# විෂය නිර්දේශ
# සහ
# ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

මව්බස (සිංහල)
පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි
දෙවන ජාතික භාෂාව (දෙමළ)
සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

## පස්වන ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා
ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

2009

පළමුවන මුද්‍රණය 2001
දෙවන මුද්‍රණය 2002
පළමුවන සංශෝධිත මුද්‍රණය 2009

හිමිකම් ඇවිරිණි

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ප්‍රාථමික පාසල් අවධිය ළමා සංවර්ධනයේ ඉතාමත් තීරණාත්මක අවධියකි. අනාගතයේ සාර්ථක පුරවැසියකු වශයෙන් ක්‍රියා කිරීමට අවශ්‍ය ශක්ති රාශියක් ගොඩ නැගෙන්නේත් හැඩ ගැසෙන්නේත් මෙම කාල පරිච්ඡේදය තුළ දී ය. ඒ සඳහා ළමයින්ගේ වර්ධනයට හිතකර එසේ ම ඒවාට අනුබල දෙන්නා වූ පරිසරයක් නිර්මාණය කිරීම අවශ්‍ය වේ. මෙහි දී ළමයින්ට තමා අවට පරිසරය සමඟ නිරන්තරයෙන් ගැටී අත්දැකීම් ලබා ගැනීමට ත් ක්‍රියාකාරී ලෙස පරිසරය සමඟ සම්බන්ධ වීමට ත් ප්‍රීතිය හා සතුට අත්විඳීමට ත් තමා කරන වැඩ තුළින් සාර්ථකත්වය භුක්ති විඳීමට ත් දෙමව්පියන් ගේ හා ගුරුවරුන් ගේ ආදරය හා පිළිගැනීම ලැබීමට ත් ඉඩ ප්‍රස්තා සැලසිය යුතු ය. එවැනි අවස්ථා ළමයාගේ සංවර්ධනය උපරිම මට්ටමකින් සිදු කිරීමට අනුබල දෙන්නක් වෙයි.

ප්‍රාථමික ශ්‍රේණි සඳහා විෂයමාලා සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ පිළියෙල කිරීමේ දී ඉහත දක්වන ලද කරුණු දැඩි ලෙස සැලකිල්ලට ගෙන ඇත. එම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ පාසල්වල ක්‍රියාත්මක කිරීමේ දී ද එම කරුණු ඉස්මතු වන ආකාරයට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමට ගුරුවරුන් විසින් අවධානය යොමු කළ යුතු ය. එසේ ම මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ ගුරු මහත්ම මහත්මීන්ට තම පන්ති කාමරවල ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා කරන මග පෙන්වීමක් පමණක් බව ද අවධාරණය කරනු කැමැත්තෙමි. එහි ඇතුළත් කරුණු සැලකිල්ලට ගෙන තමාගේ ප්‍රදේශයට ගැළපෙන ආකාරයට තමාගේ ම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් ගොඩ නගා ගැනීමට ගුරුවරුන් උනන්දු විය යුතු ය. නිර්මාණාත්මක ලෙස පන්ති කාමර කටයුතු ගොඩ නගා ගැනීමට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රයෝජනයට ගත යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටින බොහෝ පිරිසක ගේ දායකත්වයෙන් සම්පාදනය කරන ලද්දකි. ඔවුන් සියලු ම දෙනාටත් මෙම කාර්යය වෙනුවෙන් මූලිකත්වය ගෙන ක්‍රියා කළ මුල් ළමාවිය සංවර්ධන සහ ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සියලු ම නිලධාරී මහත්ම මහත්මීන්ට ත් මගේ කෘතඥතාව හිමි වේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය මුද්‍රණය කිරීම උදෙසා මූල්‍ය අනුග්‍රහය දැක්වීම වෙනුවෙන් යුනිසෙෆ් ආයතනයට මගේ විශේෂ ස්තුතිය පිරිනමමි.

මහාචාර්ය ලාල් පෙරේරා
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

## සංදේශපනය

2009 වසරේ දී පස්වන ශ්‍රේණිය සඳහා හඳුන්වා දෙන මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 2002 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පස්වන ශ්‍රේණිය සඳහා හඳුන්වා දෙන ලද ගුරු අත්පොතේ නව සංස්කරණයකි. 2003 සිට පාසල්වල ක්‍රියාත්මක කිරීමේ දී ලද අත්දැකීම් 2003 වර්ෂයේ දී පළ කළ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව, ජාතික අධ්‍යාපන ආයතනය මගින් ක්‍රියාත්මක කරන ලද විෂයමාලා පසුපෙවුම් වැඩසටහන් මගින් ලබා ගත් තොරතුරු, විවිධ ආයතන මගින් ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ව පවත්වන ලද පර්යේෂණවලින් ලබා ගත් තොරතුරු සහ ගුරු මහත්ම මහත්මීන් හා ගුරු උපදේශක මහත්ම මහත්මීන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ද සැලකිල්ලට ගෙන මෙම සංශෝධිත ගුරු මාර්ගෝපදේශය පිළියෙල කර ඇත.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය යනු ගුරු මහත්ම මහත්මීන් හට තම පන්තිවල ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු සංවිධානය කර ගැනීමට මග පෙන්වනු ලබන උපදෙස් සංග්‍රහයකි. එම මග පෙන්වීම්වලට අනුව තමන්ගේ ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු සකස් කර ගැනීම ගුරු මහත්ම මහත්මීන්ගේ වගකීම වෙයි. ප්‍රාථමික ශ්‍රේණිවල සිටින සිසුන් ඉතාමත් තීරණාත්මක සංවර්ධන අවධියක පසු වන්නන්ය. සිසුන්ගේ නිර්මාණාත්මක චින්තනය, සමාජ කුසලතා සහ පෞරුෂ ලක්ෂණ ගොඩ නැගෙන්නේත්, හැඩ ගැසෙන්නේත් මේ අවධියේ දී ය. එම නිසා සිසුන් සඳහා ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ දී, මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති තොරතුරු මෙන් ම ඉහත සඳහන් කළ ළමා සංවර්ධනය හා සම්බන්ධයෙන් වැදගත් වන කරුණු ද සැලකිල්ලට ගෙන ක්‍රියා කළ යුතු ය. ප්‍රාථමික අවධියේ දී සිසුන්ගේ ඉගෙනීම සඳහා ආසන්න පරිසරයත් සමග සිදු කරන අන්තර් ක්‍රියා අතිශයින් වැදගත්ය. එම නිසා සිසුන් සඳහා ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීමේ දී සිසුන්ගේ ආසන්න පරිසරය අර්ථාන්විත ලෙස යොදා ගැනීමට ගුරු මහත්ම මහත්මීන් උත්සාහ කළ යුතු ය.

සිසුන්ට තම ළමා කාලයේ දී ප්‍රීතිය භුක්ති විඳීමට සහ සාර්ථකත්වය අත්විඳීමට අවස්ථාවක් තිබීම ඔවුන්ගේ සංවර්ධනය කෙරෙහි අතිශයින් වැදගත් වේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීමේ දී ළමා මිතුරු ක්‍රියාකාරකම් ඇතුළත් කිරීමට වැඩි අවධානයක් යොමු කොට තිබේ. විනෝදජනක වැඩ සහ සිසුන් කේන්ද්‍ර කරගත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් රාශියක් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා ඇතුළත් කර ඇත්තේ එම නිසා ය. පන්ති කාමරය තුළ ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීමේ දී මේ කරුණු වඩාත් උද්දීපනය වන ආකාරයෙන් ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට ගුරු මහත්ම මහත්මීන් උත්සාහ කළ යුතු ය. පුද්ගලයකුගේ අනාගත ජීවිතය සංවර්ධනය කර ගැනීමට ප්‍රාථමික අධ්‍යාපන කාල සීමාවේ දී අවස්ථාවන් තිබිය යුතු ය. ඒ අනුව ඉතා පුළුල් අධ්‍යාපනයක් තුළින් ජීවන නිපුණතාවන් රාශියක් විෂයමාලාවට හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයට ඇතුළත් කිරීමට කටයුතු යොදා ඇත. ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීමේ දී ඒ ගැන අවධානයෙන් යුතු ව කටයුතු කළ යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම සඳහා ගුරුවරුන්ගේ, ගුරු උපදේශකවරුන්ගේ, විදුහල්පතිවරුන්ගේ, ගුරු විද්‍යාල හා අධ්‍යාපන විද්‍යා පීඨ, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන් ආදී හා අධ්‍යාපන නිලධාරීන් විශාල පිරිසකගේ ද අදහස් උපයෝගි කර ගන්නා ලද අතර එම දායකත්වය වෙනුවෙන් ඔවුන් වෙත අපගේ කෘතඥතාවය පළ කරමු. එසේ ම ප්‍රාථමික අධ්‍යාපන අංශයේ කටයුතුවලට නිරන්තරයෙන් සහාය දක්වන ආචාර්ය කමලා පිරිස්, චිත්‍රාංගනී මල්වැන්න, ආචාර්ය ජී.එල්.එස්. නානායක්කාර යන මහත්ම මහත්මීන් ලබා දී ඇති සේවය ද බෙහෙවින් අගය කරමු. එසේ ම නිරන්තරයෙන් අපට අවශ්‍ය මග පෙන්වීම් ලබා දෙන අප ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ලාල් පෙරේරා මහතා කෘතඥතා පූර්වක ව සිහිපත් කරමු. මෙම කෘතිය සකස් කිරීම වෙනුවෙන් ඇප කැපවී ක්‍රියා කළ අපගේ දෙපාර්තමේන්තුවේ සියලු ම නිලධාරී මහත්ම මහත්මීන්ගේ සේවය ඉතා ඉහළින් අගය කරමු.

ආචාර්ය සුරනිමල ලේකම්ගේ
අධ්‍යක්ෂ
මුල් ළමාවිය සංවර්ධනය හා
ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

විමල් සියඹලාගොඩ
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
(භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)

# ජාතික අරමුණු

(i) මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාවය, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතික ගොඩ නැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කිරීම.

(ii) වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

(iii) මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

(iv) පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

(v) සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුලු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

(vi) පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

(vii) ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

(viii) ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

| | | |
|---|---|---|
| සාක්ෂරතාව | : | සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම. |
| සංඛ්‍යා පිළිබඳ දැනුම | : | භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය. |
| රූපක භාවිතය | : | රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම. |
| තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය | : | පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම. |

(ii) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්.
- චිත්තවේගී බුද්ධිය.

(iii) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික,ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

| | | |
|---|---|---|
| සමාජ පරිසරය | : | ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්. |
| ජෛව පරිසරය | : | සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා. |
| භෞතික පරිසරය | : | අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව. |

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(iv) වැඩ ලෝකයට සුදානම් වීමේ නිපුණතා
ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම.
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(v) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා
පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(vi) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා
සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(vii) ''ඉගෙනීමට ඉගෙනුම'' පිළිබඳ නිපුණතා
ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමක් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

## පළමුවන මුද්‍රණය - 2001

**උපදේශනය :**

ආචාර්ය ජී. බී. ගුණවර්ධන
(අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය)
ආචාර්ය ජී. එල්. එස්. නානායක්කාර
(සහකාර අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය)

**අධ්‍යක්ෂණය :**

විමල් සියඹලාගොඩ
(අධ්‍යක්ෂ - ප්‍රාථමික අධ්‍යාපනය)

**විෂයමාලා කමිටුව :**

ආචාර්ය ජී. එල්. එස්. නානායක්කාර
විමල් සියඹලාගොඩ
පී. සුබ්‍රමනියම්
ඊ. එල්. සුරනිමල
කේ. ඒ. ඩී. පී. සරත්චන්ද්‍ර
එම්. එල්. විදානපතිරණ
කේ. එච්. පරණවිතාන
ජේ. එච්. චන්ද්‍රසේන
ටී. කේ. වීරතුංග
අයිරින් ගජනායක
කේ. ඩී. ආර්. දයාවංශ
ඒ. අතුකෝරළ
නන්දා බෙන්තරගේ
එස්. අයි. එම්. එච්. කරීම්
ඩී. එම්. ඩබ්ලිව්. මුණසිංහ
එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න
පී. ජී. ප්‍රේමලතා ජයසිංහ
එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම
එස්. එම්. ආර්. සුදින්
එම්. එන්. චන්දන ප්‍රනාන්දු
ආර්. එම්. කේ ද සිල්වා
ටී. මුහුන්දන්
වී. එන්. එස්. උදයචන්ද්‍රන්

**පරිගණක වචන යෙදුම :**

මොනිකා විජේකෝන්

## සංශෝධිත මුද්‍රණය - 2008

**උපදේශනය :**
මහාචාර්ය ලාල් පෙරේරා
(අධ්‍යක්ෂ ජනරාල්-ජාතික අධ්‍යාපන ආයතනය)
විමල් සියඹලාගොඩ මයා
(සහකාර අධ්‍යක්ෂ ජනරාල්-භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)

**අධ්‍යක්ෂණය :**
ආචාර්ය සුරනිමල ලේකම්ගේ
අධ්‍යක්ෂ
(මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව)

**සංස්කරණය හා සම්බන්ධීකරණය :**
ඩී. එම්. ඩබ්ලිව්. මුණසිංහ මිය
ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි
(මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව)

**ලේඛක මණ්ඩලය**
අභ්‍යන්තර (ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව)
ආචාර්ය සුරනිමල ලේකම්ගේ
කේ. ඒ. ඩී. පී. සරත්චන්ද්‍ර මයා
එම්. පී. එස්. සිල්වා මෙනවිය
එස්. එම්. ආර්. සුදින් මයා
එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න මයා
ඩී. එම්. ඩබ්ලිව්. මුණසිංහ මිය
පී. ජී. ප්‍රේමලතා ජයසිංහ මිය
එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම මයා
කේ. ආර්. පත්මසිරි මයා
එම්. එන්. චන්දන ප්‍රනාන්දු මයා
ආර්. එම්. කුමුදුමලී ද සිල්වා මිය
වී. එන්. එස්. උදය සන්දිරන් මයා
එච්.ඩබ්.ඩබ්.එම්. සජීවා රුවනි රඹුක්වැල්ල මිය
එස්. එම්. සඳමාලි දේශප්‍රිය මිය
අයි. ජී. එස්. ප්‍රේමතිලක මයා
ඩබ්ලිව්. ජී. එස්. කුමාර මයා
ජේ. ඒ. නිර්මලා දමයන්ති ජයසිංහ මෙනවිය

**ඉංග්‍රීසි අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
එච්. ආර්. එස්. කේ. අටුගොඩ මයා
ටී. චන්ද්‍රිකා පීරිස් මිය

**සිංහල අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
එච්. පී. සුසිල් සිරිසේන මයා

**බාහිර සම්පත් පුද්ගල**
පද්මිනී රණවීර මිය
රේණුකා පීරිස් මිය

**චිත්‍ර :**
රවීන්ද්‍ර තේනුවර මයා (සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව)
අමරා අමරසිංහ මෙනවිය


**පරිගණක වචන යෙදුම :**
මොනිකා විජේකෝන් මිය

**පරිගණක සැකසුම :**
වී, බී. එස්. වීරකෝන් මයා

**පිටකවරය**
වී. එන්. එස්. උදයසන්දිරන් මයා

**මුද්‍රණ සහාය**
එස්. පී. ඒ. සරත් කුමාර මයා

1 වන රූප සටහන
ප්‍රාථමික විෂයමාලා සැලැස්ම - 2007



## අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා ප්‍රතිව්‍යුහකරණ යටතේ 1999 වර්ෂයේ සිට ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාවේ විශේෂ ලක්ෂණ

* ප්‍රාථමික අධ්‍යාපනය සඳහා වෙන් කර ඇති අවුරුදු පහක කාල සීමාව විෂයමාලා සංවර්ධන හා අනෙකුත් කටයුතුවල පහසුව තකා ප්‍රධාන අවධි තුනකට බෙදීම.
පළමුවන ප්‍රධාන අවධිය : පළමුවන සහ දෙවන ශ්‍රේණි
දෙවන ප්‍රධාන අවධිය : තුන්වන සහ හතරවන ශ්‍රේණි
තුන්වන ප්‍රධාන අවධිය : පස්වන ශ්‍රේණිය

* පළමුවන ශ්‍රේණියට ඇතුළු වන දරුවන් ආරම්භයේ දී ම පහසුවෙන් හඳුනා ගැනීමට ගුරුවරයාට භාවිත කළ හැකි සැලසුම්ගත සෙල්ලම් හා ක්‍රියාකාරකම් සමූහයක් හඳුන්වා දීම.

* සාමාන්‍ය අධ්‍යාපන අවධිය අවසානයේ දී සිසුන් විසින් වර්ධනය කර ගත යුතු යැයි නිර්දේශිත නිපුණතා ප්‍රකාශයට පත් කර ඇත. ඒවා ගොඩනැගීමට සුදුසු පදනමක් සැපයෙන පරිදි සැකසුණු නිපුණතා පාදක විෂයමාලවක් වීම.

* විෂය ක්ෂේත්‍ර හතරක් යටතේ සංවිධානය කර තිබීම.
- භාෂාව
- ආගම
- ගණිතය
- පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

* දරුවකුගේ පූර්ණ වර්ධනයට භාෂාව හා ගණිත නිපුණතාවලට අමතර ව සෞන්දර්ය, නිර්මාණ, විද්‍යාව, සෞඛ්‍යය හා පෝෂණය වැනි තවත් අංශ කිහිපයකට අයත් නිපුණතා වර්ධනය වීම අවශ්‍ය ය. මෙම නිපුණතා වෙන් වෙන් ව විෂයයන් වශයෙන් ඉදිරිපත් කිරීමට වඩා සිසුනට ගැළපෙන තේමා තුළින් අවස්ථානුකූල ව මතු කර ඉගෙනීමට සැලැස්වීම වඩා යෝග්‍ය ලෙස පිළිගැනේ. මෙවැනි අංශ මතු කර ගැනීමට සමත් තේමා සමූහයකින් සමන්විත පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයෙහි පෙරට වඩා සමෝධානිත ලක්ෂණ පෙන්නුම් කිරීම.

* පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයෙහි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාෂාව, ගණිතය සහ ආගම යන විෂය ක්ෂේත්‍රවලට සම්බන්ධ නිපුණතා වර්ධනයට ද අවස්ථාවන් සැලසෙන හෙයින් එහි විෂය සම්බන්ධීකරණ ලක්ෂණ පෙන්නුම් කිරීම.

* පළමුවන ශ්‍රේණියේ සිට ම පන්තියේ ගුරුවරයා විසින් ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි නම් නව අංගයක් හඳුන්වා දීම.

* දෙවන ප්‍රධාන අවධියේ සිට විධිමත් ව ඉංග්‍රීසි විෂය හඳුන්වා දීම.

* පළමුවන ශ්‍රේණියේ සිට දිගට ම විෂය සමගාමී ක්‍රියාකාරකම්වලටත්, පස්වන ශ්‍රේණියේ දී සිසු ළැදියා හා අවශ්‍යතාවලට ගැළපෙන වෛකල්පිත ක්‍රියාකාරකම්වලටත් කාල සටහන තුළින් ඉඩ ප්‍රස්තා සැපයීම.

* ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාවෙන් සිසුන් තුළ ජීවන නිපුණතා සංවර්ධනය කිරීමට ඉඩ සලසා තිබීම.

* සමස්ත ප්‍රාථමික අධ්‍යාපන අවධිය තුළ ම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ප්‍රධාන තැනක් හිමි වනුයේ ශිෂ්‍ය කේන්ද්‍රීය දිශාවට නැඹුරු වූ ක්‍රමවේදවලට ය. එම ක්‍රමවේද ප්‍රධාන වශයෙන් තෙවැදෑරුම් වේ.
- සැලසුම්ගත සෙල්ලම් හා විනෝදජනක වැඩ
- ක්‍රියාකාරකම්
- අසුන්ගත වැඩ

* පළමුවන ප්‍රධාන අවධියේ දී සැලසුම්ගත සෙල්ලම් සහ ක්‍රියාකාරකම්වලට වැඩි අවධානයක්ද අසුන්ගත වැඩවලට අඩු අවධානයක් ද ලැබේ. දෙවන ප්‍රධාන අවධියේ දී මෙම ක්‍රමවේද තුනට ම ආසන්න වශයෙන් සමාන ව අවධානය හිමි වේ. තෙවන ප්‍රධාන අවධියේ දී ක්‍රියාකාරකම් සහ අසුන්ගත වැඩවලට වැඩි අවධානයක් ද සෙල්ලම්වලට අඩු අවධානයක් ද ලැබේ. මේ අන්දමට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද සංකලන ප්‍රධාන අවධි තුන තුළ ක්‍රම ක්‍රමයෙන් වෙනස් වීම.

* සිසු ඉගෙනුම් ප්‍රගතිය හා ඉගෙනුම් දුෂ්කරතා පිළිබඳ ව හඳුනා ගැනීම පිණිස නිරීක්ෂණය, වාචික ප්‍රශ්න කිරීම, සිසුන්ට සවන් දීම වැනි අවිධිමත් ක්‍රමවලට ප්‍රමුඛතාවය දෙන අඛණ්ඩ ව කරගෙන යා යුතු පන්ති කාමර පාදක තක්සේරු කිරීමේ ක්‍රියාවලියක් පවත්වාගෙන යාම.

* එක් සිසුවකුගේ ලකුණු හෝ සාධන මට්ටම් හෝ තවත් සිසුවකුගේ ලකුණු හෝ සාධන මට්ටම් හෝ සමඟ සසඳා තීරණ ගැනීමේ ක්‍රමයෙන් මිදී නිශ්චිත අරමුණක් හෝ සිසු පූර්ව සාධන මට්ටමක් සමඟ සිසු සාධනය සසඳා තීරණ ගැනීමට සමත් පිළිවෙළින් නිර්ණායක මූලික සහ පූර්ව සාධන මූලික තක්සේරු කිරීමේ ක්‍රම යොදා ගැනීමට අනුබල දීම.

* සැමට අධ්‍යාපනය තහවුරු කර ගැනීම ඉලක්ක කර ගනිමින්, ඒ සඳහා ප්‍රමිතියක් වශයෙන්, එක් එක් ප්‍රධාන අවධිය අවසානයේදී සිසුන් විසින් අනිවාර්යයෙන් ම ප්‍රවීණතා මට්ටමට ළඟා විය යුතු අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා හඳුන්වා දීමට පියවර ගැනීම.

* එක් එක් ප්‍රධාන අවධිය අවසානයේ දී ළඟා කර ගත යුතු යැයි අපේක්ෂිත අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා පිළිබඳ ව ප්‍රවීණතාවක් ලබා ඇත්දැයි තක්සේරු කිරීමට පියවර ගැනීම.

* එක් එක් ප්‍රධාන අවධියක් අවසානයේ අපේක්ෂිත අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා පිළිබඳ ප්‍රවීණතාවක් සියලු ම සිසුන්ට ලබා දීම ඉලක්ක කරගෙන එම එක් ප්‍රධාන අවධියක් එකම ගුරුවරයකුගේ යටතට පත් කිරීමට අනුබල දීම.

* පළමුවන ප්‍රධාන අවධියේ සිසුන් පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදී සිටින විට ගුරු අධීක්ෂණය යටතේ, සංවිධානාත්මක ව හයවන ශ්‍රේණියේ සිසුන් සමඟ කණ්ඩායම් වැඩවල යෙදීමට ඉඩ ප්‍රස්තා සැපයීම.

* පළමුවන ප්‍රධාන අවධියේ දී පමණක් මව්බස විෂයයට ගණිතය විෂයයට වඩා වැඩි කාලයක් ද, දෙවන හා තෙවන ප්‍රධාන අවධිවල දී විවේක කාලය සඳහා දිනකට මිනිත්තු 20ක කාලයක් ද වෙන් කිරීම.

* 2007 වර්ෂයේ සිට පළමුවන ප්‍රධාන අවධියට දෙවන ජාතික භාෂාව හඳුන්වා දීම. එය සවන් දීමට හා කථනයට පමණක් සීමා කර තිබුණ ද තුන්වන ශ්‍රේණියේ සිට කියවීම හා ලිවීම ක්ෂේත්‍ර සම්බන්ධ කරමින් විධිමත් ව සිසුන්ට ඉගෙනීමට අවස්ථා සලසා තිබීම.

* 2007 වර්ෂයේ සිට ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි ගණිත විෂයය සඳහා ද භාවිත කිරීම.

* 2007 වර්ෂයේ සිට සිසුන්ගේ කායික හා මානසික සංවර්ධනය සඳහා උපකාරී වන ශරීර සුවතා වැඩසටහන් පළමුවන ප්‍රධාන අවධිය සඳහා ක්‍රියාත්මක කිරීම.

# පස්වන ශ්‍රේණිය - විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 1.0 | මව්බස (සිංහල) - විෂය නිර්දේශය | 1-8 |
| | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | |
| | හැඳින්වීම | |
| | 1.1 සවන් දීම | 9-24 |
| | 1.2 කතා කිරීම | 25-35 |
| | 1.3 කියවීම | 36-61 |
| | 1.4 ලිවීම | 62-82 |
| | මව්බස විෂය තක්සේරු පත්‍රිකාව | 83 |
| | තුන්වන ප්‍රධාන අවධිය දරුවන්ගේ කියවීම හා ලිවීම පිළිබඳ දුෂ්කරතා | 84-94 |
| 2.0 | පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් - විෂය නිර්දේශය | 95-107 |
| | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | |
| | හැඳින්වීම | |
| | 2.1 අපේ යහපැවැත්ම | 108-114 |
| | 2.2 අප අවට සත්තු | 115-120 |
| | 2.3 පොළොව හා අහස | 121-129 |
| | 2.4 අප හා වෙළෙඳ පොළ | 130-134 |
| | 2.5 පැළෑටි හා ගස්වැල් | 135-142 |
| | 2.6 ජලය | 143-147 |
| | 2.7 ගෙවත්ත | 148-153 |
| | 2.8 ආරක්ෂාව හා පරිස්සම | 154-160 |
| | 2.9 අපේ අතීත විත්ති | 161-165 |
| | 2.10 වැඩ පහසු කිරීමේ මං | 166-175 |
| | 2.11 අපි ලක්වැසියෝ | 176-184 |
| | 2.12 අපට කළ හැකි වෙනස්කම් | 185-189 |
| | 2.13 මිනිසා හා තොරතුරු | 190-197 |
| | 2.14 අපේ ආහාර | 198-204 |
| | 2.15 ගමනාගමනය | 205-209 |
| | 2.16 මිනිස් හැසිරීම් | 210-217 |
| | පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය තක්සේරු පත්‍රිකාව | 218 |
| 3.0 | ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි | 219-232 |
| 4.0 | දෙවන ජාතික භාෂාව - විෂය නිර්දේශය | 233-238 |
| | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | |
| | හැඳින්වීම | |
| | ආදර්ශ ක්‍රියාකාරකම් | 239-262 |
| | විශේෂ අධ්‍යාපනය | 263-268 |
| | සිසුන්ගේ ලැදියා හා රුචිකත්වය අනුව වෛකල්පිත විෂයයන් | 269-270 |
| 5.0 | සිසු ප්‍රගතිය තක්සේරු කිරීම | 271-276 |
| 6.0 | තක්සේරු කිරීම සඳහා කාර්ය සාධන ගොනු | 277 |
| | පොදු තක්සේරු පත්‍රිකාව | 278 |



ගණිතය විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය
ආගම් සඳහා විෂය නිර්දේශ හා ගුරු අත්පොත්
වෙන වෙන ම ඉදිරිපත් කර ඇත.

## කාලය බෙදා ගැනීම - දෙවන ප්‍රධාන අවධිය (පස්වන ශ්‍රේණිය)

| | විෂයය | සතියකට කාලය |
|---|---|---|
| 1. | මව්බස | පැය 5.00 |
| 2. | ගණිතය | පැය 5.00 |
| 3. | පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 7.30 |
| 4. | ඉංග්‍රීසි | පැය 3.30 |
| 5. | දෙවන ජාතික භාෂාව | පැය 1.00 |
| 6. | ආගම | පැය 2.00 |
| 7. | උදය රැස්වීම හා ආගමික වතාවත් | පැය 1.15 (දිනකට මිනිත්තු 15යි) |
| 8. | විවේක කාලය | පැය 1.40 (දිනකට මිනිත්තු 20යි) |
| 9. | ශරීර සුවතා ක්‍රියාකාරකම් | පැය 2.05 (දිනකට මිනිත්තු 25 යි) |
| 10. | විෂය සමගාමී ක්‍රියාකාරකම් | මිනිත්තු 30 (සතියේ එක් දිනක) |
| 11. | වෛකල්පිත ක්‍රියාකාරකම් | මිනිත්තු 30 |
| | සතියකට මුළු කාලය | පැය 30.00 |

1 වන රූප සටහන

ප්‍රාථමික විෂයමාලා සැලැස්ම - 2007



# මව්බස

## 01. හැඳින්වීම

මව්බස විෂය සවන් දීම, කතා කිරීම, කියවීම, ලිවීම වශයෙන් ක්ෂේත්‍ර හතරක් යටතේ ඉදිරිපත් කර ඇත. ගුරුවරයාට විෂය අන්තර්ගත කරුණු පැහැදිලි කර ගැනීමට පහසු වනු පිණිස එසේ ඉදිරිපත් කර ඇතත් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමේ දී මෙම ක්ෂේත්‍ර අදාළ පරිදි සමෝධානය කර ගැනීම අපේක්ෂා කෙරේ. අවම වශයෙන් ක්ෂේත්‍ර දෙකක්වත් සමෝධානය වීම වැදගත් වේ. සෘජු ව ම මව්බස විෂයයට අදාළ ව තෙවන ප්‍රධාන අවධිය සඳහා නිර්දිෂ්ට මව්බස අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා පිළිබඳ ව ද අවධානය යොමු වීම අවශ්‍ය ය.

කනිෂ්ඨ ද්විතීයික අවධිය අවසානයේ දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට ඉදිරිපත් වන සියලු සිසුනට මව්බස භාවිත කිරීම බාධකයක් නොවිය යුතු ය. පස්වන ශ්‍රේණිය අවසානයේ දී ද්විතීයික අවධියට පැමිණෙන විට අත්‍යවශ්‍යයෙන් ම තිබිය යුතු නිපුණතා මෙන් ම බොහෝ සිසුනට අභිමත නිපුණතා ලබා දීම කෙරෙහි ද සැලකිලිමත් වීම ඉතා වැදගත් වේ. ඒ සඳහා පළමුවන, දෙවන, තුන්වන, හතරවන ශ්‍රේණිවල දී ප්‍රතිපෝෂණය ප්‍රබල ලෙස අනුගමනය කළ යුතු ය.

නිපුණතා පාදක ප්‍රවේශයේ දී, මූලික නිපුණතාවක් වන සන්නිවේදන නිපුණතාවේ අනුබණ්ඩයක් වශයෙන් සාක්ෂරතාව සඳහන් කෙරේ. එහි දී, සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව හා නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම යන නිපුණතා කරා සිසුන් ළඟා කරවීම අපේක්ෂාවයි.

මෙම සන්නිවේදන නිපුණතාවට අමතර ව පරිසරයට අදාළ නිපුණතා, වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා, ආචාර ධර්මවලට හා ආගමට අදාළ නිපුණතා, ක්‍රීඩා හා විවේකය ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ නිපුණතා, පෞරුෂ වර්ධනයට අදාළ නිපුණතා, ඉගෙනීමට ඉගෙනීම පිළිබඳ නිපුණතා යන අනෙක් නිපුණතා වර්ධනය වන ලෙසින් විෂයයට අදාළ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම අපේක්ෂා කෙරේ.

## 02. ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා අපේක්ෂිත නිපුණතා

- ★ එදිනෙදා අවශ්‍යතා සඳහා සවන් දීමේ, කතා කිරීමේ, කියවීමේ හා ලිවීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.
- ★ කවි, ගී, කතන්දර අසා සහ කියවා රස විඳියි.
- ★ නිවැරදි උච්චාරණය සහිත ව ශබ්ද නඟා කියවයි.
- ★ ක්‍රමවත් ව පැහැදිලි ව හා නිවැරදි ව ලියයි.
- ★ සවන් දීම, කතා කිරීම, කියවීම හා ලිවීම සම්බන්ධ හොඳ පුරුදු ප්‍රදර්ශනය කරයි.
- ★ පොත් පත් කියවා තේරුම් ගනියි, රස විඳියි.
- ★ තම අත්දැකීම් වාර්තා කිරීමේ හා අදහස් නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.
- ★ සමූහයක් ඉදිරිපිට තම අදහස් සුහද ව, නිරවුල් ව හා ආචාරශීලී ව ඉදිරිපත් කරයි.

## 03. පස්වන ශ්‍රේණිය සඳහා අපේක්ෂිත නිපුණතා

- ★ විස්තරයකට සවන් දී කරුණු අනුපිළිවෙළින් ඉදිරිපත් කරයි.
- ★ විස්තරයකට සවන් දී එහි ප්‍රධාන අදහස නිවැරදි ව ගොනු කර පැහැදිලි ව කියයි.
- ★ ළමා නාට්‍යවලට සවන් දී රස විඳියි.
- ★ අත්දැකීමක් අන්‍යයනට අවබෝධ වන පරිදි පවසයි.
- ★ අසන්නාගේ ස්වභාවයට ගැළපෙන පරිදි ආචාරශීලී ව කතා කරයි.
- ★ ළමා නාට්‍ය කියවා රස විඳියි.
- ★ ළමා නාට්‍ය නරඹා රස විඳියි.
- ★ දෙන ලද මාතෘකාවකට අදාළ ව කරුණු රැස් කර ගැනීම සඳහා කියවයි.
- ★ නිවැරදි අක්ෂර වින්‍යාසය සහ නිවැරදි උක්ත ආඛ්‍යාත සම්බන්ධය සහිත ව ලියයි.
- ★ සරල සිද්ධි ඇසුරෙන් දෙබස් නිර්මාණය කර ලියයි.
- ★ නිරීක්ෂණ වාර්තා ලියයි.

## 04. මව්බස (සිංහල) - විෂය නිර්දේශය

### 4.0 මව්බස

### 4.1 සවන් දීම

4.1.1 වින්දනය සඳහා සවන් දී ප්‍රතිචාර දක්වයි.
- රසවත් කවි/ගීවලට සවන් දී තාල තබයි.
- කතන්දරවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.
- විරිදුවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.
- නාට්‍යවල එන සංවාදවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.

4.1.2 සවන් දී අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.
- සවන් දී වචන, වාක්‍යාංශ, වාක්‍යවල තේරුම අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.
- සවන් දී වැදගත් කරුණු අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.
- සවන් දී වැදගත් සිද්ධි අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.
- සවන් දීමෙන් ප්‍රධාන අදහස අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.
- සවන් දී සිදුවීම් කිහිපයක අනුපිළිවෙළ අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.
- සවන් දී අලංකාරවත් යෙදුම් අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.
- සවන් දී විවිධ උච්චාරණ ශෛලිය අනුව මතු වන අදහස අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

4.1.3 සවන් දී චින්තනයට යොමු වී ප්‍රතිචාර දක්වයි.
- කතන්දර, චරිත කතා, සිදුවීම් ඇසුරෙන් තම අදහස පවසයි.
- සවන් දී පෙරකීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

4.1.4 ඉගෙනීම සඳහා සවන් දී ප්‍රතිචාර දක්වයි.
- ඉගෙනීම සඳහා ගුරුවරයාට සවන් දී ප්‍රතිචාර දක්වයි.
- ඉගෙනීම සඳහා වැඩිහිටියනට සවන් දී ප්‍රතිචාර දක්වයි.
- ඉගෙනීම සඳහා පූජ්‍ය පූජක උතුමන්ට සවන් දී ප්‍රතිචාර දක්වයි.
- ඉගෙනීම සඳහා විද්‍යුත් මාධ්‍යයන්ගේ අධ්‍යාපනික වැඩසටහන්වලට සවන් දී ප්‍රතිචාර දක්වයි.

## 4 . 2 කතා කිරීම

4.2.1 කතා කිරීම මගින් සුහදත්වය වර්ධනය කර ගනියි.
- සුහද කතා බහේ යෙදෙයි.
- කවි, ගී ගායනය කරයි.
- කතන්දර කියයි.
- අත්දැකීම් විස්තර කරයි.
- ගැටලු විසඳයි.

4.2.2 නිසි උච්චාරණය සහිත ව කතා කරයි.
- කවි, ගී ගායනා කරමින් තාල තබයි.
- වාචික අභිනය හා අවධාරණය සහිත ව හඬ නගා කතා කරයි.

4.2.3 සන්නිවේදන අවශ්‍යතා සඳහා කතා කරයි.
- තොරතුරු සෙසු අයට පවසයි.
- එදිනෙදා සිදුවීම් ඉදිරිපත් කරයි.
- අසන්නාගේ ස්වභාවය අනුව ආචාරශීලී ව හා සංවේදී බවින් යුතු ව කතා කරයි.
- උචිත ශෛලියෙන් යුතු ව නිවේදනවල යෙදෙයි.
- නායකත්වය දරමින් උපදෙස් දෙයි.

4.2.4 විචාරශීලී ලෙස කතා කරයි.
- ප්‍රශ්නකරණයේ හා පිළිතුරු දීමේ යෙදෙයි.
- අදාළ තැනට උචිත වචන යොදමින් කතා කරයි.
- මුල, මැද, අග ගැළපීමක් සහිත ව කතා කරයි.

## 4 . 3 කියවීම

4.3.1 නිවැරදි උච්චාරණය සහිත ව විරාම ලක්ෂණවලට අනුකූල ව කියවයි.
- මිශ්‍ර සිංහල හෝඩියේ සියලු අක්ෂර නිවැරදි ව උසුරුවමින් කියවයි.
- සියලු පිලි නිවැරදි ව උසුරුවමින් කියවයි.
- වේගවත් ව හා ප්‍රවීණත්වයෙන් යුතු ව කියවයි.
- පැරණි හා නූතන ගද්‍ය පාඨ විවිධ ශෛලීන්ගෙන් යුතු ව කියවයි.
- නැවතීමේ ලකුණ, ප්‍රශ්නාර්ථ ලකුණ, විස්මයාදී ලකුණ හා කොමාව යන විරාම ලක්ෂණවලට අවනත ව කියවයි.

4.3.2 කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.
- උපදෙස් කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.
- රූපික ප්‍රකාශන කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.
- සරල කවි, ගී කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.
- ගද්‍ය කොටස් කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.
- භාෂාමය යෙදුම් කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

4.3.3 ලිඛිත සන්නිවේදන පත්‍රිකා කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.
- ආරාධනා පත් කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.
- දැන්වීමක් කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.
- පෝස්ටර කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

4.3.4 රසාස්වාදය සඳහා කියවා ප්‍රතිචාර දක්වයි.
- ළමා කවි, ගී කියවා ප්‍රතිචාර දක්වයි.
- ළමා කතන්දර කියවා ප්‍රතිචාර දක්වයි.
- දෙබස් කියවා ප්‍රතිචාර දක්වයි.
- ළමා නාට්‍ය කියවා ප්‍රතිචාර දක්වයි.
- ළමා කාටූන් කියවා ප්‍රතිචාර දක්වයි.
- ළමා චිත්‍ර කතා කියවා ප්‍රතිචාර දක්වයි.

4.3.5 ඉගෙනීම සඳහා කියවයි.
- බිත්ති පුවත්පත්, නිර්මාණ පැදුර කියවා ප්‍රතිචාර දක්වයි.
- ළමයිනට සැකසූ සරල ගද්‍ය, පද්‍ය නිර්මාණ කියවා ප්‍රතිචාර දක්වයි.
- පොතක පටුන භාවිත කරයි.
- කියවීමේ පුරුද්ද ප්‍රදර්ශනය කරයි.
- පුවත්පත්වලින් අදාළ තොරතුරු රැස් කරයි.
- පොත් එකතු කරගෙන හුවමාරු කර ගනිමින් කියවා ප්‍රතිචාර දක්වයි.

## 4.4 ලිවීම

4.4.1 ලිවීමේ ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරයි.
- සිංහල හෝඩියේ අක්ෂරවල අංග, ප්‍රමාණය, හැඩය අනුව නිවැරදි ව ලියයි
- අකුරු හා වචන අතර පරතරය ගැන සැලකිලිමත් ව ලියයි
- අර්ථය සඳහා අකුරු හා පිලි නිවැරදි ව යොදා වාක්‍ය ලියයි.
- නැවතීමේ ලකුණ, ප්‍රශ්නාර්ථ ලකුණ, විස්මයාදි ලකුණ සහ කොමාව යන විරාම ලකුණු යොදා ලියයි.
- උපුටාගෙන නිවැරදි ව ලියයි.
- පවසන දේ අසා නිවැරදි ව ලියයි.
- සියලු පිලි අදාළ තැන නිවැරදි ව යොදා ලියයි.

4.4.2 අවශ්‍යතා සඳහා ලියයි.
- පෞද්ගලික අවශ්‍යතා සඳහා ලිපි ලියයි.
- පාසලේ ආධ්‍යාපනික අවශ්‍යතා හා සම්බන්ධ රාජකාරි ලිපි ලියයි.
- පාසලේ දී සංවිධානය කෙරෙන උත්සවවලට සම්බන්ධ ආරාධනා පත්‍ර ලියයි.
- ආකෘති පත්‍ර ඇසුරෙන් තොරතුරු සපයයි.
- නිරීක්ෂණ වාර්තා ලියයි.

4.4.3 නිර්මාණාත්මක ව ලියයි.
- දෙබස් නිර්මාණය කර ලියයි.
- සරල කවි නිර්මාණය කර ලියයි.
- චිත්‍ර, සිදුවීම් ඇසුරෙන් සරල කතා නිර්මාණය කර ලියයි.
- රචනා නිර්මාණය කර ලියයි.
- බිත්ති පුවත්පතට, නිර්මාණ පැදුරට සුදුසු නිර්මාණ ලියයි.

4.4.4 නිවැරදි ව ලේඛන ව්‍යවහාරය භාවිත කරයි.

4.4.4.1 නිවැරදි වාක්‍ය රටා ලියයි.

- ''මම'', ''අපි'' යෙදුණු වාක්‍ය නිවැරදි ව ලියයි.
- ''ඔහු'', ''ඈ'' යෙදුණු වාක්‍ය නිවැරදි ව ලියයි.
- පුරුෂ ලිංග, ඒකවචන බහුවචන නාම පද යෙදුණු වාක්‍ය නිවැරදි ව ලියයි.
- ස්ත්‍රී ලිංග, ඒකවචන බහුවචන නාම පද යෙදුණු වාක්‍ය නිවැරදි ව ලියයි.
- ඉදිරිපිට සිටින එක් අයකු හෝ සමූහයක් හෝ හඳුන්වන නමක් උක්තය ලෙස යෙදුණු වාක්‍ය නිවැරදි ව ලියයි.
- උක්තය සඳහා අප්‍රාණවාචී නාම යෙදුණු වාක්‍ය නිවැරදි ව ලියා දක්වයි.
- නිත්‍ය බහුවචන පද නිවැරදි ව යෙදුණු වාක්‍ය ලියා දක්වයි.

4 . 4 . 4 . 2 අක්ෂර වින්‍යාසය පිළිබඳ ව නිවැරදි අවබෝධය ප්‍රදර්ශනය කරයි.

- සිංහල හෝඩියේ සියලු අක්ෂර භාවිතයේ දී නිවැරදි ව ලියයි.

## 0 5 . ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පස්වන ශ්‍රේණිය සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී, සෙල්ලම් හා විනෝදජනක වැඩ අඩු ප්‍රමාණයකින් ද, ක්‍රියාකාරකම් හා අසුන්ගත වැඩ හතරවන ශ්‍රේණියට වඩා වැඩි ප්‍රමාණයකින් ද යොදා ගැනීම අපේක්ෂා කෙරේ.

මව්බස විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී පෙළ පොත යොදා ගත යුතු අතර ඒ සඳහා පැහැදිලි උපදෙස් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ සපයා ඇත. ඒ අනුව ඔබගේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගන්න. සිසුන් තුළ නිර්මාණශීලීභාවය වර්ධනය කිරීම සඳහා ඔබගේ නිර්මාණශීලී ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය විශාල අනුබලයක් බව සිතන්න.

භාෂා වර්ධන ඉලක්ක කරා යාම සඳහා මේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි සඳහන් අතිරේක පොත්, පුවත්පත්, සඟරා, කැසට් පට, සංයුක්ත තැටි ආදිය ඇතුළත් සම්පත් කට්ටලයක් පන්ති කාමර මට්ටමින් සපයා ගෙන ඒවා උචිත පරිදි භාවිත කරන්න.

පන්ති කාමරය තුළ ඇති පන්ති පුස්තකාලය, පොත් මල්ල සහ කියවීම් ඒකකය සඳහා සිසුන් යොමු කිරීමට වැඩසටහන් නිර්මාණය කරන්න. ඒවා ක්‍රියාත්මක කරන්න. (මෙම වැඩසටහන් ස්ථාවර හා නිරන්තර වැඩ ලෙස අඛණ්ඩ ව පවත්වා ගෙන යන්න)

මව්බස විෂයය යටතේ සිසුන්ගේ වාංමාලාව පෝෂණය කිරීම සඳහා ''පද පොතක්'' (නාම පද, ක්‍රියා පද, සමානාර්ථවත් පද, විරුද්ධාර්ථවත් පද, යුගල පද ආදී භාෂාවේ ඇති විවිධ පද වර්ග රැස් කරගෙන එක් එක් සිසුවා විසින් පවත්වා ගෙන යන පොතකි.) පවත්වා ගෙන යන්න.

තෝරා ගත් ගුවන් විදුලි හා රූපවාහිනී ළමා අධ්‍යාපනික වැඩසටහන්වලට සවන් දීමට හා නැරඹීමට සිසුනට අවස්ථාව ලබා දෙන්න. (මේ පිළිබඳ ව පන්ති කවවල දී දෙමාපියන් දැනුවත් කරන්න.)

නිර්මාණශීලී හා විශේෂ දක්ෂතා ඇති සිසුනට අත දීමේ පියවරක් ලෙස ඔවුන් ගුවන් විදුලි, රූපවාහිනී වැඩසටහන්වලට යොමු කිරීමටත්, පුවත්පත්වල ළමා පිටු සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීමටත් යොමු කරන්න.

සෙමින් හා වේගයෙන් ඉගෙන ගන්නා සිසුන් දෙපිරිස ම ඔබට අභියෝගයක් බැවින් ඔවුන් සඳහා උපකාරක හා අභියෝගාත්මක වැඩ සැලසුම් කිරීම ඔබ සතු යුතුකමක් හා වගකීමක් ලෙස සලකන්න.

## පෙළ පොත භාවිතය සඳහා උපදෙස්

1. ඉගැන්වීමේ කාර්යයට පෙර ගුරුවරයා පෙළ පොත හොඳින් අධ්‍යයනය කළ යුතු වේ.

2. පෙළ පොතේ පාඩම් ඉදිරිපත් කිරීමේ දී අපේ රට හා අප සතු සාරධර්ම, සත්ත්ව හා ශාක ලෝකය, විද්‍යාත්මක සොයා ගැනීම්, පරිසර සුන්දරත්වය හා සංරක්ෂණය, ආරක්ෂාව හා පරිස්සම, කෘෂි කර්මාන්තය, සාහිත්‍යය හා රස වින්දනය යන විවිධ ක්ෂේත්‍ර පදනම් කර ගත් දර්ශනයක් සහිත වන බැවින් ඒවා වඩා අර්ථවත් ලෙස ශිෂ්‍යයා සතු කිරීම ඔබට පැවරේ.

3. වසරින් වසර ශිෂ්‍යයා තුළ ක්‍රමික භාෂා නිපුණතාවක් ඇති වන සේ පෙළ පොත සැලසුම් කර ඇති බව සැලකිල්ලට ගන්න.

4. සවන් දීම, කතා කිරීම, කියවීම, ලිවීම යන භාෂා ක්ෂේත්‍ර හතර ම ශිෂ්‍යයන් විසින් ප්‍රගුණ කළ යුතු බැවින් පෙළ පොත කියවීම් ක්ෂේත්‍රය සඳහා පමණක් භාවිත කිරීම අපේක්ෂා නොකරන අතර එය සෙසු භාෂා ක්ෂේත්‍ර සමඟ ද සමෝධානය කර ගත යුතු වේ.

5. පස්වන ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති භාෂා නිපුණතා ඉටු කර ගැනීම සඳහා යෝජනා කර ඇති ඇතැම් ක්‍රියාකාරකම්වලට සමාන ක්‍රියාකාරකම් පෙළ පොතෙන් ද සොයා ගත හැකි ය. එසේ ම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතැම් ක්‍රියාකාරකම් සඳහා පෙළ පොත සහාය කර ගත හැකි ය. එවැනි අවස්ථා මොනවා දැයි පෙළ පොත හා ගුරු මාර්ගෝපදේශ හොඳින් අධ්‍යයනය කර හඳුනා ගන්න.

## 06. පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

පන්ති කාමරය තුළ සිදු වන ගුරු-සිසු අන්තර්ක්‍රියා සහිත ඉගෙනුම් අවස්ථා පමණක් සිසුන්ගේ භාෂා වර්ධනයට ප්‍රමාණවත් නොවේ. භාෂා වර්ධනය ඉලක්ක කර ගත් වැඩසටහන් රාශියක් පාසල තුළ ක්‍රියාත්මක විය යුතු ය. එසේ ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන් කිහිපයක් පහත දැක්වේ. මේවා පාසල් හා පන්ති ප්‍රතිපත්ති වශයෙන් සැලසුම් කර ක්‍රියාවට නැංවීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ.

- උදෑසන රැස්වීම් හා පන්ති රැස්වීම්
  - කථන ක්‍රියාකාරකම්
  - සවන්දීම සඳහා ක්‍රියාකාරකම්
  - නිවේදන
  - ප්‍රවෘත්ති විකාශය
  - දවසේ සිතිවිලි
  - නැරඹීම් අවස්ථා (විද්‍යුත් මාධ්‍යය)
- විවිධ ප්‍රසංග
  - සාමූහික හා කේවල ඉදිරිපත් කිරීම්
  - රංගන හා රූපණ
  - විනෝදාත්මක ඉදිරිපත් කිරීම්
- ප්‍රදර්ශන
  - නිර්මාණාත්මක ලේඛන (පොත්, සඟරා, ලිපි)
  - චිත්‍ර, කාටූන්

- ඉගෙනුම් ආධාරක
- තැනීම්

- සිගිති පොළ
  - චරිතාරෝපිත කතා
  - භූමිකා රංගන
  - රංගන හා රූපණ

- ආගමික හා සංස්කෘතික වැඩසටහන්
  - භක්ති ගීත
  - කැරොල් ගීත
  - මව් ගුණ ගී, දේශාභිමානී ගී
  - නාට්‍ය
  - ජන ගී
  - වීදි නාට්‍ය
  - අවුරුදු උත්සව

- ළමා සාහිත්‍ය මාසය
  - භාෂා දින සංවිධානය
  - අත් අකුරු තරග
  - කියවීමේ තරග
  - පොත් එළිදැක්වීම (කවි, ගීත, නාට්‍ය)
  - නාට්‍ය තරග
  - ජන ගී, ජන නැටුම්
  - නිවේදක තරග
  - සුබ පැතුම් පත්, ආරාධනා පත්, පෝස්ටර් සැකසීමේ තරග
  - ශ්‍රී ලාංකික සාහිත්‍යකරුවන් පිළිබඳ තොරතුරු රැස් කිරීමේ තරග

- බිත්ති පුවත්පත, නිර්මාණ පැදුර
  - නිර්මාණාත්මක ලේඛන
  - පද්‍ය නිර්මාණ/ගද්‍ය නිර්මාණ
  - චිත්‍ර, කාටූන් චිත්‍ර
  - නිසඳැස් සංකල්පනා

- පාඨක සමාජ
  - පන්ති පුස්තකාල භාවිතය
  - පොත්පත්, සඟරා හුවමාරු කිරීම

ඉහත දැක්වෙන පාසල් වැඩසටහන්වල දී සිසුන්ගේ භාෂා කුසලතා වර්ධනය සඳහා මෙම ක්‍රියාකාරකම් හා වැඩසටහන් සංවිධානය කරන්න. මෙම වැඩසටහන් වාර්ෂික සැලැස්මට ද ඇතුළු කරන්න.

- එළිමහන් කියවීම් ඒකකය
  - කියවීම් ලෑල්ල
  - පොත් මලු, පොත් පෙට්ටි, පොත් කූඩ භාවිතය

## 07. ශිෂ්‍ය ප්‍රගතිය තක්සේරු කිරීම

මෙම ශ්‍රේණියේ දී මව්බස විෂය තුළ ලිඛිත පරීක්ෂණ වැනි ඇගයීම්වලට වඩා ප්‍රමුඛත්වය දිය යුත්තේ සිසුන් සමඟ වැඩ කරමින් හා සිසුන්ගේ වැඩ නිරීක්ෂණය මගින් සිදු කරන ඇගයීම් විධිවලට ය. සෙල්ලම් හා විනෝදජනක වැඩ ක්‍රියාකාරකම්, පෙළ පොත භාවිතය වැනි අවස්ථාවල දී නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්න වැනි ක්‍රම මගින් පස්වන ශ්‍රේණියට අදාළ නිපුණතා වර්ධනය වීම සිදු වන්නේ දැයි නිරතුරු ව තොරතුරු රැස් කරමින් තක්සේරු කළ යුතු ය. අවශ්‍ය අවස්ථාවල දී ප්‍රතිකාර්ය ඉගැන්වීම් සංවිධානය කර ගනිමින් සිසුන් ප්‍රාප්ති මට්ටම් කරා ළඟා කරවන්න.

★ ශිෂ්‍ය ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදා ගත හැකි වාර්තා

- කණ්ඩායම් වැඩ, ප්‍රගති සටහන්
- කාර්ය සාධන ගොනුව
- බිත්ති පුවත්පතට ඉදිරිපත් කළ ලිපි එකතුව
- විෂය තක්සේරු පත්‍රිකා
- අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා වාර්තා
- සිසු කෙටි සටහන් පොත
- විශේෂ අවශ්‍යතා ඇති (සෙමින්/වේගයෙන් ඉගෙනුම ලබන) සිසුන් සම්බන්ධ වාර්තා
- කණ්ඩායම් වැඩ/ප්‍රගති සටහන්/ගෙදර වැඩ නිමවුම් එකතුව

# 4.1 සවන්දීම

භාෂාවේ මූලික කුසලතා, ඒවා ලබා ගන්නා ආකාරය අනුව ග්‍රහණය කර ගැනීමේ කුසලතාව හා ප්‍රකාශ කිරීමේ කුසලතාව යනුවෙන් දෙයාකාර ය. සවන් දීම හා කියවීම ග්‍රහණ කුසලතා වේ. කතා කිරීම හා ලිවීම ප්‍රකාශන කුසලතා වේ. මේවා සවන්දීම, කතා කිරීම, කියවීම හා ලිවීම යනුවෙන් පෙළගස්වනු ලැබේ. මෙම කුසලතා හතරෙන් සවන් දීමේ කුසලතාව ප්‍රධාන වූත් ඉතාමත් වැදගත් වූත් කුසලතාවකි. ශබ්දය කනට ඇතුළු කර ගැනීම සවන් දීම නම් වේ. අධ්‍යාපනයේ දී සවන් දීම ඉතා පුළුල් අර්ථයක් ගනී. පිටවන ශබ්ද කනට ඇතුළු කර ගෙන එහි අර්ථය වටහා ගැනීම සවන් දීම නම් වේ. ශබ්දවලින් හැදෙන අකුරු, එම අකුරුවලින් හැදුනු වචන, එම වචනවලින් තැනුණු වාක්‍ය, වාක්‍යවලින් නැගෙන අර්ථයත් යන ඒවා ඇතුළත් වූ විට එය භාෂාව වේ. භාෂාව ඉගෙන ගැනීම සඳහා වූ ප්‍රධාන දොරටුව දෙසවනයි. සවන් දීම තුළින් ඉගෙනුම් ක්‍රියාවලියේ විශාල කාර්ය භාරයක් ඉටුවේ. ළමුන්ගේ සවන් දීමේ ප්‍රමාණය මත භාෂාව කතා කිරීමේ ප්‍රමාණය රඳා පවතී.

## 4 . 1 සවන්දීම

### නිපුණතාව

4.1.1 වින්දනය සඳහා සවන් දී ප්‍රතිචාර දක්වයි.

### නිපුණතා මට්ටම

4.1.1.1 රසවත් කවි/ගීවලට සවන් දී තාල තබයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

ළමා මට්ටමට ගැළපෙන කවි/ගී තෝරා ගැනීමේ දී පහත සඳහන් කරුණු කෙරේ අවධානය යොමු කරන්න.

- සරල පද මාලාවකින් යුක්ත වීම.
- පහසුවෙන් තාල තැබීමට හැකි වීම.
- ශබ්ද රසයෙන් යුක්ත වීම.
- අර්ථය පහසුවෙන් අවබෝධ වන පද මාලාවකින් යුක්ත වීම.

### ක්‍රියාකාරකම - 1

පහත සඳහන් කවි/ගී සිසුන්ට සවන්දීමට සලස්වන්න. එම කවි/ගීවලට තාල තැබීමටත් ගායනයටත් සිසුන් යොමු කරවන්න.

### උදාහරණ - 1

*රන් ටිකිරි සිනා*
*මුව මුව පාලා*

- ඔගස්ටස් විනයාගරත්නම් -

### උදාහරණ - 2

*දොඩම් කපාලා ඇඹුල් තනාලා*
*නාන්න යන හැටි බලන් කලූ*
*සේලේ ඇඳලා නෙරිය තියාලා*
*මිදුලේ සක්මන් කරයි කලූ*

*දහසක් දීලා වළලු තනාලා*
*දෑතේ අතලා බලයි කලූ*
*දුනුකේ මල සේ උළුගෙයි ඇඳ පිට*
*ඔළිඳ කෙළින හැටි බලන් කලූ*

උදාහරණ - 3

*ඈත සිටන් එන්නි සෙල්ලි සෙල්ලියේ*
*මෑත සිටන් එන්නි සෙල්ලි සෙල්ලියේ*
*කරේ බැන්ද පවලම් වැල නොසෙල්ලියේ*
*පැරකුම් රජුගෙ දුව නවරත්න වල්ලියේ*

උදාහරණ - 4

*අන්න බලන් සඳ රන් තැටියෙන්*
*සුදු සීත ගඟුල් ගලනා*
*හද ශෝක තැවුල් නිවනා*
*චන්දන පල්ලව කෝකිල කූජන*
*සංගීතයේ පැටලී*

කුණ්ඩලකේශී නාට්‍යය

උදාහරණ - 5

*වැල්ල සිඹින රැල්ල අපට මෙහෙම කියනවා*
*අදට වඩා එළිය සඳක් හෙට පායනවා*
*දෙතුන් දවස කන්න නැතත් ශෝක නෑ හිතේ*
*විනෝද මිහිරක් ගෙනදෙයි මුහුදු ජීවිතේ*

*ලෙයි ලිලයි ලයි.... සිසිලයි සුළඟයි.... //*

පද රචනය - කරුණාරත්න අබේසේකර

උදාහරණ - 6

*මිණි මුතු කහවණු සම්පත් ගෙන දෙයි*
*ජල උල්පත් මහ පොළොවෙන් මතු වෙයි*
*දැව දඬු රන්පස මතුපිට පැළ වෙයි*
*මේ පින්බිම සුරැකුම යුතුකම වෙයි*

පද රචනය - රෝහිණී චිත්‍රලතා

උදාහරණ - 7

*ලීලයි කමලයි චම්පයි රේඛයි*
*භානුමතියි නයනයි සඳ ලේඛයි*
*දිය ගෙන යාමට එන ළිඳ මේකයි*
*මේ ළිඳ ළඟ නිතරම අවිවේකයි*

- පද්‍යාවලී -

අවධානය යොමු කළ යුතු කරුණු

තුන්වන හා හතරවන ශ්‍රේණිවල රසවත් කවි/ගී ගණනාවක් හා කැසට් පට සමූහයක් යෝජනා කර ඇත. ඒවායින් ගැළපෙන කවි/ගී භාවිතයට ගන්න. පෙළපොතේ ඇතුළත් කවි, ගී ද මේ සඳහා යොදා ගන්න.

එච්. ඩී. ජයතිලක, ආනන්ද රාජකරුණා, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ, මුනිදාස කුමාරතුංග, ඩබ්ලිව්. ඒ. අබේසිංහ වැනි ලේඛකයන් සරල බසින් ලියා ඇති වෙනත් කවි, ගී තෝරා ගන්න.

## නිපුණතා මට්ටම

4.1.1.2 කතන්දරවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

කතන්දරයක් තෝරා ගැනීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

- සිනහව, සතුට, කරුණාව, ඉවසීම, කුතුහලය, නුවණැති බව සහ යහපත් ආකල්ප ලබා දිය හැකි වීම.
- චරිත අනුකරණයට හා සිද්ධි නිරූපණයට අවස්ථාව තිබීම.

ක්‍රියාකාරකම - 1

උදාහරණ - 1

- සරල සිද්ධි ඇතුළත් කතන්දර
- උම්මග්ග ජාතකයෙන් ගත හැකි සරල කතා
- ඓතිහාසික සිද්ධි ඇතුළත් කතන්දර
- ජනප්‍රවාදයේ එන කතා

කතාවක් හෝ කතන්දරයක් හෝ ඉදිරිපත් කිරීමෙන් පසු පහත සඳහන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න. කණ්ඩායම් වීමේ දී සිසුන්ගේ රුචිය අනුව කණ්ඩායම් වීමට අවස්ථාව දෙන්න.

කණ්ඩායමේ සමබරතාව රැක ගැනීමට ගුරු මැදිහත්වීම අවශ්‍ය වේ.

### කණ්ඩායම් අංක 1

කතන්දරයේ සිද්ධි ඇතුළත් චිත්‍ර කතාවක් ගොඩනැඟීම.

### කණ්ඩායම් අංක 2

කතන්දරයේ සිද්ධි/අවස්ථා අනුපිළිවෙළින් වාචික ව ඉදිරිපත් කිරීම.

### කණ්ඩායම් අංක 3

රූකඩ, වෙස්මුහුණු යොදා ගෙන කතන්දරය රඟ දැක්වීම.

### කණ්ඩායම් අංක 4

කතන්දරය ඇසුරෙන් පද්‍ය පංතියක් නිර්මාණය කිරීම.

කණ්ඩායම් ක්‍රියාකාරකම්වලින් සිසුන්ගේ රසවින්දනය තීව්‍ර වන අන්දමින් ඉදිරිපත් කිරීමට වග බලා ගන්න.

### අවධානය යොමු කළ යුතු කරුණු

▲ මව්බස විෂය පෝෂණය සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් ඉදිරිපත් කර ඇති කැසට්පටවල අඩංගු කතන්දර සිසුන්ට සවන් දීමට සලස්වන්න.

- මව්බස
- කතන්දර
- සාම කතන්දර
- සිංහල 5

▲ තුන්වන හා හතරවන ශ්‍රේණිවල දී යෝජනා කර ඇති කතන්දර මේ සඳහා යොදා ගන්න.

## නිපුණතා මට්ටම

4.1.1.3 විරිදුවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

විරිදු තෝරා ගැනීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
- ළමා මට්ටමට ගැළපීම.
- විවිධ ශෛලීන්වලට ගායනා කළ හැකි වීම.
- සිසුන්ට ආදර්ශ ලබා ගත හැකි වීම.

### ක්‍රියාකාරකම - 2

ගුරුවරයා විසින් ගායනා කිරීමෙන් හෝ කැසට් පටයක ආධාරයෙන් හෝ පහත සඳහන් විරිදු සිසුන්ට සවන් දීමට සලස්වන්න.

විරිදු ගායනයේ දී අත් රබාන යොදා ගන්න.

### උදාහරණ - 1

*විජය රජු :* *ලක්දිව ජයකොඩි බන්දා -*
*මෙහි රජ විය යුතු හිංදා*
*ගන්නෙමි රජ කුමාරියක් -*
*මම භාරතයෙන් කැන්දා*

*කුවේණි :* *අයියෝ මේ මොන පවක් ද -*
*වින්දේ කොපමණ දුකක් ද*
*කුවේණියව පිටු දකින්න -*
*ඔබේ පපුව කළු ගලක් ද*

*විජය රජු :* *පොව පොව මුදු රස ආලේ -*
*පෙන්වා යකිනියක බලේ*
*තී මා පටලව ගත්තේ -*
*තිගෙ මායම් ගැහැනු දැලේ*

*කුවේණි :* *ඉස්සර නම් සුපියකරු ය*
*පවනට තුඩුදෙවන හිරු ය*
*කොයි පිරිමින්ගෙත් හොඳ හිත*
*කාරිය කර ගන්න තුරු ය*

*විජය රජු :* *මොහොතක් මේ ගැන සිතන්න*
*තිට කරුණක් නැහැ අඬන්න*
*යක්ෂණියක් සමග හැකි ද*
*රජෙකුට කිරුළක් දරන්න*

*තිගෙ මායම් වැඩ හින්දා -*
*වින්දෙමි මම නව නින්දා*
*තී යක්ෂණියක් හින්දා -*
*විය රජ කිරුළට බාදා*

*කුවේණි : සිටියත් මම ඔබ සන්දා*
*විඳි ගැරහුම් නව නින්දා*
*ඉසිලූ දුක් ගිනි කන්දා*
*ඔබ හට නොපෙනෙද මන්දා*

*විජය රජු : පුතු දිවහත් දූ දිශාල -*
*ගැන නම් මට හිතට දුකයි*
*තී යක්ෂණියක් හින්දා*
*මට නම් උන් ගැන ද සැකයි*

*කුවේණි : පුංචි පුතා කර පින්නං*
*පොඩි දුව උකුලට ගන්නං*
*නුඹට එපා නම් හිමියනි*
*ඔළුව හැරුණු අත යන්නං //*

උදාහරණ - 2

★ *ලොවේ දසත පූජිත ගරු සිංහල ජාතියෙ උපන්න දුවේ නුඹට මම දෙන මේ දැනමුතුකම් හිතට ගන්න හොඳමයි අම්මේ කියන්න...*

උදාහරණ - 3

★ *අඳුර මැකෙන්නේ ආලෝකය ලැබුණාමයි*
*නුවණ වැඩෙන්නේ ඉගෙනුම සපල වුණාමයි*

*උගත්කමයි ලොව හැම ගැටලුව ජය ගත්තේ*
*එයින් තමයි නැණ ගුණ බල නිති රැකගත්තේ*

*ඉගෙනුම ජය ගත්තේ - එල ඉන් ලැබ ගත්තේ*

*රට දැය ලක් දරුවන් වන අපහට බාරයි*
*එය සුරැකුම පණ නල ලෙස අප කළ යුතුමයි*

*හෙළ දරුවන් වීර විකුම් සිහියට එන්නේ*
*මී මුත්තන් ගිය පාරේ යා යුතු වන්නේ*

*අපෙ සිරිලක් අම්මේ - ඔබෙ ගුණ නැත නිම්මේ*

*හොඳ පුරවැසියන් වෙන්නට වෙහෙසෙමු සැම දා*
*උගත්කමේ රන් අබරණ ගන්නෙමු පළ ඳා*

*මිනිස්කමයි නැණ බලයයි එක්විය යුත්තේ*
*හැම බාධක බිඳ ජයටැඹ වෙත යා යුත්තේ*

*බාධක ජය ගනිමු - ඉගෙනුම එල ලබමු ... //*

පද රචනය - සිරිල් ජයරත්න

අවධානය යොමු කළ යුතු කරුණු

▲ විරිදු ගායනය සඳහා උචිත ශෛලියෙන් ම සවන්දීමට යොමු කළ යුතු බැවින් සම්පත් පුද්ගලයින් ලවා හෝ කැසට්පට භාවිතයෙන් හෝ සිසුන්ට සවන්දීමට සලස්වන්න.

▲ තුන්වන හා හතරවන ශ්‍රේණි ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල ඇතුළත් ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කරන්න.

## නිපුණතා මට්ටම

4.1.1.4 නාට්‍යවල ඇතුළත් සංවාදවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

නාට්‍යමය කොටසක් තෝරා ගැනීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
- අලංකාර යෙදුම් සහිත වීම.
- ශබ්ද රසය ඉස්මතු වීම.
- රඟ දැක්වීමට හැකි අවස්ථා තිබීම.

ක්‍රියාකාරකම

උදාහරණ - 1

පෙළපොතේ ඇතුළත් නාට්‍යමය කොටස් තෝරා ඉදිරිපත් කිරීම.

උදාහරණ - 2

හුණුවටයේ නාට්‍යයේ ඇතුළත් දෙබසක් පහත දැක්වේ. එය සිසුන්ට සවන් දීමට අවස්ථාව ලබාදෙන්න. මෙය නාට්‍යානුසාරයෙන් සිසුන් ලවා ඉදිරිපත් කරවන්න.

*''(කැඩී වැල් එල්ලෙන පාලමක්. මිනිසුන් දෙදෙනෙක් හා ගැහැනියක් ද පාලමෙන් එතෙර වීමට බියෙන් මෙගොඩ වෙති. කැඩී එල්ලෙන වැල් පාලමේ එක් වැලක් ඇද ගැනීමට දිගු ලියක් අතින් ගත් එක්*

*මිනිසකු වැර දරනු පෙනේ. දරුවා ද රැගෙන ගෘෂා ද මේ අසළට කලබලයෙන් එයි.)*

*පළමුවන මිනිහා :*

*කලබල වෙන්න කාරියක් නැහැ දරුව. පේන්නෙ නැද්ද එගොඩ වෙන්න බැරි බව පාලමෙන්?*

*ගෘෂා :*

*මම එගොඩ වෙන්න ඕනෑ කොහොම හරි. එගොඩ උතුරට ගෙනියන්න ඕනෑ මේ දරුව ව අපේ අයියලැයි ගෙදරට.*

*ස්ත්‍රියක් :*

*කොහොම හරි කොහොම ද කොහොම හරි යන්නෙ? යකා පස්සෙන් එළවනව කිව්වත් මම නම් නෑ ඔය පාළමට අඩියක් තියන්නෙ. පහළ හෙළට වැටිල බෙල්ල කඩාගන්න ඕනෑ නම් මිසක්.*

*(ගෘෂා විසින් පහර දෙන ලද සෙබළු ඇය සොයා එති. එනිසා ඇයට ඉක්මනින් වැල්-පාලමින් එතෙර වී යාමට අවශ්‍ය වී ඇත.)*

*ගෘෂා :*

*අයින් වෙනව ද පොඩ්ඩක් මට පාලමෙන් එගොඩ වෙන්න?*

*දෙවන මිනිහා :*

*මැරෙන්න හදනව ද? පේනව ද හෙළ? පාතාල ලෝකෙ වගේ.*

*පළමුවන මිනිහා :*

*බෙල්ල කඩාගන්න හදනව ද?*

*ගෘෂා :*

*ඒකට කමක් නැහැ. මම යන්න ඕන කොහොම හරි.*

*ස්ත්‍රිය :*

*ඔය දරුවත් වඩාගෙන හෙළ පල්ලෙ වැටෙන්න ද හදන්නෙ?*

*ගෘෂා :*

*එන්නෙත් එකට. යන්නෙත් එකට.''*

හුණුවටයේ කතාව - හෙන්රි ජයසේන

### අවධානය යොමු කළ යුතු කරුණු

- ▲ නාට්‍ය සංවාද කොටස් පටිගත කරගන්න.
- ▲ තුන්වන හතරවන ශ්‍රේණිවල ඇතුළත් නාට්‍ය කොටස් සිසුන්ට නැවත සවන් දීමට සලස්වන්න.
- ▲ ජාතික අධ්‍යාපන ආයතනය විසින් සම්පාදනය කර ඇති කැසට් පටවල ඇතුළත් නාට්‍ය සංවාද කොටස් මේ සඳහා යොදා ගන්න.
- ▲ සිසුන් ලවා නාට්‍ය දෙබස් නිර්මාණය කර රඟ දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.
- ▲ මෙවැනි නාට්‍ය දෙබස් ඇතුළත් කැසට් පටයක් සම්පාදනය කිරීමට උත්සාහ ගන්න.

## නිපුණතාව

4.1.2 සවන් දී අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

## නිපුණතා මට්ටම

4.1.2.1 සවන් දී වචනවල තේරුම අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

- සවන් දී වචනවල තේරුම අවබෝධ කර ගැනීමට සුදුසු වාක්‍ය, වාක්‍යාංශ, ඡේද, කවි, ගී තෝරා ගන්න.
- මෙම නිපුණතා මට්ටම යටතේ පාඩම් සැලසුම් කිරීමේ දී,
  - 4.1.2.2 සවන් දී වැදගත් කරුණු අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.
  - 4.1.2.3 සවන් දී වැදගත් සිද්ධි අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.
  - 4.1,2.4 සවන් දීමෙන් ප්‍රධාන අදහස අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.
  - 4.1.2.6 සවන් දී අලංකාරවත් යෙදුම් අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.

යන නිපුණතා මට්ටම් ද සමෝධානය කරගන්න.

### ක්‍රියාකාරකම - 1

- පහත සඳහන් ඡේදය සිසුන්ට සවන්දීමට අවස්ථාව සලසන්න.
- ඡේදය පිළිබඳ සිසුන් සමග කතාබහක යෙදෙන්න. සිසුන්ට පැවරුම ඉදිරිපත් කර ප්‍රතිචාර ලබා ගන්න. සෑම පැවරුමකට ම සෑම සිසුවකු ම ප්‍රතිචාර දැක්වීමට අවස්ථාව සලසා දෙන්න.

## උදාහරණ - 1

*''අප රිංගු ගඟ අද්දර කැලේ එක පැත්තක අහස අල්ලන්නට මෙන් ඉහළ නගින්නේ කඳු ගැටයක් නිසා ය. ඒ කඳු ගැටය මුදුනේ දැවැන්ත කළුගලක් ඇත. එය අපේ ගම දෙස බලා සිටින අද්භූත මිනිසකු වැන්න. කුඩා කළ මේ ගල් පර්වතය අප සිත බියෙන් තැති ගැන්වී ය. හැන්දෑවට මේ ගල මුදුනට මලානික අව් ඇල්ලක් වැටෙයි. එය රාස්සිගේ අව්ව යැයි වැඩිහිටියෝ කීහ. රාස්සි ඒ ගල මත්තෙහි වී වනා වේලන්නේ ඒ වෙලාවට යැයි ඔවුහු අපට කියා දුන්හ. ඒ නිසා අප කඳු මුදුන දෙස වැඩිපුර බැලුවේ නැත. වැරදිලාවත් බැලුවේ නම් අප තුළ ඇති වූයේ රාස්සිය දුටුවා හා සමාන තැති ගැන්මකි.''*

ගඟ අද්දර කැලේ - සෝමවීර සේනානායක

### පැවරුම් අංක 01

▲ අද්දර, පර්වතය, මලානික, අහස, දැවැන්ත යන මෙම වචනවලට සමානාර්ථවත් පද ඉදිරිපත් කරන්න.

### පැවරුම් අංක 02

▲ පැවරුම් අංක 01 හි වචන යොදා අර්ථවත් වැකි ගොඩනගන්න.

### පැවරුම් අංක 03

▲ බියෙන් තැති ගැන්වී ය, ගඟ අද්දර, අද්භූත මිනිසෙක්, මලානික අව් ඇල්ලක්, ගලමත්තෙහි, කඳු මුදුන මෙම වාක්‍යාංශවල අදහස වෙනත් වචනවලින් ලියන්න.

## ක්‍රියාකාරකම - 2

පහත සඳහන් කවි පෙළ සිසුන්ට සවන්දීමට සලස්වන්න. ඉරි ඇඳි පදවල තේරුම අවබෝධ කරගෙන ප්‍රතිචාර දැක්වීමට අවස්ථාව සලසන්න.

*බානෙන් බැඳ රජ රට පෙදෙසින්නේ*
*කෝච්චියේ හිර ගෙයි ලැග එන්නේ*
*පිහියේ මුවහත ගෙල සිප ගන්නේ*
*උදයෙම මේ කය නිසසල වන්නේ*

*ඇගේ කිරෙන් බෝඩිය දෝවන්නේ*
*උගෙන් මැඩූ බැත දනට පුදන්නේ*
*උන්ගෙම හම බෙර හඬට බඳින්නේ*
*උන් බැඳී ගැල් නැග පන්සල් යන්නේ*

*බානෙන් බැඳ...*

*ලේ කිරි අයිතිය වසු පැටියන්නේ*
*දම් සක්වළ ගල හැපී බිඳෙන්නේ*
*ඒ කිරි උදුරා බිව් මිනිසුන්නේ*
*සිත්වල ඇයි කළ ගුණ නොරැඳෙන්නේ*

පද රචනය - ප්‍රේමකීර්ති ද අල්විස්

## ක්‍රියාකාරකම - 3

▲ පහත දැක්වෙන ගීතය සිසුන්ට සවන් දීමට සලස්වන්න. එම ගීතයේ ඇතුළත් වචනවල අදහස පිළිබඳ කතාබහක යෙදෙන්න.

*ලලිත කලා ඔප කරලා*
*සීගිරි ළඳුනේ ඇයි ඔබ තනිවී*
*සෝ දුකිනී ඉන්නේ...*

*රතැඟිලි මොළවා කුසුම් නෙළා ගෙන*
*බුදු පුදට ද යන්නේ*
*බලන්නකෝ අනේ අප දෙස ළඳුනේ*
*සීගිරි සිනහ පපා*

*මියුරු බසින් අප නළවා*
*සුරගන රැගුමක් සොඳුරේ රඟපා*
*අප සනසනු සැනිනා*

*දෙපා නගන්නට නම් බෑ අයියෝ*
*ඔබ තනිකර දමලා*
*ඔබ වැනි සුන්දර සුරූපියන්*
*ඇයි ගල් ගෙයි තැවෙනු දුකින්*

පද රචනය - හර්බට් එන්. සෙනෙවිරත්න

## අවධානය යොමු කළ යුතු කරුණු

▲ පෙළපොතේ ඇති පාඩම්වලට සවන් දීමෙන් පසු ඒවායේ ඇතුළත් වචනවල තේරුම පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡාවක් කරන්න.

▲ තුන්වන සහ හතරවන ශ්‍රේණිවල දී සිසුන් විසින් සකස් කරන ලද පද පොත පස්වන ශ්‍රේණියේ දී ද පවත්වාගෙන යාම වැදගත් වේ.

## නිපුණතා මට්ටම

4.1.2.2 සවන් දී වැදගත් කරුණු අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

- සවන් දී වැදගත් කරුණු අවබෝධ කරගෙන ප්‍රතිචාර දැක්වීමට සුදුසු පණිවිඩයක්, ඓතිහාසික පුවතක් තෝරාගෙන සවන්දීමට සලස්වන්න.
- එම අවස්ථා හා සම්බන්ධ වැදගත් කරුණු ඉස්මතු වන ආකාරයට පැවරුම්පත් ඉදිරිපත් කරන්න.

### ක්‍රියාකාරකම - 1

- පහත සඳහන් පණිවිඩය පටිගත කරගන්න. එය සිසුන්ට සවන්දීමට සලස්වන්න.
- එහි සඳහන් වැදගත් කරුණු මතුවන සේ ප්‍රශ්න අසන්න. ඒ අනුව සාකච්ඡාවක් අරඹන්න.

**සෞඛ්‍ය හා පෝෂණ කටයුතු අමාත්‍යාංශයේ පාසල් සෞඛ්‍ය ඒකකයේ පණිවිඩයකි.**

පාසල් සිසුනි,

වර්තමානයේ ශ්‍රී ලංකාවේ පාසල් සිසුන් අතර දියවැඩියා රෝගය සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන බව පාසල් සෞඛ්‍ය ඒකක හඳුනාගෙන ඇත.

ඔබත් මෙම රෝගයෙන් ආරක්ෂා වීමට නම් පහත සඳහන් ආහාර පුරුදු අනුගමනය කරන්න.

- ★ ඔබගේ ප්‍රධාන ආහාර වේල සඳහා කෙඳි සහිත ආහාර එක්කර ගන්න.
- ★ පිරිසිදු නැවුම් එළවළු, පලතුරු හා පලාවර්ග ආහාරයට ගන්න.
- ★ සෑම ප්‍රධාන ආහාර වේලකින් පසුව නැවුම් පලතුරක් එක්කර ගන්න.
- ★ තිරිඟු පිටිවලින් නිෂ්පාදනය කෙරෙන ආහාර වර්ග හැකිතාක් දුරට අඩුකර ගන්න.
- ★ කෘත්‍රිම බීම වර්ග පානය කිරීමෙන් බැහැර වන්න.
- ★ දිනපතා නැවුම් එළකිරි වීදුරුවක් පානය කරන්න.
- ★ දිනකට අවශ්‍ය ජල ප්‍රමාණය පානය කරන්න.

*මේ පණිවිඩය සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යාංශයෙනි*

පැවරුම

පහත දී ඇති ප්‍රශ්නවලට ලිඛිත/වාචික පිළිතුරු ලබා ගන්න.

1) මෙම පණිවිඩය නිකුත් කර ඇත්තේ කුමන අමාත්‍යාංශයෙන් ද?
2) පාසල් සෞඛ්‍ය ඒකකය හඳුනාගෙන ඇති ප්‍රධාන ගැටලුව කුමක් ද?
3) පණිවිඩයේ සඳහන් ජීවිතයට එකතු කර ගත යුතු පුරුදු දෙකක් සඳහන් කරන්න.
4) නොකළ යුතු දේවල් ලෙස පණිවිඩයේ සඳහන් වී ඇත්තේ මොනවා ද?

## ක්‍රියාකාරකම - 2

පහත සඳහන් ප්‍රවෘත්තිය සිසුන්ට සවන්දීමට සලස්වන්න. එහි ඇතුළත් වැදගත් කරුණු සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න. ඒවා සාකච්ඡා කරන්න.

- වෙරළ ඛාදනය ඉහළ යයි -

*''නිරිත දිග මෝසම් සුළඟ හැමීම ආරම්භ වීමත් සමග ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ තීරය දැඩි ලෙස ඛාදනයට ගොදුරු වී ඇති බව වාර්තා වේ. උල්හිටියාව, වෙල්ලමංකරේ, සින්නපාඩුව, කන්දකුලිය යන ධීවර ගම්මාන මෙලෙස බහුල ව වෙරළ ඛාදනයට ලක් වී ඇති ප්‍රදේශ වේ. වාර්ෂික ව සිදු වන මෙම වෙරළ ඛාදනය නිසා ධීවර නිවාස හා ධීවර බිම්වලට හානි පැමිණ ඇත.*

*වෙරළ තීරයේ කළුගල් ඇතිරීම, ආරක්ෂිත වන ආවරණයක් සකස් කිරීම ආදී උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමෙන් මෙම තත්ත්වය වළක්වා ගත හැකි බව පාරිසරික විද්‍යාඥයෝ පවසති.''*

## ක්‍රියාකාරකම - 3

පහත සඳහන් ඡේදය සිසුන්ට සවන් දීමට සලස්වන්න. මෙම ඡේදයේ සඳහන් වැදගත් කරුණු සිසුන්ගෙන් විමසන්න.

*''ප්‍රදේශය ම වියළී යන නියං සමය එළඹී තිබුණ බැවින් තලාවේ නිල් පැහැය අතුරුදන් වී ඇත. ඉලුක් තලාව පිදුරු බවට පත්ව අප්‍රාණික ව පොළොවේ වැතිර සිටී. කොළ හැලුණ ලුණුමිදෙල්ල ගස්වල ගෙඩි වලුවල බරට සිහින් අතු අග්ගිස් කවාකාර ව පහත් වී ඇත. ගසේ සෙවනැල්ල ඇට සැකිල්ලක සේයාවකි. වියළි කොළ මතට ලුණුමිදෙල්ල ගෙඩි වැටීමෙන් සර සර නාදය නැග එයි.''*

වනයේ ඇඳුණු පිය සටහන් -
පියසේන කහඳගමගේ

## ක්‍රියාකාරකම - 4

- ▲ පහත සඳහන් ඓතිහාසික සිදු වීමට සවන්දීම පිණිස සිසුන්ට අවස්ථාව දෙන්න. එහි ඇතුළත් වැදගත් කරුණු මතුවන සේ පැවරුම් සකස් කර සිසුන්ට ඉදිරිපත් කරන්න.
- ▲ මෙවැනි වෙනත් ඓතිහාසික සිද්ධි සෙවීමට සිසුන් යොමු කරවන්න.

යාපහුව රාජධානිය

*''දඹදෙණි රාජධානියෙන් පසුව යාපහුව රාජධානිය ශ්‍රී ලංකාවේ අග නගරය බවට පත් විය. යාපහුව රාජධානිය පළමුවන බුවනෙකබාහු රජතුමාගේ විශිෂ්ට නිර්මාණයකි. සතුරු ආක්‍රමණවලට සාර්ථක ව මුහුණ දීමට හැකි වන අයුරින් රාජධානිය වටා දිය අගල්, මඩ අගල්, පවුරු, ආරක්ෂිත දොරටු යනාදියෙන් සමන්විත විය. මෙහි ඇතුළු නුවර හා පිට නුවර යනුවෙන් භූමිය කොටස් දෙකකට වෙන් කර ඇත. ඇතුළු නුවරට අයත් භූමියේ මනා සැලසුමකින් යුතු ව දළදා මැඳුර, පියගැට පෙළ, ද්වාර මණ්ඩපය, රාජ සභාමණ්ඩපය, රජ මාළිගය, විසිතුරු උයන් ආදියෙන් යුක්ත ය.*

*මෙහි විශිෂ්ට නිර්මාණයන් අතර දළදා මැඳුරේ පියස්ස, පියගැට පෙළ, සිංහ රූව, ගල්කුළුණු, නර්තන විලාශ දක්වන කාන්තා රූප උසස් කලා කෘතීන් වේ.*

*ආර්ය චක්‍රවර්තී නම් දකුණු ඉන්දීය ආක්‍රමණිකයා යාපහුව රාජධානියේ ප්‍රෞඪත්වය සම්පූර්ණයෙන් ම විනාශ කර දැමූ බව ඓතිහාසික සාධකවලින් අනාවරණය වේ.''*

## ක්‍රියාකාරකම - 5

▲ *අල්ලට සිගාවත් රස නැති කැවිලි* — *කකා*
*වල් කොළ බිම අතුට නිදි නොලැබ දුක්* — *තකා*
*කල් ගිය රෙදි වැරලි ඇඳ දැලි කුණෙන්* — *වකා*
*ඇල්මෙන් අකුරු උගනිව් ඉදිරි වැඩ* — *තකා*

▲ *වේවැල් කෝටු නාරං සියඹලා* — *අතු*
*කිතුල් පොල් ඉරටු වැල් කසඹිලිය* — *අතු*
*මෙහැම ඉපල් මගෙ දෑසට නොපෑ* — *යුතු*
*පමා නොවී එම් අකුරට මෙයින්* — *මතු*

මෙවැනි කරුණු ඇතුළත් වෙනත් පද්‍යවලට සවන් දීමට සිසුන් යොමු කරවන්න.

### නිපුණතා මට්ටම

4.1.2.3 සවන් දී වැදගත් සිද්ධි අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

- සවන් දී වැදගත් සිද්ධි අවබෝධ කර ගත හැකි ජේද, කතන්දර, ගීත, කවි, නාට්‍ය තෝරා ගන්න.
- මේවා උචිත ශෛලීන්ගෙන් යුතුව පටිගත කරගෙන සිසුන්ට සවන් දීමට සලස්වන්න.
- ඒවායේ ඇතුළත් වැදගත් සිද්ධි මතුවන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

## ක්‍රියාකාරකම - 1

පහත සඳහන් ජේදයට සවන් දීමට සලස්වන්න. වැදගත් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

### උදාහරණ - 1

*''අනුරාධපුර රාජධානියේ රාජ්‍ය කළ වළගම්බා රජතුමා රජ වී දින හතක් ඇතුළත දකුණු ඉන්දියානු ආක්‍රමණයක් අනුරාධපුර රාජධානියට එල්ල විය. වළගම්බා රජතුමා ආරක්ෂාව පතා සෝමා දේවියත් අනුලා දේවියත් අශ්ව රථයක නංවාගෙන අනුරාධපුර දකුණු වාහල් දොරටුවෙන් පලා ගියේ ය. මේ සිද්ධිය දුටු අසල අසපුවක වාසය කළ ගිරි නම් නිඝණ්ඨයා ''මහා කළු සිංහලයා පලා යේ'' යනුවෙන් කෑ ගසන්නට විය.''*

වැදගත් සිද්ධි ඇතුළත් ගීත, කවි, කතන්දර, නාට්‍ය සිසුන්ට සවන්දීමට සලස්වන්න.

### නිපුණතා මට්ටම

4.1.2.4 සවන්දීමෙන් ප්‍රධාන අදහස අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

- සවන්දීමෙන් ප්‍රධාන අදහස අවබෝධ කර ගත හැකි කවි, ගී, ජේද සිසුන්ට සවන් දීමට සලස්වන්න.
- ඒවායේ ප්‍රධාන අදහස මතුවන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

## ක්‍රියාකාරකම - 1

පහත සඳහන් ජේදය සිසුන්ට සවන් දීමට සලස්වන්න. එම ජේදයෙන් මතුවන අදහස වගන්තිවලින් ලියා දැක්වීමට අවස්ථාව දෙන්න.

### උදාහරණ - 1

*'හිරු දවසේ විරාමය ලබන්නට සූදානම් ය. දවසේ මහා මෙහෙවර අවසන් කර ගෙදර යන්නට සැරසෙන <u>මිනිසුන් මෙන් ම විහඟුන් මෙන් ම හිරු ද ගෙදර යයි.</u> නිකම් ම නොවේ. බටහිර අහස රතු තැඹිලි දම් ආදී විවිධ නෙත්කළු වර්ණ මාලාවකින් සරසා සමු ගැනීමේ සාදයක් පැවැත්වීමෙන් අනතුරුව ය.*

*ඒ සාදය වෙනුවෙන් හිරු තාමත් අහස සරසයි. ඒ වෙනුවෙන් හිරුට උදව් කරන්නට පැමිණි වලාකුළු බොහෝමයක් තවමත් සුදු පාට ය. නිල්පාට අහස මත මේ වලාකුළු විවිධ*

*සිත්තම් ඇඳියි. මම බොහෝ වේලාවක් මෙම සොඳුරු සිත්තම දෙස බලා සිටියෙමි.''*

ශ්‍රී ලංකාවේ සුන්දර ස්ථාන -
ශාන්ත කුමාර විතාන

## උදාහරණ - 2

(1) *මව්පිය දෙදෙනව ත්*
*තමන් ගුරුවරයින්ව ත්*
*නුඹෙ වරද ඇසුවො ත්*
*නොසගවා එය කියනු යහප ත්*

සිරිත් මල් දම

(2) *සැඟවෙමි එබෙමි නිසසල වෙමි සසල වෙමි*
*ඇඹරෙමි එහෙත් පසු නොබසිමි නොනවතිමි*
*කවදා කොතැනදි හෝ මහ මුහුද හිමි*
*හමුවුණු තැනදි මා සතු බර ඔහුට දෙමි*

එච්. එම්. කුඩලිගම
සිංහල - 5 කැසට් පටය
ජාතික අධ්‍යාපන ආයතනය

## පැවරුම

කවිවල අදහස තනි වැකියකින් සිසුන්ගෙන් ලබා ගන්න.

## නිපුණතා මට්ටම

4.1.2.5 සවන් දී සිදුවීම් කිහිපයක අනුපිළිවෙළ අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

- සවන් දී අනුපිළිවෙළට කරුණු ගොඩ නැගිය හැකි කවියක්, ඡේදයක් සවන්දීමට සිසුන් යොමු කරවන්න.
- එම සිදුවීම් අනුපිළිවෙළට වාචික ව/ලිඛිත ව ගොඩ නැගීමට සලස්වන්න.

## ක්‍රියාකාරකම - 1

පහත සඳහන් කවි සිසුන්ට සවන්දීමට සලස්වන්න. එහි සඳහන් වැදගත් සිද්ධි අනුපිළිවෙළට ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරවන්න.

- *හනික වරෙල්ලා පේලි සැදෙල්ලා*
*බැස යන හිරු දෙස බලන් නගෝ*
*වැඩ නිම කරලා ගොඩට වරෙල්ලා*
*ඉන පොට හවඩිය ගනින් නගෝ*

- *දොහොත් නගාලා දෙවි නමදිල්ලා*
*සිනහ නගා කෙත බලන් නගෝ*
*සතර වරම් දෙවි පිහිට පතාලා*
*හනි හනිකට අපි යමන් නගෝ*

## ක්‍රියාකාරකම - 2

*අරුණ වලා ඇදෙන්නේ*
*අඳුර පලා දුවන්නේ*
*සිහිල් සුළං හමන්නේ*
*මෙන්න මේ උදේ . . .*

*කැකුළු කුසුම් පිපෙන්නේ*
*මුකුළු සිනා නැගෙන්නේ*
*කුරුලු ගීත ඇසෙන්නේ*
*මෙන්න මේ උදේ . . .*

*කුකුළුහාමි අසන්නේ*
*කවුද තාම නිදන්නේ*
*ඇවිත් වැඩට බසින්නේ*
*මෙන්න මේ උදේ . . .*

## ක්‍රියාකාරකම - 3

පහත සඳහන් ඡේදය සිසුන්ට සවන් දීමට සලස්වන්න. මෙහි සඳහන් සිදුවීම් කිහිපයෙහි අනුපිළිවෙළ ගොඩ නැගීමට සිසුන් යොමු කරවන්න.

*''පොසොන් මාසය ලබත් ම හේනේ වල් කෙටීම ඇරඹෙයි. එක් මසක් පමණ ගත වන විට අක්කර දෙක තුනක් කොටා ගැනීමට හේන් ගොවියෝ සමත් වෙති. නිකිණි මස සැඩ සුළං සහිත ය. මේ කාලයේ කළ යුතු වැදගත් කාරිය හේන ගිනි තැබීමයි. හේන පුළුස්සා*

*අවසන් වීමත් සමග වැට බැඳීම ආරම්භ වෙයි. ඔක්තෝබර් නොවැම්බර් මාසවල වසින වර්ෂාව ගොවි සිත් සතුටු කරවයි. ඒ බීජ වැපිරීම අරඹන කාලයයි. බීජ වපුළ මොහොතේ සිට ම හේනට සතුන්ගෙන් කරදර ඇති වේ. ඒ නිසා වගා කිරීම අවසන් කිරීමත් සමග ම පැල් තැනීමට ගොවීන්ට සිදු වේ. හේනේ නොදැවී ඉතිරි වුණු ගස් දෙබලක ආධාරයෙන් පැල සාදා ගැනීමට ඔවුහු වෙහෙස වෙති.''*

## නිපුණතා මට්ටම

4.1.2.6 සවන් දී අලංකාරවත් යෙදුම් අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

අලංකාරවත් යෙදුම් සහිත රසවත් ගද්‍ය හා පද්‍ය කොටස්වලට සවන් දීමට අවස්ථාව ලබා දෙන්න. පහසුවෙන් ම වැටහෙන සරල පද මාලාවකින් යුත් රසවත් යෙදුම් සහිත ගද්‍ය හා පද්‍ය තෝරා ගැනීම සුදුසු වේ. මෙහි දී පහත සඳහන් අවස්ථා ඇසුරෙන් ප්‍රතිචාර ලබා ගන්න.

* අසනු ලබන ප්‍රශ්නවලට වාචික, ලිඛිත පිළිතුරු ලබා ගන්න.
* ගද්‍ය හා පද්‍ය කොටස්වලින් කියවෙන දේ චිත්‍රයට නැගීමට යොමු කරවන්න.
* මෙවැනි වෙනත් ගද්‍ය හා පද්‍ය නිර්මාණ-කරණයට සිසුන් යොමු කරවන්න.

### ක්‍රියාකාරකම - 1

★ *දුනුකෙයියා මලක් වගේ දුරට පෙනෙනවා*
*වැටකෙයියා මලක් වගේ සුවඳ දැනෙනවා*
*පසළොස්වක සඳ වාගේ සිසිල දැනෙනවා*
*මගේ අම්මා මට ජීවන සුවය සදනවා*

ගායනය - සුජාතා අත්තනායක

### ක්‍රියාකාරකම - 2

පහත සඳහන් ගද්‍ය කොටස් සිසුන්ට සවන් දීමට සලස්වන්න.

#### උදාහරණ - 01

*''මෙතෙක් පැවති කාලගුණය වෙනස් වී ගහකොළ පෙරළාගෙන සුළං පාරක් හමන්නට විය. අහසේ වැහි ලකුණු පහළ විය. කළු වලාකුළු නග්න හිරු වටා සළු පොරවන්නට විය. කැළඹුණු අහස්තලය හරහා කුරුලු රැන් වේගයෙන් පියඹා යන්නට වූහ.*

*අහස් තලයෙහි පැහැබර සඳ බැබළෙන්නට විය. රිදී පාට සඳරැසින් මුළු වන පෙත ම සැනසෙන්නට පටන් ගත්තේ ය. වන දහන සතුටු කරමින් ගලා ගිය ගංගා කුමරිය තව තවත් හැඩ ගැනුණේ සඳරැස් වැළඳ ගැනීමට මෙන් ය. මේ මනහර රාත්‍රියේ ගලා එන සිසිල් සුළඟින් මල් සුවඳ පැතිර ගියේ ය. ටිකෙන් ටික සඳ මෝරමින් ඉහළ අහසට නැගුනි. ඒත් සමග ම නිදි නොලැබූ කොවුලකුගේ මිහිරි නාදය පැතිරෙන්නට පටන් ගත්තේ මුළු වනය ම මිහිරියාවකට පත් කරමිනි.''*

### ක්‍රියාකාරකම - 3

පහත සඳහන් ගීතය සිසුන්ට සවන් දීමට සලස්වන්න.

#### උදාහරණ - 01

*ලෝ අඩ නින්දේ මේ රෑ යාමේ*
*සඳරැස් වතුරේ කිමිදෙන්නේ*
*රන්තරු බැබළේ නිල් ආකාසේ*
*ලස්සන මල් වාගේ*

*කිරල ගහේ ගෙඩි දිය මත වැටිලා*
*පහළට බැස යයි දිය රැල්ලේ*
*නාමල් පිපිලා නැළවෙයි සුළඟේ*
*සුවඳ හමා දසතේ . . .*
*සෝබන මේ නදියේ . . . //*
*සඳරැස් වැතිරෙන්නේ*

*ලෝ අඩ නින්දේ . . . //*

*ඇල්කෙතකින් එන දැරියකගේ හඬ*
*දැන් දැන් මා හද නළවන්නේ*

*මහ රෑ හින්දයි ඇයගෙ රිදී හඬ*
*දසත ම පැතිරෙන්නේ*
*කවුරු ද ඇල්හේනේ . . . //*
*ගී හඬ මුමුණන්නේ . . .*

පද රචනය - සුසිල් සේනාධීර

## නිපුණතා මට්ටම

4.1.2.7 සවන් දී උච්චාරණ ශෛලිය අනුව මතුවන අදහස අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

සතුට, දුක, සන්තාපය, විධාන, ඉල්ලීම්, වේදනාව, ආදරය, හාස්‍යජනක බව, ත්‍රාසජනකබව, පුදුම සහගතබව, පිළිකුල ආදී හැඟීම් හා අවස්ථා මතුවන ආකාරයට විවිධ වචන හා දෙබස් කාණ්ඩ සිසුන්ට සවන් දීමට සලස්වන්න.

### ක්‍රියාකාරකම - 1

පහත සඳහන් වැකි සිසුන්ට සවන් දීමට සලස්වන්න.

#### උදාහරණ - 01

- ★ *මරන්න එපා, නිදහස් කරන්න.*
  *මරන්න. එපා නිදහස් කරන්න.*
- ★ *කන්න. එපා විසි කරන්න.*
  *කන්න එපා. විසි කරන්න.*

#### උදාහරණ - 02

- ★ *දේවයන් වහන්ස!*
  *ගැත්තාට අනුකම්පා කළ මැනව.*
- ★ *දේවයන් වහන්ස! දේවයන් වහන්ස!*
  *සතුරන් ගොඩ බැහැලා . . .*

### ක්‍රියාකාරකම - 2

පහත සඳහන් දෙබස් තෝරාගෙන ඒවා උච්චාරණය කළ යුතු ආකාරය ආදර්ශනය කරවන්න. හැකි නම් පටිගත කරන ලද දෙබස් ඉදිරිපත් කරන්න. අනතුරුව ඒවායේ උච්චාරණ වෙනස්කම් සාකච්ඡා කරන්න.

#### උදාහරණ - 01

*''කිරිහාමි ඔබට පිස්සු ද? නැගිටිනවා නැගිටිනවා''*

*''මා මළා, නැගිටින්නේ කෙසේ ද?''*

*''මළා! මළා! නම් දොඩන්නේ?''*

*'මළ අය දොඩන්නේ නැද්ද? එදා අපේ ගෙදර මඟුල් දවසේ හාමුදුරුවන් කීවා, 'හිසත් පයත් එක සැටි සීතල වුණු දා මළා තමයි' කියා''*

*''අනේ, කිරිහාමි, පිස්සු නැති ව නැගිටිනවා. යමු ගෙදර''*

හත් පණ - කුමාරතුංග මුනිදාස

#### උදාහරණ - 02

*ගෘෂා* *''.... සීයේ, අනේ සීයේ කිරි බින්දුවක් දෙන්න බැරි ද අපට තියෙනව නම් කැවුම් පෙත්තකුත් එක්ක?''*

*මහල්ලා* *''කිරි? මෙහි ඇති කිරක් නෑ. සිදාදියෙන් ආපු යකඩයො අපේ එළුවො උස්සගෙන ගිහින්. උන්ගෙන් ඉල්ල ගනින් කිරි ඕන්නං''*

*ගෘෂා* *''පිං සිද්ධ වෙයි සීයේ, පොඩි දරුවකුට දෙන්න කිරි ජුංඩක් ඇතිනේ මේ ගෙදර.''*

*මහල්ලා* *''පිං සිද්ධ වෙන්න ඈ?''*

*ගෘෂා* *''කවුද කිව්වෙ පිනට කියල? කුමාරයො වගේ ගෙවනව අපි. දන්නව ද? පස්ස බිම ඇනුණත් ගමන උඩින්''*

හුණුවටයේ කථාව - හෙන්රි ජයසේන

#### උදාහරණ - 03

*සිටු දුව* *''ඒත් ආත්තම්මේ ඒ මිනිහගේ තරම් හොඳ වළලු නැහැ කොහේවත්. ඒවා කසී රටෙන් ගෙනාපු ඒවා''*

*මිත්තණිය* *''කසී රටෙන්? මොන පිස්සු ද? කසී රටේ*

*වළලු හඳනවායැ? අන්න කසී රටේ සළු නම් හඳනවා.''*

සිටු දුව' *'ඒ වුණත්, ඒ තරම් ලස්සන වළලු ගොඩක් මං කොහේවත් දැකල නෑ, ආත්තම්මෙ''*

මිත්තණිය *''කවුරු ගාවත් තියෙන්නෙ ඔය වළලු තමයි, හොඳයි. ඕන නං මම අද ම අරන් දෙන්නම්කො, ඒ වගේ ම වළලු කුට්ටමක්.''*

කදා වළලු - එදිරිවීර සරත්චන්ද්‍ර

## නිපුණතාව

4.1.3 සවන් දී චින්තනයට යොමු වී ප්‍රතිචාර දක්වයි.

## නිපුණතා මට්ටම

4.1.3.1 කතන්දර, චරිත කතා, සිදුවීම් ඇසුරෙන් තම අදහස පවසයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

මෙය අවබෝධය හා වින්දනය සඳහා සවන් දීමට වඩා ගැඹුරු අවස්ථාවකි.
පවසන දෙයට ඉතා හොඳින් සවන් දී සවන් දුන් දේ පිළිබඳ ව සිතා බලා සිතින් විග්‍රහ කර ඒ පිළිබඳ ව තම අදහස් පැවසීමට හැකියාව තිබීම අවශ්‍ය වේ.

### ක්‍රියාකාරකම 1

පන්ති කාමරයේ එක් සිසුවකුට හෝ සිසුන් දෙදෙනෙකුට හෝ තම ජීවිතයේ දී වඩාත් සංවේදී වූ හෝ වඩාත් සතුටට පත් වූ අවස්ථාවක් හෝ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී ඊට සවන්දීමට සිසුන් යොමු කරන්න. අවසානයේ දී සවන්දුන් දේ පිළිබඳ ව ඇතිවූ හැඟීම ලිඛිත ව හෝ වාචික ව හෝ ලබාගෙන සාකච්ඡාවක් මෙහෙයවන්න.

### උදාහරණ - 01

පහත සඳහන් ප්‍රකාශ සිසුන්ට සවන් දීමට සලස්වන්න. තම අදහස් ලිඛිත ව හෝ වාචික ව හෝ ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරවන්න.

1. *අහසින් වැටෙන දිය බිඳක්වත් මිනිසාගේ ප්‍රයෝජනයට නොගෙන මහ මුහුදට ගලා යාමට ඉඩ නොදෙමු.*

   පළමුවන පරාක්‍රමබාහු රජතුමා

2. *මාගේ ව්‍යායාමය, හුදු රජසැප පිණිස නොව රටේත්, සාසනයේත් චිරස්ථිතිය සඳහා පමණි.*

   දුටුගැමුණු රජතුමා

### ක්‍රියාකාරකම - 2

සිසුන්ට තම අදහස පැවසීමට සුදුසු කතන්දරවලට සවන් දීමට අවස්ථාව ලබා දෙන්න.
සවන් දීමෙන් අනතුරු ව වාචික හා ලිඛිත ප්‍රතිචාර ලබා ගන්න.
මේ සඳහා සුදුසු කැසට්පට හා කතන්දර පහත දැක්වේ.

### කතන්දර

- ★ අවිච්චියාගේ ඇඳුම මොනරා ඉල්ලා ගෙන ගොස් ආපසු නොදුන් කතාව.
- ★ තල් අත්ත මතට වැටුණු බෙලි ගෙඩියට බිය වූ හාවා අහස කඩා වැටෙන්න එන බව අනෙක් සතුන්ට කී කතාව.
- ★ මහදැන මුත්තාගේ කතා.
- ★ අන්දරේ හා සම්බන්ධ කතා.
- ★ කුඤ්ඤදය ගැල වූ වඳුරාගේ කතාව.
- ★ විහාර මහා දේවිය මුහුදට බිලි වූ පුවත දැක්වෙන කතාව.

### කැසට්පට

- ★ සාම කතන්දර - ජා.අ.ආ.
- ★ කතන්දර - ජා.අ.ආ.

### ක්‍රියාකාරකම - 4

සිසුන්ට තම අදහස පැවසීමට සුදුසු චරිත කතාවලට සවන්දීමට අවස්ථාව ලබා දෙන්න.

සවන් දීමෙන් අනතුරු ව වාචික හා ලිඛිත ප්‍රතිචාර ලබා ගන්න.

- ★ මහත්මා ගාන්ධිතුමා
- ★ තෙරේසා මව්තුමිය
- ★ මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමා
- ★ ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා
- ★ ආචාර්ය ගුණපාල මලලසේකර මහතා
- ★ මාර්ටින් වික්‍රමසිංහ මහතා
- ★ ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම් මහතා
- ★ ආචාර්ය ආතර් සී. ක්ලාක් මහතා

## නිපුණතා මට්ටම

4.1.3.2 සවන් දී පෙරකීමේ හැකියාව ලබයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

කාලීනව රටේ සිදුවන ආර්ථික, දේශගුණික, සමාජයීය සිද්ධිවලට සහ ජාත්‍යන්තර ව සිදුවන නව සොයා ගැනීම් පිළිබඳ ව කරුණු රැස්කර ගන්න. ඒ සම්බන්ධ තොරතුරු සිසුන්ට සවන් දීමට සලස්වන්න. ඒ ඇසුරෙන් චින්තනයට යොමු වන අන්දමේ ප්‍රශ්න ඉදිරිපත් කර සාකච්ඡා කරන්න.

### ක්‍රියාකාරකම - 1

පහත සඳහන් ඡේදවලට සවන් දීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමට කණ්ඩායම් සාකච්ඡාවක් සැලසුම් කර ක්‍රියාත්මක කරන්න.

### උදාහරණ - 01

*''කැලෑ ගමේ මිනිස්සු ඉවක් බවක් නැතිව කැලෑවේ ගස් කැපීම පුරුද්දක් කරගෙන සිටියහ. ඔවුහු කපන ලද ගස්වලින් කොටසක් විකුණා මුදල් ලබා ගත් අතර ඉතිරි දැව නිවෙස් කටයුතු සඳහා යොදා ගත්හ. ගස් කැපීමට විශේෂ උනන්දුවක් දැක්වුව ද මොව්හු කැපූ ගසක් වෙනුවට එක් පැළයක් වත් සිටවීමට කාරුණික නොවූහ.''*

- ★ ඉදිරි කාලයේ දී කැලෑගමට කුමක් සිදු වේ ද?

### උදාහරණ - 02

*''ගමේ පවුල් සංඛ්‍යාව වැඩිවීම නිසා කුඩා ඉඩම් කොටස්වල නිවාස ඉදිවීම සිදුවිය. ඒ හේතුව නිසා ම වගුරු බිම් ද ක්‍රමක්‍රමයෙන් නැති වී ගියේ ය. මැයි මාසයේ පටන් ගැන්මත් සමග ආරම්භ වූ වර්ෂාව සති දෙකක් ගත වී තිබියදීත් නිමාවන ලකුණු පහළ වී නොමැත.''*

- ★ මේ ගමේ වැසියන් ඉදිරි කාලයේ දී මුහුණ දෙන පාරිසරික ගැටලු මොනවා ද? සාකච්ඡා කරන්න. වාචික/ලිඛිත ප්‍රතිචාර ලබා ගන්න.

### උදාහරණ - 03

*''සිරිසේන හා ගුණවතී ''සැනසුම'' නිවසේ වෙසෙන අඹු-සැමි යුවලකි. මේ දෙදෙනාම රජයේ රැකියාවල නියුතු නිසා දිනපතා උදෑසනින් ම නිවසින් පිටව යති. නිවසේ වෙසෙන්නේ සිරිසේනගේ මව වන හැත්තෑපස් හැවිරිදි මැණික්හාමි පමණි. අසනීපයෙන් පෙළෙන මවගේ ඕනෑ එපාකම්, සුවදුක් සොයා බැලීමට සිරිසේන හෝ ගුණවතීට කිසිදු ඉඩක් නොමැත.''*

- ★ මෙවැනි තත්ත්වයක් යටතේ මැණික්-හාමිගේ ඉදිරි කාලය කෙසේ ගත වේ ද?

### උදාහරණ - 04

අනාගතයේ දී අප රටේ පානීය ජල හිඟයක් ඇති වන බවට අදහසක් ඉදිරිපත් වී ඇත. එසේ වුවහොත් සිදුවිය හැකි දේ පිළිබඳ ව අදහස් පැවසීමට අවස්ථාව ලබා දෙන්න.

## නිපුණතාව

4.1.4 ඉගෙනීම සඳහා සවන් දී ප්‍රතිචාර දක්වයි.

## නිපුණතා මට්ටම

4.1.4.1 ඉගෙනීම සඳහා ගුරුවරයාට සවන් දී ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

ඉගෙනීම සඳහා ගුරුවරයාට සවන් දී ප්‍රතිචාර දැක්වීමට සුදුසු අත්දැකීම්, උපදෙස්, විධානවලට සවන් දීමට යොමු කරන්න.
සවන් දීම සම්බන්ධයෙන් දී ඇති මූලික උපදෙස්වලට සිසු අවධානය යොමු කරවන්න.

### ක්‍රියාකාරකම - 1

පහත සඳහන් අත්දැකීම් සිසුන්ට සවන්දීමට සලස්වා ප්‍රතිචාර ලබා ගන්න.

#### උදාහරණ - 01

★ තමා අධ්‍යාපන චාරිකාවක් ගොස් ලැබූ අත්දැකීමක් හා සම්බන්ධ සිද්ධියක්.
★ ස්වාභාවික විපතකට මුහුණ දුන් අවස්ථාවක් හෝ ඇසූ සිද්ධියක්.

#### උදාහරණ - 02

ගුරු උපදෙස් පිළිපදිමින් ඔරිගාමි නිර්මාණයක් සකස් කිරීම.

#### උදාහරණ - 03

විධාන හා නීතිවලට සවන් දෙමින් ක්‍රීඩාවක නිරත වීම.

## නිපුණතා මට්ටම

4.1.4.2 ඉගෙනීම සඳහා වැඩිහිටියන්ට සවන් දෙමින් ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

පාසලට සමීප පරිසරයේ ජීවත් වන විශේෂිත පුද්ගලයන් කීප දෙනකු පන්ති කාමරයට ගෙන්වාගෙන ඔවුන්ගේ ජීවන අත්දැකීම් හා වෘත්තීය අත්දැකීම්වලට සවන් දීමට හා ඒ හා සම්බන්ධ සංවාදයකට සිසුන් යොමු කරන්න.

### ක්‍රියාකාරකම - 1

#### උදාහරණ

★ ආදර්ශවත් ගොවි මහතෙක්,
★ ස්වෝත්සාහයෙන් ආර්ථික වශයෙන් දියුණු වූ පුද්ගලයෙක්,
★ ගමේ ආදර්ශවත් වැඩිහිටියෙක්,
★ දක්ෂ ක්‍රීඩකයෙක් / ක්‍රීඩිකාවක්,
★ නීතිගරුක රියදුරෙක්,

## නිපුණතා මට්ටම

4.1.4.3 ඉගෙනීම සඳහා පූජ්‍ය/පූජක උතුමන්ට සවන් දී ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

විශේෂ ආගමික වැඩසටහන්වල දී, පාසලේ විශේෂ ආගමික උත්සවවල දී හා ආගමික ස්ථානයක දී පූජ්‍ය/පූජක උතුමන්ට සවන් දීමට අවස්ථාව සලසා දෙන්න.
ඒ සම්බන්ධයෙන් සිසුන්ගෙන් වාචික හා ලිඛිත ප්‍රතිචාර ලබා ගන්න.

## නිපුණතා මට්ටම

4.1.4.4 ඉගෙනීම සඳහා විද්‍යුත් මාධ්‍යයන්ගේ අධ්‍යාපනික වැඩ සටහන්වලට සවන් දී ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

විද්‍යුත් මාධ්‍ය අධ්‍යාපනික වැඩ සටහන් හා ප්‍රවෘත්ති කිහිපයක් පටිගත කරගන්න (ගුවන් විදුලි / රූපවාහිනී). ඒවා සිසුන්ට සවන් දීමට සලස්වන්න.
සවන් දුන් දේ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
ඒ ඇසුරෙන් සරල ප්‍රශ්න කිහිපයකට පිළිතුරු වාචික ව හා ලිඛිත ව ලබා ගන්න.
මෙම වැඩ සටහනේ වැදගත්කම හා අවශ්‍යතාව පිළිබඳ ව පන්ති කවවල දී දෙමාපියන් දැනුවත් කරන්න.
මෙවැනි ක්‍රියාකාරකම් නිරන්තර හා ස්ථාවර වැඩ සටහන් ලෙස සැලසුම් කරගන්න.

### ක්‍රියාකාරකම - 1

උදාහරණ - 01

- ★ පරිසර වැඩ සටහන්
- ★ විද්‍යාත්මක සොයා ගැනීම්
- ★ කාලීන සිදුවීම්
- ★ චරිතාපදාන
- ★ ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්
- ★ ජාතික හා ජාත්‍යන්තර දින

කතා කිරීමේ නිපුණතාව ඇති කර ගැනීමේ දී සැළකිලිමත් විය යුතු අංග

- ▲ හඬ පාලනය
- ▲ අංග චලනය
- ▲ උචිත ඉරියව්
- ▲ අවස්ථාවට ගැළපීම
- ▲ මාතෘකාවට අදාළ වීම
- ▲ කරුණු මතු කිරීම
- ▲ පැහැදිලි බව
- ▲ ආචාරශීලී බව
- ▲ උචිත වාංමාලාව
- ▲ අන් මතවලට සවන් දීම

---

## ගුරුවරුන්ගේ ස්වයං ඇගයීම සඳහා වූ නිර්ණායක

01. භාෂාව ඉගැන්වීමේ දී සවන්දීමේ කුසලතාව වැදගත් වන බව අත්දැකීමෙන් වටහා ගත්තේ ද?
02. සවන්දීමේ කුසලතාව ප්‍රගුණ කරවීම සඳහා වූ උපක්‍රම ඔබ දන්නේ ද?
03. සැලසුම්ගත ක්‍රීඩා හා ක්‍රියාකාරකම් තුළින් සවන්දීමේ කුසලතාව ප්‍රගුණ කිරීමට උත්සාහ දැරුවේ ද?
04. ගීත, කතන්දර හා සංවාද තුළින් කාර්යක්ෂමවූත් ඉතාමත් උචිතවූත් ක්‍රමවේදයන් අනුගමනය කරන්නේ ද?
05. දැන්වීම් හා උපදෙස් තේරුම් ගෙන කටයුතු කිරීමට අවස්ථාව සලසන්නේ ද?
06. සවන් දෙන විට නැතහොත් සවන් දුන් පසු ප්‍රශ්න ඇසීමට උනන්දු කරන්නේ ද?
07. අනුන්ගේ අදහස්වලට ගරු කරමින් තම අදහස් සංයමයෙන් ප්‍රකාශ කිරීමට ඉඩ සලසන්නේ ද?
08. වින්දනාත්මක ව සවන් දීමටත් ඒ අනුව ක්‍රියාත්මක වීමටත් විවිධ නවීන ක්‍රමවේදයන් අනුගමනය කරන්නේ ද?
09. ශබ්දවල වෙනස්කම් හඳුනාගෙන සවන්දීමට සුදුසු ක්‍රියාකාරකම් ඉදිරිපත් කරන්නේ ද?
10. ශ්‍රව්‍ය මාධ්‍ය තුළින් ශ්‍රවන කුසලතාව තව දුරටත් කාර්යක්ෂම කළ හැකි යැයි විශ්වාස කරන්නේ ද?
11. භාෂා වර්ධනයටත්, තොරතුරු හුවමාරුවටත් සවන්දීම වැදගත් වන බව හැඟෙන්නේ ද?
12. සවන්දීම සඳහා ලබා දෙන ක්‍රියාකාරකම් තුළින් කථනය හා සවන්දීම යන ක්‍රියාවලි දෙක ම සිදු වේ. මේ සඳහා ගුරුවරයාගේ වගවීම වැදගත් බව සැලකිල්ලට ගෙන ක්‍රියා කරන්නේ ද?

# 4.2 කතා කිරීම

සවන්දීම මෙන් ම මූලික කුසලතාවලින් එකක් ලෙස කථනය සැලකේ. මෙය ප්‍රකාශන කුසලතාවකි. කථනය, සවන්දීමෙන් පසු හා සවන්දීම හේතු කොට ගෙන ඇති වන කුසලතාවකි. සංවාද කුසලතාව හා කථන කුසලතාව යනුවෙන් ව්‍යවහාර දෙකක් වේ. සංවාද යන්න තොරතුරු හුවමාරු ක්‍රියාවලිය ලෙස හැඳින්වේ. තොරතුරු ප්‍රකාශ කිරීමෙන් සංවාද අවසන් වේ. අනුන් ආකර්ෂණය වන ආකාරයට අදහස් දැක්වීම කථන කුසලතාව වේ. යමෙක් කතා කරන විට සංවාද සිදු වේ. වේදිකාවක කථනය සිදු වේ. කථන කුසලතාව වර්ධනය වීමට පදනම වන්නේ සංවාද කුසලතාවයි. එම පදනමේ සිට සාහිත්‍ය අංග ලක්ෂණ එක් කරගෙන ගොඩ නැගෙන්නේ කථන කුසලතාවයි. භාෂාව ඉගෙනීමේ ආරම්භක අවස්ථාව සංවාද කුසලතාවයි. සංවාදය යනු දිව, දත්, තොල්, උඩු තල්ල යන ශබ්ද නැගීමට උපකාර වන අවයවවලට සම්බන්ධ ක්‍රියාදාමයකි. ළමුන්ට සංවාදයේ යෙදීමට ඉඩ සලසා දෙන වාතාවරණ සියල්ල සංවාද කුසලතාව වර්ධනය කරන ක්‍රියාකාරකම් වේ.

## 4.2 කතා කිරීම

### නිපුණතාව

4.2.1 කතා කිරීම මගින් සුහදත්වය වර්ධනය කර ගනී.

### නිපුණතා මට්ටම

4.2.1.1 සුහද කතාබහේ යෙදෙයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

#### ක්‍රියාකාරකම - 1

#### උදාහරණ - 01

පන්තියේ සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කර එක් අයකුගේ පෞද්ගලික තොරතුරු අනෙකාට පැවසීමටත්, අනෙකාගේ පෞද්ගලික තොරතුරු විමසීමටත් හැකිවන ක්‍රියාකාරකමක් ඉදිරිපත් කරන්න.

එකිනෙකාගේ තොරතුරු පන්තිය හමුවේ ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

#### උදාහරණ - 02

ප්‍රහේලිකාව පිරවීමට පහත සඳහන් ඉඟි වැකි උදව් කරගෙන සාකච්ඡා කරමින් සිසුන් දෙදෙනාගේ කණ්ඩායම්වලට උපදෙස් දෙන්න.

#### උපදෙස්

**පහළට**

(1) ''රස'' යන්නෙහි විරුද්ධාර්ථවත් පදය
(2) රට වටා වැට බැන්දත් මෙය වටා වැට බැඳිය නොහැකි ය
(3) ධීවර කටයුතු සඳහා ප්‍රසිද්ධ නගරයකි
(7) කාන්තාව යන වචනයට සමානාර්ථවත් පදයකි
(9) උත්තම පුරුෂ ඒක වචන නාම පදයකි

**හරහට**

(2) වී වගාව හා සම්බන්ධ ස්ථානයකි
(4) මල්වාන ප්‍රදේශයේ වැවෙන රසවත් පලතුරකි

(5) සිංහල භාෂාවේ පද වර්ගයකි

(6) වහල සෙවිලි කිරීමට මෙය යොදා ගනී

(8) සිය යන්නට සමානාර්ථවත් පදයකි

| | | | | |
|---|---|---|---|---|
| 1 | ■ | 2 | 3 | |
| 4 | | | | ■ |
| | ■ | ■ | 5 | 9 |
| ■ | 6 | 7 | | |
| ■ | ■ | 8 | | ■ |

## නිපුණතා මට්ටම

4.2.1.2 කවි ගී ගායනා කරයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

සිසුන් අතර සුහදත්වය වර්ධනය කිරීම සඳහා කවි ගී තෝරා ගැනීමේ දී පහත සඳහන් කරුණු කෙරේ අවධානය යොමු කරන්න.

- ★ චිත්තරූප මැවිය හැකි වීම
- ★ අපූර්ව භාෂා යෙදුම් තිබීම
- ★ රසවිඳිය හැකි වීම

### ක්‍රියාකාරකම - 1

සිසුන්ට යෝග්‍ය කවි සහ ගී තෝරාගෙන තනි ව, සාමූහික ව ගායනා කිරීමටත්, රංගනයටත් අවස්ථා සලසා දෙන්න.

#### උදාහරණ - 01

දරු නැළවිලි ගී

▲ *වසු පැටියෝ ගෙල පසා*
*මිණි වැල් සෙලවෙන නිසා*
*රිසි ලෙස ඇඟ නොම කසා*
*සිටිති තනට ඇස වසා*

▲ *සුරතල් දරු බිය වෙති*
*කුරුලු පැටව් නොහ ඬති*
*නැළවිල්ලෙන් කම් නැති*
*කිරිල්ලෝ ද සැත පෙති*

#### උදාහරණ - 02

පාරු කවි

▲ *ඔන්න මලේ ඔය නා මල නෙළා වරෙන්*
*අත්ත බිඳෙයි පය බුරුලෙන් තබා වරෙන්*
*කැලණි ගඟේ ඔරු යනවා බලා වරෙන්*
*සාදුකාර දී ඔරුවට නැගී වරෙන්*

▲ *ආරන්නේ පඳුරු වටකර දළු ලන්ට*
*මෝරන්නේ සඳේ කරුවල වැඩි වෙන්ට*
*පීරන්නේ වරල තෙල් ගා ඔප වෙන්ට*
*තේරෙන්නේ නැද්ද මේ දුක දෙවි යන්ට*

#### උදාහරණ - 03

නෙළුම් කවි

▲ *තෙල් ගාලා හිස පීරන් නෑනෝ*
*ඇට වැල අරගෙන බැඳගන් නෑනෝ*
*සේලේ ඉණවට ඇඳගන් නෑනෝ*
*ගොයම් නෙළන්නට යමු අපි නෑනෝ*

▲ *වරම් ගතිම් ඉර සඳ දෙවි අතින් වරම්*
*වරම් ගතිම් මිහිකත් දෙවි අතින් වරම්*
*වරම් ගතිම් සක්වල දෙවි අතින් වරම්*
*වරම් ගොයම් කැපුමට දෙවිඳුගෙන් වරම්*

උදාහරණ - 04

පතල් කවි

▲ ඉන්නෙත් දුම්බරයි මහ කළු ගලක් යට
කන්නෙත් කරවලයි රට හාලේ බතට
බොන්නෙත් බොර දියයි පුරුවෙ කළ පවට
යන්නේ කවදා ද මවුපියො දකින්නට

▲ දුම්බර කන්ද පාමුල මිනිරන් පතලේ
බැසලා බඹ තිහක් කළුගල සිදුරු කළේ
බස්නාහිරට දෝනා දෙක ගමන් කළේ
විස්තර කියමි දුම්බර මිනිරන් පතලේ

ක්‍රියාකාරකම - 2

උදාහරණ - 01

ගජගා වන්නම

දෙව් පුර ඇතෙකී - කුඹු දහසයකී
දිග දළ අටකී - සත් ගැබකී
වැව් පොකුණු ද කී - සත් සිය ගැන කී
එක පොකුණෙක කී - සිවු මලෙ කී

උදාහරණ - 02

වෛරෝඩි වන්නම

අගය වඩන කවි වරුණා -
රගය දැනෙයි කළ රචනා
මට උරනා නොව මෙදිනා -
මහතුගෙ අවසර රැගෙන කමා වා
ඉසුරු දෙව්දු වඩින දිනා -
කෙහෙතු විමන දැන නෙතිනා
එම විමනා, දෙව් වඩිනා,
කෙහෙතු ද දැක කොයි වඩිති පමා වා

උදාහරණ - 03

★ ලෝකෙන් උතුම් රට ලංකාවයි
ලංකාවයි සිරි ලංකාවයි . . .
අයි.එම්.ආර්.ඒ. ඊරියගොල්ල

★ සෙනෙහස පුදා අම්මාවරුන් වගේ
දහඩිය හෙළා මහ සාගරය වගේ
පද රචනය - රඹුකන සිද්ධාර්ථ හිමි

★ උඩරට කඳුකර සිරියා පරදන
රූබර මුහුණ ඔබේ
රතැඟිලි දිගු කොට මදහස නංවන
තේ දළු නෙළන ළඳේ . . . . .

★ හොඳ හොඳ ළමයින් අපි වාගේ
මේ මව්බිම ඉපදී ඉන්නේ . . . . .
අත්පොඩි ටික එකමුතු කරලා
රකිමු අපේ සිරි ලක් අම්මා . . . . .
විල්ෆ්‍රඩ් සිල්වා

★ ලොවේ සැමා එක ම දැයේ
දූ දරුවන් වේවා
වාද නැතී බේද නැතී ලස්සන ලොව හෙට
අපට උදා වේවා . . . . .
හේමසිරි හල්පිට

විශේෂ උපදෙස්

★ මෙම නිපුණතා මට්ටම ක්‍රියාත්මක කිරීමේ දී
4.1.1.1 - රසවත් කවි ගීවලට සවන් දී තාල තබයි.
4.2.2.1 - කවි ගී ගායනා කරමින් තාල තබයි.
4.3.2.3 - සරල කවි ගී කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

යන නිපුණතා මට්ටම් සමග සමෝධානය කරගත හැකි ය.

## නිපුණතා මට්ටම

4.2.1.3 කතන්දර කියයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

සිසුන්ගේ මට්ටමට ගැළපෙන යහපත් ආදර්ශයක් ලබා ගත හැකි අන්දමේ කතන්දර කීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

ඉදිරිපත් කරන කතන්දරය ඇසුරෙන් පහත දැක්වෙන ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවන්න.

- ▲ කතන්දරයේ සිද්ධි අනුපිළිවෙළට පෙළ ගස්වන්න.
- ▲ කතන්දරයේ වඩාත් කැමති සිද්ධියක් හෝ අවස්ථාවක් චිත්‍රයට නගන්න.
- ▲ ඇසූ කතන්දරය තමන්ගේ වචනවලින් නැවත ලියන්න.

## නිපුණතා මට්ටම

4.2.1.4 අත්දැකීම් විස්තර කරයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

සිසුන්ට තම අත්දැකීම් විස්තර කිරීමට හැකි අවස්ථා මතු කර දෙන්න.

අත්දැකීම් ඉදිරිපත් කිරීමට පන්තියේ ඇති වේදිකාව හා එෆ්එම් මයික්‍රෆෝනය භාවිතයට ගන්න.

අත්දැකීම් ඉදිරිපත් කිරීමේ දී ආචාරශීලී ව අදහස් නිරවුල් ව ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරවන්න.

සිසුන්ගේ අත්දැකීම් දින පොතක නිරන්තරයෙන් වාර්තා කිරීමට ද උපදෙස් දෙන්න.

### විශේෂ උපදෙස්

★ මෙම නිපුණතා මට්ටම ක්‍රියාත්මක කිරීමේ දී
4.2.3.1 - තොරතුරු සෙසු අයට පවසයි.
4.4.2.5 - නිරීක්ෂණ වාර්තා ලියයි.
යන නිපුණතා මට්ටම් සමග සමෝධානය කරගත හැකි ය.

## නිපුණතා මට්ටම

4.2.1.5 ගැටලු විසඳයි

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

ගැටලු සහිත සිද්ධියක් තෝරා ගන්න. සිසුන් කණ්ඩායම් කර එම සිද්ධිය ඉදිරිපත් කරන්න. ගැටලුව විසඳීම සඳහා සුදුසු ක්‍රම සාකච්ඡා කර ලැයිස්තු ගත කරවන්න. එම විසඳුම් අතරින් උචිත ම ක්‍රමය තෝරා ගැනීමට උනන්දු කරවන්න. එම ක්‍රමය තේරීමට හේතු සිසුන්ගෙන් විමසන්න.

### ක්‍රියාකාරකම - 1

කණ්ඩායම් ක්‍රියාකාරකමේ දී එක ම සිද්ධිය පත්‍රිකාවල ලියා කණ්ඩායම්වලට බෙදා දෙන්න. ඒ ඇසුරෙන් සිසුන් ක්‍රියාකාරකම්වල යොදවන්න.

### උදාහරණ - 01

*"අපේ ගමේ එක් කලෙක ගවයින් බහුල වූ නිසා කිරි සුලබ විය. ගවයින් බහුල වීම නිසා එළවළු වතුවලට පෝර ලැබිණ. ගොම පෝර නිසා කුරුමිණියෝ ද කුරුමිණියන් නිසා තලගොයි ද බහුල වූහ. තලගොයින් බහුල වීම එළවළු ගොවිතැනට බාධා ගෙන දෙන්නක් විය."*

★ මෙම බාධාවන්ට විසඳුම් යෝජනා කරන්න.

### උදාහරණ - 02

*"සිරිමල් රාත්‍රි කාලයේ පාඩම් කරන්නේ කුප්පි ලාම්පුවේ එළියෙනි. මෙදින කුප්පි ලාම්පුවේ ඉතිරිව තිබුණේ තෙල් ස්වල්පයකි. දිගින් අඩු පහන් තිරයක් දමා තිබූ නිසා මෙම කුප්පි ලාම්පුවේ එළිය ක්‍රම ක්‍රමයෙන් අඩු වී අවසානයේ නිවී ගියේ ය."*

- ★ මෙම කුප්පි ලාම්පුවේ ඇති තෙල් ස්වල්පය යොදා ගෙන එය නැවත දල්වා ගැනීමට සිරිමල්ට කළ හැකි දේවල් ලැයිස්තු ගත කරන්න.
- ★ මෙවැනි වෙනත් ගැටලු සහගත සිද්ධිවලට විසඳුම් සෙවීමට සිසුන් යොමු කරවන්න.

## නිපුණතාව

4.2.2 නිසි උච්චාරණය සහිත ව කතා කරයි.

## නිපුණතා මට්ටම

4.2.2.1 කවි ගී ගායනා කරමින් තාල තබයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

> ගුරු උපදෙස්
>
> මේ සඳහා අක්ෂර දෙකෙන් දෙකට, තුනෙන් තුනට, හතරෙන් හතරට තාල තැබිය හැකි කවි, ගී තෝරා ගන්න. ආදේශ භාණ්ඩ උපයෝගී කර ගෙන තාල තබමින් ගායනා කිරීමට සිසුන්ට අවස්ථාව සලසන්න. එවැනි තාල තැබිය හැකි ගී නිර්මාණය කිරීමට ද සිසුන් පොළඹවන්න. නිර්මාණය කළ ගී ඇතුළත් පොත් පිංචක් සැකසීමට උනන්දු කරවන්න.

### ක්‍රියාකාරකම - 1

මාත්‍රා දෙකෙන් දෙකට තාල තැබිය හැකි කවි, ගී තෝරා ගෙන ගායනයට අවස්ථාව දෙන්න.

### උදාහරණ - 01

★ *තරුැ පිරි අහසයි*
*සුදු හඳ හාමියි*
*අහසේ බැබළෙයි*
*ලොවට එළිය දෙයි*

★ *ගස් වැල් දළු ලයි*
*මල් පල ගන් වයි*
*බක් මහ අසිරිය*
*රට සරුැ කර වයි*

### ක්‍රියාකාරකම - 2

මාත්‍රා තුනෙන් තුනට තාල තැබිය හැකි කවි, ගී තෝරා ගෙන ගායනයට අවස්ථාව දෙන්න.

### උදාහරණ - 01

★ *දුවේ පුතේ මේ අහන්න*
*මේ කියමන හිතට ගන්න*
*උගත්කමය වෙයි අබරණ*
*මුළු දිවිය ම එළිය කරන*

★ *වම්බටු තුඹ මෑ කරල් ද*
*තම්පලා ද දෙහි මිරිස් ද*
*ජම්බු දොඩම් අඹ කජු මද*
*දම් වෙරළු ද ගන්නවා ද*

### උදාහරණ - 02

★ *ලීලයි කමලයි චම්පයි රෑබයි*
*බානුමතියි නයනයි සඳ ලේඛයි*
*දිය ගෙන යාමට එන ළිඳ මේකයි*
*මේ ළිඳ ළඟ නිතරම අවිවේකයි*

★ *මවු පිය දෙගුරුැන් හා වැඩිහිටියන්*
*දරුැවන් දැරියන් වෙත දෙන ඔවදන්*
*සිත තුළ රැඳවා ගෙන හද බැතියෙන්*
*දිවි මග බාධක විඳගනු සතුටින්*

## නිපුණතා මට්ටම

4.2.2.2 වාචික අභිනය හා අවධාරණය සහිත ව හඬනගා කතා කරයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

වාචික අභිනය හා අවධාරණය සහිත ව කතා කිරීමට සිසුන් යොමු කිරීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

★ පන්ති කාමර වේදිකාව භාවිත කරන්න.
★ එෆ්එම් මයික්‍රෆෝනය යොදා ගන්න.
★ කැසට් පටයක පටිගත කරන්න.
★ නැවත ඇගයීමට සලස්වන්න.
★ ස්වයං ඇගයීමට අවස්ථාව දෙන්න.

### ක්‍රියාකාරකම

සිසුන්ට කැමති මාතෘකාවක් යටතේ මිනිත්තු 03ක් පමණ කතා කිරීමට අවස්ථාව ලබා දෙන්න. මේ සඳහා පන්ති කාමර වේදිකාව, එෆ්එම් මයික් භාවිත කිරීමට අවස්ථාව සලසන්න. එම කතා කැසට් පටයක ආධාරයෙන් පටිගත කර නැවත ඇසීමට සලස්වන්න.
මේ සඳහා පහත දැක්වෙන ස්ථාවර වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරවන්න.

★ ශිෂ්‍ය සමිති
★ කථික තරඟ
★ වාද විවාද
★ නාට්‍යමය දෙබස්

## නිපුණතාව

4.2.3 සන්නිවේදන අවශ්‍යතා සඳහා කතා කරයි.

## නිපුණතා මට්ටම

4.2.3.1 තොරතුරු සෙසු අයට පවසයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

තොරතුරු සෙසු අයට පැවසීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරවන්න.

▲ අනුපිළිවෙළින් පැවසීම.
▲ විස්තරාත්මක ව පැවසීම.
▲ වර්ණනාත්මක ව පැවසීම.
▲ විමර්ශනාත්මක ව පැවසීම.

### ක්‍රියාකාරකම - 1

★ පහත සඳහන් ක්‍රියාකාරකම්වල සිසුන් තනි තනි ව යොමු කරවන්න.
★ මෙහි දී පන්තියේ වේදිකාව හා එෆ්එම් මයික්‍රෆෝනය යොදා ගන්න.

### උදාහරණ - 01

එක් එක් සිසුවාට තමා පිළිබඳ ව හා තම පවුල පිළිබඳ ව විස්තරාත්මක තොරතුරු පන්තිය හමුවේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

### උදාහරණ - 02

සිසුන් විසින් සපයා ගන්නා ලද හෝ ගුරුවරයා විසින් සපයන ලද හෝ ගමන් මාර්ග විස්තරයක් පන්තියේ සෙසු අයට ඉදිරිපත් කරවීමට අවස්ථාව සලසා දෙන්න.

### උදාහරණ - 03

සිසුන් සමග ක්ෂේත්‍ර චාරිකාවක් හෝ අධ්‍යාපන චාරිකාවක් හෝ සංවිධානය කරන ආකාරය පිළිබඳ ව සාකච්ඡාවක් කරන්න. මෙහි දී දිනය, සහභාගී වන අය, නිරීක්ෂණය කරන ස්ථාන, ගමනාගමන

පහසුකම්, ආහාරපාන, ආරක්ෂාව යනාදි කරුණු ඇතුළත් ව සාකච්ඡාව කිරීම වැදගත් ය. ඒ අනුව එක් එක් සිසුවාට එම තොරතුරු පන්තිය හමුවේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

මීට අමතර ව පහත සඳහන් ක්‍රියාකාරකම් හා අවස්ථා ද යොදා ගත හැකි ය.

- ★ දවස ගත කළ අන්දම පැවසීම
- ★ පළමු පාසල් ගමන ආරම්භ වූ දිනය
- ★ වෙනත් අයකුට පිහිට වූ අවස්ථාවක්
- ★ මෑතක දී කියවූ පොතක් පිළිබඳ විස්තරයක්
- ★ විස්මයට පත් වූ අවස්ථාවක්

## නිපුණතා මට්ටම

4.2.3.2 එදිනෙදා සිදුවීම් ඉදිරිපත් කරයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

- ★ එදිනෙදා සිදුවීම් ඉදිරිපත් කිරීම. පන්ති කාමරයේ නිරන්තර වැඩක් ලෙස පවත්වා ගෙන යන්න. මේ සඳහා පන්ති කාමර වේදිකාව හා එෆ්එම් මයික් භාවිත කරමින් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ. තමා සම්බන්ධ මෙන් ම අවට පරිසරය හා සම්බන්ධ සිදුවීම් අත්දැකීමෙන් හෝ නිරීක්ෂණයෙන් හෝ පැවසීමට අවස්ථාව සලසා දෙන්න.
- ★ දෛනික ව කාලීන පුවත් ඉදිරිපත් කිරීමේ වැඩ සටහනක් අඛණ්ඩ ව පවත්වා ගෙන යන්න.

## ක්‍රියාකාරකම - 1

පහත සඳහන් නිරීක්ෂණයෙන් ලැබූ අත්දැකීම් හෝ සිදුවීම්වලින් ලැබූ අත්දැකීම් හෝ සිසුන්ට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

උදාහරණ - 01

- ★ අද කාලගුණික තත්ත්වය
- ★ කාලීන සිදුවීම්
- ★ පරිසරයේ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ පත්‍රිකාව ඇසුරෙන් සිසුන් තක්සේරු කරන්න. සිසුන් සියලු ම දෙනා මෙවැනි අවස්ථාවලට සහභාගි කරවන්න.

නිරීක්ෂණ පත්‍රිකාව

| [illegible] / නිර්ණායක | [illegible] |
|---|---|
| මාතෘකාවට අදාළ ව | ✓ |
| හඬ පාලනය | ✓ |
| අංග චලනය හා ඉරියව් | ✓ |
| ආචාරශීලී බව | ● |
| උචිත වාංමාලාව භාවිතය | ✓ |
| කාලය | ● |

## නිපුණතා මට්ටම

4.2.3.3 අසන්නාගේ ස්වභාවය අනුව ආචාරශීලී ව හා සංවේදී බවින් යුතු ව කතා කරයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

අසන්නාගේ ස්වභාවය අනුව ආචාරශීලී ව හා සංවේදී බවින් යුතු ව කතා කිරීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරවන්න.

- ★ ආචාරශීලී ව කතාව ඇරඹීම.
- ★ සවන්දෙන්නාගේ තරාතිරම හා ස්වභාවයට උචිත වාංමාලාවක් යොදා ගැනීම.
- ★ අසන්නාගේ අදහස්වලට සවන් දීම.
- ★ ආරම්භයේ දී පැවති ආචාරශීලී කතාබහ අවසානය තෙක් පවත්වාගෙන යාම.
- ★ ආචාරශීලී ව කතාව අවසන් කිරීම.

### ක්‍රියාකාරකම - 1

පහත සඳහන් අවස්ථාවල දී කතාබහ කිරීමට සිසුන්ට අවස්ථාව සලසා දෙන්න.

### විශේෂ උපදෙස්

★ මෙම නිපුණතා මට්ටම ක්‍රියාත්මක කිරීමේ දී,
4.2.1.4 - අත්දැකීම් විස්තර කරයි.
4.2.3.1 - තොරතුරු සෙසු අයට සපයයි.
යන නිපුණතා මට්ටම් සමග සමෝධානය කරගත හැකි ය.

## නිපුණතා මට්ටම

4.2.3.4 උචිත ශෛලියෙන් යුතු ව නිවේදනවල යෙදෙයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

- ★ විවිධ ශෛලියෙන් යුතුව කතා කළ හැකි නිවේදන මේ සඳහා යොදා ගන්න.
- ★ හඬ හා වේගය පාලනය කරමින් අදහස් පැහැදිලි වන ආකාරයට නිවේදන, දැන්වීම්, විස්තර ප්‍රචාර කරන ආකාර නිරූපණයට අවස්ථාව ලබා දෙන්න.
- ★ පන්ති කාමර වේදිකාව මත සිට එෆ්එම් මයික් භාවිත කරමින් මෙය කළ යුතු අතර ඒවා පටිගත කිරීමෙන් පසු නැවත ඇසීමට සලස්වා ප්‍රතිපෝෂණ අවස්ථා උදා කර ගන්න.

### විශේෂ උපදෙස්

මේ සඳහා හතර වන ශ්‍රේණියේ 1.3.1.4 විවිධ ශෛලීන්ගෙන් යුතු ව කියවයි, යන නිපුණතා මට්ටමට යෝජිත ක්‍රියාකාරකම් යොදා ගත හැකි ය.

## නිපුණතා මට්ටම

4.2.3.5 නායකත්වය දරමින් උපදෙස් දෙයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

- ★ නායකත්වය දරමින් උපදෙස් දීමට හැකි වන අවස්ථා කිහිපයක් තෝරා ගන්න. එම අවස්ථාවලට සෑම සිසුවකුට ම ක්‍රියාකාරී ව සහභාගි වීමට අවස්ථාව ලබා දෙන්න.
- ★ තමා නායකත්වය දුන් ක්‍රියාකාරකමේ කළ කාර්යයන් පිළිබඳ ව තොරතුරු දැක්වෙන පොත් පිංචක් සකස් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.

නායකත්වය දැරීමට සුදුසු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

- ★ එළිමහන් කියවීමේ ඒකකයේ නායකත්වය.
- ★ නිර්මාණ පැදුර සැකසීමේ නායකත්වය.
- ★ ශරීර සුවතා වැඩ සටහනේ නායකත්වය.
- ★ පන්ති නායකත්වය / විෂය නායකත්වය / කණ්ඩායම් නායකත්වය.
- ★ ක්‍රීඩාමය ක්‍රියාකාරකම්වල දී නායකත්වය.
- ★ කියවීම් කඳවුරේ නායකත්වය.
- ★ නිවාසාන්තර මලල ක්‍රීඩා තරගවල දී නිවාස නායකත්වය.
- ★ විෂය සමගාමී ක්‍රියාකාරකම්වල දී නායකත්වය.

## ක්‍රියාකාරකම - 1

අනතුරුදායක නොවන එළිමහන් ස්ථානයකට පන්තියේ සිසුන් රැගෙන යන්න. සිසුන් යුගල වශයෙන් කණ්ඩායම් කරන්න. සෑම යුගලයකට එක් අයෙක් පළමු වැන්නා වේ. අනෙකා දෙවැන්නා ය. ඉන්පසු ව ''පළමුවැන්නාගේ දෑස් වැසෙන සේ රෙදි පටියකින් බඳින්න. දෙවැන්නා වචනවලින් පමණක් උපදෙස් දෙමින් පළමු වැන්නා එළිමහන් ස්ථානයේ නිශ්චිත ස්ථානයකට රැගෙන යා යුතු ය. මෙහි දී එළිමහනේ ඇති බාධක නිසා පළමු වැන්නාට (දෑස් බැඳ ඇති අයට) අනතුරක් නොවිය යුතු අතර නිවැරදි වාචික උපදෙස් ලබා දිය යුතු ය. පසු ව මෙම ක්‍රියාකාරකම අනෙකාට මාරු කර පවත්වාගෙන යන්න.

## නිපුණතාව

4.2.4 විචාරශීලී ලෙස කතා කරයි.

## නිපුණතා මට්ටම

4.2.4.1 ප්‍රශ්නකරණයේ හා පිළිතුරු දීමේ යෙදෙයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

- ★ ප්‍රශ්න සකස් කිරීමට සුදුසු කවි, ගී, ඡේද තෝරා ගන්න. සිසුන් කණ්ඩායම් කර එක ම ඡේදය හෝ එක ම කවි පෙළ හෝ කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- ★ එම ඡේද ඇසුරෙන් ප්‍රශ්න සැකසීමට සිසු කණ්ඩායම්වලට පවරන්න.
- ★ එක් කණ්ඩායමක් විසින් සෑදූ ප්‍රශ්න අනෙක් කණ්ඩායම්වලට ඉදිරිපත් කර පිළිතුරු ලබා ගැනීමේ තරගවලට අවස්ථාව සලස්වන්න.
- ★ පන්තිය තුළ, සමාන්තර පන්ති අතර, අවට පාසල් අතර විවාද තරග පැවැත්වීමට කටයුතු සලස්වන්න.

## නිපුණතා මට්ටම

4.2.4.2 අදාළ තැනට උචිත වචන යොදමින් කතා කරයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කරන්න. පහත සඳහන් අවස්ථාවලින් එකක් පන්තිය හමුවේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

## ක්‍රියාකාරකම - 1

පහත සඳහන් සංවාදමය අවස්ථා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

- ★ දුරකථන සංවාදයක්
- ★ පාරිභෝගිකයා හා වෙළෙන්දා අතර සංවාදයක්
- ★ මව හා පුතා/දුව අතර සංවාදයක්
- ★ වෛද්‍යවරයා හා රෝගියා අතර සංවාදයක්

## ක්‍රියාකාරකම - 1

මාතෘකා තෝරා ගැනීමේ දී විවිධ විෂයයන් පිළිබඳ ව සලකා බැලීම සිදු විය යුතු ය.

- ★ ගස් වැල් අපේ මිතුරෝ ය.
- ★ වන සතුන් පරිසරය සුන්දර කරයි.
- ★ කියවීමෙන් ජීවිතය ජය ගනිමු.
- ★ අපගේ ශ්‍රේෂ්ඨ රජවරුන්ගේ හපන්කම්.
- ★ ජලය මිනිසාගේ ජීවනාලියයි.
- ★ ගත සිත පිනවන රසවත් පලතුරු.

## විශේෂ උපදෙස්

★ මෙම නිපුණතා මට්ටම ක්‍රියාත්මක කිරීමේ දී

4.2.4.2 - අදාළ තැනට උචිත වචන යොදමින් කතා කරයි.

4.2.4.3 - ආචාරශීලී ව හා සංවේදී බවින් යුතුව කතා කරයි

යන නිපුණතා මට්ටම් සමග සමෝධානය කරගන්න.

## ක්‍රියාකාරකම - 2

- ★ පහත සඳහන් වචන සහිත කාඩ්පත් සකස් කර ගන්න.
- ★ එක් එක් සිසුවා ඉදිරියට කැඳවන්න.
- ★ එක් කාඩ්පතක් ගැනීමට උපදෙස් දෙන්න.
- ★ එහි ඇති වචන උපයෝගී කරගෙන අර්ථවත් කතාවක් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

### කාඩ්පත් අංක 1

අහස, සරුංගලය, සතුටින්

### කාඩ්පත් අංක 2

හිමිදිරියේ, සුන්දර, සුවදායී, සතුට

### කාඩ්පත් අංක 3

බියකරු, අඳෝනාවක්, වේදනාවෙන්, උදව්, ප්‍රයත්නය

## නිපුණතා මට්ටම

4.2.4.3 මුල මැද අග ගැළපීමක් සහිත ව කතා කරයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

- ★ සිසුන්ට මාතෘකා බෙදා දෙන්න.
- ★ කරුණු රැස් කර ගැනීමට කාලය ලබා දෙන්න.
- ★ මුල මැද අග ගැළපීමක් සහිත ව කතා කිරීම සිදුවන්නේ දැයි නිරීක්ෂණය කිරීමට සිසු කණ්ඩායම්වලට පවරන්න.
- ★ එම කතා පටිගත කර නැවත ඇසීමට අවස්ථාව ලබා දී ප්‍රතිපෝෂණය ලබා දෙන්න.

## ගුරුවරුන්ගේ ස්වයං ඇගයීම සඳහා වූ නිර්ණායක

01. සංවාද කුසලතාව, කථන කුසලතාව යන සංකල්ප දෙක වටහා ගෙන ක්‍රියාකාරකම් සැලසුම් කරන්නේ ද?

02. සංවාද කුසලතාව සවන් දීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන කුසලතාවක් බව අත්දැකීමෙන් වටහා ගෙන ක්‍රිය කරන්නේ ද?

03. කටහඬේ උස් පහත් බව, වචන බර කිරීම, නැවැත්වීම යන භාෂා උපක්‍රම සංවාදයේ දීත් කථනයේ දීත් තිබෙන බව වටහා ගෙන ක්‍රියාකරන්නේ ද?

04. සංවාද සඳහා වූ වාතාවරණයක් සකස් කිරීමේ දී ළමුන්ට පැකිලීමකින් තොර ව කතා කිරීමටත්, උනන්දුවෙන් සාකච්ඡා කිරීමටත්, සැමදෙන ම සම්බන්ධ කරවීමටත් ගුරුවරයාගේ දිරිමත් කිරීම අවශ්‍ය බව ඔබට හැඟෙන්නේ ද?

05. කතන්දර, අංග චලන හා අභිනය සහිත ව කීමටත්, ගීත, වින්දනාත්මක ව ගැයීමටත් අවස්ථාව ලබා දෙන්නේ ද?

06. දැන්වීම් හා උපදෙස් කීමටත් ඒට සවන් දී ක්‍රියාත්මක වීමටත් ඉඩ ප්‍රස්තා ලබා දෙන්නේ ද?

07. පෙර සූදානමක් ඇතිව කතා කිරීමටත්, පෙර සූදානමක් රහිත ව කතා කිරීමටත් අවස්ථා සලසා දී ඔවුන් දිරිමත් කරන්නේ ද?

08. විවිධ කතාවලට සවන් දී කතා කිරීමට ශ්‍රව්‍ය දෘෂ්‍ය පට හා සංයුක්ත තැටි වැනි දෑ භාවිත කරන්නේ ද?

09. චරිතවලට ආරෝපණය වී කතා කිරීමටත්, නාට්‍යවල රඟපෑමටත්, සජීවී විස්තර ප්‍රචාරක කටයුතු කිරීමටත්, විවාදවලටත් අවශ්‍ය ඉඩකඩ සලසා දෙන්නේ ද?

10. ප්‍රහේලිකා හා තේරවිලි විසඳීමටත් ඉඟියක් ලබා දී ප්‍රශ්න ඇසීම තුළින් එය ප්‍රකාශ කිරීමටත් ඔවුන්ට උදවු ලබා දෙන්නේ ද?

11. කතා කිරීමට පසුබට වන, හැකිළෙන මානසික ගැටලු ඇති ළමුන් හඳුනාගෙන එම ගැටලු මඟහැරවීමට විවිධ ක්‍රමවේදයන් අනුගමනය කළේ ද?

12. වාග්මාලාව පෝෂණය කිරීම තුළින් සංවාද කුසලතාව දියුණු කිරීමට නව ක්‍රමවේදයන් අනුගමනය කළේ ද?

13. නවීන ඉගැන්වීම් ක්‍රමශිල්ප භාවිත කර ක්‍රියාකාරකම් තුළින් සංවාද කුසලතාව වර්ධනය කිරීමට උත්සාහ කළේ ද?

14. සංවාද කුසලතාව මැනීමේ මාධ්‍ය, කථනය බව වටහාගෙන තක්සේරු කරන්නේ ද?

# 4.3 කියවීම

අකුරු දැනීමේ හැකියාව ඇරඹෙන්නේ කියවීමේ දී ය. දකින දේ මොළය දැනගෙන අර්ථය හඳුනා ගන්නා විට කියවීම සිදුවේ. කියවීමේ දී මානසික ක්‍රියාවන් දෙකක් සිදුවේ. මොළය ඇසට පැවසීම හා ඇස මොළයට පැවසීම එම ක්‍රියාවන් දෙක වේ. වචන හා වාක්‍ය වශයෙන් ඇති පද ශබ්ද බවට පෙරළා, උච්චාරණය කර, අවයවත් වචන දකින ඇසුත් ඒකාබද්ධ වුවහොත් කියවීම නිසියාකාර ව සිදු වන්නේ ය. එබැවින් කියවීමෙහි වචන හඳුනා ගැනීම, උච්චාරණය, අර්ථ වටහා ගැනීම යනුවෙන් අංශ තුනක් ඇත. මනස, ඇස්, කන්, නාසය, දිව ආදී හඬට අදාළ අවයව සියල්ලගේ ම සහයෝගය අවශ්‍ය වන තත්ත්වයක් ඇත්තේ කියවීමේ දී පමණි. කියවීමේ දී ලියන සංකේත ශබ්ද සංකේත බවට හරවනු ලැබේ. ශබ්ද නගා කියවීමේ දී පමණක් මෙම ක්‍රියාවලිය සිදුවන්නේ යැයි කිව නොහැක. නිහඬ කියවීමේ දී ද මෙම ක්‍රියාවලිය ම සිදුවේ. කියවීමේ ක්‍රියාවලිය හා සවන්දීමේ ක්‍රියාවලිය අතර විශාල වෙනසක් නැත. සවන්දීමේ දී යමෙක් පිටතින් සිට කතා කරති. කියවීමේ දී කියවන්නාගේ මනස තුළින් කෙනකු කතා කරන්නාක් වැනි තත්ත්වයක් ඇති වේ. ශබ්ද වශයෙන් පිටකිරීමේ ක්‍රියාවලිය කියවීමේ දී සිදුවේ. එම ක්‍රියාවලිය තුළින් පමණක් කියවීම සම්පූර්ණ නොවේ. ශබ්ද වශයෙන් පිටකරන වචනවල අර්ථය වටහා ගත යුතු ය. අර්ථය වටහා ගෙන කියවීම සැබෑ කියවීම වන්නේ ය. අකුරුවලින් ගොඩනැගුණු වචන, වචනවලින් ගොඩනැගුණු වාක්‍ය ආදිය කියවීමේ දී අර්ථය වටහාගෙන කියවිය යුතු ය. එබැවින් අකුරු, වචන, වාක්‍ය යනාදිය අර්ථය වටහාගෙන හැසිරවීම කියවීමේ දී ඉතාමත් අත්‍යවශ්‍ය ය.

## නිපුණතාව

4.3.1 නිවැරදි උච්චාරණය සහිත ව විරාම ලක්ෂණවලට අනුකූල ව කියවයි.

## නිපුණතා මට්ටම

4.3.1.1 මිශ්‍ර සිංහල හෝඩියේ සියලු අක්ෂර නිවැරදි ව උසුරුවමින් කියවයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

*ගුරු උපදෙස්*

සිසුන්ගේ මට්ටමට ගැළපෙන ඡේද තෝරාගෙන කාඩ්පත්වල / කළුලෑල්ලේ ලියා ඉදිරිපත් කරන්න. එක් එක් සිසුවාට එය තනිව ම කියවීමට සලස්වන්න. ඡේදයේ ඇති සියලු අක්ෂර නිවැරදි ව උසුරුවමින් කියවන්නේ දැයි සොයා බලන්න.

★ කියවීමට දුෂ්කරතා දක්වන සිසුන් සඳහා නිවැරදි ව අක්ෂර හා වචන කියවීමට යොමු කරවන්න.

★ මේ සඳහා පෙළපොත, පුවත්පත්, නිර්දේශිත වෙනත් ග්‍රන්ථ, නිවේදන, දැන්වීම් ආදිය ද යොදා ගන්න.

### ක්‍රියාකාරකම - 1

පහත දී ඇති ඡේද සිසුන් ලවා ශබ්ද නගා කියවීමට යොමු කරවන්න.

### උදාහරණ 01

*''කැලේ ඇවිද යන අපට පඳුරක තිබී කුරුලු කූඩුවක් හමු විය. බට්ටිච්චි කුඩු ගස් දෙබල්වල ඇත්තේ තද සුළඟකටවත් බිම නොවැටෙන පරිද්දෙනි. කූඩු තුළ පැටවුන් ඇතැයි අපේ සිත කුහුලින් පිරුණි. අප කුරුලු කූඩුවට එබී බැලුවේ වෙනත් ගස් දිගේ බඩගෑමෙනි. හිටි හැටියේ ම කුරුල්ලාත් කිරිල්ලීත් කොහේදෝ සිට පැමිණ කෑ ගසන්නට වූහ.''*

### උදාහරණ - 02

*''මේ පවත් ඇසූ ඇත් රජ තෙමේ පැන් සොයනු පිණිස අට දිගට ම ඇතුන් යැවූයේ ය. මෙසේ පෙරදිග බලා නික්මුණු ඇත් පිරිසට පිරිසිදු ජලයෙන් පිරුණු නන්දා නම් වූ අභිනන්දනීය විලක් දක්නට ලැබිණි. එය සේරුන්, දියකාවන්, තාරාවන්, පාත්තයන්, හංසයන්, රාජ හංසයන් ආදි පක්ෂි ජනයා විසින් සේවිත ය. හාත්පසින් ම එය සල්, සපු, කීණ, අඹ, දඹ, දොඹ ආදී වෘක්ෂ ගණයාගෙන් විසිතුරු ය. නිරන්තරයෙන් භෘංගයන් විසින් උරා ගනු ලබන මකරන්දය ඇති ඕලු, නෙළුම් ආදී පුෂ්පයන්ගෙන් අලංකෘත ය.''*

(විෂ්ණු ශර්මන්ගේ පංචතන්ත්‍රය - අනුවර්තනය : හේමපාල මුනිදාස)

මෙවැනි වෙනත් ගද්‍ය ඡේද සපයාගෙන සිසුන්ට කියවීමට යොමු කරවන්න.

### විශේෂ උපදෙස්

මෙම ක්‍රියාකාරකමින් පසුව එක් එක් සිසුවාගේ කියවීම් දුෂ්කරතා හඳුනා ගන්න. එවැනි සිසුන් සඳහා විශේෂ ප්‍රතිපෝෂණ ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.

## නිපුණතා මට්ටම

4.3.1.2 සියලු පිලි නිවැරදි ව උසුරුවමින් කියවයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

*ගුරු උපදෙස්*

★ සියලු පිල්ලම් නිවැරදි ව කියවීමට සුදුසු ඡේද, කවි, ගීත සපයාගෙන සිසුන්ට කියවීමට සලස්වන්න.

★ මේ සඳහා පෙළපොතේ ඡේද ද යොදා ගෙන කියවීමට සලස්වන්න.

★ මීට අමතර ව නිර්දේශිත වෙනත් පොත් ද භාවිතයට ගන්න.

- ★ ඉස්පිලි, පාපිලි, හල්කිරීම්, ඇලපිලි, ඇදපිලි (ඇදය), රකාරාංශය, යංශය, ගයනුකිත්ත, කොම්බුව, කොම්බු දෙක, කොම්බුව සහ ගයනුකිත්ත, ගැට ඇලපිල්ල යෙදුණු අකුරු සහිත වචන කියවීමට දෙන්න.
- ★ හතරවන ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.3.1.5 නිපුණතා මට්ටම ප්‍රයෝජනයට ගන්න.

## ක්‍රියාකාරකම - 1

පහත සඳහන් වගන්ති සිසුන් ලවා කියවීමට සලස්වන්න. ඉරි ඇඳි පදවල ඇතුළත් පිලි කෙරෙහි අවධානය යොමු කරවන්න.

- ▲ *පෞරාණික ස්ථානයක් වූ සීගිරිය ලාංකිකයන්ගේ ජාතික උරුමයකි.*
- ▲ *වෛද්‍යවරයා අසාධ්‍ය රෝගීන් පරීක්ෂා කර, ඖෂධ නියම කළේ ය.*
- ▲ *ඖෂධීය ගුණයෙන් යුතු කොළ කැඳ දෛනික ව පානය කිරීමෙන් අපගේ සෞඛ්‍ය ආරක්ෂා කරගත හැක.*
- ▲ *ඓතිහාසික ඇම්බැක්ක දේවාලය ගෘහ-නිර්මාණ ශිල්පය අතින් ලෝක ප්‍රසිද්ධ ය.*
- ▲ *පාසලේ ත්‍රෛමාසික ව එළි දක්වන ප්‍රවෘත්ති සඟරාවට සිසුහු ලිපි සැපයූහ.*

## ක්‍රියාකාරකම - 2

පහත සඳහන් කවිය සිසුන් ලවා ශබ්ද නගා ගායනා කිරීමට සලස්වන්න.

★ *වැල්ලව වෙලේ වේ වැල්වල වවුල්ලු*
*විල්වල වේලිවල වැව්වල ලුල්ලු*
*වැල්ලව වලව්වේ ලී ලෝලු ලෑලිලු*
*වැල්ලව වෙලේ වී ලෑවේ වාල්ලු*

මෙවැනි කවි හා ගීත සපයාගෙන ඉදිරිපත් කරන්න.

## ක්‍රියාකාරකම - 3

පහත සඳහන් ඡේදය නිවැරදි ව කියවීමට සලස්වන්න.

*''ආගමි නිර්මාතෘවරුන්ගේ චරිත ගැන සිතන විට එතුමන්ලා ආදරය, කරුණාව, මෛත්‍රිය යන ගුණාංග පෞරුෂයට එකතු කරගෙන තිබේ. තෘෂ්ණාව, වෛරය යන බැහැර කළ යුතු අංග තම සිත්වලින් ඉවත් කිරීමට දෛනික ව සිත් පහන් කිරීමේ අභ්‍යාසවල යෙදුණු බව ඓතිහාසික තොරතුරුවලින් හෙළි වේ.''*

## නිපුණතා මට්ටම

4.3.1.3 වේගවත් ව හා ප්‍රවීණත්වයෙන් යුතු ව කියවයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

- ★ වේගවත් ව හා ප්‍රවීණත්වයෙන් යුතුව කියවීමේ කුසලතා වර්ධනය කිරීමේ ක්‍රියාකාරකම්, ප්‍රියජනක ආකාරයට, තරගකාරී ස්වරූපයෙන් ඉදිරිපත් කරන්න.
- ★ ගද්‍ය කොටස් තෝරා ගන්නා විට මුලින් ම සරල බසින් ලියැවුණ දේ යොදා ගන්න.
- ★ කියවීමේ පැහැදිලි බව, නිවැරදි උච්චාරණය හා හඬ පාලනය, කියවීමේ කාලය මැන බැලීම යන නිර්ණායක පිළිබඳ ව අවධානය යොමු කරන්න.

## ක්‍රියාකාරකම - 1

පහත සඳහන් ඡේදය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න. දෙන ලද නිශ්චිත කාලයක් තුළ දී ඡේදය වේගයෙන් කියවා එහි සඳහන් උපමාව සොයා ලිඛිත ව ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරවන්න.

(මෙය තරගයක ආකාරයෙන් පැවැත්වීම සුදුසු ය. හැකි නම් එක් සිසුවකුට ඡේදය බැගින් ලියූ කාඩ්පත් එක බැගින් ලබා දීම වඩාත් උචිත ය.)

*''බැඳගෙන වැසි වසින මාස් මෝසමේ කළමනා ගෙන ඒමට යාම අතිශයින් ම දුෂ්කර ගමනකි. දින ගණන් නොව සති ගණන් එක දිගට වැසි වැටෙන*

*බැවින් ජලය උරා බොන පොළොව මඩ කුඹුරක් මෙන් මොලොක් වෙයි. පොළොව ඇති තරම් ජලය උරා බිව් පසු වැටෙන වැඩි වතුර දෝරේ ගලමින් පහත් බිම් ඔස්සේ ගලා බසියි. දෙපා කොතැනක බිම තැබුවත් අඟල් කිහිපයක් යටට එබී යයි. ඇඟිලි කරු අතරින් චිරිස් ගා මිරිකී මතුවන මඩ රොල්ල දෙපා වසා ගනී.''*

වනයේ ඇඳුණු පිය සටහන් -
පියසේන කහඳගමගේ

## ක්‍රියාකාරකම - 2

සිසුන් පස්දෙනා බැගින් කණ්ඩායම් කරන්න. පහත දැක්වෙන වගන්ති කාඩ්පත්වල වෙන වෙන ම ලියා එක් කට්ටලය බැගින් කණ්ඩායම් අතර බෙදා දෙන්න. සිද්ධිය අනුපිළිවෙළට ගොඩ නැගෙන සේ නිශ්චිත කාල සීමාවක් තුළ පෙළ ගැස්වීමට කණ්ඩායම් යොමු කරවන්න. මෙය තරගයක් ලෙස පවත්වන්න.

### උදාහරණ - 01

*නිමල් ගෙනැවිත් දුන් මිරිස් පැළය එහි සිටුවා එයට ජලය යෙදුවේ ය.*

| |
|---|
| *එම පොල් ලෙල්ල, වගා බඳුනක ආකාරයට කම්බියකින් බැඳ සකස් කර ගත්තේ ය.* |

| |
|---|
| *පාසල ඇරී නිවසට ආ සරත් පොල් ලෙලි ගොඩෙන් තරමක් විශාල පොල් ලෙල්ලක් තෝරා ගත්තේ ය.* |

| |
|---|
| *මිරිස් පැළය සිට වූ වගා බඳුන කොක්කක ආධාරයෙන් අඹ ගසේ අත්තක එල්ලුවේ ය.* |

| |
|---|
| *අනතුරුව කොම්පෝස්ට් වලකින් පොහොර ගෙන ඔහු ඒවායින් වගා බඳුන පිරවී ය.* |

## ක්‍රියාකාරකම - 3

වම්පස ඇති ගීත ඛණ්ඩවලට ගැළපෙන ගීත ඛණ්ඩ දකුණු පසින් තෝරා ගැළපීමේ ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.

### උදාහරණ - 01

| | | | |
|---|---|---|---|
| *1.* | *දකුණ බලා වම බලන්න<br>නැවතත් දකුණ ම බලන්න* | *1.* | *ගුණ නුවන දැක්කම<br>ඔබට සලකයි රටේ ඔක්කොම* |
| *2.* | *ගුරුසිත නොරිදවා<br>වේලාව නොවරදවා* | *2.* | *බෝ අතුවල එල්ලී ගෙන<br>මා වවුලෝ කෑ ගසතී* |
| *3.* | *බකමූණෝ පියාඹතී<br>අනෙක් කුරුල්ලෝ නිදතී* | *3.* | *පාරේ වාහන නැත්නම්<br>ඉක්මනින් ම මාරු වෙන්න* |
| *4.* | *දැන ඉගෙන ගත්තම<br>තමයි කෙනෙකුගෙ වත්කම* | *4.* | *එය රැක ගන්නට මෙලොවේ<br>සමත් වෙතොත් පුත නුඹ වේ* |
| *5.* | *ජාතිය මිණි පහනක් වේ<br>ආගම රන් විමනක් වේ* | *5.* | *බැති පෙම් උපදවා<br>අකුරු උගනී කුමරු සොඳවා* |

## ක්‍රියාකාරකම - 4

අවශ්‍ය කොටස් තෝරා හිස්තැන් සම්පූර්ණ කර ඡේදය, කියවීමේ අභ්‍යාසවල සිසුන් යොදවන්න.

### උදාහරණ - 01

*තිත් මුවා හෙමිහිට හිස හරවමින් එළිමහන් බිමෙහි හැම අස්සක් (1) ______ සෝදිසි කර බැලුවේ ය. අවට කිසි අනතුරක් නොමැති බව ______ පැමිණ එළිමහන් තණ බිම වෙත ගමන් කළේ ය.*

*ළා දුඹුරු පැහැ සිහින් සිරුරකින් යුතු ඌ ඉතා ලස්සන සතෙක් විය. පිට පුරා වැටී ඇති පුංචි තිත් උගේ රුව වැඩි කර තිබිණ. හිස මුදුනෙහි වූ අලංකාර අං තට්ටුව ඌට ගෙන දුන්නේ ආඩම්බර පෙනුමකි.*

*එළිමහන් බිම වෙත පැමිණි උන් රිසි සේ (2) ______ කන්නට පටන් ගත්හ. මුව පැටව් උන්ගේ ______ කරමින් සිටියහ. විටෙක උන් උඩ පනිමින් ______ සමග තරගයක යෙදී සිටි බවක් පෙනිණි. ______ සිටි මුවෝ හිස් ඔසවා බලා ටික වේලාවකින් ඇහුම්කන් දෙමින් සිට එළිමහන් බිමෙහි තවත් පැත්තකට ගමන් කළහ.*

---

*අස්සක් ම*
*නොමැති බව වටහා ගත් ඌ වදුළ*

*මුල්ලක් ම*
*වටහා ගත් ඌ වදුළ තුළින් එළියට*

*සෝදිසි*
*අවට කිසි අනතුරක් නොමැති බව*

*තණ උලා*
*වටා කරකැවෙමින් හා නටමින් සෙල්ලම් ද එකිනෙකා පසුපස පන්නා යමින් ද එකිනෙකා*


*උන් රිසි සේ*
*උන්ගේ මව් දෙනුන් වටා කරකැවෙමින් හා එකිනෙකා පසුපස පන්නා යමින් ද එකිනෙකා පෙනිණ.*

*තණ උලා*
*මව් දෙනුන් වටා කරකැවෙමින් හා නටමින් සෙල්ලම් ද එකිනෙකා පසුපස පන්නා යමින් ද එකිනෙකා තණ කමින්*

## ක්‍රියාකාරකම - 5

ඡේදයේ ඇතුළත් පින්තූර වෙනුවට සුදුසු වචනය යොදා ඡේදය කියවීමේ අභ්‍යාසවල සිසුන් යොදවන්න.

### උදාහරණ - 01

ඈත  අතරින්  උදාවනවාත්
සමග ම අවටින් ඇසෙන   ගේ මිහිරි නාදයෙන් අවදිවන දරුවෝ
 වෙත යාමට සූදානම් ‍ෙ  ්‍රීනක් සේ
සුදු ඇඳුමින් සැරසී ගත්  ගෙන් වැඩි පිරිසක් පා ගමනින් 
වෙත යන අතර තවත් පිරිසක්  ාසල වෙත යති.

## නිපුණතා මට්ටම

4.3.1.4 පැරණි හා නූතන ගද්‍ය පාඨ විවිධ ශෛලීන්ගෙන් යුතු ව කියවයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

> ගුරු උපදෙස්
>
> විවිධ ශෛලීන්ගෙන් යුතුව කියවීමට හැකි ගද්‍ය පාඨ මේ සඳහා තෝරා ගන්න. තෝරා ගත් ඡේද උචිත ශෛලීන්ගෙන් යුතුව කියවා පටිගත කර ගෙන සිසුන්ට ඇසීමට සලස්වන්න. ඉන්පසු ව එම ඡේද ලියූ කාඩ්පත් බෙදා දී උචිත ශෛලීන්ගෙන් යුතුව කියවීමට හුරු කරවන්න.

## ක්‍රියාකාරකම - 1

### උදාහරණ - 01

*ගම්මං ඇවිදිල්ල - ගම්මං ඇවිදිල්ල*
*කැවුම් කෙහෙලුත් බො - අරං ඇවිදිල්ල*
*ඉතිං නැගිටින්න - දෙ ඇස් පිහගන්න*
*හොඳින් සැරසෙන්න - ගිහිං දොරරින්න*
*දෙමව්පියො දෙන්න - හොඳින් පිළිගන්න*

(නරිබෑණා - දයානන්ද ජයවර්ධන)

### උදාහරණ - 02

*''....... එසමයෙහි එක් වැද්දෙක් **බෝධිසත්වයන්** වසන්නා වූ ගස සමීපයෙහි වර මන්දෙන් ඉදි කරන ලද උගුලක් සලස්වා ලී ය. **බෝධිසත්වයෝ** උගුලෙහි පෙරයම බැඳුණාහ. එමල වරපට කඩා*

*ගත නොහී* ***<u>මරණප්‍රාප්ත</u>*** *රාග වශයෙන් ඇඬූහ. ඒ අඬ අසා කෑරලා හා ඉදිබුවා එතැනට අවුත් යාළුවාට* ***<u>දුක්ඛය</u>*** *පැමිණි කල ගලවා ගන්නට උවමනා වේ දැයි සිතා........''*

(ජාතක පොත)

උදාහරණ - 03

*''.... එක් බ්‍රාහ්මණයෙක් ගවයන් දෙන්නා වූ දායකයන්ගේ සමීපයට ගොස් ගවයෙක් ලැබ ගෙන නන්දිවිශාල යැයි කියා නමක් කොට පුත්‍ර ස්ථානාන්තරයෙහි තබා ඕ හට බොහෝ ප්‍රිය වෙමින් කැඳ බත් ආදිය දී පෝෂ්‍ය කරන්නේ ය...''*

(ජාතක පොත)

උදාහරණ - 04

*''....... ස්වාමීනි* ***<u>මනුෂ්‍ය ඝාතක</u>*** *චණ්ඩ පරුෂ වූ නාලාගිරි හස්තියා මේ වීථියට පැමිණියේ ය. එතෙම* ***<u>බුද්ධාදීන්ගේ</u>*** *ගුණයක් නොදන්නේ ය. එසේ හෙයින්* ***<u>භාග්‍යවත් වූ සර්වඥයන්</u>*** *වහන්ස......''*

(බුත්සරණ)

උදාහරණ - 05

*''....... සුසුම් ලා යතින්නී, නෙත් කඳුළු ඉසින්නී, මෙලෙස සිට කියන්නී, සිංහ පුරවර සොඳා, රජ ඉසුරු විඳ විදා, කරන නොපණත් සඳා, නැව් නගා හළ සඳා, ලක් දිවට බැස එදා, නුග සෙවන වන මැදා, තනි ව උන් සඳ එදා, බත් බුලත් දී සොඳා, මවා විමනක් සොඳා......''*

(කුවේණි අස්න)

## නිපුණතා මට්ටම

4.3.1.5 නැවතීමේ ලකුණ, ප්‍රශ්නාර්ථ ලකුණ, විස්මයාදි ලකුණ සහ කොමාව යන විරාම ලකුණුවලට අවනත ව කියවයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

★ පහත සඳහන් ඡේදය සිසුන්ට ඉදිරිපත් කරන්න.

★ නැවතීමේ ලකුණ, ප්‍රශ්නාර්ථ ලකුණ, විශ්මයාදි ලකුණ සහ කොමාව යන විරාම ලකුණුවලට අවනත ව කියවීමට සිසුන් යොමු කරන්න.

★ මෙවැනි ඡේද පෙළපොතින් හා සුදුසු වෙනත් පොත්වලින් ද සපයාගෙන සිසුන්ට ලබා දෙන්න.

★ ලිවීම ක්ෂේත්‍රය යටතේ යෙදී ඇති 4.4.1.4 - නිපුණතා මට්ටම සමග සමෝධානය කරන්න.

උදාහරණ - 01

*'නැහැ, එහෙම වෙන්නේ නෑ. මම කියන විදියකට ඉන්නං. මට ටිකක් පීනන්නත් පුළුවනි. අනේ අද විතරක් මම එක්ක යන්න.''*

*''පීනන්නත් පුළුවනි !'' යි සරදමක් කළ කිරිබබා කර බාගෙන ගමන් කළේ ය.*

*'මට තරමක් පීනන්න පුළුවනි. මම බය නැහැ. අනේ, මං එක්ක යන්න''යි කියමින් මම දිවගොස් කිරිබබාගේ අත්ල ගෙන එහි සත පනහේ කාසියක් තැබීමි. ඔහු සත පනහ ආපසු මට දුන් නමුත්, මම එය නොගෙන,*

*''අනේ මාත් එක්ක යන්න!'' යි කියමින් කන්නලවු කෙළෙමි.*

(අපේ ගම - මාර්ටින් වික්‍රමසිංහ)

## නිපුණතාව

4.3.2 කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

## නිපුණතා මට්ටම

4.3.2.1 උපදෙස් කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

මේ සඳහා ලිඛිත උපදෙස් මාලාවක් ලබා දී එය කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දැක්වීමට සුදුසු වැඩ සංවිධානය කරගන්න.

### ක්‍රියාකාරකම - 1

උපදෙස් කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දැක්වීමට සුදුසු ක්‍රියාකාරකමක් පහත දැක්වේ.

### උදාහරණ - 01

පහත සඳහන් කවිය කියවා දී ඇති උපදෙස් අනුව පිළිතුරු සපයන්න.

▲ *ගුරු සිත නොරිද වා*
*වේලාව නොවර වා*
*බැති පෙම් උපද වා*
*අකුරු උගනී කුමරු සොඳ වා*

1. ''සිත'' යන වචනය වටා රවුමක් අඳින්න.
2. ''උගනී'' යන පදය යටින් ඉරක් අඳින්න.
3. ''අක්ෂර'' යන වචනයට සමානාර්ථවත් පදයක් කවියෙන් සොයා එය ඉරකින් කපා හරින්න.
4. ''ගුරු'' යන වචනයෙහි අර්ථය වෙනස් කිරීම සඳහා ''දෙ'' අකුර කවියේ එම වචනය ඉදිරියෙන් යොදන්න.
5. ''අවේලාව'' යන වචනයේ විරුද්ධාර්ථවත් පදය කවියෙන් සොයා එය වටා කොටුවක් අඳින්න.

▲ මේ සඳහා යොදා ගත හැකි වෙනත් ක්‍රියාකාරකම් කීපයක් පහත දැක්වේ.

- උපදෙස් පිළිපදිමින් පත්‍රිකාවක් පිරවීම.
- උපදෙස් කියවීමෙන් ප්‍රහේලිකාවක් පිරවීම.
- උපදෙස් කියවා නිර්මාණයක් කරවීම.
- උපදෙස් කියවා මග සලකුණු දැක්වෙන ගමන් මගෙහි සටහනක් යෙදීම.
- උපදෙස් කියවා ක්‍රියාකාරකමක යෙදීම.
- ගද්‍ය හෝ පද්‍ය පංතියක් කියවා උපදෙස් පිළිපැද ප්‍රතිචාර දැක්වීම.

## නිපුණතා මට්ටම

4.3.2.2 රූපික ප්‍රකාශන කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

රූපික ප්‍රකාශන කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දැක්වීමේ නිපුණතා මට්ටම සංකීර්ණ එකකි. එය ඉගැන්වීමේ පහසුව සඳහා ක්ෂේත්‍ර කීපයක් යටතේ සංවිධානය කර ඉදිරිපත් කෙරේ.


1. බහුල ව භාවිත වන පොදු රූපික ප්‍රකාශන.
2. භාණ්ඩ පරිහරණය සඳහා ඇති උපදේශනාත්මක රූපික ප්‍රකාශන.
3. පරිගණක තිරයක් මත දැකිය හැකි සලකුණු.

මේ හා සම්බන්ධ රූපික ප්‍රකාශන පංති කාමරයේ ප්‍රදර්ශනය කරන්න. ඒවායේ ප්‍රකාශිත අර්ථය සිසුන් සමග සාකච්ඡා කරන්න.

### ක්‍රියාකාරකම - 1

### උදාහරණ - 01

බහුල ව භාවිත වන පොදු රූපික ප්‍රකාශන


විදුලිය සැපයුම් ස්ථාන



ආබාධිත පුද්ගලයන් සඳහා



දුරකථන පහසුකම්



භෝජනාගාරය




ඉන්ධන පිරවුම් හල



ගුවන් තොටුපොළ



ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය




මාර්ග සංවර්ධන අධිකාරිය




පළල් මාර්ගය




ඛනිජ තෙල් නීතිගත සංස්ථාව




ලංකා විදුලිබල මණ්ඩලය



ගිනි ඇල්වීම අනතුරුදායකයි



පහළට බෑවුම් සහිත පාර ඉදිරියට



වර්ණ සංඥා ඉදිරියෙන්



වාහන නවතා තැබීම තහනම්



විදුලියෙන් අනතුරු ඇති වේ

ක්‍රියාකාරකම - 2

උදාහරණ - 01


භාණ්ඩ පරිහරණය සඳහා ඇති උපදේශනාත්මක රූපික ප්‍රකාශන.




බිඳෙන සුළුයි



ප්‍රවේශමෙන් අල්ලන්න



මේ පැත්ත උඩට





එක මත එක ගබඩා කළ හැක්කේ හයක් පමණි



ප්‍රතිචක්‍රීකරණය කළ හැක

පරිගණක තිරයක් මත දැකිය හැකි සලකුණු.



## නිපුණතා මට්ටම

4.3.2.3 සරල කවි ගී කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

අවබෝධ කර ගෙන ප්‍රතිචාර දැක්වීම සඳහා සුදුසු කවි තෝරා ගන්නා විට සාම්ප්‍රදායික ජනවහරේ එන කවි මෙන් ම නූතන කවි ද යොදා ගන්න. අවබෝධය විමසීම සඳහා වාචික මෙන් ම ලිඛිත ව පිළිතුරු ලබා ගැනීමේ ක්‍රියාකාරකම් සංවිධානය කර ගන්න.

ක්‍රියාකාරකම - 1

උදාහරණ - 01

▲ *දුම්බර කන්ද පාමුල මිනිරන් පතලේ*
*බැසලා බඹ තිහක් කළුගල සිදුරු කළේ*
*බස්නාහිරට දෝනා දෙක ගමන් කළේ*
*විස්තර කියම් දුම්බර මිනිරන් පතලේ*

1. මිනිරන් පතල පිහිටා ඇත්තේ කොහේ ද?
2. දෝනා දෙක ගමන් කළේ කුමන දිසාවට ද?
3. නාම විශේෂණ පද දෙකක් කවියෙන් තෝරා ලියන්න.
4. උත්තම පුරුෂ ඒක වචන ක්‍රියාපදයක් කවියෙන් තෝරා ලියන්න.
5. මෙම කවිය අයත් වන්නේ කුමන ජන කවි වර්ගයට ද?

උදාහරණ - 02

*ඉඳුනිල් ගඟුලැල් - පියුමෙන් සැරසූ*
*රුව ලස්සන මව් ලංකා*
*මුතුලැල් සයුරේ - තේජමාන දීපයයි*
*මගෙ මව්බිම ලංකා*
*මේ පොළෝ තලේ එදා උන්නු*
*රාජ රාජ සිංහයන්වන් වූ*
*දූ පුතුන් ලෙයින් තෙදින් නැංවූ*
*මගේ.... පූජනීය භූමියයි ලංකා*

*ඉඳුනිල් ගඟුලැල් .....//*

*සිවු මහා නදී ගලා බැසලා*
*රත්තරං ගොයම් කරල් පැසීලා*
*ජාතිකානුරාගයෙන් වෙලිලා*
*ජීවිතේ.... පුදා රකිවු ලංකා*

*ඉඳුනිල් ගඟුලැල් .....//*

පද රචනය : අජන්තා රණසිංහ

ක්‍රියාකාරකම - 2

උදාහරණ - 01

*මගෙ පොඩි යාළු - නෙළුම් ද ඕලු ...//*
*ගඟට යමු - ඔරු පදිමු*
*මල් නෙළමු - කවි කියමු //*
*හඳ වැටිලා - වතුරේ - බොඳ වෙනවා -*
*මිතුරේ - තරු ඉහිලා - අඳුරේ -*
*හිනැහෙනවා - ඉවුරේ //*
*කිරල ගොමු - වෙත ඇදෙමු*
*ගෙඩි කඩමු - ගොඩට යමු*
*මගෙ පොඩි යාළු... //*

*පිනි වැහැලා - මුතු සේ - මල මුදුනේ -*
*දිලිසේ - මා වුවුලෝ - රහසේ -*
*ඉගිළෙනවා - අහසේ //*
*කිරල ගොමු - වෙත ඇදෙමු*
*ගෙඩි කඩමු - ගොඩට යමු*
*මගෙ පොඩි යාළු... //*

පද රචනය : මහාචාර්ය සුනිල් ආරියරත්න

1. මෙම ගීතයෙන් කියැවෙන්නේ දවසේ කුමන වේලාවක් ගැන ද?
2. පිනි උපමා කර ඇත්තේ මොනවාට ද?
3. ''මා වවුලෝ රහසේ ඉගිලෙනවා'' යන වගන්තිය ලිඛිත බසට හරවා ලියන්න.
4. ''තරු ඉහිලා අඳුරේ හිනැහෙනවා'' යන වගන්තියේ අදහස ඔබේ වචනයෙන් ලියන්න.
5. උත්තම පුරුෂ බහුවචන අඛ්‍යාත පද පහක් ගීතයෙන් තෝරා ලියන්න.

## උදාහරණ - 02

*සඳපානේ වැලිතලා - සුර කුමරියො මල්සලා*
*නටති මෙලෙස බල බලා - ගිගිරි වළලු පය නොලා*
*සුර කුමරියො පෙළ සැදී - අතින් හිසින් රඟ යෙදී*
*හඟවති තාලය බැඳී - වීණා බෙර නද නොදී*
*සඳ ද සිනිඳු රැස් කඳු - නොහෙලා බිම එක බඳු*
*වලාකුළින් පිරිසිදු - පෙරා එවයි බිඳු බිඳු*

කුමාරතුංග මුනිදාස

1. මල් සලමින් නටන්නේ කවුද?
2. මෙහි වාද්‍ය භාණ්ඩ දෙකක් ගැන කියවේ. ඒවා නම් කරන්න.
3. 'චන්ද්‍රයා' යන පදයට සමානාර්ථ පදයක් ගීතයෙන් තෝරා ලියන්න.
4. 'අපිරිසිදු' යන පදයට විරුද්ධාර්ථ පදයක් තෝරා ලියන්න.
5. වලාකුළින් පෙරා පිරිසිදු කර එවන්නේ මොනවා ද?

## නිපුණතා මට්ටම

4.3.2.4 ගද්‍ය කොටස් කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

විවිධ කෘතිවලින් තෝරාගත්, සිසුන්ගේ සිත් ගන්නා ගද්‍ය ඡේද සිසුන්ට ඉදිරිපත් කරන්න. සිසුන්ගේ අවබෝධය මැනීම සඳහා ලිඛිත ප්‍රතිචාර ලබා ගන්න.

## ක්‍රියාකාරකම - 1

පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සැපයීමට සිසුන් යොමු කරවන්න.

## උදාහරණ - 01

*''ගස් බෙනයක මීයක් ඇති බව ගැමියා දැන ගන්නේ මීමැස්සන්ගේ ගුමු ගුමු නාදයෙනි. මීමැස්සන්ගේ ගුමු ගුමු නාදය ගැමියා හඳුන්වන්නේ ''මීය ගුගුරනවා'' යනුවෙනි. මී වද දෙවර්ගයකි. ඒවා පැණි වද හා පිලවු වද යනුවෙන් ගැමියෝ හඳුන්වති. කිරි වද යනු පිලවි වදවලට යෙදෙන වෙනත් නාමයකි. සුදු වර්ණයෙන් යුත් ළපටි පැටවුන් පිලවි යනුවෙන් හැඳින්වේ.*

*මී පැණි පිරුණු වද, පැණි වද නම් වේ. පැණි වදය ''ඉහල්'' යනුවෙන් ද ගම් වැසියෝ හඳුන්වති. ඉහල්ඔරු යනු වදයේ පැණි පිරුණු සිදුරු ය. මී මැස්සෝ සිදුරු පැණියෙන් පුරවා එහි මුහුණත් වසා දමති. ගැමියන් මෙය හඳුන්වන්නේ ''මීය පිය ගෑම'' යනුවෙනි.''*

1. ''මීය ගුගුරනවා'' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
2. මී වද දෙවර්ගයකි. ඒවා මොනවා ද?
3. මී මැස්සන් මී වදයේ සිදුරු පැණියෙන් පුරවන්නේ ඇයි?

4. සුදු වර්ණයෙන් යුත් ළපටි පැටවුන් සිටින වඳය කුමන නමකින් හැඳින්වේ ද?
5. මෙම ඡේදයේ සඳහන් ගැමියාගේ ජීවන වෘත්තිය කුමක් විය හැකි ද?

## උදාහරණ - 02

පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

*''රැහැයි කන් කරච්චලයෙන් කන් අගුලු වැටෙද්දී, අපි තව තවත් ඉදිරියට ගියෙමු. තේ වත්ත හරියේ දී හිසට වැටුණු හිරු අව්වෙන් එක් අංශු මාත්‍රයකුදු දැන් ඔළුවට නොවැටේ. ඒ වෙනුවට තුරු වියනක් හිසට ඉහළින් සෑදී තිබේ. මොහොතක් නතර ව මම තුරු වියන දෙස බැලීමි. වලාකුළින් බර අහසෙන් බිඳක් ඉඳහිට තැනකින් නෙතට අසුවේ.*

*උණ පඳුරු, බට පඳුරු, වැටකෙයා වැනි පඳුරු අතරින් අහසට නැගුණු ගස් වර්ග දහස් ගණනකි. මේ ගස් කොළන් අතරේ වැඩිපුර ම ඇත්තේ නම නොදන්නා රූස්ස ගස් කොළන් ය. එහෙත් වටිනා ගස් කොළන් කිසිවක් හඳුනාගත නොහැකි ය.''*

ශාන්ත කුමාර විතාන -
ශ්‍රී ලංකාවේ සුන්දර ස්ථාන

1. මෙහි සඳහන් ක්‍රියාපද දෙකක් ලියන්න.
2. ඡේදයේ සඳහන් උත්තම පුරුෂ නාමපද දෙකක් ලියන්න.
3. 'අපි තව තවත් ඉදිරියට ගියෙමු'. මෙම වගන්තිය ඒකවචනයට හරවා නැවත ලියන්න.
4. මේවායේ තේරුම ලියන්න.
    - ★ කන්කරච්චලයෙන්
    - ★ අංශුමාත්‍රයකුදු
    - ★ රූස්ස ගස්
5. ඡේදයෙන් විස්තර කරන්නේ කෙබඳු ප්‍රදේශයක් ගැන ද?
6. ඡේදයේ සඳහන් ප්‍රදේශයේ වැඩිපුර ම දක්නට ලැබෙන බව කියන්නේ මොනවා ද?

## ක්‍රියාකාරකම - 2

කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දැක්විය හැකි ගද්‍ය ඡේද පෙළපොතින් සපයාගෙන සිසුන්ට ලබා දෙන්න.

මීට අමතර ව නිර්දේශිත පොත්වලින් කොටස් ද යොදා ගන්න.

## නිපුණතා මට්ටම

4.3.2.5 භාෂාමය යෙදුම් කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

යුගල පද, උපමා, තනි පද, කෙටි යෙදුම්, ප්‍රස්ථාව පිරුළු, ආප්තෝපදේශ, ඉඟි වැකි වැනි භාෂාමය යෙදුම් සහිත ගද්‍ය, පද්‍ය කොටස් පෙළපොතින් හා වෙනත් පොත්වලින් තෝරා ගන්න.

ඒවා මතුවන අයුරින් කියවීමටත්, එම වචන ඡේදයෙන් වෙන්කර ලිවීමටත් හැකි වන අයුරින් ක්‍රියාකාරකම් සැලසුම් කරන්න.

සිසුන් පවත්වාගෙන යන පද පොතේ සටහන් කිරීමටත් නිර්මාණ පුවරුවේ ප්‍රදර්ශනය කිරීමටත් සිසුන් පොළඹවන්න.

## ක්‍රියාකාරකම - 1

පහත සඳහන් ඡේදය කියවීමට සිසුන් යොමු කරවන්න. ඡේදයේ සඳහන් යුගල පද සොයා කියවීමටත් පද පොතේ ලිවීමටත් උපදෙස් දෙන්න.

## උදාහරණ - 01

*''සෝමදාස ගේ-දොර, ඉඩ-කඩම්, හරක-බාන සියල්ල ම විකුණා දැමුවේ මවගේ ලෙඩ-දුක් සුවකර ගැනීමට අවශ්‍ය බෙහෙත්-හේත් ගැනීමට මිල-මුදල් උවමනා වූ බැවිනි. අගහිඟකම්වලින් පිරුණු නිසා ලොකුපුතාගේ පාසල් ගමන අතරමග නතර කරන්නට සෝමදාසට සිදු වූයෙන් ඔහු මහත්*

*කම්පාවට පත් විය. දුර-දිග බලා කටයුතු කරන ලෙස පන්සලේ ලොකු හාමුදුරුවෝ සෝමදාසට අවවාද-අනුශාසනා කළෙන් ඔහු දරුවන්ට අවශ්‍ය පොත-පත ගැනීමට මගක් කල්පනා කළේ ය. වතු-පිටි සියල්ල ම අහිමි වුවත් සෝමදාස ගමේ වෙද මහතාගේ පුරන් වූ කුඹුරු යාය වෙහෙස- මහන්සිය නොබලා කොටා වී වැපුරුවේ ය. ඔහුගේ අත-මිට සරු විය. පවුලේ සෑම දෙනාට ම හොඳ කලක් උදා විය.*

## උදාහරණ - 02

*දුර එනකොට වැටකෙයියා මලක් වගෙයි*
*ළඟ එනකොට රිදියෙන් කළ රුවක් වගෙයි*
*ගෙට එනකොට ගෙයි ඇවිලෙන පහන වගෙයි*
*මගෙ අම්මා මට මානෙල් මලක් වගෙයි*

## ක්‍රියාකාරකම - 2

පහත සඳහන් ඡේදය කියවා උපමා තෝරා ගෙන කියවීමටත් උපමා ලිවීමටත් සිසුන් යොදවන්න.

## උදාහරණ - 01

*"ධවල පැහැ ගත් මීදුම් පට අතරින් ඈතට දිස්වෙන කඳු ශිඛර කීපය මනස්කාන්ත දර්ශනයක් මවා පායි. කඳු ශිඛර පාමුල සිට දිග හැරෙන, එලූ මුතු පලසක් සේ පෙනෙන මල් ගොමුවේ එහා මෙහා දඟලන බිඟු කැළ නගන ගුමු ගුමු නාදය මියුරු ගීයක් වෙනුවෙන් වැයෙන වීණා නාදයක් වැනි ය. මේ කඳු අතරින් බිමට වැටෙන මහවැලි ගංගා කොමලිය ගස්වැල් අතරින් ඉදිරියට ඇදෙද්දී ජල කඳ මත නළියන පෙණ පොකුරු පුළුන් රොදවල් සේ ඔබ මොබ යමින් ගං ඉවුරේ හැපීම නෙතට රසඳුනකි."*

## ක්‍රියාකාරකම - 3

පහත සඳහන් ඡේදයේ ඉරි ඇඳි වාක්‍යාංශ වෙනුවට තනි පද යොදා ඡේදය නැවත කියවීමට හා ලිවීමට සිසුන් යොමු කරන්න.

*"ගලෙන් කරන ලද බැම්මකින් හරස් කරන ලද පල්ලම් ඔයේ ජලය යෝධ ඇළ හරහා පැරණි වැවක් වෙත ගෙන යන ලදී. යෝධ ඇළ දෙපස අක්කර විසිපහක් පමණ වූ සාරවත් බිම අද ජනයාගෙන් තොර ප්‍රදේශයක් බවට පත් ව ඇත. එසේ වූයේ යෝධ ඇළ සාදා දින තුන්සිය හැට පහක් ගතවන්නටත් පෙර එහි විසූවන් ගම පාළු කර දමා බොහෝ ජනයා වෙසෙන වෙනත් පළාත්වලට පදිංචිය සඳහා ගොස් සිටි නිසා ය. ගම පාළු වූ නිසා ම අද යෝධ ඇළ ජලයේ වාසය කරන සතුන්ගේ, බඩගා යන සතුන්ගේ මෙන් ම දිය ගොඩ වාසය කරන සතුන්ගේ ද පාරාදීසයක් බවට පත් ව ඇත."*

## ක්‍රියාකාරකම - 4

එදිනෙදා කටයුතු සඳහා භාවිත කරන කෙටි යෙදුම් සෙවීමට සිසුන් යොමු කරන්න. එම කෙටි යෙදුම්වලින් කියවෙන වචන ලියා කියවීමට සලස්වන්න.

## උදාහරණ 01

- ★ *ලංකා විදුලිබල මණ්ඩලය - ලං.වි.ම.*
- ★ *යුධ හමුදාව - යු.හ.*
- ★ *සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය - ස.ණ.ස.*
- ★ *ලියා පදිංචි තැපෑල - ලි.ප.තැ.*
- ★ *රාජ්‍ය සේවය පිළිසයි - රා.සේ.පි.*
- ★ *බුද්ධ වර්ෂ - බු.ව.*
- ★ *ක්‍රිස්තු වර්ෂ - ක්‍රි.ව.*
- ★ *ප්‍රදේශීය ලේකම් - ප්‍රා.ලේ.*

## ක්‍රියාකාරකම - 5

පහත සඳහන් ආකාරයේ ප්‍රස්තාව පිරුළු, ඉඟි වැකි, ආප්තෝපදේශ සෙවීමටත් පද පොතට එකතු කර ගැනීමටත් සිසුන් යොමු කරවන්න. මෙය නිරන්තර වැඩක් ලෙස පවත්වාගෙන යන්න.

## උදාහරණ - 01

## ප්‍රස්තාව පිරුළු

- ★ *කරදරයකට පත් වූ කෙනෙක් ඊට වඩා තවත් කරදරයකට පත් වීම*
  *- කබලෙන් ලිපට වැටුණා වගේ*
- ★ *නිශ්ඵල වැඩක යෙදීම*
  *- වක්කඩේ හකුරු හැංගුවා වගේ*

★ *උදව් කළ අය අමතක කර වෙනත් අයට ප්‍රශංසා කිරීම*
*- ගඟෙන් දිය බී මුහුදට අවඩන්නා සේ*

★ *අනතුරුදායක ක්‍රියාවක් වෙනත් අය ලවා කර ගැනීම*
*- බළලුන් ලවා කොස් ඇට බාවන්නා සේ*

## *ඉඟි වැකි*

★ *ඉතා සෙමින් වැඩ කිරීම*
*- ගොළුබෙලි ගමන*

★ *විශාල සතුටක් ඇති වීම*
*- ඉහේ මලක් පිපුණා*

★ *ප්‍රමාණය ඉක්මවා වර්ණනා කිරීම*
*- මුරුංගා අත්තේ තියනවා*

★ *අධික සැප සම්පත් විඳීම*
*- රජ ගෙදර පරෙවියා*

## *ආප්තෝපදේශ*

★ *උගතමනා ශිල්පයමයි මතු රැකෙනා*

★ *කාලය රන් හා සමාන ය*

★ *අවවාදයට වඩා ආදර්ශය උතුම් ය*

★ *උඩ පැන්නොත් බිම වැටේ*

## විශේෂ උපදෙස්

★ මෙම නිපුණතා මට්ටම ක්‍රියාත්මක කිරීමේ දී
4.3.2.4 - ගද්‍ය කොටස් කියවා අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.
4.2.4.2 - අදාළ තැනට උචිත වචන යොදමින් කතා කරයි
යන නිපුණතා මට්ටම් සමග සමෝධානය කරගන්න.

## නිපුණතාව

4.3.3 ලිඛිත සන්නිවේදන පත්‍රිකා කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

## නිපුණතා මට්ටම

4.3.3.1 ආරාධනා පත් කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

විවිධ අවස්ථා සඳහා යොදා ගැනෙන ආරාධනා පත් එකතු කර ගන්න.
ඒවා සිසුන්ට කියවීමට අවස්ථාව සලසන්න.
ආරාධනා පත්වල වැදගත් කරුණු මතුවන සේ වාචික ව හා ලිඛිත ව පිළිතුරු ලබා ගැනීමේ ක්‍රියාකාරකම් සංවිධානය කර ගන්න.

## ආරාධනා පත් වර්ග

1. මංගල අවස්ථා සඳහා සකසන ආරාධනා පත්

| | |
|---|---|
| ජිනපාල කුරුප්පු මහතා සහ එම මැතිනියගේ | අමරතුංග වීරකෝන් මහතා සහ එම මැතිනියගේ |
| ආදරණීය දියණිය | ආදරණීය පුත් |
| **සුරංගි** | **චන්දන** |

සමඟ අතිනත ගැනීමේ ප්‍රීතිය නිමිත්තෙන්


1997 ජුනි මස 12 වන බ්‍රහස්පතින්දා
පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා

හෝමාගම ''ෂැන්හයි ඩ්‍රැගන්'' හි දී පැවැත්වෙන
ප්‍රිය සම්භාෂණයට

..........................................................................ගේ
පැමිණීම ගෞරවයෙන් අපේක්ෂා කරමු.
*(පෝරුවේ චාරිත්‍ර පෙ.ව. 10.27ට)*

| | |
|---|---|
| 381<br>පිටිපන-දකුණ<br>හෝමාගම | ''නිසංසල''<br>මිනිගමුව<br>ගලගෙදර |


2. විවෘත කිරීමේ අවස්ථා සඳහා සකසන ආරාධනා පත්




3. සංස්කෘතික, කලා හා ක්‍රීඩා කටයුතු සඳහා සකසන ආරාධනා පත්




4. ආගමික හා ජාතික උත්සව කටයුතු සඳහා සකසන ආරාධනා පත්




## නිපුණතා මට්ටම

4.3.3.2 දැන්වීමක් කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

විවිධ අවශ්‍යතා සඳහා යොදා ගැනෙන දැන්වීම් එකතු කර ගන්න.
ඒවා සිසුන්ට කියවීමට අවස්ථාව සලසන්න.
එම දැන්වීම්වල වැදගත් කරුණු මතුවන සේ වාචික හා ලිඛිත පිළිතුරු ලබා ගැනීමේ ක්‍රියාකාරකම් සංවිධානය කර ගන්න.

## දැන්වීම් වර්ග

1. පණිවිඩ හෝ දැනුවත් කිරීම සඳහා වන දැන්වීම්

### විශිෂ්ට දූ දරුවන් 50ක් සඳහා විශ්ව ළමා දිනයේ දී උපහාර සම්මාන

සෑම වසරක ම විශ්ව ළමා දිනය වෙනුවෙන් ළමා කුසලතා සංවර්ධන වැඩසටහන මගින් විශිෂ්ට දූ දරුවන් 50 කට උපහාර සම්මාන පිරිනමන අතර මෙවර ද ඒ සඳහා අයදුම්පත් බාර ගැනේ. විවිධ ක්ෂේත්‍රවලින් දක්ෂතා පා ඇති දූ දරුවන්ට තමා විසින් සැකසූ අයදුම්පතක් මාර්ගයෙන් මේ සඳහා අයදුම් කළ යුතු අතර පියවර 3ක් යටතේ කරනු ලබන පරීක්ෂණයකින් පසුව තෝරා ගැනීම් සිදු කෙරේ. ඊට සමගාමී ව පැවැත්වෙන පෙර පාසල්, අවුරුදු 12න් පහළ හා අවුරුදු 12න් ඉහළ ලෙස වයස් කාණ්ඩ 3ක් යටතේ පැවැත්වෙන ගායනා, කථික, නිවේදන, කෙටි නාට්‍ය, චිත්‍ර, පෝස්ටර්, රංගන, වාදන, නැටුම්, ගීත රචනා, පද්‍ය රචනා, අභිරූපණ රංගන, රචනා තරග සඳහා අයදුම්පත් හා නිර්මාණ භාර ගැනීමේ අවසන් දිනය බොහෝ දෙනාගේ ඉල්ලීම පිට 2008 සැප්තැම්බර් 10 දිනය දක්වා දීර්ඝ කර ඇත. මීට අමතර ව විශ්ව ළමා දිනය වෙනුවෙන් ආධුනික දූ දරුවන්ට ගී ගැයීමට අවස්ථාව ලබා දෙන ගීත තැටිය නිකුත් කිරීම, ළමා වේදිකා නාට්‍ය හා ළමා ටෙලි නාට්‍යයට එක්වීමට අවස්ථාව ලබා දීම ආදී ක්‍රියාකාරකම් රැසක් ද සංවිධානය කර ඇති අතර වැඩි විස්තර ළමා කුසලතා සංවර්ධන වැඩසටහන්, අංක 70/එෆ්-6, රොඩ්නි වීදිය, කොටා පාර, බොරැල්ල, කොළඹ 08 යන ලිපිනයෙන් ලබා ගත හැකියි. මෙහි දී ළමා පරපුර වෙනුවෙන් තම දායකත්වය ලබාදුන් මාධ්‍යවේදීන්, මාධ්‍ය ආයතන, පුද්ගලයින් හා සංවිධාන සඳහා උපහාර පිරිනැමීම ද විශේෂත්වයකි.

### ලෝක වාර්තාවක්

මංගල ටෙස්ට් තරගමාලාවක දී වැඩි ම ටෙස්ට් කඩුලු ලාභියාගේ ලෝක වාර්තාව තබා තිබුණේ එංගලන්ත ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩක ශ්‍රීමත් ඇලෙක් වික්ටර් බෙඩ්සර් විසිනි. ඔහුගේ මේ වාර්තාව බිඳ හෙළීමට අපේ ශ්‍රී ලාංකික ක්‍රීඩක අජන්ත මෙන්ඩිස් ඉකුත් දා සමත් විය. ඉන්දියාවට එරෙහි ව 1946 දී ඇලෙක් බෙඩ්සර් කඩුලු 24ක් බිඳ හෙලා තිබූ වාර්තාව අජන්ත මකා දැමීමේ ද ඉන්දියාවට එරෙහි ව වීම විශේෂත්වයකි. අජන්ත මෙන්ඩිස් එම ලෝක වාර්තාව බිඳ හෙලුවේ ප්‍රථම තරගයේ දී 72 ට 4, 60 ට 4, දෙවන තරගයේ දී 117 ට 6, 92 ට 4, තෙවන තරගයේ දී 56 ට 5, 81 ට 3 ක් ලෙසිනි.

2. වෙළෙඳ දැන්වීම්

### මඟුල්කෑම හා හීන්සැරය අලුත්වෙලා....

කුමාරතුංග මුනිදාසයන්ගේ මඟුල් කෑම සහ හීන්සැරය කෘති සිබිල් වෙත්තසිංහ මහත්මියගේ අලංකාර සිතුවමින් හැඩ ගැන්වී නැවුම් නිමාවකින් යුතු ව සාහිත්‍ය මාසයේ දී ඔබ අතට පත්වේ.

ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය
2008 සැප්තැම්බර් මස
20 වන දා සිට 28 වන දා දක්වා
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී
පැවැත්වේ.

3. මරණ දැන්වීම්

### අවමංගල්‍ය දැන්වීම්

**ජී. ජේ. දසරත්න සිකිබොටුවාවේ වෙද මහතා** - ඇහැලියගොඩ සිකිබොටුවාවේ හාරද වෙද මැදුරේ අධිපතිව විසූ කැපුම් බිඳුම් වෛද්‍යාචාර්ය ජී. ජේ. දසරත්න සිකිබොටුවාවේ වෙද මහතා අවු. 91 ක් ආයු වළඳා 2008.07.01 දින අභාවප්‍රාප්ත වූයෙන් ඒ පිළිබඳව අවසන් කටයුතු 2008.07.05 සෙනසුරාදා සවස 3.00 ට පවුලේ සුසාන භූමියේදී සිදු කරන බව සියලු ඥාති මිත්‍රාදීන් වෙත සංවේගයෙන් දන්වා දෙමු. මෙයට, භාර්යාව ඇතුළු දූ දරු පිරිස.

**වීරසූරිය හෙට්ටිගේ සිසේරා මහත්මිය** - කැලිගිය ඩබ්. ඩබ්. මාර්ටින් ප්‍රනාන්දු මහතාගේ භාර්යාව වූද, සෙලස්ටී, (ඔස්ට්‍රේලියාව), පර්ල් සිසේරා (නීතිඥ), සිංසලී, මේරි ප්‍රාන්සිස්, මේබල්, පෝල් ඇන්ටනී, අර්නෙස්ට් යන අයගේ මෑණියන් 2008.07.03 දින අභාවප්‍රාප්ත වූයෙන් ඒ පිළිබඳ අවසන් කටයුතු 2008.07.05 වන සෙනසුරාදා සවස 4.00 ට කටුනේරියේදී සිදු කරන බව සියලු ඥාති මිත්‍රාදීන් වෙත සංවේගයෙන් දන්වා දෙමු. මෙයට දූ දරු පිරිස ඇන්තනී විල්ලා, කටුනේරිය.

## නිපුණතා මට්ටම

4.3.3.3 පෝස්ටර් කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

විවිධ දැනුවත් කිරීම් සඳහා ප්‍රදර්ශනය කෙරෙන පෝස්ටර් කීපයක් එකතු කර ගන්න.

උදා:- 1. අධ්‍යාපනික වශයෙන් දැනුවත් කිරීම් සඳහා
2. වෙළෙඳ ප්‍රචාරණ කටයුතු සඳහා
3. උත්සව කටයුතු සඳහා
4. සංස්කෘතික කටයුතු සඳහා

මෙම පෝස්ටර් කියවීමට අවස්ථාව සලසන්න. එම පෝස්ටර්වල ඇති වැදගත් කරුණු මතුවන සේ වාචික හා ලිඛිත පිළිතුරු ලබා ගැනීමේ ක්‍රියාකාරකම් සංවිධානය කර ගන්න.

### ගුරුවරුන් පෝස්ටර් නිර්මාණය කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු.

- ▲ පෝස්ටරයෙන් දෙන පණිවිඩය ප්‍රබල විය යුතු ය.
- ▲ සිත් ගන්නාසුළු රූප රාමු හෝ චිත්‍ර ඇතුළත් විය යුතු ය.
- ▲ ප්‍රධාන පණිවිඩයට යොදන අකුරු අනිකුත් අකුරුවලට වඩා විශාල විය යුතු ය.
- ▲ සම්පූර්ණ පෝස්ටරයට යොදන වචන සංඛ්‍යාව අඩු විය යුතු ය.
- ▲ විවිධ හැඩවලින් යුත් අකුරු ඇතුළත් කළ යුතු ය.
- ▲ වර්ණවත් විය යුතු ය.

## නිපුණතාව

4.3.4 රසාස්වාදය සඳහා කියවා ප්‍රතිචාර දක්වයි.

## නිපුණතා මට්ටම

4.3.4.1 ළමා කවි ගී කියවා ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

රසාස්වාදය සඳහා ළමා කවි, ගී තෝරා ගැනීමේ දී පහත සඳහන් කරුණු කෙරේ අවධානය යොමු කරන්න.

- ▲ අලංකාරවත් යෙදුම් සහිත වීම.
- ▲ චිත්ත රූප මැවෙන කවි තෝරා ගැනීම.
- ▲ ළමා මනසට උචිත ආකාරයේ වාං මාලාවකින් හා උචිත ශෛලියෙන් ගායනය කළ හැකි වීම.

### ක්‍රියාකාරකම - 1

- ▲ පහත සඳහන් කවි, ගී සිසුන් ලවා කියවීමට යොමු කරන්න. FM මයික් භාවිත කරමින් පන්ති කාමර වේදිකාව මේ සඳහා උපයෝගී කර ගන්න.
- ▲ රසාස්වාදය වැඩි කිරීම සඳහා මේ කවි, ගී පටිගත කරවන්න. ඇසීමට සලස්වා ගායනා කරවන්න.

### උදාහරණ - 01

*1. මගේ පුතා කොතැන ගියේ*
*මානෙල් මල් විලට ගියේ*
*එතැන මලක් පිපුණා යේ*
*එමල කඩා එන්ට ගියේ*

*2. මෙනුඹට මුදු යහන් ඇතේ*
*සිනිඳු සිහින් කෙඳිත් ඇතේ*
*මෙනුඹට කිසි දුකක් නැතේ*
*නිදාගන්න ම සොඳ පුතේ*

## උදාහරණ - 02

1. මල් ලස්සනයි හොඳ හොඳ පාටයි කීවා
පෙනෙනවා දකිනවා කියනා ඒවා
මොනව ද අම්මේ මම අහගන්නට ආවා
තෝරා දෙන්න මම දන්නේ නැහැ මේවා

2. මල්වල හොඳ සුවඳ මිස පාටක් කොහි ද
ඒවා මොළොක් බව තේරෙනවා මට ද
එළියක් කියා මොකවත් හෙම තියෙනව ද
මට තේරුම් ගන්ට අම්මේ බැරි මොක ද

3. උණුසුම දැනේ දහවල් මට රැයට වඩා
වෙනසක් හෙම කියෙනව ද මෙහි මෙයට වඩා
මට නොදැනෙන්නෙ මම කණා කොලුවකුලු කුඩා
ලොකු වෙන කොට දැනේවි ද මම අසමි අඩා

## උදාහරණ - 03

අම්මාගේ උකුලේහි නැළවී
තාත්තාට සුරතල් වෙවී
පාසල් ගොසින් උදය කාලේ
ගතවීලා යයි මාගේ බාලේ

දෙගුරුන්ගෙ අවවාද අසලා
අවුරුද්ද අවුරුද්ද ගෙවලා . . . . . //
ලොකු පොත් සොයලා කියෝලා
ඉගෙනීම අවසාන කරලා

ලංකාව රට මා උපන්න
මගෙ ජාතියේ නාමෙ ගන්න . . . . . //
පුළුවන් තරම් වෙහෙස වන්න
පතමි මා හොඳින් හැදෙන්න . . . . . //

පදමාලාව : කරුණාරත්න අබේසේකර

## උදාහරණ - 04

කුසුම් පිපී තුරු මතේ -
සුවඳ හමයි දස අතේ . . . //
කෝකිල කූජනය ඇසේ ලිය ගොමු අතරේ
මධුර වසන්තේ

අර අඹ අත්තට වෙලා -
ලේනෙකු ටිං ටිං කියා . . . //

මධු රස ගී ගය ගයා - අමරස වින්දේ
මධුර වසන්තේ

කුසුම් පිපී තුරු මතේ . . . //
ගම්මානය කෙළවරේ -
පන්සල් බිමෙ බෝ රුකේ . . . //
සිලි සිලි ගා කොළ නැටවේ - කුරුළු ගී ඇසේ
මධුර වසන්තේ
කුසුම් පිපී තුරු මතේ . . . //

ගායනය : සෝමතිලක ජයමහ

## උදාහරණ - 05

මිදුලේ වැලි මාලිගාවෙ - සක්විති පදවිය ලබන්න
ගල් වැට ළඟ වාඩිවෙලා - හඳ පායන හැටි බලන්න
සතර දිසා ජයගෙන මම හනික එමී
ඔබේ ලොවට සඳ හිරු වී එළිය දෙමී . . . . //

පීනා සිප් සයුර දෙතෙර සියල් සතර දැන පිරිසිඳ
ලොවේ අනෙක අවමන් මැද නොසෙල්වෙමී
මිනිස් මහිම දෝතින් ගෙන සිනාසෙමී

මිදුලේ වැලි මාලිගාවෙ . . . . //

එපා ඔටුණු මගෙ සිරසට එපා සිහසුනක් හිඳිනට
සිනා සිසී මා එන මග හිඳිනු මැනේ
දුවේ කියා මා අමතන් පියාණනේ

පදමාලාව : කුමාරදාස සපුතන්ත්‍රී

### විශේෂ උපදෙස්

- ★ මෙම ගීතවලට අමතර ව පෙළපොතේ සඳහන් ළමා ගීත ද යොදා ගන්න.
- ★ මෙම නිපුණතා මට්ටම ක්‍රියාත්මක කිරීමේ දී
  - 4.1.1.1 - රසවත් කවි/ගීවලට සවන් දී තාල තබයි.
  - 4.2.1.2 - කවි / ගී ගායනා කරයි.
  - 4.3.2.3 - සරල කවි / ගී කියවා අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි

යන නිපුණතා මට්ටම් සමග සමෝධානය කරගන්න.

## නිපුණතා මට්ටම

4.3.4.2 ළමා කතන්දර කියවා ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

කියවා රස විඳීමට හැකි කතන්දර තෝරා ගෙන සිසුන්ට ඉදිරිපත් කරවන්න.
කියවූ කතන්දරය ඇසුරෙන් පහත සඳහන් ක්‍රියාකාරකම්වලට සිසුන් යොමු කරවන්න.

- ▲ කතන්දර කියවීම සඳහා පන්තියට ඉදිරිපත් කරන්න.
- ▲ කතන්දරය නාට්‍යයක ස්වරූපයෙන් ඉදිරිපත් කරවන්න.
- ▲ කතන්දරයේ සිද්ධි හා අවස්ථා දෙබස් හඬකැවීම් නිර්මාණය කරවන්න.
- ▲ කතන්දරයේ සිද්ධි හා අවස්ථා චිත්‍රයට නැගීමට යොමු කරන්න.
- ▲ කතන්දරය ඇසුරෙන් සිසුන්ගේ අවබෝධය මැනීමේ ප්‍රශ්න ඉදිරිපත් කරන්න.

## නිපුණතා මට්ටම

4.3.4.3 දෙබස් කියවා ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

සිනහව, දුක, අනුකම්පාව, භක්තිය, වැනි හැඟීම් දැනවෙන දෙබස් තෝරාගෙන සිසුන්ට ඉදිරිපත් කරන්න.
කියවූ දෙබස් සිසුන් ලවා සංවාද ලෙස ඉදිරිපත් කරන්න.
පෙළ පොත පාඩම් ආශ්‍රිත ව යෙදී ඇති දෙබස් ද කියවීමට සිසුන් යොමු කරන්න.
සංවාදාත්මක දෙබස් ඉදිරිපත් කිරීමට FM මයික් සහ පන්ති කාමර වේදිකාව යොදා ගන්න.
එම දෙබස් පටිගත කරන්න.
පටිගත කළ දෙබස් සිසුන්ට ඇසීමට ඉඩ ලබා දී කියවීමේ ගැටලු මගහරවා ගන්න.

### උදාහරණ 01

*මහෞෂධ : නුඹේ නම කුමක් ද?*
*කාලගෝල : මා සත් අවුරුද්දක් කඹුට .....*
*මහෞෂධ : මා අසන දේට පමණක් පිළිතුරු දෙනු !*
*කාලගෝල : යහපති ස්වාමිනී !*
*මහෞෂධ : නුඹේ නම කියනු !*
*කාලගෝල : මගේ නම කාල ගෝලයා නොහොත් ගෝල කාලයා ය.*
*මහෞෂධ : නුඹේ පියාගේ නම කුමක් ද?*
*කාලගෝල : ඒ ඇත්තාට කියන්නේ කයිදා කියාය.*
*මහෞෂධ : නුඹේ මවගේ නව කුමක් ද?*
*කාලගෝල : ඒ ඇත්තීට කියන්නේ චමරී කියාය.*
*මහෞෂධ : නුඹේ ස්ත්‍රියගේ නම කුමක් ද?*
*කාලගෝල : සත් අවුරුද්දක් මෙහෙවර කර කර ගත්තු මාගේ... ස්ත්‍රියගේ නම දී ...දී.... දික්තලා ය. ඈ අර සොර දෙටුවා ....*
*මහෞෂධ : මා අසන දේට පමණක් පිළිතුරු දෙනු ! නුඹේ ස්ත්‍රියගේ පියාගේ නම කුමක් ද?*
*කාලගෝල : ඒ ඇත්තාට කියන්නේ හේතුපානි කියායි.*
*මහෞෂධ : නුඹේ ස්ත්‍රියගේ මවගේ නම කුමක් ද?*
*කාලගෝල : ඒ ඇත්තීට කියන්නේ දික්සුරඹි කියායි.*
*මහෞෂධ : පසෙකට වී සිටිනු ! ඔය අනෙක් පුරුෂයා මෙහි කැඳවනු*
*මහෞෂධ : නුඹේ නම කුමක් ද?*
*දික්පිටිය : හාමුදුරුවනේ ! මගේ නම දික්පිටිය*

(දික්තල කාලගෝල - චාල්ස් සිල්වා ගුණසිංහ)

### උදාහරණ 02

*මම පින්නාගේ අත අල්ලාගෙන බැලුවෙමි. පිට අල්ලෙහි කොනක වූ සීන් සීරීම හැර අනික් කිසි තුවාලයක් නොදක්නා ලදී.*

*"දළ දෙක තබා එකක් වත් හරියට වැදුණා නම් මගේ වැඩ ඉවරයි" යි පින්නා කී ය.*

*"මිනිහෝ, උඹ මට වඩා හොඳින් නයින් ගැන දන්නේ කොහොම ද?"*

*ජින්නා අමාරුවෙන් සිනාසුණේ ය. මම ඔහුගේ උගත්කම වර්ණනා කරන ලදැයි සිතූ බැවින් දෝ ඔහු දොඩන්ට වී ය.*

*''මම නාගයන් ගැන හුඟක් අහලා තියනවා''යි ජින්නා කීවේ ය.*

*''අපේ බාප්පා සරුප වෙදෙක්. තාත්තාත් සරුප වෙදකම් කරලා තියෙනවා''*

*''එහෙනම් සරුපයන් දස්ට කරාම කරන බෙහෙතුත් උඹ දන්නවා ඇති''*

*''බෙහෙත් මොනවාවත් දන්නේ නැහැ. බාප්පා සරුප විසට ගන්නා බෙහෙත් ජාතිවල නම් කවදාවත් කිව්වෙ නැහැ''*

*''සමහර විට පස්සෙ අමාරු වෙන්න පුළුවනි. කොයි එකටත් මම පොඩි ගමරාල බලන්න යන්නම්''*

*''එපා තව ටිකක් වෙලා බලා උවමනා උණොත් යන්න පුළුවනි''*

*''නයා අපේ ගල් ගුහාවට ඇදෙන්නෙ ගෙම්බන් කන්න වෙන්න ඕනෑ. ඌ ආයිත් ඒවි, ඌ මරා දමන්න උඹ ඉඩ දුන්නේ නැහැ'' යි මා කීවේ කෝපයෙනි.*

*''නයි මරන එක බොහොම නරකයි. නයි වයිර බැඳගන්නවා. නයෙක් මැරුවාට පරම්පරාවක් පල දෙනවා. ඊටත් වැඩිය උ ! නයෙක් නෙවි හැපින්නක්''*

*''වයිර බැඳගන්නා නිසා නොවෙන්නම් මරා දමන්න ඕනෑ''*

*''එහෙම කියන්න එපා. නයෙක් මරාල පවුලක් එහෙම ම විනාශ වෙලා තියෙනවා''*

*''අපට පවුලක් නැහැ නොව මිනිහෝ! මම නයාට වෙඩි තියන්න හැදූ හින්දා ඌ දැන් මම එක්ක වයිර බැඳගෙන ඇති''*

*''නැහැ, ගුහාවට ආවේ හැපින්නෙක්. හැපින්නෙක් එන්නේ ආදරේට''*

*''ආදරේට !'' යි කියමින් මම සුනාසුණෙමි*

*''උඹ කාලා තියෙන්නෙ ආදරේට!''*

*''මට ආදරේට නෙවි''*

*''එහෙනම් කාට ආදරේට ද? උබේ මේ අංඩර දෙමළ කතාව මට තේරෙන්නේ නැහැ''*

(මඩොල් දූව - මාර්ටින් වික්‍රමසිංහ)

## නිපුණතා මට්ටම

4.3.4.4 ළමා නාට්‍ය කියවා ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

කියවා ප්‍රතිචාර දැක්විය හැකි ළමා නාට්‍ය සපයාගෙන සිසුන්ට කියවීමට සලස්වන්න.

නාට්‍යවල එක් එක් චරිත සිසුන්ට පවරා හඬ පාලනය හා අභිනය සහිත ව කියවීමට යොමු කරන්න.

පෙළ පොත හා වෙනත් සුදුසු ළමා නාට්‍ය පොත්, පොත් මුල්ලේ ඇති, කියවීම් ඒකකයේ, එළිමහන් කියවීම් ඒකකයේ, පෙදු පුස්තකාලයේ, ළමා පුවත්පත්වල ඇති නාට්‍ය කියවීමට සිසුන් යොමු කරන්න.

ළමා නාට්‍ය පොත් හා නාට්‍ය කොටස් කියවා පහත සඳහන් ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.

- ▲ රඟ දැක්වීමේ අවස්ථා
- ▲ නාට්‍ය ඇසුරෙන් කතා නිර්මාණය
- ▲ තෝරාගත් නාට්‍ය ජවනිකා චිත්‍රයට නැඟීම
- ▲ ආදේශ භාණ්ඩ භාවිතයට අවස්ථා සලසා දීම

## නිපුණතා මට්ටම

4.3.4.5 ළමා කාටූන් කියවා ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

- ▲ සිසුන්ට සුදුසු කාටූන්, පුවත්පත්, සඟරා සහ පොත්පත් ඇසුරෙන් සපයා ගන්න.
- ▲ තෝරා ගත් කාටූන් සිසුන්ට ප්‍රදර්ශනය කර සාකච්ඡාවක් කරන්න.
- ▲ කාටූන් කියවීම සඳහා වැඩි කාලයක් ලබා දෙන්න.

- කාටුන් නිර්මාණය කිරීමට සිසුන් පොළඹවන්න.
- සිසු නිර්මාණ, නිර්මාණ පැදුරට එක් කරන්න.
- වඩා සුදුසු කාටුන් පුවත්පත්වල පළ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

02



ක්‍රියාකාරකම 01

- පහත දැක්වෙන කාටුන් සිසුන්ට ඉදිරිපත් කරන්න.
- එක් එක් සිසුවා ලවා කාටුන් කියවීමට අවස්ථාව දෙන්න.
- සාකච්ඡා කරන්න.
- මෙවැනි වෙනත් කාටුන් නිර්මාණයට සිසුන් යොමු කරවන්න.
- සිසුන්ගේ කාටුන් නිර්මාණ ඇතුළත් පොතක් නිර්මාණය කරන්න.

උදාහරණ 01

01



03



## නිපුණතා මට්ටම

4.3.4.6 ළමා චිත්‍ර කතා කියවා ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

- සිසුන්ට කියවීමට උචිත චිත්‍ර පුවත්පත්වලින් සොයා ගෙන චිත්‍ර කතා එකතුවක් සාදා ගන්න.
- හාස්‍යය, දුක, අනුකම්පාව, විස්මිත හා අධ්‍යාපනික පණිවිඩ ඇතුළත් සිද්ධි චිත්‍ර කතාවල ඇතුළත් වී තිබීම වඩා උචිත වේ.
- චිත්‍ර කතාවල අන්තර්ගතය පිළිබඳවත්, ඒවායේ ඇතුළත් පණිවිඩ, සිද්ධි පිළිබඳවත් සිසුන්ගෙන් විමසන්න.
- සිසුන් තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් චිත්‍ර කතා ලිවීමට ඇදීමට යොමු කරන්න.
- කණ්ඩායම් නිර්මාණවලින් තෝරාගත් ළමා චිත්‍ර, නිර්මාණ පැදුරට යොමු කරන්න.
- වඩා සුදුසු ළමා චිත්‍ර පුවත්පත්වල පළ කිරීමට අවස්ථාව සලසන්න.

### ක්‍රියාකාරකම 1


පහත දැක්වෙන චිත්‍ර කතා සිසුන්ට ඉදිරිපත් කරන්න. එක් එක් සිසුවාට චිත්‍ර කතා කියවීමට අවස්ථාව දෙන්න. සාකච්ඡා කරන්න. වෙනත් චිත්‍ර කතා නිර්මාණයට අවස්ථාව දෙන්න. නිර්මාණය කරන ලද චිත්‍ර කතා ඇතුළත් පොතක් සකස් කරන්න.

01




02




03
04
හඟ්... හඟ්... හා...
මම තමයි දැන් කැලේ ඉන්න
ලස්සන ම සතා. යන්න ඕන
අනෙක් සතුන්ට
පෙනෙන්න.
05
මෙන්න.. මෙන්න..
අමුතු තාලෙ විකාර
සතෙක්
මෙන්න බොලේ
අමුතු සතෙක්
බුදු අම්මෝ
අමුතු සතෙක්
දුවමු... දුවමු...
පණ බේරගෙන
දුවමු...
06
මදැයි... ලස්සන වෙන්න
ගිහින් මගෙ තිබුණු ලස්සනත්
නැති වුණා

## නිපුණතාව

4.3.5 ඉගෙනීම සඳහා කියවයි.

## නිපුණතා මට්ටම

4.3.5.1 බිත්ති පුවත්පත්, නිර්මාණ පැදුර කියවා ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

★ නිර්මාණ පැදුරේ ප්‍රදර්ශනය කිරීම් කළ යුත්තේ මව්බස විෂය ක්ෂේත්‍රවලට අදාළ නිර්මාණ පමණි. (බිත්ති පුවත් පතේ වෙනත් විෂයයන් සම්බන්ධ ප්‍රදර්ශනය කිරීම් ද කළ හැක)

★ සෑම සති දෙකකට වරක් ම නිර්මාණ පැදුර සංස්කරණය කළ යුතු අතර සති දෙක ඇතුළත සිසුන්ට කියවීමටත් ඒ හා සම්බන්ධ ක්‍රියාකාරකම් කිරීමටත් සිසුන් යොමු කළ යුතු ය.

★ නිර්මාණ පැදුරට නිර්මාණ සැපයීමේ දී පන්තියේ සියලු ම සිසුන්ට අවස්ථාව ලබා දිය යුතු අතර, තෝරා ගන්නා නිර්මාණ සිසු නිර්මාණ ලිපිගොනුවට එකතු කරන්න.

★ මීට අමතර ව නිර්මාණ පැදුරෙන් ලබා ගන්නා උසස් මට්ටමේ සිසු නිර්මාණ එකතු කර වාරයකට වරක් පන්ති සඟරාවක් එළිදැක්වීමට කටයුතු කරන්න.

## නිපුණතා මට්ටම

4.3.5.2 ළමයින්ට සැකසූ සරල ගද්‍ය පද්‍ය නිර්මාණ කියවා ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

▲ ළමා සඟරා, ළමා පුවත්පත් සහ ළමා ගද්‍ය, පද්‍ය පොත්වලින් සපයාගත් නිර්මාණ එකතුවක් පවත්වාගෙන යන්න.

▲ සිසුන්ට මේවා කියවීමට අවස්ථාවක් සලසා දෙන්න.

▲ මෙවැනි නිර්මාණ එකතු කිරීමට සිසුන් යොමු කරවන්න.

▲ එසේ එකතු කරගත් නිර්මාණවලින් සඟරාවක් එළිදක්වන්න.

▲ සිසුන්ට ගැළපෙන මාතෘකා ඔස්සේ ගද්‍ය, පද්‍ය නිර්මාණය කරවීමට සිසුන් යොමු කරන්න.

▲ මෙවැනි නිර්මාණ, නිර්මාණ පැදුරට එකතු කරවන්න.

## නිපුණතා මට්ටම

4.3.5.3 පොතක පටුන භාවිත කරයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

▲ පොතක පටුන භාවිත කිරීමේ වැදගත්කම සිසුන් සමග සාකච්ඡා කරන්න.
    ★ පහසුවෙන් පාඩම සොයා ගැනීමට හැකිවීම.
    ★ අදාළ පාඩමේ පිටු ගණන දැන ගැනීමට හැකිවීම.
    ★ මුළු පොතේම සමස්තය දැන ගැනීමට හැකිවීම.
    ★ පොතක අදාළ පාඩම් මාතෘකා හඳුනා ගැනීමට හැකිවීම.

- ★ තමාට අවශ්‍ය කරුණු මෙම පොත තුළ අන්තර්ගත වී ඇත්ද යන්න දැන ගැනීමට හැකිවීම.
- ▲ පටුන භාවිත කර නිවැරදි ව පාඩමක් තෝරා ගන්නා ආකාරය සෑම සිසුවකු ලවාම ප්‍රායෝගික ව කරවන්න.

## ක්‍රියාකාරකම 01

පෙළ පොතේ ඇති පටුන කියවා පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| පාඩමේ අංකය | පාඩමේ නම | පිටු අංකය සිට දක්වා |
|---|---|---|
| 3 | | |
| 6 | | |
| 9 | | |
| 10 | | |
| 2 | | |

## නිපුණතා මට්ටම

4.3.5.4 කියවීමේ පුරුද්ද ප්‍රදර්ශනය කරයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

- ▲ සිසුන්ට විවේකය අර්ථවත් ව ගත කිරීම සඳහා පොත් කියවීමට යොමු කරන්න.
- ▲ මේ සඳහා පන්ති පුස්තකාලය, පොත්මුල්ල, පොත්මල්ල, එළිමහන් කියවීම් ඒකකය පොදු පුස්තකාලය භාවිතයට අවස්ථාව දෙන්න.
- ▲ සිසුන් කියවීමට හුරු කරවීම සඳහා පාඨක සමාජ පිහිටුවා ගන්න.
- ▲ පාඨක සමාජ කණ්ඩායම්වල සාමාජිකයන්ගේ නාම ලේඛනය පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- ▲ මෙය නිරන්තර වැඩක් ලෙස පවත්වා ගෙන යන්න.
- ▲ කියවීම් කඳවුර සංවිධානය කරන්න.
- ▲ පන්තියේ සෑම සිසුවකු ම කියවීමට යොමු වන ලෙස පහත සඳහන් ආකෘතිය සම්පූර්ණ කරවන්න.

| පොතේ නම | කර්තෘගේ නම | පොත කියවූ දිනය | පොතේ අන්තර්ගතය පිළිබඳ ව කෙටියෙන් සටහන් කරන්න |
|---|---|---|---|
| | | | |

## නිපුණතා මට්ටම

4.3.5.5 පුවත්වලින් අදාළ තොරතුරු රැස් කරයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

- ▲ දෛනිකව පුවත්පත් කියවීමේ වැදගත්කම සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ▲ පුවත්පත් කියවීමෙන් අනතුරු ව පහත සඳහන් අවස්ථා කෙරේ අවධානය යොමු කරවන්න.
  - ★ පාරිසරික තොරතුරු
  - ★ සත්ත්ව ලෝකය තොරතුරු
  - ★ රසවිඳීම්
  - ★ ලොව වැදගත් සිදුවීම්
  - ★ විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුව
  - ★ නව සොයා ගැනීම්
  - ★ කාලීන ප්‍රශ්න
- ▲ පුවත්පත්වලින් ඉහත මාතෘකාවලට අදාළ ව ලිපි සපයා ගෙන ඒවා කාඩ්පත්වල අලවන්න. ඒවා පොත් මල්ලට ද එකතු කරන්න.

## නිපුණතා මට්ටම

4.3.5.6 පොත් එකතු කරගෙන හුවමාරු කර ගනිමින් කියවා ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

- සිසුන්ගේ පරිණතිය පිළිබඳ ව සලකා බලා පන්ති පුස්තකාලයට, කියවීම් ඒකකයට, පොත්මල්ලට, සිසුන් සඳහා ගැළපෙන පොත් එකතු කරගන්න.
- විවේක කාලයේ දී සිසුන්ට ඒවා කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- නිවසේ දී ද මෙවැනි පුස්තකාල පවත්වා ගැනීමට දෙමාපියන් දැනුවත් කරන්න.
- නිවසේ ඇති පුස්තකාල පොත්පත් යහළුවන් අතර හුවමාරු කරගෙන කියවීමේ සැලසුමක් සාදා භාවිතයට ගැනීම පිණිස සිසුන් යොමු කරන්න.

### ගුරුවරුන්ගේ ස්වයං ඇගයීම සඳහා වූ නිර්ණායක

01. කියවීමේ ක්‍රමවේද හඳුනාගෙන ඊට සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කරන්නේ ද?
02. කියවීම හා සවන්දීම අතර ඇති සම්බන්ධය අත්දැකීම් තුළින් වටහා ගත්තේ ද?
03. කියවීමේ දී වැකි දෙස බැලීම, ශබ්ද කිරීම, අර්ථ වටහා ගැනීම යන අංශ තුන ම සම්බන්ධ වන බව වටහාගෙන ක්‍රියාකරන්නේ ද?
04. ශබ්ද නගා කියවීමට සුදුසු වාතාවරණයක් ඇති කිරීම සඳහා එළිමහන් පරීක්ෂණ තෝරා ගත්තේ ද?
05. ශබ්ද නගා කියවීමේ දී ශබ්දවල වෙනස්කම් හා නැවතීම් ලකුණුවලට අවනත ව කියවීමට සුදුසු ක්‍රියාකාරකම් සැලසුම් කරන්නේ ද?
06. ශබ්ද නගා කියවීමේ කුසලතාව වර්ධනය කිරීමට තනි තනි ව කියවීමේ ක්‍රමය සුදුසු බව වටහාගෙන ක්‍රියාත්මක වන්නේ ද?
07. ශබ්ද නගා කියවීමේ පුහුණුව ලැබූ පසු නිහඬ කියවීමට අදාළ ක්‍රියාකාරකම් සැලසුම් කර ඉදිරිපත් කරන්නේ ද?
08. නිහඬ කියවීම තුළින් කාලය පිරිමසා ගැනීම, කියවීමේ වේගය, අවයවවලට විවේකය ලබා දීම වැනි කරුණු සිදුවේ, යන්න අත්දැකීම් තුළින් වටහා ගත්තේ ද?
09. අර්ථාවබෝධයෙන් හඬනගා කියවීමට උචිත ක්‍රියාකාරකම් සැලසුම් කර ඉදිරිපත් කරන්නේ ද?
10. ස්වාධීන ව වචන වර්ධනය කර ගැනීම සඳහා කියවීමට උචිත විවිධ ක්‍රියාකාරකම් ඉදිරිපත් කරන්නේ ද?
11. සන්නිවේදනය සඳහා කියවීමේ කුසලතාව වර්ධනය කිරීමට වර්තමාන සාක්ෂරතාවයන් අනුගමනය කරන්නේ ද?
12. වින්දනාත්මක ව කියවීමට උචිත ක්‍රියාකාරකම් තුළින් කියවීමේ උනන්දුව වැඩි කිරීමට උත්සාහ කරන්නේ ද?
13. ඉගෙනුම් සඳහා ඉගෙනීමට, පුළුල් ලෙස කියවීමට උචිත පරිදි දිරි ගන්වන්නේ ද?
14. විද්‍යුත් මාධ්‍ය තුළින් කියවීමේ අවශ්‍යතාව වටහා ගෙන ඊට අදාළ ක්‍රමවේදයන් අනුගමනය කරන්නේ ද?
15. පුස්තකාලයට ගොස් කියවීමේ අවශ්‍යතාව වටහා දී ඊට අදාළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන්නේ ද?
16. පන්ති කාමරයේ කියවීම් මුල්ලක් සකස් කර කියවීමට දිරි ගන්වන්නේ ද?
17. කියවීම සඳහා වූ නවීන ශිල්ප ක්‍රම පන්ති කාමරයේ දී භාවිත කරන්නේ ද?
18. කියවීමේ කුසලතාව අනෙකුත් මූලික කුසලතා මෙන් ම ඉගෙනීමේ කාලය තුළ සෑම අවස්ථාවක ම වර්ධනය වන බව වටහා ගෙන ක්‍රියා කරන්නේ ද?

# 4.4 ලිවීම

මූලික භාෂා කුසලතාවලින් හතරවැන්න වන්නේ ලිවීමේ කුසලතාව යි. ලිවීමේ කුසලතාව ලේඛන කුසලතාවට වඩා වෙනස් ය. භාෂාවක් හැදෑරීමේ දී එහි ඇති අකුරු, වචන, වාක්‍ය නිවැරදි ව ලිවීමෙන් පමණක් කියවීමේ කුසලතාව සම්පූර්ණ වේ. භාෂාව අර්ථවත් ව දක්ෂ ආකාරයට එළි දැක්වීමේ හැකියාව ලේඛන කුසලතාව වේ. මෙය භාෂාවේ උසස් ම මට්ටමේ කුසලතාවකි. මෙම කුසලතාව ලබා ගැනීමට ලිවීමේ හැකියාවත් සමග චින්තන හැකියාවත් සම්බන්ධ විය යුතු ය. ලිපි, රචනා, නිර්මාණ යනාදිය ලේඛන කුසලතාවට සම්බන්ධ දේවල් වේ. ලිවීමේ කුසලතාව යනු අකුරු ලිවීමට අදාළ පූර්ව කුසලතා, ලියන ක්‍රමය යනාදිය සමග සම්බන්ධ දෙයකි. සවන්දීම, කථනය, කියවීම යන කුසලතා ලබා ගැනීමට පාසලට පරිබාහිර සාධක ද උදව් වේ. එහෙත් ලිවීමේ කුසලතාව වර්ධනය කිරීමේ වගකීම ඇත්තේ පාසල් ගුරුවරයාට හෝ ගුරුවරියටයි. භාෂාවේ මූලික කුසලතා වන සවන්දීම, කථනය, කියවීම, ලිවීම යනාදිය එකිනෙකට සම්බන්ධ ක්ෂේත්‍ර වේ. එබැවින් මූලික කුසලතා වර්ධනය කිරීමෙහි ලා ප්‍රාථමික අධ්‍යාපනය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

## 4.4 ලිවීම


### සාර්ථක ලිවීමක් සඳහා

1. නිවැරදි ව අසුන් ගත වීම හා ශාරීරික වර්ධනය අනුව මේසයේ හා පුටුවේ උස ගැළපෙන ලෙස තෝරා දෙන්න.



නිවැරදි ව අසුන්ගත වීම


2. පැන්සල හෝ පෑන නිවැරදි ව අල්ලා ගැනීමට හුරු කරවන්න.



දකුණත වමත

3. නිවැරදි ව හා ක්‍රමවත් ව ලිවීමට හැකි සිසුන් තීන්ත පෑන හෝ ජෙල් පෑන භාවිත කළ යුතු අතර ලිවීමේ දුෂ්කරතා දක්වන සිසුන්ට තව දුරටත් පැන්සල භාවිත කිරීමට අවස්ථාව දෙන්න.
4. පැන්සල භාවිත කරන සිසුන්ගේ පැන්සලේ දිග හා තුඩ ගැන අවධානය යොමු කරන්න. මෙහි දි HB වර්ගයේ පැන්සල් භාවිතය යෝග්‍ය වේ.
5. අභ්‍යාස පොත නිවැරදි ව තබා ගැනීමට හුරු කරවන්න.
6. සාමාන්‍ය රූල් පොත භාවිත කිරීමට යොමු කරවන්න.
7. අකුරක ප්‍රමාණය සාමාන්‍ය තනිරූල් පොතේ රූල් දෙක අතර ප්‍රමාණයෙන් ½ ක් තරම් වන සේ ලිවීමට හුරු කරවන්න.
8. අකුරක ආරම්භය, ලියන නිවැරදි දිශාව හා අවසානය පිළිබඳ සැලකිලිමත් වන්න.
9. අකුරු අතර පරතරය හා වචන අතර පරතරය ගැන වඩාත් අවධානය යොමු කරන්න.
10. නිවැරදි අත් අකුරු ආදර්ශනයක් සකස් කර පන්ති කාමරය ඉදිරියේ පැහැදිලි ව පෙනෙන සේ ප්‍රදර්ශනය කරන්න.
11. පන්ති කළුලෑල්ලේ එක් කොටසක් රූල් ගසා අකුරු ආදර්ශන ලියා ඉදිරිපත් කරන්න. රූල් දෙකක් අතර පරතරය සෙන්ටිමීටර හතක් පමණ විය යුතු ය.
12. නිවැරදි ව ලිවීම ප්‍රගුණ කිරීම සඳහා නිරන්තර අභ්‍යාසවල යොදවන්න.

මධ්‍ය අක්ෂර, අවරෝහණ අක්ෂර, ආරෝහණ අක්ෂර පිළිබඳ ව නිදසුන් සඳහා මෙම අකුරු ලියා ඇති ආකාරය අධ්‍යයනය කරන්න.



*අකුරු ලිවීම සඳහා මාර්ගෝපදේශ - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව*


පළමුවන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය දක්වා අකුරු ලිවීම විකාශය වන ආකාරය

## පළමුවන ශ්‍රේණිය

රූල් නොමැති කඩදාසිය මත ලිවීම




රූලක් මත ලිවීම




සැ.යු.
අකුරක ආරම්භය, ලියන නිවැරදි දිශාව හා අවසානය පිළිබඳ ව අවධානය යොමු කිරීම වැදගත් ය.

දෙවන ශ්‍රේණිය

රූල් අතර ලිවීම

කපුටා ගස උඩ කූඩුව සාදයි.

ඉබ්බා ගෙන් පිහාටු

ඉල්ලුවා වගේ.

තුන්වන ශ්‍රේණිය

අකුරක ප්‍රමාණය මෙම රූල් දෙක අතර ප්‍රමාණය ¾ කි.

කපුටා ගස උඩ කූඩුව සාදයි.

ඉබ්බාගෙන් පිහාටු ඉල්ලුවා වගේ.

හතරවන ශ්‍රේණිය

අකුරක ප්‍රමාණය මෙම රූල් දෙක අතර ප්‍රමාණයෙන් 2/3 කි.

කපුටා ගස උඩ කූඩුව සාදයි.

ඉබ්බාගෙන් පිහාටු ඉල්ලුවා වගේ.

පසවන ශ්‍රෙණාය

අකුරක ප්‍රමාණය මෙම රූල් දෙක අතර ප්‍රමාණයෙන් ½ කි.

කපුටා ගස උඩ කූඩුව සාදයි.

ඉබ්බාගෙන් පිහාටු ඉල්ලුවා වගේ.

## 4.4 ලිවීම

### නිපුණතාව

4.4.1 ලිවීමේ ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරයි.

### නිපුණතා මට්ටම

4.4.1.1 සිංහල හෝඩියේ අක්ෂරවල අංග, ප්‍රමාණය, හැඩය අනුව නිවැරදි ව ලියයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

★ අක්ෂරවල අංග ප්‍රමාණය හැඩය නිවැරදි ව ලියන ලද ගුරු ආදර්ශනයක් පන්ති කාමරයේ නිදහස් තැනක ප්‍රදර්ශනය කරන්න.
★ ගුරුවරයා විසින් අත් අකුරු ලියන සෑම අවස්ථාවකදී ම කළුලෑල්ලේ රූල් කරන ලද කොටස පමණක් භාවිත කරන්න.
★ මව්බස විෂයයේ දී පමණක් නොව අනෙකුත් විෂයයන්වලදී ද නිවැරදි අත් අකුරු ලිවීම සම්බන්ධව වැඩි අවධානය යොමු කරන්න.
★ දිනපතාම බලා ලිවීමේ ක්‍රියාකාරකමක සිසුන් යොදවන්න.
★ දවසේ නිවැරදි ව අත් අකුරු ලියන ලද සිසුවා ලවා කළුලෑල්ලේ රූල් කරන ලද කොටසේ නැවත වගන්තියක් ලියවා ප්‍රදර්ශනය කරවන්න. (මෙය පන්තියේ සියලු ම සිසුන්ගේ පෙළඹවීම වැඩි කරලීම සඳහා සැලසුම් කරන ලද ක්‍රියාකාරකමකි.)
★ පන්ති මට්ටමින් මෙන් ම සමාන්තර පන්ති මට්ටමින් ද නිවැරදි අත් අකුරු ලිවීමේ තරග සංවිධානය කරන්න.

නිවැරදි අත් අකුරු ආදර්ශනයකි.



### නිපුණතා මට්ටම

4.4.1.2 අකුරු හා වචන අතර පරතරය ගැන සැලකිලිමත් ව ලියයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

සිසුන් විසින් ලිවීමේ දී කරනු ලබන දෝෂ හඳුනා ගන්න.
ඒවා අවම කිරීම සඳහා ශිල්පීය ක්‍රම භාවිත කරමින් ක්‍රියාකාරකම් සැලසුම් කර ක්‍රියාත්මක කරන්න.
බහුලව කෙරෙන දෝෂ ලෙස වචනයක අකුරු එකිනෙක ගෑවෙන සේ ලිවීම, අසමතුලිත බවින් යුතු අකුරු ලිවීම, පද නොබෙදීම, වැරදි ලෙස පද බෙදීම යනාදියට උදාහරණ කිපයක් පහත දක්වා ඇත.

උදාහරණ :

(1) අකුරු එකිනෙක ගෑවෙන සේ ලිවීම




(2) අසමතුලිත බවින් යුතු අකුරු ලිවීම



(3) පද නොබෙදීම



(4) වැරදි ලෙස පද බෙදීම



(5) ශ්‍රේණියට අදාළ අකුරුවල ප්‍රමාණය ගැන නොසලකා ලිවීම.

## නිපුණතා මට්ටම

4.4.1.3 අර්ථය සඳහා අකුරු හා පිලි නිවැරදි ව යොදා වාක්‍ය ලියයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය -

ගුරු උපදෙස්

අදාළ අක්ෂර යොදා අර්ථවත් වචන ලිවීමේ හැකියාවත් එවැනි වචන යොදා අර්ථවත් වැකි ගොඩ නැගීමේ හැකියාවත් මෙහි දී අපේක්ෂා කෙරේ.
වචනයේ අර්ථය නිවැරදි වීම සඳහා ගැළපෙන පිලි යොදා අර්ථවත් වැකි ගොඩ නැගීමේ හැකියාව ද මෙම නිපුණතාවේ අරමුණක් වේ. එමෙන් ම පිලි යෙදීමේ නිවැරදි ආකාරය පිළිබඳ ව ද විශේෂ අවධානය යොමු කෙරේ.
පස්වන ශ්‍රේණියේ සිසුන් දැනුවත් කළ යුතු සියලු පිල්ලම් සහිත වගුවක් ආදර්ශනයත් ලෙස පහත ඉදිරිපත් කර ඇත. ඒවා නිවැරදි ව යොදා, ලිවීම සම්බන්ධ ක්‍රියාකාරකම් සංවිධානය කර ගන්න.

ස්වර ලකුණ හෙවත් පිලි ව්‍යඤ්ජන ශබ්ද හා සංයෝජනය වී භාවිත කෙරේ. පහත සඳහන් සටහනින් ඒ පිලි හඳුනා ගත හැකි ය.

| ව්‍යඤ්ජනය හා ස්වරය | ස්වරය ආරූඪ වූ පසු | පිල්ල | පිලි නාමය |
|---|---|---|---|
| ක්, ට් | | ් | හල්පිල්ල |
| ක් අ | ක | | |
| ක් ආ | කා | ා | ඇලපිල්ල |
| ක් ඇ | කැ | ැ | ඇදය |
| ක් ඈ | කෑ | ෑ | දීර්ඝ ඇදය |
| ක් ඉ | කි | ි | ඉස්පිල්ල |
| ක් ඊ | කී | ී | දීර්ඝ ඉස්පිල්ල |
| ක් උ | කු | ු | පාපිල්ල |
| ක් ඌ | කූ | ූ | දීර්ඝ පාපිල්ල |
| ක් ඍ | කෘ | ෘ | ගැට ඇලපිල්ල |
| ක් ඎ | කෲ | ෲ | ගැට ඇලපිලි දෙක |
| ක් එ | කෙ | ෙ | කොම්බුව |
| ක් ඒ | කේ | ේ | කොම්බුව සහිත හල්පිල්ල |
| ක් ඓ | කෛ | ෛ | කොම්බු දෙක |
| ක් ඔ | කො | ො | කොම්බුව සහිත ඇලපිල්ල |
| ක් ඕ | කෝ | ෝ | කොම්බුව සහිත හල් ඇලපිල්ල |
| ක් ඖ | කෞ | ෞ | කොම්බුව සහ ගයනුකිත්ත |

ව්‍යඤ්ජන සංයෝගයේ දී ඇතැම් ව්‍යඤ්ජන නියෝජනය කිරීම සඳහා යොදන සංකේත කීපයක් ද ඇත.

| | | |
|---|---|---|
| ක්‍ය | ්‍ය | යංශය |
| ර්‍ක | ර්‍ | රේඵය |
| ක්‍ර | ්‍ර | රකාරංශය |

## ක්‍රියාකාරකම - 01

සිසුන් බහුලව කරනු ලබන, වැරදි අක්ෂර භාවිතය හඳුනා ගැනීම සඳහා අසා ලිවීමේ ක්‍රියාකාරකමක් කරවන්න. ඒ අනුව හඳුනා ගන්නා වැරදි අක්ෂර භාවිතය නැතිකරලීම සඳහා නිවැරදි ව අකුරු යෙදූ වචන කළුලෑල්ලේ ප්‍රදර්ශනය කරන්න. එම වචන අභ්‍යාස පොතේ ලියා ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.

## ක්‍රියාකාරකම - 02

### වැරදි අකුරු භාවිත කර ලියා ඇති වචන නිවැරදි ලෙස ලිවීම

| වැරදි | නිවැරදි |
|---|---|
| *අවුෂධ* | *ඖෂධ* |
| *උර්තය* | *වෘත්තය* |
| *රිජුකෝණය* | *සෘජුකෝණය* |
| *කුෂිකර්මය* | *කෘෂිකර්මය* |
| *වයිරය* | *වෛරය* |
| *විද්දියාලය* | *විද්‍යාලය* |

හඳුනාගත් මෙවැනි වැරදි නිවැරදි කර නැවත නැවත ලිවීමේ ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.

## ක්‍රියාකාරකම - 03

වැරදි ලෙස පිලි භාවිත කර ලියා ඇති අකුරු සහිත වචන නිවැරදි ලෙස ලිවීම

| වැරදි | නිවැරදි |
|---|---|
| *පස්පවු* | *පස්පව්* |
| *නැවු* | *නැව්* |
| *ඉරියව්* | *ඉරියවු* |
| *උදව්* | *උදවු* |
| *රැපියල* | *රුපියල* |
| *ගුල්ලා* | *ගුල්ලා* |

## නිපුණතා මට්ටම

4.4.1.4 නැවතීමේ ලකුණ, ප්‍රශ්නාර්ථ ලකුණ, විස්මයාදී ලකුණ සහ කොමාව යන විරාම ලකුණු යොදා ලියයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

කියවීමේ ක්ෂේත්‍රයේ දී හඳුනා ගත් නැවතීමේ ලකුණ, ප්‍රශ්නාර්ථ ලකුණ, විස්මයාදී ලකුණ සහ කොමාව යන විරාම ලකුණු ලිවීමේ දී නිවැරදි ව භාවිත කිරීමට හුරුවක් ලබා දීම මෙහි දී අපේක්ෂා කෙරේ.
සිසුන් විසින් එදිනෙදා කරන සෑම ලිවීමකදී ම මෙම විරාම ලකුණු භාවිතය කෙරෙහි අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ.

මෙම නිපුණතා මට්ටම සඳහා 4.3.1.5 ''නැවතීමේ ලකුණ, ප්‍රශ්නාර්ථ ලකුණ, විස්මයාදී ලකුණ, හා කොමාව යන විරාම ලකුණුවලට අවනතව කියවයි'' යන නිපුණතා මට්ටම ද සමෝධානය කර ගන්න.

## ක්‍රියාකාරකම - 1

ජාතික අධ්‍යාපන ආයතනය මගින් සකස් කරන ලද සිංහල ලේඛන රීතිය ඇසුරෙන් පහත සඳහන් කොටස් අවධාරණය කෙරේ.

### තිත (.)

- වාක්‍යයක අවසානය දැක්වීම සඳහා යෙදේ. නිදසුන් මෙම පොතෙහිම දැකිය හැකි වේ.
- පුද්ගල නාම මුලකුරු හා යෙදේ.
  උදාහරණ : *පු. බ. තෙන්නකෝන්*
  *ක. ග. අමරසේන*
  *ආර්. එස්. ගුණවර්ධන*
- නාමයක් කෙටි කොට දැක්වීමේ දී යෙදේ.

  උදාහරණ :

  *ලං. ග. ම. (ලංකා ගමනාගමන මණ්ඩලය)*
  *රු. 30/- (රුපියල් 30යි)*
  *පූජා. (පූජාවලිය)*
- ''ලං. ග. ම. '' වැනි වහර ඇතැම් විට ''ලංගම'' යනුවෙන් මුල'කුරු පද බවට පත් වන අවස්ථාවල දී තිත් අනවශ්‍ය ය. එවන් වහර විබත් ගනියි.
  උදාහරණ : *අපොස*
  *ජනවසමට*
  *ලංගමෙහි*
  *සතොසෙන්*

### ප්‍රශ්න ලකුණ (?)

- ප්‍රකාශයක් ප්‍රශ්නයක් බව දැක්වීමට එහි අග යෙදේ.
  උදාහරණ : *පුතා ගෙදර ගියා ද?*
  *මෙය කීයට ද ගත්තේ?*
  *ඊයේ නිවාඩුවක් ලැබුණේ නැහැ?*
- සැකයක් සටහන් කිරීම සඳහා යෙදේ.
  උදාහරණ :
  *සයුරට කැප කරන ලද විහාර මහා දේවිය (සවෙර - දේවිය?) ගොඩ බැසීමෙන් (?) ඉතිහාස ගත වුණු කිරින්ද, ශ්‍රී ලංකාවේ ගිනි කොණෙහි පිහිටා ඇත.*

### විස්මයාදී ලකුණ (!) (හර්ෂාදී ලක්ෂණය)

- විස්මයක්, ආශීර්වාදයක්, ප්‍රාර්ථනයක්, හඬ නඟා කරන ආමන්ත්‍රණයක්, නොහොත් නියෝගයක්, හර්ෂයක්, ශෝකයක් ආදිය හඟවන ප්‍රකාශනයක කෙළවර යෙදේ.

  උදාහරණ :

  - *මොනවා, කතරගම දෙවියන් හැබැහින් දැකලා!*
  - *ඔබ හැමට නිදුක් නිරෝගී සුවය ලැබේවා!*
  - *මම බුදු වෙම්වා!*
  - *පුතේ! දරුවනේ!*
  - *නො නවතිවු, ඉදිරියට ම යවු!*
  - *ඒ ගැන අපට හතර හිනා!*
  - *අනේ ඔහුට වුණු දේ !*

### කොමාව (,)

★ වාක්‍යයක නොයෙක් කොටස් අතර පැවතිය හැකි ඇතැම් මඳ විරාමය දැක්වීම සඳහා යෙදේ.

★ ප්‍රධාන අදහසක් හා ඈඳුණු එක් ගණයකට අයත් වචනවලට පරව යෙදේ.

උදාහරණ :

- *සරසන ලද ටැම්, බිත්ති, දොර, කවුළු ආදිය ද තැන තැන ලඹ දුන් මල්වැල්, කොඩිවැල්, බුබුළුවැල් ආදිය ද ඒ ශාලාව පියකරු කළේය.*

සැ.යු. එහි අවසන් වචනයට පර ව කොමාව නො යෙදේ.

★ නිදසුන් සැපයීම, නම් වැලක් ඉදිරිපත් කිරීම වැනි තන්හි :

උදාහරණ :

*ඇතැම් ස්වදේශික බෙහෙත් ද්‍රව්‍ය අරළු, බුළු, නෙල්ලි, ඉඟුරු, බැබිල, කටුවැල් බටු*

- ඉහත දැක්වෙන විරාම ලක්ෂණ සහිත වගන්ති ඡේද ආදිය ආදර්ශවත් ව ලියා ඉදිරිපත් කර, ඒවා බලාගෙන නිවැරදි ව ලිවීමට යොමු කරන්න.

- විරාම ලක්ෂණ යෙදිය යුතු ආකාරය පිළිබඳ ව අත්දැකීම් ලබා දී විරාම ලක්ෂණ යෙදීමේ අභ්‍යාසවල යොදවන්න.
- මව්බස විෂයට අමතර ව වෙනත් විෂයයන්හි දී ද මේ ගැන සැලකිලිමත් වන්න.
- පෙළ පොත සහ මඩොල් දූව, හත් පණ, මඟුල් කෑම, හීන් සැරය ආදි සුදුසු අතිරේක පොත්වලින් උදාහරණ ඉදිරිපත් කරමින් ඉගෙන් වූ විරාම ලක්ෂණ පිළිබඳ ව දැනුම තහවුරු කරන්න.

## නිපුණතා මට්ටම

4.4.1.5 උපුටාගෙන නිවැරදි ව ලියයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

උපුටාගෙන ලිවීම යනු යම් මුද්‍රිත කෘතියක අඩංගු කොටසක් එපරිද්දෙන් ම ලිවීමයි. කොටසක් උපුටාගෙන ලිවීමේ දී සඟල උඩු කොමා (" ") යෙදිය යුතු බවත්, උපුටා ගත් පොතේ නම සහ කතෘගේ නම සඳහන් කළ යුතු බවත් සිසුන් දැනුවත් කරන්න.

උපුටා ගන්නා ලද කොටසේ මෙවැනි යෙදීම් ඇතුළත් කිරීමේ වැදගත්කම සිසුන්ට පැහැදිලි කර දෙන්න.

### ක්‍රියාකාරකම

උදාහරණ 01

*"ලේනෝ ඔබ පා නිදහස*
*ටිං ටිං ගාමින් මේ ලෙස*
*බුදිමින් හොඳ හොඳ පල රස*
*සිටිනු දකිනු මට වෙයි තොස"*

(ළමා ගී - කුමාරතුංග මුනිදාස)

*"තොරතෝංචියක් නැති ව ගී ගයන සියොතුන්ගේ සංගීතයෙන් වනයේ නිහැඬියාව මැකී යයි. මල් පැණි බී, මත් වූ මී මැසි බඹර සමූහයා නගන ගීය,*

*මී පැණි මෙන් මිහිරිය. හමායන මන්ද මාරුතයට මුසු වූ වනමල් සුවඳ නැහැ පුඩුවල දැවටෙයි. කුරුලු ගීතයෙන්, රැහැයි නාදයෙන් හා මී මැසි බඹර ගුමුගුමුවෙන්, වනයේ නිහැඬියාව මකා දැමුවත්, මිනිස් හඬක් කනට නොඑන බැවින් අවිනිශ්චිත හැඟීම් මුසුවූ ත්‍රාසය හා භීතිය කුළුගැන්වෙයි. ගස් අතු එකට ඇතිල්ලීමෙන් නැගෙන ක්‍රීං ක්‍රීං නාදයත්, රිලා, වඳුරන්ගේ බුකු බුකුවත්, උන්ගේ විරිත්තීමත්, හොඳට හුරුපුරුදු නිසා වන්දනාකාර නඩයේ කිසිවකු බිය වූයේ නැත. වනගැබේ පාළුවට අභියෝග කරමින් වනයේ උරුමක්කාරයින් නගන නාදය, ඔවුන්ගේ සැලකිලිමත් බව තියුණු කිරීමට සමත් විය.''*

(වනතරණය - පියසේන කහඳගමගේ)

## නිපුණතා මට්ටම

4.4.1.6 පවසන දේ අසා නිවැරදි ව ලියයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

අසා ලිවීමේ දී ඉදිරිපත් කරන වචන වැකි ඡේද හා පද්‍ය කොටස් නිවැරදි ව උච්චාරණය කරන්න. ඒවා අසා සිසුන්ට ලියා ගැනීමට ප්‍රමාණවත් කාලයක් දෙන්න. සරල බවේ සිට සංකීර්ණ බව දක්වා පෙළ ගැස්වූ නිරන්තර වැඩක් ලෙස පවත්වාගෙන යන්න.

අසා ලිවීමේ දී අක්ෂරවල ප්‍රමාණය, විරාම ලකුණු, අක්ෂර හා වචන අතර පරතරය නිවැරදි පිල්ලම් යෙදීම හා නිවැරදි අත් අකුරු යෙදීම කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරන්න.

## නිපුණතා මට්ටම

4.4.1.7 සියලු පිල්ලම් අදාළ තැන නිවැරදි ව යොදා ලියයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

අදාළ තැන නිවැරදි ව පිලි යෙදූ ආදර්ශයක් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.

සිසුන් ලියන සෑම අවස්ථාවකදී ම නිවැරදි ව පිලි යෙදීම පිළිබඳ ව අවධානය යොමු කරන්න.


සිසුන් විසින් වැරදි ක්‍රමවලට පිලි භාවිත කළ අවස්ථාවක දී, ඒ මොහොතේ ම නිවැරදි කළ යුතු ය.

මෙම නිපුණතා මට්ටම සාධනය සඳහා 4.3.1.2 සියලු පිලි නිවැරදි ව උසුරුවමින් කියවයි.

(4.1.3.1.5 නිපුණතා මට්ටම හතර වන ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය) යන නිපුණතා සමෝධානය කරගන්න.

උදාහරණ - 1

<u>අදාළ තැන නිවැරදි පිල්ලම් යෙදූ ආදර්ශයක්</u>



## නිපුණතාව

4.4.2 අවශ්‍යතා සඳහා ලියයි

## නිපුණතා මට්ටම

4.4.2.1 පෞද්ගලික අවශ්‍යතා සඳහා ලියයි.


### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

පෞද්ගලික ලිපියක ආකෘතිය පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
පෞද්ගලික ලිපියක තිබිය යුතු අංග සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
නිවැරදි ලෙස ලියූ සැබෑ ලිපි කියවීමට අවස්ථාව ලබා දෙන්න.
ඥාතියකුට හෝ මිතුරෙකුට ලිපියක් ලියා තැපැල් කරවීමට සිසුන් යොමු කරවන්න. (ප්‍රායෝගික ක්‍රියාකාරකමකි)

### උදාහරණ - 1

| | |
|---|---|
| | යවන්නාගේ ලිපිනය<br>ලියන දිනය |
| ආශීර්වාදය | |
| ආමන්ත්‍රණය | |
| අඩංගු වන කරුණු | |
| | අවසානය |



පී. ජී. මිනුක සංජය,
අංක 82,
පන්සල පාර,
අම්පාර,
2008. 04. 08.

ජය වේවා!

ආදරණීය නිපුන් මල්ලී,

ඔබගේ තොරතුරු කෙසේද? සුවයෙන් ඇතැයි සිතමි. ඊයේ අපට අවුරුදු නිවාඩුව ලැබුණා. අවුරුදුවලට බොහෝලාගේ ගෙදර එන්න බලාපොරොත්තු වෙනවා. ගෙදර ආවාම පේරාදෙණිය උද්භිද උද්‍යානය නැරඹීමට යමු.

මේ දිනවල ඔය පැත්තට කාළ වැසි ඇති නේද? අපේ පැත්තෙ නම් වැස්ස නැහැ. අපේ කුඹුරු වතුපිටි පාළු වෙලා. ලොකු අක්කා හරිම කැමැත්තෙන් ඉන්නේ නුවර එන්න. ලොකු අක්කාට නම් ඇම්බැක්ක දේවාලය, ගඩලාදෙණිය, ලංකාතිලක විහාරය බලන්න එන්න අවශ්‍යයිලු. ඉඩක් තිබුණොත් ඒවාත් බලන්න යමු නේද? ඔබගේ පවුලේ සියලු දෙනාට ඉතා ආදරයෙන් මතක් කළ බව කියන්න.

ඔබ සැමට දෙවි පිහිටයි!

මෙයට,
ආදරණීය අයියා,
මිනුක සංජය.

## නිපුණතා මට්ටම

4.4.2.2 පාසලේ අධ්‍යාපනික අවශ්‍යතා හා සම්බන්ධ රාජකාරි ලිපි ලියයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

රාජකාරි ලිපියක ආකෘතියක් පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
රාජකාරි ලිපියක තිබිය යුතු අංග සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
නිවැරදි ලෙස ලියූ සැබෑ ලිපි කිපයක් කියවීමට අවස්ථාව ලබා දෙන්න.
රාජකාරි ලිපි ලිවීමට සිදුවන විවිධ අවස්ථා මතුකර ඊට අදාළ ලිපි ලිවීමට යොමු කරන්න.

ක්‍රියාකාරකම - 1

උදාහරණ - 01

ලිපිය යවන ස්ථානය/
ආයතනය/පුද්ගලයා ගේ
ලිපිනය
ලියන දිනය

ලිපිය ලබන අයගේ ලිපිනය

මාතෘකාව

අන්තර්ගතය

යවන්නා හා අත්සන

විදුහල්පති,
සමගි ප්‍රාථමික විදුහල,
නුවරඑළිය.
2008 . 03 . 09.

අධ්‍යක්ෂ,
ජාතික කෞතුකාගාරය,
ඇල්බට් චන්ද්‍රවංකය,
කොළඹ.

මහත්මයාණෙනි,

කෞතුකාගාරය නැරඹීම සඳහා අවසර ලබා ගැනීම.

උක්ත කාම සඳහාත් අප විදුහලේ පස්වන ශ්‍රේණියේ සිසුන්ගේ වාර්ෂික අධ්‍යාපන චාරිකාවේ දී කෞතුකාගාරය නැරඹීමට ද සැලසුම්කර ඇත. මේ සඳහා ගුරු මහත්ම/මහත්මීන් සහ සිසු දරු දැරියන් හැත්තෑදෙනෙකු සහභාගිවීමට නියමිතය.

එහෙයින් ඔබ ආයතනය නැරඹීම සඳහා නැති දිනයක් සහ වේලාව සහිත ව අවසර පත්‍රයක් ලබා දෙන මෙන් කාරුණික ව ඉල්ලා සිටිමි.

ස්තූතියි,
මෙයට,
විශ්වාසී,
________________ (අත්සන)
ජේ. පී. පෙරේරා (විදුහල්පති)

## නිපුණතා මට්ටම

4.4.2.3 පාසලේ දී පවත්වනු ලබන උත්සවවලට සම්බන්ධ ආරාධනා පත්‍ර ලියයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

පාසලේ දී සිදුවන විවිධ උත්සව අවස්ථාවල දී ඉදිරිපත් කරන ලද ආරාධනා පත්‍ර එකතුවක් තබා ගන්න.
ඒවා සිසුන්ට නිරීක්ෂණයට අවස්ථාව ලබා දෙන්න.
ආරාධනා පත්‍රවල පොදු ලක්ෂණ පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.
- කෙටි වීම
- සරල වීම
- සිත්ගන්නා සුළු ආකෘතිය
- වැදගත් කරුණු විවිධ ක්‍රම මගින් ඉස්මතු කිරීම

මෙම ලක්ෂණවලට අනුව ආරාධනා පත්‍රයක් සකස් කිරීමට සිසුන් යොමු කරන්න.
පාසලේ විවිධ අවස්ථාවල දී ආරාධනා පත්‍ර සිසුන් ලවාම නිර්මාණය කර භාවිතයට ගන්න.

## විශේෂ උපදෙස්

4.3.3.1 ආරාධනා පත්‍ර කියවා තේරුම් ගෙන ප්‍රතිචාර දක්වයි යන නිපුණතාව මේ සඳහා සමෝධානය කර ගන්න.

## නිපුණතා මට්ටම

4.4.2.4 ආකෘති පත්‍ර ඇසුරෙන් තොරතුරු සපයයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

**ගුරු උපදෙස්**

විවිධ වර්ගයේ ආකෘති පත්‍ර හා විවිධ ආයතනවල ආකෘති පත්‍ර ගොනුවක් තබා ගන්න.
සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍රයක ආදර්ශනයක් පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
සිසුන්ගේ පෞද්ගලික තොරතුරු ඇතුළත්කර ආකෘති පත්‍රයක් සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.

වාසගම සහිත සම්පූර්ණ නම : හේරත් මුදියන්සේලාගේ නවෝදා පුලස්ති බණ්ඩාර

පෞද්ගලික ලිපිනය : අංක 269 බී පැරණි ඩෝස ... වීදිය කුරුණෑගල

උපන් දිනය : වර්ෂය 1995 මාසය 06 දිනය 14

ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☒ (අදාළ කොටුව තුළ x ලකුණ යොදන්න.)

ජන වර්ගය : සිංහල ☒ දෙමළ ☐ මුස්ලිම් ☐ බර්ගර් ☐ වෙනත් ☐

ආගම : බෞද්ධ ☒ කතෝලික ☐ ක්‍රිස්තියානි ☐ හින්දු ☐ ඉස්ලාම් ☐ වෙනත් ☐

ඉගෙන ගන්නා පාසල : ව/කු සාන්ත ඈන්ස් රෝමානු කතෝලික විදුහල

අවසන් වරට සමත් වූ ශ්‍රේණිය : 07

පියා/මව/භාරකරුගේ නම : කෝරළ ගමගේ විජිත සෙනෙකා

### විශේෂ උපදෙස්

පාපිල්ල, දීර්ඝ පාපිල්ල, ඉස්පිල්ල, දීර්ඝ ඉස්පිල්ල, ඇදය, දීර්ඝ ඇදය, ඇලපිල්ල, ගැට ඇලපිල්ල, ගැට ඇලපිලි දෙක, හල්පිල්ල, රකාරාංශය අක්ෂර සමග යෙදෙන නිසා ඒවා අක්ෂරය සමග එක කොටුවක් තුළ යෙදිය යුතු ය.
කොම්බුව, යංශය, ගයනු කිත්ත, පිළි ලෙස ගැනෙන බැවින් ඒවා ද අක්ෂරය සමග එක කොටුවක් තුළ ලිවිය යුතු ය.
බිංදුව අක්ෂරයක් නිසා එය වෙන ම කොටුවක් තුළ ලිවිය යුතු ය.
පද බෙදීම් සඳහා ද එක් කොටුවක් වෙන් කරන්න.

### අවධානයට යොමු කළ යුතු කරුණු :

ඉහතින් දක්වා ඇත්තේ ගුරු ආදර්ශයක් බැවින් හිස් ආකෘති පත්‍රයක් සෑම සිසුවකුට ම ලබා දී ඔවුන්ගේ තොරතුරුවලින් එය සම්පූර්ණ කිරීමේ ක්‍රියාකාරකමක යෙදවිය යුතු ය.

## නිපුණතා මට්ටම

4.4.2.5 නිරීක්ෂණ වාර්තා ලියයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

සිසුන්ට විවිධ අවස්ථා නිරීක්ෂණයට අවස්ථාව ලබා දෙන්න.
නිරීක්ෂණයේ දී වැදගත් වූ කරුණු සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
එම කරුණු විධිමත් ව වාර්තා ගත කිරීමට යොමු කරවන්න.
කරුණු වාර්තා ගත කිරීමේ විවිධ ක්‍රම හඳුන්වා දෙන්න.

- ලිඛිත ව
- වගු ගත කිරීම්
- ප්‍රස්තාර මගින්
- චිත්‍ර මගින්
- සංකේත මගින්
- පෝස්ටර් මගින්

### විශේෂ සටහන්

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයෙහි නිරීක්ෂණ අවස්ථාවක් සමග සමෝධානය කර ගන්න.

## නිපුණතාව

4.4.3 නිර්මාණාත්මක ව ලියයි

"නිර්මාණාත්මක ව ලියයි" යන නිපුණතාව සිසුන් විසින් අත්පත් කර ගැනීමට නම් ලිවීමේ දී ප්‍රධාන පියවර කිහිපයක් අනුගමනය කළ යුතු ය.

1. නිර්මාණාත්මක ව ලිවිය යුතු මාතෘකාවට අදාළ ව නිදහසේ සිතීමට අවස්ථාව ලබා ගැනීම.
2. එම සිතුවිලි අවිධිමත් ලෙස සටහන් කර ගැනීම.
3. සටහන් කර ගත් කරුණු විධිමත් ලෙස පෙළ ගැස්වීම.
4. නිවැරදි අක්ෂර, නිවැරදි පද බෙදීම්, නිවැරදි ව විරාම ලකුණු යෙදීම්, ඡේද වෙන් කිරීම් සහ උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය අනුව ලිවීම.

### නිපුණතා මට්ටම

4.4.3.1 දෙබස් නිර්මාණය කර ලියයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කරන්න.
කණ්ඩායම්වලට දෙබස් නිර්මාණය කිරීමට සුදුසු මාතෘකාවක්/මාතෘකා දෙන්න.
ලැබුණු මාතෘකාවට අදාළ ව සංවාදයේ යෙදීමට උපදෙස් දෙන්න.
එම දෙබස් සටහන් කර ගැනීමට යොමු කරවන්න.
එය දෙබසක ආකාරයට කියවීමට උපදෙස් දෙන්න.
උචිත විරාම ලකුණු යොදමින් අඩුපාඩු සම්පූර්ණ කර විධිමත් ලෙස දෙබස ලියන්න.

කණ්ඩායමේ සියලු දෙනා විසින් රචිත දෙබස් සියල්ල එකතු කර ''දෙබස් පොතක්'' කරවන්න.
එම පොත්, පොත් මල්ලට එකතු කරන්න.

## නිපුණතා මට්ටම

4.4.3.2 සරල කවි නිර්මාණය කර ලියයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

සිසුන්ට නිර්මාණාත්මක සිතිවිලි පහලවන අන්දමේ පරිසරයක් ගොඩ නගන්න.
නිදහසේ සිතීමට අවකාශ ලබා දෙන්න.
සිසුන් ලබා ඇති අත්දැකීම් මූලික කර ගෙන නිර්මාණ බිහි කිරිමට අවස්ථාව සලසා දෙන්න.
ලියන ලද සියලු නිර්මාණ අගය කරන්න.

### ක්‍රියාකාරකම - 01

උදාහරණ - 01

සිසුන් එළිමහනේ නිදහස්, නිසංසල තැනකට රැගෙන ගොස් තනි තනි ව වාඩි කරවන්න.
තමන් කැමති මාතෘකාවක් ඔස්සේ සිතා කවි නිර්මාණය කිරීමට යොමු කරවන්න.
සියලු නිර්මාණයන් පන්තියට ඉදිරිපත් කිරීමටත් පන්තියේ සිසුන් ලවා ම සංස්කරණය කිරීමටත් පොළඹවන්න.
වඩාත් සුදුසු නිර්මාණ තෝරා නිර්මාණ පැදුරේ ප්‍රදර්ශනය කරවන්න.

උදාහරණ - 02

සිසුන් කණ්ඩායම් කරන්න.
එක් එක් කණ්ඩායමට එක් එක් පින්තූරය බැගින් ලබා දෙන්න.
පින්තූරය ගැන සාකච්ඡා කරමින් කවි නිර්මාණ කිරීමට පොළඹවන්න.
කණ්ඩායම එක් ව තාලානුකූල ව නිර්මාණය කළ කවි ගැයීමට අවස්ථාව දෙන්න.
නිර්මාණය කළ සියලු ම කවි එකතු කර පොතක් සාදා පොත් මල්ලට එකතු කරන්න.

### ක්‍රියාකාරකම - 02

කවියට කවිය ලියා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

### ක්‍රියාකාරකම - 03

පිළිතුරු කවි ලියා ඉදිරිපත් කිරිමට සිසුන් යොමු කරන්න.

### ක්‍රියාකාරකම - 04

තේරවිලි කවි නිර්මාණය කර ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.

## නිපුණතා මට්ටම

4.4.3.3 චිත්‍ර, සිදුවීම් ඇසුරෙන් සරල කතා නිර්මාණය කර ලියයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

සිද්ධියක් අනුපිළිවෙළට ගොඩ නැගෙන ආකාරයේ විශාල ප්‍රමාණයේ චිත්‍ර කීපයක් සපයා ගන්න.
එම චිත්‍ර මුළු පන්තියට ම පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරන්න.
ඒවා පිළිබඳ ව සාකච්ඡා කරන්න.
කථිත බසින් ඉදිරිපත් වූ වගන්ති කළුලෑල්ලේ ලියන්න.
ඒවා ලිඛිත බසට හරවා නැවත ලියන්න.
ආදර්ශනයක් ලෙස එම වගන්ති සිසු අභ්‍යාස පොතේ ලියා ගැනීමට උපදෙස් දෙන්න.

## ක්‍රියාකාරකම - 1

### උදාහරණ - 01

ඉහත සඳහන් කර ඇති ආකාරයට ම සිද්ධියක් ගොඩනැගිය හැකි චිත්‍ර කට්ටල කිහිපයක් සකස් කරගෙන කණ්ඩායමට එක් කට්ටලයක් වන සේ බෙදා දෙන්න.
කණ්ඩායම් සාකච්ඡාවක් මගින් වගන්ති ලිවීමට යොමු කරන්න.
සකස් කළ වගන්ති හා ඊට ප්‍රදර්ශනය කළ චිත්‍ර කණ්ඩායම් අතර හුවමාරු කර කියවීමට අවස්ථාව ලබා දෙන්න.

### උදාහරණ - 02

තනි චිත්‍රයක් දී ඒ ඇසුරෙන් කතාවක් නිර්මාණය කිරීමට සිසුන් යොමු කරන්න.

## ක්‍රියාකාරකම - 02

### උදාහරණ - 01

සිදුවීම් කිහිපයක් ඇතුළත් පද්‍ය පන්තියකට සවන් දීමට සලස්වා ඒ ඇසුරින් නිර්මාණශීලී ලෙස කතාවක් ගොඩනැගීමට යොමු කරන්න.

### උදාහරණ - 02

සිදුවීමක කොටසක් පමණක් කියවීමට සලස්වා ඉතුරු කොටස ගොඩනැගීමට යොමු කරන්න.

## නිපුණතා මට්ටම

4.4.3.4 රචනා නිර්මාණය කර ලියයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

රචනා නිර්මාණය කර ලිවීමේ දී සිසුන් බහුලව සිදු කරනු ලබන අඩුපාඩු පහත දැක්වේ.

උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳ ව නිවැරදි අවබෝධයක් නොතිබීම.
ලියන ලද වැකියේ අදහස නිරවුල් නොවීම.
නිවැරදි ව පද බෙදීමට නොදැනීම.
වැරදි ලෙස අක්ෂර වින්‍යාසය යෙදීම.
වැකියක වචන හතරක් වත් අවම වශයෙන් යෙදීමට නොහැකිවීම.
ලියන ලද වැකිය මාතෘකාවට හෝ සිද්ධියට හෝ අදාළ නොවීම.
අපැහැදිලි හා අක්‍රමවත් අත් අකුරු ලිවීම.
පිල්ලම් අඩුව හෝ වැඩිපුර හෝ යොදා ලිවීම.
විරාම ලක්ෂණ උචිත ලෙස යොදා ලිවීමට නොදැනීම.
මාතෘකාවට අදාළ වන කාලය පිළිබඳ අවබෝධයක් නොමැතිවීම.
රචනයේ ඡේද වෙන් කිරීමට නොදැනීම.
ඡේදයේ ආරම්භය හා අවසානය පිළිබඳ නිවැරදි අවබෝධයක් නොතිබීම.

## නිපුණතා මට්ටම

4.4.3.5 බිත්ති පුවත්පතට, නිර්මාණ පැදුරට සුදුසු නිර්මාණ ලියයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

මෙම නිපුණතා මට්ටම කරා ළඟා වීම සඳහා පහත දැක්වෙන නිපුණතා මට්ටම් සමෝධානය කර ගන්න.

4.4.3.1 දෙබස් නිර්මාණය කර ලියයි.
4.4.3.2 සරල කවි නිර්මාණය කර ලියයි.
4.4.3.3 චිත්‍ර සිදුවීම් ඇසුරෙන් සරල කතා නිර්මාණය කර ලියයි.
4.4.3.4 රචනා නිර්මාණය කර ලියයි.

මීට අමතර ව කියවීම් ක්ෂේත්‍රයට අදාළ ව

4.3.5.1 බිත්ති පුවත්පත් නිර්මාණ පැදුර කියවා ප්‍රතිචාර දක්වයි.
4.3.5.1 පොතක පටුන භාවිත කරයි.

බිත්ති පුවත් පතෙහි, නිර්මාණ පැදුරෙහි ඉදිරිපත් කරන නිර්මාණ අතරින් උසස් මට්ටමේ නිර්මාණ තෝරා නිර්මාණ සඟරාවක් සකස් කරන්න.

මෙය ස්ථාවර වැඩක් ලෙස පවත්වාගෙන යන්න. මෙම නිර්මාණ සඟරාව, උදෑසන රැස්වීමේ දී පාසල් පුස්තකාලය සඳහා විදුහල්පතිතුමාට පිරිනමන්න.

## නිපුණතාව

4.4.4 නිවැරදි ව ලේඛන ව්‍යවහාරය භාවිත කරයි

## නිපුණතා මට්ටම

4.4.4.1 නිවැරදි වාක්‍ය රටා ලියයි.

4.4.4.1.1 මම, අපි යෙදුණු වාක්‍ය නිවැරදි ව ලියයි.

මම / අපි යෙදුණු වාක්‍ය

| කාලය | ඒක වචන | බහු වචන |
|---|---|---|
| වර්තමාන | මම පොත් පාඩම් කරමි<br><br>මම පැළයක් සිටවමි | අපි පොත් පාඩම් කරමු<br><br>අපි පැළයක් සිටවමු |
| අතීත | මම පොත් පාඩම් කළෙමි<br><br>මම පැළයක් සිටෙව්වෙමි | අපි පොත් පාඩම් කළෙමු<br><br>අපි පැළයක් සිටෙව්වෙමු |

4.4.4.1.2 ඔහු / ඈ යෙදුණු වාක්‍ය නිවැරදි ව ලියයි.

ඔහු / ඈ යෙදුණු වාක්‍ය

| කාලය | ඒක වචන | බහු වචන |
|---|---|---|
| වර්තමාන | ඔහු පොත් පාඩම් කරයි<br><br>ඔහු පැළයක් සිටවයි | ඔවුහු පොත් පාඩම් කරති<br><br>ඔවුහු පැළයක් සිටවති |
| අතීත | ඔහු පොත් පාඩම් කළේය<br><br>ඔහු පැළයක් සිටෙව්වේය | ඔවුහු පොත් පාඩම් කළෝය<br><br>ඔවුහු පැළයක් සිටෙව්වෝය |

4.4.4.1.3 පුරුෂ ලිංග, ඒක වචන, බහු වචන නාම පද යෙදුණු වාක්‍ය නිවැරදි ව ලියයි.

| කාලය | පුරුෂ ලිංග ඒක වචන | පුරුෂ ලිංග බහු වචන |
|---|---|---|
| වර්තමාන | දරුවා සරුංගලය සාදයි.<br><br>ගොවියා හේන රකියි. | දරුවෝ සරුංගලය සාදති.<br><br>ගොවියෝ හේන රකිති. |
| අතීත | දරුවා සරුංගලය සෑදුවේය.<br><br>ගොවියා හේන රැක්කේය. | දරුවෝ සරුංගලය සෑදුවෝය.<br><br>ගොවියෝ හේන රැක්කෝය. |

4.4.4.1.4 ස්ත්‍රී ලිංග ඒක වචන, බහු වචන නාම පද යෙදුණු වාක්‍ය නිවැරදි ව ලියයි.

| කාලය | ඒක වචන | බහු වචන |
|---|---|---|
| වර්තමාන | ගායිකාව ගීතයක් ගයයි.<br><br>එළදෙන තණකොළ කයි. | ගායිකාවෝ ගීතයක් ගයති.<br><br>එළදෙන්නු තණකොළ කති. |
| අතීත | ගායිකාව ගීතයක් ගැයුවාය.<br><br>එළදෙන තණකොළ කෑවාය. | ගායිකාවෝ ගීතයක් ගැයුවෝය.<br><br>එළදෙන්නු තණකොළ කෑවෝය. |

4.4.4.1.5 ඉදිරිපිට සිටින එක් අයකු හෝ සමූහයක් හඳුන්වන නමක් උක්තය ලෙස යෙදුණු වාක්‍ය නිවැරදි ව ලියයි.

| කාලය | ඒක වචන | බහු වචන |
|---|---|---|
| වර්තමාන | තෝ මල් කඩහි<br>නුඹ සෙල්ලම් කරහි | තොපි මල් කඩහු<br>නුඹලා සෙල්ලම් කරහු |
| අතීත | තෝ මල් කැඩුවෙහි<br>නුඹ සෙල්ලම් කළෙහි | තොපි මල් කැඩුවෙහු<br>නුඹලා සෙල්ලම් කළෙහු |

4.4.4.1.6 අප්‍රාණවාචී ඒක වචන, බහු වචන නාම පද උක්තය සඳහා යෙදුණු වාක්‍ය නිවැරදි ව ලියයි.

| කාලය | ඒක වචන | බහු වචන |
|---|---|---|
| වර්තමාන | ගස සුළඟට සෙලවෙයි.<br>නිවස ජල ගැල්මට අසුවෙයි. | ගස් සුළඟට සෙලවෙයි.<br>නිවෙස් ජල ගැල්මට අසුවෙයි. |
| අතීත | ගස සුළඟට සෙලවුණේය.<br>නිවස ජල ගැල්මට අසුවුණේය. | ගස් සුළඟට සෙලවුණේය.<br>නිවෙස් ජල ගැල්මට අසුවුණේය. |

4.4.4.1.7 නිත්‍ය බහු වචන පද නිවැරදි ව යෙදුණු වාක්‍ය ලියා දක්වයි.

උදාහරණ :

1. කෙනෙක් රූපවාහිනිය නරඹති.
2. අයෙක් මුද්දර එකතු කරති.
3. යමෙක් පොත් කියවති.
4. ඇතැමෙක් පුවත්පත් බලති.
5. සමහරෙක් ගී ගයති.

මෙවැනි නිත්‍ය බහු වචන පද නිවැරදි ව යෙදුණු වගන්ති වෙනත් පොත්වලින් සොයා ලිවීමට සිසුන් පොළඹවන්න.

## නිපුණතා මට්ටම

4.4.4.2 අක්ෂර වින්‍යාසය පිළිබඳ ව නිවැරදි අවබෝධය ප්‍රදර්ශනය කරයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ගුරු උපදෙස්

**නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත ව ලිවීමට හුරුවීම**

සිංහල භාෂාවේ ඇතැම් වචනවල නියම අරුත ප්‍රකාශ කිරීම පිණිස ලිවිය යුතු අකුරු පිළිබඳ සම්මත රීතියක් පවතී. එක් එක් වචනය වෙන වෙන ම ගෙන එසේ යෙදෙන නිවැරදි අකුර/අකුරු සිසුනට ඉගැන්වීම පහසු කරුණක් නොවේ. පස්වන ශ්‍රේණිය මට්ටමේ සිසුනට එසේ කියා දීම ද ඵලදායී ඉගැන්වීමක් නොවනු ඇත. එබැවින් ඔවුන්ගේ වාංමාලාවේ ඇති වචන ඇසුරු කරගෙන එසේ නියමිත අකුර යෙදීමේ රටාව දැකීමට හුරු කිරීම අරමුණු කර ගනිමින් පහත දැක්වෙන අක්ෂර වින්‍යාස රටා දැකීමට සැලැස්විය යුතු වේ.

### අගට දන්තජ "ල්" යෙදෙන බහු වචන පද ඒක වචනයෙන් ලිවීම

දන්තජ "ල්" අවසන් වන, සිසුන් දන්නා වචන කණ්ඩායම් වශයෙන් ලිවීමට යොමු කිරීම

උදාහරණ : මල්, ගල්, උල්, පිල්

- සිසු කණ්ඩායම් හඳුනාගත් එම වචන ඒක වචනයෙන් ලිවීම. (සිසුන් හා සාමූහික ව)
- ඒ හැම විටෙක ලියන ඒක වචන පදයේ ''ල'' යන්න දන්තජ බව දැකීමට සලස්වා එම රටාව තහවුරු කිරීම.
- හඳුනාගත් ඒක වචන හා බහු වචන පද කිහිපයක් තෝරා ගෙන ඒවායේ අරුත පැහැදිලි වන සේ සරල වාක්‍ය ලිවීමේ අභ්‍යාසවල යෙදවීම.

## අගට දන්තජ ''න් '' යෙදෙන බහු වචන පද ඒක වචනයෙන් ලිවීම

දන්තජ ''න් '' වලින් අවසන් වන, සිසුන් දන්නා බහු වචන පද කණ්ඩායම් වශයෙන් රැස් කිරීමට යොමු කිරීම.

උදාහරණ : කන්, පින්, දන්, හිඟමන්, පෑන්, උඳුන්, කෙසෙල්කැන්

- සිසු කණ්ඩායම් හඳුනාගත් එම වචන අගට ''න '' යෙදෙන ලෙස ඒක වචනයෙන් ලිවීම. (සිසුන් හා සාමූහික ව)
- ඒ හැම විටෙක ම ලියන ඒක වචන පදයේ 'න' යන්න දන්තජ බව දැකීමට සලස්වා එම රටාව තහවුරු කිරීම.
- හඳුනාගත් ඒක වචන හා බහු වචන පද කිහිපයක් තෝරා ගෙන ඒවායේ අරුත පැහැදිලි වන සේ සරල වාක්‍ය ලිවීමේ අභ්‍යාසවල යෙදවීම.

## වචන මුලට මූර්ධජ ''ළ'' යෙදෙන පද

'හදවතට' කියන තවත් නමක් විමසා ''ළය'' යන වචනය ඒ සඳහා යෙදෙන බව මතු කර ගැනීම. එම වචන පාවිච්චි කරන අවස්ථා සාකච්ඡාවක් මගින් හඳුනා ගැනීම.

උදාහරණ : 1. ළය රෝහල
2. ළය පිළිකා

''ළය'' යන අරුත සහිත වචන සාකච්ඡාවක් මගින් හඳුනා ගැනීම.

උදාහරණ : ළයාන්විත ගීතය
ළගන්නාසුලු වචන
එම වදන්වලින් ළතෙක් විය

- ළය/හදවත යන අරුත දෙන වචන සහිත වැකි, පෙළ පොත්වලින් හෝ තමා විසින් ඒ සඳහා ම සකස් කළ ලේඛනවලින් හෝ සෙවීමේ අභ්‍යාසවල යෙදවීම.
- ඉහත ක්‍රියාකාරකම් ඇසුරෙන් හදවත යන අරුත දීම පිණිස යොදන වචනවල 'ළ' කාරය මූර්ධජ වන බව තහවුරු කිරීම.
- ''නොමේරූ'' යන වචනය සඳහා යෙදෙන තවත් වචන සිසුන්ගෙන් විමසීම. ඒ මගින් ළපටි, ළා යන වචනය මතුකර ගෙන එම වචන යෙදෙන අවස්ථා සිසුන් සමඟ හඳුනා ගැනීම.

උදාහරණ : ළපටි කොළ
ළා දලු
ගැහැනු ළමයා
ළහිරු මඬල

- නොමේරූ/අලුත් යන අරුත දීමට මූර්ධජ 'ළ' යෙදුණු වචන සහිත වැකි පෙළ පොත්වලින් හෝ තමා විසින් ඒ සඳහා ම සකස් කරන ලද ලේඛනවලින් හෝ සෙවීමේ අභ්‍යාසවල යෙදවීම.
- ඉහත ක්‍රියාකාරකම් ඇසුරින් නොමේරූ/අලුත් යන අරුත සඳහා යොදන වචනවල 'ළ' කාරය මූර්ධජ බව තහවුරු කිරීම.

## ''ඩ'' අකුරට මුලින් මූර්ධජ ''ණ්'' යෙදෙන පද

- පෙළ පොත්වලින් ඉහත ආකාරයේ වචන සහිත වැකි හඳුනා ගැනීමේ කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සිසුන් යෙදවීම.
- එසේ හඳුනාගත් වචන සමූහයක් ඇසුරින් ''ඩ'' අකුරට මුලින් යෙදෙන්නේ මූර්ධජ ''ණ්'' බව තහවුරු කිරීම.

උදාහරණ : දණ්ඩ, ආණ්ඩුව, තුණ්ඩුව, හෙණ්ඩුව, කඩමණ්ඩිය

තාලුජ 'ශ' අකුරට පසුව දන්තජ 'න' යෙදෙන පද

- පෙළ පොත්වලින් ඉහත ආකාරයේ වචන සහිත වැකි හඳුනා ගැනීමේ කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සිසුන් යෙදවීම.
- එසේ හඳුනා ගත් වචන සමූහයක් ඇසුරෙන් තාලුජ 'ශ' අකුරට පසුව යොදන 'න' දන්තජ බව තහවුරු කිරීම.

උදාහරණ : ප්‍රදර්ශන, ආදර්ශන, නිදර්ශන, ප්‍රශ්න (ශ්‍රේණි ආදී වශයෙන් රකාරාංශය නොයෙදුණු වචනවල)

මූර්ධජ 'ෂ' අකුරට පසුව මූර්ධජ 'ණ' යෙදෙන පද

- පෙළ පොත්වලින් ඉහත ආකාරයේ වචන සහිත වැකි හඳුනා ගැනීමේ කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සිසුන් යෙදවීම.
- එසේ යෙදෙන වචන රැස් කිරීමට යොමු කරවීම.
- එවැනි වචන ලැයිස්තු පන්තියේ ප්‍රදර්ශනය කර සිසුනට පෙනෙන්ට සැලැස්වීම.

මහප්‍රාණ අකුරු යෙදීම (ධ, භ, ඨ, ඛ, ඵ, ෂ)

- පෙළ පොතේ පාඩම් අධ්‍යයනය කර එක් එක් අකුර යෙදුණු වචන සිංහල පෙළ පොතෙන් සොයා ලැයිස්තු ගත කිරීමේ පැවරුම්, ගෙදර වැඩ සඳහා යොදා ගැනීම. මේ සඳහා ප්‍රමාණවත් කාලයක් දෙන්න.
- සියලු ම සිසුන් සොයා ගත් වචන එක් එක් අකුර යටතේ ලැයිස්තු ගත කිරීම හා ප්‍රමාණවත් කාලයක් පන්තිය තුළ ප්‍රදර්ශනය කිරීම.
- අදාළ අකුරු, වචන යොදා වැකි ගොඩ නැගීම, අදාළ අකුරු හිස්තැන්වලට යොදා වැකි සහ වචන සම්පූර්ණ කිරීම, නිවැරදි අකුරු යොදා වචන, වැකි අසා ලිවීම යන අභ්‍යාසවල යෙදවීම.

නිර්දේශිත පොත්

1. අපේ ජන කවිය - හන්ගමුවේ ගුණතිලක බණ්ඩාර
2. රොබට් නොක්ස් - රංජිත් ධර්මකීර්ති (පරිවර්තනය)
3. ගඟ අද්දර කැලේ - සෝමවීර සේනානායක
4. වන තරණය - පියසේන කහඳගමගේ
5. දිගාමඩුල්ලේ ආශ්චර්යය - මායා රංජන්
6. සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය
7. මඩොල් දූව - මාර්ටින් වික්‍රමසිංහ
8. ජනකවි රටා - ලක්ෂ්මන් කහටපිටිය
9. ළමා ගී - කුමාරතුංග මුනිදාස
10. ගොයම් කවි සරණිය - නෝමන් සිරිපාල
11. හත්පණ - කුමාරතුංග මුනිදාස
12. දික්තල කාලගෝල - පුණ්‍යසේන ගුණසිංහ
13. වනන්තරේ වික්‍රමය - ජේ. ඒ. කුමාරදාස
14. වනේ ඇඳුණු පිය සටහන් - පියසේන කහඳගමගේ

## ගුරුවරුන්ගේ ස්වයං ඇගයීම සඳහා වූ නිර්ණායක

01. අකුරු ලිවීමේ නිවැරදි ශිල්ප ක්‍රම භාවිත කරමින් වඩා උචිත උපක්‍රම අනුගමනය කරන්නේ ද?
02. කථනය හා ලිවීම අතර ඇති සම්බන්ධය අත්දැකීමෙන් වටහා ගත්තේ ද?
03. ලිවීමේ දී පැන්සල අල්ලා ගෙන සිටින ඉරියව්ව, කඩදාසිය තබාගන්නා ක්‍රමය, යනාදිය සැලකිල්ලට ගනිමින් නිවැරදි ව ලිවීමට මග පෙන්වන්නේ ද?
04. අකුරු අතර පරතරය, වචන අතර පරතරය, වාක්‍ය අතර පරතරය යනාදිය සැලකිල්ලට ගනිමින් ලිවීමේ අවශ්‍යතාව තහවුරු වන සේ ක්‍රියාකාරකම් සැලසුම් කරන්නේ ද?
05. බලා ලිවීමේ කුසලතාව වර්ධනය කිරීම තුළින් අකුරු නිවැරදිවත් නිවැරදි අංග ලක්ෂණ සහිතවත් ලිවීමේ කුසලතාව දියුණු කළ හැකි බව අත්දැකීමෙන් වටහා ගත්තේ ද?
06. අසා ලිවීම තුළින් අකුරු ශබ්ද, උච්චාරණය මගින් මතකයට නැගෙන නිසා ගුරුවරයාගේ ශබ්ද උච්චාරණය නිවැරදි විය යුතු බව වටහාගෙන ක්‍රියාකරන්නේ ද?
07. නැවතීමේ ලකුණ සුදුසු පරිදි භාවිත කිරීමේ අවශ්‍යතාව වැටහෙන ආකාරයට සැලසුම් කළ ක්‍රියාකාරකම් ඉදිරිපත් කරන්නේ ද?
08. කියවීම තුළින් වටහාගෙන ලිවීමේ කුසලතාව වැඩි දියුණු කිරීම සඳහා විවිධ ක්‍රියාකාරකම් ලබා දී උනන්දු කරන්නේ ද?
09. දෛනික අවශ්‍යතාවල දී විවිධ ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාව වටහා දී එවැනි ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමට අවස්ථාව ලබා දෙන්නේ ද?
10. සවන් දී වටහාගෙන ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමට, හඬ පට භාවිත කරන්නේ ද?
11. නිර්මාණ කුසලතාව වර්ධනය කිරීමට විවිධ ක්‍රමවේදයන් අනුගමනය කරන්නේ ද?
12. මූලික ව්‍යාකරණ දැනුම වර්ධනය කිරීමට ප්‍රයෝගික වශයෙන් සාර්ථක ක්‍රියාමාර්ග ඉදිරිපත් කරන්නේ ද?
13. ශබ්ද කෝෂය භාවිත කර වචනවල අර්ථ වටහාගෙන භාවිත කිරීමට සුදුසු ක්‍රියාකාරකම් ලබා දී ඔවුන් දිරිමත් කරන්නේ ද?
14. තොරතුරු සොයා ලබා ගෙන ඒවා සංස්කරණය කර ලිවීමට අවශ්‍ය අවස්ථා ලබා දෙන්නේ ද?
15. විවිධ භාෂා අභ්‍යාස තුළින් භාෂා දැනුම දියුණු කිරීමේ ක්‍රියාකාරකම් ඉදිරිපත් කරන්නේ ද?
16. ලේඛන කුසලතාව වර්ධනය කිරීමට අත් අකුරු පත්‍රිකා, සඟරා හා බිත්ති පුවත්පත් නිර්මාණය කිරීමටත් ඒවා ප්‍රදර්ශනය කිරීමටත් උනන්දු කරන්නේ ද?
17. ලිපි නිර්මාණ, තරග, ප්‍රදර්ශන යනාදියට සහභාගි වීමට අවශ්‍ය ඉඩ ප්‍රස්ථා ලබා දෙන්නේ ද?
18. අකුරු අභ්‍යාස පත් පරීක්ෂා කර ඒවා නිවැරදි කර අදාළ පැහැදිලි කිරීම් කරන්නේ ද?
19. අකුරුවල ඇති වරදකට රතු පෑනෙන් වැරදියි යනුවෙන් සලකුණු කිරීම දරුවාගේ ආත්ම විශ්වාසය බිඳ වැටීමට හේතුවන ක්‍රියාවක් බව අත්දැකීමෙන් අවබෝධ කරගත්තේ ද?
20. මූලික භාෂා කුසලතා හතර ම ඒකාබද්ධ කර ඉගැන්වීම් තුළින් ද භාෂා කුසලතාව වර්ධනය කළ හැකි බව අත්දැකීම් තුළින් වටහා ගත්තේ ද?

මව්බස - තක්සේරු තොරතුරු වාර්තා කිරීම - පස්වන ශ්‍රේණිය

තක්සේරු කිරීමේ පරිමාණය

සාර්ථකව කරයි ✓

දුෂ්කරතා පෙන්නුම් කරයි •

| සිසුන්ගේ නම් | | |
|---|---|---|
| 1. සිද්ධියක් පිළිබඳ විස්තරයකට සවන් දී එහි වැදගත් කරුණු ප්‍රකාශ කරයි. | | |
| 2. ප්‍රවෘත්ති හා නිවේදනවලට සවන් දී එහි වැදගත් කරුණු ප්‍රකාශ කරයි. | | |
| 3. සිදුවීම් කිහිපයක අනුපිළිවෙළ ප්‍රකාශ කරයි. | | |
| 4. විස්තරයකට සවන් දී ඒ පිළිබඳ ව අදහසක් ප්‍රකාශ කරයි. | | |
| 5. ළමා නාට්‍යකට වින්දනයෙන් යුතුව සවන් දී ප්‍රතිචාර දක්වයි. | | |
| 6. එකිනෙකා අතර සුහදත්වය වර්ධනය කරන ආකාරයට කතා කරයි. | | |
| 7. නිවැරදි උච්චාරණය සහිත ව කතා කරයි. | | |
| 8. අවස්ථාවට උචිත ලෙස කතා කරයි. | | |
| 9. මුල, මැද, අග ගැළපීම් සහිත ව අදහස් ප්‍රකාශ කරයි. | | |
| 10. විරාම ලක්ෂණවලට අනුකූල ව නිවැරදි උච්චාරණය සහිත ව කියවයි. | | |
| 11. සරල කවියක්, ගද්‍ය කොටසක් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | | |
| 12. ළමා නිර්මාණ හා කතන්දර පොත් කියවා රසවත් තැන් ප්‍රකාශ කරයි. | | |
| 13. පුවත්පත් කියවා වැදගත් තොරතුරු ප්‍රකාශ කරයි. | | |
| 14. සිංහල හෝඩියේ සියලු ම අක්ෂර ඇතුළත් වන පරිදි සකස් කළ වගන්ති කිහිපයක පිල්ලම් හා විරාම ලක්ෂණ යොදා ලියයි. | | |
| 15. පාසලේ අධ්‍යාපනික අවශ්‍යතා සම්බන්ධ රාජකාරි ලිපියක් සකස් කරයි. | | |
| 16. දෙන ලද මාතෘකාවකට අනුව නිර්මාණාත්මක ව ලියයි. | | |
| 17. චිත්‍රයක සිදුවීම් පදනම් කර ගනිමින් සරල කතා නිර්මාණය කරයි. | | |
| 18. සරල කවි නිර්මාණය කරයි. | | |
| 19. එදිනෙදා බහුල ව භාවිත වන වචන නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත ව ලියයි. | | |
| 20. උක්තය සඳහා මම/අපි යෙදුණු වාක්‍යවල උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි ව ලියයි. | | |
| 21. අප්‍රාණවාචී නාම පදය උක්තය සඳහා යෙදුණු වාක්‍ය නිවැරදි ව ලියයි. | | |
| 22. නිත්‍ය බහුවචන පද උක්තය සඳහා යෙදුණු වාක්‍ය නිවැරදි ව ලියයි. | | |
| 23. එදිනෙදා ජීවිතයේ දී බහුලව භාවිත වන රූපික ප්‍රකාශන කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි. | | |
| 24. භාෂාමය යෙදුම් කියවා හඳුනාගෙන ප්‍රකාශ කරයි. | | |

# තුන්වන ප්‍රධාන අවධිය දරුවන්ගේ කියවීම හා ලිවීම පිළිබඳ දුෂ්කරතා

## කියවීම

1. කියවීමට නොහැකි වීම.
2. කියවීමට අකමැති වීම.
3. තතන තතනා කියවීම.
4. තිබෙන වචනය වෙනුවට වෙනත් වචනයක් කියවීම.
5. වචන අතහැර කියවීම.
6. වචන හෝ අකුරු නැවත නැවත කියවීම.
7. විරාම ලක්ෂණ නොසලකා කියවීම.
8. තාලයකට කියවීම අපහසු වීම.

## ලිවීම

1. බලාගෙන ලිවිය හැකි වුවත් අසා ලිවීමට නොහැකි වීම.
2. මතකයෙන් වචන ලිවීමට අපහසු වීම.
3. ඇතැම් අකුරු ලිවීමට නොහැකි වීම.
4. අර්ථයක් නොමැතිව අකුරු පමණක් ලිවීම.
5. අකුරු ලියන අකාරය වැරදි සහගත වීම.
6. අකුරුවල කොටස් අඩුවෙන් ලිවීම.
7. ඇතැම් අකුරු අතර වෙනසක් නොවීම.
8. අකුරු එකට ඇඳා ලිවීම හා වචන වෙන් නොකිරීම.
9. ඇතැම් අකුරු අතහැර ලිවීම.
10. පිල්ලම් අතහැර ලිවීම.
11. ලිවීම සඳහා පමණට වඩා වේලාගත කිරීම.
12. එක් එක් අකුර එක් එක් ප්‍රමාණවලට ලිවීම. (අකුරුවල නිශ්චිත ප්‍රමාණය නොසලකා ලිවීම)
13. ලියන ප්‍රමාණය ඉතා අඩු වීම.
14. තමාගේ සම්පූර්ණ නම ලිවීමට නොහැකි වීම.
15. අශෝභන අත් අකුරු

අධ්‍යයනයකින් හඳුනා ගත් පරිදි පස්වන ශ්‍රේණිය වන විටත් ඇතැම් සිසුන් තුළ කියවීම හා ලිවීමට අදාළ ව අනාවරණය වූ භාෂා දුෂ්කරතා සමූහයකි මේ.

# කියවීම හා ලිවීම පිළිබඳ දුෂ්කරතා මග හැරවීම

දරුවන් තුළ පවතින ලිවීම හා කියවීම පිළිබඳ දුෂ්කරතා මග හැරවීම සඳහා යෝජනා කරනු ලබන ක්‍රමවේද දෙආකාරයකට පන්ති කාමරය තුළ භාවිත කිරීම අපේක්ෂා කෙරේ. ඇතැම් ක්‍රමවේද පොදුවේ මුළු පන්තිය සඳහා ම යොදා ගත හැකිය. අනෙක් ඒවා ඒ ඒ දුෂ්කරතා පෙන්නුම් කරනු ලබන සිසුන් සඳහා වෙන ම භාවිත කළ යුතු වේ. මේ සඳහා පන්ති කාමරයේ ඉගැන්වීම් කාලයෙන් බැහැර ව වෙනත් වේලාවක් යොදා ගන්නේ නම් යෝග්‍ය වේ. මක්නිසා ද යත් පන්ති කාමරයේ නියමිත ඉගෙනීමේ කටයුතුවල නිරත වීමේ අවස්ථා මෙම සිසුන්ටත් ලබා දිය යුතු හෙයිනි.

ප්‍රථමයෙන් පොදුවේ මුළු පන්තිය වෙනුවෙන් යොදා ගත හැකි ක්‍රමවේ ද අනතුරු ව ඒ ඒ සිසුන් වෙනුවෙන් භාවිත කළ යුතු ක්‍රමවේද ද දක්වා ඇත.

## (අ) කියවීම හා ලිවීම සඳහා පොළඹවන වාතාවරණයක් පන්ති කාමරය තුළ ගොඩනැගීම

පන්ති කාමර වටාපිටාව කියවීම හා ලිවීම ඉගෙනීම සඳහා ඉතා බලවත් වාතාවරණයකි. එබැවින් එය කියවීම ලිවීමට පොළඹවන අයුරින් සැකසිය යුතුයි. ඒ සඳහා පහත දැක්වෙන ක්‍රමවේද යෝග්‍ය වේ.

- ★ සිසුන්ට නිදහසේ කතා බහ කිරීමට අවස්ථා ලබා දීම.
- ★ නිදහසේ ලිවීමට, ඇඳීමට, හැකි වන පරිදි කළුලෑල්ලක් හෝ සුදුලෑල්ලක්, පාට කූරු, කඩදාසි, පැන්සල්, පෑන් සපයා තිබීම.
- ★ පන්තියේ බිත්තිවල, සිවිලිමේ කතාන්තර පින්තූර ගත කර තිබීම හා ඒවා පැහැදිලි ලෙස නම් කිරීම.
- ★ එක් එක් ස්ථාන නම් කරන ලද පාසලේ සැලැස්මක් බිත්තියේ එල්ලා තැබීම.
- ★ බිත්තියේ එක් තැනක, පුවත්පත්වලින් කපා ගත් වැදගත් ආරංචි දිනපතා ම අලවා තැබීම.
- ★ දරුවන්ගේ සම්පූර්ණ නම ප්‍රදර්ශනය කර තැබීම.

  (දරුවන්ගේ මේසය මත හෝ බිත්තියේ එල්ලා ඇති දරුවන්ගේ නිර්මාණ සමග)
- ★ දරුවන්ගේ අදහස් ලියා තැබීම සඳහා පෙට්ටියක් තැබීම, සතියේ එක් දිනක එම පෙට්ටිය විවෘත කර සියලු දෙනා ම එක් වී ඒවා කියවීම.
- ★ පන්තියේ මේස, පුටු, කණ්ඩායම් ක්‍රියාකාරකම්වලට යෝග්‍ය පරිදි සකසා ගත හැකි වීම.
- ★ සරල පින්තූර කතා, කතාන්තර පොත්, ළමා පුවත්පත් එකතුවක් තබා ගැනීම.
- ★ බිත්තිවල එල්ලා ඇති පරණ පින්තූර ඉවත් කොට අලුත් ඒවා එල්ලා තැබීම. (මාසයකට හෝ වාරයකට වරක්)
- ★ දරුවන්ට කණ්ඩායම් වශයෙන් ක්‍රීඩා කිරීම, පාට කිරීම, තේරීම, රංගපෑම, ගොඩ නැගීම සඳහා ඉඩකඩ හා අවස්ථාවන් ලබා දීම.
- ★ එක් එක් විෂයයන් සඳහා බිත්තියේ කොටස් වෙන් කිරීම. (සිංහල, ආගම, ඉංග්‍රීසි ආදී වශයෙන්)

(ආ) කියවීම හා ලිවීම දුර්වල සිසුන් සඳහා තනි තනිව යොදා ගත හැකි ක්‍රමවේද :

1. අරමුණ : කියවීමේ සූදානම හඳුනා ගැනීම.

ක්‍රමෝපාය : පොතක් සපයා පහත දැක්වෙන ප්‍රශ්න අසන්න.
- පොතේ මුල් පිටුව පෙන්වන්න.
- පොතේ අන්තිම පිටුව පෙන්වන්න.
- පොතේ ඉහළ පෙන්වන්න.
- පොතේ පහළ පෙන්වන්න.
- පොතේ ඉදිරිපස පිටුව පෙන්වන්න.
- පොතේ පිටුපස පිටුව පෙන්වන්න.
- කතාන්තරය පටන් ගන්නේ කොතනින්ද?
- වචනයක් පෙන්වන්න.
- මේ පේළියේ මුල් වචනය පෙන්වන්න.
- පින්තූරය යටින් ඇති වචන පෙන්වන්න.
- පින්තූරයට උඩින් ඇති වචන පෙන්වන්න.
- මම කියවන වචනය පෙන්වන්න.

මෙම ප්‍රශ්නවලට සාර්ථක පිළිතුරු ලැබේ නම් සිසුන් කියවීමට යෝග්‍ය තත්ත්වයක සිටින බව තීරණය කළ හැක. ඒ අනුව ඔවුන් විධිමත් කියවීම සඳහා සූදානම් කළ යුතුයි. ඒ සඳහා පහත දක්වා ඇති ක්‍රම අනුගමනය කරන්න.

2. අරමුණ : කියවීම සඳහා සූදානම් කිරීම

ක්‍රමෝපාය : පහත දැක්වෙන පියවර අනුගමනය කරන්න.
- මෑතක දී සිදු වූ රසවත් අත්දැකීමක් සාකච්ඡා කරන්න.
- කැමති දේවල් අසා ඒවා විස්තර කිරීමට කියන්න.
- පන්තියෙන් පිටත නිරීක්ෂණය කිරීමට ඉඩ දී අනතුරු ව ඒවා විස්තර කිරීමට යොමු කරන්න.
- ඇස අත සමායෝජනය සඳහා කතුරෙන් කැපීම, බිම හෝ කළුලෑල්ලේ හෝ කඩදාසිවල පින්තූර ඇඳීමට අවස්ථා ලබා දෙන්න.
- පින්තූර කතා බලා ගුරුවරයා සමඟ සාකච්ඡා කරන්න.

කියවීම් හුරුව ලැබෙන තෙක් මෙම ක්‍රියාකාරකම් කළ යුතු වේ. මේ සඳහා තවත් උපක්‍රමයක් යොදා ගත හැකිය.

★ එදිනෙදා සිදුවන කුතුහලය ඇති කරන සිද්ධීන් ඇතුළත් පුවත්පත් වාර්තාවල ශීර්ෂ පාඨ කාඩ්පත්වල අලවා ගන්න. මෙවැනි කාඩ්පත් 20 - 30 පමණ සාදා ගන්න. ඒවා සිසුන්ට පෙන්වා ඒ ගැන සාකච්ඡා කරන්න.

3 . අරමුණ : කියවීම ආරම්භ කිරීම

ක්‍රමෝපාය : කතාන්තරයක් ඉදිරිපත් කරන්න.
- තම වචනයෙන් එම කතාව කියන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.
- සිසුන් කියන දේ ලියන්න. (දරුවාගේ වචනවලින්)
- ලියන ලද කතාව ගුරුවරයා විසින් කියවන්න.
- සිසුන් සමඟ කියවන්න.
- සිසුන් ලවා කතාව පිටපත් කරවන්න.

4 . අරමුණ : සරල කතා පොතක් කියවීමට ඉගැන්වීම

ක්‍රමෝපාය : පින්තූර සහිත සරල කතා පොතක් තෝරා ගන්න.
- කතාවේ ඇති අලුත් වචන සිසුන්ගේ ජීවිතයට සම්බන්ධ සිද්ධීන් ඇතුළත් වන සේ සාකච්ඡා කරන්න.
- එම වචන කළුලෑල්ලේ ලියන්න.
- කතා පොතේ පින්තූර බැලීමට හා ඒ ගැන ගුරුවරයාගෙන් විමසීමට ඉඩ දෙන්න.
- කතාව කියවමින් වැදගත් වන වචන මතු වූ විට කළුලෑල්ලේ ලියන්න.
- කතාව ගැන අමතර ප්‍රශ්න අසා චිත්තරූප මවා ගැනීමට ඉඩ සලස්වන්න.

5 . අරමුණු : නියමිත පන්ති පොත කියවීම

ක්‍රමෝපාය : කියවීමට යෝග්‍ය පන්ති පොත තෝරා ගන්න.
- උච්චාරණය කිරීමට අපහසු වචන වේ නම් ඒවා ඔබ හොඳින් උච්චාරණය කරන්න.
- පේළි දිගේ කියවීමට අපහසුකම් නියමිත පේළිය යටින් කාඩ්බෝඩ් තීරුවක් තබා පේළියෙන් පේළියට කියවීමට සලස්වන්න.

6 . අරමුණ : කියවීම සඳහා දරුවා සූදානම් කිරීම

(අ) ක්‍රමෝපාය : විවිධ පින්තූර ඇතුළත් කාඩ්පත් 6 සකස් කර ගන්න. ඒවා එකවර ම පෙන්වා අනතුරුව වසන්න. පින්තූරවල ඇති දේ මතකයෙන් කියන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.
- පින්තූර 6න් එකක් ඉවත් කර අනෙක් පින්තූර පෙන්වන්න. ඉවත් කළ පින්තූරය කුමක් දැයි අසන්න.
- වචන අඩංගු කාඩ්පත් යොදා ගෙන ඉහත ක්‍රමය අනුගමනය කරන්න.

(ආ) ක්‍රමෝපාය : ඔබ වචනයක් කියා ඊට සමාන රිද්මයක් ඇති වචන කියන ලෙස උපදෙස් දෙන්න.
- පටිගත කළ ශබ්ද ඇසීමට සලස්වා ඒ කුමක් දැයි අසන්න.
- සරල කතාන්තරයක් කියා අතර මැද නවත්වන්න. ඊළඟට සිදුවන දේ අසන්න.
- කතාවක් කියන අතරතුර වැරදියට කියන්න.
- කතාවක් කියා එයට යෝග්‍ය අවසානය දරුවාගෙන් අසන්න.

## 7. අරමුණ : කියවීම දුර්වල සිසුන්ට කියවීම ඉගැන්වීම

ක්‍රමෝපාය : පහත පියවර අනුගමනය කරන්න.

- ගුරුවරයා ඡේදයක් හෝ වාක්‍ය හෝ ශබ්ද නඟා කියවන්න. ඒ ගැන ප්‍රශ්න අසන්න.
- එහි එන සිද්ධීන්/දේවල් රූපයට නගමින් සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ගුරුවරයා ශබ්ද නඟා කියවන අතර සිසුන්ට එය අසා කියවීමට යොමු කරන්න. (වචනයෙන් වචනය ඇඟිල්ල තබා කියවිය යුතුය.)
- නිවසේ දී දෙමාපියන් හෝ වැඩිහිටියකු ලවා හෝ පෙළ පොත කියවීමට උපදෙස් දෙන්න. (පාසලේ දී නම් වෙනත් ශිෂ්‍යයකු ලවා මෙය කළ හැකියි)

## 8. අරමුණ : කියවීම දුර්වල සිසුන් කියවීම සඳහා පොළඹවා ගැනීම

ක්‍රමෝපාය : හවුලේ කියවීම

- ගුරුවරයා විසින් පාඩම් පොතේ හෝ කතා පොතේ හෝ ඡේදයක් කියවීම, ශිෂ්‍යයා ද එය කියවීම.
- ඊළඟ ඡේදය කියවීමට දී ගුරුවරයා අසා සිටීම හා අවශ්‍ය විට උදවු දීම.
- ශිෂ්‍යයාගේ කියවීම ගැන ප්‍රශංසා කරමින් ගුරුවරයා ඊළඟ කොටස කියවීම.
- නැවත කියවීමට සිසුන්ට ඇරයුම් කිරීම (අවශ්‍ය උදවු දෙමින්)
- ගුරුවරයාගේ කියවීම ක්‍රමයෙන් අඩු කරමින් සිසුන්ගේ කොටස් වැඩි කිරීම.

## 9. අරමුණ : කියවීම ඉගැන්වීම සඳහා දෘෂ්‍ය වාග්මාලාව ගොඩ නැංවීම

ක්‍රමෝපාය : කියවීමට ඉගැන්විය යුතු වචන හඳුනාගෙන එක කාඩ්පතක වචන 6ක් පමණ සිටින සේ කාඩ්පත් සාදා ගන්න.

1 පියවර

- කාඩ්පත සිසුන් අතට දී කියවිය හැකි දැයි බලන්න.
- කියවිය නොහැකි වචන බලාගෙන ලියවන්න.
- එම වචන ශබ්ද නඟා කියවවන්න. කියවන අතර එම අකුරු උඩ ඇඟිල්ලෙන් අඳින ලෙස උපදෙස් දෙන්න.
- එම වචන ශබ්ද කරමින් කියවීමට හෝ බිම ඇඳීමට උපදෙස් දෙන්න. අනතුරු ව ලියූ වචනයෙහි හරි වැරදි පරීක්ෂා කරවන්න. වැරදි නම් ඉහත පියවර නැවත අනුගමනය කරවන්න.
- උගත් වචන, ඇතුළත් කොට වචන පොතක් සාදවන්න. දිනපතා ඉගෙන ගන්නා වචන එයට එකතු කරවන්න.
- එම වචන යොදා වාක්‍ය සාදවන්න.

## 10. අරමුණ : පන්ති පොත කියවීම

ක්‍රමෝපාය : පන්ති පොතේ නියමිත පාඩමේ සිසුන්ට කියවිය නොහැකි වචන තෝරා ගෙන ඉහත 9හි සඳහන් ක්‍රමය අනුගමනය කරවන්න. අනතුරු ව එම වචන ප්‍රවීණ වීමෙන් පසුව පාඩම කියවීමට දෙන්න.

11. අරමුණ : නිතර අකුරු/වචන අමතක වන සිසුන්ට එම වචන/අකුරු ඉගැන්වීම

ක්‍රමෝපාය : නිතර අමතක වන අකුරු හෝ වචන හෝ කාඩ්පත්වල ලොකු අකුරින් (වර්ණවත්ව) ලියාගන්න.

- එම අකුරු/වචනය ශබ්ද නගා කියවමින් ඒ උඩ ඇඟිල්ලෙන් ඇඳීමට උපදෙස් දෙන්න. එම අකුර හෝ වචනය, මතකයෙන් ලිවීමට හැකි වන සේ එසේ කිරීමට උපදෙස් දෙන්න.
- එම අකුර/වචනය අඩංගු කාඩ්පත වසා මතකයෙන් ලියවන්න.
- ලියු දෙයෙහි වැරදි නිවැරදි බව කාඩ්පත සමග පරීක්ෂා කරවන්න.
- වැරදියට ලියා තිබේ නම් ඉහත ii, iii ඉහත පියවර නැවත අනුගමනය කරවන්න.

12. අරමුණ : මුද්‍රිත වචන හඳුන්වා දීම

ක්‍රමෝපාය : 1 පියවර - පහත දැක්වෙන පරිදි පොතක් සාදා ගන්න.
(ඉගැන්වීමට අවශ්‍ය වචන හා එම වචනවලට අදාළ පින්තූර ඇතුළත් වන සේ)

| | |
|---|---|
| බසය | |

ප්‍රථමයෙන් පින්තූරය පෙන්වා එහි නම අසන්න. දෙවනුව එහි වචනය ශබ්ද නගා කියවන්න. වචනය ශබ්ද කරමින් එම අකුරු මත ඇඟිල්ල ගෙන යන්න. සිසුන් අකුරු හා වචන හඳුනා ගන්නා තෙක් මේ ක්‍රමය අනුගමනය කරන්න.

2 පියවර - වචන 2 පොතක් සෑදීම
රූපයේ දැක්වෙන පරිදි වචන දෙකක ප්‍රකාශන (වාක්‍ය)
අඩංගු රූප - වාක්‍ය පොතක් සාදා ගන්න.

| | |
|---|---|
| බත් කනවා | |

වචන හා ප්‍රකාශනය හඳුනා ගන්නා තෙක් ඉහත 1 පියවරේ ක්‍රමය අනුගමනය කරන්න.

3 පියවර - වචන 3 පොතක් සාදන්න.
රූපයේ දැක්වෙන පරිදි දරුවාට ඉගැන්වීමට අවශ්‍ය වචන ඇතුළත් වචන 3 යෙදෙන වාක්‍ය පොතක් සාදා ගන්න. මෙම පොත ඉහත 1 පියවරේ උපදෙස් අනුව භාවිත කරන්න.

| | |
|---|---|
| ළමයා පාරේ දුවයි | |

4 පියවර - දරුවාට ඉගැන්වීමට අවශ්‍ය වගන්ති ඇතුළත් කාඩ්පත් තනා එම වගන්තියට අදාළ පින්තූර ඇඳීමට හෝ ඇලවීමට උපදෙස් දෙන්න.

| | |
|---|---|
| ළමයා බත් කයි | |

## කියවීම දුෂ්කර සිසුන්ට ඉගැන්වීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු :

- ★ ගුරුවරයා සානුකම්පික/සහකම්පනය සහිත ලිවීම හා කියවීමට දක්ෂ අයකු වීම.
- ★ විනෝදයක් ලැබීම මෙන් ම තොරතුරු දැන ගැනීම සඳහා කියවීමේ අවස්ථා වැඩි කිරීම.
- ★ කියවීමේ අරමුණු හා එහි වැදගත්කම දරුවන් තේරුම් ගැනීම.
- ★ දරුවාට සමීප දේවල් හා ඔහු රුචි කරන දේවල් ඇසුරින් කියවීම් ද්‍රව්‍ය සකසා ගැනීම.
- ★ කියවීම වෙනුවෙන් තෑගි, ප්‍රශංසා වැනි දිරිපත් කිරීම් ලබා දීම.
- ★ ඉතා සැලකිල්ලෙන් සකස් කරන ලද කියවීම් ද්‍රව්‍ය යොදා ගැනීම.
- ★ එක්වර ම පොත්පත් යොදා ගන්නවා වෙනුවට ප්‍රථමයෙන්, පින්තූර කාඩ්පත් යොදා ගෙන අනතුරුව පොත්වලට පිවිසීම.
- ★ කියවීම සඳහා ප්‍රමාණවත් තරම් කාලය ලබා දීම.
- ★ අලුත් කියවීමකට පෙර දෘෂ්‍ය වාග්මාලාව ගොඩනැගීම.
- ★ ශබ්ද විභේදන හා ශබ්ද මිශ්‍ර අභ්‍යාස භාවිත කිරීම.
- ★ නිවැරදි අත් අකුරු හුරු කිරීම (නිවැරදි ව ලස්සනට ලියූ අත් අකුරු ආදර්ශ ඇසුරෙන්)
- ★ ඇඟිලිවලින් මතුපිට ඇඳීම වැනි බහු ඉන්ද්‍රිය ප්‍රවේශ යොදා ගැනීම.

## ලිවීම ඉගැන්වීම

සිසුන් තමන්ගේ ජීවිතයට අදාළ ලිවීම්වල නිරත වීමට කැමතියි. එබැවින් තමාගේ නම් ලිවීම, චිත්‍රවලට නම් ලිවීම, මිත්‍රයින්ට ලියුම් යැවීම වැනි ක්‍රියාකාරකම් ප්‍රථමයෙන් යොදා ගැනීම වැදගත්ය.

### 1. අරමුණ : අත් අකුරු ලිවීම සඳහා සුදානම් කිරීම

ක්‍රමෝපාය :
- ★ පෑන පැන්සල නිවැරදිව අල්ලන ආකාරය සිසුන්ට ආදර්ශනය කිරීම.
- ★ අකුරු ලිවීමට යෝග්‍ය පරිදි අත චලනය කිරීමේ හැකියාව ලබා දීම.

මේ සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකම් යොදා ගත හැකිය.
- අත වමට, දකුණට කරකැවීම.
- යා කිරීමේ අභ්‍යාස, තිත් ඉරිමත ඇඳීම, බලාගෙන ඇඳීම, සීමාවක් තුළ පාට කිරීම වැනි පෙර ලිවීමේ කුසලතා ලබා දීම.

- ★ චිත්‍ර ඇඳීම මගින් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම.
  උදාහරණ : අම්මා, තාත්තා, පවුලේ අය අඳින්න.

| ☹ | ☺ | |
|---|---|---|
| අඬනවා | සිනාසෙනවා | වැනි අයුරින් අදහස් ප්‍රකාශ කරන මුහුණු ඇඳීම |

- ★ දරුවන්ගේ මේසය මත, කෑම පෙට්ටියේ හා නිර්මාණවල දරුවාගේ නම පැහැදිලි අකුරින් ලියා තැබීම.
- ★ අසනීප නිසා පාසල් නොපැමිණෙන දරුවන්ට ලිපි යැවීම (ගුරුවරයා විසින් ලියන ලද දේ බලාගෙන ලිවීමට ඉඩ දිය හැකියි)
- ★ දිනපතා කළ යුතු වැඩ, රසවත් අත්දැකීම්, අනෙක් සිසුන්ගේ නම් හා දිනය ආදිය පාට හුණුවලින් කළුලෑල්ලේ ලියා පිටපත් කර ගැනීමට අවස්ථාව දීම.

2 . අරමුණ : පැහැදිලි අත් අකුරු ලිවීම

ක්‍රමෝපාය : කාඩ්පතක ලොකුවට ලියන ලද අකුරුවල ආකෘතියක් මත අකුර ලියන ආකාරයට දඹර ඇඟිල්ල ගෙන යාම (ගුරුවරයා සමග)

- ඉහත ආකාරයට සිසුන් පමණක් අකුර මත දඹර ඇඟිල්ල ගෙන යාම
- දෑස් වසාගෙන අකුර මත ඇඟිල්ල ගෙන යාම හා ඒ අනුව අකුර හඳුනා ගත හැකි දැයි පරීක්ෂා කිරීම
- ඇඟිල්ලෙන් අකුර/වචනය මත ලියූ ආකාරයට ම පැන්සලෙන් ලිවීම
- අකුර/වචනය වසා තබා මතකයෙන් ලිවීම
- ලියූ දෙය කාඩ්පත බලා සංසන්දනය කිරීම

අත් අකුරු ලිවීමට නිපුණත්වය ලැබෙන තෙක් මෙම ක්‍රමය අනුගමනය කරන්න.

- නිපුණත්වය ලැබූ විට මෙම අකුරු/වචන යොදා අර්ථවත් දේ ලියවීම (මේ දක්ෂතා සුළු වශයෙන් ලබා ගත් විගස ම ලිවීම සඳහා උනන්දු කරවන්න)

  උදාහරණ : චිත්‍රවලට මාතෘකා ලිවීම, පණිවිඩ ලිවීම, කතාවක කොටසක් ලිවීම, දිනපොත් ලිවීම, සමරුපොත්වල ලිවීම, පණිවිඩ පෙට්ටියට පණිවිඩයක් ලිවීම, අසනීප නිසා පාසල් නොපැමිණි මිතුරන්ට ලිපි ලිවීම වැනි

3 . අරමුණ : අකුරු එක ගොඩේ ලිවීම/වචන හා අකුරු ඈත් නොකර ලිවීම වැළැක්වීම

ක්‍රමෝපාය : ලිවීම සඳහා ලොකු කොටු සහිත පොත් හෝ කොටු සඳහන් කඩදාසි යොදා ගන්න. එක කොටුවක් තුළ එක අකුරක් ලියවන්න. වචනයක් ලියා කොටුවක් අතහැර ඊළඟ වචනය ලියවන්න.

4 . අරමුණ : ලිවීම ආරම්භ කිරීම

ක්‍රමෝපාය : ශිෂ්‍යයාගෙන් ප්‍රශ්නයක් අසන්න. ඔහු පිළිතුර කියයි.

- ගුරුවරයා එම පිළිතුර කඩදාසියක හෝ කළුලෑල්ලේ ලියන්න.
- ලියන ලද පිළිතුර ශිෂ්‍යයාට කියවන්න.
- එම පිළිතුර බලාගෙන ලියවන්න.

5 . අරමුණ : ලිවීම ආරම්භ කිරීම

ක්‍රමෝපය : මුලට එක ම අකුර යෙදෙන වචන කිහිපයක් කියන්න කීම.

- තවත් එවැනි වචන පොත් පත්තරවලින් සොයා ගැනීම.
- ඒවා පිටපත් කිරීම.

  උදාහරණ :

| | |
|---|---|
| අ | අලියා, අට, අක්කා, අරලිය, අඹ |
| ක | කට, කළය, කපුටා, කකුළුවා, කඩියා |
| න | නයා, නරියා, නටනවා, පැන්සල, නගරය |

6. අරමුණ : වචන ඉගෙනීම

ක්‍රමෝපාය : දරුවාට ඉගැන්වීමට අවශ්‍ය වචන ඇතුළත් කර වචන කාඩ්පත් සකසා ගන්න. එම කාඩ්පත් ශිෂ්‍යයාට දී පහත දැක්වෙන අයුරින් ප්‍රශ්න අසන්න.

- මැද ''ත'' අකුර ඇති වචන සොයන්න.
- මැද අකුර ''ල'' වූ වචන සොයන්න.
- මුල අකුර ''ච'' වූ වචන සොයන්න.
- අග අකුර ''න'' වූ වචන සොයන්න.

ආදී වශයෙන් විවිධ අයුරින් එම වචන කියවා බලා හඳුනා ගැනීමට අවස්ථාව දෙන්න.
අනතුරු ව ඉහත ආකාරයට ම ඒවා ලියවන්න.

මැද අකුර ''ත'' වචන ලියන්න.
මුල අකුර ''ච'' වචන ලියන්න.
අග අකුර ''න'' වචන ලියන්න. අදී වශයෙන්

7. අරමුණ : වචන කියවීම හා ලිවීම ඉගැන්වීම

ක්‍රමෝපාය : සිසුන් වැඩි කැමැත්තක් දක්වන
කෑම ජාති
ඇඳුම්
වාහන
යාළුවන්
නෑදෑයන් යනාදියේ නම්වල මුල අකුර අසන්න. අනතුරු ව ඒවා ලියවන්න.
සිසුන් නොදන්නා අකුරු වේ නම් ඒවා ලිවීමට සහාය වන්න. (ගුරුවරයා ලියා දරුවාට පිටපත් කිරීමට දෙන්න.)

8. අරමුණ : පැහැදිලි අත් අකුරු ලිවීමේ මූලික කුසලතා ලබා දීම

ක්‍රමෝපාය : පහත දැක්වෙන රූප රටා පිටපත් කරවන්න.

- ඉරි රටා
- වෘත්ත/අර්ධ වෘත්ත රටා
- මල් රටා
- රටාවක් ඉදිරියට ඇඳීම
- මල් පොකුරට මල් ඇඳීම
- වහළයට උළුඩු ඇඳීම
- උපදෙස් අනුව රූපය වර්ණ කිරීම

9. අරමුණ : ඉස්පිලි/පාපිලි නිවැරදි ව ඉගැන්වීම

ක්‍රමෝපාය : පිල්ලම් වැරදියට ලියන වචන හඳුනාගෙන ඒවා පැහැදිලි අකුරින් කාඩ්පතක හෝ කළුලෑල්ලේ හෝ ලියන්න. පිල්ලම් වර්ණයෙන් ලියන්න. අනතුරුව සිසුන්ට ඒවා පිටපත් කර ගැනීමට සලස්වා කියවන විට කියවන්න. ඉන්පසුව තනිව ම කියවන්න. තව දුරටත් කියවීමට අපහසු නම් බලන්න. කියන්න. වහන්න. ලියන්න. පරීක්ෂා කරන්න. ක්‍රමය භාවිත කරන්න.

- වචනයක් ලියන විට එහි අකුරු ශබ්ද කරමින් ලිවීමට උපදෙස් දෙන්න.
- ගැහැනු පිරිමි මල් පලතුරු ක්‍රීඩාව යොදා ගන්න.
- ගම් කෙටීමේ ක්‍රීඩාව (ගමක මුල අකුර හා අග අකුර ලියා ඉතිරි අකුරු සම්පූර්ණ කිරීම තරගයක් ලෙස යොදා ගැනීම)

  උදාහරණ : ම ...... ....... ....... ම, (මන්නාරම)
  ම ..... ..... ..... ..... ව, (මඩකලපුව)
  නු .... ..... ඩ, (නුගේගොඩ)
- ''කිරි කෑ කොකා'' අකුරු දෙකකින් පමණක් ලියන්න.

  ''අලව්වේ වලව්වල වවුල්ලු'' අකුරු තුනක් පමණක් භාවිත කොට ලියන්න.

  ''ළැලිවලේ ලූලා'' අකුරු දෙකකින් ලියන්න.

  වැනි ක්‍රියාකාරකම්වල සිසුන් සමඟ නිරත වන්න.

## 10. අරමුණ : සම්පූර්ණ නම නිවැරදි ව ලිවීම

ක්‍රමෝපාය : ශිෂ්‍යයන් සම්පූර්ණ නම පැහැදිලි අකුරින් කාඩ්පතක ලියා දෙන්න.
අරලිය කොළයක් ගෙන එහි නටුවෙන් අරලිය කොළයේ ශිෂ්‍යයාගේ සම්පූර්ණ නම ලියවන්න. ඊට පසු එම කොළය උඩට දුවිලි හෝ පිටි හෝ පවුඩර් ටිකක් දමා පිඹ හරින්න. එවිට සම්පූර්ණ නම අරලිය කොළය මත දක්නට ලැබේ. මෙය ශිෂ්‍යයාට අපූරු අත්දැකීමක් වනු ඇත. අරලිය කොළය දිග මදි නම් කොළ දෙකක් යොදා ගත හැකි ය.

- පරණ පත්තර පිටුවක් දී සම්පූර්ණ නමට අයත් වන අකුරු කපාගෙන නම දැක්වෙන සේ කාඩ්පතක අලවා ගැනීමට උපදෙස් දෙන්න.

## 11. අරමුණ : ලිවීමට අකමැති දරුවන් ලිවීමට පොළඹවා ගැනීම

ක්‍රමෝපය : i පියවර - මිනිත්තු කීපයක් අකුරු උඩ අන්දවන්න.
උදාහරණ : තිත් ඉරි මත ඇඳීම, හැඩතලවල අඩුපාඩු සම්පූර්ණ කිරීම. මුහුණු ඇඳීම වැනි

ii පියවර - ලියා ඇති දේවල් බලාගෙන ලිවීමට දෙන්න.

iii පියවර - ලිවීම සඳහා අපේක්ෂිත මාතෘකා සාකච්ඡා කරන්න.

iv පියවර - එම මාතෘකා ඇඳීමට දෙන්න.

v ගුරුවරයා සමඟ සාකච්ඡා කළ දේ ලියන්න. ඒවායින් වාක්‍ය දෙකක් හෝ කීපයක් පිටපත් කරවන්න.

vi දරුවා ලියූ දේවල්වල හරි වැරදි නොබලා ලිවීම ගැන ප්‍රසංශා කරන්න.

12. අරමුණ : ලිවීමට පොළඹවා ගැනීම

ක්‍රමෝපාය : ''අද අපි අමුතු ක්‍රීඩාවක් කරමුයි'' පවසා කඩදාසියක් ගෙන පහත සඳහන් ප්‍රශ්නය ලියන්න.

ඔබේ නම කුමක් ද? ......................................................................

සිසුන් එය ලියූ පසු, තවත් ප්‍රශ්නයක් ලියන්න.

යහලුවාගේ නම කුමක් ද? ....................................................................

මෙයට පිළිතුරු ලියූ පසු මේ ප්‍රශ්නය ලියන්න.

අද ගෙනා කෑම මොනවා ද? .................................................................

මේ ආකාරයට දිගින් දිගට ලිඛිත සාකච්ඡාවල යෙදෙන්න.

# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

## 1. හැඳින්වීම

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් නමින් හැඳින්වෙන මෙම ඉගෙනුම් ක්ෂේත්‍රය මිනිසා සහ මිනිස් ප්‍රජාව කෙරෙහි විවිධ අයුරින් බලපෑම් කළා වූ හෝ කරන්නා වූ හෝ භෞතික, සමාජයීය සහ ජෛව පද්ධති පිළිබඳ ව ඒවා පදනම් කරගෙන සිදු විය යුතු ඉගෙනුම් ක්‍රියාවලියකට යොමු කරන්නකි.

ළදරු වියේ සිට ම ස්වභාවයෙන් ම මිනිසා සිය වටාපිටාව කෙරෙහි කුතුහලයකින් පසු වන අතර ක්‍රමයෙන් එම වටාපිටාව සමග සාර්ථක ව අන්තර් ක්‍රියා කිරීමට අවශ්‍ය නිපුණතා ළඟා කර ගැනීමට උත්සාහ දරයි. මෙම ක්‍රියාවලියේ දී සිය සංවේදී ඉන්ද්‍රියයන් ප්‍රයෝජනයට ගන්නා අතර ම ඒවායේ සංවේදී බවත්, වර්ගීකරණය හා තර්කනය වැනි බුද්ධිමය හැකියාවනුත් වර්ධනය කර ගනියි. එසේ ම ඒ ඔස්සේ සිය වාංමාලාව සහ සන්නිවේදන කුසලතා ද වර්ධනය කර ගනියි. තමා ජීවත් වන වටපිටාව පිළිබඳ ව තොරතුරු සොයා බැලීම රැස් කිරීම හා නැවත ප්‍රකාශ කිරීම දරුවාගේ ජීවන ක්‍රියාවලියේ ම අංගයකි. දරුවාගේ එම නැඹුරුව පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ගොඩනැගීමේ පදනම විය.

එදිනෙදා ජීවිතයේ දී හමු වන අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැකි හා රටේ සංවර්ධන ක්‍රියාවලියට දායක විය හැකි සමබර පෞරුෂයකින් හෙබි පුද්ගලයකුගේ විවිධ නිපුණතා වර්ධනය වීම අවශ්‍ය ය. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් මෙම කාර්යයට බෙහෙවින් දායක වේ. සෞන්දර්ය අධ්‍යාපනය, නිර්මාණාත්මක ක්‍රියාකාරකම්, ශාරීරික අධ්‍යාපනය හා විද්‍යාව වැනි විෂයය ක්ෂේත්‍ර සමෝධානය වීමෙන් මෙම විෂය ගොඩනැගී ඇති අතර, ආගම, මව්බස හා ගණිතය යන ප්‍රධාන විෂයයන් පෝෂණය සඳහා ද පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් යොදා ගත හැකි ය. මෙසේ ප්‍රධාන විෂයයන් හා සමඟ පවත්නා සම්බන්ධතාවය සම්බන්ධීකරණ ලක්ෂණ ලෙස හැඳින්වේ. නව විෂයමාලාවේ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් නම් වූ පුළුල් විෂය ක්ෂේත්‍රය යටතේ එම විවිධ ක්ෂේත්‍රවලට අයත් නිපුණතා අවස්ථානුකූල ව මතු කර ගැනීමට ඉඩ සලසා ඇත. එම නිසා මෙය සමෝධානික විෂයයක් ලෙස හැඳින්විය හැකි ය. ස්වභාව ධර්මයෙන් ශ්‍රී ලංකාවට දායාද කර තිබෙන පාරිසරික සම්පත් උපරිම අයුරින් භාවිත කිරීමට යොමු කිරීම ද මෙම විෂයයෙන් අපේක්ෂා වේ.

හතරවන ශ්‍රේණියේ දී තේමා සඳහා හඳුන්වා දුන් නිපුණතාවලට අදාළ සමහර ක්‍රියාකාරකම් පස්වන ශ්‍රේණියේ අදාළ තේමාවලදී ද ඇතුළත් කර ඇත.

දරුවන්ගේ කතා බහට ගැළපෙන සරල ඉංග්‍රීසි වදන් සහ වැකි මෙම ක්‍රියාකාරකම් මගින් මතු කර ගත යුතු ය. දරුවන් සඳහා ක්‍රියාකාරකම් තෝරා ගැනීමේ දී සිය පරිසර සම්පත්වලට සරිලන සේ ඒවා තෝරා ගැනීමේ නිදහස හා වගකීම ගුරුවරයා සතු ය.

## 2. ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා

පළමුවන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය තෙක් මෙම ඉගෙනුම් ක්‍රියාකාරකම් සාර්ථක ව නිම කිරීම මගින් සිසුන් තුළ පහත දැක්වෙන දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

- ✓ සිය වටාපිටාවේ චමත්කාරය හඳුනාගෙන ඒ තුළින් වින්දනයක් ලබයි.

- ✓ ක්‍රීඩාව, විවේකය, විනෝදය සිය ජීවිතයට අවශ්‍ය අංග ලෙස සලකා ප්‍රමාණවත් පරිදි ඒවා සිය දින චර්යාවට මුසු කර ගනියි.
- ✓ සෞන්දර්යය අගය කරමින් ඒවා සිය ප්‍රකාශන කාර්යන්හි දී භාවිත කරයි.
- ✓ නිරෝගී දිවි පැවැත්මකට අවශ්‍ය මූලික හුරුකම් ප්‍රදර්ශනය කරයි.
- ✓ මිනිසාගේ නිර්මාණ අගය කරයි.
- ✓ සිය වටාපිටාවේ සිටින ජීවීන් පිළිබඳ ව සහ ඔවුන්ගේ අන්තර් ක්‍රියා පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.
- ✓ මිනිස් සමාජය පිළිබඳවත් විවිධ මිනිසුන්ගේ හැසිරීම් හා මිනිසා කෙරෙහි ඒවායේ බලපෑම පිළිබඳවත් අවබෝධ-යෙන් යුතුව කටයුතු කරයි.
- ✓ පෘථිවිය, එහි සම්පත් හා අවකාශය මිනිසා කෙරෙහි බලපාන අයුරු ගවේෂණය කරයි.
- ✓ පාරිසරික සංරක්ෂණ ක්‍රියාවලියේ සිය වගකීම අවබෝධ කරගෙන ඒ අනුව කටයුතු කරයි.
- ✓ සිය වටාපිටාවේ ශක්තිය සහ බලය යෙදීම ප්‍රජාවේ ඉදිරි ගමනට බලපාන අයුරු විමර්ශනාත්මක ව අගය කරයි.
- ✓ අනාගත වැඩ ලෝකයට අවශ්‍ය හුරුව ලබා ගනිමින් තම එදිනෙදා පරිහරණයේ ඇති භාණ්ඩ හා උපකරණ අවශ්‍ය පරිදි හසුරුවයි.

## 3. තෙවන ප්‍රධාන අවධිය සඳහා නිපුණතා

- ✶ අධ්‍යාත්මික යහපැවැත්ම සඳහා වන භාවිත පිළිබඳ සැලකිලිමත් ව එදිනෙදා කටයුතුවල නියැලෙයි.
- ✶ සමාජයේ යහපැවැත්මට තුඩු දෙන යුතුකම්, අයිතිවාසිකම් හා වගකීම් කෙරෙහි සංවේදී ව කටයුතු කරයි.
- ✶ නීතිරීතිවල වැදගත්කම පිළිබඳ සැලකිලිමත් වෙමින් නීති ගරුක ව හැසිරෙයි.
- ✶ සමාජ යහපැවැත්මට අදාළ උපදේශාත්මක කවි, ගී, ගායනාවල හා රංගනවල නියැලෙයි.
- ✶ සමාජ යහපැවැත්මට තුඩු දෙන නිර්මාණවල නියැලෙයි.
- ✶ සතුන්ගේ චර්යාවන්හි විවිධත්වය ගවේෂ-ණය කර සුවිශේෂී හැකියා අගය කරමින් කටයුතු කරයි.
- ✶ සත්ත්ව විවිධත්වයෙහි විචිත්‍ර බව වින්දනාත්මක ව ඉදිරිපත් කරයි.
- ✶ සතුන්ගේ පැවැත්ම සඳහා ඉවහල්වන හැසිරීම් පවත්වා ගනියි.
- ✶ සතුන්ගෙන් අපට ලැබෙන ප්‍රයෝජන පිළිබඳ විමසිලිමත් වෙමින් කටයුතු කරයි.
- ✶ විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් සත්ත්ව ලෝකයේ අසිරිය විදහා දැක්වෙන නව නිර්මාණ කරයි.
- ✶ සත්ත්ව චර්යා අනුකරණය කරමින් ක්‍රීඩාවල වින්දනාත්මක ව නියැලෙයි.
- ✶ ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම පිළිබඳ ව විමසිලිමත් ව කටයුතු කරයි.
- ✶ භූමියේ විවිධත්වය තුළින් මතුවන සුන්දරත්වය රැක ගැනීමට දායක වෙයි.
- ✶ පසෙහි විවිධත්වය විමර්ශනය කරමින් පස සංරක්ෂණයට දායක වෙයි.
- ✶ අහසෙහි අපූර්වත්වය ගවේෂණය කරමින් වින්දනයක් ලබයි.
- ✶ සුළඟේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ව විමර්ශනාත්මක ව කටයුතු කරයි.
- ✶ තම ප්‍රදේශයට ලැබෙන වර්ෂාවේ වෙනස්වීම් පිළිබඳ ව අවබෝධයකින් යුතුව ක්‍රියා කරයි.
- ✶ අවකාශ භාවිත කරමින් ක්‍රීඩාවන්හි නියැලේ.
- ✶ අහසේ හා පොළොවේ අසිරිය විදහා දැක්වෙන කවි, ගී, ගායනා හා රංගනවල නිරත වෙයි.
- ✶ අහසෙහි පොළොවෙහි වෙනස්වීම් මිනිස් ජීවිතවලට බලපාන අන්දම පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.

* භාණ්ඩයක් මිල දී ගැනීමේ දී ප්‍රමිතීන් හා තම ආර්ථික තත්ත්වය පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.
* භාණ්ඩයක් විකිණීමේ දී එහි ප්‍රමිතීන් ගැන සැලකිලිමත් ව ක්‍රියා කරයි.
* සේවාවක් ලබා ගැනීමේ දී සහ සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ ව අවධානයෙන් යුතු ව කටයුතු කරයි.
* එදිනෙදා ජීවිතයේ දී භාණ්ඩ හා සේවා කාර්යක්ෂම ව සහ ඵලදායී ලෙස පරිහරණය කරයි.
* එදිනෙදා නිවසේ වැඩ කටයුතුවල දී අරපිරිමැස්මෙන් යුතුව කටයුතු කරයි.
* ගෙදර දොර අරපිරිමැස්ම සඳහා පරිසරයෙන් සපයා ගත හැකි විවිධ ද්‍රව්‍ය යොදා ගනිමින් සුදුසු භාණ්ඩ නිර්මාණය කරයි.
* වෙළෙඳ පොළ ආශ්‍රිත නැටුම්, ගැයුම් හා චරිතාරෝපිත රංගනයන්හි නියැලෙමින් වින්දනයක් ලබයි.
* අපේ පැවැත්ම සඳහා උපකාරීවන ආහාර පාන සපයා ගැනීමට ගස්වැල්වල ඵලවලින් ලැබෙන ප්‍රයෝජන අගයමින් නිසි පරිදි භාවිත කරයි.
* ගස්වැල්වල ඵලවල විවිධත්වය පිළිබඳ විමසිලිමත් ව අධ්‍යයනය කරමින් ඒවායේ පැවැත්මට දායක වෙයි.
* විශේෂ අවධානයක් යොමු කළ යුතු පැළෑටි හා ගස්වැල් සංරක්ෂණය කිරීමට දායක වෙයි.
* අවට පරිසරයේ පැළෑටි හා ගස්වැල්වල විවිධත්වය අගය කරමින් ඒවා පවත්වා ගැනීමට දායක වෙයි.
* ගස්වැල් හා පැළෑටි සම්බන්ධ ව ඵලදායී නිර්මාණ කරයි.
* ශාක ආරක්ෂා කිරීමේ වැදගත්කම මතු වන ගායන හා රංගනවල නිරත වෙයි.
* ශාකවල විවිධත්වය මතු වන නිර්මාණාත්මක ක්‍රීඩාවන්හි නියැලෙයි.
* ගස්වැල් ඇසුරින් මානසික සුවය ලබා ගනිමින් වින්දනයක් ලබයි.
* අගනා සම්පතක් ලෙස සලකා ජලය අරපිරිමැස්මෙන් භාවිත කරයි.
* නිරෝගී පැවැත්ම සඳහා ප්‍රමාණවත් ලෙස ජලය පරිභෝජනය කරයි.
* ජලය හා බැඳි සාම්ප්‍රදායික සිරිත් විරිත් ගවේෂණශීලී ව පවත්වා ගනියි.
* ජල දූෂණය කෙරෙහි සැලකිලිමත් වෙමින් එය වලක්වා ගැනීමට දායක වෙයි.
* ගලා යන ජලයේ ශක්තිය උපයෝගී කරගෙන ක්‍රියාත්මක වන උපකරණවල ආකෘති ගොඩනගයි.
* ජලය හා සබැඳි ක්‍රීඩා, ගායන, රංගන ඉදිරිපත් කරයි.
* ගෙවතු වගාවට පර්යේෂණාත්මක ව දායක වීම තුළින් වින්දනයක් ලබයි.
* බෝග වගා කිරීමේ විකල්ප ක්‍රම සකස් කරයි.
* විවිධ නිර්මාණ මගින් ගෙවත්තක සුන්දරත්වය මතු කර දක්වයි.
* ගෙවතු වගාවේ නිරත වෙමින් අත්දැකීම් හුවමාරු කරගෙන එහි ඵලදාව නැංවීමට ක්‍රියා කරයි.
* ගෙවත්තක සුන්දරත්වය මතු වන කවි, ගී ගායනා හා රංගනවල නිරත වෙයි.
* ස්වභාවික සංසිද්ධිවල දී හානි විය හැකි අවස්ථා පිළිබඳ ව විමසිලිමත් ව ඒවායින් ආරක්ෂාවීමට කටයුතු කරයි.
* හදිසි අනතුරු විය හැකි අවස්ථාවල දී තමාගේ මෙන් ම අන් අයගේ ආරක්ෂාව පිළිබඳ ව අවධානයෙන් යුතු ව කටයුතු කරයි.
* හදිසි අනතුරුවල දී නිසි ප්‍රථමාධාර ලබා දීමට කටයුතු කරයි.
* ළමයින්ට එරෙහි ව සිදුවන සමාජ විරෝධී ක්‍රියාවලින් ආරක්ෂාවීමට කටයුතු කරයි.
* තමා මෙන් ම අන් අය රෝගවලින් ආරක්ෂාවීම කෙරෙහි සැලකිලිමත් වෙමින් සෞඛ්‍යමත් පරිසරයක් පවත්වා ගැනීමට දායක වෙයි.
* ආරක්ෂාව හා පරිස්සම පිළිබඳ ව දැනුවත් කිරීමට උචිත විවිධ නිර්මාණවල නියැලෙයි.

* ආරක්ෂා සහිත ව පරිස්සමින් යුතුව කටයුතු කරන ආකාර අවධාරණය වන කවි, ගී, ගායනා හා රංගනවල නිරත වෙයි.
* රටේ දියුණුවට මහඟු සේවයක් කළ රජවරු කිහිපදෙනෙක් හඳුනාගෙන ඔවුන්ගේ සේවයේ යහපත් ආදර්ශ ජීවිතයට එක් කර ගනියි.
* ඓතිහාසික වටිනාකමකින් යුතු ස්ථාන කිහිපයක් හඳුනාගෙන අභිමානයෙන් යුතු ව අගයමින් විස්තර කරයි.
* ඓතිහාසික ස්ථාන පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රමවේද ඵලදායී ලෙස භාවිත කරයි.
* අතීත කලා කෘතිවල සුවිශේෂතා ගවේෂණය කර වින්දනයක් ලබයි.
* ඓතිහාසික වටිනාකමකින් යුතු ස්ථාන සංරක්ෂණයට දායක වෙයි.
* දේශාභිමානය නැංවෙන කවි, ගී, ගායන හා රංගනවල නිරත වෙයි.
* සාමූහික කාර්යයක් සැලසුම් කිරීමේ සිට සාර්ථකව නිම කිරීම තෙක් දායක වෙයි.
* වැඩ පහසුකර ගැනීම සඳහා සරල යන්ත්‍ර මූලධර්ම භාවිත කරයි.
* විවිධ ශක්තීන් යොදා ගනිමින් එදිනෙදා වැඩ පහසුකර ගනියි.
* වැඩ පහසුකර ගැනීම සඳහා යොදා ගත හැකි සරල උපකරණ කිහිපයක් සකස් කරයි.
* වැඩ පහසුකර ගැනීමට යොදා ගන්නා කවි, ගී ගායනා හා රංගනවල නිරත වෙයි.
* සාමූහිකත්වය මතුවන නිර්මාණාත්මක ක්‍රීඩාවල නියැලෙයි.
* උපකල්පනයන් ඇතුව සැලසුම් කිරීම්වල යෙදෙයි.
* සියලු ම ජන කොටස්වල අනන්‍යතාවයට ගරු කරමින් සහයෝගයෙන් කටයුතු කරයි.
* රටේ නිදහස වෙනුවෙන් සිදු කළ කැප කිරීම් අගය කරමින් දේශාභිමානයෙන් යුතු ව කටයුතු කරයි.
* ශ්‍රී ලාංකිකයකු ලෙස සිය අනන්‍යතාවය ආරක්ෂාවන අයුරින් කටයුතු කරයි.
* සම්පත් නිසි අයුරින් සුරැකෙන ලෙස කටයුතු කරයි.
* රටේ කීර්තිනාමය නැංවීමට දායකත්වය දැක් වූ චරිත ආදර්ශයට ගෙන ක්‍රියා කරයි.
* දේශීය අනන්‍යතාව විදහා දැක්වෙන ගායන, රංගන, ක්‍රීඩා, නිර්මාණවල සහ නිරත වෙයි.
* තම චර්යාවේ ප්‍රතිජනනාත්මක වෙනසක් සඳහා විමසිලිමත් ව කටයුතු කරයි.
* තමාගේ මෙන් ම සහෝදර සිසුන්ගේ අධ්‍යාපනික ගුණාත්මක බව සහ මනෝ සමාජයීය සත්කාරය සඳහා විමසිලිමත් ව කටයුතු කරයි.
* අන් අයට උදවු කිරීමට ඇති අවස්ථාවන් පිළිබඳ සොයා බලා ඒ සඳහා කටයුතු කරයි.
* පාසලේ පරිසරය සෞන්දර්යාත්මක ව පවත්වා ගෙන යාමට දායක වෙයි.
* කායික හා මානසික සුවතාව සඳහා වන නිර්මාණශීලී ක්‍රීඩාවල නියැලෙයි.
* තොරතුරු ලබා ගැනීම සඳහා විවිධ මාධ්‍ය හා ක්‍රමවේද භාවිත කරයි.
* එදිනෙදා කටයුතු සඳහා විද්‍යුත් උපකරණ කිහිපයක් හසුරුවයි.
* විවිධ මාධ්‍ය ඇසුරින් ලැබෙන තොරතුරු විශ්ලේෂණය කර උචිත තොරතුරු තෝරා ගනියි.
* තොරතුරු ඉදිරිපත් කිරීමේ වඩා ඵලදායී ක්‍රමය යොදා ගනියි.
* විවිධ මාධ්‍ය ඔස්සේ ලබා ගන්නා තොරතුරු භාවිත කරමින් විවේකය ඵලදායී ලෙස ගත කරයි.
* තමාගේ දායකත්වය සහිත ව නිපදවන ආහාර ද්‍රව්‍යයක් ආහාර වේලට එකතු කර ගැනීමට ක්‍රියා කරයි.
* නිරෝගී පැවැත්ම සඳහා සමබල ආහාර වේලක අවශ්‍යතාව වටහාගෙන කටයුතු කරයි.

- ✶ වයසට සුදුසු පරිදි උස හා බර පවත්වා ගනියි.
- ✶ නිවැරදි පිළිවෙත් අනුගමනය කරමින් නිර්මාණශීලී ව ආහාර පිළිගන්වයි.
- ✶ ආහාර නාස්තිය වළක්වා ගැනීම සඳහා සැලකිල්ලෙන් යුතුව කටයුතු කරයි.
- ✶ පෝෂණ ගුණය ආරක්ෂා වන අයුරින් ආහාරයක් පිළියෙල කරයි.
- ✶ කායික හා මානසික සමබරතා සඳහා වන නිර්මාණාත්මක ක්‍රීඩාවන්හි නියැලෙයි.
- ✶ ආහාරවල පෝෂණ ගුණයේ වැදගත්කම මතුවන කවි, ගී ගායන හා රංගනවල නිරත වෙයි.
- ✶ ගමනාගමන විකාශයෙහි අතීතය හා වර්තමානය සසඳමින් අනාගතය පිළිබඳ පුරෝකථනය කරයි.
- ✶ මාර්ගවල ව්‍යාප්තිය අධ්‍යයනය කර ඒ පිළිබඳ ව සැලසුම් සහගත ව කටයුතු කරයි.
- ✶ ගමන් බිමන්වල දී සැලසුම් සහගත ව කටයුතු කරයි.
- ✶ ගමනාගමන අවශ්‍යතා පහසු කර ගැනීම සඳහා යාන්ත්‍රික ශක්තිය උපයෝගී කර ගත හැකි අයුරු පිළිබඳ ව ගවේෂණශීලි ව කටයුතු කරයි.
- ✶ මාර්ග භාවිත කරන්නන් විසින් පිළිපැදිය යුතු නීතිරීති, ආචාරධර්ම, මහ මඟදී ප්‍රවේසම පිළිබඳ සැලකිලිමත් වෙමින් ඒ අනුව ක්‍රියා කරයි.
- ✶ ගමනාගමනය ආශ්‍රිත ගායන, රංගන, නිර්මාණ සහ ක්‍රීඩාවල නිරත වෙයි.
- ✶ අවබෝධයෙන් කටයුතු කරමින් අන් අයට සහානුභූතික වෙයි.
- ✶ මානව ගරුත්වය සුරැකෙන ලෙසින් සහනශීලි ලෙස ක්‍රියා කරයි.
- ✶ සැමවිට ම අන්‍යයන්ට උපකාර කිරීමට ද අවශ්‍ය විටක පමණක් අන්‍යයන්ගෙන් උපකාර ලබා ගැනීමට ද පෙළඹෙයි.
- ✶ වයස අඩු සහ වැඩි අයගේ චර්යා රටා අවබෝධ කරගෙන ඒ අනුව හැසිරෙයි.
- ✶ විකල්ප ජනනය පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.
- ✶ ප්‍රියමනාප ලෙස සමගියෙන් ජීවත් වීමේ අගය අවධාරණය වන කවි, ගී, ගායන හා රංගනවල නිරත වෙයි.
- ✶ යහපත් මිනිස් චර්යා පිළිබිඹු වන නිර්මාණ කරයි.

## 4. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් - විෂය නිර්දේශය

1 අපේ යහපැවැත්ම

### නිපුණතා

- ✶ අධ්‍යාත්මික යහපැවැත්ම සඳහා වන භාවිත පිළිබඳ සැලකිලිමත් ව එදිනෙදා කටයුතුවල නියැලෙයි.
- ✶ සමාජයේ යහපැවැත්මට තුඩු දෙන යුතුකම්, අයිතිවාසිකම් හා වගකීම් කෙරෙහි සංවේදී ව කටයුතු කරයි.
- ✶ නීතිරීතිවල වැදගත්කම පිළිබඳ සැලකිලිමත් වෙමින් නීති ගරුක ව හැසිරෙයි.
- ✶ සමාජ යහපැවැත්මට අදාළ උපදේශාත්මක කවි, ගී, ගායනාවල හා රංගනවල නියැලෙයි.
- ✶ සමාජ යහපැවැත්මට තුඩු දෙන නිර්මාණවල නියැලෙයි.

### අන්තර්ගතය

- ✓ අධ්‍යාත්මික යහපැවැත්ම සඳහා භාවිත ක්‍රමවේද
- ✓ සමාජයේ යහපැවැත්මට තුඩු දෙන යුතුකම් වගකීම් හා අයිතිවාසිකම්
- ✓ නීති රීති පිළිපැදීමේ වැදගත්කම
- ✓ සමාජයේ යහපැවැත්ම සඳහා උදවු වන උපදේශාත්මක කවි, ගී, ගායන හා රංගන
- ✓ සමාජ යහපැවැත්මට තුඩු දෙන අදහස් සහිත විවිධ නිර්මාණ

## 2 අප අවට සතුන්

### නිපුණතා

- ✶ සතුන්ගේ චර්යාවන්හි විවිධත්වය ගවේෂණය කර සුවිශේෂී හැකියා අගය කරමින් කටයුතු කරයි.
- ✶ සත්ත්ව විවිධත්වයෙහි විචිත්‍ර බව වින්දනාත්මක ව ඉදිරිපත් කරයි.
- ✶ සතුන්ගේ පැවැත්ම සඳහා ඉවහල්වන හැසිරීම් පවත්වා ගනියි.
- ✶ සතුන්ගෙන් අපට ලැබෙන ප්‍රයෝජන පිළිබඳ විමසිලිමත් වෙමින් කටයුතු කරයි.
- ✶ විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් සත්ත්ව ලෝකයේ අසිරිය විදහා දැක්වෙන නව නිර්මාණ කරයි.
- ✶ සත්ත්ව චර්යා අනුකරණය කරමින් ක්‍රීඩාවල වින්දනාත්මක ව නියැලෙයි.

### අන්තර්ගතය

- ✓ සතුන්ගේ විවිධ චර්යාවන්හි විවිධත්වය විමසුම හා වින්දනය
- ✓ සත්ත්ව විවිධත්වයෙහි විචිත්‍ර බව
- ✓ සතුන්ගේ පැවැත්ම සඳහා ඉවහල් වන හැසිරීම්
- ✓ සතුන්ගෙන් අපට ලැබෙන ප්‍රයෝජන
- ✓ විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් සත්ත්ව ලෝකයේ අසිරිය විදහා දැක්වෙන නිර්මාණ
- ✓ සත්ත්ව චර්යා අනුකරණය කෙරෙන ක්‍රීඩා
- ✓ සත්ත්ව චර්යා විදහා දැක්වෙන ගායන, රංගන

## 3 පොළොව හා අහස

### නිපුණතා

- ✶ ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම පිළිබඳ ව විමසිලිමත් ව කටයුතු කරයි.
- ✶ භූමියේ විවිධත්වය තුළින් මතුවන සුන්දරත්වය රැක ගැනීමට දායක වෙයි.
- ✶ පසෙහි විවිධත්වය විමර්ශනය කරමින් පස සංරක්ෂණයට දායක වෙයි.
- ✶ අහසෙහි අපූර්වත්වය ගවේෂණය කරමින් වින්දනයක් ලබයි.
- ✶ සුළඟේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ව විමර්ශනාත්මක ව කටයුතු කරයි.
- ✶ තම ප්‍රදේශයට ලැබෙන වර්ෂාවේ වෙනස්වීම් පිළිබඳ ව අවබෝධයකින් යුතුව ක්‍රියා කරයි.
- ✶ අවකාශ භාවිත කරමින් ක්‍රීඩාවන්හි නියැලේ.
- ✶ අහසේ හා පොළොවේ අසිරිය විදහා දැක්වෙන කවි, ගී, ගායන හා රංගනවල නිරත වෙයි.
- ✶ අහසෙහි පොළොවෙහි වෙනස්වීම් මිනිස් ජීවිතවලට බලපාන අන්දම පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.

### අන්තර්ගතය

- ✓ ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම
- ✓ භූමියේ මතුපිට විවිධත්වය තුළින් මතු වන සුන්දරත්වය
- ✓ පසෙහි ස්වභාවය
- ✓ පස සංරක්ෂණයට දායකත්වය
- ✓ රාත්‍රී අහසෙහි දක්නට ලැබෙන දෑ
- ✓ කාලගුණ අනාවැකි හා සුළං හමන දිශාව මෙන් ම වැස්ස මැනිය හැකි උපකරණ
- ✓ වැස්සේ අඩු වැඩි බව
- ✓ සුළං බලයෙන් ක්‍රියාකරවිය හැකි දේ
- ✓ අවකාශ භාවිතයෙන් කළ හැකි ක්‍රීඩා
- ✓ අහසේ හා පොළොවේ අසිරිය විදහා දැක්වෙන කවි, ගී ගායන, රංගන හා නිර්මාණ
- ✓ අහසේ පොළොවේ වෙනස්කම්වලට අනුව ජීවන රටාවල ඇති වෙනස

## 4 අප හා වෙළෙඳ පොළ

### නිපුණතා

- ✶ භාණ්ඩයක් මිල දී ගැනීමේ දී ප්‍රමිතීන් හා තම ආර්ථික තත්ත්වය පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.

- ✶ භාණ්ඩයක් විකිණීමේ දී එහි ප්‍රමිතීන් ගැන සැලකිලිමත් ව ක්‍රියා කරයි.
- ✶ සේවාවක් ලබා ගැනීමේ දී සහ සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ ව අවධානයෙන් යුතුව කටයුතු කරයි.
- ✶ එදිනෙදා ජීවිතයේ දී භාණ්ඩ හා සේවා කාර්යක්ෂම ව සහ ඵලදායී ලෙස පරිහරණය කරයි.
- ✶ එදිනෙදා නිවසේ වැඩ කටයුතුවල දී අරපිරිමැස්මෙන් යුතුව කටයුතු කරයි.
- ✶ ගෙදර දොර අරපිරිමැස්ම සඳහා පරිසරයෙන් සපයා ගත හැකි විවිධ ද්‍රව්‍ය යොදා ගනිමින් සුදුසු භාණ්ඩ නිර්මාණය කරයි.
- ✶ වෙළෙඳ පොළ ආශ්‍රිත නැටුම්, ගැයුම් හා චරිතාරෝපිත රංගනයන්හි නියැලෙමින් වින්දනයක් ලබයි.

### අන්තර්ගතය

- ✓ භාණ්ඩ මිල දී ගන්නාගේ විමසිලිමත් බව
- ✓ භාණ්ඩ විකිණීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු
- ✓ සේවා ලබා ගැනීමේ දී මෙන් ම සේවා සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු
- ✓ භාණ්ඩ හා සේවා කාර්යක්ෂම සහ ඵලදායී ලෙස පරිහරණය
- ✓ නිවසේ කටයුතුවල දී අරපිරිමැස්මෙන් යුතුව පවත්වාගෙන යාමට තම දායකත්වය
- ✓ පරිහරණයට සුදුසු භාණ්ඩ නිර්මාණය
- ✓ ගනුදෙනු කරන ආකාරය හා සේවා සපයන හා ලබා ගන්නා ආකාරය දැක්වෙන ගායන රංගන

## 5 පැළෑටි හා ගස්වැල්

### නිපුණතා

- ✶ අපේ පැවැත්ම සඳහා උපකාරීවන ආහාර පාන සපයා ගැනීමට ගස්වැල්වල ඵලවලින් ලැබෙන ප්‍රයෝජන අගයමින් නිසි පරිදි භාවිත කරයි.
- ✶ ගස්වැල්වල ඵලවල විවිධත්වය පිළිබඳ විමසිලිමත් ව අධ්‍යයනය කරමින් ඒවායේ පැවැත්මට දායක වෙයි.
- ✶ විශේෂ අවධානයක් යොමු කළ යුතු පැළෑටි හා ගස්වැල් සංරක්ෂණය කිරීමට දායක වෙයි.
- ✶ අවට පරිසරයේ පැළෑටි හා ගස්වැල්වල විවිධත්වය අගය කරමින් ඒවා පවත්වා ගැනීමට දායක වෙයි.
- ✶ ගස්වැල් හා පැළෑටි සම්බන්ධ ව ඵලදායී නිර්මාණ කරයි.
- ✶ ශාක ආරක්ෂා කිරීමේ වැදගත්කම මතු වන ගායන හා රංගනවල නිරත වෙයි.
- ✶ ශාකවල විවිධත්වය මතු වන නිර්මාණාත්මක ක්‍රීඩාවන්හි නියැලෙයි.
- ✶ ගස්වැල් ඇසුරින් මානසික සුවය ලබා ගනිමින් වින්දනයක් ලබයි.

### අන්තර්ගතය

- ✓ මිනිසාගේ පැවැත්ම සඳහා ගස්වැල්වලින් ලැබෙන ගෙඩි, බීජ, අල, කරල්, පත්‍ර වැනි දේවලින් ලැබෙන ප්‍රයෝජන
- ✓ ඵලවල විවිධත්වය සහ ඒවායේ පැවැත්ම
- ✓ විශේෂ අවධානයකින් යුතුව රැක බලා ගත යුතු ගස්වැල් හා පැළෑටි
- ✓ අවට පරිසරයේ ගස්වැල් හා පැළෑටිවල විවිධත්වය හා පැවැත්ම
- ✓ ශාක පිළිබඳ ව හා ශාක කොටස් ඇසුරින් විවිධ නිර්මාණ
- ✓ ශාක රැක ගැනීමේ දී වැදගත්කම මතු වන ගායන හා රංගන
- ✓ ශාකවල විවිධත්වය මතු වන නිර්මාණාත්මක ක්‍රීඩා

## 6 ජලය

### නිපුණතා

- ✶ අගනා සම්පතක් ලෙස සලකා ජලය අරපිරිමැස්මෙන් භාවිත කරයි.
- ✶ නිරෝගී පැවැත්ම සඳහා ප්‍රමාණවත් ලෙස ජලය පරිභෝජනය කරයි.

- ✶ ජලය හා බැඳි සාම්ප්‍රදායික සිරිත් විරිත් ගවේෂණශීලී ව පවත්වා ගනියි.
- ✶ ජල දූෂණය කෙරෙහි සැලකිලිමත් වෙමින් එය වළක්වා ගැනීමට දායක වෙයි.
- ✶ ගලායන ජලයේ ශක්තිය උපයෝගී කරගෙන ක්‍රියාත්මක වන උපකරණවල ආකෘති ගොඩනගයි.
- ✶ ජලය හා සබැඳි ක්‍රීඩා, ගායන, රංගන ඉදිරිපත් කරයි.

## අන්තර්ගතය

- ✓ ජලය අත්‍යවශ්‍ය සම්පතක් ලෙස
- ✓ දෛනිකව පානීය ජල අවශ්‍යතාව
- ✓ ජලය අරපිරිමැස්මෙන් යුතුව භාවිත
- ✓ අපතේ යන ජලයෙන් ගත හැකි ප්‍රයෝජන
- ✓ ජලය හා බැඳි සම්ප්‍රදායික සිරිත් විරිත් ගවේෂණය හා පවත්වා ගැනීම
- ✓ ජලයේ අන්තර්ගත ශක්තිය උපයෝගී කර ක්‍රියාත්මක කළ හැකි විවිධ නිර්මාණ
- ✓ ජල දූෂණය හා වලක්වා ගැනීම
- ✓ ජලය හා සබැඳි ක්‍රීඩා
- ✓ ජලය හා සම්බන්ධ ගායන හා රංගන

## 7 ගෙවත්ත

### නිපුණතා

- ✶ ගෙවතු වගාවට පර්යේෂණාත්මක ව දායක වීම තුළින් වින්දනයක් ලබයි.
- ✶ බෝග වගා කිරීමේ විකල්ප ක්‍රම සකස් කරයි.
- ✶ විවිධ නිර්මාණ මගින් ගෙවත්තක සුන්දරත්වය මතු කර දක්වයි.
- ✶ ගෙවතු වගාවේ නිරත වෙමින් අත්දැකීම් හුවමාරු කරගෙන එහි ඵලදාව නැංවීමට ක්‍රියා කරයි.
- ✶ ගෙවත්තක සුන්දරත්වය මතු වන කවි, ගී ගායනා හා රංගනවල නිරත වෙයි.

### අන්තර්ගතය

- ✓ විවිධ අත්හදා බැලීම් තුළින් ගෙවතු වගාව සඳහා දායකත්වය
- ✓ බෝග වගා කිරීමේ විකල්ප ක්‍රම
- ✓ ගෙවත්තක තිබිය යුතු ලක්ෂණ
- ✓ කොම්පෝස්ට් පොහොර සැකසීම හා භාවිතය
- ✓ වගාවට හිතකර හා අහිතකර සතුන්
- ✓ ගෙවත්තක සුන්දරත්වයේ වින්දනය

## 8 ආරක්ෂාව හා පරිස්සම

### නිපුණතා

- ✶ ස්වභාවික සංසිද්ධිවල දී හානි විය හැකි අවස්ථා පිළිබඳ ව විමසිලිමත් ව ඒවායින් ආරක්ෂාවීමට කටයුතු කරයි.
- ✶ හදිසි අනතුරු විය හැකි අවස්ථාවල දී තමාගේ මෙන් ම අන් අයගේ ආරක්ෂාව පිළිබඳ ව අවධානයෙන් යුතුව කටයුතු කරයි.
- ✶ හදිසි අනතුරුවල දී නිසි ප්‍රථමාධාර ලබා දීමට කටයුතු කරයි.
- ✶ ළමයින්ට එරෙහි ව සිදුවන සමාජ විරෝධී ක්‍රියාවලින් ආරක්ෂාවීමට කටයුතු කරයි.
- ✶ තමා මෙන් ම අන් අය රෝගවලින් ආරක්ෂාවීම කෙරෙහි සැලකිලිමත් වෙමින් සෞඛ්‍යමත් පරිසරයක් පවත්වා ගැනීමට දායක වෙයි.
- ✶ ආරක්ෂාව හා පරිස්සම පිළිබඳ ව දැනුවත් කිරීමට උචිත විවිධ නිර්මාණවල නියැලෙයි.
- ✶ ආරක්ෂා සහිත ව පරිස්සමින් යුතුව කටයුතු කරන ආකාර අවධාරණය වන කවි, ගී, ගායනා හා රංගනවල නිරත වෙයි.

### අන්තර්ගතය

- ✓ වැසි, සුළං, නායයාම්, සුනාමි, අකුණු කුණාටු, නියඟ, ගංවතුරවලින් විය හැකි හානි
- ✓ හදිසි අනතුරු වැළකීමට ගත හැකි උපක්‍රම

- ✓ හදිසි අනතුරු වළක්වා ගැනීම හා අනතුරු අවස්ථාවල දී ප්‍රථමාධාර
- ✓ තමාගේ මෙන් ම අන් අයගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් බව
- ✓ ළමයින්ට එරෙහිව සිදුවන සමාජ විරෝධී ක්‍රියා සහ ඉන් ආරක්ෂාවීමට ගත හැකි පියවර
- ✓ රෝගවලින් තමා මෙන් ම අන් අය ආරක්ෂා කිරීමට කළ හැකි දේ
- ✓ ස්වභාවික සංසිද්ධි, හදිසි අනතුරු, රෝගවලින් ආරක්ෂාවීම් පිළිබඳ විවිධ නිර්මාණ
- ✓ ස්වභාවික සංසිද්ධි, හදිසි අනතුරු, සමාජ විරෝධී ක්‍රියාවලින් ආරක්ෂාවීම මතු වන කවි, ගී ගායන හා රංගන

## 9 අපේ අතීත විත්ති

### නිපුණතා

- ✶ රටේ දියුණුවට මහඟු සේවයක් කළ රජවරු කිහිපදෙනෙක් හඳුනාගෙන ඔවුන්ගේ සේවයේ යහපත් ආදර්ශ ජීවිතයට එක් කර ගනියි.
- ✶ ඓතිහාසික වටිනාකමකින් යුතු ස්ථාන කිහිපයක් හඳුනාගෙන අභිමානයෙන් යුතුව අගයමින් විස්තර කරයි.
- ✶ ඓතිහාසික ස්ථාන පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රමවේද ඵලදායී ලෙස භාවිත කරයි.
- ✶ අතීත කලා කෘතිවල සුවිශේෂතා ගවේෂණය කර වින්දනයක් ලබයි.
- ✶ ඓතිහාසික වටිනාකමකින් යුතු ස්ථාන සංරක්ෂණයට දායක වෙයි.
- ✶ දේශාභිමානය නැංවෙන කවි, ගී, ගායන හා රංගනවල නිරත වෙයි.

### අන්තර්ගතය

- ✓ රටේ දියුණුව උදෙසා ක්‍රියා කළ රජවරු කිහිපදෙනකු ඉටු කළ සේවය
- ✓ ඓතිහාසික වටිනාකමකින් යුත් කලා කෘති පිළිබඳ ප්‍රදේශයේ තොරතුරු
- ✓ ඓතිහාසික තොරතුරු රැස් කිරීමේ හා වාර්තා කිරීමේ විවිධ ක්‍රම
- ✓ දේශාභිමානයේ කවි, ගී, ජන ක්‍රීඩා ගායන හා රංගන

## 10 වැඩ පහසු කිරීමේ මං

### නිපුණතා

- ✶ සාමූහික කාර්යයක් සැලසුම් කිරීමේ සිට සාර්ථකව නිම කිරීම තෙක් දායක වෙයි.
- ✶ වැඩ පහසුකර ගැනීම සඳහා සරල යන්ත්‍ර මූලධර්ම භාවිත කරයි.
- ✶ විවිධ ශක්තීන් යොදා ගනිමින් එදිනෙදා වැඩ පහසුකර ගනියි.
- ✶ වැඩ පහසුකර ගැනීම සඳහා යොදා ගත හැකි සරල උපකරණ කිහිපයක් සකස් කරයි.
- ✶ වැඩ පහසුකර ගැනීමට යොදා ගන්නා කවි, ගී ගායනා හා රංගනවල නිරත වෙයි.
- ✶ සාමූහිකත්වය මතුවන නිර්මාණාත්මක ක්‍රීඩාවල නියැලෙයි.
- ✶ උපකල්පනයන් ඇතුව සැලසුම් කිරීම්වල යෙදෙයි.

### අන්තර්ගතය

- ✓ සාමූහික ව ඉටු කළ හැකි කාර්යයක සාර්ථකත්වය
- ✓ ඇදීමේ, තල්ලු කිරීමේ, එසවීමේ, කරකැවීමේ උපයෝගීතාව
- ✓ උපකරණ, ආවුද, ඇටවුම්වල භාවිතය
- ✓ අතීතයේ සිට අද දක්වා වැඩ පහසුකර ගැනීම සඳහා වන වෙනස්වීම් හා ප්‍රතිඵල
- ✓ විද්‍යුත් චුම්භකත්වය, සුළං බලය, ජල විදුලි බලය මගින් වැඩ පහසුකර ගැනීම
- ✓ වැඩ පහසුකර ගැනීම සඳහා සරල උපකරණ නිර්මාණ (නිවස හා අවට)
- ✓ වැඩ පහසුකර ගැනීම සඳහා අතීතයේ සිට යොදා ගන්නා ලද කවි, ගී, ගායන හා රංගන
- ✓ සාමූහිකත්වය මතු වන නිර්මාණාත්මක ක්‍රීඩා

## 1 1 අපි ලක්වැසියෝ

### නිපුණතා

- ✶ සියලු ම ජන කොටස්වල අනන්‍යතාවයට ගරු කරමින් සහයෝගයෙන් කටයුතු කරයි.
- ✶ රටේ නිදහස වෙනුවෙන් සිදු කළ කැප කිරීම් අගය කරමින් දේශාභිමානයෙන් යුතු ව කටයුතු කරයි.
- ✶ ශ්‍රී ලාංකිකයකු ලෙස සිය අනන්‍යතාවය ආරක්ෂාවන අයුරින් කටයුතු කරයි.
- ✶ සම්පත් නිසි අයුරින් සුරැකෙන ලෙස කටයුතු කරයි.
- ✶ රටේ කීර්තිනාමය නැංවීමට දායකත්වය දැක් වූ චරිත ආදර්ශයට ගෙන ක්‍රියා කරයි.
- ✶ දේශීය අනන්‍යතාව විදහා දැක්වෙන ගායන, රංගන, ක්‍රීඩා, නිර්මාණවල නිරත වෙයි.

### අන්තර්ගතය

- ✓ ශ්‍රී ලංකාවේ විවිධ ජන කොටස්වල අනන්‍යතාව
- ✓ ශ්‍රී ලාංකික අනන්‍යතාව
- ✓ ජන කොටස් අතර සහයෝගී බව
- ✓ නිදහස වෙනුවෙන් කටයුතු කළ විවිධ ජන නායකයින්
- ✓ රටේ කීර්ති නාමය නැංවීමට දායක වූ චරිත
- ✓ සම්පත් සුරැකීමේ ආකල්ප වර්ධනය
- ✓ දේශීයත්වය විදහා දක්වන ගායන, රංගන, ක්‍රීඩා සහ නිර්මාණ

## 1 2 අපට කළ හැකි වෙනස්කම්

### නිපුණතා

- ✶ තම චර්යාවේ ප්‍රතිජනනාත්මක වෙනසක් සඳහා විමසිලිමත් ව කටයුතු කරයි.
- ✶ තමාගේ මෙන් ම සහෝදර සිසුන්ගේ අධ්‍යාපනික ගුණාත්මක බව සඳහා සහ මනෝ සමාජයීය සත්කාරය සඳහා විමසිලිමත් ව කටයුතු කරයි.
- ✶ අන් අයට උදවු කිරීමට ඇති අවස්ථාවන් පිළිබඳ සොයා බලා ඒ සඳහා කටයුතු කරයි.
- ✶ පාසලේ පරිසරය සෞන්දර්යාත්මක ව පවත්වා ගෙන යාමට දායක වෙයි.
- ✶ කායික හා මානසික සුවතාව සඳහා වන නිර්මාණශීලී ක්‍රීඩාවල නියැලෙයි.

### අන්තර්ගතය

- ✓ දෛනිකව පවත්වාගෙන යන වැරදි චර්යා නිවැරදි කර ගැනීමට කළ හැකි දෑ
- ✓ තමාගේ මෙන් ම අන් අයගේ අධ්‍යාපනික සංවර්ධනයට සහ මනෝ සමාජය පැවැත්මට කළ හැකි උදවු
- ✓ පාසලින් බාහිර අන් අයට උදවු කිරීමට ඇති අවස්ථා හා කළ හැකි උදවු
- ✓ පාසලේ සුන්දරත්වය පවත්වා ගැනීමට කළ හැකි දේ
- ✓ ප්‍රතිජනනාත්මක වෙනස්කම් සම්බන්ධව කවි, ගී, ගායන, රංගන හා නිර්මාණ
- ✓ ශාරීරික හා මානසික සුවතා සඳහා වන නිර්මාණාත්මක ක්‍රීඩා

## 1 3 මිනිසා හා තොරතුරු

### නිපුණතා

- ✶ තොරතුරු ලබා ගැනීම සඳහා විවිධ මාධ්‍ය හා ක්‍රමවේද භාවිත කරයි.
- ✶ එදිනෙදා කටයුතු සඳහා විද්‍යුත් උපකරණ කිහිපයක් හසුරුවයි.
- ✶ විවිධ මාධ්‍ය ඇසුරින් ලැබෙන තොරතුරු විශ්ලේෂණය කර උචිත තොරතුරු තෝරා ගනියි.
- ✶ තොරතුරු ඉදිරිපත් කිරීමේ වඩා ඵලදායී ක්‍රමය යොදා ගනියි.
- ✶ විවිධ මාධ්‍ය ඔස්සේ ලබා ගන්නා තොරතුරු භාවිත කරමින් විවේකය ඵලදායී ලෙස ගත කරයි.

## අන්තර්ගතය

- ✓ තොරතුරු ලබා ගැනීමේ මාධ්‍යයක් ලෙස විද්‍යුත් මාධ්‍ය, මුද්‍රිත මාධ්‍ය, සංඥා හා සංකේත
- ✓ තොරතුරු ලබා ගැනීම සඳහා සමීක්ෂණ, නිරීක්ෂණ හා ගවේෂණ ක්‍රම භාවිතය
- ✓ පුස්තකාල පරිහරණය
- ✓ විද්‍යුත් මාධ්‍ය උපකරණ කිහිපයක ක්‍රියාත්මක ස්වභාවය හා හැසිරවීම්
- ✓ උචිත තොරතුරු තෝරා ගැනීමේ අවශ්‍යතා හා විශ්ලේෂණ
- ✓ වඩා සුදුසු මාධ්‍ය ඇසුරින් තොරතුරු ලබා දීමේ හා ඉදිරිපත් කිරීමේ උචිත ක්‍රම
- ✓ ගායන වාදන ඇතුළත් නිර්මාණ නාටක

## 1 4 අපේ ආහාර

### නිපුණතා

- ✶ තමාගේ දායකත්වය සහිත ව නිපදවන ආහාර ද්‍රව්‍යයක් ආහාර වේලට එකතු කර ගැනීමට ක්‍රියා කරයි.
- ✶ නිරෝගී පැවැත්ම සඳහා සමබර ආහාර වේලක අවශ්‍යතාව වටගාගෙන කටයුතු කරයි.
- ✶ වයසට සුදුසු පරිදි උස හා බර පවත්වා ගනියි.
- ✶ නිවැරදි පිළිවෙත් අනුගමනය කරමින් නිර්මාණශීලී ව ආහාර පිළිගන්වයි.
- ✶ ආහාර නාස්තිය වළක්වා ගැනීම සඳහා සැලකිල්ලෙන් යුතුව කටයුතු කරයි.
- ✶ පෝෂණ ගුණය ආරක්ෂා වන අයුරින් ආහාරයක් පිළියෙල කරයි.
- ✶ කායික හා මානසික සමබරතා සඳහා වන නිර්මාණාත්මක ක්‍රීඩාවන්හි නියැලෙයි.
- ✶ ආහාරවල පෝෂණ ගුණයේ වැදගත්කම මතුවන කවි, ගී ගායන හා රංගනවල නිරත වෙයි.

### අන්තර්ගතය

- ✓ බෝග සිටුවීමට තම දායකත්වය
- ✓ කායික නිරෝගීතාව පවත්වා ගැනීමේ ක්‍රියා
- ✓ සෞඛ්‍යයට අහිත කර ආහාර
- ✓ ආහාර පිළිගැන්වීමේ නිවැරදි පිළිවෙත්
- ✓ ආහාර පිළිගැන්වීමේ නිර්මාණශීලී බව
- ✓ ආහාර නාස්තිය හා වළක්වා ගැනීමේ ක්‍රම
- ✓ පෝෂණ ගුණය රැකෙන අයුරින් ආහාර සකස් කිරීම
- ✓ කායික හා මානසික සමබරතා රැකෙන ක්‍රීඩා
- ✓ පෝෂණ ගුණය මතු වන කවි, ගී ගායන හා රංගන

## 1 5 ගමනාගමනය

### නිපුණතා

- ✶ ගමනාගමන විකාශයෙහි අතීතය හා වර්තමානය සසඳමින් අනාගතය පිළිබඳ පුරෝකථනය කරයි.
- ✶ මාර්ගවල ව්‍යාප්තිය අධ්‍යයනය කර ඒ පිළිබඳ ව සැලසුම් සහගතව කටයුතු කරයි.
- ✶ ගමන් බිමන්වල දී සැලසුම් සහගත ව කටයුතු කරයි.
- ✶ ගමනාගමන අවශ්‍යතා පහසු කර ගැනීම සඳහා යාන්ත්‍රික ශක්තිය උපයෝගී කර ගත හැකි අයුරු පිළිබඳ ව ගවේෂණශීලි ව කටයුතු කරයි.
- ✶ මාර්ග භාවිත කරන්නන් විසින් පිළිපැදිය යුතු නීතිරීති, ආචාරධර්ම, මහ මගදී ප්‍රවේසම පිළිබඳ සැලකිලිමත් වෙමින් ඒ අනුව ක්‍රියා කරයි.
- ✶ ගමනාගමනය ආශ්‍රිත ගායන, රංගන, නිර්මාණ සහ ක්‍රීඩාවල නිරත වෙයි.

### අන්තර්ගතය

- ✓ ගමනාගමන විකාශය
- ✓ මහාමාර්ග, දුම්රිය මාර්ග හා ගුවන් මාර්ගවල ව්‍යාප්තිය (සිතියම් ඇසුරින්)
- ✓ ප්‍රධාන මාර්ග හා විකල්ප මාර්ග
- ✓ ගමනාගමන ආශ්‍රිත තොරතුරු

- ✓ සැලසුම්ගත ගමන් බිමන් සහ එහි වැදගත්කම
- ✓ බයිසිකලයේ ක්‍රියාකාරිත්වය
- ✓ ගමනාගමනය සඳහා යාන්ත්‍රික ශක්තිය යොදා ගැනෙන අවස්ථා
- ✓ ගමනාගමනයට අදාළ නීති රීති හා ආචාරධර්ම
- ✓ ගමනාගමනය ආශ්‍රිත ගායන, රංගන හා ක්‍රීඩා
- ✓ ගමනාගමනයට සම්බන්ධ ආකෘති, පෝස්ටර්, නිර්මාණ

1 6 මිනිස් හැසිරීම්

නිපුණතා

- ✶ අවබෝධයෙන් කටයුතු කරමින් අන් අයට සහානුභූතික වෙයි.
- ✶ මානව ගරුත්වය සුරැකෙන ලෙසින් සහනශීලී ලෙස ක්‍රියා කරයි.
- ✶ උපකාර කිරීමට ද උපකාර ලබා ගැනීමට ද පෙළඹෙයි.
- ✶ වයස අඩු සහ වැඩි අයගේ චර්යා රටා අවබෝධ කරගෙන ඒ අනුව හැසිරෙයි.
- ✶ විකල්ප ජනනය පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.
- ✶ ප්‍රියමනාප ලෙස සමගියෙන් ජීවත් වීමේ අගය අවධාරණය වන කවි, ගී, ගායන හා රංගනවල නිරත වෙයි.
- ✶ යහපත් මිනිස් චර්යා පිළිබිඹු වන නිර්මාණ කරයි.

අන්තර්ගතය

- ✓ පවුලේ අය කෙරෙහි සහානුභූතික වීම
- ✓ දෛනික කටයුතුවල දී සහානුභූතික ව කටයුතු කිරීමේ වැදගත්කම
- ✓ මානව ගරුත්වය සුරැකෙන පරිද්දෙන් සහනශීලී ව ක්‍රියා කිරීමේ අගය
- ✓ විකල්ප ජනනය පිළිබඳ අත්දැකීම්
- ✓ ප්‍රියමනාප ලෙස සමගියෙන් ජීවත් වීමේ අගය අවධාරණය කෙරෙන කවි, ගී, ගායන හා රංගන
- ✓ යහපත් මිනිස් චර්යා පිළිබිඹු වන නිර්මාණ

## 5. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් යනු ඉගැන්වීමට වඩා ඉගෙනුමට මුල් තැනක් දෙන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් සහිත විෂයයකි. කණ්ඩායම් හා තනි තනි ව ද වරෙක මුළු පන්තියම ද ඉගෙනුම් කාර්යවල යෙදවිය හැකි ය.

ගුරුවරයා මේ සඳහා කල් ඇති ව සැලසුම් කර ගත යුතුය. එකම මොහොතක විවිධ කණ්ඩායම් එකිනෙකට වෙනස් වැඩවලට යොමු කළ හැකිය. දැනට විවිධ ක්‍රමවලින් හැකියා ප්‍රදර්ශනය කිරීමෙන් එකම කාලසීමාවන් තුළ පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය කර ගැනීමට ද හැකි ය.

සිසුන් සඳහා සැලසුම් කරන වැඩ අතර ක්ෂේත්‍ර චාරිකා කෙටි ව්‍යාපෘති තුළින් අනුමාන කිරීමේ නිරීක්ෂණය, ගවේෂණය, අත්හදා බැලීම්, රැස් කිරීම්, ප්‍රශ්න කිරීම්, ප්‍රශ්නාවලි භාවිතය, පුද්ගල සම්බන්ධතා ඇති කිරීම, පොත්පත් වැනි මුද්‍රිත භාවිතය ගුවන්විදුලිය, රූපවාහිනිය අන්තර්ජාලය වැනි විද්‍යුත් මාධ්‍ය භාවිතය සහ තොරතුරු වාර්තා කිරීම සඳහා රංගනය නිර්මාණාත්මක ක්‍රීඩා වාචික හා ලිඛිත ප්‍රකාශන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයන් වැදගත් වේ.

## 6. පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

නිර්මාණාත්මක, සෞන්දර්යාත්මක හා ශාරීරික අධ්‍යාපන නිපුණතා හා සම්බන්ධ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පුළුල් පරාසයක ඉගෙනුම්-ඉගැන්වීම් අත්දැකීම් සපුරාලීමේ

අවශ්‍යතාවය නව විෂය නිර්දේශයෙහි දක්නට ලැබෙන පැහැදිලි වෙනසකි. එවැනි වෙනසක් සඳහා පන්ති කාමරය පමණක් නොව සම්පූර්ණ පාසල් පරිසරය ද, සිසුන් ඒ දෙස බලන දෘෂ්ටි කෝණය ද වෙනස් විය යුතු ය.

එබැවින් පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය විය යුත්තේ දවස පුරා අසුන්ගත ව සිටීම වෙනුවට විවිධ තැන්වල විවිධ ඉරියව්වෙන් හා සතුටෙන් නොයෙකුත් ක්‍රියාකාරකම්වල නිරත වන දරුවන් පිරිසක් දැකිය හැකි වන පරිදි ය.

මේ සඳහා සැලසුම් කරනු ලබන පන්තියක තිබිය යුතු ලක්ෂණ මෙසේ ය.

- ✓ පාසල් කාලය තුළ දී සිසුනට ප්‍රධාන වශයෙන් ක්‍රියාකාරකම්වල නිරත වීමට උචිත අයුරින් ඉගෙනුම් පරිසරය සකස් කිරීම.
- ✓ එළිමහන් ඉගෙනුම් අවස්ථා සඳහා පහසුකම් සැපයීම.
- ✓ පාසලේ ක්‍රීඩා, සෞන්දර්යාත්මක කටයුතු හා වෙනස් විෂය සමගාමී කටයුතු කෙරෙහි ද අවධානය යොමු කිරීම.

## 7. සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය හා සම්බන්ධ තක්සේරු කිරීමේ දී එම ඉගෙනුම් ක්‍රියාවලිය තුළින් සිසුනට ලබා දීමට බලාපොරොත්තු වන දැනුම, කුසලතා ආකල්ප හා සාරධර්ම පිළිබඳ සැලකිල්ලට ගත යුතුය. එසේ ම සමාජීය දක්ෂතා කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

ඒ ඒ සිසු කණ්ඩායම් හෝ තනි තනි සිසුන් තුළ හෝ ඇති ඌනතා, ඉදිරි ඉගෙනුම් කටයුතුවල දී මග හරවා ගනිමින් ඉක්මනින් ඉගෙනුම් හැකියා පෙන්නුම් කරන සිසුන් සඳහා තව දුරටත් පෙළඹීමක් ඇති වන අරමුණෙන් මෙම තක්සේරු කිරීම් කළ යුතු ය.

මෙහි දී බොහෝ විට විධිමත් ඇගයීම් ක්‍රමවලට පරිබාහිර ක්‍රම අනුගමනය කිරීමට සිදුවේ. සිසුන් වැඩෙහි යෙදී සිටින අවස්ථාවල ඔවුන් නිරීක්ෂණයෙන්, සවන් දීමෙන් සහ ඔවුන් සමග සාකච්ඡා කිරීම වැනි ක්‍රියාවලීන් මගින් මෙම අවස්ථා මතු කර ගත හැකි වනු ඇත. ඒවා ක්‍රමවත් ව වාර්තා කර ගැනීමට ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඇතුළත් තක්සේරු වාර්තා සටහන් භාවිත කළ හැකි ය.

# 1 අපේ යහපැවැත්ම

සිය අයිතිවාසිකම් පිළිබඳ ව පමණක් වෙහෙසෙන, සිය යුතුකම් හා වගකීම් පැහැර හරින පුද්ගලයන්ගෙන් පිරුණු සමාජයක යහපැවැත්ම අවදානම් සහගත ය. සමාජ යහපැවැත්ම සහතික වන්නේ සිය අයිතිවාසිකම් යුතුකම් හා වගකීම් පිළිබඳ ව සමබරතාවයකින් ක්‍රියාකරන සමාජ සම්මත නීති රීතිවලට ගරුකරමින් කටයුතු කරන පුද්ගලයන් බහුතරයක් සිටින්නේ නම් පමණි. එවන් පුද්ගලයන් බහුතරයකින් යුත් සමාජයක පදනම සඳහා අනාගත පුරවැසියන් සංවර්ධනය කිරීමේ අපේක්ෂාවෙන් යුතු ව මෙම තේමාව සකස් කර ඇත.

## නිපුණතා


- ✶ අධ්‍යාත්මික යහපැවැත්ම සඳහා වන භාවිත පිළිබඳ සැලකිලිමත් ව එදිනෙදා කටයුතුවල නියැලෙයි.
- ✶ සමාජයේ යහපැවැත්මට තුඩු දෙන යුතුකම්, අයිතිවාසිකම් හා වගකීම් කෙරෙහි සංවේදී ව කටයුතු කරයි.
- ✶ නීතිරීතිවල වැදගත්කම පිළිබඳ සැලකිලිමත් වෙමින් නීති ගරුක ව හැසිරෙයි.
- ✶ සමාජ යහපැවැත්මට අදාළ උපදේශාත්මක කවි, ගී, ගායනාවල හා රංගනවල නියැලෙයි.
- ✶ සමාජ යහපැවැත්මට තුඩු දෙන නිර්මාණවල නියැලෙයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

හතරවන ශ්‍රේණියේ මෙම තේමාව යටතේ අධ්‍යාත්මික යහපැවැත්ම සඳහා පුරුදු පුහුණු වූ සූර්ය නමස්කාරය ක්‍රියාකාරකම් වඩාත් සුමට ලෙස ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව සලසන්න. යම් හෙයකින් සුමට ලෙස සූර්ය නමස්කාරය ක්‍රියාකාරකම්වල යෙදීමට අසීරු සිසුන් වෙතොත්, වඩාත් සුමට ලෙස මෙම ක්‍රියාකාරකම් කළ හැකි සිසුන්ගේ ආදර්ශනයක් සහිත ව ඒවායේ යෙදීමට සිසුන් යොමු කරන්න.

සූර්ය නමස්කාර ක්‍රියාකාරකම් දිනපතා පුරුද්දක් ලෙස කරගෙන යන සිසුන් අගය කරන්න. තවමත් එසේ නොකරන සිසුන් විමසා ඔවුන්ට ද දෛනික යහපුරුද්දක් ලෙස මෙම ක්‍රියාකාරකම්වල යෙදීමට පොළඹවන්න.



තේමාව අවසන් වූ පසුව ද සෑම සතියකම විෂය සමගාමී ක්‍රියාකාරකම් මිනිත්තු 30ක කාලය ආරම්භ කිරීමේ දී සූර්ය නමස්කාරය ක්‍රියාත්මක කරන්න. සති අන්තයේ හා නිවාඩු කාලවල පාසල් නොපැවැත්වෙන දිනවල අධ්‍යාත්මික හා ශාරීරික යෝග්‍යතාව සඳහා සූර්ය නමස්කාර ක්‍රියාකාරකම්වල යෙදීමේ වැදගත්කම අවධාරණය කරන්න.

අවසානයේ සිසුන් සමග සූර්ය නමස්කාරය යහපත් ජීවිත පුරුද්දක් වීමේ වැදගත්කම අවධාරණය කෙරෙන කතා බහක නිරතවන්න. මෙහි දී සිසුන්ගේ අදහස් ද එකතු කර ගනිමින් මතු දැක්වෙන කරුණු අවධාරණය කරන්න.

- ★ සූර්ය නමස්කාරය පුරුදු පුහුණු වී යහපත් ජීවිත පුරුද්දක් බවට පත් කර ගැනීමේ අගය
- ★ එමගින් අධ්‍යාත්මික හා ශාරීරික යෝග්‍යතා ඇතිවීම ජීවිතයට බොහෝ වැදගත් වන බව
- ★ එවැනි තත්ත්වයක් ඇති කර ගැනීමෙන් සන්සුන් සිතක් හා නිරෝගී ගතක් ඇතිවීමේ වැදගත්කම

දැනටමත් සූර්ය නමස්කාරය පුරුදු පුහුණු වී දිනපතා කරගෙන යන සිසුන් නැවතත් අගය කරමින් පන්තියේ සියලු දෙනා ඒ සඳහා යොමු කරන්න.

## ක්‍රියාකාරකම 2

සිසුන්ගෙන් නිවසට පාසලට ඉටු විය යුතු යුතුකම් හා වගකීම් පිළිබඳ ව අවධාරණය කෙරෙන භූමිකා රංගන කිහිපයක් කලින් සැලසුම් කරන්න.

### භූමිකා රංගන 1

නිවසට ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් අවධාරණය වන පරිදි

උදාහරණ :

මවගේ පියාගේ කටයුතුවලට උදවු වීම.
ගෙදර දොර පිළිවෙළකට තබා ගැනීමට සහාය වීම.
ගේ අවට පරිසරයේ මදුරුවන් බෝවිය නොහැකි ලෙස පවත්වා ගැනීමට දායක වීම.
නිවසේ සිටින වියපත් අයට උපස්ථාන කිරීමට සහාය වීම.
නිවසේ අය රෝගී වූ විට උපස්ථාන කිරීමට උදවු වීම වැනි අවස්ථා

### භූමිකා රංගන 2

පන්තියට/පාසලට ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් අවධාරණය වන පරිදි

උදාහරණ :

- පන්තිය පිරිසිදු ව ක්‍රමානුකූල ව තබා ගැනීමට දායක වීම.

- පන්තියේ සිසු සිසුවියන් සමඟ සුහද ව කටයුතු කිරීම.
- පාසලේ සම්පත් ආරක්ෂා කිරීම.
- පාසලේ විශේෂ අවස්ථාවල දී උපරිම දායකත්වය දැක්වීම වැනි අවස්ථා

## භූමිකා රංගන 3

සිසුවකු ලෙස තමාගෙන් රටට ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් අවධාරණය වන පරිදි කටයුතු කිරීම.

උදාහරණ :

- ★ නොමිලේ ලැබෙන පෙළ පොත ඊළඟ වසරට තවත් සිසුවකුට භාවිත කිරීමට හැකි වන ලෙස ප්‍රවේශම් කිරීම.
- ★ නොමිලේ ලැබෙන නිල ඇඳුම තමා ම සෝදා පිරිසිදු කරගෙන පියකරු ලෙස සැරසී පාසල් යාම.
- ★ තමා යන එන තැන්වල දී පොදු දේපල ආරක්ෂා කිරීම.
- ★ ජාතික කොඩිය සහ ජාතික ගීය කෙරෙහි වැරදි පැවතුම්වලින් වැළකී ගෞරවාන්විත පැවැත්ම.

මෙම භූමිකා රංගන සඳහා පෙර සඳහන් දෑ අවධාරණය වන ලෙස රංගනයට හැකියාවක් ඇති සිසුන් තෝරා ගන්න.

භූමිකා රංගන ඉදිරිපත් කිරීමට පෙර අවශ්‍ය මග පෙන්වීම් කරමින් ඒවා සංවර්ධනය කරන්න.

සිසුවකු ලෙස සිය යුතුකම් හා වගකීම් පිළිබඳ හැඟීමක් නරඹන සිසුන්ට ඇති වන ලෙස උක්ත භූමිකා රංගන ඉදිරිපත් කිරීම සඳහා තෝරා ගන්නා සිසුන්ට සහාය වන්න.

භූමිකා රංගන ඉදිරිපත් වූ පසු සිසුන් සමඟ ඒවා පදනම් කරගත් සාකච්ඡාවක නියැලෙන්න. සිසුවකු ලෙස සිය යුතුකම් හා වගකීම් අවබෝධ කර ගැනීමට සිසුන්ට පහසු වන පරිදි සාකච්ඡාව මෙහෙයවන්න.

## ක්‍රියාකාරකම 3

හතරවන ශ්‍රේණියේ දී ද සිසුන් අත්විඳින ලද සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකම් යුතුකම් අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳ යොමුවක් ඇති ව මෙම පන්තියේ දී හඳුන්වා දෙන්න.

පන්තියේ ස්වභාවය අනුව එක්වර ම හඳුන්වාදීම අසීරු බව හැඟේ නම් දිනෙන් දින පියවර එකක් බැගින් වැඩි කරමින් සිත් පහන් කිරීම සම්පූර්ණ කරන්න.

තේමාව ක්‍රියාත්මක කරන සෑම දිනක දීම ආරම්භක ක්‍රියාකාරකම ලෙස සිත් පහන් කිරීම යොදා ගන්න.

නිවසේ දී ද පුරුදු පුහුණු වීමට යොමු කරන්න.

අධ්‍යාත්මික යෝග්‍යතාවය සඳහා දිනපතා ජීවිතයට හුරු කරගත යුතු ක්‍රියාකාරකමක් ලෙස සිත් පහන් කිරීමට යොමු කරන්න.

පියවර 1

### ශාරීරික ලිහිල්බව

පහසු ලෙස වාඩිවෙන්න. ඇස් හෙමින් හෙමින් වැසී යන්නට සලස්වන්න. අත් පා තද නොකර සැහැල්ලුවෙන් තබා ගන්න. පාදවල ඇඟිලි, වළලු කර, දණ හිස, උකුල, බඩ, පපුව, උරහිස, අත්, වැලමිටි, අත්වල ඇඟිලි සැහැල්ලු කරන්න. බෙල්ල, හිස ප්‍රදේශය සැහැල්ලු කරන්න. හුස්ම ඉහළට ගන්න. පහළට හෙලන්න. (කිහිප වරක්) හුස්ම ඉහළ ගන්න පහළට හෙලන්න.

පියවර 2

### මානසික ලිහිල් බව

සිසුන් අමතා මෙසේ කියන්න.

අවශ්‍ය අවස්ථාවලදී ඔබේ ඇඟ දැන් ලිහිල් වෙලා. දැන් සිත ද ලිහිල් කරන්න. වටපිටාවට කන් දෙන්න. ඈතින් ඇසෙන ශබ්දවලට සවන් දෙන්න. කුරුළු ගී ... ඔබට ඇසෙනවා ඇති. සවන් දෙන්න. ළඟින් ඇසෙන ශබ්දවලට සවන් දෙන්න. ඔබේ හදවත ගැහෙන හඬ ඔබට ඇසෙනවා ද? එයට සවන් දෙන්න. දැන් ඔබේ සිත සන්සුන් වෙලා. දැන් සිත සැහැල්ලුයි. දැන් ඔබේ සිත සන්සුන්. සැහැල්ලුයි.

පියවර 3

## අධිෂ්ඨානය

සිසුන් අමතා ලයාන්විත ලෙස මෙසේ කියන්න.
ඒ අනුව සිතන්නට අවකාශ දෙමින් මෙසේ සිතන්නට යෝජනා කරන්න.
මගේ සිත සන්සුන් කරන්නට මට හැකිවෙලා. සන්සුන් සිතට වැදගත් අදහස් ඇති කර ගන්නටත් මට පුළුවන්.
නිවසට මගෙන් ඉටුවිය යුතු යුතුකම් මම ඉටු කරනවාමයි. මට පැවරෙන පුංචි වගකීම් මම ඉටු කරනවාමයි. පන්තියට පාසලට මගෙන් ඉටු විය යුතු යුතුකම් මම ඉටු කරනවාමයි. අවුරුදු දහයක් වයස වන දරුවකු හැටියට මගෙන් පන්තියට පාසලට වියයුතු වගකීම් ඉටු කරනවාමයි. නිවසේදීත්, පන්තියේදීත්, පාසලේදීත් වගකීමක් ඇති ව හැසිරෙන්නට උනන්දු වෙනවාමයි. අනාගතයේ මගේ රටට වැඩ ඇති කෙනෙක් වෙනවාමයි.

පියවර 4

## ප්‍රාර්ථනාව

සිසුන් අමතා කියන්න.
මෙසේ සිතන්නට ඉඩ දෙන්න. යුතුකම් ඉටු කරන්නට මගේ හිතේ ඇති වුණ උනන්දුව මගේ යහළුවන්ගේ සිත්වලත් ඇතිවේවා!
පුංචි පුංචි වගකීම් දැරීමට මගේ හිතේ ඇති වූ උනන්දුව මගේ යහළුවන්ටත් දැනේවා!
මගේ පවුලේ හැමගේ ම සිත් ඒවගේ ම වේවා!
යුතුකම් ඉටු කරන, වගකීමෙන් වැඩ කරන අය මට ගෙදර දී හමුවේවා!. පාසලේදීත් හමුවේවා!
අනාගතයේ දී මා යන එන හැම තැනක ම හමුවේවා!

පියවර 5

## උදානය

සිසුන් අමතා කියන්න.
මෙසේ සිතන්නට ඉඩදෙන්න.
මම පුංචි මගෙන් ඉටුවිය යුතු යුතුකම්
නිවසටත්, පන්තියටත්, පාසලටත් ඉටු කරන දරුවෙක්මි.
මම නිවසේදීත්, පාසලේදීත් වගකීමෙන් වැඩ කරන දරුවෙක්මි.
නිවසටත්, පාසලටත් මම පහනක් මෙන් එළිය වෙන්නම්.
අනාගතයේ මගේ රටටත් මම පහනක් වෙන්නෙමි.

## ක්‍රියාකාරකම 4


පියවර 1

එක් කණ්ඩායමකට සිසුන් හයදෙනකු පමණ සිටින සේ පන්තිය කණ්ඩායම්වලට වෙන් කරන්න. බෝලයක් හෝ එවැනි එකිනෙකා වෙත යැවිය හැකි යමක් හෝ සෑම කණ්ඩායමකට ම ලබා දෙන්න. කණ්ඩායමේ සිසුන් රවුමට සිටින අතර එක් සිසුවෙක් මැද සිටියි. මැද සිටින සිසුවා ''මා කැමතියි'' යනුවෙන් තමන් කැමති දෑ කණ්ඩායමේ සියල්ලන්ට ඇසෙන සේ කියා රවුම වටේ සිටින සිසුවකුට බෝලය යවයි. එම සිසුවා ද තමා කැමති දෑ කියා බෝලය මැද සිටින සිසුවාට යවයි. එවිට මැද සිසුවා ''ඔබ කැමතියි ...'' කියා තමා වෙත බෝලය එවූ සිසුවා කී දෑ නැවත කියා තහවුරු කරයි.
මෙසේ ''මා කැමතියි'' වටයට පසු ''මා අකමැතියි'' යනුවෙන් තවත් වටයක දී ඉහත අන්දමට ක්‍රියාකාරකමේ යෙදීමට අවස්ථාව සලසන්න.

පියවර 2

මෙම ක්‍රියාකාරකමට පෙර සිසුන් විසින් තනි තනි ව පහත සඳහන් දෑ පිළියෙල කර ගත යුතු බව දන්වන්න.

★ එස වූ විට කාටත් පෙනෙන ප්‍රමාණයට ඝන කඩදාසි කැබලි තුනක ඇඳගත් පහත ආකාරයේ මුහුණු දැක්වෙන රූප




පියවර 1 ක්‍රියාකාරකමේ දී තම කණ්ඩායමේ සිසුන් ප්‍රකාශ කළ මා කැමතියි හා මා අකමැතියි යනුවෙන් පෙළ ගැස් වූ සටහනක්

උදාහරණ :

| මා කැමතියි | මා අකමැතියි |
|---|---|
| ක්‍රීඩා කරන්නට | මට විහිළු නම් කියනවාට |
| මට හිතෙන දේ කියන්නට | මට සැරෙන් කතා |
| ලෙඩ නොවී ඉන්නට | කරනවාට |
| හොඳින් ඉගෙන ගන්නට | වැරදි වැඩ කරන්නට |
| රසවත් පලතුරු කන්නට | මට තරවටු කරනවාට |

පියවර 1හි මෙන් කණ්ඩායම් වශයෙන් රැස් වී තමාගේ ''මා කැමතියි'' සටහනේ සඳහන් කැමති දෑ එකිනෙක කියවීමට උපදෙස් දෙන්න. කණ්ඩායමේ එක් සිසුවකු එය කියවන අතර අනෙක් අය එය අසා එයට

තමා ද කැමති නම් සතුටු මුහුණ ද
අකමැති නම් දුක්මුසු මුහුණ ද
විශේෂ කැමැත්තක් හෝ අකමැත්තක්
හෝ නැත්නම් මැදහත් මුහුණ ද ඔසවා
පෙන්වීමට මග පෙන්වන්න.

මුල් අවස්ථාවල ගැටලුසහගත බවක් දක්වන සිසුන්ට සහායවන්න.

කුඩා කණ්ඩායම්වල සියලු ම සිසුන් පෙළ ගැස්වූ ''මා කැමතියි'' ලැයිස්තු සඳහා ද අදාළ මුහුණ සෙවීමට අවස්ථාව සලසන්න.

පියවර 3

කණ්ඩායමේ බහුතරයක් ''සතුටු මුහුණු'' පෙන් වූ දෑ ''අප කැමතියි'' යනුවෙන් කාඩ්පතක ලියන්නට උපදෙස් දෙන්න. කණ්ඩායමේ බහුතරයක් ''දුක්මුසු මුහුණු පෙන්වූ'' දෑ ''අප අකමැතියි'' යනුවෙන් කාඩ්පතක ලියන්නට ද යොමු කරන්න.

එක් එක් කණ්ඩායමේ ''අප කැමතියි'' කාඩ්පත් අනෙක් කණ්ඩායම්වලට පිළිවෙළක් අනුව හුවමාරු කර ගැනීමට අවස්ථා සලසන්න. කණ්ඩායමකට අලුත් කාඩ්පතක් ලැබුණු විට කණ්ඩායමේ නායකයා ඒවා එකිනෙක කියවීමට ද, අනෙක් අය ''සතුටු මුහුණු'' ''මැදහත් මුහුණු'' හා ''දුක්මුසු මුහුණු'' පෙන්වීමට ද මග පෙන්වන්න. එම කණ්ඩායමේ බහුතර මතය, කාඩ්පතේ සඳහන් දේ සමඟ එකඟ නම් එසේ ම තිබෙන්නට හරින්න, එකඟ නොවේ නම් එම කරුණට අදාළ ව ප්‍රශ්නාර්ථයක් යොදන්න.

මෙසේ සෑම කණ්ඩායමක් විසින් ම ''අප කැමතියි'' කාඩ්පත් පිළිබඳ මත විමසුම් අවසන් වූ පසු ''අප අකමැතියි'' කාඩ්පත් ද මත විමසුම් සඳහා කණ්ඩායම්වලට යොමු කරන්න.

පියවර 4

කණ්ඩායම් සියල්ල සමඟ සාකච්ඡාවක යෙදෙන්න. සෑම කණ්ඩායමකට ම ''අප කැමතියි'' කාඩ්පත් ගැන අවධානය යොමු කරන්න. ඒවායේ ප්‍රශ්නාර්ථ ලකුණු නැති දෑ පන්තියේ අප සැම කැමති දෑ බව අවධාරණය කරන්න.

අප කැමැතියි කිවූ දේ ලබා ගැනීමට පන්තියේ සෑම සිසුවකුට ම හැකි විය යුතු බව අවධාරණය කරන්න. ඒවා පන්තියේ සිසුන්ගේ අයිතිවාසිකම්වලට ඇතුළත් වන බව අවධාරණය කරන්න. සෑම සිසුවකුට ම ඒ සඳහා සමාන අයිතියක් ඇති බව පෙන්වා දෙන්න. ඒ හැම දෙයක් ම සිසුවකුට ලැබිය යුත්තේ සිසුවාගේ ''වැඩිම යහපත'' සඳහා බව ද පෙන්වා දෙන්න. අප කොතරම් කැමති දෙයක් වුවත් තමන්ට ද, අනුන්ට ද යහපතක් නොවේ නම් ඒ සඳහා අපට අයිතියක් නැති බව ද පෙන්වා දෙන්න.

පියවර 5

කණ්ඩායම් සියල්ල සමඟ ''අප අකමැතියි'' කාඩ්පත් මුල් කර ගත් සාකච්ඡාවක නිරත වන්න. අනෙක් කණ්ඩායම් විසින් ප්‍රශ්නාර්ථ ලකුණු දමා නැති ''අප අකමැති'' දෑ කිසිවෙක් කරන්නේ නම් කුමක් වේ දැයි ප්‍රශ්න කරන්න. එවිට අපේ අයිතිවාසිකම් කඩවන බව අවධාරණය කරන්න.

අනෙක් කණ්ඩායම් විසින් දක්වන ඔවුන් අකමැති දෑ නොකර සිටීම අපේ යුතුකම බව අවධාරණය කරන්න.

අනෙක් කණ්ඩායම විසින් දක්වා ඇති ඔවුන් කැමති දෑවලින් කළ හැකි දෑ කිරීම ද අපේ යුතුකම බව පෙන්වා දෙන්න.

පියවර 6

කලින් පියවරේ දී මෙන් ම කණ්ඩායම් වශයෙන් එකිනෙකාගේ අදහස් තෝරාගෙන ''අපි අකමැතියි'' යනුවෙන් කාඩ්පතක ලිවීමට යොමු කරන්න. එක් එක් අදහස් තෝරා ගැනීමේ දී ''අපට හානි කර අපේ අනාගතයටත් හානි කර'' ඒවා තෝරා ගැනීමට යොමු කරන්න.

එක් එක් කණ්ඩායමේ ''අපි කැමතියි'' කාඩ්පත සෑම කණ්ඩායමකට ම කියවීමට ඉඩ සලස්වන්න.

සිසුන් විසින් කාඩ්පත්වල පෙළ ගැස් වූ සිසුන්ගේ පැවැත්මට හානි කර, ගරුත්වයට ද හානි කර දෑ අපට හානිකර, අපේ අනාගතයට ද හානිකර දේවල් ලෙස හඳුන්වා දෙන්න.

ඒවායින් ආරක්ෂා වීමට ද, යහළුවන් ආරක්ෂා කර ගැනීමට ද සෑම සිසුවකුට ම වගකීමක් ඇති බව අවධාරණය කරන්න.

ඒ සඳහා

- හානිකර දෑ සිදුවන්නට හැකි තැන්වලින් ඉවත් වීමට
- සිසුන්ට හානිකර දෑ සිදු කිරීමට මාන බලන පුද්ගලයන්ගෙන් ඈත්වීමට
- හානිකර දෑ සිදු වන්නට යන්නේ නම් ආරක්ෂාව සඳහා උදවු ඉල්ලීමට
- යහළුවන්ගෙන්, සමීප අයගෙන් වුව ද කෙරෙන හානි කර යෝජනා ප්‍රතික්ෂේප කිරීමට

ධෛර්ය සම්පන්න විය යුතු බව පෙන්වා දෙන්න.

තමා අකමැති තමාට හානියක් විය හැකි බව හැඟෙන සෑම දෙයක් ම ගුරුවරයාට කීමේ වැදගත්කම අවධාරණය කරන්න.

ගුරුවරයා වශයෙන් ඔබ සෑම විට ම සිසුන් ආරක්ෂා කිරීමට සූදානම් බව පවසන්න.

## ක්‍රියාකාරකම 5

සිසුන් සියලු දෙනාට ම සහභාගි විය හැකි, කණ්ඩායම් කිහිපයක් ලෙස යෙදිය හැකි, ඕනෑ ම එළිමහන් ක්‍රීඩාවක් තෝරා ගන්න.

තෝරා ගන්නා ක්‍රීඩාවේ නීති රීති පිළිබඳ ව ක්‍රීඩාව ආරම්භයට පෙර හොඳින් පැහැදිලි කරන්න. දැනුවත් වූ නීති රීති හොඳින් පිළිපැදීමත් නීතිගරුක ව ක්‍රීඩා කිරීමේ වැදගත්කමත් අවධාරණය කරන්න.

සිසුන් ක්‍රීඩාවේ යෙදෙන ආකාරය හොඳින් නිරීක්ෂණය කරන්න. නීතිරීති කඩවන අවස්ථා සටහන් කර ගන්න.

එළිමහන් ක්‍රීඩාවෙන් පසු ක්‍රීඩාවේ නියැලීම පිළිබඳ අත්දැකීම් ද පදනම් කරගෙන සාකච්ඡාවක යෙදෙන්න. නීතිරීති කඩ වූ අවස්ථා පිළිබඳ ඔබේ නිරීක්ෂණ ද යොදා ගෙන නීතිරීති පිළිපදින ලද අවස්ථා අගය කරන්න. නීතිරීති පිළිපැදීමේ වැදගත්කම අවධාරණය වන ලෙස සාකච්ඡාව මෙහෙයවන්න.

එම පදනම මත නීතිරීති පිළිපැදීම අපේ පන්තියට, අපේ පාසලට හා අපේ රටට කොතරම් වැදගත් වන්නේ දැයි සිතා බලන්නට යොමු කරන්න.

සමාජයේ යහපැවැත්ම සඳහා නීති රජය විසින් පනවා ඇති බව ද රීති සමාජය විසින් දිගු කලක් පවත්වා ගෙන පැමිණ ඇති බව ද පැහැදිලි කරන්න.

## ක්‍රියාකාරකම 6

සමාජය විසින් දිගුකලක් පවත්වා ගන්නා රීති තව දුරටත් පවත්වා ගැනීමට

- අප විසින් කළ යුතු දෑ සිරිත් ලෙස ද
- අප විසින් නොකළ යුතු දෑ විරිත් ලෙස ද

හඳුන්වා දෙන්න.

සමාජයේ යහපැවැත්මට තුඩු දෙන සිරිත් හා විරිත් පිළිබඳ කරුණු දැක්වීම සඳහා කලින් දැනුවත් කර ඇති සම්පත් පුද්ගලයකුට පන්තියට ආරාධනා කරන්න.

උදාහරණ : සමාජ යහපැවැත්මට තුඩු දෙන සිරිත් විරිත් පිළිබඳ පරිචයක් ඇති ආගමික පූජ්‍ය පූජකවරු හෝ විශ්‍රාමික පරිනත පුද්ගලයන් හෝ දැනුවත් වැඩිහිටියන්

එවැනි පුද්ගලයකු හා සමඟ අතීතයේ සිට පැවති අනාගතයේ දී ද ආරක්ෂා කර ගත යුතු සිරිත් විරිත් ගැන කතා බහ කිරීමට සිසුන් දිරිගන්වන්න.

මෙම කතා බහ අතරතුර එවැනි සිරිත් විරිත් පිළිබඳ ලෑල්ලේ පෙළ ගස්වන්න.

ඒවා ඇසුරෙන් සිරිත් හා විරිත් පිළිබඳ අවධාරණය වන පෝස්ටර් නිර්මාණය කිරීමට කණ්ඩායම් වශයෙන් යොමු කරන්න.

නිර්මාණය කරනු ලබන පෝස්ටර් ප්‍රදර්ශනය කරමින් දෙමාපිය හමුවක දී අගය කරන්න.

## ක්‍රියාකාරකම 7

ක්‍රියාකාරකමට පෙර සමාජයේ යහපැවැත්ම සඳහා උදවු වන කවි, ගී සම්භාව්‍ය සහ නූතන සාහිත්‍යයෙන් තෝරා ගන්න. උපදේශාත්මක කවි, ගී ආදියේ හඬ පට, හඬ තැටි, වාදනය කිරීමට හැකිනම් ඒ සඳහා උනන්දු වන්න. නැතිනම් ඒවා මිහිරි හඬින් තාලයට ගයන්න.

උදාහරණ : සුභාෂිතය, සිරිත්මල් දම ආදී සම්භාව්‍ය ග්‍රන්ථවල කවි
උපදේශාත්මක ළමා ගී

එවැනි කවි ගීවලට සවන් දීමට සිසුන් යොමු කරන්න. එවැනි කවි ගී ගායනා කිරීමට ද සිසුන් යොමු කරන්න.

ඇසු සහ ගැයූ කවියක් ගීයක් අවසානයේ දී සමාජය යහපැවත්ම සඳහා අප විසින් පිළිපැදිය යුතු සිරිත් විරිත්, නීතිරීති හා අගය කළ යුතු මානව වටිනාකම් පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරමින් අවධාරණය කරන්න.

සමාජයේ යහපැවැත්ම සඳහා උදවු වන කෙටි රංගන සැලසුම් කිරීමට සිසුන්ට මග පෙන්වන්න. එම රංගන කිහිපයක් තේමාව ක්‍රියාත්මක වන කාලයේ දී ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

# 2 අප අවට සතුන්

පරිසරයේ කොටසක් වන සතුන් පරිසරයේ ඇති අභියෝග ජය ගනිමින් සාර්ථක ව තම ජීවිතය පවත්වාගෙන යන ආකාරය අධ්‍යයනය කිරීම සිසුන්ට රසවත් අත්දැකීමක් වනු ඇත. සතුන් මේ සඳහා අනුගමනය කරන විවිධ චර්යා රටා නිරීක්ෂණය සහ තව දුරටත් ගවේෂණයට ඉඩ ප්‍රස්තා ලබා දීම මෙම ඒකකය තුළින් ලබා දී ඇත. ඒ තුළින් සත්ත්ව ලෝකයේ විවිධත්වය පරිසරයේ යහපැවැත්මට දායක වන අතර ඒවා මිනිසාට ප්‍රයෝජනවත් පරිදි හසුරුවා ගැනීමට අද මිනිසා සමත් වී ඇත. මේ පිළිබඳ මූලික ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීමට හැකි වන සේ මෙම තේමාව ගවේෂණාත්මක ස්වරූපයකින් ක්‍රියාත්මක කිරීම වැදගත් වේ.

## නිපුණතා

- ✶ සතුන්ගේ චර්යාවන්හි විවිධත්වය ගවේෂණය කර සුවිශේෂී හැකියා අගය කරමින් කටයුතු කරයි.
- ✶ සත්ත්ව විවිධත්වයෙහි විචිත්‍ර බව වින්දනාත්මක ව ඉදිරිපත් කරයි.
- ✶ සතුන්ගේ පැවැත්ම සඳහා ඉවහල්වන හැසිරීම් පවත්වා ගනියි.
- ✶ සතුන්ගෙන් අපට ලැබෙන ප්‍රයෝජන පිළිබඳ විමසිලිමත් වෙමින් කටයුතු කරයි.
- ✶ විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් සත්ත්ව ලෝකයේ අසිරිය විදහා දැක්වෙන නිර්මාණ කරයි.
- ✶ සත්ත්ව චර්යා අනුකරණය කරමින් ක්‍රීඩාවල වින්දනාත්මක ව නියැලෙයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

තමන් කැමති එක් සතකු පිළිබඳ ව පහත සඳහන් තොරතුරු සපයා ගෙන එන ලෙස පාඩමට දින කිහිපයකට පෙර සිසුන්ට දැනුම් දෙන්න.

සතා ජීවත් වන පරිසරය
බහුල ව දක්නට ලැබෙන රටවල්/ප්‍රදේශ
ශරීරයේ ප්‍රමාණය දළ වශයෙන් හෝ නැතිනම් විශාල, මධ්‍යම හෝ කුඩා යනුවෙන්
ශරීර වර්ණය
ආහාරට ගන්නා දේ
එහා මෙහා ගමන් කරන ආකාරය
සතාගෙන් මිනිසාට ඇති ප්‍රයෝජන/හානි
සතුන්ගෙන් ආරක්ෂා වන ආකාරය/
වර්ගයා බෝවෙන ආකාරය

සතාගේ නම සහ හැකි නම් එම සතාගේ රූපයක් ද තම තමන් ළඟ තබා ගත යුතු බව සිසුන්ට දන්වන්න.

පන්තිය කුඩා කණ්ඩායම්වලට බෙදන්න.

එක් එක් කණ්ඩායමේ සාමාජිකයින් තමා තොරතුරු රැගෙන ආ සතාගේ නම සඟවාගෙන තොරතුරු පමණක් කණ්ඩායමට ඉදිරිපත් කරන්න.

එම තොරතුරු ඇසුරෙන් කණ්ඩායමේ අන් අයට

සතා කවරෙකු දැයි අනුමාන කිරීමට අවස්ථාව දෙන්න.

එක් එක් කණ්ඩායම තුළ හඳුනා ගැනීමට වඩාත් ම අපහසු වූ සතාගේ නමින් තම කණ්ඩායම නම් කර ගන්න. එහෙත් එය අනෙක් කණ්ඩායම්වලින් සඟවා තබා ගන්න.

## ක්‍රියාකාරකම 2

ඉහත එක් එක් කණ්ඩායම් අතර සතා නිවැරදි ව හඳුනා ගැනීමේ තරගයක් පවත්වන්න.

මේ සඳහා ලකුණු දීමේ ක්‍රමයක් ද ඉදිරිපත් කර ඇත. ඒ සිසුන්ගේ උනන්දුව පවත්වා ගැනීම සඳහායි.

සතුන් පිළිබඳ සෙවූ තොරතුරු ආශ්‍රයෙන් සකස් කරගත් ප්‍රශ්න විශාල ව ලියා පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

එක්වර තරග කරන්නේ කණ්ඩායම් දෙකක් පමණයි.




එක් කණ්ඩායමකට තරග කිරීමට ලැබෙන්නේ එක් අවස්ථාවක් පමණි.

සෑම කණ්ඩායමකට ම ආරම්භයේ දී ලකුණු 10ක් හිමිය. ලකුණු වශයෙන් කිසියම් ද්‍රව්‍ය 10 කණ්ඩායමට ලබා දිය හැකිය.

(උදාහරණ : කාඩ්පත්, මුඩි, කැට, බොත්තම් ආදී)

එක් කණ්ඩායමක් අනෙක් කණ්ඩායමෙන් ප්‍රදර්ශනය වන ප්‍රශ්න අසමින් සතා අනුමාන කිරීමට උත්සාහ කිරීම මෙම තරගයේ ස්වරූපයයි.

- ★ ප්‍රශ්න අනුපිළිවෙළින් ඇසීම අවශ්‍ය නොවේ.
- ★ එහෙත් අසන සෑම ප්‍රශ්නයකින් පසුව සතාගේ නම කීමට නොහැකි වුවහොත් ප්‍රශ්න අසන කණ්ඩායමෙන් ලකුණක් අඩු වන අතර අනෙක් කණ්ඩායමට එම ලකුණ හිමිවේ.
- ★ නිවැරදි පිළිතුර ලබා දීමේ උත්සාහයන් තුනක් හිමිවේ.

මේ ආකාරයට සියලු ම කණ්ඩායම් තරගයට සහභාගි කරවන්න.

මෙම ක්‍රියාකාරකම මගින් අපේක්ෂා කරන්නේ සත්ත්ව විවිධත්වය වටහා ගැනීමත් සතුන් පිළිබඳ තොරතුරු සෙවීමට කිසියම් මග පෙන්වීමක් කිරීමටත් ය. මීට පසුව එන ක්‍රියාකාරකම් අවසානයේ දී මේ තොරතුරු සියල්ල එකතු කර පන්තියේ තබා ගැනීමට ''සත්ත්ව ලෝකය'' යනුවෙන් පොතක් සකස් කළ හැකි ය.

## ක්‍රියාකාරකම 3

මීට පෙර ක්‍රියාකාරකම සඳහා සිසුන් ගෙන ආ පින්තූර මගින් සතුන් වර්ගීකරණය කිරීමට සලස්වන්න.

එක් එක් කණ්ඩායමකට එක් වර්ගයක සතුන්ගේ පින්තූර ලබා දෙන්න.

වර්ග කිරීමට නිර්ණායක තෝරා ගැනීම සිසුන්ට පවරන්න.

උදාහරණ :
- ★ ගන්නා ආහාර අනුව
- ★ එහා මෙහා යන ක්‍රම අනුව
- ★ ශරීරයේ ලක්ෂණ අනුව
- ★ වාසය කරන ස්ථානය අනුව

යනාදී වශයෙන් විවිධ ක්‍රම අනුව සතුන් වර්ග කළ හැකි බව අවධාරණය කරන්න.

## ක්‍රියාකාරකම 4

සතුන්ගේ විශේෂ අනුවර්තන/හැඩ ගැනීම් සහ චර්යාවන් ඔවුන්ගේ පැවැත්මට උදවු වන බව උදාහරණ මගින් පැහැදිලි කරන්න.

කැලෑවේ සතුන් තම ආහාර වාසස්ථාන ආරක්ෂාව ආදිය සඳහා අනුගමනය කරන විශේෂ ක්‍රම සාකච්ඡා කරන්න.

උදාහරණ :
- ★ සතුන්ගේ ශරීර වර්ණය (ගිරවා, කටුස්සා, සර්පයන්)
- ★ වේගයෙන් දිවීමට හැකිවීම (මුවා)
- ★ සියුම් ශබ්ද ශ්‍රවණය කිරීමට හැකි වීම (හාවා)

සතුන්ගේ විවිධ හඬවල් අනුකරණය කිරීමට සලස්වන්න.

උදාහරණ : හරකා (ගවයා) බල්ලා
එළුවා පූසා
ලේනා නරියා
බකමූණා වඳුරා
කොහා

එක් එක් සතුන් හඬ හසුරුවන ආකාරය හඬ නිකුත් කරන ආකාරය පිළිබඳ අවබෝධ කර දෙන්න.
එමෙන් ම එක් එක් සතුන්ගේ සුවිශේෂතා පිළිබඳ ව අත්දැකීම් කතා බහ කරන්න.

උදාහරණ :
- ★ කටුව තුළට රිංගා ආරක්ෂා වීම (ඉබ්බා)
- ★ තියුණු දෑස් (උකුස්සා)

පක්ෂීන්ට තමන්ට ආවේණික ජීවන රටාවක් ඇති බව හඳුනා ගැනීමට හැකි වන පරිදි සිසුන් සමඟ කතා බහක යෙදෙන්න.
පක්ෂීන් කිහිප දෙනකුගේ පින්තූර පන්තියට ඉදිරිපත් කරන්න. පක්ෂියකු අනෙක් සතුන්ගෙන් වෙන් කෙරෙන බාහිර ලක්ෂණ පිළිබඳ ව සාකච්ඡා කරන්න.

- ★ පියාපත් පිහිටීම (බොහෝ පක්ෂීන්ට පියාසර කළ හැකිය)
- ★ පාද යුගලය
- ★ ශරීරය වසා ඇති පිහාටු
- ★ පෙඳය
- ★ හිස සහ දිගු බෙල්ල
- ★ හොට
- ★ හොටට උඩින් නාස් විවර පිහිටා ඇති ආකාරය
- ★ ඇස්වල පිහිටීම (ඇස් හැරවිය නොහැකි ය. එම නිසා බෙල්ල හරවා වට පිට බලයි)
- ★ ගොඩ බිම, ගස් මත හා ඉහළ තැන්වල සහ ජලයේ වාසය කරන
- ★ ශරීරයේ දක්නට ලැබෙන වෙනත් බාහිර ලක්ෂණ

පක්ෂීන්ගේ ජීවන රටාව පිළිබඳ අවබෝධයක් ලබා දීම සඳහා තම ප්‍රදේශයේ වැඩිපුර ගැවසෙන පක්ෂියකු තෝරා ගන්න. ඒ අනුව පහත සඳහන් අවස්ථා හැකිතාක් නිරීක්ෂණයට යොමු කරවන්න.

බොහෝ පරිසරවල මොවුන් නිරීක්ෂණය කිරීමේ අවස්ථා තිබේ. නැතිනම් කුකුළු කොටුවක් නැරඹීමට අවස්ථාවක් ලබා දෙන්න. පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරවන්න.

- ★ ජීවත් වන්නේ තනි වශයෙන් ද, රංචු වශයෙන් ද?
- ★ රංචු වශයෙන් නම් නායකයා/නායිකාව හඳුනා ගත හැකි ද?
- ★ එසේ හඳුනා ගත හැකි ලක්ෂණ මොනවා ද?
- ★ ගන්නා ආහාර වර්ග මොනවා ද?
- ★ ආහාර සපයා ගන්නේ කුමන ආකාරයකට ද?
- ★ ආහාර ශරීරයට ඇතුලු කර ගන්නේ මොන ක්‍රමයට ද? (විකීමෙන්/එකවර ගිල දැමීමෙන්)
- ★ ජලය පානය කරන්නේ කෙසේ ද?
- ★ ශබ්ද පිට කරන්නේ කුමන අවස්ථාවල දී ද? කෙසේ ද?
- ★ ඊළඟ පරපුර බිහි කරන්නේ කෙසේ ද? (බිත්තර වශයෙන්/පැටව් වශයෙන්)
- ★ බිත්තර දමන්නේ නම් කුමන තැනක ද?
- ★ බිත්තර රකින්නේ කෙසේ ද?
- ★ රාත්‍රිය ගත කරන්නේ කොහේ ද?

මෙම තොරතුරු එකතු කොට, කරුණු සාකච්ඡා කරමින් පක්ෂීන්ගේ ජීවන රටාව විස්තර කරන පෝස්ටරයක් සාමූහික ව නිර්මාණය කිරීමට සලස්වන්න.
ඔබ පාසල අවට ප්‍රදේශයේ බහුල ව වාසය කරන සතුන් කිහිප දෙනකුගේ නම් සිසුන් ලවා ඉදිරිපත් කරවන්න. එක් එක් සතාගෙන් පරිසරයට ඉටුවන සේවාවන් මතක් කරමින් සාකච්ඡාවක් අරඹන්න.

උදාහරණ :
කපුටා - කුණු කසල කා දමයි
මී මැස්සා - මල්වල පරාගනයට දායක වෙයි
වවුලා - ගස්වල බීජ ඈතට ගෙන ගොස් දමයි
වේයා - ලී හා රොඩු ආදිය දිරාපත් කරවීමට මුල පුරයි

මේ සෑම සතකු ම වනයේ සමතුලිතතාව රැකීමට උදවු කරන ආකාරය සාකච්ඡා කරන්න.
මේ ආකාරයට තවත් උදාහරණ කිහිපයක් ගන්න. මේ සතුන්ගෙන් පරිසරයට සිදුවන යහපත පිළිබඳ ව සාකච්ඡා කරන්න. අපට අහිතකර යැයි පෙනෙන ක්‍රියාවන් පවා පරිසරයට යහපතක් ඉටු කරන බව පෙන්වා දෙන්න. උදාහරණ ලෙස කපුටා කරදරකාරයකු ලෙස පෙනුණත් ඌ පරිසරයේ නොමැති වුවහොත් ඌ විසින් කාදමනු ලබන කුණු කසල ඉතිරි වනු ඇත.
වේයා සමහර විට මිනිසාට ප්‍රයෝජනවත් දේ ද කාදමන නමුත් ඌ නොමැති වුවහොත් නොදිරා ඉතිරි වන කුණු රොඩු හා ලී කැබලි ආදියෙන් පොළොව වැසී යනු ඇත.

අශ්වයාගේ ගමන් විලාසය ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න. මෙහි දී (අභිනිෂ්ක්‍රමණය) සිදුහත් කුමරා ගිහිගෙයින් නික්ම යාම පිළිබඳ කතාව කෙටියෙන් පැහැදිලි කරන්න.

*සත් වෙන් මහත් අදර ලත් යුත් සිදුත් කුමරු*
*ගොත් සිත් තොසත් පැවිදි අංගා*

*අණකරන ඡන්නයෙන කන්තකය අසු*
*ගෙනෙත*

*ගෙන එඳුන අසුගේ පිට නැංගා*

*හාවෙකුගේ ගමන් විලාසය පිළිබිඹු කෙරෙන*
*වනපත්ත බියපත්ව සයනම් //*
*දුටත් යනෙන විටත් දුවන පිටත් පොට ගසා*
*පනිමින*
*නැත නාඩි ඉඳ වාඩි වෙව්ලුම්*


මුසලඩි වන්නමේ ඇතුළත් ගමන් විලාසය ඉදිරිපත් කිරීමට සිසුනට අවස්ථාව ලබා දෙන්න.

වන්නම් ඇසුරෙන් සතුන්ගේ චර්යා විදහා දැක්වීමට සිසුනට අවස්ථාව ලබා දෙන්න.
වඳුරෙකුගේ ඉරියව් හා හඬ ප්‍රදර්ශනය කිරීම.

*ගිරෙන් ගිරට පැන ලැගුම් සොයා*
*පුබුදමින් අරුණ කලා මා ... ගොර*
*දෙමින් නැවත වට පිටින් බලති නෙක*
*උසුළු විසුළු පුදුමා*

## ක්‍රියාකාරකම 5

සතුන් මෙන් ගමන් කිරීමේ ක්‍රීඩාවල නියැලීමට සිසුනට අවස්ථාව ලබා දෙන්න. මේ සඳහා එළිමහන් ස්ථානයකට සිසුන් රැගෙන යන්න.
එක් කණ්ඩායමකට සිසුන් පස් දෙනෙක් බැගින් වන සේ කණ්ඩායම් කරන්න.
රූප සටහනේ පරිදි පේළි වශයෙන් සිටුවන්න.
ආරම්භක රේඛාවක් හා අවසන් රේඛාවක් සලකුණු කරන්න.



ආරම්භක රේඛාව අවසන් රේඛාව

සංඥාවකට අනුව ආරම්භක සිසුවා වලස් ගමනින් ගොස් නැවත පැමිණිය යුතු බව දන්වන්න. ආපසු එන විට හාවා මෙන් පැන පැන ඒමට උපදෙස් දෙන්න. තම පෙළේ ඉදිරියෙන් සිසුවාට තට්ටු කර තම පේළියේ පිටුපසින් වාඩිවීමට උපදෙස් දෙන්න.
පෙළේ ඊළඟ සිසුන්ට පහත සතුන් අනුගමනය කරමින් ඉහත පරිදි කටයුතු කිරීමට උපදෙස් දෙන්න.

- ★ ඇත් ගමන
- ★ කැන්ගරු ගමන
- ★ දෙමලිච්චාගේ පැන පැන යාම
- ★ තාරා ගමන

පළමුව අවසන් කරන කණ්ඩායමට ජයග්‍රහණය ලබා දෙන්න.

## ක්‍රියාකාරකම 6

සතුන්ගේ චරිත, හැසිරීම් රටා, සහ පැවැත්ම පිළිබිඹු කරන නිර්මාණ ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.
උදාහරණ :
- ★ වන්නම්
- ★ සතුන් ගැන ගීත
- ★ ජාතක කතා සහ සතුන් ආශ්‍රිත වෙනත් ආගමික කතා රඟ දැක්වීම

ඒ තුළින් සත්ත්ව චර්යා, අභිනයන් දැක්වීමට හැකිවීම අපේක්ෂා කෙරේ.

උදාහරණ : නලපාන ජාතකය රඟ දැක්වීම

සතුන් ගැන කියැවෙන පහත සඳහන් ගීතය ගායනයට අවස්ථාව දෙන්න. ආදේශක භාණ්ඩ ද වාදනය සඳහා උදව් කර ගන්න.

*සැළලිහිණි කොවුල් හඬ රැව් දෙන්නා*
*මහ උයනක සිරි ඉතිරේ*
*මුව රළ අතරේ වගවලසුන්ගේ*
*රඟ මඬලකි මේ උයනේ*
*නීලකොබෝ රෑනගිරා*
*පිල්විදහා රඟනා මොනරා*
*කට ඇද කිරලා*
*සහ වලිකුකුළා*
*හොට දිග පිළිහුඩුවා*
*අප දැකලා බියවැදිලා*
*තරගෙට හඬ නැගුවා*
*කොළ දිවියා රළු කොටියා*
*කපටි රජානම් ලද හිවලා*
*විසකුරු පොළඟා මිනිකන කිඹුලා*
*පොතුහැර කබරගොයා*
*රට පිඹුරා ළඟම නයා දරණගසා සිටියා*

තනු නිර්මණය හා
ගායනය : සී. ටී. ප්‍රනාන්දු
රචනය : සරත් විමලවීර

## ක්‍රියාකාරකම 7

තම ප්‍රදේශයේ බහුල ව දක්නට ලැබෙන ඒකදේශික සතුන් පිළිබඳ තොරතුරු රැස් කිරීමට අවස්ථාව සලස්වන්න. (ඒකදේශික සතුන් යනු ජන්මයෙන් ශ්‍රී ලංකාවට ආවේණික වූ සතුන් වේ)

ගුරු කොණ්ඩයා, අළු දෙමළිච්චා, ලංකා සැළලිහිණියා, වල් ඇටිකුකුළා, කැහිබෙල්ලා, හබන් කුකුළා හා වලිකුකුළා ආදී පක්ෂීන් ද, කළුවැද්දා, කළුවඳුරා, හික්මීයා ආදී ක්ෂීරපායීන් ද, ගස් ගෙම්බා සහ රම්බෙල්ලා මැඩියා අදී උභය ජීවීන් ද, පුලුට්ටා, ගල්පාඩියා හා හීන්මැස්සා ආදී මසුන් ද, පළා පොළඟා, දිය නයා, වයිරි හාල් දණ්ඩා ආදී සර්පයන් ද කරමල් බෝදිලියා හා යක් කටුස්සා ද සමහර සමනලයින් (සිලෝන් ට්‍රී නිම්ප් හා ශ්‍රී ලංකා බර්ඩ් විංග්) ද උදාහරණ වෙති.

ඉහත දැක්වෙන ශ්‍රී ලංකාවට ආවේණික සතුන් අතරින් තම ප්‍රදේශයේ දක්නට ලැබෙන ඒකදේශික සතුන් හඳුනා ගැනීමට සලස්වන්න. මොවුන් අප රටේ උරුමයක් බව සිසුන්ට පහදා දෙන්න. අනාගත පරපුර සඳහා මේ සතුන් අප විසින් ආරක්ෂා කළ යුතු බව පෙන්වා දෙන්න.

මොවුන් රැක ගැනීම සඳහා අපට කළ හැකි දේ කුමක් දැයි සාකච්ඡා කරන්න.

මෙසේ සෑම සතෙක් ම පරිසරයේ කොටසක් බව පෙන්වා දෙන්න. පරිසරය ආරක්ෂා කිරීමට නම් පරිසරයේ කොටස් වන සතුන් ද ආරක්ෂා කළ යුතු බව තහවුරු කරන්න.

ශ්‍රී ලංකාවේ ඒක දේශික සතුන්ගේ රූප ඇතුළත් මුද්දර එකතුවක් ප්‍රදර්ශනය කරන්න.

ඒක දේශික සතුන් ඒ ඒ රටවලට බොහෝ වැදගත් වන බව පහත සඳහන් උදාහරණ ඇසුරෙන් පමණක් අවධාරණය කරන්න.

උදාහරණ :

★ පැන්ඩා - චීනයේ බෙයිජිං ඔලිම්පික් උළෙලේ සංකේතය
★ වලිකුකුළා - ශ්‍රී ලංකාවේ ජාතික සංකේතය
★ කැන්ගරු - ඕස්ට්‍රේලියාවේ ජාතික සංකේතය

ජාතික හෝ වෙනත් වැදගත් සංකේත සඳහා හෝ ඒක දේශික සතුන් සංකේත ලෙස යොදා ගන්නා වෙනත් රටවල් පිළිබඳවද සොයා බැලීමට යොමු කරන්න.

## ක්‍රියාකාරකම 8

සතුන් පිළිබඳ පෙර උගත් දේ ඇසුරින් සතුන්ගෙන් අපට ලැබෙන ප්‍රයෝජන ඇතුළත් වගුවක් සකස් කරන්න.

උදාහරණ :

පරිසරයට ඇති වාසි

| සතාගේ නම | පරිසරයට ඇති වාසි |
|---|---|
| කපුටා | කසල ඉවත් කරයි |
| ගැඩවිලා | පස සාරවත් කරයි |
| බකමූණා | කුඹුරුවල හානිකර කෘමීන් විනාශ කරයි |

සමාජයීය වශයෙන් ඇති වාසි

| සතාගේ නම | සමාජයීය වශයෙන් ඇති වාසි |
|---|---|
| බල්ලා | ආරක්ෂාව සපයයි |
| බළලා | සුරතලකු ලෙස මානසික සතුටක් ලබා දෙයි |
| ඇති කරන මසුන් | පරිසරයට අලංකාරයක් මානසික සුවයක් |
| කුරුල්ලන් | නිරීක්ෂණයෙන් ලබන මානසික තෘප්තිය, |

ආර්ථික වාසි

| සතාගේ නම | ආර්ථික වාසි |
|---|---|
| මී මැස්සා | මී පැණි නිපදවයි |
| ගවයා | කිරි නිපදවයි |
| කුකුලා | මස්, බිත්තර සපයයි |

## ක්‍රියාකාරකම 9

ගවයාගෙන් අප ලබා ගන්නා වඩාත් වැදගත් ප්‍රයෝජනයක් ලෙස කිරි ලබා ගැනීම කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරන්න.

කිරි ආහාරය ගන්නා විවිධ ක්‍රම

උදාහරණ : දියර කිරි
පිටිකළ කිරි
චීස්, බටර්, යෝගට්, මුදවාපු කිරි

කිරි නිෂ්පාදනවල සඳහන් ලේබලයකින් ගත හැකි තොරතුරු පිළිබඳ ව කතා බහ කරන්න.

ලේබල් එකතු කරන්න.

ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනවලට දායක වන ආයතන මොනවා දැයි තොරතුරු රැස් කිරීමට සිසුන් යොමු කරන්න. පශු සම්පත් අමාත්‍යාංශය, මේවා මගින් කිරි එකතු කිරීමේ කටයුතු ප්‍රවර්ධනය කිරීම සිදුවන බව පැහැදිලි කරන්න.

දියර කිරි භාවිතය පිළිබඳ වෙළෙඳපොළක් නිර්මාණය වී තිබීමේ වැදගත්කම හා ඒවා පරිභෝජනයට ගැනීමට මග පෙන්වන්න.

ගවයන් ඇති කරන අයකු පන්තියට ගෙන්වා සාකච්ඡා කිරීම හෝ ගව පට්ටියක් බැලීමට යාමට හෝ අවස්ථා ලබා දෙන්න. ඒ අනුව පහත තොරතුරු රැස් කිරීමට උපදෙස් දෙන්න.

එළදෙන හා සම්බන්ධ තොරතුරු
- ආහාර ගැනීම
- ආරක්ෂාව
- ලෙඩ රෝග
- කිරි ලබා ගන්නා ක්‍රම

රැස් කරගෙන ආ තොරතුරු පිළිබඳ ව පන්තියේ දී කතා බහක යෙදෙන්න.

## ක්‍රියාකාරකම 10

පහත සඳහන් නිර්මාණ කිරීමට සිසුන් යොමු කරන්න

1. ගව පාලනය සඳහා කෙනකු උනන්දු කරවීමට පත්‍රිකාවක්
2. සාර්ථක ගව පාලනයක් සඳහා සරල උපදෙස් ඇතුළත් පත්‍රිකාවක්
3. ගවයා මිනිසාගේ මිතුරෙකි යන අදහස දෙන කවි පෙළක්

# 3 පොළොව හා අහස

අප ජීවත්වන පොළොව සහ අප අවට ඇති අහස පිළිබඳ ව අධ්‍යයනය කිරීම අතිශයින්ම චමත්කාරජනකය. මේ තුළින් පුද්ගලයකුගේ ජීවිතයට අවශ්‍ය වන නිපුණතා රාශියක් සංවර්ධනය කර ගත හැකි ය. පොළොව මතු පිට ඇති පස සෝදා යාම, පස සරු කර ගැනීම, වැස්ස හා සුළඟ වැනි ස්වභාවික සංසිද්ධි අධ්‍යයනය කිරීම, අහසේ දැකිය හැකි වස්තූන් පිළිබඳ ව විමසිලිමත් ව අධ්‍යයනය කිරීම ආදී කරුණු රාශියක් මේ තේමාව යටතේ සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ.

## නිපුණතා

- ★ ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම පිළිබඳ ව විමසිලිමත් ව කටයුතු කරයි.
- ★ භූමියේ විවිධත්වය තුළින් මතුවන සුන්දරත්වය රැක ගැනීමට දායක වෙයි.
- ★ පසෙහි විවිධත්වය විමර්ශනය කරමින් පස සංරක්ෂණයට දායක වෙයි.
- ★ අහසෙහි අපූර්වත්වය ගවේෂණය කරමින් වින්දනයක් ලබයි.
- ★ සුළඟේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ව විමර්ශනාත්මක ව කටයුතු කරයි.
- ★ තම ප්‍රදේශයට ලැබෙන වර්ෂාවේ වෙනස්වීම් පිළිබඳ ව අවබෝධයකින් යුතුව ක්‍රියා කරයි.
- ★ අවකාශ භාවිත කරමින් ක්‍රීඩාවන්හි නියැලේ.
- ★ අහසේ හා පොළොවේ අසිරිය විදහා දැක්වෙන කවි, ගී, ගායනා හා රංගනවල නිරත වේ.
- ★ අහසෙහි, පොළොවෙහි වෙනස්වීම් මිනිස් ජීවිතවලට බලපාන අන්දම පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

සිසුන් ලබා ඇති අත්දැකීම් ආශ්‍රයෙන් ශ්‍රී ලංකාවේ පිහිටීම පිළිබඳ ව තොරතුරු සාකච්ඡා කරන්න.

ආදර්ශ ලෝක ගෝලයක් හෝ ලෝක සිතියමක් හෝ පන්තියේ ප්‍රදර්ශනය කර ශ්‍රී ලංකාවේ පිහිටීම නිරීක්ෂණය කිරීමට සලස්වන්න.

සිසුන් ඉදිරිපත් කළ අදහස් හා සිතියම නිරීක්ෂණය කර ලබා ගත් තොරතුරු ආශ්‍රයෙන් සාකච්ඡාවක් ගොඩනගන්න.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පිහිටීම පිළිබඳ ව පහත සඳහන් ආකාරයේ ප්‍රකාශ කළ හැකි බව පැහැදිලි කරන්න.

උදාහරණ : ශ්‍රී ලංකාවට උතුරින් ඉන්දියාව ද බටහිරින් අප්‍රිකානු රටවල් ද දකුණින් ඉන්දියන් සාගරය ද නැගෙනහිරින් මැලේසියාව, තායි-ලන්තය... වැනි රටවල් ද පිහිටා ඇති බව (සාපේක්ෂ පිහිටීම)

ඉන්දියන් සාගරයේ පිහිටි දූපතක් බව

ඉන්දියාවට දකුණින් හා ඉන්දියාවට ආසන්න ව පිහිටා ඇති බව

ලෝක සිතියම/ආදර්ශ ගෝලය නිරීක්ෂණය කරමින් ඉහත ඉදිරිපත් කළ අදහස් නිවැරදි දැයි බැලීමට සලස්වන්න. මේ සඳහා පන්තිය කුඩා කණ්ඩායම්වලට බෙදා ඒ එක් එක් කණ්ඩායමට සිතියමක් හෝ ලෝක ගෝලයක් හෝ ලබා දෙන්න.

## ක්‍රියාකාරකම 2

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා, දිය ඇළි, කඳු, තැනිතලා ඡායාරූප, පින්තූර, සිතියම් ඉදිරිපත් කරමින් භූමිය සෑම තැනම එක සමාන නොවන බවත් විවිධත්වයෙන් යුක්ත බවත් අවබෝධ කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න. හැකි සෑම අවස්ථාවක ම සිසුන්ගේ අත්දැකීම් ඉදිරිපත් කිරීමටත් සාකච්ඡා කිරීමටත් ඉඩ සලස්වන්න.

ශ්‍රී ලංකාවේ භූවිෂමතා දැක්වෙන ලොකු සිතියමක් නිරීක්ෂණයට සිසුනට අවස්ථාව ලබා දෙන්න.

සිතියමේ දැක්වෙන

- ★ කඳු ප්‍රදේශ
- ★ පහත් බිම් ප්‍රදේශ
- ★ ප්‍රධාන ගංගා දියඇලි

ආදිය හඳුනා ගැනීමට යොමු කරන්න.

ඒවා සටහන් කර ඇති ආකාරය සොයා බැලීමට සලස්වන්න. මෙහි දී වර්ණ භාවිත කර ඇති ආකාරය අනුව ද පිහිටීම හඳුනා ගත හැකි බව පෙන්වා දෙන්න. ගංගා කිහිපයක් උදාහරණ ලෙස ගෙන ඒවා ආරම්භ වන ප්‍රදේශ සිට පහත් ප්‍රදේශ හරහා ගලා ගොස් මුහුදට වැටෙන බව හඳුනා ගැනීමට සලස්වන්න. ඒවා මුහුදට වැටෙන ස්ථාන ද හඳුනා ගැනීමට සලස්වන්න.

තමා සිටින ප්‍රදේශය අයත් වන්නේ කඳු ප්‍රදේශයකට ද? පහත් බිම් ප්‍රදේශයකට ද ආදී වශයෙන් භූවිෂමතා ලක්ෂණ සාකච්ඡා කරන්න.

සිසුන් කණ්ඩායම් කොට සිසුන් ලද අත්දැකීම් ආශ්‍රයෙන් ලෑල්ලක් මත හෝ වෙනත් සුදුසු ස්ථානයක හෝ මැටි/පල්ප් වැනි දේ යොදා ගනිමින් තම ප්‍රදේශයේ භූවිෂමතා දැක්වෙන ආකෘති නිර්මාණයක් කිරීමට සලස්වන්න. කුඩා ගෙවල් දිය පාරවල් ආදිය ඇතුළත් කොට නිර්මාණය අලංකරණය කිරීමට ද උපදෙස් දෙන්න. කණ්ඩායම් ක්‍රියාකාරකමක් සේ ආකෘති කිහිපයක් නිර්මාණය කිරීමට පැවරුම් දෙන්න.

ප්‍රධාන ගංගා, දියඇලි ගැන කියැවෙන කවි ගී ගායනයට සලස්වන්න. අදාළ පරිදි රංගනයට ද ඉඩකඩ සලස්වන්න. ආදේශ වාද්‍ය භාණ්ඩ භාවිතයට ද උපදෙස් දෙන්න.

උදාහරණ : *සරසමු ලංකා - නළවමු ලංකා*
*සුරලෝ සිරි පිරි සිරි ලංකා*
*කෝකිල ගීතේ ඒ මේ යාමේ*
*නළවමු සිරි ලංකා //*

*මානෙල් අරලිය වතුසුදු කටරොළු*
*මල්බර සිරි ලංකා*
*සමනල බඹරුන් ඔබ මත සරසයි*
*ලස්සන මා ලංකා ///*
*සරසමු ලංකා ....*

*මහවැලි කැලණි - වලවේ ගිං ගඟ*
*ඔබ යහනයි ලංකා*
*පිණිකැට මුතුකැට රන්තරු බඳුවේ*
*මනහරයි ලංකා //*
*සරසමු ලංකා ...*

*සීගිරි යාමේ රුංගිරි සමනල*
*කඳුගැට පෙළ ලංකා*
*සිරිබර ඔබගේ ලස්සන පවසා*
*නමදිමු සිරි ලංකා //*
*සරසමු ලංකා ....*

රචනය - පියසේන කොස්තා

මෙයට අමතර ව පහත සඳහන් කවි හා ගීත ද ගායනා කිරීමට සිසුන් යොමු කරන්න.

උදාහරණ: මහවැලි, කැලණි, වළවේ, කළු යන ගංගා
කළු කැලණි නදී ගලායාවී .....

භූමියේ විෂමතාවය පෙන්වන කවි ගී සිසුන්ට ද ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දෙන්න. හැකිනම් කවි ගීත නිර්මාණයට යොමු කරන්න.

කවි හා ගීතවල සඳහන්වන ගංගා, ඇළ, දොළ, කඳු සිතියම් ආශ්‍රයෙන් සොයා ගැනීමට සිසුන් යොමු කරන්න.

## ක්‍රියාකාරකම 3

ගංගාවක වැලි ගොඩ දමන ස්ථානයක් ගැන සිසුන්ගේ අවධානය යොමු කිරීම හෝ එවැනි ස්ථානයක පින්තූරයක් සිසුන්ට ඉදිරිපත් කර හෝ පහත සඳහන් ප්‍රශ්න ඔස්සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- ★ මේ වැලි ගඟට ලැබුණේ කෙසේ ද?
- ★ මෙම වැලි සම්පූර්ණයෙන් ඉවත් කළ හොත් ගඟ පතුල කෙබඳු ආකාරයක් විය හැකි ද?
- ★ ගඟේ ඉවුරු කෙබඳු ද? බොහෝ තැන්වල ඉවුරේ තණ කොළ ආදිය දැකිය නොහැකි ය. ඒ මන්ද?

ගංගාවට හෝ දොළට හෝ මෙසේ වැලි එකතු වී තිබෙන්නේ ගඟ අද්දර හා ඉහළ ඉඩම්වල පස සෝදා ගෙන පැමිණ වැලි ඉතුරු වීමෙන් යන්න මෙහි දී මතු කරන්න.

ජලය වේගයෙන් ගැලීම පස සේදීයාම වේගවත් කරයි ද? යන්න සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

මෙම සිදුවීම සඳහා පරීක්ෂණයක් සැලසුම් කිරීමට සිසු කණ්ඩායම්වලට පවරන්න.

පසුව සාකච්ඡා කර එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවස්ථාව සලස්වන්න.

පෙළොව මතු පිට ගලා යන ජලයේ වේගය පාලනය කිරීමට භූමිය මතු පිට තෘණ වගාවකින් ආවරණය කිරීම, සුදුසු කාණු ක්‍රම යොදා ගැනීම වැනි පස රැක ගැනීමේ ක්‍රම පිළිබඳ ව සාකච්ඡා කරන්න.

පාසල් වත්තේ හෝ පෞද්ගලික ඉඩමක හෝ එවැනි අධ්‍යයනයක් කිරීමට සිසුන් යොදවන්න. පාංශු ඛාදනයට ලක්ව ඇති ස්ථානයක් හඳුනාගෙන පාංශු ඛාදනයට විසඳුම් ලෙස ගත හැකි ක්‍රියාමාර්ග මොනවා දැයි සොයා බැලීමට යොමු කරන්න.

පාංශු ඛාදනය නිසා ඇති වන පහත සඳහන් කරුණු ආශ්‍රයෙන් සාකච්ඡාවක් මෙහෙයවන්න. සාකච්ඡාවෙන් මතු වන කරුණු වාර්තා කිරීමට යොමු කරන්න.

1. මතුපිට පස නිසරුවේ. එම නිසා වගාවන්ට හානිවේ.
2. ගංපතුල ගොඩවී ගංවතුර ගැලීමට හේතුවක් ඇතිවේ.

පස විනාශ වීමට (පාංශු ඛාදනයට) බලපාන සාධක වශයෙන් මිනිසුන් හා සතුන් ගේ ක්‍රියාකාරකම්, ගලා යන ජලය හා සුළඟ වැනි හේතු බලපාන බව පෙන්වා දෙන්න.

## ක්‍රියාකාරකම 4

පස සරු ස්ථානයක් හා පස නිසරු ස්ථානයක් තෝරාගෙන පස් නියැදි දෙකක් ලබා ගන්න. ඉන්පසු සිසුන් කාණ්ඩ කර එක් කණ්ඩායමකට පස් වර්ග දෙකෙන් කොටස බැගින් බෙදා දෙන්න. ඉන්පසු එම පස් කාණ්ඩ දෙක වෙන වෙන ම අධ්‍යයනය කිරීමට යොමු කරන්න. ඉන්පසුව පහත සඳහන් ආකාරයේ වගුවක් ආශ්‍රයෙන් ලබාගත් තොරතුරු විශ්ලේෂණය කර දැක්වීමට සිසුන් යොමු කරන්න. (මෙම ක්‍රියාකාරකම කිරීමේ දී අත්වැසුම් පැළඳීම වැනි සෞඛ්‍යමය ආරක්ෂණ ක්‍රමවේද භාවිත කරමින් වැඩ ලෝකයට උචිත පුරුදු ප්‍රවර්ධනය කිරීමට ද උනන්දු වන්න)

| පස් ලබාගත් ස්ථානය | සරු පසේ ලක්ෂණ | නිසරු පසේ ලක්ෂණ |
|---|---|---|
| | | |

## ක්‍රියාකාරකම 5

රාත්‍රි අහස පිළිබඳ ව සිසු අත්දැකීම් ප්‍රකාශනයට අවස්ථාව ලබා දෙන්න. එදින රාත්‍රී අහස නිරීක්ෂණය කර (නිශ්චිත කාලයක් තුළ) දකින්නට ලැබුණු දෑ පසු දින පන්තියට ඉදිරිපත් කිරීමට යොමු කරන්න. (වැසි රහිත දිනයක් විය යුතුයි) ගුරුවරයාගේ අදහස ද එකතු කර පෝෂණය කරන්න.

විවිධ දිනවල චන්ද්‍රයා පෙනෙන ආකාරය ගැන කතා බහ කරන්න. නිවසේ දී රාත්‍රී කාලයේ සඳ නිරීක්ෂණය කිරීමට ද සිසුන් යොමු කරන්න. ඒ සඳහා රූපයේ ඇති අන්දමේ ඇටවුමක් සාදා ගැනීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

වටපිටාවෙන් සපයා ගත හැකි දේවල් යොදා එවැන්නක් සකස් කර ගැනීමට යොමු කරන්න.



එළිමහන් ස්ථානයක් තෝරා ගෙන උපකරණය සවිකරගන්න. රාත්‍රියේ යම් පහසු වේලාවක් තෝරා ගෙන බටය තුළින් සඳ පිහිටි ස්ථානය නිරීක්ෂණය කර අවකාශයේ සීමාව නිශ්චය කර ගන්න.

සෑම දිනක ම එක ම වේලාවක දී එක ම ස්ථානයක සිට සඳෙහි පිහිටීම (දළ වශයෙන්) සහ හැඩය නිරීක්ෂණය කර පහත අයුරින් සටහන් කර ගැනීමට සිසුන්ට පවසන්න.




සඳෙහි හැඩය අදාළ කොටුව තුළ අඳින්න.
දවස් දෙකකට තුනකට වරක් මෙසේ වාර්තා කිරීම සෑහේ.
ඉහත සටහන අවසන් වූ පසු මාසයේ ඉතිරි දවස් සඳහා තවත් සටහනක් ඇඳගන්න. සියල්ල මෙසේ කර අවසන් කළ පසු එක් දිනයක එම තොරතුරු ඇතුළත් වාර්තා ප්‍රදර්ශනය කරන්න. ඒ පිළිබඳ ව පහත කරුණු ද මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- ★ 1 දා සිට 15 දා තෙක් සඳේ හැඩයට කුමක් සිදු වී ඇති ද?
- ★ පසළොස්වක පෝයදා කවදා ද?
- ★ ඊට පසු දවස් කිහිපය තුළ සඳේ ප්‍රමාණයට කුමක් සිදු වේ ද?
- ★ සඳ ඇතුළත වක්‍රය කුමන දිශාවට යොමු වී තිබේ ද?
- ★ දෙදිනක් තුළ එකම වේලාවක බැලුව ද සඳ එකම තැනක දැකිය නොහැකි ය. හේතුව කුමක් විය හැකි ද?
- ★ සඳේ ඇතුළත වක්‍රය විරුද්ධ පැත්තට හැරුණේ කවදායින් පසුව ද?
- ★ මෙම වෙනස සිදු වීමට දවස් කීයක් ගතවේ ද?
- ★ සමහර උදෑසනක ද සඳ බටහිර අහසේ දැකිය හැකි වේ.

සඳේ හැඩයේ වෙනස්වීම කෙසේ සිදු වේ දැයි පෙන්වීමට ආකෘතියක් ගොඩ නගන්න. සඳ බැලීමට සකස් කර ගන්නා ලද උපකරණය භාවිතයෙන් පහත අයුරින් තරු නිරීක්ෂණයට සිසුන් යොමු කරන්න.
ඇටවුම එළිමහන් තැනක සිටුවා ඉර බැස යාමෙන් පසුව දකින පළමු තරුව දෙසට බටය යොමු කර තබන්න.
පැයකට/දෙකකට පසුව බටය තුළින් නැවත පෙර දුටු තරුව දෙස බලන්න.
ඔබ දකින ලද එම තරුව අවට ඇති අනෙක් තරු සමග සසඳන්න. සමානකම් සහ වෙනස්කම් සටහන් කර ගන්න.

## ක්‍රියාකාරකම 6

ජූනි, ජූලි, අගෝස්තු වැනි මාසවල පැහැදිලි ව බස්නාහිර අහසේ පහත දැක්වෙන තරු රටා දැකිය හැකි ය. ඒවා හඳුනා ගැනීමට උත්සාහ කරන්න.

තරු අතර ලොකු තරු ද කුඩා තරු ද දැකිය හැකි බව නිරීක්ෂණවලින් ලත් අත්දැකීම් ආශ්‍රයෙන් සාකච්ඡාවේ දී මතු කර දක්වන්න.

මෙසේ දවස් කිහිපයක දී තරු පිළිබඳ ව නිවසේ දී ලබා ගන්නා ලද අත්දැකීම් ඉදිරිපත් කිරීමට සිසුනට අවස්ථාව දෙන්න. ඒවා සාකච්ඡා කරන්න.

සිසුන් හඳුනා ගත් තරු රටා කිහිපයක් ඇඳ ගැනීමට සලස්වන්න. ඒවා හඳුන්වන නාමයන් හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න.

උදාහරණ :

හත්දින්නත් තරු
මහවලහා
දඬයක්කාරයා

## ක්‍රියාකාරකම 7

අහස ගැන කියවෙන කවි, ගී ගායනය සමඟ චලන ක්‍රියාකාරකම සඳහා සිසුන් යොමු කරන්න. විශේෂයෙන් රාත්‍රී අහස ගැන කියවෙන ගී ගායනය හා රංගනයට අවස්ථාව ලබා දෙන්න.

*පාට පාට සළු සලා*
*මිණි කිංකිණි සොලවලා*
*නටමු නටමු නටමු නටමු*
*වළාකුළෙන් රිංගලා*
*මොළකැටි බඳ නළවලා*
*තාලෙට පොඩි පා තබා*
*නටමු නටමු නටමු නටමු*
*වළාකුළෙන් රිංගලා*

රචනය - චන්ද්‍රරත්න මානවසිංහ
(සේපාලිකා ගීත නාටකයෙන්)

ලෝ අඬ නින්දේ ගීතය - මව්බස විෂයයේ සවන් දීම ක්ෂේත්‍රය තුළ සඳහන් කර ඇත.

අන්න බලන් සඳ රන් තැටියෙන් සුදු සිත ගඟුල් ගලනා - මව්බස විෂයයේ සවන් දීම ක්ෂේත්‍රය යටතේ සඳහන් කර ඇත.

මෙම ගීත ගායනයට හා රංගනයට යොමු කරන්න. සඳ, පෘථිවිය, සූර්යයා රූකඩ හෝ වෙස්මුහුණු හෝ භාවිත කර භූමිකා නිරූපණයට සලස්වන්න.

උදාහරණ : සඳ බවට පත් වී සිසුන්ට ම කතා කිරීමට, පෘථිවිය බවට පත් වී සිසුන්ට ම කතා කිරීමට (සඳ සහ පෘථිවිය අතර දෙබසක් ලෙස) යොදා ගත හැකි ය.

පහත සඳහන් රබන් පද ගායනය සමඟ රබන් පද වාදනයට අවස්ථාව සලසන්න.

*එගොඩ ගොඩෙත් රත්තරන්*
*මෙගොඩ ගොඩෙත් රත්තරන්*
*එගොඩ ගොඩෙත්*
*මෙගොඩ ගොඩෙත්*
*ඇතෙක් බරට රත්තරන්*
*ඉරමඬලේ රත්තරන්*
*සඳමඬලේ රත්තරන්*
*කොහෙන්ද මේ රත්තරන්*
*දෙයියො දුන්නු රත්තරන්*

## ක්‍රියාකාරකම 8

සුළඟ පිළිබඳ අත්දැකීම් සිසුන් සමඟ කතා බහ කරන්න. එම කතා බහ තුළින්

- ★ වාතය හැම තැන ම ඇති බව
- ★ චලනය වන වාතය සුළඟ ලෙස හැඳින්විය හැකි බව පැහැදිලි කර දෙන්න.

පන්තියේ සිසුන් කණ්ඩායම් කරන්න. සුළං හමන දිශාව දැක ගැනීමට කළ හැකි පහත ආකාරයේ සරල ක්‍රියාකාරකම්වල යොදවන්න.

උදාහරණ:

- ★ හඳුන් කූරක් දල්වා දුම ගමන් කරන ආකාරය නිරීක්ෂණය කිරීම
- ★ හොඳින් වේළුණු ශාක පත්‍රයක් අහුලා ගෙන පොඩි කර අහසට විසි කර සිදු වන දේ නිරීක්ෂණය කිරීම
- ★ ඉලුක් මල්, පුළුන්, සිනිඳු මල් පෙති වැනි පරිසරයේ ද්‍රව්‍ය ගෙන අහසට විසි කර නිරීක්ෂණය කිරීම

- ★ සිහින් ලෙස ඉරා ගත් හෝ කපා ගත් හෝ කඩදාසි කැබැලි අහසට විසි කර නිරීක්ෂණය කිරීම
- ★ සවි කඩදාසියක් කපා ජනෙල් උළුවහුවේ පහතට එල්ලෙන ලෙස අලවා එහි සෙලවීම අනුව සුළඟ නිරීක්ෂණය කිරීම
- ★ ගස් සෙලවෙන ආකාරය නිරීක්ෂණය කොට ඒ අනුව සුළං හමන දිශාව අවබෝධ කර ගැනීම

ඉහත සඳහන් ක්‍රියාකාරකම්වලින් අනාවරණය කරගත් තොරතුරු සාකච්ඡා කිරීම සහ වාර්තා කර ගැනීමට සිසුන් යොමු කරන්න. එහි දී පහත සඳහන් ආකාරයේ කරුණු අවධාරණය කළ හැකිය.
උදාහරණ :

- ★ ඒ ඒ අවස්ථාවල දී සුළං හමන්නේ කවර දිශාවකට ද?
- ★ සුළං හැමීම එක ම දිශාවකට පමණක් සිදුවේ ද?

අවුරුද්දේ එක් එක් කාලවල දී සුළං හමන දිශා පිළිබඳ සිසුන්ගෙන් විමසන්න. සුළඟ වැස්ස සම්බන්ධ ප්‍රාදේශීය වශයෙන් ඇති මත රැස් කිරීමට ද උනන්දු කරන්න. රැස් කර ගත් තොරතුරු පන්තියේ දී සාකච්ඡා කරන්න. ඒ පිළිබඳ කවි, ගී නිර්මාණය කර තනිව හා සමූහ වශයෙන් ගායනයට යොමු කරන්න. චලන ක්‍රියාකාරකම්වල ද යොදවන්න.

සුළං හමන විට අවට පරිසරයේ සිදුවන දේ නිරීක්ෂණය කර වෙනස්කම් පිළිබඳ ව තොරතුරු සාකච්ඡා කරන්න. සුළඟ හමන විට ඇති වන ශබ්දය ඇති කිරීමට එක් කණ්ඩායමක් යොමු කරන්න. වෙනස්කම් නිරූපණය කිරීමට තවත් කණ්ඩායමක් ද යොමු කරන්න. සුළඟේ වේගය වෙනස්වීම (අඩු/වැඩි) අනුව පහත සඳහන් චලන ගවේෂණ ක්‍රියාකාරකම්වලට යොමු කරන්න.
උදාහරණ :

- ★ උස ගස් මෙන් ඇඹරෙන්න
- ★ සුළං දිශා දර්ශකයක් මෙන් කැරකෙන්න
- ★ පැළෑටි සේ නැමී යන්න
- ★ සුළං බමරයක් මෙන් සෙමෙන් කැරකෙන්න

## ක්‍රියාකාරකම 9

තම තමන්ගේ නිවෙස්වල එදිනෙදා කටයුතු සඳහා සුළං බලය යොදා ගන්නා අවස්ථා හා ආකාර පිළිබඳ ව සිසුන්ගේ අත්දැකීම් සාකච්ඡා කරන්න.
උදාහරණ :

- ★ ලිප ගිනි මෙළවීමේ දී
- ★ තෙත ඇඳුම් වියළා ගැනීමේ දී
- ★ වීවලින් බොල් ඉවත් කිරීමේ දී

තාක්ෂණික ක්‍රම ඇසුරෙන් සුළං බලය උපයෝගී කර ගන්නා යන්ත්‍රෝපකරණ පිළිබඳ තොරතුරු හා ඒවායින් කෙරෙන කාර්යයන් හඳුනා ගැනීමට කතා බහ කරන්න. යන්ත්‍ර සූත්‍ර ආශ්‍රිත පින්තූර මේ සඳහා යොදා ගත හැකිය. හැකි නම් ප්‍රායෝගික ව අත්දැකීම් ලබා ගැනීමට ද අවස්ථා ලබා දෙන්න.
උදාහරණ :

- ★ මෝටර් රථ, ලී බඩු වර්ණ කර ගැනීමට යොදා ගන්නා සායම් ඉසීමේ යන්ත්‍ර
- ★ දූවිලි කුණු ඉවත් කිරීමට සුළං බලය යොදා ගන්නා නවීන උපකරණ
- ★ කොණ්ඩය වියළා ගන්නා උපකරණ
- ★ ලුණු ලේවායන්හි දී කරදිය ජලය ලියදිවලට ඇද ගැනීමට යොදා ගෙන ඇති සුළං යන්ත්‍රය
- ★ සුළං බලය යොදා ගෙන විදුලිය නිපදවීම
- ★ කාමරවල වාතය සිසිල් කිරීම සඳහා විදුලි පංකා යොදා ගැනීම

සුළං බලය යොදා ගනිමින් විවිධ වෘත්තීන්හි යෙදෙන අවස්ථා අභිරූපණයට යොමු කරන්න.
උදාහරණ :

- ★ කරණවෑමියකුගේ චරිතය
- ★ මෝටර් රථයක්, ලී බඩුවක්, වර්ණ කරන ආකාරය
- ★ බයිසිකල් ටයරයකට හුළං ගැසීම

ස්වභාවික සුළං ඇසුරෙන් අතීතයේ ගමන් බිමන් යොදා ගත් ආකාර පිළිබඳ ව තොරතුරු සිසුන් සමඟ කතා බහ කරන්න.
කාලගුණය පිළිබඳ අනාවැකි පිළිබඳ ව සිසු අදහස් විමසන්න. වැහිලිහිණියෝ පියෑඹීම

සුළං පිඹීමෙන් මෝස්තරයක් නිර්මාණයට මග පෙන්වන්න. මේ සඳහා දිය සායම් වැනි වර්ණ විශේෂයක් හා සුළං පිඹීමට බටයක් සපයා ගන්න. කඩදාසි තලය මත වර්ණ බින්දු තබමින් බටය ආධාරයෙන් පිඹ, මෝස්තරය නිර්මාණයට සිසුන්ට උපදෙස් දෙන්න.

## ක්‍රියාකාරකම 10

පන්තියේ සිසුන්ට පහත දැක්වෙන ද්‍රව්‍ය සපයා ගැනීම සඳහා දින කිහිපයකට ප්‍රථම ව උපදෙස් දෙන්න.

උපකරණ :

- ★ සරුංගලයක් සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය
- ★ නළාවක් සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය: ප්ලාස්ටික් බට කැබැල්ලක් හෝ ගොක් කොළ හෝ ගස්ලබු බට හෝ උණ බට හෝ කැබැල්ලක්, (අවශ්‍ය දිග ප්‍රමාණයෙන්) මහත පරාල ඇණයක්
- ★ සුළං පෙත්තක් සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය: කඩදාසි රවුමක් සෑදීමට ප්ලාස්ටික් පිඟානක්, පොරොප්පයක්, යකඩ කම්බිකූරක්

එක් එක් සිසු කණ්ඩායමකට පහත දැක්වෙන එක් නිර්මාණයක් කිරීමට පැවරුමක් දෙන්න. ඊට අදාළ උපදෙස් කණ්ඩායමේ සිසුන්ට දිය යුතු ය.

පැවරුම් කාර්ය :

1 කණ්ඩායම - සරුංගලය සෑදීම

2 කණ්ඩායම - බට නළාවක් සෑදීම

3 කණ්ඩායම - සුළං පෙත්තක් සෑදීම

සරුංගලය සෑදීම :

කණ්ඩායමට හෝ එක් එක් සිසුවාට කැමති පරිදි එකමුතු ව හෝ තනි තනිව හෝ සරුංගලයක් නිර්මාණය කිරීමට යොමු කරන්න. කඩදාසි නවා කැපීමෙන් අලංකාර මෝස්තර නිර්මාණය කර ඇලවීමට යොමු කරන්න.

බටනළාවක් තැනීම :

බටනළාවක ප්‍රමාණයට ප්ලාස්ටික් බට කැබැල්ලක් තෝරා ගන්න. බටනළාවක සිදුරු විද ඇති ආකාරය නිරීක්ෂණය කර සිදුරු විද ඇති දුර ප්‍රමාණය අනුව බට කැබැල්ලේ ද ස්ථාන ලකුණු කර ගන්න. හොඳින් රත් කර ගත් ඇණයක් හෝ යකඩ කූරක් ලකුණු කර ගත් බටයේ ස්ථාන මත තබන්න. (ආරක්ෂාව ඇති ව කාර්යයෙහි යෙදෙන්නට අවශ්‍ය උපදෙස් දෙන්න.) සිදුරු විදගත් පසු කටින් පිඹින සිදුර සහිත ස්ථානයේ අග ඇතුලු පැත්තේ පොරොප්ප කැබැල්ල සිර කොට සුළං පිටවීම වැළැක්වීමට ඉටිපන්දම් කිරිවලින් සීල් කර ගන්න.

(දින කිහිපයක් නිර්මාණ කාර්යයෙහි නිරත වේ නම් ඒ ඒ කණ්ඩායම්වලට පැවරුම මාරු කොට සියලු හුරුකම් හැම සිසුවකුට ම ලබා දීමට කටයුතු කළ හැකි ය)

නිර්මාණය කර ගත් බටනළා පිඹීමෙන් තෘප්තිය ලැබීමට, වින්දනයට අවස්ථා සලසා දෙන්න.

උදාහරණ :

කණ්ඩායමක් ගායනයක යෙදෙන විට අනෙක් කණ්ඩායම බටනළා වාදනය කිරීමට ද (කණ්ඩායම් මාරු කරමින්) සියලු ම සිසුන්ට බටනළා පිඹීමේ ක්‍රියාවලියේ යෙදීමට ද ඉඩ දෙන්න.

## ක්‍රියාකාරකම 11

කඩදාසි පිඟානක්/කෝප්පයක් ඇසුරෙන් සුළං පෙත්තක් සෑදීම



රූප සටහනේ පරිදි කඩදාසි පිඟානේ පෙති ලකුණු කර ගන්න.
දිග අතට පමණක් කපා පෙති වෙන් කර ගන්න.
මැදින් කපමින් අනවශ්‍ය කොටස් වෙන් කර ගන්න.
මැද සිදුරක් විද කඩදාසි පිඟානේ පොරොප්ප කැබැල්ලක් අලවා ගන්න.
මැද සිදුර හරහා කම්බිකූරක් හෝ හීන් ඇණයක් හෝ යවා කෝටුවකට සවි කරන්න.
කම්බි කූර කෝටුවකට සවි කොට පෙති මදක් හැඩ කර හරවා ගන්න.

සුළං දිශා දර්ශකයක් තැනීම


පන්ති කාමරයේ දී සරල දිශා දර්ශකයක් තනා ගැනීමට සිසුන් යුගල වශයෙන් වෙන් කර පැවරුමක් දෙන්න.

අවශ්‍ය උපකරණ :
බීම බට දෙකක් (මේ සඳහා ගම්බද පළාත්වල වැවෙන ඉලුක් දඬු වැනි දේ යොදා ගත හැකි ය.)
ඉවත ලන ඝන කඩදාසි පටියක් (බ්‍රිස්ටල් බෝඩ් වැනි)
පොරොප්පයක් (රූප සටහනේ දැක්වෙන පරිදි ඒ සඳහා සුදුසු වෙනත් ආධාරකයක් යොදා ගත හැකි ය)
අල්පෙනෙත්තක්
හතරැස් කඩදාසියක් (දිශා ඇඳ දැක්වීමට)

කඩදාසියේ දිශා අට ලකුණු කරන්න. හරි මැද ආධාරකය සවි කරන්න. බීම බටයක් ගෙන බටය අගින් පළා ඝන කඩදාසි හැඩ කපා දෙපස සවි කරන්න. සාදා ගත් හීය මැද අල්පෙනෙත්තෙන් විද බීම බටයේ කුඩා කැබැල්ලකින් අල්පෙනෙත්ත ආවරණය වන සේ මැදි කොට ආධාරකයේ සවි කරන්න. අතින් කරකවා කරකැවෙන අයුරු බලන්න.

සිසුන් දෙදෙනා බැගින් එක්ව සෑදූ සරල නිර්මාණය සුළඟේ ක්‍රියාකරන ආකාරය නිරීක්ෂණයට එළිමහනකට ගෙන යෑමට උපදෙස් දෙන්න. සුළඟට දිශා දර්ශකය ක්‍රියා කරන ආකාරය බලා වින්දනයක් ලැබීමට අවස්ථාව සලසන්න. නිර්මාණය අගය කරන්න. ස්ථාන වෙනස් කරමින් තව දුරටත් සුළං හමන දිශා ගැන නිර්මාණය තුළින් කතා බහ කරන්න.

මෙම සරල නිර්මාණයට අමතර ව ලැබූ අත්දැකීම් ඇසුරෙන් හා පාරිසරික සම්පත් උපයෝගී කොට ගෙන කලක් පවත්වා ගත හැකි තරමක් විශාල සුළං දිශා දර්ශක පාසල් වත්තේ සුදුසු තැන් කිහිපයක සෑදීමට කණ්ඩායම් පැවරුමක් දෙන්න.



## ක්‍රියාකාරකම 12


අවකාශ භාවිත කරමින් පන්දු යැවීමේ ක්‍රීඩාවක් මෙහි පහත දැක්වේ. මේ සඳහා එළිමහනකට සිසුන් රැගෙන යන්න.

පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න. (එක් පිලකට 10ක් පමණ වන සේ) සිසුන් සංඛ්‍යාව වැඩි නම් තවත් ස්ථාන යොදා ගනිමින් කණ්ඩායම් සකස් කර ගත හැකි ය.

මෙම ක්‍රීඩාවේ දී A B වශයෙන් දෙපිලක් නම් පළමුව පන්දුව යවන්නේ කවුරුන් දැයි තෝරා ගත යුතු වේ. ඊට සුදුසු ක්‍රමයක් භාවිත කළ හැකි ය. A පිල පන්දුව යැවීමට අවස්ථාව ලැබුවේ නම් එම පිලේ යම් සිසුවකු විසින් පන්දුව ඉහළින් B පිලට යැවිය යුතුයි. එය අල්ලා ගැනීමට සමත් වුවහොත් අල්ලා ගත් තැනැත්තා A පිල පැත්තට පැමිණිය යුතුයි. එසේ වුව ද ඔහු/ඇය A පිලෙහි සාමාජිකයකු

නොවේ. අල්ලාගත් පිලට (B) පන්දුව යැවීමට අවස්ථාව සැලසේ. මෙහි දී පන්දුව එවීමේ දී තම පිලෙන් ගිය සිසුවාට කෙසේ හෝ පන්දුව යැවීමට B පිල කටයුතු කළ යුතුයි. මේ අවස්ථාවේ දී A පිලේ සිසුන් ද පන්දුව අල්ලා ගැනීමට උත්සාහ කළ යුතු ය. A පිලට පැමිණි සිසුවා පන්දුව අල්ලා ගත හොත් ඔහුට/ඇයට බාධාවකින් තොරව තම පිලට පන්දුව යැවිය හැකි ය. (සඳහන් කර ඇති සීමාවේ ආසන්නයට ම පැමිණ හෝ පන්දුව අල්ලා ගැනීමට පහසු වන ලෙස පන්දුව යැවිය හැකි ය) එවිට B පිල පන්දුව අල්ලා ගැනීමට සමත් වුවහොත් එම සිසුවාට ද A පිලට පැමිණිය හැකි ය. B පිලෙන් එවන පන්දුව A පිල සිසුවකු අල්ලා ගත හොත් එම සිසුවා B පිලට යා යුතුවේ. මේ ආකාරයෙන් එක් පිලක සිසුන් අනෙක් පිලට යාමෙන් හිස්වන පැත්ත ජය ගනී. කිසියම් පිලක් ජය ගන්නා තෙක් පන්දුව යැවීම සිදු කළ යුතුවේ. කාලය සඳහා සීමා පැනවිය හැකි ය. මෙම ක්‍රීඩාවේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.

(i) දෙපිලකට ක්‍රීඩා කිරීමට ප්‍රමාණවත් අවකාශයක් තිබීම.
(ii) තම සීමාව තුළ නිදහසේ සිටීමට හැකිවීම.
(iii) සීමා තුළට පන්දුව යැවීම සිදු කළ යුතු අතර සීමාවෙන් පිටතට පන්දුව වැටුණහොත් එම අවස්ථාව අනෙක් පිලට ලබා දීම.
(iv) සීමාව තුළ පමණක් ක්‍රීඩා කළ යුතු අතර ඉන් පිටතට ගොස් පන්දුව ඇල්ලීම පන්දුව දැමීම සිදු නොකිරීම.
(v) කණ්ඩායම තුළ සාමූහික හැඟීමකින් කටයුතු කිරීම.



# 4 අප හා වෙළෙඳ පොළ

දියුණු පුරවැසියන් සහිත සමාජයක පැවතිය යුත්තේ ගුණාත්මක තත්ත්වයේ වෙළෙඳ පොළකි. එවැනි වෙළෙඳ පොළක් ප්‍රමිතියෙන් යුතු භාණ්ඩ හා සේවා සපයන සාධාරණ ව්‍යවසායකයන්ගෙන් යුක්ත වේ. එම භාණ්ඩ හා සේවා පරිභෝජනය කරන්නේ විචාරශීලී පාරිභෝගික පිරිසකි. එවැනි ගුණාත්මක වෙළෙඳ පොළකට සරිලන අනාගත ව්‍යවසායකයන් සහ පාරිභෝගිකයන්ගේ පදනම සඳහා අවශ්‍ය ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීම පිණිස මෙම තේමාව සකස් කර ඇත.

## නිපුණතා

- ✶ භාණ්ඩයක් මිල දී ගැනීමේ දී ප්‍රමිතීන් හා තම ආර්ථික තත්ත්වය පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.
- ✶ භාණ්ඩයක් විකිණීමේ දී එහි ප්‍රමිතීන් ගැන සැලකිලිමත් ව ක්‍රියා කරයි.
- ✶ සේවාවක් ලබා ගැනීමේ දී සහ සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ ව අවධානයෙන් යුතුව කටයුතු කරයි.
- ✶ එදිනෙදා ජීවිතයේ දී භාණ්ඩ හා සේවා කාර්යක්ෂම ව සහ ඵලදායී ලෙස පරිහරණය කරයි.
- ✶ එදිනෙදා නිවසේ වැඩ කටයුතුවල දී අරපිරි-මැස්මෙන් යුතුව කටයුතු කරයි.
- ✶ ගෙදර දොර අරපිරිමැස්ම සඳහා පරිසරයෙන් සපයා ගත හැකි විවිධ ද්‍රව්‍ය යොදා ගනිමින් සුදුසු භාණ්ඩ නිර්මාණය කරයි.
- ✶ වෙළෙඳ පොළ ආශ්‍රිත නැටුම්, ගැයුම් හා චරිතාරෝපිත රංගනයන්හි නියැලෙමින් වින්දනයක් ලබයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

මෙම තේමාව ආරම්භ කිරීමට පෙර දෙමාපිය හමුවක් පවත්වන්න.
එහිදී ගෙදර බඩු මිලදී ගැනීම සඳහා වෙළෙඳ පොළට යනවිට සිසුන් ද කැටුව ගොස් වෙළෙඳ පොළේ සජීවී අත්දැකීම් ලබා දීම පිළිබඳ අවධානය යොමු කරවන ලෙස දෙමාපියන් දැනුවත් කරන්න.

## ක්‍රියාකාරකම 1

ඉහතින් ලබා ගත් අත්දැකීම් ඔස්සේ බඩු මිලදී ගැනීමේ හා විකිණීමේ අවස්ථා හා එම ස්ථාන පිළිබඳ සිසුන්ගෙන් කරුණු විමසන්න.
එම ස්ථානවල දී තමා අත්විඳි විවිධ අත්දැකීම් පාදක කර ගනිමින් සාකච්ඡා කිරීම සඳහා කණ්ඩායම් ක්‍රියාකාරකමක් මෙහෙයවන්න.
එක් එක් කණ්ඩායම පහත දැක්වෙන කරුණු ඔස්සේ අත්දැකීම් බෙදාගනිමින් සාකච්ඡා කිරීමට යොමු කරන්න.

- වෙළඳාම සඳහා භාණ්ඩ තබා ඇති පිළිවෙළ
- භාණ්ඩයක් විකිණීමට වෙළෙන්දා දරන උත්සාහය
- මුදල් ගණු දෙනු සිදුකරන ආකාරය
- කිරුම් මිනුම් සඳහා භාවිත කරන උපකරණ
- කිරුම් මිනුම්වල නිවැරදි බව

- ලබා දුන් මුදලට සාධාරණ භාණ්ඩයක් ලැබුණේ ද යන බව
- මිළ දී ගත් භාණ්ඩයේ පිරිසිදුකම හා අලුත් බව.

කණ්ඩායම් 4/5 ක් බෙදා සිසුන්ට කරුණු රැස් කිරීමට අවස්ථාව සලස්වන්න. කණ්ඩායම් ක්‍රියා-කාරකම් අවසානයේ දී වෙළඳ පොළ පිළිබඳ එක් එක් කණ්ඩායමේ අදහස් දැක්වීමට අවස්ථාව සලස්වන්න. එම අදහස් ද උපයෝගි කර ගනිමින් භාණ්ඩයක් මිලදී ගැනීමේ දී ඒවායේ ප්‍රමිතිය පිළිබඳ ව විමසිලිමත් වීම සහ තමන්ගේ ආර්ථික තත්ත්වයට සරිලන ලෙස ගුණාත්මක භාණ්ඩ තෝරා ගැනීම පිළිබඳ අවධාරණය කරන්න.

## ක්‍රියාකාරකම 2

භාණ්ඩ මිලදී ගැනීමේ දී සහ විකිණීමේ දී සැලකිලිමත් විය යුතු ප්‍රමිති පිළිබඳ අවධානය යොමු කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා සිසුන් යොමු කරන්න.

කලින් සිසුන් දැනුවත් කර සබන්, කිරිපිටි, ටින්මාලු, දත්බෙහෙත්, වැනි විවිධ වර්ගයේ භාණ්ඩවල ඇසුරුම් අදාළ දිනයේ දී රැස් කර ගන්න.

පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කර එක් එක් වර්ගවලට අයත් ඇසුරුම් කණ්ඩායම්වලට වෙන් කර දෙන්න.

ඒ අනුව පහත කරුණු කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරන්න.

- කල් ඉකුත්වීමේ දිනය, නිෂ්පාදිත දිනය
- භාණ්ඩයේ මිල
- භාණ්ඩයේ ප්‍රමාණය හා සංයුතිය (බර/පරිමාව/දිග)
- නිවැරදි ලෙස ඇසුරුම් කර ඇති ආකාරය
- පිළිගත් ගුණාත්මක භාණ්ඩයක් බවට සාක්ෂි (තත්ත්ව සහතිකය) S L S, I S O
- වෙළෙඳ නාමය, වෙළෙඳ ලකුණ, නිෂ්පාදිතයාගේ නම හා ලිපිනය
- පෝෂණීය වටිනාකම්/ අඩංගු දේවල්
- භාවිත කිරීමට උපදෙස්
- චෝදනා ඉදිරිපත් කිරීමට ලබා දී ඇති තොරතුරු (දුරකතනය, ලිපිනය)

භාණ්ඩවල ප්‍රමිතිය ගැන කණ්ඩායම් අදහස් පන්තියට ප්‍රකාශ කිරීමට අවස්ථා සලස්වන්න. සිසුන්ට නිදහස් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දී ඒවායින් වැදගත් අදහස් ද උපයෝගී කරගෙන භාණ්ඩ මිලදී ගැනීමේ දී ද, විකිණීමේ දී ද ප්‍රමිතිය පිළිබඳ සැළකිය යුතු කරුණු සිසුන්ට වැටහෙන ලෙස අවධාරණය කරන්න.

**SLS** යන ඉංග්‍රීසි අකුරු තුන සහිත භාණ්ඩ හා ද්‍රව්‍ය පරිභෝජනයට සුදුසුයි යන්න හඳුනා ගැනීමේ සහතිකයක් සේ සැලකිය හැකිය. ඔබ ප්‍රදේශයේ වෙළෙඳ සැල්වල ඇති ආහාර පාන අතරෙන් **SLS** ලාංඡනය සහිත ආහාර පාන මොනවා දැයි සොයා බැලීමට සිසුන් යොමු කරන්න. එම ලාංඡනය සහිත ආහාර පානවල නම් ලැයිස්තුවක් ලිවීමට කණ්ඩායම්වලට පවරන්න.

## ක්‍රියාකාරකම 3

වෙළෙඳ පොළේ විකිණීමට ඇති සමහර භාණ්ඩ හා ද්‍රව්‍ය නියමිත ප්‍රමිතියෙන් තොර විය හැකි ය. එවැනි භාණ්ඩ/ද්‍රව්‍ය මිලදී ගැනීමේ දී අප සැලකිලිමත් විය යුතු බව අවධාරණය කරන්න.

උදාහරණ :

තේ කොළ, සබන් වර්ග, ගෘහ භාණ්ඩ, විදුලි උපකරණ

ද්‍රව්‍යයක ගුණාත්මක තත්ත්වය නිවසේ දී ම පරීක්ෂා කළ හැකි පරීක්ෂණයක් සඳහා උදාහරණයක් පහත දැක්වේ. මෙම පරීක්ෂණය පන්ති කාමරයේ දී සිසුන් ලවා අත්හදා බැලීමට අවස්ථාව ලබා දෙන්න.

අවශ්‍ය ද්‍රව්‍ය :

- වෙළෙඳ පොළේ ඇති තේ කොළ වර්ග කිහිපයක්
- අවර්ණ වීදුරු කිහිපයක්
- සිසිල් ජලය

වීදුරු කිහිපයක් ගෙන එක් එක් වීදුරුවකට ජලය දමා ඒ මත තේ කොළ සාම්පලයක් බැගින් වන සේ වෙන වෙන ම දමන්න. ජලය මතු පිට සැනෙකින් තද දුඹුරු පැහැයක් ඇති වී පසුව එම වර්ණය ක්‍රමක්‍රමයෙන් ජලය තුළ විසිරී යන්නේ දැයි සෝදිසි

කරන්න. මෙබඳු වර්ණයක් කෘතිම වර්ණ ගැන්වූ තේ කොළවලින් ලැබේ. ඉක්මනින් ජලය වර්ණවත් වීමක් ගුණාත්මක බවෙන් ඉහළ තේ කොළවලින් නොලැබේ.

වෙළෙඳ පොළේ ඇති තවත් ද්‍රව්‍ය යොදා ගනිමින් එහි ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා මෙවැනි පරීක්ෂණ කිරීමට සිසුන් යොමු කරන්න.

## ක්‍රියාකාරකම 4

සිසුන් ලබා ගත් අත්දැකීම් ඔස්සේ භාණ්ඩ විකිණීම හා මිලදී ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින් පාසල තුළ වෙළෙඳ පොළක් පැවැත්වීමට සිසුන් යොමු කරන්න.

පහළ ශ්‍රේණිවල දී ද වෙළෙඳ පොළක් පවත්වා සිසුන්ට අත්දැකීම් තිබිය හැකි ය. එහෙත් මෙම ක්‍රියාකාරකමේ දී මෙතෙක් තේමාව ඇසුරෙන් ලද අත්දැකීම් උපයෝගි කරගෙන වඩාත් ගුණාත්මක තත්ත්වයෙන් භාණ්ඩ විකිණීමට යොමු කරන්න. භාණ්ඩවල බර හෝ ප්‍රමාණය, නිෂ්පාදිත දිනය, මිල, කල් ඉකුත්වීමේ දිනය (දළ වශයෙන් නිමානය කර) ආදිය සඳහන් කිරීම අත්‍යාවශ්‍ය බව පහදා දෙන්න. භාණ්ඩ මිලදී ගැනීමේ දී ද ප්‍රමිතිය පිළිබඳ සොයා බැලීමට හා ගෙවන මුදලට සරිලන වටිනාකමක් ඇත්දැයි විමසා බැලීමට යොමු කරන්න.

## ක්‍රියාකාරකම 5

වෙළෙඳ පොළ ඇසුරෙන් ලබා ගත් අත්දැකීම් පිළිබඳ කතා බහ කිරීමට අවස්ථාව සලස්වන්න.

''වෙළෙඳ පොළ'' මාතෘකාව සඳහා මිශ්‍ර මාධ්‍ය ඇසුරෙන් ප්‍රකාශන චිත්‍රයක් නිර්මාණයට උපදෙස් දෙන්න. මේ සඳහා වර්ණ සායම්, වර්ණ කඩදාසි, පරිසරයේ ඇති ශාක කොටස් වැනි දෑ යොදා ගැනීමට යොමු කරන්න.

යම් සිත් ගත් සිද්ධියක් නිරූපණය කිරීමට චිත්‍ර කතාවක් නිර්මාණය කරන්න. රූප රාමු වෙන් කර ගැනීමට සහ දෙබස් හසුරුවා ගැනීමට සිසුනට අවශ්‍ය උදවු ලබා දෙන්න.

වෙළෙඳ පොළේ අත්දැකීම් පිළිබඳ චලන ගවේෂණ ඉදිරිපත් කිරීමට ක්‍රීඩා පිටියේ නිදහස් තැනකට සිසුන් යොමු කර පහත සඳහන් ප්‍රශ්න ඉදිරිපත් කරන්න.

උදාහරණ :

- කාටද පුළුවන් බර කඳක් අරගෙන යනවා මෙන් යන්න
- කාටද පුළුවන් ලොකු පෙට්ටියක් හිස මත තබා ගෙන යනවා මෙන් යන්න
- කාටද පුළුවන් හාල් ගෝනියක් පිටේ තබා ගෙන යනවා මෙන් යන්න
- කාටද පුළුවන් බයිසිකලයක පිටුපස බර බැඳගෙන පදිනවා වගේ පදින්න
- කාටද පුළුවන් අත් දෙකෙන් ම බර මලු එල්ලා යනවා වගේ යන්න

සිසුන්ට නිර්මාණාත්මක ව චලන ඉදිරිපත් කිරීමට දිරිදෙන්න. ගවේෂණය කරන ලද චලන වඩාත් නිර්මාණාත්මක ව ඉදිරිපත් කළ විට එය අගය කරන්න.

සති අන්තයකට පෙර දිනයක දී පහත දැක්වෙන පැවරුම සඳහා සිසුන් යොමු කරන්න.

### පැවරුම

සති අන්ත දිනයක ගෙදර දොර පරිහරණය කරන භාණ්ඩ හා නිවසේ දී ලැබෙන සේවා පිළිබඳ අධ්‍යයනය කරන්න.

ගෙදර දොර පරිහරණය කරන භාණ්ඩ ලෙස

- කුස්සියේ භාවිත කරන භාණ්ඩ හා උපකරණ
- ගේ දොර අලංකාර කිරීමට යොදා ගෙන ඇති භාණ්ඩ
- ගේ දොර පවිත්‍ර කිරීමට යොදාගෙන තිබෙන භාණ්ඩ හා උපකරණ

නිවසේ දී ලැබෙන සේවා ලෙස

- විදුලිය ලබා ගැනීම
- බීමට, නෑමට හා සේදීමට ජලය ලබා ගැනීම
- දුරකථන වැනි සන්නිවේදන පහසුකම් ලබා ගැනීම

එම භාණ්ඩ හා උපකරණවල තත්ත්වය නිරීක්ෂණය කර වාර්තා කරගෙන පැමිණීමට උපදෙස් දෙන්න. නිවසේ දී රැස් කරන ලද තොරතුරු පන්තියට රැගෙන ඒමට යොමු කරන්න.
පන්තිය සුදුසු පරිදි කණ්ඩායම්වලට යොමු කර නිවසේ දී භාවිත වන භාණ්ඩ හා උපකරණ කාර්යක්ෂම ව හා ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ ව සාකච්ඡා කිරීමට යොමු කරන්න.

| භාණ්ඩය/ උපකරණය / සේවාව | දැනට දැකිය හැකි තත්ත්වය |
|---|---|
| උදාහරණ : කැත්ත | කඩතොළු වී ඇත. මලකඩ කා ඇත. අත්පාවල හැපුණොත් තුවාල විය හැකි ය. |
| ඉදල | පැත්තක ඉරටු වැඩියෙන් ගෙවී ඇත. කුස්සියේ බිත්තියට හේත්තු කර තිබේ. වැස්සට ඉරටු තෙමී ඇත. |
| ජලය ගෙනෙන කළය | ඇල්වතුර බීමට ගනු ලැබේ. කළය පිටත ජලය ඉහිරී අපතේ ගිය බව පෙනේ. |
| විදුලිය | එළිය වැඩි සාමාන්‍ය බල්බ යොදා ඇත. රෑ ගෙදර සෑම කාමරයක ම බල්බ් දැල්වේ. විදුලිය නාස්ති වන බව පෙනේ. |

සෑම කණ්ඩායමක් ම සාකච්ඡා කරන ලද තොරතුරු පහත දැක්වෙන ආකාරයට වගුවක සටහන් කිරීමට සිසු කණ්ඩායම් යොමු කරන්න.

| භාණ්ඩය/ උපකරණය / සේවාව | කළ හැකි වෙනස්කම් |
|---|---|
| උදාහරණ : කැත්ත | කඩතොළු නැතිවන ලෙස මුවහත් කිරීම. මල නොකන ලෙස මුව අත ආරක්ෂා වන ලෙස, අත් පා වල නොගැටෙන ලෙස රාක්කයේ තැබීම. |
| ඉදල | සමබර ව ඉදල ගෙවී යන ලෙස නිවැරදි ව අතුගෑම. ඉරටු නොතෙමෙන ලෙස පිටුපස බිත්තියක එල්ලා තැබීම. |
| ජලය ගෙනෙන කළය | ජලය ගෙනෙන කළය තැබීමට නිසි තැනක් සුදානම් කිරීම උණුකර නිවා ගත් ජලය කළයට දැමීම වතුර ඉතිරි නොයන ලෙස අවශ්‍ය ප්‍රමාණයට පමණක් වතුර බොන වීදුරුවකට නවා ගැනීම. |
| විදුලිය | පිලිස්සියන සාමාන්‍ය බල්බ් එකක් වෙනුවට CFL බල්බ් දැමීම සඳහා දිනපතා කැටයකට මුදල් දමා මුදල් ඉතිරි කිරීම. රාත්‍රියේ අවශ්‍ය තැන්වල පමණක් බල්බ් දැල්වීම. එතැනින් ඉවත් වන විට ම බල්බය නිවා දැමීම |

මේ ආකාරයට එක් එක් කණ්ඩායම් කාර්යක්ෂම ව හා ඵලදායි ලෙස භාවිත කිරීමට ගත හැකි පියවර ඉදිරිපත් කරන විට ගුරුවරයාගේ අදහස් ද එකතු කරමින් එවැනි පියවර සංවර්ධනය කිරීමට දිරිමත් කරන්න.
අවසානයේ තම තමන්ගේ නිවෙස්වල භාණ්ඩ, උපකරණ හා සේවා කාර්යක්ෂම ව හා ඵලදායි

ලෙස පරිහරණය කිරීම සඳහා ගත හැකි පියවර ඇතුළත් වගුවක් පිළියෙල කර ගැනීමට සෑම සිසුවකු ම යොමු කරන්න. ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න. තම වගුවේ ඇතුළත් පියවර නිවසේ දී ක්‍රියාත්මක කිරීම සඳහා සිසුන්ට දෙමාපියන්ගෙන් ලැබිය යුතු සහයෝගය පිළිබඳ දෙමාපිය හමුවක දී පහදා දෙන්න.

## ක්‍රියාකාරකම 6

ක්‍රියාකාරකම් අවසානයේ සිසුන්ගේ අදහස් ද උපයෝගී කර ගනිමින් සාකච්ඡාවක් මෙහෙයවන්න. ඒවායින් පහත සඳහන් අදහස් මතු කරන්න.

- සෑම සේවාවක් සඳහා ම සම්පත් උපයෝගී වේ.
- ඒවායේ පැවැත්මට වියදමක් දැරීමට සිදුවේ.
- වියදම් පියවීම සඳහා සරිලන මිලක් ගෙවිය යුතු ය.
- සේවාව ලබා දෙන්නා ද ගෙවූ මිලට සරිලන සේවාවක් සැපයිය යුතු ය.
- අපට නොමිලේ ලැබෙන සේවාවලට ද (අධ්‍යාපන, සෞඛ්‍යය) වියදම් වේ.
- සමහර සේවාවලට අපට ගෙවීමට සිදුවන්නේ ඉතා අඩු මිලකි. (උදාහරණ : ලංගම බස් රථවල වාර ප්‍රවේශ පත්‍ර)
- නොමිලයේ සහ අඩුමිලට අපට ලැබෙන සේවා සඳහා වියදම් දරන්නේ රටේ ජනතාවයි.
- එබැවින් එවැනි සේවා ආරක්ෂා කරමින් පවත්වා ගෙන යාම ද ඒවායින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම ද අපේ යුතුකමකි.

සේවාවන් ලබා ගැනීමේ දී සහ සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ ව අවධාරණය කිරීම සඳහා ඒ ඒ සේවාවන්ට සම්බන්ධ පුද්ගලයන් කලින් දැනුවත් කර පන්තියට ආරාධනා කරන්න.

උදාහරණ :

- අධ්‍යාපන සේවය — විදුහල්පතිතුමා/ නියෝජ්‍ය විදුහල්පතිතුමා
- සෞඛ්‍ය සේවය — පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි/මහජන සෞඛ්‍ය පරීක්ෂක
- තැපැල් සේවය — තැපැල්කරු/තැපැල් ස්ථානාධිපති
- ගමනාගමන සේවය — බස් රියදුරු/කොන්දොස්තර (ලංගම මෙන් ම පෞද්ගලික)
- විදුලි සේවය — ලංකා විදුලි බල මණ්ඩලයේ නිලධාරීවරයකු/නිලධාරිනියක

මෙවැනි නිලධාරින් කිහිප දෙනකුට පමණක් ඇරයුම් කරන්න. අනෙකුත් සේවා ගැන පත්‍රිකා හෝ තොරතුරු ලියූ කාඩ්පත් පන්තියේ කණ්ඩායම්වලට ඉදිරිපත් කරන්න.

උදාහරණ :

ජල සම්පාදන සේවා
දුරකතන සේවා

## ක්‍රියාකාරකම 7

වෙළෙඳ පොළ සම්බන්ධ ව පහත ගී ගායන හා රංගනයට අවස්ථාව ලබා දෙන්න.

*සිනි කෝපි තේ කිරිතේ*
*වෙරළු මසන් ජමනාරං*
*කොස් දෙල් පොල් මිරිස් ගන්න*
*එන්න// මෙන්න අපේ සීනිබෝල හෝටලේ*

*පොඩි බණ්ඩයි මුදලාලියි*
*ගණන් ලියයි පොඩි හාමි*
*පිගන් කෑලි සල්ලි අරං*
*එන්න// මෙන්න අපේ සීනිබෝල හෝටලේ*

*බයිසිකලෙන් කාර් එකෙන්*
*අශ්ව කරත්තෙන් ආවත්*
*එක මේසේ කෑම කන්න*
*එන්න// මෙන්න අපේ සීනිබෝල හෝටලේ*

පද රචනය - සුනිල් ආරියරත්න

වෙළෙඳ පොළ තුළ සිදුවන සාධාරණ හා අසාධාරණ සිදුවීම් ඇතුළත් නාට්‍යයක් (චරිතාරෝපිත) ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

# 5 පැළෑටි හා ගස්වැල්

විවිධත්වය සහිත ගස්වැල්වල රට පුරා ව්‍යාප්තව පවත්නා නිසා අපේ රටේ පරිසරය සුන්දර ය. මේ ගස්වැල් බොහොමයක් ආහාර සපයා දීමෙන් ද, ඖෂධ සපයාදීම වශයෙන් ද අපේ පැවැත්මට දායක වෙයි. විශේෂ අවධානයකින් රැක බලා ගත යුතු ගස් ද වෙති. එබැවින් ගස්වැල්වල පැවැත්මට දායක වෙමින් ඒවා රැක ගැනීමට දායක වීම අපේ යුතුකමකි. ඒ සඳහා පදනම වන හුරුකම් ලබා දීම අපේක්ෂා කරමින් මෙම තේමාව සැලසුම් කර ඇත.

## නිපුණතා

- ✶ අපේ පැවැත්ම සඳහා උපකාරීවන ආහාර පාන සපයා ගැනීමට ගස්වැල්වල ඵලවලින් ලැබෙන ප්‍රයෝජන අගයමින් නිසි පරිදි භාවිත කරයි.
- ✶ ගස්වැල්වල ඵලවල විවිධත්වය පිළිබඳ විමසිලිමත් ව අධ්‍යයනය කරමින් ඒවායේ පැවැත්මට දායක වෙයි.
- ✶ විශේෂ අවධානයක් යොමු කළ යුතු පැළෑටි හා ගස්වැල් සංරක්ෂණය කිරීමට දායක වෙයි.
- ✶ අවට පරිසරයේ පැළෑටි හා ගස්වැල්වල විවිධත්වය අගය කරමින් ඒවා පවත්වා ගැනීමට දායක වෙයි.
- ✶ ගස්වැල් හා පැළෑටි සම්බන්ධ ව ඵලදායී නිර්මාණ කරයි.
- ✶ ශාක ආරක්ෂා කිරීමේ වැදගත්කම මතු වන ගායනා හා රංගනවල නිරත වෙයි.
- ✶ ශාකවල විවිධත්වය මතු වන නිර්මාණාත්මක ක්‍රීඩාවන්හි නියැලෙයි.
- ✶ ගස්වැල් ඇසුරින් මානසික සුවය ලබා ගනිමින් වින්දනයක් ලබයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

තම ප්‍රදේශයේ වැඩෙන ශාක (ආහාර, ඖෂධ, වෙනත් වටිනා ශාක) පිළිබඳ සිසුන් අත්දැකීම් ලබා ඇත. එම අත්දැකීම් පාදක කර ගනිමින් ''ගස්වැල් පැළෑටි'' නමින් ප්‍රදර්ශනයක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ගන්න. තේමාව ආරම්භයේ දී එසේ සැලසුම් කර ගැනීම අවශ්‍ය වන අතර පහත සඳහන් කරුණු කෙරෙහි අවධාණය යොමු වීම අවශ්‍ය වේ.

- ප්‍රදර්ශනය කරන ශාක තෝරා ගැනීම.
  උදාහරණ : ආහාර බෝග පැළෑටි, ඖෂධ පැළෑටි ... වැනි
- ප්‍රදර්ශනය කරන ශාක ලේබල් කිරීම.
- ශාකය සුදුසු භාජනයක (ටින් එකක හෝ වෙනත් සුදුසු භාජනයක) සිටුවා ගෙන ඒම.
- රැගෙන එන ශාකය සිසුන්ට හසුරුවා ගත හැකි ප්‍රමාණයේ එකක් වීම.
- පන්තියට ගෙනෙන විවිධ ශාක සුදුසු ස්ථානයක ක්‍රමානුකූල ව ස්ථාන ගත කිරීම.
- සකස් කර ඇති ගෙවත්තේ/එළිමහනේ සුදුසු ස්ථානයක ප්‍රදර්ශනය පැවැත්වීම.

- ඵල (ගෙඩි, කරල්) හට ගන්නා ශාක රැගෙන එන සිසුන්ට හැකිනම් ඒවායේ ඵලයක් ද රැගෙන ඒමට උපදෙස් දීම.
- ප්‍රදර්ශනය අවසන් වූ පසු එම ශාක ගෙවත්තේ සිටුවීම.

මෙවැනි සැලැස්මක් සහිත ව ''ගස්වැල් පැළෑටි'' වැනි සුදුසු නමක් සහිත ප්‍රදර්ශනයක් පැවැත්වීමට කටයුතු සැලසුම් කර ගන්න.

ශාකවලින් ඵල ලබා ගන්නේ කෙසේ ද යන්න (ගෙඩි, කරල්, අල වශයෙන්) අත්දැකීම් තුළින් කණ්ඩායම තුළ සාකච්ඡා කිරීමට යොමු කරන්න. සියලු ම නිරීක්ෂණ ද ඇතුළත් වන සේ වාර්තාවක් සකස් කර පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න. වාර්තාවක් සකස් කිරීමේ දී විවිධත්වයක් සහිත ව ඉදිරිපත් කිරීමේ වැදගත්කම අවධාරණය කරන්න. සිසුන් හඳුනාගන්නා ලද ශාකවලින් ලැබුණ ප්‍රයෝජන පිළිබඳ ව කතා බහ කරන්න.

උදාහරණ :
- ආහාර වශයෙන්
- ඖෂධීය පානයක් ලෙස
- රසවත් පානයක් ලෙස
- අලංකරණය සඳහා
- ගෘහ නිර්මාණ, ගෘහ භාණ්ඩ සඳහා

ප්‍රදර්ශනය වූ සමහර ශාක සුදුසු පරිදි පාසලේ ම අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කරන්න. සමහර ශාක පාසල් ගෙවත්තේ මෙන් ම පාසල් වත්තේ ද සිටුවිය හැකි ය.

## ක්‍රියාකාරකම 2

සිසුන් කණ්ඩායම් කරන්න. පෙර දින ගෙන ආ ඵල (ගෙඩි, කරල්) කණ්ඩායම් අතර බෙදා දෙන්න. පළමුව එහි බාහිර ස්වරූපය පමණක් නිරීක්ෂණයට යොමු කරන්න.

උදාහරණ : වර්ණය කුමක් ද?
කරලක් ද? ගෙඩියක් ද?
මතුපිට ස්වභාවය කෙබඳු ද?

කරල් හා ගෙඩි දෙකට කැපීමට යොමු කරන්න. (ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වන්න)

කපන ලද කරල් හා ගෙඩි පහත සඳහන් ආකාරයට නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- බීජ පිහිටා ඇති ආකාර
- බීජවල ප්‍රමාණය, හැඩය, පැහැය
- බීජ ප්‍රමාණය
- ආහාරයට ගත හැකි ආකාරය

එම නිරීක්ෂණ වාර්තා කිරීමට මග පෙන්වන්න.

උදාහරණ :

| ආහාරයට ගන්නා කරල් | ආහාරයට ගන්නා ගෙඩි | බීජ වශයෙන් ආහාරයට ගන්නා වර්ග | බීජ ඉවත් කර ආහාරයට ගන්නා වර්ග |
|---|---|---|---|
| දඹල<br>මෑ<br>කරවිල<br>බණ්ඩක්කා<br>බෝංචි | අන්නාසි<br>කෙසෙල්<br>වම්බටු | මුං<br>කව්පි<br>වී<br>බඩඉරිඟු | වට්ටක්කා<br>කැකිරි, අඹ<br>ඵළබටු<br>ගස්ලබු<br>පතෝල |

- සකස් කරන ලද වාර්තා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව සලස්වන්න.
- ගස්වැල්වල හැදෙන ගෙඩි හා කරල් අපිට නිරෝගී ව සිටීමට හා ක්‍රියාකාරී ව සිටීමට උදවු වන බව අවබෝධ වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.
- අපේ ආහාරයට මෙන් ම අපේ රෝග සඳහා ඖෂධ වශයෙන් ද ගෙඩි හා කරල් උදවු වන බව ද අවධාරණය කරන්න.
- පන්තියට ගෙන එන ලද විවිධ ඵල වර්ග ඇසුරෙන් සකස් කර ගත් ආහාරයක් බුක්ති විඳීමට අවස්ථාව දෙන්න. මේ සඳහා අවශ්‍ය නම් දෙමාපියන්ගේ සහයෝගය ලබා ගන්න.

  උදාහරණ :

  සිසුන් විසින් සකස් කරන පලතුරු සලාදයක්, දෙමාපිය සහාය ඇති ව සකස් කළ මුං ඇට කිරිබතක්

මුල් දින දෙකෙහි දී ලත් අත්දැකීම් පදනම් කර ගනිමින් කුඩා පොත් පිංචක් බැගින් සකස් කිරීමට කණ්ඩායම්වලට පවරන්න.

## ක්‍රියාකාරකම 3

ගෙඩි, කරල් හා බීජ වර්ග නිරූපණය වන වෙස් මුහුණු නිර්මාණය කිරීමට සිසුන් යොමු කරන්න. එම වෙස් මුහුණු පැළඳගෙන අදාළ ගෙඩිය හෝ කරල හෝ බීජය හෝ පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න. ඒ සඳහා අවශ්‍ය යොමු කිරීම පෙර දින කළ යුතුවේ.

උදාහරණ :

- තමා හටගන්නේ (ඉපදෙන්නේ) ගසක ද? පැළයක ද? වැලක ද?
- ප්‍රමාණය, වර්ණය ආදී බාහිර ස්වභාවය
- ඇතුළත ඇති බීජ ප්‍රමාණය
- එම බීජ ප්‍රයෝජනයට ගන්නේ ආහාරයට හෝ අලුත් ගස් සෑදීමට ද?
- අමුවෙන් ආහාරයට ගත හැකි ද? නැත්නම් ආහාරයට ගත හැක්කේ පිසීමෙන් හෝ වෙනත් ක්‍රමවලින් ද? නැත්නම් දෙ ආකාරයෙන් ම ද?

උදාහරණ :

කුරක්කන් - පිටි කර විවිධ ආහාර ලෙස

මුං - ආහාරයක් වශයෙන් මෙන් ම පිටි කර රස කැවිලි සකස් කර ගැනීමෙන්

## ක්‍රියාකාරකම 4

ගස්වැල්වල ඇති ස්වභාවික පැහැයන් අවබෝධ කර ගැනීමට සලස්වා එම අත්දැකීම් ඇසුරින් ගෙවත්තක් චිත්‍රයට නැගීමට අවස්ථාව දෙන්න. පාසල් වත්තේ විවිධ ගස්වල කොළ නිරීක්ෂණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. හොඳින් නිරීක්ෂණය කිරීමට උපදෙස් දෙන්න.

උදාහරණ :

- ළපටි කාලයේ පැහැය
- මෝරපු කාලයේ පැහැය
- වියළීමේ දී පැහැය

සිසුන් කුඩා කණ්ඩායම් කිහිපයකට බෙදන්න. ලොකු ඩිමයි කඩදාසියක් පැස්ටල්/දිය සායම් දෙන්න. කරන ලද නිර්මාණ ප්‍රදර්ශනය කරමින් අගයන්න.

කඩදාසි පල්ප්/මැටිවලින් ආහාරයට ගන්නා ගෙඩි වර්ග නිර්මාණය කිරීමට සිසුන් යොමු කරන්න. ගෙවත්ත පිළිබඳ චිත්‍ර සිරස් ව ප්‍රදර්ශනය වන අතර එම ගෙවත්තෙන් ලබා ගන්නා ගෙඩි හා කරල් වර්ගවල කඩදාසි පල්ප්/මැටි ආකෘති තිරස් ව තබා ඇති ප්‍රදර්ශනයක් සකස් කරන්න. දෙමාපියන් හා පාසල් ප්‍රජාවට ප්‍රදර්ශනයට ආරාධනා කරන්න.

## ක්‍රියාකාරකම 5

පහත සඳහන් විවිධ බීජ හා ගෙඩි වර්ග පන්තියට ගෙන එන ලෙස සිසුන් දැනුවත් කරන්න.

උදාහරණ :

මෝරන ලද බණ්ඩක්කා කරලක්, දඹල කරලක්, මෑ කරලක්

වී කරලක්, බඩඉරිඟු කරලක්

අඹ ගෙඩියක්, දං, කොස් ඇට, කපු පුහුලන් කුඩළු, පෙනෙල

හොර,

වරා, පුළුන්, මොනරකුඩුම්බිය

තුත්තිරි, වම් ඇපල,

රබර්, මදටිය, මුරුංගා

පුවක්

සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පන්තියට ගෙන ආ බීජ වර්ග හා ගෙඩි වර්ග එකතුවක් බැගින් කණ්ඩායම්වලට ලබා දෙන්න. එක් එක් කණ්ඩායම එම බීජ හා ගෙඩි නිරීක්ෂණයට යොමු කර එම බීජ හා ගෙඩි ඇසුරෙන් පහත දැක්වෙන දෑ අත්හදා බැලීමට සිසුන් යොමු කරන්න. ඒ සඳහා වන ප්‍රශ්නවලට යොමු කරන්න.

- වතුරේ දැමූ විට කුමක් වෙයි ද?
- සුළඟට හසුවූ විට කුමක් වේ ද?
- රෙදි කෑල්ලක හෝ ඇඳුමේ හෝ ගෑවුණු විට කුමක් වේ ද?
- කරල් පිපිරුන විට කුමක් වෙයි ද?

මෙම ක්‍රියාකාරකම් කරමින් ලබන අත්දැකීම් සමග පැළෑටි හා ගස්වැල් ව්‍යාප්ත වන අන්දම පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න. ඒවා ව්‍යාප්ත වන්නේ තමාගේ වර්ගය තව දුරටත් රැක ගැනීමට බව

අවධාරණය කරන්න. එක් එක් ක්‍රමයට ව්‍යාප්ත වන අන්දමට ඒවායේ බීජ අනුවර්තනය වන ආකාරය පිළිබඳ ව විස්තර ඇතුළත් කර සැබෑ ද්‍රව්‍ය හෝ පින්තූර හෝ එක්කර පැළෑටි හා ගස්වල පැතිරීම පිළිබඳ බිත්ති පුවත් පතක් නිර්මාණය කිරීමට සිසුන්ට දිරි දෙන්න.

## ක්‍රියාකාරකම 6

සිසුන් කණ්ඩායම් කර කණ්ඩායමකට නායකයකු බැගින් පත් කර ගැනීමට අවස්ථාව දෙන්න. එක් සිසුවෙක් නායකයා කර අනෙක් අය සාමාජිකයන් කරන්න. කණ්ඩායම් මෙසේ නම් කළ හැක.

★ සතුන් හෝ මිනිසුන් හෝ මගින් ව්‍යාප්ත වන බීජ
★ සුළඟින් ව්‍යාප්ත වන බීජ
★ කරල් පිපිරී ඇට වැටීමෙන් ව්‍යාප්ත වන බීජ
★ ජලයේ පා වී ගොස් ව්‍යාප්ත වන බීජ
★ සතුන්ගේ හෝ ඇඳුම්වල හෝ ඇල වී ව්‍යාප්ත වන බීජ

එක් එක් කණ්ඩායමට අත් රූකඩ හෝ සැබෑ ද්‍රව්‍ය හෝ තොප්පි හෝ සාදා ගෙන එම බීජ වර්ගයට ආරෝපණය වීමට අවස්ථාව ලබා දෙන්න.

නායකයා තම කණ්ඩායම හඳුන්වා දීමට යොමු කරන්න. ඒ අයගේ තොරතුරු ඉදිරිපත් කිරීමට උදවු කරන්න.

උදාහරණ :

සතුන් මගින් බීජ ව්‍යාප්ත වන කණ්ඩායම
අඹ, ගස් ලබු, පතෝල, වම්බටු

මගේ නම අඹ

මම ලොකු ගහක හැදෙන්නේ,
මම හොඳ පලතුරක්
මට සහෝදරයෝ ගොඩක් ඉන්නවා
මාව ඉඳවල ආහාරයට ගන්නෙ
උයල ආහාරයට ගන්නත් පුළුවන්
මාව ආහාරයට ගන්න කුරුල්ලොත්
මිනිසුනුත් කැමතියි. ඒ අය මාගේ
ඇතුළත තිබෙන ඇටය හිටවනවා. එහෙම තමයි
මගේ අලුත් ගස් හැදෙන්නේ

මෙවැනි විස්තර කිරීම් මගින් පැළෑටි හා ගස්වැල්වල ව්‍යාප්තිය පිළිබඳ ව දැනගත් කරුණු තහවුරු කරන්න.

මෙවැනි ඉදිරිපත් කිරීම්වල දී පන්තියේ අනෙක් සිසුන්ට ප්‍රශ්න කිරීමට ද අවස්ථාව සලස්වන්න.

## ක්‍රියාකාරකම 7

පරිසරයෙන් සොයා ගත් විවිධ බීජ, ඇට, කරල්වලින් විවිධ නිර්මාණ කිරීමට සිසුන් යොමු කරන්න. මෙහි දී ආහාරයට ගන්නා බීජ, ඇට, කරල් නොව සුලභ ව සොයා ගත හැකි මුදල් නාස්තියක් නොවන ගෙඩි/කරල්/ඇට වර්ග තෝරා ගන්න.

උදාහරණ :

- කදුරු ගෙඩිවලින් සතුන් සෑදීම
- රබර් ඇට හා පොතුවලින් විවිධ නිර්මාණ
- විවිධ ඇට හා බීජ ආදිය උපයෝගී කරගෙන මල්වල හැඩ නිර්මාණය කිරීම.

මෙම නිර්මාණ නිම වූ පසු සිසුන් අගය කරමින් පැළෑටි හා ගස්වැල්වලට ආදරය කිරීමේ වැදගත්කම අවධාරණය කරන්න.

## ක්‍රියාකාරකම 8

අපට ගස්වැල්වලින් ලැබෙන ප්‍රයෝජන පිළිබඳ ව අවධාරණය කිරීමට පහත දැක්වෙන ක්‍රියා-කාරකම්වලට සිසුන් යොමු කරන්න.

පාසල් වත්තේ විශාල ගස් සෙවනකට සිසුන් සමඟ යන්න. මේ යන ගමනේ දී තදින් හිරු රශ්මිය වැටෙන මාර්ගයක් තෝරා ගන්න. අව්වෙන් ගොස් ගස් සෙවනට ගිය විට සිසුන්ට දැනෙන වෙනස පිළිබඳ ව සාකච්ඡා කරන්න.

- ගස් සෙවනේ දී ඇති සිසිලස ගැන කතා කරන්න.
- ගස්වල කොළ සෙලවෙන විට ඇසෙන රිද්මයට සවන් දීමට සලස්වන්න. පාසල් වත්තේ ඒවැනි

ගස්වැල් ඇත්නම් ඒවා රැක ගැනීමේ වැදගත්කම ද අවධාරණය කරන්න.

- ගසට නිසල ව, නිශ්ශබ්ද ව දෑස් වසා ගෙන සිටීමට සලස්වන්න. මනසට දැනෙන සුවය අත්විඳීමට ඉඩ සලසන්න.

අපට ගස්වලින් ලැබෙන තවත් ප්‍රයෝජන ගැන පැවසීමට සිසුන්ට අවස්ථාව සලසන්න. සිසුන්ගේ සිතට ගලා ආ අදහස් පෙළ ගස්වන්න.

උදාහරණ :

★ ගස්වැල් අපට ආහාර පාන ලබා දෙයි.
★ ගස්වැල් අපට ඖෂධ ලබා දෙයි.
★ ගෙවල් සෑදීමේ දී වහලට, දොර ජනෙල්වලට යෙදෙයි.
★ ගෘහ භාණ්ඩ සෑදීමට භාවිත වේ.
★ සතුන්ගේ ආහාරවලට ප්‍රයෝජනවත් ය.
★ පරිසරයේ සුන්දරත්වය ඇති කරයි.
★ ඉන්ධන වශයෙන් භාවිත වෙයි.
★ ගස්වැල් මනස සුවපත් කරයි.

ක්‍රියාකාරකම අවසානයේ මෙවැනි ප්‍රයෝජන අගය කරමින් වැඩි දෙනකුගේ ප්‍රයෝජනය සඳහා සිසුන්ට කළ හැකි දෑ විමසන්න. එවැනි යෝජනා විමසා බලමින් පන්තියේ සැමට කළ හැකි දෙයක් ක්‍රියාත්මක කිරීමට මග පෙන්වමින් සහාය වන්න.

උදාහරණ :

සෑම සිසුවකු ම ඔසු පැළයක් රැගෙන විත් රෝපනය කරමින් පාසලේ ඔසු උයනක් සකස් කිරීම.

## ක්‍රියාකාරකම 9

තමන්ගේ උපන් දිනයක් දා සිට වූ ගස් වේ නම් ඒවා පිළිබඳ ව කතා කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

පාසල් වත්තේ, පාසල් ඉතිහාසයට සම්බන්ධ වැදගත්කමක් ඇති ගස් වේ නම් ඒවා හඳුනා ගැනීමට සලස්වන්න. ඒවා කවුරුන් විසින් කවදා සිටවා ඇති දැයි සොයා ගැනීමට දිරි දෙන්න.

තම ප්‍රදේශයේ පැරණි ම ශාකය හෝ ශාක පිළිබඳ ව හෝ සොයා බැලීමට අසා දැන ගැනීමට සිසුන් යොමු කරන්න.

තම ජීවිතයට, පාසලේ ඉතිහාසයට, පළාතේ ඉතිහාසයට හා රටේ ඉතිහාසයට සම්බන්ධ වැදගත්කමක් ඇති ගස් ගැන සිසුන් සමග සාකච්ඡා කරන්න. ඒවා රැක ගැනීමේ අගය අවධාරණය කරන්න.

## ක්‍රියාකාරකම 10

මෙම ක්‍රියාකාරකමට පෙර තම ප්‍රදේශයේ දී හඳුනා ගත හැකි ඒකදේශික ශාක මොනවා දැයි සෙවීමට සිසුන් යොමු කරන්න.

ඒකදේශික ශාක යනු ජන්මයෙන් රටකට ආවේණික වූ පැළෑටි හා ගස්වැල් වේ.

උදාහරණ :

ආරිද්ද, බදුල්ල, ගෝනවැල්, කෙකු, වල් කඳුරු, කෙකටිය, අතු උඩයන්, කීන, එළගොරක, හීං බෝවිටියා, ගිරිතිල්ල, දොරණ, හොර, දුම්මල, දුන් බෙරලිය, කලු මැදිරිය, බිනර, වෙසක් මල්, ඕකෙයියා, හරන්කහ, කැකුණ, ගොඩපර, දියපර, බිං කොහොඹ, රුක්, ලේන්තැරි, මා වේවැල්, දෝතලු, වන මී ආදිය ශ්‍රී ලංකාවේ පවතින ඒක දේශික ශාකවලට උදාහරණ වේ.

ශ්‍රී ලංකාවට ඒකදේශික ශාක 830ක් පමණ හඳුනාගෙන ඇත.

සිසුන් සොයා ගත් තොරතුරු ද උපයෝගී කර ගනිමින් මෙබඳු ශාක අප රටේ උරුමයක් බැවින් අනාගත පරම්පරාව සඳහා මේවා රැක බලා ගැනීමේ වැදගත්කම මතු කරන්න. තම ප්‍රදේශයේ ඇති ඒකදේශික ශාක කිහිපයක් හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න. හැකිනම් නිරීක්ෂණයට සලස්වන්න.

ඓතිහාසික ශාක හා ඒකදේශික ශාක රැක ගැනීමට අපට කළ හැකි දේ කුමක් දැයි සාකච්ඡා කරන්න. පැරණි ශාක, ඒකදේශික ශාක පිළිබඳ ගී ගායනයට හා නිර්මාණයට යොමු කරන්න. නිර්මාණීය නාටක ඉදිරිපත් කිරීමට අවස්ථා සලස්වන්න.

උදාහරණ:

ගස් කැපීමට කැළයට මිනිසුන් කණ්ඩායමක් යයි. ගස් කපන විට ගස් කෑ ගසා හඬයි.

තමා වැනසූ විට රටේ තවත් එවැනි ගස් නැති වන බව හඬ නගා කියයි.

බේරා ගන්න යයි කෑ ගසයි. එහෙත් මිනිසුන් එය අසන්නේ නැත. ගස් කපා දමයි.

සවස ගස්වල කූඩු සාදා සිටි කුරුල්ලන් පැමිණේ. ඔවුන්ට නිවාස නැත. කුරුල්ලෝ කෑ ගසමින් එහා මෙහා පියාඹයි. ගස් යට නිවාස ලෙස පාවිච්චි කළ සිවුපා සතුන් පැමිණේ. ඔවුන් ද කෑ ගසමින් එහා මෙහා දුවයි. කැලය අද්දර ගමේ ළමයි, වැඩිහිටියන් තැනින් තැන දුර්මුඛව බලා සිටී. ගස් කොළ වියළී ගොස් ඇත. මේ අතර කවුදෝ කතා කරයි.

ගැඹුරු පසුබිම් හඬකින් ඒකදේශික ශාක, පැරණි ශාක ආරක්ෂා කිරීමේ වැදගත්කම අවධාරණය කරයි.

මෙවැනි නිර්මාණීය නාට්‍ය සාදා ගැනීම සඳහා සිසුනට අවස්ථාව දෙන්න. පහත සඳහන් කවි ගායනයට යොමු කරන්න.

*මොර හිඹුටු දන් පනා*
*අඹ දඹද ඇට බිනා*
*පළු වීර දෙබරිනා*
*කැදලි විලිකුන් ගෙනා*

| X | | X | | |
|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 |
| මො | ර | හි | ඹු | ටු |
| ද | න් | ප | නා | |
| අ | ඹ | ද | ඹ | ද |
| ඇ | ට | බි | නා | |
| ප | ළු | වී | ර | |
| දෙ | බ | රි | නා | |
| කැ | ද | ලි | වි | ලි |
| කු | න් | ගෙ | නා | |

'X' මෙම සංකේතය දක්වා ඇති තැන අත්පුඩිය ද අනිත් අංක සඳහා ඇඟිලි ද යොදාගෙන තාල තැබීමට සිසුන් යොමු කරන්න.

මෙවැනි ගීත ගායනයට හා රංගනයට ද සිසුන් යොමු කරන්න.

*පුහුල් කැකිරි වට්ටක්කා - තිබ්බටු සහ බණ්ඩක්කා*
*උදේ සවස තම්බන්නට - කටට රහයි මයියොක්කා*
*දුව පනින්ට කඳු නගින්ට - ඇස් පෙනෙන්ට කන් ඇහෙන්ට*
*කොඩොල් කඳල පොඩි කිරි අල - බතල රටල තුන් මස් අල*
*මුරුංග කංකුං ගොටුකොළ - එළබටු වම්බටු කරවිල*
*සාරණ මෑ මුකුණුවැන්න - වැටකොළු නිවිතිය පතෝල*
*කටට රහයි ඇඟට ගුණයි - එළවළු මගෙ හරි ලාභයි*
*තව ඇත්තේ හරිම ටිකයි - ගන්න ගන්න හරි වාසියි*

ගී සීපද, ගායනය - ජයලත් මනෝරත්න

පැරණි ශාක, ඖෂධීය ශාක හා ඒකදේශීය ශාකවල වැදගත්කම පිළිබඳ සාකච්ඡා කරන්න. ඒවායේ අගය රැක ගැනීමේ වැදගත්කම සහ සංරක්ෂණයට දායක වීම පිළිබඳ අවධාරණය වන ගී ගැයීමට සලස්වන්න.

උදාහරණ :

*පිනවන දුටු දන සෑම ගඟ ළඟ පිහිටි කදීම*
*තුරු පෙළ අවට සෑදීම යුත් සෙවනැල්*

*ගන මේ කුලෙව් දිලීම විහඟුන් මත රැව්දීම*
*සුළඟින් පත් ලෙලදීම ඇතිහැම කල්*

*යන එන දන සැමගේ ම එහි ඉඳ ගිම් සැලසීම*
*දසදිග අතු විහිදීම තිබෙන විසල්*

*දෙනිපිටියට ම ඉතාම වටිනා මහනුග දුම*
*බලසකි එහි සිතුසේම නිලඹර දුල්*

## ක්‍රියාකාරකම 11

පාසල් වත්තේ හෝ ආසන්න පරිසරයේ හෝ ශාකවල විවිධත්වය සොයා බැලීමට සලස්වන්න.

එම පරිසරයේ ඇති ගස්වැල්වල ස්වභාවය
ඒ පරිසරයට අනුවර්තනය වී ඇති ආකාරය
ඵලවල ස්වභාවය
මල්වල ස්වභාවය
වැඩි වශයෙන් ඒ ඒ පරිසරය ආශ්‍රිත ව ගැවසෙන සතුන්

මෙවැනි ප්‍රශ්නාවලියක් ඔස්සේ නිරීක්ෂණයට යොමු කරන්න. එහි ඇති වැදගත් දේ සටහන් කර ගැනීමට ද යොමු කරන්න.

ආරක්ෂාව පිළිබඳ ව විශේෂ උපදෙස් දීමට වග බලා ගන්න.

සිසුන්ට ප්‍රමාණවත් කාලයක් ගත කිරීමට දෙන්න.

පන්තියට ගෙන ආ තොරතුරුවලින් කණ්ඩායම් වාර්තා සකස් කර පන්තියට ඉදිරිපත් කර සාකච්ඡාවට භාජනය කරන්න.

මෙහි දී නිරීක්ෂණයට යොමු කළ කරුණුවලට අවධානය දෙමින් ඒ ඔස්සේ සාකච්ඡාව මෙහෙයවන්න.

ඒ ඒ පරිසරයේ දී තමන් දුටු සුන්දරත්වය ගැන කවි, ගී, රචනා, චිත්‍ර ඇතුළත් පන්ති සඟරාවක් සකස් කිරීමට යොමු කරන්න.

## ක්‍රියාකාරකම 12

පාසල් වත්තේ විවිධ ගස්වැල් ඇති බිම් කොටස් කිහිපයක් තෝරා ගන්න.

පාසල් වත්තේ එවැනි තැනක් නොමැති නම් ආසන්නතම සුදුසු ස්ථානයක් තෝරා ගන්න. සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර වර්ග මීටර එක බැගින් සලකුණු කළ කොටස් කණ්ඩායම්වලට පවරන්න.

තෝරා ගත් කොටසේ ඇති එකිනෙකට වෙනස් වූ ගස්, පැළෑටි, වැල් පිළිබඳ ව නිරීක්ෂණයට සිසුන් යොමු කරන්න.

වර්ග මීටරයක ප්‍රමාණයක කොපමණ ශාක වර්ග ඇතිදැයි ගැන බැලීමට යොමු කරන්න. සිසුන්ට දුෂ්කරතා ඇති නම් සමීප ව උදවු කරන්න.

එක ම ප්‍රදේශයක විවිධ වූ ශාක ඇති බව සිසුන්ට අවබෝධ කර ගත හැකි පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

විවිධ වූ ගස්වැල් නිසා ම පරිසරය අලංකාරවත් වන බව සාකච්ඡාවේ දී මතු කරන්න.

කොළවල හැඩය, පාට, මල්වල විවිධත්වය, කඳේ ස්වභාවය, කඳේ විවිධත්වය ආදිය උපයෝගි කර ගන්න.

කණ්ඩායම් විසින් නිරීක්ෂණය කරන ලද කොටසේ ඇති විවිධ ශාක ප්‍රමාණය අනුව ජෛව විවිධත්වයේ අඩු වැඩි බව තීරණය කළ හැකි බව අවධාරණය කරන්න.

පන්තිය ඉදිරිපිට හෝ අවට භූමියේ හෝ ජෛව විවිධත්වයෙන් යුතු ශාක වවා අලංකාර කිරීමට යොමු කරන්න.

තමාගේ නිවසේ ඉදිරිපිට කොටසක් ද එසේ අලංකාර කිරීමට යොමු කරන්න.


ශාකවල විවිධත්වයේ විචිත්‍ර බව සජීවී ලෙස අත්දැකීමට අවස්ථා සලසන්න.

විවිධ ශාක පත්‍ර කොටස් හෝ විවිධ මල් ඇසුරින් හෝ අලංකාර බඳුනක් පිළියෙල කිරීමට සිසුනට උදවු වන්න. එම අලංකාර බඳුන් පන්තියේ මේසය මත තබන්න.

ගස්වැල් හා පැළෑටි හා සම්බන්ධිත පහත සඳහන් ක්‍රීඩාවේ නියැලීමට අවස්ථාව ලබා දෙන්න.

සිසුන් එළිමහනට/පිට්ටනියට රැගෙන යන්න. විවිධ ශාක වර්ග 3/4 කින් බිම වැටී ඇති ශාක පත්‍ර ඇහිලීමට උපදෙස් දෙන්න. එක් ශාක වර්ගයකින් පත්‍ර 15 - 20 අතර සංඛ්‍යාවක් ද ප්‍රමාණවත් වේ.

පහත සඳහන් රූපයේ දැක්වෙන පරිදි සිසුන් කණ්ඩායම් 3 /4 ක් A, B, C, D ලෙස නම් කර ස්ථාන ගත කරන්න.




අනුලන කොළ කණ්ඩායමකට සිටින සිසුන් සංඛ්‍යාවට අනුව A, B, C, D, .. ලෙස නම් කරන ලද කුඩා රවුම්වල තබන්න.

දෙන ලද සංඥාවකට අනුව කණ්ඩායමේ ආරම්භක සිසුවා තමාට හිමි රවුමෙන් කොළයක් රැගෙන ඉතා වේගයෙන් දිව ගොස් මැද සලකුණු කර ඇති රවුම තුළට අතේ තියෙන කොළය දමා නැවත තම පේළියේ පිටුපසින් ම සිට ගත යුතුයි. එසේ දැමූ පසු දෙවෙනි සිසුවා ද කොළයක් රැගෙන දිව ගොස් රවුම තුළට දැමිය යුතුයි. ඒ අනුව පිළිවෙළින් කණ්ඩායමේ සිසුන් සියලු දෙනාගේ සහභාගිත්වයෙන් තමාට අයත් රවුම තුළ ඇති ශාක පත්‍ර අවසන් වනතුරු මැද තිබෙන රවුම තුළ තැබිය යුතු ය.

මෙවැනි ක්‍රීඩා නිර්මාණය කර සිසුනට ක්‍රීඩාවල නිරත වීමට අවස්ථාව සලස්වන්න.

# 6 ජලය

ලොව ඇති ජලයෙන් 97%ක් ම ලුණු මිශ්‍ර වූ ජලයයි. තවත් 2%ක් ඇත්තේ අයිස් ලෙස ය. මේ නිසා මිනිසාට භාවිත කිරීමටත් ශාක වැඩීමටත් ඉතිරිව තිබෙන්නේ 1%ක් වූ ජල ප්‍රමාණයක් ය. මේ ජලය ප්‍රමාණයෙහි වෙනසක් සිදු නොවන අතර ජල දූෂණය හේතුවෙන් භාවිතයට ගත හැකි එම ජල ප්‍රමාණය ද අපිරිසිදු වීමෙන් භාවිත කළ නොහැකි තත්ත්වයට පත් වේ.

මේ නිසා ජලය අරපිරිමැස්මෙන් භාවිත කිරීම කාලීන අවශ්‍යතාවකි. විවිධ පාරිසරික විනාශයන් නිසා ජල උල්පත් සිඳී යාම හා ගංගා වියළී යාම හේතුවෙන් ආහාර බෝග වගා කිරීමට නොහැකි තත්ත්වයක් උදා වනු ඇත. වැඩිවන ජනගහනයට අනුව ජල පරිභෝජනය ද වැඩි වී ඇත. මේ සියල්ල ජලය පිළිබඳ අප හමුවේ ඇති අභියෝගයි.

## නිපුණතා

- ✶ අගනා සම්පතක් ලෙස සලකා ජලය අරපිරිමැස්මෙන් භාවිත කරයි.
- ✶ නිරෝගී පැවැත්ම සඳහා ප්‍රමාණවත් ලෙස ජලය පරිභෝජනය කරයි.
- ✶ ජලය හා බැඳි සාම්ප්‍රදායික සිරිත් විරිත් ගවේෂණශීලී ව පවත්වා ගනියි.
- ✶ ජල දූෂණය කෙරෙහි සැලකිලිමත් වෙමින් එය වලක්වා ගැනීමට දායක වෙයි.
- ✶ ගලායන ජලයේ ශක්තිය උපයෝගී කරගෙන ක්‍රියාත්මක වන උපකරණවල ආකෘති ගොඩනගයි.
- ✶ ජලය හා සබැඳි ක්‍රීඩා, ගායන, රංගන ඉදිරිපත් කරයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

පාඩමට පෙර පහත සඳහන් තොරතුරු සපයා ගෙන ඒමට සිසුන්ට පවරන්න.

තමා දිනකට පානය කරන ජල වීදුරු ගණන හෝ කෝප්ප ගණන, නිවසේ මුළුතැන්ගෙයි වැඩකටයුතු සඳහා දිනකට භාවිත කරන ජල ප්‍රමාණය, නිවසේ දිනක දී වෙනත් කටයුතු සඳහා භාවිත කරන ජල ප්‍රමාණය, නල ජලය භාවිත කිරීමේ දී දිනක දී පාවිච්චි කළ ජල ඒකක ගණන. මේ තොරතුරු ආශ්‍රයෙන් දිනකට සිසුවකු පානය කරන ජල ප්‍රමාණය දළ වශයෙන් ලීටරවලින් සොයා ගන්න.

ඒ අනුව දිනකට පන්තියේ සියලු ම සිසුන්ට පානය කිරීමට අවශ්‍ය ජල ප්‍රමාණය අනුමාන කරන්න.

එමෙන් ම දිනකට පන්තියේ සියලු ම සිසුන්ගේ නිවෙස්වල භාවිත කරන මුළු ජල ප්‍රමාණය පිළිබඳ ව සාකච්ඡා කරන්න.

මේ අනුව අපේ පරිභෝජනය සඳහා අති විශාල ජල ප්‍රමාණයක් අවශ්‍ය වන බව සාකච්ඡාවෙන් මතු කරන්න.

මෙයින් කොපමණ ජල ප්‍රමාණයක් අපතේ යනවා ද යන්න සහ ජලය අපතේ යාම වලක්වා ගන්නා ආකාර පිළිබඳ ව සාකච්ඡා කරන්න. එමගින් ජලය උපරිම අයුරින් ප්‍රයෝජනයට ගත හැකි ආකාර පිළිබඳ ව කතා බහ කරන්න.

උදාහරණ :

★ මුළුතැන්ගෙයින් ඉවත් වන ජලය සුදුසු වගා කටයුතු සඳහා යොදා ගැනීම.

★ මුහුණ සෝදන අවස්ථාවන්හි දී ජලය භාජනයකට ගැනීම.

එක් එක් සිසුන්ගේ නිවසේ ජලය ලබා ගන්නා ආකාරය පිළිබඳ තොරතුරු ප්‍රස්තාරයකින් දක්වන්න.

## ක්‍රියාකාරකම 2

පොළොවෙහි ජලය රැඳී ඇති ස්වරූපය කෙබඳු දැයි සාකච්ඡා කරන්න.

මෙයට පිවිසීමක් ලෙස ''ජල බිංදුවක ජීවිත කතාව'' යනුවෙන් කතාවක් නිර්මාණය කරන්න.

උදාහරණ :

*''මම හුඟක් ඉස්සර සිටියේ පුංචි බබෙක් නාවපු වතුර බේසමක බබා නාවලා මාව කාණුවකට වීසි කළා මට මතකයි. කාණුව දිගේ ගිහින් මාව පොළවට උරා ගත්තා. පස් අතරට වෙලා ටික දවසක හිටපු මම ගහක මුලකට ඇතුල් උනා. මුල දිගේ උඩට ආපු මම ගහේ කොළේකින් එළියට ගියා. ඊට පස්සෙ හුළඟේ පාවෙලා ගිහින් වළාකුලක හිටපු මං වගේ ගොඩක් අය එක්ක එකතු උනා. එතැන පාවෙවී ඉඳල එක පාරට ආයිත් පොළවට වැටුණා. ඊට පස්සෙ ගල් අස්සෙන් පැන පැන දඟ කර කර හිටපු මම හිටපු ගමන් පුංචි බටයක් අස්සෙන් රිංගලා ආවා. දැන් මං ඉන්නෙ වතුර කේතලයක් ඇතුලෙ. දැන් මාව තේ කෝප්පෙකට යයි ද නැත්නම් දුමක් වගේ ආයිත් අහසට යයි ද? කොහනට ගියත් මං කවද හරි ආයිත් ඔයාල සොයාගෙන එනවා.''*

මේ අයුරින් ජලය රැඳී ඇති විවිධ ස්ථාන සාකච්ඡා කොට (මුහුද, ගංගා, ඇල, දොළ, දිය ඇලි, ළිං හා වෙනත් ස්ථාන) ඒවා සම්බන්ධ කර ගනිමින් එක ම ජලය චක්‍රීය ලෙස ලෝකය පුරා පවතින බව සිසුන්ට වටහා දෙන්න. තවත් විවිධ වූ වෙනස්කම් සහිත ව ජල බිංදුවේ කතා ගොතන්නට සිසු කණ්ඩායම්වලට අවස්ථාව දෙන්න. මෙම කතාවල සිත්ගත් අවස්ථාවක් චිත්‍රයට නැගීමට ද යොමු කරන්න. එම චිත්‍ර ප්‍රදර්ශනය කරන්න.

## ක්‍රියාකාරකම 3

ඕනෑ ම පුද්ගලයකුගේ ශරීරයක ජලය තිබෙන බව ද ඒවා විවිධ අයුරින් ශරීරයෙන් පිටවන බව ද පැහැදිලි කරන්න.

උදාහරණ :

දහඩිය, මුත්‍ර වැනි

එබැවින් ශරීරයේ ජල මට්ටම පවත්වා ගැනීමට ප්‍රමාණවත් ජල ප්‍රමාණයක් පානය කිරීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.

මහන්සි වී වැඩ කිරීමේ දී හා ක්‍රීඩා කිරීමේ දී වැඩි දහඩිය ප්‍රමාණයක් පිටවන බැවින් ජලය බීමට අවශ්‍ය වන බව පෙන්වා දෙන්න.

ප්‍රමාණවත් පිරිසිදු ජලය පානය කිරීමෙන් නිරෝගී ව සහ ප්‍රාණවත් ව සිටීමට හැකි වන බව අවධාරණය කරන්න. හොඳින් උතුරවා නිවාගත් ජලය පානය කිරීමෙන් පාචනය වැනි රෝග වැළඳීම වළක්වා ගත හැකි බව සඳහන් කරන්න.

## ක්‍රියාකාරකම 4

ජල පිල්ටරයක් සෑදීම

ලොකු ප්ලාස්ටික් බෝතලයක් රූපයේ පෙනෙන පරිදි කපා ගන්න.



උඩ කොටසෙහි කට පහළට හරවා පුනීලයක් ලෙස යොදා ගන්න. එහි කට ආවරණය වන ලෙස පුළුන් ගුලියක් සිර කරන්න.
ඉන් පසු ඒ මත විවිධ ප්‍රමාණයේ බොරලු තට්ටු සහ වැලි තට්ටු අසුරා ගන්න. ඒ තුළින් ජලය කාන්දු වීමට සලස්වා බෝතලයේ යට ඇති කොටසට එකතු වීමට සලස්වන්න.
බොර පාට ජලය ඉහළින් වත් කරන්න. පැහැදිලි ජලය පිටතට එන ආකාරය නිරීක්ෂණය කරන්න.
මෙහි දී ගල් කැටවල ප්‍රමාණය, ගල් හා වැලි තට්ටුවල ගණකම ආදී දේ වෙනස් කරමින් වඩා හොඳ පෙරනයක් සකස් කර ගත හැකි අන්දම සොයා ගැනීමට සිසුනට අවස්ථාව දෙන්න.

## ක්‍රියාකාරකම 5

ජලය ජන ජීවිතයට සමීප වන්නේ ඉන් ලබා ගන්නා ප්‍රයෝජන නිසාම පමණක් නොව විවිධ සංස්කෘතික උත්සව සහ අවස්ථා ආශ්‍රිත ව ඇති වී තිබෙන සිරිත් විරිත් නිසා බව හඳුනා ගැනීමට සහාය වන්න. මේ සම්බන්ධ ව පවතින කතන්දර, පින්තූර එකතු කිරීමට කල් තබා උපදෙස් දෙන්න. ඒවා පාඩමට උදවු කර ගන්න.

උදාහරණ :

- සිංහල ජනතාව සුබ කටයුත්තකට යන විට ජලය පිරුණු කළයක් / වීදුරුවක් ගත් කාන්තාවක් ඉදිරියට ඒම
- සිංහල අලුත් අවුරුද්දට ස්නානය
- ළිඳ හා ගනුදෙනු කිරීම
- ඉස්ලාම් භක්තිකයන් ආගම ඇදහීමට පෙර පිරිසිදු වීම, මිය ගිය පසු මතක දේහය නෑවීම
- ද්‍රවිඩ ජනතාව - මංගල චාරිත්‍රවල දී මනාලයා දෙපා සෝදා පිළිගැනීම, ජලය පිරුණු කළයක් තැබීම, අලුත් අවුරුද්දේ ජල ස්නානයේ දී කෝවිලෙන් ලබා ගන්නා මර්ත්තුනීර් දමා ස්නානය කිරීම, දෙපා සෝදා කෝවිලට ඇතුල් වීම, දෙවිවරුන් නැවීම (කුම්බාභිශෝතම්).
  කතෝලික, ක්‍රිස්ත්‍රියානි ආගමිකයින් සිදු කරන චාරිත්‍ර ද සොයා බලන්න.
- කෑමට ආරාධනා කිරීමේ දී වතුර ඇල්ලීම
- අත පැන් වත් කිරීම
- කෙස් කපා ජලයේ පා කර හැරීම
- පිරිත් පැන්
- සංඝයාවහන්සේ පා සෝදා පිළිගැනීම

වෙනත් එවැනි ආගමික හා සංස්කෘතික සිරිත් විරිත් ජලය හා බැඳී ඇති ආකාරය අත්දැකීම් ඇසුරෙන් සාකච්ඡා කරන්න. හැකිනම් ජලය හා බැඳි සිරිත් විරිත් පැවසීමට සම්පත් පුද්ගලයකුට ආරාධනා කරන්න. (උදාහරණ : ගමේ වැඩිහිටියන්, ආගමික නායකයන්, පාසල් ගුරුවරයෙක් ... වැනි)

## ක්‍රියාකාරකම 6

තම ප්‍රදේශයේ පානීය ජලය අවශ්‍යතාව විසඳාගෙන ඇති ආකාරය සොයා බැලීමට යොමු කරන්න.
නාගරික ව සපයන නල ජලයට ගාස්තුවක් ගෙවීමට සිදුවන්නේ එම ජලය පිරිසිදු කිරීමට මුදල් වැය වන නිසා ය. මුදල් අය කිරීම වක්‍රව ජල පරිභෝජනය අවම කිරීමට රුකුලක් වේ. පිරිසිදු ජලය නාස්ති කිරීම වළක්වා ගැනීමට සෑම දෙනකු ම පියවර ගත යුතු ය.
සිසුන් කණ්ඩායම් කරන්න. ජල නාස්තිය වැළැක්වීමට කළ හැකි යෝජනා කණ්ඩායම් තුළ සාකච්ඡාවට භාජන කිරීමට යොමු කරන්න. එම යෝජනා කැමති ආකාරයකින් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

උදාහරණ :

- වගන්ති වශයෙන්
- චිත්‍ර නිර්මාණයන් මගින්
- කවි, ගී නිර්මාණයෙන්

ජලය අරපිරිමැස්මෙන් පාවිච්චි කිරීම පිළිබඳ පණිවුඩ ඉදිරිපත් කරන පෝස්ටර් නිර්මාණයට යොමු කරන්න.

උදාහරණ :

- කරාමය ඇර තබා වෙනත් වැඩක නිරත නොවීම
- පොදු ස්ථානවල ජල කරාම හොඳින් වසා තැබීම
- භාජන සේදීමේ දී එක් එක් භාජනය වරින් වර සේදීම වෙනුවට එකවර කිහිපයක් සේදීම.

ජලය හිඟ ප්‍රදේශවල එය සපයා ගැනීමේ දී ඇති වන අපහසුව සාකච්ඡා කිරීමට කණ්ඩායම්වලට පවරන්න.

පිරිසිදු පානීය ජලය හිඟයෙන් පීඩා විඳින ජනතාව අප රටේ නොයෙක් ප්‍රදේශවල සිටින බව සිහිපත් කරන්න. අත්දැකීම් තිබේ නම් ඒවා ද උදවු කරගන්න.

ඔබේ ප්‍රදේශයේ දී එවැනි ජල ගැටලුවක් ඇත්නම් එය විසඳා ගැනීමට ක්‍රියාමාර්ග යෝජනා කිරීමට කණ්ඩායම්වලට යොමු කරන්න.

උදාහරණ :

වැසි ජලය රැස් කර තබා ගැනීම, ඇළ, දොළ, ගංගා වැව් අපවිත්‍රවීමෙන් වලක්වා ගැනීම.

පාසලේ එවැනි තත්ත්වයක් තිබේ නම් එය විසඳා ගැනීමට මෙතෙක් ගෙන ඇති පියවර සොයා බලන්න.

මෙතෙක් ඒ සඳහා විසඳුම් ඉදිරිපත් වී නොමැති නම් ඒ ගැන සක්‍රිය සංවිධානයක් පිහිටුවා ගෙන කටයුතු කිරීමට මග පෙන්වන්න.

## ක්‍රියාකාරකම 7


ජල දූෂණය සිදුවන ක්‍රම පිළිබිඹු කරන වාර්තා, ඡායාරූප එකතු කර ඒවා පන්තියට ඉදිරිපත් කරන්න. ජල දූෂණය නිසා ඇති වන විපාක සාකච්ඡා කරන්න.

තම ප්‍රදේශයේ ප්‍රධාන ජල මූලාශ්‍ර දූෂණය වීම පිළිබඳ වාර්තා සකස් කිරීමට සිසුන් යොමු කරන්න.

විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා වෙන් කර ඇති කාලය උපයෝගී කර ගෙන පාසලේ පරිසර නියමු කණ්ඩායමක් සකස් කර ඒ හරහා ජල සංරක්ෂණය සහ දූෂණය වැළැක්වීමේ ක්‍රියාමාර්ගවලට පිවිසෙන්නට සහාය දෙන්න.

## ක්‍රියාකාරකම 8

ගලා යන ජලය මගින් කරකැවෙන ජල රෝදයක් සෑදීමට සිසුන් යොමු කරන්න.



රෝදය වටා ලී පතුරු, යෝගට් හැඳි ආදිය සවි කර මෙය සාදා ගත හැකි ය.

මෙම රෝදය ගලා යන ජල පහරක් හරහා තැබූ විට එය කරකැවෙන ආකාරය නිරීක්ෂණයට සලස්වන්න. රෝදයේ කර කැවීම කෙරෙහි ජල පහරේ වේගය බලපාන අයුරු නිරීක්ෂණයට ද යොමු කරන්න.

වගාවන් සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට භාවිත කරන ඇටවුමක් ලෙස ''දිය හොල්මන'' හඳුන්වා දෙන්න. පන්ති මට්ටමෙන් මෙවැනි නිර්මාණයක් කර සිසුන්ට අත්දැකීම් ලබා දෙන්න.

## ක්‍රියාකාරකම 9

ජල සම්පත ආරක්ෂා කිරීම පිළිබඳ කියැවෙන කවි, ගී ගායනයට අවස්ථාව සලස්වන්න. නව කවි, ගී නිර්මාණයට අවස්ථාව දෙන්න. ජල සම්පත සුරැකීමේ වැදගත්කම ඇතුළත් ලිපි සකස් කර හෝ පුවත්පත්වලින් සොයා ගන්නා ලිපි හෝ සිසුනට කියැවීම සඳහා ප්‍රදර්ශන පුවරුවට යොමු කරන්න.

## ක්‍රියාකාරකම 10

ජලය හා සම්බන්ධ පහත සඳහන් ක්‍රීඩාවේ නිරත වීමට අවස්ථාව ලබා දෙන්න.
මේ සඳහා සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න. (කණ්ඩායමකට උපරිම 5ක් ප්‍රමාණවත් වේ)
කණ්ඩායම් වශයෙන් සිසුන් පෙළ ගස්වන්න. සෑම කණ්ඩායමක ම එක් කෙළවරක වතුර භාජනයක් සහ අනෙක් කෙළවරේ බෝතලයක් බැගින් තබන්න.
ගුරුවරයා දෙනු ලබන සංඥාවකට අනුව කෙළවර සිසුවා දෝතට වතුර ගෙන අසල සිටින අනෙක් සිසුවාගේ දෝතට දිය යුතුයි. මේ ආකාරයෙන් පේළිය අවසානයේ සිටින සිසුවා තෙක් වතුර දෝතින් මාරු කරමින් අවසානයේ තබා ඇති බෝතලයට දැමිය යුතු ය.
මේ අන්දමින් බෝතලය පිරෙන තුරු වතුර දැමිය යුතු අතර අඩු කාලයකින් වතුර බෝතලයට පුරවන සහ පුරවාගත් බෝතලය රැගෙන අවසන් සලකුණ කර ඇති නිමාවට දිව යන කණ්ඩායම ජයග්‍රාහී කණ්ඩායම වේ.
මෙවැනි තවත් ක්‍රීඩා නිර්මාණය කරගන්න.

# 7 ගෙවත්ත

සමස්ත ලෝකවාසීන් උග්‍ර ආහාර හිඟයකට මුහුණපාන බවට අනතුරු අඟවා ඇති බැවින් ආහාර වගාව වර්ධනය කිරීමත්, සුරක්ෂිත කර ගැනීමත් කාලීන අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. එයට යොමු වන මතු පරපුරක පදනම ශක්තිමත් කරනු පිණිස ගෙවතු වගාව පිළිබඳ මූලික අත්දැකීම් ලබා දීම මීට පෙර වසරවල දී ද සිදුවිය. පස්වන ශ්‍රේණියේ දී එවැනි ඉගෙනුම් අත්දැකීම් තව දුරටත් තහවුරු කර ගැනීමට සහ විමසිලිමත් පර්යේෂකයින් ලෙස වගා කිරීම සඳහා යොමු කිරීමට මෙම තේමාව සංවර්ධනය කර ඇත.

## නිපුණතා

- ✶ ගෙවතු වගාවට පර්යේෂණාත්මක ව දායක වීම තුළින් වින්දනයක් ලබයි.
- ✶ බෝග වගා කිරීමේ විකල්ප ක්‍රම සකස් කරයි.
- ✶ විවිධ නිර්මාණ මගින් ගෙවත්තක සුන්දරත්වය මතු කර දක්වයි.
- ✶ ගෙවතු වගාවේ නිරත වෙමින් අත්දැකීම් හුවමාරු කරගෙන එහි ඵලදාව නැංවීමට ක්‍රියා කරයි.
- ✶ ගෙවත්තක සුන්දරත්වය මතු වන කවි, ගී ගායන හා රංගනවල නිරත වෙයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

ගෙවත්තක සිටුවීමට සුදුසු ධාන්‍ය, පලතුරු හා එළවලු වර්ග කිහිපයක බීජ ස්වල්පයක් බැගින් පන්තියට ගෙන ඒමට සලස්වන්න. හොඳ අස්වැන්නක් ලබා ගැනීමට නම් ශක්තිමත් ව වැඩුණු නීරෝගී ශාක බිහි කර ගත යුතු බවත්, ඒ සඳහා නීරෝගී බීජ තෝරා ගැනීමේ වැදගත්කමත් අවධාරණය කරන්න.

සිසුන් ගෙන ආ බීජ මේස මත අතුරා ඒ අතරින් වඩා ශක්තිමත් නීරෝගී පැළ ලබා ගත හැකි යැයි සිතිය හැකි බීජ තෝරා ගැනීමට සිසුන්ට අවස්ථාව දෙන්න. නීරෝගී පැළ ලබා ගත හැකි බීජවල මතුපිටින් හඳුනා ගත හැකි ලක්ෂණ මොනවා දැයි සිසුන්ගෙන් විමසන්න.

උදාහරණ :

- හොඳින් මෝරා තිබීම
- ආහාර පිරී පුෂ්ටිමත් ව වැඩී තිබීම
- පිට පොත්ත පැල්ලම් රහිත ව දීප්තිමත් ව පිහිටීම
- තුවාල රහිත වීම
- කෘමීන් නොසිටීම

ආදී පිටතින් පෙනෙන ලක්ෂණවලින් හොඳ බීජ තෝරා ගත හැකිය. ඉතිරි බීජ ඉවත් කිරීමට උපදෙස් දෙන්න.
හොඳින් පැළ නොවන බීජ සිටවුවහොත් ගෙවත්තෙන් උපරිම ප්‍රයෝජන ලබා ගත නොහැකි බැවින් සපයා ගන්නා බීජවලින් සාම්පලයක් ගෙන ඒවා නිසි ලෙස පැළ වේ දැයි පරීක්ෂා කිරීමට අවස්ථා සලසන්න.
පහත දැක්වෙන ක්‍රමවලින් එකක් භාවිත කොට කලින් තෝරා ගත් බීජවලින් කොපමණ ප්‍රමාණයක් හොඳින් පැළ වේ දැයි පරීක්ෂා කරවන්න.
ලොකු බීජ නම් තෙත වැලි තවානක යට කර තබන්න.
කුඩා බීජ නම් පහත දැක්වෙන එක් ආකාරයකට පරීක්ෂා කරවන්න.

- පීරිසියක් ගෙන එය මත පුළුන් ටිකක් අතුරා පුළුන් ඕමයි කඩදාසි තට්ටුවකින් වසා හොඳින් තෙත් කරන්න. බීජ ඒ මත තැන්පත් කරන්න. දිනපතා පීරිසියට වතුර ස්වල්පයක් දමන්න.
- කෙසෙල් පිත්තකින් හෝ හබරල පිත්තකින් හෝ සෙන්ටිමීටර 30ක පමණ කෑල්ලක් කපා ගන්න. දිග අතට දෙකට මැදින් පලන්න. පැළුමේ ඇතුලු පැත්තේ දිගට බීජ තැන්පත් කරන්න. ඉන් පසු පළු දෙක නැවත යා කොට නූලකින් ගැට ගසන්න. සෙවන සහිත සිසිල් ස්ථානයක තබන්න.

දින කිහිපයකට පසු බීජ පැළ පරීක්ෂා කිරීමට සලස්වන්න. පැළ කළ බීජ ගණන සහ පැළ වී ඇති/නැති බීජ ප්‍රමාණය සෙවීමට සලස්වන්න. පැළ වී ඇති ප්‍රමාණය ¾ ක් වත් වුවහොත් වගාවට හොඳ බීජ යැයි නිගමනය කළ හැකි බව පෙන්වා දෙන්න.

මීළඟ පරීක්ෂණය සඳහා ඉක්මනින් පැළවෙන බීජ වර්ගයක් තෝරා ගන්න. (මුං හෝ අබ ඇට හෝ උදාහරණ වේ) තෝරා ගත් බීජ සාම්පලය කොටස් හතරකට බෙදන්න.

1 වන කොටස : වියළි පරීක්ෂණ නළයකට/ කුඩා වීදුරුවකට දමා සාමාන්‍ය කාමරයක තැන්පත් කරන්න.

2 වන කොටස : පරීක්ෂණ නළයක/කුඩා වීදුරුවක පතුලට තෙත පුළුන් ස්වල්පයක් දමා බීජ ඒ මත තැන්පත් කරන්න. සාමාන්‍ය උෂ්ණත්වය සහිත කාමරයක තබන්න.

3 වන කොටස : පරීක්ෂණ නළයක/කුඩා වීදුරුවක බීජ දමන්න. බීජ සම්පූර්ණයෙන් වැසෙන සේ ජලය පුරවන්න. සාමාන්‍ය උෂ්ණත්වය සහිත කාමරයක තබන්න.

4 වන කොටස : මුලින් ම බීජ උතුරන වතුරට දමා තම්බන්න. ඉන් පසු පරීක්ෂණ නළයක/කුඩා වීදුරුවක පතුලේ ඇති තෙත පුළුන් මත තැන්පත් කරන්න. සාමාන්‍ය උෂ්ණත්වය සහිත කාමරයක තබන්න.

දින කිහිපයකට පසු ලබන නිරීක්ෂණ ආශ්‍රය කර ගෙන පහත දැක්වෙන ආකාරයේ වගුවක් සම්පූර්ණ කිරීමට යොමු කරන්න.

| | පරීක්ෂණය | දුටු දේ | සිතිය හැකි හේතුව |
|---|---|---|---|
| 1 වන නළය | | | |
| 2 වන නළය | | | |
| 3 වන නළය | | | |
| 4 වන නළය | | | |

බීජ පැළ වී වැඩීම සඳහා ජලය, උෂ්ණත්වය හා වාතය අවශ්‍ය බවත්, හොඳ බීජ තිබිය යුතු බවත් පෙන්වා දෙන්න.

තුන්වන පරීක්ෂණය සඳහා සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න. එක් එක් කණ්ඩායමකට හිස් ජෑම් බෝතලයක් හෝ පැහැදිලි බිත්ති සහිත වීදුරුවක් බැගින් හෝ සපයා ගැනීමට උපදෙස් දෙන්න.
එම භාජනයේ ඇතුල් පැත්තේ බිත්ති දිගේ ඕමයි කඩදාසියක් අතුරන්න. ඕමයි කඩදාසිය ඇතුළින් වැලි පුරවන්න. භාජනයේ බිත්තියත්, ඕමයි කඩදාසියත්

අතර ඉඩෙහි මැදින් එක් බීජ වර්ගයකින් දෙක තුන බැගින් තැන්පත් කරන්න. (බඩ ඉරිඟු, බටු, රාබු, මිරිස් උදාහරණ වේ)

ඉන් පසු වැලි හොඳින් තෙත් කරවන්න. සාමාන්‍ය ආලෝකය ලැබෙන කාමරයක මෙම බඳුන් තැන්පත් කරවන්න.

- බීජ පැළවෙන ආකාරය දිනපතා නිරීක්ෂණය කරවන්න. (බීජ පත්‍ර හැසිරෙන ආකාරය, කඳ දික්වන ආකාරය, පත්‍ර හට ගන්නා ආකාරය .......... ආදී)
  - දිනපතා දක්නට ලැබෙන ආකාරයට රූප සටහන් ඇඳීමට උපදෙස් දෙන්න.
  - අන් කණ්ඩායම්වල බීජ පැළවෙන ආකාරය ද නිරීක්ෂණය කරවන්න.
  - එක් එක් බීජ වර්ගයක් පැළවෙන විට ඒවා අතර ඇති සමානකම් හා වෙනස්කම් නිරීක්ෂණය කරවන්න.

මෙම ක්‍රියාකාරකමේ දී භාවිත කළ ඕනෑ ම ක්‍රමයක් ඇසුරෙන් ගෙවත්තේ සිටුවීමට අවශ්‍ය පැළ ලබා ගැනීමට මග පෙන්වන්න.

## ක්‍රියාකාරකම 2


දඬු කැබලි මගින් අලුත් පැළ සකස් කර ගැනීම පිළිබඳ අත්දැකීම් ලබා ගැනීම සඳහා පහත දැක්වෙන ක්‍රම දෙක අනුව ක්‍රියාකාරකමෙහි යෙදීමට උපදෙස් දෙන්න.

ක්‍රමය 1

- වැඩිපුර ජලය ඉවත් වීම සඳහා සිදුරු සාදා ගත් විනිවිද පෙනෙන බඳුනක් යොදා ගන්න.
- හලාගත් පස් කොටස් එකකට කොම්පෝස්ට් පොහොර කොටස් එකක් මිශ්‍ර කරන්න.
- මෙම මිශ්‍රණය බඳුනේ තැන්පත් කර අවශ්‍ය ප්‍රමාණයට ජලය යොදවන්න.
- තෝරා ගත් දඬු කැබැල්ල බඳුනේ සිටුවන්න.
- දිනපතා අවශ්‍ය ප්‍රමාණයට ජලය දමන්න.
- මුල් අදින ආකාරය දිනපතා නිරීක්ෂණය කරන්න.

ක්‍රමය 2

- විනිවිද පෙනෙන බඳුනක් තෝරා ගන්න.
- හලාගත් පස් හා කොම්පෝස්ට් පොහොර කොටස් එක බැගින් මිශ්‍ර කරන්න.
- මෙම මිශ්‍රණය බඳුනේ තැන්පත් කර අවශ්‍ය ප්‍රමාණයට ජලය එකතු කරන්න. නැවත ජලය දැමීම අවශ්‍ය නැත.
- තෝරා ගත් දඬු කැබැල්ල බඳුනේ සිටුවන්න.
- අවශ්‍ය නම් ආධාරකයක් යොදන්න.
- පොලිතීන් කවරයක් තුළ බඳුන තබන්න.
- හොඳින් වාතය ඇතුළත් වන සේ උඩින් ගැට ගසන්න.
- මුල් අදින ආකාරය දිනපතා නිරීක්ෂණය කරන්න.




මෙම ක්‍රම දෙකෙන් ම සිට වූ දඬු කැබැල්ලේ මුල් ඇද ඇති ආකාරය නිරීක්ෂණය කිරීමට යොමු කරන්න. හොඳින් මුල් ඇද ඇති වඩාත් සරුඵලයක් ලබා ගැනීමට ඉහත ක්‍රම දෙක ම සුදුසු ද? නො එසේ නම් එක් ක්‍රමයක් අනෙකට වඩා සුදුසු දැයි සිසුන් සමග සාකච්ඡා කරන්න.

සිසුන් තීරණය කරන ආකාරයට අනුව ගෙවත්තේ දඬු කැබලි සිටුවා අවශ්‍ය පැළ ලබා ගැනීමට යොමු කරන්න.

## ක්‍රියාකාරකම 3

විකල්ප ක්‍රම උපයෝගී කර ගනිමින් ගෙවත්තේ බෝග වගා කිරීම සඳහා සිසුන් යොමු කරන්න.

උදාහරණ :

- පෝර උර, වැහිපීලි, බේසම්, උණ පතුරු ආදිය ඒ එක් එක් දෑ උපයෝගී කර ගනිමින් උචිත

පැළ සිටුවීමට උනන්දු කරන්න. විකල්ප ක්‍රමවලින් යුතුව ගෙවතු පිළියෙල කිරීමේ වැදගත්කම සාකච්ඡා කරන්න. සිසුන්ගේ එකිනෙකට වෙනස් නිවෙස් පරිසර අනුව විකල්ප ක්‍රම යොදා ගෙන පැළ සිටුවීමට දිරි දෙන්න. හැකිනම් එවැනි විකල්ප ක්‍රම හා මනාව පවත්වා ගෙන යන ගෙවත්තක් නිරීක්ෂණයට අවස්ථාව ලබා දෙන්න. රූපවාහිනී සේවාවල විකාශනය වන විකල්ප ක්‍රම උපයෝගී කර ගන්නා ගෙවතු වගා වැඩ සටහන් පිළිබඳ ව සාකච්ඡා කර ඒවා නියමිත වේලාවට බැලීමට ද සිසුන් යොමු කරන්න.

## ක්‍රියාකාරකම 4

වගාවට හානිකරන සතුන් හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න. ඔවුන් නම් වශයෙන් සහ හානිය සිදුවන්නේ බෝගයේ කවර කොටසට ද යන්න සාකච්ඡා කරන්න.

උදාහරණ :

- අල වර්ගවලට ඌරන්, මීයන් වැනි සතුන්ගෙන් වන හානි
- ගොයමේ පුරුක් පණුවන්, පැල මැක්කන්, කුඩිත්තන් සිදු කරන හානි
- වම්බටු, තක්කාලි, බණ්ඩක්කා වැනි එළවළු වගාවන්හි පිටිමකුණන් කරන හානි

හැකිනම් එම හානි වූ ශාක කොටස් නිරීක්ෂණයට යොමු කරන්න. ඒ සඳහා අත් කාචයක් යොදා ගන්න. ගෙවත්තේ දී හෝ හානි වූ කොටස් පන්තියට ගෙන විත් හෝ මෙම නිරීක්ෂණ කළ හැකිය.

වගාවනට සතුන්ගෙන් වන හානි අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න.

මේ සඳහා පළපුරුදු ගොවි මහතකු/ප්‍රදේශයේ කෘෂිකර්ම ව්‍යාපෘති නිලධාරීවරයකු/සාර්ථක ගෙවත්තක් පවත්වාගෙන යන අයකුට ඇරයුම් කරන්න.

මෙහි දී කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය වෙනුවට භාවිත කරන වෙනත් ක්‍රම, පාරම්පරික ක්‍රම හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න. වගාවනට හානි කරන සතුන් ආහාර ලෙස ගන්නා සතුන් හඳුනා ගැනීමට යොමු කරන්න.

උදාහරණ :

- මීයන් ආහාරයට ගන්නා සර්පයන්
- කෘමීන් ආහාරයට ගන්නා ගෙම්බන්, කටුස්සන්
- ගොලුබෙල්ලන් ආහාරයට ගන්නා ඇටිකුකුළන්

පරිසරයේ ඇති මෙම ස්වාභාවික සමතුලිතතාව නැති වී යාමට කෘෂි රසායන ඉවහල් වී ඇති ආකාරය පිළිබඳ ව කතා බහ කරන්න. ඒ සඳහා සිසු අත්දැකීම් සාකච්ඡාවට ගන්න. කෘෂි රසායන භාවිතයේ හානි පිළිබඳ තව දුරටත් කරුණු සෙවීමට සිසුන්ට මග පෙන්වන්න.

## ක්‍රියාකාරකම 5

මෙම ක්‍රියාකාරකමට පෙර කෘමි නාශකවල හානිය හා පරිසර හිතකාමී කෘෂි පාලන දියරවල වටිනාකම පිළිබඳ ලිපි, පුවත්පත් දැන්වීම් ආදිය රැස් කිරීමට සිසුන් යොමු කරන්න.

ගෙවතු වගාවක දී යොදා ගත හැකි පරිසර හිතකාමී කෘෂි පාලන දියරයක් සාදා ගන්නා අන්දම පිළිබඳ ව පුවත්පත් හෝ වෙනත් පත්‍රිකාවල හෝ සඳහන් දේ සොයා ගැනීමට මග පෙන්වන්න.

මේ සඳහා කොහොඹ ඇට, කොහොඹ තෙල්, ආදිය යොදා ගන්නා අන්දම විස්තර කෙරෙන පත්‍රිකා ලිපි ආදියට යොමු කරන්න.

මෙවැනි කෘෂි පාලන දියර සාදාගෙන ගෙවතු වගා කටයුතුවලට යොදා ගන්නා අය වැනි සම්පත් පුද්ගලයන් හඳුනා ගත හැකිනම් එවැනි දියර සාදා ගන්නා ආකාරය පිළිබඳ ආදර්ශනයක් සඳහා ඔවුනට ඇරයුම් කරන්න.

එවැනි පරිසර හිතකාමී කෘෂි පාලන දියරයක් සාදා ගැනීමට යොමු කරන්න. කණ්ඩායම් වශයෙන් එවැනි දියර වර්ග කිහිපයක් විවිධ ශාක කොටස් ඇසුරෙන් පිළියෙල කර ගත හැකිනම් වඩාත් සුදුසු ය.

සිසුන් විසින් සාදාගත් කෘෂි පාලන දියරය පාසල් ගෙවත්තේ හෝ නිවසේ හෝ කෘමි හානියක් ඇති ශාකයට දිනපතා යොදමින් දින කිහිපයක් නිරීක්ෂණය කිරීමට සලස්වන්න. පහත සඳහන් ආකාරයේ වගුවක් නිරීක්ෂණ සටහන් කිරීමට සිසුන් යොමු කරන්න.

| කෘෂි පාලන දියරය | දියරය ඉසීමට පෙර තත්ත්වය | නිරීක්ෂණ | | | | |
|---|---|---|---|---|---|---|
| | | 1 වන දින | 2 වන දින | 3 වන දින | 4 වන | 5 වන |
| උදා : කොහොඹ තෙල් | | | | | | |

සිසුන් විසින් දින පහක් පමණ නිරීක්ෂණය කර වගු ගත කරන ලද තොරතුරු ඇසුරෙන් කුඩා කණ්ඩායම් සාකච්ඡාවට අවස්ථා සලසන්න.

- කුඩා කණ්ඩායම්වල අත්දැකීම් උපයෝගී කර ගනිමින් පොදු සාකච්ඡාවක් මෙහෙයවන්න.
- පොදු සාකච්ඡාවේ දී සාර්ථක වූ කෘෂි පාලන දියරවල වැදගත්කම අවධාරණය කරන්න.
- විවිධ ශාකමය ද්‍රව්‍ය ඇසුරෙන් කෘෂි පාලන දියර අත්හදා බැලීමෙන් සාර්ථක කෘෂි පාලන දියර හඳුනා ගත හැකි බව අවධාරණය කරන්න.
- කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය වෙනුවට භාවිත කළ හැකි පාරම්පරික ක්‍රමවල වටිනාකම මතු වන පෝස්ටර් නිර්මාණයට සිසුනට අවස්ථාව දෙන්න.

## ක්‍රියාකාරකම 6

පාසලේ පවත්වා ගෙන යන ගෙවත්ත අලංකාර කිරීම සඳහා සිතා බැලීමට යොමු වන ප්‍රශ්න කිහිපයක් අසන්න.

උදාහරණ :

ගෙවත්තේ කුඩා ගස් වවා අලංකාර කරන්නේ කෙසේ ද?

උසට වැඩෙන වැල් වර්ගවලට සුදුසු රඳවන මොනවා ද?

බිම ඇදෙන වැල් වර්ගවල සීමා යොදන්නේ කෙසේ ද?

පැල සිටුවා ඇති විවිධ බඳුන් අලංකාර ලෙස තබා ගන්නේ කෙසේ ද?

මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමට කුඩා කණ්ඩායම්වල සාකච්ඡා මෙහෙයවන්න.

එක් එක් කණ්ඩායමට ගෙවත්තේ අලංකරණය පිණිස යෝජනා පෙළ ගස්වා එම කණ්ඩායමට ක්‍රියාත්මක කළ හැකි වෙනස්කමක් සැලසුම් කිරීමට මග පෙන්වන්න.

සැලසුමට අනුව ඒ ඒ කණ්ඩායම් විසින් සිය වෙනස්කම සිදු කළ පසු කලින් තිබූ ගෙවත්තට වඩා අලංකාර ගෙවත්තක් සඳහා නිර්මාණශීලී ව කටයුතු කිරීම අගය කරන්න.

## ක්‍රියාකාරකම 7

කොම්පෝස්ට් පොහොර පිළියෙල කිරීම පිළිබඳ කරුණු අධ්‍යයනය කර ඔබේ පාසලට ගැළපෙන ක්‍රමයක් තෝරා ගන්න. සිසුන්ට තේරුම් ගත හැකි ආකාරයට සරල ලෙස උපදෙස් පත්‍රිකාවක් ලියා සකස් කරන්න. මෙහි දී කොම්පෝස්ට් පොහොර කුඩා ප්‍රමාණයක් සකස් කිරීමට යොමු කරන්න. ඔබ තෝරා ගන්නා ක්‍රමය අනුව සැලසුම් කළ උපදෙස් පත්‍රිකාවට සරිලන ලෙස කුඩා කණ්ඩායම් සකස් කරන්න. කණ්ඩායම්වලට අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගැනීම සඳහා සිසුන් යොමු කරන්න. අවශ්‍ය නම් දෙමාපිය සහාය ද ලබා ගන්න.

තේමාව ක්‍රියාත්මක වන කාලයේ දී කොම්පෝස්ට් පොහොර සෑදීම ආරම්භ කරන්න. එම ක්‍රියාවලියෙන් පසු සකස් වූ කොම්පෝස්ට් පොහොර සාම්පලයක් සිසුන්ට ඉදිරිපත් කරන්න. එම සාම්පලය නිරීක්ෂණය කළ පසු ඒ ඒ කණ්ඩායම් විසින් සකස් කළ කොම්පෝස්ට් පොහොර සැකසුම් කල්ගත වන විට එම තත්ත්වයට පත්වන බව අවධාරණය කරන්න. කොම්පෝස්ට් පොහොර භාවිතයෙන් ගෙවත්ත සරු සාර කර ගැනීමේ අගය අවධාරණය කරන්න.

තේමාව ක්‍රියාත්මක වන කාලයෙන් පසුව ද සිසුන් විසින් සකස් කළ කොම්පෝස්ට් සැකසුම් පිළිබඳ නිරන්තර අවධානයෙන් සිටීමේ වැදගත්කම පෙන්වා දෙන්න. ඒවා කොම්පෝස්ට් ලෙස දිරා ගිය තත්ත්වයට පත් වූ පසු ගෙවත්තට යෙදීමට යොමු කරන්න.

## ක්‍රියාකාරකම 8

''අපේ ගෙවත්ත'' නම් වූ බිත්ති පත්‍රිකාවක් නිර්මාණය කිරීමට යොමු කරන්න. ඡායාරූපයක් ද යෙදිය හැකිනම් වඩාත් සුදුසුය. ගෙවත්තේ පැළවල, මල් ගෙඩි කරල් දකින විට ඇති වන හැඟීම් වින්දනාත්මක ව රිද්මයානුකූල ව කෙටි වැකි ලෙස තවත් අයකු ගෙවත්තක් සෑදීමට යොමු වන සරල පණිවුඩ හා කාව්‍ය නිර්මාණ ලෙස එළිදැක්වීමට දිරි දෙන්න. දෙමාපිය කවයක් පැවැත්වෙන දිනවල පාසලේ ගෙවත්ත දෙමාපියන්ට පෙන්වා බිත්ති පත්‍රිකාව ද කියවීමට අවස්ථාව සලසන්න.

## ක්‍රියාකාරකම 9

ගෙවතු වගා කිරීමේ අගය, වගා කිරීමේ වැදගත්කම, වගා කිරීමට අපට ඇති ශක්තිය වැනි අදහස් අවධාරණය වන ගීත ගායනා කිරීමට සිසුන් යොමු කරන්න. ගායනයේ දී ආදේශ භාණ්ඩ ද උදවු කර ගන්න.

උදාහරණ :

*ලෝකෙන් උතුම් රට ලංකාවයි*
*ලංකාවයි ශ්‍රී ලංකාවයි*
*අප නිජ භූමිය ලංකාවයි //*
*රටවට මුහුදයි සිප එන සුළඟයි*
*නොකඩව ගලනා ගංගාවෝ*
*පස සරු සාරයි - වැසිපල නියමයි*
*මෙහි නොවැඩෙන කිසිවක් නැතිලු*
*ලෝකෙන් උතුම් රට......*
*දස දෙස පූජිත දේශ ගුණය මේ*
*මිහිබට සුරලොව මේ රට දෝ*
*වටපිට හැම තැන හරිත වර්ණයයි*
*තුරුලිය දෙයි සෙවනේ සෙවනේ*
*ලෝකෙන් උතුම් රට ....*
*වන බත හිග නම් කුමට ද මේ සිරි*
*පිට රටුනට ගැති වී ණය වී*
*තව ඉවසනු බැහැ වහලුන් වනු බැහැ*
*වවමු නෙලමු කෙත් වඩමු*
*ලෝකෙන් උතුම් රට ....*
*ලක්ෂ තිහක සිසු කැල අති දක්ෂයි*
*පක්ෂ භේද කිසිවක් නෑ නෑ*
*ඔක්කොම ගුරු දෙගුරු ද අත දෙන්නේ*
*ලස්සන ගොවි පළවල් තනමු*
*පන්තියෙහි සෙසු වැඩ නොපිරිහෙලා අපි*
*වවමු පාසල් වතු ගෙවතු*
*අතීත ඊයේ ඉවරයි ඉවරයි*
*නව සමාජයක් බිහි කරමු*
*ස්වයං පෝෂණය කරනට මව්බිම*
*දිරි ගන්වමු වෑයම රජයේ*
*ධාන්‍ය එළවලු අල පලතුරු හැම*
*වවමු වවමු වවමු .... ////*

රචනය - අයි.එම්.ආර්.ඒ. ඊරියගොල්ල

# 8 ආරක්ෂාව හා පරිස්සම

අනතුරු වළක්වාගෙන, විපත්වලින් සිදුවන හානි අවම කර ගනිමින් ජීවත් විය හැකි පරිසරයක් ගොඩ නැගීම අපට අත්හල නොහැකි වගකීමකි. වර්තමානයේ දී අසන්නට දකින්නට ලැබෙන අනතුරු විපත් සහ වසංගත රෝග හැකි උපරිම මට්ටමින් වළක්වාගෙන කටයුතු කිරීම යුගයේ අවශ්‍යතාවයකි. කුඩා අවධියේ සිට ම ඒ සඳහා අවශ්‍ය නිපුණතා ළඟා කර ගැනීමට උත්සුක වන පරපුරක් හෙට දවසේ අපේ රටේ ජීවනාලියයි. ඒ සඳහා පදනම් වන ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීම අපේක්ෂා කරගෙන මෙම තේමා සැලසුම් කර ඇත.

## නිපුණතා

- ✶ ස්වභාවික සංසිද්ධිවල දී හානි විය හැකි අවස්ථා පිළිබඳ ව විමසිලිමත් ව ඒවායින් ආරක්ෂාවීමට කටයුතු කරයි.
- ✶ හදිසි අනතුරු විය හැකි අවස්ථාවල දී තමාගේ මෙන් ම අන් අයගේ ආරක්ෂාව පිළිබඳ ව අවධානයෙන් යුතුව කටයුතු කරයි.
- ✶ හදිසි අනතුරුවල දී නිසි ප්‍රථමාධාර ලබා දීමට කටයුතු කරයි.
- ✶ ළමයින්ට එරෙහි ව සිදුවන සමාජ විරෝධී ක්‍රියාවලින් ආරක්ෂාවීමට කටයුතු කරයි.
- ✶ තමා මෙන් ම අන් අය රෝගවලින් ආරක්ෂාවීම කෙරෙහි සැලකිලිමත් වෙමින් සෞඛ්‍යමත් පරිසරයක් පවත්වා ගැනීමට දායක වෙයි.
- ✶ ආරක්ෂාව හා පරිස්සම පිළිබඳ ව දැනුවත් කිරීමට උචිත විවිධ නිර්මාණවල නියැලෙයි.
- ✶ ආරක්ෂා සහිත ව පරිස්සමින් යුතුව කටයුතු කරන ආකාර අවධාරණය වන කවි, ගී, ගායනා හා රංගනවල නිරත වෙයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

පසුගිය කාලවල දී හානි සිදුකරන ලද ස්වභාවික සංසිද්ධි වන වැසි සුළං, නාය යෑම්, සුනාමි, අකුණු, කුණාටු, නියඟ, ගංවතුර ආදිය පිළිබඳ ව පුවත්පත්වලින් / අසා දැන ගැනීමෙන් ආදී වශයෙන් තොරතුරු රැස් කිරීමට සිසුන් කණ්ඩායම් වශයෙන් යොමු කරන්න. තොරතුරු රැස් කිරීමේ දී පහත සඳහන් වගු සටහන සම්පූර්ණ කිරීමට අවශ්‍ය වන තොරතුරු රැස් කිරීමට සිසුන් යොමු කරන්න. පසුව අදාළ තොරතුරු ඇසුරින් වගු සටහන සම්පූර්ණ කිරීමට සිසුන්ට යොමු කරන්න.

| ස්වභාවික සංසිද්ධිය නිසා ඇති වූ හානිය | හානි වූ දින වකවානු | හානියට පත් ප්‍රදේශ | ඇති වූ හානිය | |
|---|---|---|---|---|
| | | | භෞතික | මානව |
| උදාහරණ : ගංවතුර | 2007 දෙසැම්බර් | කළුතර දිස්ත්‍රික්කය | නිවාස, කුඹුරු වතුපිටි හා වෙනත් දේපළ | මිනිසුන් දෙදෙනෙක් අතුරුදහන් වීම |

මෙම ස්වභාවික සංසිද්ධිවලින් සිදුවන හානි පිළිබඳ ව කතා කරන්න.

ශ්‍රී ලංකාවට වරින් වර විවිධ සංසිද්ධිවලට මුහුණ දීමට සිදු වී ඇති බව හා රටක් වශයෙන් වී ඇති හානිය, පාඩුව පිළිබඳ ව සාකච්ඡා කරන්න.

පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න. තමාට හෝ තම මිතුරකුට හෝ වෙනත් තැනැත්තකුට හෝ මුහුණ දීමට සිදු වූ අනතුරු පිළිබඳ ව කණ්ඩායම තුළ සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දෙන්න. එම අනතුරු පිළිබඳ ව පන්තියට තොරතුරු ඉදිරිපත් කිරීමට යොමු කරන්න. මෙම අවස්ථාවේ දී සිසුන්ට ප්‍රශ්න ඇසීමට යොමු කරමින් තව තවත් තොරතුරු ලබා ගැනීමට කටයුතු කිරීමට ද යොමු කරන්න.

සිසුන්ගෙන් ප්‍රශ්න මතු කිරීමේ දී පහත සඳහන් කරුණු යටතේ ද ප්‍රශ්න මතු කිරීමට කටයුතු කරන්න.

උදාහරණ :

- ගංවතුරකින් වූ හානියක්
- ගංවතුර ඇති වීමට පෙර සිතේ ඇති වූ අදහස
- පියවරෙන් පියවර හානි සිදු වූ අයුරු
- එක් එක් පියවරේ දී තමාට පවුලේ අයට සිත තුළ ඇති වූ අදහස්
- පියවරෙන් පියවර ඇති වූ හානිවලින් වැලකීමට ගත් ක්‍රියාමාර්ග
- ගංවතුර අවසානයේ දී ඇති වූ ප්‍රතිඵලය
- ගංවතුර බැස ගිය පසු තමාට ඒ පිළිබඳ ව සිතෙන දෑ, තමාට සිදු වූ වැරදීම්
- තමා ක්‍රියාකළ යුතු නිවැරදි ක්‍රමයක් දැන් අවබෝධ වන්නේ නම් ඒ පිළිබඳ අදහස්
- ඉදිරියේ දී ඇති වන ගංවතුර අවස්ථාවල දී තමා ගැනීමට බලාපොරොත්තු වන ක්‍රියාමාර්ග

ඉහත සඳහන් අයුරින් සිසුන් සමග තවත් එවැනි හානිදායක අවස්ථා මතු කරමින් අත්දැකීම් සාකච්ඡා කරන්න. මෙවැනි විපත් නිතර නිතර සිදුවිය හැකි බවත් ඒ ගැන සුදානම අවශ්‍ය බවත් සිසුන්ට අවධාරණය කරන්න. හානි ඇති වීමට පෙර සුදානම අවශ්‍ය බව අවධාරණය කරන්න.

පාසලේ දී අවධානමට පෙර සුදානම සඳහා සිසුන් සමඟ පහත සඳහන් ක්‍රියාකාරකම්හි නියැලීමට අවස්ථාව සලස්වන්න.

පියවර 1

පාසලේ තත්ත්වය තක්සේරු කිරීම.

සිසුන් කණ්ඩායම් කරන්න. පාසලේ විවිධ ස්ථාන කරා සිසු කණ්ඩායම් යොමු කරන්න.

උදාහරණ :

ක්‍රීඩාපිටිය, විද්‍යාගාරය, වැසිකිළි, කැසිකිළි, පඩිපෙළ, වැට, ආපනශාලාව, පන්ති කාමරය ... වැනි

- එක් එක් ස්ථානයක දක්නට ලැබෙන අවදානම් සහගත දෑ පහත නිර්ණායක ඔස්සේ වාර්තා කිරීමට යොමු කරන්න.
- එම ස්ථානයේ සිදුවිය හැකි අනතුරු
- එම අනතුරු සිදුවිය හැක්කේ කවර අවස්ථාවක ද?
- එම ස්ථානයට සිසුන් කොපමණ ප්‍රමාණයක් යෑම් ඊම් කරනවා ද?
- මීට පෙර මේ සම්බන්ධ ව අවධානය යොමු කර තිබෙනවා ද?

පියවර 2

අවධානමට මුහුණ දීමට සැලැස්මක් සකස් කිරීමට මග පෙන්වන්න.

නිරීක්ෂණයෙන් ලද තොරතුරු පිළිබඳ ව කණ්ඩායම් එකතු වී වඩාත් හොඳ විනිශ්චයක යෙදෙන්න.

ඒවා අවම කර ගැනීමට යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

උදාහරණ :

- විශාල ගස්වල දිරාගිය අතු කපා දැමීම
- කැලෑ ප්‍රදේශ එළිපෙහෙළි කිරීම.
- පොළොවේ මතු වී ඇති ගල් මුල් ඉවත් කිරීම හෝ වසා දැමීමට කටයුතු කිරීම.
- පාසල් භූමියට වාහන ඇතුල් වීම පාලනය කිරීම.
- කාමරයක අනතුරුදායක වීමට ඉඩකඩ ඇති වන සේ තබා ඇති උපකරණ නැවත නිසි පරිදි තැබීම.

පියවර 3

සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

පාසල විසින් කළ හැකි දේවල් ක්‍රියාත්මක කිරීම. ඒ සඳහා දින වකවානු යොදා ගෙන නියාමනය කිරීම.

දිගු කාලීන ව සිදු කළ යුතු මැදිහත්වීම් සඳහා පාසල් සංවර්ධන සමිතිය, පන්ති කව වෙනත් ආයතන සහභාගි කර ගැනීම, සිසුන් පිළියෙල කළ වාර්තා හා යෝජනා සිසුන් ලවා එම කණ්ඩායම්වලට ඉදිරිපත් කරවීම.

පාසලේ හදිසි අවස්ථාවක දී ඊට මුහුණ දීමට සූදානම් වීම.

මේ සඳහා පාසල හා අවට ප්‍රදේශය පිළිබඳ සිතියමක් සකස් කර කඩිනමින් එම සීමා තුළ ආරක්ෂිත ස්ථාන හා යා හැකි මාර්ග හඳුනා ගැනීම

අනතුරෙහි ස්වභාවය අනුව එම ස්ථානයෙන් ඉවත් වීමට භාවිත කළ හැකි විකල්ප මාර්ග හඳුනා ගැනීම

උදාහරණ :

- පාසල තුළ ගින්නක් ඇති වුවහොත් යා යුතු ආරක්ෂිත ස්ථානය කොතැන ද යනුවෙන් කල් තබා හඳුනා ගැනීම.
- ගින්නක් පැතිරියාමට ඉවහල් විය හැකි තෙල් ටැංකි, ගෑස්, වැනි ස්ථාන කල් තබා හඳුනාගෙන සිටීමෙන් ඒවායින් බැහැර වීමට සිසුන්ට පහසුවෙන් ම පුළුවන.
- ප්‍රථමාධාර ලබා ගත යුත්තේ කොතැනින් දැයි දැන සිටීම.
- අනතුරක් සිදු වූ විට දැනුම් දිය යුතු අය කවු ද?

ඉහත දී සිසුන් සමග සකස් කළ පරිදි යම් ස්වභාවික හානි අවස්ථාවක් මවා ගනිමින් පියවරෙන් පියවර ගත හැකි ක්‍රියා මාර්ග සිසුන් සමග කතා කරන්න. එක් එක් ස්වභාවික ව්‍යසනයන් අවස්ථාවට අනුව වෙනස්විය හැකි බව ද කලබල වීමෙන් තොරව ක්‍රියා කළ යුතු බව ද අවධාරණය කරන්න. දේපල බේරා ගැනීමට වඩා ජීවිත බේරා ගැනීම ඉතා වැදගත් බව ද සාකච්ඡාවේ දී තව දුරටත් අවධාරණය කරන්න.

## ක්‍රියාකාරකම 2

හදිසි අනතුරු ඇති විය හැකි අවස්ථා පිළිබඳ ව සිසු අවධානය යොමු කරන්න. හදිසි අනතුරු පිළිබඳ ව තොරතුරු ඇතුළත් පුවත්පත්වල කොටස්, අසා දැන ගත් තොරතුරු, ආදිය රැස් කර ගැනීමට සිසුන් යොමු කරන්න. රැස් කර ගත් එම තොරතුරු ඇසුරින් පහත සඳහන් වගු සටහන සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.

| අනතුර | අනතුර සිදුවූ දිනයන් (සොයා ගත හැකිනම්) | අනතුරට හේතුව | සොයා ගත හැකිනම් අනතුර සිදුවූ ස්ථානය | අනතුරින් ඇති වූ හානිය | |
|---|---|---|---|---|---|
| | | | | පුද්ගල | දේපල |
| උදා: රිය අනතුරකින් තුවාල වීම | 2008.1.2 | රාත්‍රි කාලයේ කළු ඇඳුම් ඇඳ නොසැලකිල්ලෙන් ගමන් කිරීම | ගාල්ල | 01 | බයිසිකලයට හානිවීම |
| දියේ ගිලි මිය යාම | | අනාරක්ෂිත ස්ථානයක දිය නෑම | කළුතර මුහුදේ දී | පාසල් සිසුන් 03යි | |

ඉහත සඳහන් පරිදි සිසුන් ගොනු කළ තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න. එක් එක් කණ්ඩායම තොරතුරු ඉදිරිපත් කිරීමේ දී සාමූහික ව කටයුතු කිරීම සඳහා ද යොමු කරන්න. කණ්ඩායම් ඉදිරිපත් කළ තොරතුරු ඇසුරින් සාකච්ඡාවක යෙදෙන්න. පහත සඳහන් කරුණු එහි දී මතු කර ගන්න.

- සෑම අනතුරක් සඳහා ම විවිධ හේතු ඇති බව
- එක ම අනතුර විවිධ හේතු මත සිදුවිය හැකි බව
- අනතුරු බොහෝ විට නොසැලකිල්ල නිසා සිදුවන බව
- තම ප්‍රදේශයේ හෝ තමා නොදන්නා ස්ථානයක හෝ අනතුරු බහුල ව සිදුවන තැනක ආරක්ෂා වීමට කටයුතු කිරීම අවශ්‍ය බව

- අනතුරු ඇති වන්නේ අපේ ම නොසැලකිල්ලෙන් බව හා ඒවා වැළැක්වීම සඳහා පූර්ව සූදානම අවශ්‍ය බව
- අනතුරුවලින් වැළකීමට කටයුතු කිරීමෙන් මිනිසුන්ගේ මෙන් ම සතුන්ගේ ද ජීවිත ආරක්ෂා කර ගත හැකි අතර ම දේපල ද ආරක්ෂා කර ගත හැකි බව

★ නිවසේ දී පාසලේ දී අතරමග දී විය හැකි අනතුරුවලින් තමා මෙන් ම අන් අය ද ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව සාකච්ඡාවක් තුළින් මතු කරන්න.

★ අනතුරුවලට පත් වූ අය පිළිබඳ ව සිසුන් දන්නා තොරතුරු ඉදිරිපත් කිරීමට ද සිසුන්ට අවස්ථාව සලසන්න.

★ හදිසි අනතුරුවලින් තමා මෙන් ම අන් අය ආරක්ෂා කිරීම සඳහා පණිවුඩ ලබා දෙන භූමිකා රංගන සැලසුම් කරන්න. ඒවායින් ලබා දෙන පණිවුඩ පිළිබඳ කතාබහ කරන්න.

★ තමා මෙන් ම අන් අය අනතුරුවලින් ආරක්ෂා කිරීම/වීම සඳහා පණිවුඩ ඇතුළත් පෙරහැරක් පාසලේ හෝ පාසල අවට හෝ පැවැත්වීමට කටයුතු කරන්න. එහි දී පෝස්ටර් චිත්‍ර හා වෙනත් තොරතුරු ප්‍රදර්ශනය කරවන්න.

## ක්‍රියාකාරකම 3

පහත සඳහන් අදහස් ඇතුළත් පින්තූර ඇඳගන්න.

උදාහරණ :

★ කඳු මුදුනක සිට පහළට හැඬලය අතහැර බයිසිකලයක් පැදයන ළමයෙක්

★ ''නෑම අනතුරුදායකයි'' යන පුවරුව සඳහන් වැවක නෑමට තැත්කරන සිසු පිරිසක්

★ ගසක අත්තක් කපන ආසන්නයේ බලා සිටින ළමයෙක්

★ අනාරක්ෂිත ආකාරයට විදුලිය පරිහරණය කිරීමට තැත්කරන ළමයෙක්

කාඩ්පත්වල දැක්වෙන අනතුරු හා සම්බන්ධ අවස්ථා පිළිබඳ ව සිසු අවධානය යොමු කරන්න.

එම කාඩ්පත් කණ්ඩායම් අතර බෙදා දෙන්න. එම කාඩ්පත් අධ්‍යයනය කරමින් පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

★ සිදුවිය හැකි අනතුරු

★ ඒවා වළක්වා ගැනීමට කළ හැකිදේ

★ අන් අයට එවැනි අනතුරුවලින් වැළකීමට ලබා දෙන උපදෙස්

මෙවැනි අවස්ථා හා සම්බන්ධ වෙනත් සිදුවීම් ද සිසුන්ට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. පාසලේ දී අනතුරු සිදු වූ අවස්ථාවක දී ගත හැකි පියවර පිළිබඳ ව සිසු අවධානය යොමු කරන්න.

උදාහරණ :

- අනතුරක් සිදුවූ වහාම කලබල නොවීම
- අනතුරේ ස්වභාවය අනුව තමාගේ හා අන් අයගේ ආරක්ෂාව ගැන සැලකිලිමත් ව කටයුතු කිරීම
- තමාට ආරක්ෂිත පියවරක් ගත නොහැකිනම් වහාම වැඩිහිටි සහෝදර ශිෂ්‍යයකුට හෝ ගුරු මහත්මයකුට හෝ දැන්වීම
- හැකිනම් ප්‍රථමාධාර ලබා දීම
- අවශ්‍යතාව අනුව ඉක්මනින් රෝහලකට ගෙන යෑමට කටයුතු යෙදීම

ආදී වශයෙන් ලැයිස්තුවක් පිළියෙළ කරන්න.

මෙවැනි අවස්ථාවක දී ප්‍රයෝජනයට ගැනීම සඳහා පාසලේ තිබෙන පහසුකම්/අඩුපාඩුකම් මොනවා දැයි යන්න පිළිබඳ ව සිසු අවධානය යොමු කරන්න.

උදාහරණ :

අනතුරක් පිළිබඳ වාර්තා කිරීමට පාසලේ එම කටයුතු භාර සිසුවෙක්/ගුරු භවතෙක් සිටී ද?

අනතුරට පත් වූ කෙනෙක් ගෙන යෑම සඳහා පාසලේ වෙන් කළ ස්ථානයක් තිබේ ද?

ප්‍රථමාධාර පහසුකම් තිබේ ද? (බෙහෙත් ද්‍රව්‍ය, රෝගියකුට හාන්සිවීමට ඇඳක් වැනි)

අනතුරක් වූ අවස්ථාවක දී ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ ව සිසුන් දැනුවත් වී තිබේ ද?

අනතුරට පත් අයකු රෝහලට ගෙන යෑමට වැඩ පිළිවෙළක් පාසලේ තිබේ ද?

ආදී වශයෙන් තොරතුරු රැස් කරන්න.

ඉහත රැස් කළ තොරතුරු ඇසුරින් පාසලේ දක්නට නොමැති දෑ පාසලේ ඇති කිරීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග යෝජනා කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

## ක්‍රියාකාරකම 4

හදිසි අවස්ථාවල දී දිය හැකි ප්‍රථමාධාර පිළිබඳ ව සිසු අවධානය යොමු කරන්න.

උදාහරණ :

ක්ලාන්තයක් වූ විටක දී
දියේ ගිලීමක දී
සර්පයෙක් දෂ්ඨ කළවිට දී වැනි

මෙවැනි හදිසි අවස්ථා පිළිබඳ ව කතා බහ කරන්න. සිසුන්ට තම අත්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න. ප්‍රථමාධාර දීම පිළිබඳ ව ඊට වඩාත් යෝග්‍ය සම්පත් පුද්ගලයකුගේ සහාය ලබා ගැනීම මේ සඳහා වඩාත් වැදගත් ය.

උදාහරණ :

වෛද්‍යවරයෙක්, හෙද නිලධාරිනියක්

වර්තමානයේ ශ්‍රී ලංකාවේ පැතිරී යන හා පසුගිය දශක කිහිපයක දී ශ්‍රී ලංකාවේ පැතිරී ගිය වසංගත රෝග පිළිබඳ ව තොරතුරු ඊට අදාළ පුවත්පත් වාර්තා ද පින්තූර ද රැස් කිරීමට සිසුන් යොමු කරන්න.

එම තොරතුරු ඇසුරින් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්නට උපදෙස් දෙන්න.

| පැතිරී ගිය වසංගත රෝගය | පැතිරී ගිය ප්‍රදේශය/ ප්‍රදේශ | පැතිරෙන්නේ කෙසේ ද | පැතිරීමෙන් වූ හානිය |
|---|---|---|---|
| උදාහරණ : චිකුන්ගුන්‍යා | සබරගමුව පළාත | මදුරුවන් මගින් | මිනිසුන් විශාල පිරිසක් මිය යෑම<br>මිනිසුන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිරිහීම |

වගුවේ තොරතුරු ඇසුරින් පහත සඳහන් කරුණු මත කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

- ශ්‍රී ලංකාව තුළ පසුගිය දශකවල/වර්තමානයේ බහුල ව පැතිරිගිය වසංගත රෝග තිබේ ද?
- එම රෝග බහුල ව පැතිරෙන ප්‍රදේශ හඳුනා ගත හැකි ද?
- එක් එක් වසංගත රෝගයක් පැතිරීම සිදුවන්නේ කෙසේ ද?
- එක් හේතුවක් රෝග කිහිපයක් පැතිරීමට බලපාන්නේ ද?

ආදී වශයෙන්

මෙම වසංගත රෝග නිසා පුද්ගලයා/පවුල/ගම/රට වශයෙන් ඇති වන පාඩු පිළිබඳ ව කතාබහ කරන්න.

උදාහරණ :

ශරීර ශක්තිය දුර්වලවීම
ආර්ථික වශයෙන් පරිහානි තත්ත්වයට පත්වීම

මැලේරියා රෝගය පසුගිය දශකවල ශ්‍රී ලංකාවේ පැතිරී යාම නිසා උතුරු නැගෙනහිර ප්‍රදේශවල රජරට ප්‍රදේශවල ඇතුලු බොහෝ ප්‍රදේශවල ජන ජීවිතය අඩාල වී ගිය අයුරු, මිනිසුන් මිය ගිය අයුරු, රටේ කෘෂිකර්මය අඩාල වූ අයුරු, මිනිසුන් ප්‍රදේශ අත්හැර ආ අයුරු ආදී කරුණු මත කරමින් සිසු අවධානය මේ පිළිබඳ ව යොමු කරන්න.

මෙම වසංගත රෝග ආශ්‍රිත ව යහපත් පණිවුඩ ලබා දිය හැකි භූමිකා රංගන, චිත්‍ර, පෝස්ටර් ආදී දෑ ඉදිරිපත් කිරීමට ද සිසුන්ට මග පෙන්වන්න.

ඉහත සඳහන් වසංගත වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග ද සොයා බලන්න. එය පහත සඳහන් අයුරින් පෙළ ගස්වන්න.

උදාහරණ :

| බෝවන රෝගය | පැතිරීම | රෝගයෙන් වැලකීම |
|---|---|---|
| මැලේරියාව | මදුරුවා මගින් | මදුරුවන් බෝවීම වැලැක්වීම<br>නිසි ප්‍රතිකාර ගැනීම |


සිසුන් සමඟ පාසල් වත්ත නිරීක්ෂණය කරන්න. මැසි මදුරුවන් බෝවන ස්ථාන හඳුනා ගැනීමට සිසුන් ව යොමු කරන්න.
එම ස්ථානවල මැසි මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග සිසුන්ට ම යෝජනා කිරීමට ඉඩ හරින්න. එම යෝජනා ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ලබා දෙන්න. සිසුන් කරන කටයුතු අගය කරන්න.
තම නිවසේ පරිසරය ද පවිත්‍ර ව තබාගැනීම සඳහා මැසි මදුරුවන් බෝවන ස්ථාන හඳුනාගෙන එම ස්ථාන විනාශ කිරීම සඳහා කරන ලද කටයුතු දැක්වෙන පොත් පිංචක් පවත්වාගෙන යෑමට සිසුන් යොමු කරන්න.
සිසුන් රැස් කළ තොරතුරු අගය කරන්න.
බෝවන රෝග, ඉන් සිදුවන හානි වළක්වා ගැනීම පිළිබඳ ව පුවත්පත්වල පළවන තොරතුරු පන්තියේ ප්‍රදර්ශනය කර ඒවා කියවීමට සලස්වන්න.

## ක්‍රියාකාරකම 5

මදුරු උවදුරෙන් වැලකීමේ පණිවුඩ තහවුරු වීම සඳහා ක්‍රීඩාවල යෙදීමට අවස්ථාව සලසන්න.

උදාහරණ : මදුරු දැල

පන්තියේ සිසුන් සුදුසු පරිදි කොටස් තුනකට බෙදන්න. බෙදා එක් කොටසක් මදුරුවන් ලෙස ද තවත් කොටසක් මදුරු දැල ආකාරයෙන් අත් අල්ලා කවයක් ලෙස ද අනෙක් කොටස සිසුන් ලෙස ද වෙන් කරන්න. සිසුන් කණ්ඩායම මදුරු දැල තුළ සිටිය යුතු ය. පිටත සිටින මදුරුවෝ පියඹා විත් මදුරු දැල තුළ සිටින සිසුන් අල්ලා ගන්නට තැත් කරති. මදුරු දැල ලෙස පෙනී සිටින සිසුන් එය වලක්වා ගන්නට තැත් කරති. මදුරුවෝ දැල තුළට විත් විද්දොත් සිසුන් ලෙඩ වී පරාජය වෙති. දැල තුළට යන්නට නොහැකි මදුරුවෝ පරදිති. මෙහි දී සිසු කණ්ඩායම් මාරු වෙමින් ක්‍රීඩාව කරගෙන යාමට අවස්ථාව දෙන්න.




මෙවැනි නිර්මාණාත්මක ක්‍රීඩා සංවිධානය කර ඒවායේ නිරත වීමට සිසුනට අවස්ථාව ලබා දෙන්න.

## ක්‍රියාකාරකම 6

සිසුන්ට සිදුවන සමාජ විරෝධී ක්‍රියා පිළිබඳ ව සිසු අවධානය යොමු කරන්න. මේ යටතේ වැඩිහිටියන්ගෙන්, පුවත්පත්වලින් පෝස්ටර් හා වෙනත් ප්‍රකාශනවලින් ලබා ගත් තොරතුරු, පින්තූර ආදිය පන්තියට රැස් කර ගැනීමට ද සිසුන්ට උපදෙස් දෙන්න. සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කර මෙම තොරතුරු යම් ක්‍රමයකට ගොනු කිරීම සඳහා උත්සාහ කරන්න. ඒ ඇසුරෙන් පහත සඳහන් සටහන සම්පූර්ණ කිරීමට යොමු කරන්න.

| සමාජ විරෝධී ක්‍රියාව කුමක්ද | සමාජ විරෝධී ක්‍රියාව සිදු වූ ප්‍රදේශය | සමාජ විරෝධී ක්‍රියාවට ළමයා යොමු කර ඇති තැනැත්තා කවුද යන්න |
|---|---|---|
| මත් ද්‍රව්‍ය ගෙන යෑම | කොළඹ | මත් ද්‍රව්‍ය වෙළෙන්දෙක් |
| ළමයින් සේවයට යොදවා ගැනීම | අනුරාධපුර | හෝටලයක හිමිකරුවෙක් |

මෙම රැස් කළ තොරතුරු පන්තියට වාර්තා කිරීම සඳහා ද සිසුන් යොමු කරන්න.එසේ වාර්තා කිරීමේ දී කණ්ඩායමේ සියල්ලන්ගේ ම ක්‍රියාශීලිභාවය හා දායකත්වය වැදගත් බව අවධාරණය කරන්න. ගොනු කරගත් තොරතුරු ඇසුරෙන් සාකච්ඡාවක් ගොඩ නගන්න.

පහත සඳහන් කරුණු මෙම සාකච්ඡාවේ දී සිසුන්ට අවධාරණය කරන්න.

★ සමාජ විරෝධී ක්‍රියා යනු මොනවා ද?
★ ඒවා ශ්‍රී ලංකාවේ කිනම් ප්‍රදේශවල සිදු වී ඇති ද?
★ එවැනි තත්ත්වයන්ට ලක් වන්නේ කෙබඳු ළමයින් ද? එම ළමුන්ගේ වයස් මට්ටම්
★ ඔවුන් සමාජ විරෝධී ක්‍රියා සඳහා යොමු කර ගත් පුද්ගලයන් කවුරුන් ද යන වග

මෙම සාකච්ඡාව තුළ දී පහත සඳහන් කරුණු ද සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

සමාජ විරෝධී ක්‍රියාව හෝ ක්‍රියා නිසා තමාට හෝ තම පවුලට හෝ වන පාඩුව

★ සමාජයෙන් අපකීර්තියක් ලැබීම, කොන් වීම
★ දඬුවම්වලට ලක්වීම
★ ආත්ම ගරුත්වය කෙලෙසීම
★ සමාජයේ පිරිස් නොසැලකීම

සමහර පුද්ගලයින් ඉහත සඳහන් තමාට වන පාඩු නොසලකා සිදු කරන සමාජ විරෝධි ක්‍රියාවල නිසරු බව සිසුන් සමග ගැඹුරින් කතා බහ කරන්න.

තව ද ඉහතින් හඳුනාගත් සමාජ විරෝධි ක්‍රියාවලින් බේරීම සඳහා සිදු කළ හැකිව තිබූ ක්‍රියා මාර්ග ද සිසුන්ගේ අවධානයට ලක් කරන්න. ඊට අදාළ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

මෙම තොරතුරු තව දුරටත් සිසුන් තුළ තහවුරු කරලීම සඳහා භූමිකා රංගන ආදිය ද යොදා ගන්න.

සමාජ විරෝධී ක්‍රියාවන්ට එරෙහි ව අදහස් මතු වන චිත්‍ර පෝස්ටර් නිර්මාණ කිරීමට ද සිසුන් යොමු කරන්න. ඒවා පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

# 9 අපේ අතීත විත්ති

ශ්‍රී ලාංකිකයන් වන අපට ඉතා පෞඪ ඉතිහාසයක් ඇත. අප ඈත අතීතයේ සිට ඉතා දියුණු ශිෂ්ටාචාරයකට උරුමකම් කියා ඇත. තාක්ෂණයෙන් ද කලාශිල්පවලින් ද සංස්කෘතික ගුණාංගවලින් ද එදා බොහෝ දියුණු තත්ත්වයක් පැවැති බවට සාධක බොහෝය. අපේ අනාගත පුරවැසියන් මෙම තත්ත්වයන් හොඳින් හඳුනාගෙන ඒවාට සංවේදීව කටයුතු කරන පිරිසක් වීම වැදගත්ය. ඉතිහාසයෙන් උගත යුතු පාඩම් හා ආදර්ශය ලබාගෙන ක්‍රියා කරනු ලබන පිරිසක් අනාගතයේ රටට දායක කරණු පිණිස මෙම තේමාවේ ක්‍රියාකාරකම් සැලසුම් කර ඇත.

## නිපුණතා

- ✶ රටේ දියුණුවට මහඟු සේවයක් කළ රජ-වරු කිහිපදෙනෙක් හඳුනාගෙන ඔවුන්ගේ සේවයේ යහපත් ආදර්ශ ජීවිතයට එක් කර ගනියි.
- ✶ ඓතිහාසික වටිනාකමකින් යුතු ස්ථාන කිහිපයක් හඳුනාගෙන අභිමානයෙන් යුතුව අගයමින් විස්තර කරයි.
- ✶ ඓතිහාසික ස්ථාන පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රමවේද ඵලදායී ලෙස භාවිත කරයි.
- ✶ අතීත කලා කෘතිවල සුවිශේෂතා ගවේෂණය කර වින්දනයක් ලබයි.
- ✶ ඓතිහාසික වටිනාකමකින් යුතු ස්ථාන සංරක්ෂණයට දායක වෙයි.
- ✶ දේශාභිමානය නැංවෙන කවි, ගී, ගායන හා රංගනවල නිරත වෙයි.



යාපහුව බලකොටුවේ ප්‍රවේශ දොරටුව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

අපේ රටට විශාල සේවාවක් කළ රජවරු හෝ ශ්‍රේෂ්ඨ පුද්ගලයන් කිහිපදෙනකු හෝ හඳුනාගෙන ඔවුන් අප රටට කළ සේවාවන් හඳුනා ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම්වල යෙදීමට සලස්වන්න.

අපේ රටට විශිෂ්ට සේවාවක් කර ඇති රජවරු හෝ පුද්ගලයින් හෝ පිළිබඳ ව සිසුන් ගෙන් විමසන්න. තේමාව ක්‍රියාත්මක කිරීමට පෙර සිසුන්ට සොයා ගත හැකි අපේ රටට විශිෂ්ට සේවාවක් කළ රජවරුන්, පුද්ගලයන් පිළිබඳ ව පින්තූර, කවි, ගී, පුවත්පත් වාර්තා, ජනකතා එකතු කිරීමට සිසුන් යොමු කරන්න. ඒ අනුව රැස් කළ තොරතුරු පන්තියට ගෙන ඒමට උපදෙස් දෙන්න. පන්තියට ගෙනෙන තොරතුරු ඇසුරු කර සාකච්ඡාවක් මගින් අධ්‍යයනය කළ යුතු රජවරු හෝ පුද්ගලයින් හෝ හඳුනා ගන්න.

සිසුන් සමඟ කරන සාකච්ඡාව තුළින් අදාළ පුද්ගලයන් හා රජවරු තෝරා ගැනීම සුදුසු ය.

තෝරා ගන්නා ලද රජවරු හෝ පුද්ගලයන් හෝ පිළිබඳ තව දුරටත් තොරතුරු සොයා ගැනීමට සුදුසු ක්‍රමවේදයන් හඳුනා ගන්න. එම ක්‍රමවේද භාවිත කොට රජවරු, පුද්ගලයන් පිළිබඳ අධ්‍යයනය කිරීමට සලස්වන්න. මෙහි දී පොත්පත්වල ඇති තොරතුරු, ඉතිහාසය පිළිබඳ අවබෝධයක් ඇති පුද්ගලයන් ඡායාරූප වාර්තාමය වැඩසටහන්, නටබුන් සහිත ස්ථාන ආදිය මෙහි දී වැදගත් වේ. ලබා ගත් තොරතුරු පහත දැක්වෙන ලෙස වගුවක් යටතේ සංවිධානය කිරීමට යොමු කරන්න.

| රජවරු හෝ ශ්‍රේෂ්ඨ පුද්ගලයන් | ඉටු කළ සේවාවන් | අද අපට ඒවායින් ලැබෙන ප්‍රයෝජන |
|---|---|---|
| | | |

සිසුන් කණ්ඩායම්වලට බෙදා වගුව ඇසුරින් එක් එක් රජවරු හෝ පුද්ගලයන් හෝ ඉටු කළ සේවාවන් හඳුනා ගන්න. එම තොරතුරු පිළිබඳ ව කතා බහ කරන්න. ඒවා ඇසුරින් උදෑසන රැස්වීමේ දී නැතිනම් සමිතිවල දී ඔවුන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

බිත්ති පුවත්පතට වාර්තාවක් ඉදිරිපත් කිරීම.
කවි, ගී නිර්මාණය කර ගායනා කිරීම.
නාට්‍ය නිර්මාණය කර රඟ දැක්වීම ආදියට සිසුන්ට අවස්ථාව දෙන්න.

මේ සඳහා කණ්ඩායම් වශයෙන් සිසුන් යොමු කිරීම වඩාත් පහසු විය හැකි ය.

රජවරුන් සහ ශ්‍රේෂ්ඨ පුද්ගලයන් කළ සේවාවන් තුළින් අපගේ රටට ශ්‍රී ලාංකිකයන්ට සිදු වූ සේවාවන් සහ අදත් ඒවායින් අප ප්‍රයෝජන ලබා ගන්නා බව සාකච්ඡා කරන්න.

උදාහරණ :

- සුපිරි වෙළෙඳ සැලකින් මුදලක් දී මිලයට ගන්නා සහල් නිෂ්පාදනය කර ඇත්තේ අතීත රජවරු කළ වාරිකර්මාන්ත මගින් බව
- වැව් ජලය බීමට නෑමට සහ විවිධ කටයුතු සඳහා යොදා ගන්නා බව

පහත දැක්වෙන විරිඳු ගායනයට සිසුන්ට අවස්ථාව දෙන්න. එම ගායනයේ දී විරිඳු රබානක්, තාලම්පටක් යොදා ගන්න.

## විරිඳු

*අනුරාපුර පොළොන්නරුව සීගිරි මන බන්දනී ය*
*කුළුනු පිළිම බිතු සිතුවම් - (නන් සිතුවිලි රන්ජනී ය) //*

*පස් පියුමින් පිරුණු පොකුණු රේණු හැළී රන්පාට ය*
*ඉන් නැහැවී නිල් ගැන්වෙන - (ගොයම් තලා පින්පාට ය) //*

*වසන්තයේ හිරිමල් වන බිඟු ගී මිහිරෙන් පිරෙන්නෙ*
*මහියංගන කැලේ සැදෙන - (මී වදවල පැණිපිරෙන්නෙ) //*

*මින්නේරිය අභය වාපි තෝපා ගිරිතලේ සිරිය*
*විසිතුරු ඇති ගී ගයන්න - (සරසවි දේවිටත් බැරිය) //*

*සීගිරි ගිර සරසන කැටපත් පවුරට එබී බලන*
*දෙනෙතට හමු වන්නෙ ලොවෙකි - (සිඟිති කලා පිළිබිඹුවන) //*

*ජේන මාන නිල් හැඩ වන් උගුවතලා සුන්දරී ය*
*මිණිමුතු මතැ වැඩෙන කුමරි (ලක් මව හරි පින්බරී ය) //*

ගායනය : අයිවෝ ඩෙනිස්

සිසුන්ට ගායනය කළ හැකි මෙවැනි විරිඳු, මෙන් ම කවි, ගී සොයා ගායනට හා රංගනයට යොමු කරන්න.

## ක්‍රියාකාරකම 2

අපේ අතීත මුතුන් මිත්තන් කළ ශ්‍රේෂ්ඨ නිර්මාණ හඳුනාගෙන ඒවා අධ්‍යයනය කිරීමට සලස්වන්න.



පැරණි ගල් පාලම - අනුරාධපුරය

මේ සඳහා නිර්මාණයන් අධ්‍යයනය කිරීමට සුදුසු ක්‍රම වේදයන් හඳුනා ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය විධිවිධාන යොදා ගැනීමට කටයුතු සලස්වන්න.

- මෙහි දී පොත්පත්වල ඇති තොරතුරු අධ්‍යයනය කිරීම.
- පාසලේ සිටින ඉතිහාස ගුරුවරයා හෝ වෙනත් සම්පත් පුද්ගලයන් හෝ සමග පවත්වන සාකච්ඡා අදාළ ස්ථානවල ජනප්‍රවාද හා ජනකතා සොයා බැලීම.
- අතීත මුතුන් මිත්තන් කළ නිර්මාණ අධ්‍යයනය කිරීම සඳහා ගවේෂණශීලී චාරිකාවක් සැලසුම් කිරීම.
- එම ගවේෂණශීලී චාරිකාවේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
- නිර්මාණවල ශ්‍රේෂ්ඨත්වය අගය කිරීම.
- ඒවා ඉදි කිරීම සඳහා යොදාගත් දියුණු තාක්ෂණික ක්‍රම.
- ඒවා නිර්මාණය කිරීමේ දී කරන ලද කැප කිරීම.

මෙම ගවේෂණශීලී චාරිකාවේ දී ලබා ගත් තොරතුරු වාර්තා ගත කර ගැනීමට මග පෙන්වන්න.
එම තොරතුරු ඇසුරෙන් වාර්තා පොත් පිළියෙල කිරීම, චිත්‍ර නිර්මාණය කිරීම, කවි, ගීත නිර්මාණය කර ගායනා කිරීම, ආකෘති නිර්මාණය කිරීම සඳහා අවස්ථා ලබා දෙන්න.

උදාහරණ :

කලාවැව හෝ වෙනත් වැවක හෝ ආකෘතියක් නිර්මාණය

වාර්තා කර ගන්නා ලද තොරතුරු ප්‍රදර්ශනය හා ප්‍රසංගයක ආකාරයෙන් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
ඓතිහාසික වටිනාකමක් ඇති ස්ථාන පිළිබඳ ලියවී ඇති කවි, ගී හෝ තනි තනි ව හා සාමූහික ව හෝ ගායනා කිරීමට සිසුන් දිරි ගන්වන්න.

උදාහරණ :

*ලංකා ලංකා පෙම්බර ලංකා*
*පිනවමු ඔබ ලංකා හොබවමු ඔබ ලංකා*
*දිවි දී සුරකිමු ඔබ ලංකා*
*බලිතරු රාවණ ගැමුණු විජය බා*
*නිරිඳුන් ලද ලංකා*
*පුලතිසි දැම් සිරි රහල් කුමරතුගු*
*පඬුවන් ලද ලංකා*
*විදු සක්විති මහ පැරකුම් කිවියුරු*
*කිවියන් ලද ලංකා*
*ඔබ රැකුනොත් ලෝ කුඹුවද අපහට*
*සීත ගඟුලෙ ලංකා*
*ලංකා ලංකා ....*
*මහවැලි කළු කැළණි වලවේ අත්*
*හතරක් ඇති ලංකා*
*සමනොල කිරිගල් පිදුරුතලා නෙක*
*ගිරි ගැට ඇති ලංකා*
*තේවතු පොල්වතු කෙත්වතු හෙළ*
*උකුලේ නලවන ලංකා*
*මුහුදින් අඟලක් ඔබ වැඩෙතොත් එහි*
*පනිමු පනිමු ලංකා*
*ලංකා ලංකා ....*
*හෙල මුතු මිණි වැල් එකට දමලා*
*ඔබ සරසමු ලංකා*
*ගස්වැල්වල මල් එකට ගොතාලා*
*ඔබ පළඳමු ලංකා*
*රැහුණේ කිරිපැණි එකට අනාලා*
*ඔබ පිනවමු ලංකා*
*ඔබ වෙනුවෙන් එන වෙඩි සැර මල් පෙති*
*සේ සළකමු ලංකා*
*ලංකා ලංකා ....*

*ඔබහට අතපොවනට උන්මුන්හට*
*ඉඩ නොතබමු ලංකා*
*අවතොත් මෙහි උන් ලුහුබඳවා ගොළු*
*මුහුද ගෙවමු ලංකා*
*ගොඩදිය අහසේ හැමතැන ඔබගේ*
*නම කියවමු ලංකා*
*අවසන ඔබටම පොහොරට මේ කය*
*මෙහිම හොවමු ලංකා*
*ලංකා ලංකා ....*

ගායනය/රචනය - සුනිල්ශාන්ත

## ක්‍රියාකාරකම 3

අපේ රටේ පවතින ඓතිහාසික වටිනාකමකින් යුතු කලා කෘති පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම්වලට සිසුන් යොමු කරන්න.

අධ්‍යයනය කිරීමට සුදුසු කලා කෘති කිහිපයක් පිළිබඳ ව සිසුන් සමඟ කතා කරන්න. එහි දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

අතීතයේ ශ්‍රී ලංකිකයන්ගේ ආර්ථික සමාජමය සෑම අංශයක් ම කලාවෙන් පෝෂණය වූ එකකි. එවැනි ශ්‍රේෂ්ඨ කලා කෘති විශාල ප්‍රමාණයක් අප රට තුළ දක්නට ලැබේ.

උදාහරණ :

චිත්‍ර කලාව - සීගිරිය, ඉසුරුමුණිය විහාරය,
කැටයම් කලාව - ඇම්බැක්කේ යාපහුවේ දළදා මාලිගාව
සාහිත්‍ය පොත් පත් - පැරකුම්බා සිරිත

මෙහි දී සිසුන් දැනට ම දන්නා කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙමින් සාකච්ඡා මෙහෙයවන්න.

එමගින් අතීත රජවරු රාජ්‍ය පාලන කටයුතු මෙන් ම කලා, සාහිත්‍ය හා සංස්කෘතික කටයුතු කෙරෙහි ද අවධානය යොමු කර ඇති බව සිසුන්ට පැහැදිලි කරන්න.

අධ්‍යයනය කිරීමට සුදුසු ක්‍රමවේද හඳුනා ගැනීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර ගැනීමට උපදෙස් දෙන්න.

උදාහරණ :

- පොත්පත් පරිශීලනය කිරීම.
- සම්පත් පුද්ගලයන්ගේ අදහස් ලබා ගැනීම
- වාර්තා වැඩසටහන් නැරඹීම

හඳුනා ගත් ක්‍රමවේද ඇසුරෙන් එම කලා කෘති පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමට සිසුන්ට මග පෙන්වන්න. ඒවායේ ඇති ශ්‍රේෂ්ඨත්වය හඳුනා ගැනීමට අවශ්‍ය ගුණාංග චරිතායනය කර ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට පියවර ගන්න.

අධ්‍යයනය කිරීමෙන් පසු වාර්තා කරගත් තොරතුරු සුදුසු පරිදි කණ්ඩායම් ලෙස පහත සඳහන් කරුණු ඔස්සේ සාකච්ඡා කරන්න.

- එම කලා කෘතිවල ඓතිහාසික අගය
- ඒවායේ කලාත්මක වටිනාකම
- ඒවායේ වර්තමාන තත්ත්වය
- ඒවා රැක ගැනීමට අපට කළ හැකි දෑ

## ක්‍රියාකාරකම 4

ඓතිහාසික වටිනාකමකින් යුත් ස්ථාන සංරක්ෂණය කිරීමේ වැදගත්කම අවධාරණය කිරීම සඳහා මෙම ක්‍රියාකාරකමෙහි නියැලීමට සිසුන්ට අවස්ථාව සලසන්න.

පුරාවිද්‍යා සංරක්ෂණය සඳහා ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් අධ්‍යයනය කිරීම සඳහා ප්‍රදේශයට සමීප ව පවතින එවැනි ව්‍යාපෘතියක් හෝ එවැනි විධිවිධාන ඇති ස්ථානයක් හෝ හඳුනා ගන්න. මේ සඳහා විශාල ව්‍යාපෘතියක් නොව සෙල්ලිපියක් ආරක්ෂා කිරීම සඳහා වැටක් ඉදි කර තිබීම හා ඒ සඳහා පුරාවිද්‍යා ලාංඡනය යොදා තිබීම වැනි අවස්ථාවන් වඩාත් යෝග්‍ය ය.

එවැනි ස්ථානයක ගවේෂණශීලී චාරිකාවක් සඳහා සිසුන්ට මග පෙන්වන්න. එම චාරිකාවේ දී හමුවිය හැකි පුරා විද්‍යා නිලධාරීන් හෝ එම ස්ථාන පිළිබඳ දන්නා වැඩිහිටියන් හෝ සමඟ සාකච්ඡා කිරීමට ද කලින් සැලසුම් කොට අවස්ථා සලසන්න.

මෙහි දී

- පුරා විද්‍යාත්මක භාණ්ඩ ස්වභාවික ව විනාශ වන ආකාරය
- පුද්ගලයන් විසින් කරනු ලබන විනාශ
- ඒවා (විදේශකයන්ට) විකිණීම වැනි ජාවාරම් ආදිය ගැන අවධාරණය කිරීම පිළිබඳ සැලකිලිමත් වන්න.

ගවේෂණාත්මක චාරිකාවෙන් පසු පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත සඳහන් කරුණු පිළිබඳ විමසිලිමත් වීමට සිසුන් යොමු කරන්න.

- අතීත කලා කෘතිවල සුවිශේෂතා
- ඒවායේ ඓතිහාසික වටිනාකම
- ඒවායින් ලබා ගත හැකි වින්දන
- ඒවායේ සංරක්ෂණයට දායක විය හැකි අන්දම

ඉහත එක් එක් කරුණු පිළිබඳ සිසු අදහස් විමසන්න. අදාළ යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

උදාහරණ :

කලා කෘතිවල සුවිශේෂතා යටතේ නිර්මාණය සඳහා යොදා ගෙන ඇති අමුද්‍රව්‍ය, අලංකරණය වැනි

අතීත කලා කෘතියක් ගෙන එක් එක් කරුණ පිළිබඳ තොරතුරු සිසුන් සමඟ කතා බහ කරන්න. විශේෂයෙන් ඒවා සංරක්ෂණයට දායක විය හැකි අන්දම පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

## ක්‍රියාකාරකම 5

මෙම තේමාවේ දී කරන ලද ගවේෂණශීලී චාරිකා පිළිබඳ පොත් පිංචක් සකස් කරන්න.

සිසුන්ට පහසුකම් ඇති මාධ්‍යවලින් එම පොත් පිංච වඩා හොඳ තත්ත්වයකින් ඉදිරිපත් කිරීමට ඔවුන් දිරිමත් කරන්න.

ඓතිහාසික වටිනාකමකින් යුත් ස්ථාන සංරක්ෂණයට දායකවීම පිළිබඳ නිර්මාණශීලී පණිවුඩ ගෙනෙන පෝස්ටර් නිර්මාණය කිරීම සඳහා කණ්ඩායම් වශයෙන් පවරන්න. එවැනි නිර්මාණ මෙම තේමාවට පසු දෙමාපියන් සඳහා පැවැත්වෙන පන්ති කවයේ දී ඔවුන්ට ඉදිරිපත් කරන්න.

# 10 වැඩ පහසු කිරීමේ මං

අද අප ජීවත් වන්නේ තාක්ෂණික වශයෙන් ඉතා දියුණු ලෝකයකය. අපගේ ජීවිතයේ වැඩ පහසු කර ගැනීම සඳහා නිර්මාණය කළ නොයෙකුත් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ රාශියක් අප අවට පවතී. එම යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනය කිරීම සඳහා පදනම් වූ සරල මූල ධර්ම රාශියක් ඇත. ඒ පිළිබඳ ව අවබෝධයක් හා ප්‍රායෝගික අත්දැකීම් සිසුන්ට ලබා දීම තාක්ෂණික ලෝකය සඳහා ඔවුන් සූදානම් කිරීමේ දී බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. එයට අදාළ නිපුණතා සිසුන් තුළ සංවර්ධනය කිරීමේ අරමුණින් මෙම තේමාව සංවිධානය කර ඇත.

## නිපුණතා

- ✶ සාමූහික කාර්යයක් සැලසුම් කිරීමේ සිට සාර්ථක ව නිම කිරීම තෙක් දායක වෙයි.
- ✶ වැඩ පහසුකර ගැනීම සඳහා සරල යන්ත්‍ර මූලධර්ම භාවිත කරයි.
- ✶ විවිධ ශක්තීන් යොදා ගනිමින් එදිනෙදා වැඩ පහසුකර ගනියි.
- ✶ වැඩ පහසුකර ගැනීම සඳහා යොදා ගත හැකි සරල උපකරණ කිහිපයක් සකස් කරයි.
- ✶ වැඩ පහසුකර ගැනීමට යොදා ගන්නා කවි, ගී ගායනා හා රංගනවල නිරත වෙයි.
- ✶ සාමූහිකත්වය මතුවන නිර්මාණාත්මක ක්‍රීඩාවල නියැලෙයි.
- ✶ උපකල්පනයන් ඇතුව සැලසුම් කිරීම්වල යෙදෙයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

වැඩ පහසුකර ගැනීමට එදිනෙදා භාවිත කරන විවිධ උපකරණ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කර එවැනි දේ කිහිපයක් අඩංගු ලැයිස්තුවක් සකස් කරන්න.

තුන්වන හා හතරවන ශ්‍රේණිවල දී හඳුනා ගන්නා ලද උපකරණ සහ ඒවායින් කෙරෙන කාර්යයන් පිළිබඳ ව කතා බහ කරන්න.

උදාහරණ :

කතුර, ඩැහි අඬුව, බෝතල් මූඩි විවෘත කරන උපකරණ

විවිධ උපකරණ භාවිත කරමින් වැඩ පහසු කර ගන්නා අවස්ථා හා ආකාර නිරීක්ෂණය කළ හැකි කර්මාන්ත ශාලාවක් වැඩ බිමක් සඳහා සිසුන් යොමු කිරීමට කටයුතු සංවිධානය කර ගන්න. එවැනි ස්ථානයක් නිරීක්ෂණයෙන් ලබා ගන්නා අත්දැකීම් පන්තියේ දී කතා බහ කරන්න.

නිවෙස්වල අතීතයේ විවිධ කාර්යයන් සඳහා භාවිත කළ උපකරණ හා ඒවාට ගත කළ කාලය, ශ්‍රමය, මුදල් ආදිය පිළිබඳ ව තොරතුරු සොයා ගෙන ඒමට ශිෂ්‍යයන් යොමු කරන්න.

පන්තිය කණ්ඩායම් කර එම කණ්ඩායමේ ශිෂ්‍යයන් රැගෙන ආ තොරතුරු එක්කර එම එක් එක් කාර්යය සඳහා වර්තමානයේ භාවිත වන ක්‍රම/උපකරණ පිළිබඳ ව සාකච්ඡා කිරීමට යොමු කරන්න.

එම තොරතුරු අනුව විවිධ කාර්යයන් සඳහා අතීතයේ සහ වර්තමානයේ භාවිත කරන ක්‍රම/උපකරණ පිළිබඳ ව කඩදාසියක සටහන් කිරීමට සලස්වන්න. හැකිනම් රූප සටහන් ඇඳීමට ද යොමු කරන්න. (මෙහි දී ඉතා නිවැරදි ව ඇඳීමට සිසුනට අපහසු විය හැකිය. එහෙත් තාක්ෂණ චිත්‍ර සඳහා පිවිසුමක් මෙමගින් ඇති කිරීමට හැකිය)

කණ්ඩායම් සකස් කළ තොරතුරු වාර්තා ඉදිරිපත් කිරීමේ අවස්ථාවල දී අතීතයේ හා වර්තමානයේ භාවිත කළ ක්‍රම/උපකරණවල වාසි සහ අවාසි පිළිබඳ ව සාකච්ඡා කරන්න.

- ★ ගතවන කාලය
- ★ වැයවන මිනිස් ශ්‍රමය
- ★ වැයවන මුදල් (මිල දී ගැනීම සඳහා, විදුලිය සඳහා, නඩත්තු කිරීම සඳහා)

සාමූහික ව වැඩකරන අවස්ථා රංගනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

එවැනි වැඩබිමක/කර්මාන්තශාලාවක අවස්ථා දැක්වෙන චිත්‍ර නිර්මාණයට යොමු කරන්න.

ඒවා ප්‍රදර්ශනය කර ඒ පිළිබඳ කතා බහ කරන්න.

## ක්‍රියාකාරකම 2

යම් දෙයක් එක් තැනක සිට තවත් තැනකට ගෙනයාමේ දී ඇදීමක් හෝ තල්ලු කිරීමක් සිදුවන බව ශිෂ්‍යයන්ට පැහැදිලි කර දෙන්න.


| | |
|---|---|
| තල්ලු කිරීම | විල් බැරෝව |
| | අල්මාරියක් එක් තැනක සිට තවත් තැනකට තල්ලු කිරීම |
| | බෝලයකට පිත්තෙන් ගැසීම |
| ඇදීම | ළිඳකින් වතුර ඇදීම |
| | දොඹකරයකින් බඩු එසවීම |

බරක් එහා මෙහා ගෙන යාමේ දී ඔසවාගෙන යාමට වඩා ඇදීම හෝ තල්ලු කිරීම පහසුවන බව ශිෂ්‍යයන්ට ප්‍රායෝගික ව අත්හදා බැලීමට අවස්ථාව දෙන්න.


මේ සඳහා සරල ක්‍රම කිහිපයක් යොදා ගන්න.

උදාහරණ :

දණ්ඩක් යොදා ගැනීම




විල් බැරෝව මත තබාගෙන යාම



සිසුන් පහත සඳහන් ක්‍රියාකාරකම්වල යොදවන්න.

1. එකම බරක් විවිධ කෝණ සහිත ආනත තල දිගේ ඇදගෙන යාමේ දී අත්දකින වෙනස්කම් මොනවා දැයි බැලීමට සලස්වන්න.

   උදාහරණ : පහසුව, දුර, කාලය



ඉහත රූපයේ ආකාරයට එක මට්ටමක සිට තවත් සම මට්ටමකට යාමට අවස්ථා සපයන්න.

2. විවිධ බර එක ම ආනත තලයක ගෙන යාමට සලස්වන්න. මෙම දෙකෙහි වෙනස්කම් හඳුනා ගෙන විස්තර කිරීමට යොමු කරන්න.

වැඩ පහසු කර ගැනීමේ තවත් ක්‍රමයක් වන්නේ ද්‍රව්‍ය එහා මෙහා ගෙන යාමේ මාධ්‍ය වෙනස් කිරීම ය.

උදාහරණ :

ජලයේ ද්‍රව්‍ය එහා මෙහා ගෙන යෑම

ජලය ගලා යන නොගැඹුරු, අපවිත්‍ර නොවූ ජලය සහිත ඇළක් වේ නම් සිසුන් එහි කැටුව යන්න. මෙම ක්‍රියාකාරකම් සඳහා ජලයට බැසීම අවශ්‍ය නොකෙරේ.

කඩදාසි බෝට්ටුවක්, ප්ලාස්ටික් බෝලයක්, පස් ටිකක්, වැලි ටිකක්, තරමක් ලොකු ගලක්, පිඟන් කෑල්ලක්, පොල් ගෙඩියක්, රබර් ඇටයක් වැනි සපයා ගත හැකි විවිධ දේවල් ගලා යන ජලයට දමා සිදුවන දේ නිරීක්ෂණය කිරීමට යොමු කරන්න.

නිශ්චල ජලය සහිත නොගැඹුරු ස්ථානයක් තෝරා ගන්න. සමීපයේ ආරක්ෂිත තැනක් මේ සඳහා සුදුසු ය.

තරමක් බර ගලක් ලණුවකින් ගැට ගසන්න. ලණුවෙන් අල්ලා එය ඔසවන්න. එම ගල ජලයේ ගිල්වන්න. ඉහළට අදින්න. දැනෙන වෙනසක් වෙයි නම් ඒ පිළිබඳ කතා බහ කරන්න.

තව තවත් ද්‍රව්‍ය සමඟ එසේ කරන්න.

ජලයේ පා වෙන ලී කුට්ටියක් සපයා ගන්න. එක කෙළවරකින් නූලක්/ලණුවක් ගැට ගසා බිම දිගේ ඇදගෙන යන්න.

ලී කුට්ටිය ජලයට දමා ජලයේ ඇදගෙන යන්න. වෙනසක් දැනෙයි නම් එම වෙනස විස්තර කරන්න.


ඉහත ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර ඒ පිළිබඳ තොරතුරු පේළි කිහිපයකින් ලිවීමට සලස්වන්න. සිසුන් ලියා ගත් දෑ පිළිබඳ ව නැවත සාකච්ඡා කර සමාලෝචනයක් කරන්න.


## කප්පි

එසැවීම පහසු කරන තවත් ක්‍රමයක් වශයෙන් කප්පි භාවිතය හඳුන්වා දෙන්න.

කප්පි වෙළෙඳ පොළේ ඇත. ලියවන පට්ටල තිබේ නම් ලීවලින් විවිධ ප්‍රමාණයේ කප්පි කිහිපයක් ලියවා ගැනීමට ද පිළිවන.

කප්පි භාවිත කළ හැකි විවිධ අවස්ථා අත්හදා බැලීමට සිසුනට අවස්ථා සපයන්න.






වෙළෙඳපොළේ ''කැස්ටර් වීල් ''නමින් යටතට සවිකළ හැකි රෝද ඇටවුම් ඇත. ඉන් 4ක් සපයා ගන්න. කැස්ටර්වීල් සපයා ගත නොහැකි නම් වෙනත් විකල්ප ආදේශක යොදා ගන්න.



රූපයේ දක්වා ඇති තරමේ සෙන්ටිමීටර 3ක් පමණ මහත ලෑල්ලක් ද සපයා ගන්න.

කැස්ටර් රෝද සවි කිරීමට තරම් ප්‍රමාණවත් හිල් (රූපයේ පරිදි) විද ගන්න. ලෑල්ලේ දෙකෙළවර ලණුවක් ගැට ගසා ගැනීම සඳහා කොකු දෙකක් ද සවිකර ගන්න.



මෙම පුවරුව සහ රෝද කට්ටලය භාවිත කරමින් විවිධ ආකාරයේ කරත්ත සාදන්න.

තනි රෝදයකින් කරත්තයක් සෑදිය හැකි ද? යන්න අත්හදා බැලීමට අවස්ථාව දෙන්න.

පුවරුවේ විවිධ ස්ථානවලට රෝද දෙකක් යොදා ඇද ගෙන යෑමට හැකි කරත්තයක් සාදන්න.


ඒ එක් එක් අවස්ථාවේ දැකිය හැකි හොඳ ලක්ෂණ මෙන් ම අසාර්ථක වන අවස්ථා හඳුනා ගන්න.

පහත ප්‍රශ්න ඔස්සේ සිසුන් සොයා බැලීම්වලට යොමු කළ හැකි ය.

රෝද දෙකේ ඇදගෙන යන කරත්තයකට රෝද සවි කළ යුතු හොඳ ම ස්ථාන මොනවා ද?

රූපයේ දැක්වෙන පරිදි රෝද සවි කළ විට දකින සුවිශේෂ ලක්ෂණ මොනවා ද?

රෝදවල මැද සිදුර හරි මැදින් නොවන විට දකින ලක්ෂණ මොනවා ද?



අත්හද... ට සලස්වන්න.

කරත්ත හ... ගෙන වර්ග නැවත නිරීක්ෂණය කිරීමට සලස... න.

මෝටර් රථයක, අත් ට්‍රැක්ටරයක වැනි බහුල ව වාහනවල යොදා ගෙන ඇති රෝද කෙරෙහි අවධානය යොමු කරන්න.

ඩීසල්වලින් ක්‍රියාකරන අත් ට්‍රැක්ටරවල ගුරු රෝදය නමින් හඳුන් වන රෝදයක් ඇත. එම රෝදයෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද? එවැනි රෝද ඇති සෙල්ලම් කාර් වැනි වෙනත් අවස්ථා හඳුනා ගැනීමට සලස්වන්න.

සිසුන් කණ්ඩායම් වශයෙන් එකතු වී ක්‍රියාකාරී සෙල්ලම් කරත්තයක් නිර්මාණය කිරීමට යොමු කරන්න. අවශ්‍ය දෑ සපයා ගැනීම, නිර්මාණයේ මූලික ලක්ෂණ පිළිබඳ ව කතා බහ කිරීම. ඒ සඳහා පෞද්ගලික උදවු හා උපදෙස් දීම. නිර්මාණය අලංකරණය වැනි අවස්ථා සිහිපත් කරන්න. සෑදූ නිර්මාණ ක්‍රියාකරවා වින්දනයක් ලැබීමට ද ඉඩ දෙන්න.

දැති රෝද තවත් විශේෂයකි.

දැති රෝද දැකිය හැකි වාහන, උපකරණ හෝ ඇටවුම් කෙරෙහි අවධානය යොමු කරන්න.

වාහන/උපකරණ ආදියෙන් ඉවත් කරන ලද දැති රෝද එකතු කර ඒවා හොඳින් නිරීක්ෂණය කිරීමට සලස්වන්න.

පා පැදියක ඇති රෝදවල ක්‍රියාකාරීත්වය පහත සඳහන් කරුණු අනුව අධ්‍යයනය කිරීමට අවස්ථා සලසා දෙන්න.

- ★ දැති රෝද එක සමාන වන්නේ කුමන ලක්ෂණ මත ද?
- ★ එකක් එක රවුමක් කරකවන විට අනෙක් දැති රෝදය එම රවුමට කරකැවේ ද?
- ★ මෙයින් සලසා ගෙන ඇති වාසිය කුමක් ද?
- ★ පැඩලය සවිකර ඇති රෝදය තවත් විශාල වුවහොත් කුමක් වේ ද?
- ★ තවත් කුඩා වුවහොත් කුමක් වේ ද?
- ★ රෝද යා කරන චේන් එකෙන් ඉටු කරන කාර්ය කුමක් ද?
- ★ චේන් හැර රෝදයකින් රෝදයක් කරකැවීම (භ්‍රමණය) පිණිස යොදා ගන්නා වෙනත් ක්‍රම මොනවා ද? අවස්ථා මොනවා ද?

## ක්‍රියාකාරකම 3

විදුලියෙන් හෝ ඉන්ධනවලින් ක්‍රියාකරන යන්ත්‍ර ඇති කර්මාන්ත ශාලාවකට ගොස් එහි විවිධ කාර්ය සඳහා යන්ත්‍ර විවිධ අයුරින් යොදා ගෙන ඇති ආකාරය නිරීක්ෂණය කිරීමට සලස්වන්න.

උදාහරණ :

- ඇඟලුම් කර්මාන්ත ආයතනවල රෙදි මහන මැසිම ක්‍රියා කරන්නේ කකුලෙන් 'පැඩල්' කර නොවේ.
- රෙදි කපන යන්ත්‍රයේ තලය ඉහළ පහළ යවන්නේ එය ක්‍රියා කරවන්නා විසින් නොවේ.


- මෝටර රථයක/අත් ට්‍රැක්ටරයක රෝද කරකවන්නේ එය ක්‍රියා කරවන්නා නොවේ.


මෙවැනි අවස්ථා නිරීක්ෂණයට පසුව ඒ පිළිබඳ ව කතා බහ කරන්න. උපකරණ පිළිබඳ ව සිසුන්ට අසා දැන ගැනීම සඳහා ඒ පිළිබඳ දැනුමක් ඇති කෙනකු ද සම්පත් පුද්ගලයකු ලෙස හැකිනම් පන්තියට ගෙන්වා ගන්න. හැකිනම් සිසුන්ට නිරීක්ෂණය කිරීම සඳහා උපකරණ කිහිපයක් ද රැගෙන ඒමට යොමු කරන්න.

## ක්‍රියාකාරකම 4

විවිධ මාධ්‍ය උපයෝගී කර ගනිමින් වැඩ කිරීම පහසු කිරීමට අවශ්‍ය තල්ලුව, ඇදීම, එසැවීම හෝ භ්‍රමණය ලබා ගන්නා බව අවබෝධ කර ගැනීමට සලස්වන්න.
පහත ඇත්තේ ඒ ඒ ප්‍රභවය ඇසුරින් ඇදීම, තල්ලු කිරීම, කරකැවීම (භ්‍රමණය) සහ එසවීම කරවා ගන්නා ක්‍රමවල සරල ආකෘතීන්ය. ද්‍රව්‍ය සපයා සෑම සිසුවකුට ම මින් එකක් හෝ දෙකක් හෝ සෑදීමට අවශ්‍ය මග පෙන්වීම කරන්න. (අවශ්‍ය නම් සම්පත් පුද්ගලයකුගේ සහාය ලබා ගෙන සිසුන් සමඟ මේවා නිර්මාණය කරන්න.)

උදාහරණ :
- හුමාලයෙන් ක්‍රියා කරන බෝට්ටුවක්/බඹරයක්





- බඩු එහා මෙහා ගෙන යන දොඹකරයක්
- විදුලි සෝපානයක් (ආකෘතියක්)
- විදුලියෙන් ක්‍රියා කරන දුම්රියක්
- දහඩිය නිවා ගැනීමට සුදුසු පංකාවක්

නූතන ''රොබෝ'' පිළිබඳ ව කතා කිරීමට සුදුසු දැනුවත් කෙනකු සිසුනට හමු වීමට සලස්වන්න. මෙහි දී රොබෝ යන්ත්‍ර නිපදවීමට හේතු ඒවායින් කෙරෙන කාර්යයන් ආදිය පිළිබඳ කතා කරන්න. රොබෝ යන්ත්‍ර ලෙස පෙනී සිටිමින් ඒවා කතා කරන ආකාරය නිරූපණය කිරීමට සිසුන් යොමු කරන්න. නැතහොත් රොබෝ ක්‍රියාකාරීත්වය ''වීඩියෝ'' වැඩසටහනකින් බැලීමට අවස්ථා සපයන්න.

## ක්‍රියාකාරකම 5

චුම්බක (කාන්දම්) පිළිබඳ ඔවුන් දන්නේ මොනවා දැයි සිසුන්ගෙන් අසන්න.
හතරවන ශ්‍රේණියේ දී කාන්දම් පිළිබඳ ව ඉගෙන ගත් දේ සිහිපත් කිරීම සඳහා ප්‍රශ්න අසන්න.
චුම්බකවල හැඩ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
හැකි නම් විවිධ හැඩයේ චුම්බක කිහිපයක් පන්තියට ගෙනැවිත් සිසුන්ට නිරීක්ෂණයට අවස්ථාව දෙන්න.

උදාහරණ :

දණ්ඩ චුම්බක (Bar magnet )
රවුම් හැඩයේ චුම්බක (Circle magnet)
ලාඩම් හැඩයේ චුම්බක (Horse shoe magnet)
මුදු හැඩයේ චුම්බක (Ring magnet)

එදිනෙදා ජීවිතයේ චුම්බක භාවිත වන අවස්ථා/ උපකරණ පිළිබඳ ව සාකච්ඡා කරන්න.

උදාහරණ :


- කබඩ්/අල්මාරිවල දොරවල් සඳහා
- ශීතකරණවල
- අත්බෑග්

කාන්දම් භාවිත කර ඇති සෙල්ලම් බඩු කිහිපයක් සිසුන්ට පෙන්වන්න. ඒවා චුම්බක භාවිතයෙන් ක්‍රියා කරන ආකාරය නිරීක්ෂණයට යොමු කරන්න.

චුම්බක භාවිත වන උපකරණ කිහිපයක් නිර්මාණයට අවස්ථාව සලස්වන්න.


චුම්බක භාවිතයෙන් චලනය වන සමනලයකු සෑදීමට අවස්ථාව ලබා දෙන්න. ඒ සඳහා සිසුන් කණ්ඩායම් කර පහත උපකරණ කට්ටලය බැගින් ලබා දෙන්න.

- මුදු/රවුම් හැඩයේ චුම්බකයක්
- කඩදාසිවලින් නිර්මාණය කරන ලද සමනලයෙක්
- නූල්, සෙලෝටේප්
- කෝටු කැබලි දෙකක්
- රෙජිෆෝම් කැල්ලක් (20 cm x 6 cm)/මැටි
- කතුරක්



පහත දැක්වෙන රූපය කළුලෑල්ලේ අඳින්න.

රෙජිෆෝම්/මැටි →



Resource :JICA OBIHIRO Presentation Manual - 2007

එය නිර්මාණය කරන ආකාරය සිසුන්ට පැහැදිලි කරන්න.

රූපයේ දක්වා ඇති ආකාරයට කෝටු දෙක එක් කෙළවරකින් ගැට ගසන්න.

තිරස් ව ඇති කෝටුවේ යට පැත්තේ චුම්බකය සෙලෝටේප් මගින් රඳවන්න.

සාදාගත් ඇටවුම රූපයේ ආකාරයට ආධාරකයක් (රෙජිෆෝම් හෝ මැටි) මත සවි කරගන්න.

කඩදාසි සමනලයාගේ ඔළුවේ උඩ සිට පහළට ඇල්පෙනෙත්තක් රඳවන්න. පහළ කෙළවරට නූලක් ගැට ගසා ගන්න.

කඩදාසි සමනලයා රූපයේ දැක්වෙන ආකාරයට චුම්බකයට 2 cmක් පමණ ඈතින් සිටින සේ නූලේ අනෙක් කෙළවර රෙජිෆෝම් කැබැල්ලට රඳවන්න.

පහත අයුරින් ප්‍රශ්න අසමින් නිරීක්ෂණයට අවස්ථාව දෙන්න.

සමනලයා සෙලවීමට/චලනය වීමට හේතුව/හේතුවන ද්‍රව්‍ය සිසුන්ගෙන් විමසන්න. (ඇල්පෙනෙත්ත කාන්දමට ආකර්ෂණය වී ඇති බැවින්)

ඇල්පෙනෙත්ත ගැල වූ විට සමනලයාට කුමක් වෙයි ද?

ඇල්පෙනෙත්ත වෙනුවට යොදා ගත හැකි වෙනත් ද්‍රව්‍ය මොනවා ද?

වෙනත් ද්‍රව්‍ය භාවිත කර සිදුවන දේ නිරීක්ෂණයට අවස්ථාව දෙන්න.

සිදු වන දේ වාර්තා කිරීමට අවස්ථාව දෙන්න.


චුම්බකයේ ඇති කුමන ලක්ෂණය නිසා මෙසේ සිදුවීද යන්න සිසුන්ගෙන් විමසන්න. යකඩ වැනි දේ කාන්දම්වලට ඇද ගැනීමක් (ආකර්ශනයක්) සිදුවේ.

මෙය චුම්බකත්වය ලෙස සිසුන්ට හඳුන්වා දෙන්න.

සමනලයා සහ කාන්දම අතර කඩදාසියක් තැබූ විට සිදුවන දේ නිරීක්ෂණය කිරීමට යොමු කරන්න. කඩදාසිය වෙනුවට ප්ලාස්ටික්, ඝන කඩදාසියක්, වීදුරු, ලී වැනි දේ තබා සිදුවන දේ නිරීක්ෂණය කිරීමට ද අවස්ථාව දෙන්න.


චුම්බකවල ලක්ෂණ පිළිබඳ ව තව දුරටත් අවබෝධ කර ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දීම සඳහා පහත නිර්මාණය ද යොදා ගත හැකි ය.

මෙම රූප සටහන කලුලෑල්ලේ හෝ වෙනත් සුදුසු කඩදාසියක ඇඳ ප්‍රදර්ශනය කරන්න.



Resource :JICA OBIHIRO Presentation Manual - 2007

ඉහත ඇටවුම නිර්මාණය සඳහා රවුම් කාන්දම් දෙකක්, කෝටු දෙකක්, නූල්, කුඩා ප්ලාස්ටික්/රෙජිෆෝම් බෝලයක්, සෙලෝටේප් සහ බෝලය වටේට දැමීම සඳහා කාඩ්බෝඩ් රවුමක් අවශ්‍ය වේ.




මෙය සාදන ක්‍රමය සිසුන්ට පහදා දෙන්න.

- බෝලය මත නූලක් තබා සෙලෝටේප්වලින් අලවා ගන්න.
- රූපයේ පෙනෙන පරිදි බෝලය කාඩ්බෝඩ් රවුමෙහි රඳවන්න.
- බෝලයේ යට පැත්තේ හරි මැද රවුම් කාන්දමක් සෙලෝටේප් මඟින් රඳවන්න.
- රූපයේ දක්වා ඇති ආකාරයට කෝටු දෙක ගැට ගසා සකස් කරන ලද ඇටවුම රෙජිෆෝම් කැබැල්ල මත සිරස් ව රඳවන්න. (රෙජිෆෝම් වෙනුවට මැටි/ලී භාවිත කළ හැකි ය.)
- ඇටවුමේ සිරස් කෝටුව ඉදිරියෙන් කෙළවරෙහි රෙජිෆෝම් කැබැල්ල මත අනෙක් කාන්දම රඳවා ගන්න. (බෝලයේ යට පැත්තට සහ රෙජිෆෝම් කැබැල්ල මත අලවන ලද කාන්දම් දෙකෙහි මුහුණට මුහුණ ලා සිටින ධ්‍රැව දෙක සමාන විය යුතුයි.
- බෝලය ගැට ගසා ඇති නූල තිරස් කෝටුව කෙළවරේ සිට ක්‍රමයෙන් පහළට ගෙනයන්න.
- කාන්දම් දෙකෙහි එක ම ධ්‍රැව එකිනෙකට ඇද ගැනීමක් සිදු නොවන නිසා කාන්දම් දෙක සමීප කරන විට එකිනෙකින් ඈත්වීමට (විකර්ශනයට) උත්සාහ දරයි. එවිට බෝලය රවුමට කරකැවීමට පටන් ගනී. එම අවස්ථාවේ දී නූල තිරස් කෝටුවේ ගැට ගසන්න.

  සිසුන්ට මෙය නිරීක්ෂණයට ලබා දී බෝලය කරකැවීමට හේතුව සාකච්ඡා කරන්න.

## ක්‍රියාකාරකම 6

රූපයේ පරිදි විද්‍යුත් චුම්භකයක් සාදා ගැනීම සඳහා යකඩ ඇණයක්, කොයිල් කම්බි කැබලි කිහිපයක්, වියළි කෝෂයක් සහ වයර් කැබලි කිහිපයක් සම්බන්ධ කරන්න.



මෙබඳු අවස්ථාවන්හි දී යකඩ ඇණය කාන්දමක් ලෙස ක්‍රියා කරන ආකාරය දැක ගැනීමට සලස්වන්න.

එක් වියළි කෝෂයක් පමණක් සම්බන්ධ කරන විට ඇල්පෙනෙත්ති කොපමණ ප්‍රමාණයක් යකඩ ඇණය වෙත ඇදී එත් ද? නිරීක්ෂණය කිරීමට අවස්ථාව දෙන්න.

කෝෂ ගණන හා කොයිල් ලෙස යොදා ගන්නා කම්බිවල දිග වෙනස් කරමින් මෙම ක්‍රියාකාරකම කිහිපවරක් කරන්න. පහත ආකාරයේ වගුවක සටහන් කරන්න.

| කොයිල් කම්බියේ දිග | කෝෂ ගණන | ඇදී එන ඇල්පෙනෙත්ති ගණන |
|---|---|---|
| | | |

විද්‍යුත් චුම්බක භාවිත වන උපකරණ පිළිබඳ ව සිසුන් සමග කතා බහ කරන්න.

විදුලි සීනුව සඳහා ද මේ ආකාරයට ම විද්‍යුත් චුම්භකයක් සකසා ගන්නා බව පැහැදිලි කරන්න.

සිසුන්ගේ ද සහාය ඇති ව විදුලි සීනුවක් නිර්මාණය කරන්න. (මේ සඳහා අවශ්‍ය නම් සම්පත් පුද්ගලයකුගේ ද සහාය ලබා ගන්න)

මෙහි දී කම්බි ඇණය කාන්දමක් ලෙස ක්‍රියාකරවන බව යකඩ කුඩු ස්වල්පයක් හෝ ඇල්පෙනෙත්ති කිහිපයක් හෝ උපයෝගී කර ගනිමින් පෙන්වා දෙන්න.

විදුලි කෝෂය හා සම්බන්ධතාවය ඉවත් කළ විට කුමක් සිදු වන්නේ දැයි නිරීක්ෂණය කිරීමට යොමු කරන්න.

## ක්‍රියාකාරකම 7

එදිනෙදා ජීවිතයේ දී ආලෝකය උපයෝගී කර ගන්නා අවස්ථා පිළිබඳ ව සාකච්ඡා කරන්න.

ආලෝකය උපයෝගී කරගෙන වැඩ පහසු කර ගන්නා අවස්ථා පිළිබඳ සිසුන් අත්දැක තිබේ දැයි අසන්න.

අඳුරේ දී ද ඡායා රූපයක් ගත හැකි වන පරිදි කැමරාවක ඇති බල්බයක් මගින් (ෆැලෑෂ් ලයිට්) ආලෝකය නිකුත් කළ හැක.

විදුලි පන්දමක් භාවිත කිරීම.

සිනමා ශාලාවක තිරය මතට රූප පතිත කිරීම.

මාර්ග සංඥා පද්ධතියක ක්‍රියාකාරිත්වය


ආලෝකය උපයෝගී කර ගන්නා අවස්ථාන්ට අදාළ විවිධ නිර්මාණ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

සරල විදුලි පරිපථයක් භාවිත කර සෙල්ලම් මාර්ග සංඥා පද්ධතියක් සැකසීම.

මේ සඳහා ලෑලි කැබැල්ලක් වියළි කෝෂයක්, කුඩා බල්බ 3ක්, වයර් කැබලි කිහිපයක්, ඇමුණුම් කටුවක් සහ ඩ්‍රොයින්පින් කිහිපයක් සපයා ගන්න.


බල්බ තුන රතු, කොළ සහ කහ සෙලෝපේන් කඩදාසිවලින් ආවරණය කිරීමට හෝ එම පාටවලින් පාට කිරීමට උපදෙස් දෙන්න.

ස්විචයේ ඇමුණුම් කටුව එක් පිහිටුමකට ගෙන ආ විට එක් බල්බයක් දැල්වෙන අයුරින් පහත රූපයේ පරිදි ඇටවුම සකස් කර ගන්න.



ස්විචයේ ඇමුණුම් කටුව එක් එක් පිහිටුමට ගෙනයමින් සෙල්ලම් මාර්ග සංඥා පද්ධතියේ ක්‍රියාකාරීත්වය අත්විඳීමට සෑම සිසුවකු ම යොමු කළ යුතු ය.

හිරු එළිය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා පෙන්වීම සඳහා පහත ආකාරයේ ක්‍රියාකාරකමක් සිසුන්ට හඳුන්වා දෙන්න.



හොඳින් හිරු එළිය ඇති අවස්ථාවක වළඳ/තාච්චිය ඉරු එළියට අල්ලා තාච්චියේ පතුලේ සිට කාඩ්බෝඩ් කෑල්ලක් තාච්චියෙන් ඉවතට ගෙන යන්න.


ආලෝක කදම්භය කුඩා තිතකට කුඩාවන ස්ථානය සොයා ගන්න.

එම ස්ථානයේ පිහිටන පරිදි කුඩා ජලය බඳුනක් සිටින සේ බඳුන එල්ලා තබන්න.

මඳ වේලාවකට පසුව ජලයේ උෂ්ණත්වය පරීක්ෂා කර බලන්න.

## මැජික් පෙට්ටිය

කුඩා කාඩ්බෝඩ් පෙට්ටියක් සපයා ගන්න. එහි එක පැත්තක් කපා විවර කර ගන්න.
කැඩපත් කෑලි දෙකක් ගෙන පෙට්ටිය තුළ සිටුවන්න. (රූපය බලන්න) (මුහුණ බලන පැත්ත ඇතුළට සිටින සේ) කැඩපත් දෙක මැද යමක් තබන්න.
කැඩපත් තුළින් බලන්න. කැඩපත්වල පිහිටීම වෙනස් කර අලුත් දේවල් සොයන්න.



## ක්‍රියාකාරකම 8

පහත සඳහන් ක්‍රීඩාවේ සිසුනට නිරත වීමට අවස්ථාව ලබා දෙන්න.
සිසුන් කණ්ඩායම් හතරකට/පහකට සුදුසු පරිදි බෙදා ගන්න.
ද්‍රව්‍ය/වස්තූන් පහක් පරිසරයෙන් සපයා ගන්න.

උදාහරණ :

- රවුම් හැඩ ඇති ගලක්
- වල් පැළෑටියක කොළ 2ක් සහිත ඉත්තක්
- සෙ.මී. 30ක් පමණ දිග ලී කැබැල්ලක්
- වැටී තිබෙන ශාක පත්‍රයක් (උදාහරණ : කොස් කොළ, වැනි පහසුවෙන් සපයා ගත හැකි මෙවැනි දෑ) රැස් කර ඒවා ස්ථාන ගත කොට ඒවා හොඳින් නිරීක්ෂණයට සිසුනට අවස්ථාව ලබා දෙන්න.

එම නිරීක්ෂණය කළ දෑ පරිසරයෙන් සොයා ඒමට උපදෙස් දෙන්න.
ඒ සඳහා නිශ්චිත කාලයක් ලබා දෙන්න.

මෙම ක්‍රීඩාවේ පහත සඳහන් කරුණු කෙරෙහි අවධාරණය කරන්න.

1. පරිසරයෙන් සපයා ගත යුතු දේ නිරීක්ෂණය කළ දේ හා සමාන විය යුතු බව
2. අඩු කාලයකින් නිම කිරීම සඳහා කළ යුතු දේ පිළිබඳ කණ්ඩායම විසින් තීරණය කළ යුතු බව
3. වැඩ පහසු කර ගැනීම සාමූහික ව කටයුතු කළ යුතු බව

මෙවැනි තවත් ක්‍රීඩා නිර්මාණය කරගෙන සිසුන් ඒ සඳහා යොමු කරන්න.
වැඩ කිරීමේ දී තම මහන්සිය කාන්සිය නිවා ගැනීම සඳහා කවි, ගී, ගායනා කර ඇති බව සිසුන්ට මතක් කර දෙන්න.

උදාහරණ :

*උදේ සිටන් වකුටු කොන්ද දිග	හැරපල්ලා*
*හිසේ තියෙන ලේන්සු පොඩිය අතට	ගනිල්ලා*
*අතේ තියෙන ගොයම් මිටිය බිම	දමපල්ලා*
*සතර වරම් දෙවි පිහිටෙන් ගොඩ	වරෙල්ලා*

*හෝ ... හෝගා රැල්ල බිඳේ*
*මූ දේ .... නාදේ ....*
*පැදලා පැදලා දෑත රිදෙනවෝ*
*වඩදිය මා වෙහෙසන්නේ*
*රැල්ල කපාලා ඇදියන් ඔරුවේ*
*ගංගා මෝය දිහාවේ*
*හෝ ...*
*සිතලේ මා වෙව්ලමින්නේ*
*තනිව මේ රෑ යාමේ*
*නිදිවරා වෙහෙසි සුසුම්ලා*
*මෝය බලා යන්නේ*
*හෝ ...*
*ගී නදින් මා විඩා පලායයි*
*හෝ හෝ ගා*
*ජීවිතේ රස දැන් දැනෙන්නේ*
*මී අමා රස වෑහේ*

රචනය - ගායනය - සුනිල් ශාන්ත

*උඩරට කඳුකර සිරියා පරදන*
*රූබර මුහුණ ඔබේ .....*
*රතැඟිලි දිගුකොට මදහස නංවන*
*තේ දළු නෙලන ළඳේ*
*රට පනගන්වන ජාතිය සුරකින*
*ජාතික ධනය අපේ*
*අපි ණය ගැතිවෙමු සුකොමල දෑතට*
*තේ දළු නෙලන ළඳේ*
*ලියලන දළුවල කරටිය සැමවිට*
*ඔබෙ නෙත් දෙකට පෙනේ*
*දනමන පිනවන ඉමිහිරි පානෙකි*
*පිටරට යවන අපේ*
*සේවය යහපත ලොවටම සලසන*
*කම්කරු ළඳකි ගමේ*
*ලංකා පොළොවේ පැළවෙන තේ ගස*
*ඔබෙ දිවි රකිනු ලැබේ*

ගායනය - චිත්‍රා සෝමපාල

# 11 අපි ලක් වැසියෝ

මිනිස් සමූහයක එකතුවෙන් සකස් වන සමාජයක් තුළ ජාති ආගම්, යනා දී ලෙස විවිධ ජන කොටස් සහිත සමාජ අනුබණ්ඩ ඇති වේ. එවැනි සමාජයකට අයත් පුද්ගලයන් ඒ සමාජය තුළ දැකිය හැකි සංස්කෘතික සමාජීය තත්ත්වයන් හා බැඳී දේශයට හිතැති අනන්‍යතාවන්ට ගරු කරන පුද්ගලයන් ලෙස කටයුතු කිරීමෙන් ජන කොටස් අතර සුරක්ෂිතතාව තහවුරු කෙරේ. විවිධ ජන කොටස් අතර පවතින සංස්කෘතීන් අගය කරමින් හා ඒවාට ගරු කරමින් සහජීවනයෙන් කටයුතු කිරීම කුඩා කළ සිටම හුරුවිය යුතු බැවින් එම හුරුව ලබා දීමට මෙම තේමාව සැලසුම් කර ඇත.

## නිපුණතා

- ✶ සියලු ම ජන කොටස්වල අනන්‍යතාවයට ගරු කරමින් සහයෝගයෙන් කටයුතු කරයි.
- ✶ රටේ නිදහස වෙනුවෙන් සිදු කළ කැප කිරීම් අගය කරමින් දේශාභිමානයෙන් යුතු ව කටයුතු කරයි.
- ✶ ශ්‍රී ලාංකිකයකු ලෙස සිය අනන්‍යතාවය ආරක්ෂාවන අයුරින් කටයුතු කරයි.
- ✶ සම්පත් නිසි අයුරින් සුරැකෙන ලෙස කටයුතු කරයි.
- ✶ රටේ කීර්තිනාමය නැංවීමට දායකත්වය දැක් වූ චරිත ආදර්ශනට ගෙන ක්‍රියා කරයි.
- ✶ දේශීය අනන්‍යතාව විදහා දැක්වෙන ගායන, රංගන ක්‍රීඩා, සහ නිර්මාණවල නිරත වෙයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

ශ්‍රී ලංකාවේ වාසය කරන ආදිවාසීන් ද ඇතුළුව සියලු ජන කොටස්වල අනන්‍යතාවය විදහා දැක්වෙන පන්ති මට්ටමින් ප්‍රදර්ශනයක් පවත්වන්න. එම ප්‍රදර්ශනය සඳහා

- ආචාර විධි
- ඇඳුම් පැළඳුම්
- වැඳුම් පිදුම්
- ආගමික උත්සව
- ආහාර පාන

වැනි අංග නිරූපණය වන චිත්‍ර/ඡායාරූප/පින්තූර කල් තබා රැස් කර ගන්න. ඒවා සකස් කොට කිසියම් පිළිවෙළකට පන්ති කාමර මට්ටමින් ප්‍රදර්ශනයක් පවත්වන්න. ප්‍රදර්ශනය නරඹමින් ඒවායේ ඇති විශේෂ ලක්ෂණ ලැයිස්තු ගත කිරීමට පැවරුමක් දෙන්න. කණ්ඩායම් විසින් හඳුනා ගත් ලක්ෂණ මොනවා ද යන්න ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න. සිසුන්ගේ ඉදිරිපත් කිරීම්වලදී මතු වන එක් එක් සුවිශේෂ ලක්ෂණ කළුලෑල්ලේ හෝ ඩිමයි කඩදාසියක හෝ සටහන් කර ගන්න. ගුරුවරයාගේ මැදිහත් වීමෙන් හඳුනා නොගත් ලක්ෂණ තිබේ නම් ඒවා මතු කරන්න.

## ක්‍රියාකාරකම් 2

පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න. සෑම කණ්ඩායමකට ම වාර්ෂික ලිතක් බැගින් දෙන්න. ලිත් වර්ෂය තුළ ඇති විවිධ ආගමික උත්සව, නිවාඩු දිනයන් නිරීක්ෂණයට අවස්ථාව දෙන්න.

සොයා ගන්නා ලද කරුණුවල වැදගත්කම හා එහි දී එක් එක් දිනයන්ට අදාළ ව පවත්වනු ලබන සංස්කෘතිකාංග හා සිරිත් විරිත්, ආගමික කටයුතු පිළිබඳ සාකච්ඡා කරන්න. පැහැදිලි කර ගැනීම් අවශ්‍ය වේ නම් ඉදිරි දිනයක දී කැඳවනු ලබන ආගමික පූජකවරුන්ගෙන් විමසා පැහැදිලි කර ගන්න.

විවිධ ආගමික උත්සව පිළිබඳ ව ලිය වී ඇති විවිධ වාර්තා පොත් පත් මගින් කරුණු රැස් කර ගොනු කිරීමටත් ඒවා වාර්තා කිරීමටත් ඉඩ ලබා දෙන්න.

වාර්ෂික ලිතෙන් හඳුනා ගත් විශේෂ දිනයන් පාසල් පවත්වන කාලවකවානුවලට ඇතුළත් වේ නම් එම දිනයන්වලට නිවාඩු ලැබෙන බව පෙන්වා දෙන්න.

නිවාඩු ලැබුන ද එම නිවාඩු ගත කරන විට විශේෂ දින වැඩසටහන් නැරඹීමෙන් හෝ ඒ පිළිබඳ ව පොත්පත්වල සටහන් වී ඇති තොරතුරු මගින් හෝ වැඩිහිටියන්ගෙන් අසා තොරතුරු දැන ගැනීමෙන් හෝ දැනුවත් වීමේ වැදගත්කම සිසුනට අවබෝධ කරවන්න.

## ක්‍රියාකාරකම 3

විවිධ ජනවර්ගවලට අයත් වැඩිහිටියන්, ආගම්වල පූජක පක්ෂයේ කිහිපදෙනකු පන්තියට කැඳවීමේ අවස්ථාවක් උදා කර ගන්න.

එම පුද්ගලයන් ලවා තම සංස්කෘතීන්වලට අනන්‍ය වූ ලක්ෂණ හා විශේෂ අවස්ථාවන් පිළිබඳ ව පැහැදිලි කරමින් කතා කිරීමට අවස්ථාව ලබා දෙන්න. සිසුන්ට පැහැදිලි කර ගැනීම් අවශ්‍ය වේ නම් ඊට ඉඩසලසා දෙන්න.

උදාහරණ :

- චාරිත්‍ර විධි
- ආහාර පාන හා සිරිත් විරිත්
- ආගමික දිනයන්හි සිදු කරන විශේෂ වැඩසටහන්... වැනි

මෙබඳු අවස්ථා සහජීවනයෙන් යුතු ව කටයුතු කළ හැකි අවස්ථා බව පහදා දෙන්න.

## ක්‍රියාකාරකම 4

ශ්‍රී ලාංකිකයකු ලෙස සිය අනන්‍යතාව කැපී පෙනෙන අවස්ථා පිළිබඳ ව අවධාරණය කරන්න.

උදාහරණ :

අන්තර් ජාතික වශයෙන් පවත්වන ක්‍රීඩා උළෙල, අන්තර් ජාතික සමුළු, සම්මන්ත්‍රණ, අධ්‍යාපනික කටයුතු ... වැනි

මෙවැනි අවස්ථාවල දී ශ්‍රී ලාංකිකයකු ලෙස පෙනී සිටීමේ දී ශ්‍රී ලාංකිකයන්ට අනන්‍ය වූ ඇඳුම් පැළඳුම්වලින් පෙනී සිටී මේ අවශ්‍යතාව මෙන් ම ජාතික කොඩිය ප්‍රධාන වශයෙන් වැදගත් සංකේතයක් බව ද සිසුනට පැහැදිලි කිරීම අවශ්‍යය. මේ පිළිබඳ ව සිසුන්ගේ අත්දැකීම් ද පන්තියට ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.

එවැනි අවස්ථා දැක්වෙන ඡායාරූප, රූප ඉහත ක්‍රියාකාරකම්වල දී යොදා ගැනීමෙන් ඒ බව වඩාත් තහවුරු කිරීමට උදවු කර ගන්න. ශ්‍රී ලාංකික අනන්‍යතාවට ආරක්ෂා වන අයුරින් කටයුතු කිරීමේ වටිනාකම පෙන්වා දෙන්න. ශ්‍රී ලංකාවේ අනන්‍යතාව මතු වන කවි, ගී ගායනයට අවස්ථාව දෙන්න.

උදාහරණ :

*පොළොවෙන් මතුවන මිණි කැට*
*මනරම් දිවයින මගෙ රට //*
*ගැතියන් නොව පිටරටකට*
*බැතියෙන් සුරකිමු සදහට //*
*ගිරි සිරසින් සැදී ඇදී*
*කළු මහවැලි කැළණි නදී //*
*දසත ගලා දෙරණ සලා*
*හෙළබිම සරු කරන ලදී //*
*සීගිරියේ බිතු සිතුවම්*
*ඉසුරුමුණියෙ ගල් කැටයම් //*
*සිරි ඉතිරේ අනුරපුරේ*
*යුගයක හෙළ විරු විකුමන් //*

*වැවෙන් ජලය කෙතට හලා*
*ගලෙන් විකුම් පිළිම නෙළා //*
*පොළොන්නරුවෙ හෙළ විරුවන්*
*රුවන් දෙරණ සසිරි කළා //*
*අසිරිය දැක මගෙ රටේ*
*පිටරැටිනගෙ අවි ගැටේ //*
*එකමුතුවෙමු නිති සුරකිමු*
*උරුමය අප දිනු රටේ //*

පද රචනය : සෝමරත්න දිසානායක
ගායනය - හර්ෂණ දිසානායක

## ක්‍රියාකාරකම 5

දේශීය අනන්‍යතාව විදහා දැක්වෙන ගායන, රංගන සඳහා අවස්ථාව ලබා දෙන්න. මේ සඳහා දේශීය ජන නැටුම් සහ ජන ක්‍රීඩා කිහිපයක් රංගනයට යොමු කරන්න.

උදාහරණ :

- මේවර කෙළිය, ඔළිඳ කෙළිය
- ගොයම්
- පන්
- ලී කෙළි
- කළගෙඩි
- තාලම්

## ක්‍රියාකාරකම 6

දේශීය නිර්මාණ සඳහා සිසුනට අවස්ථාව ලබා දෙන්න. මෙහි දී විශේෂයෙන් දේශීය සැරසිලි

උදාහරණ : ගොක් කොළ, කඩදාසි සැරසිලි, පොල් කොළ වට්ටි, වෙස් මුහුණු සෑදීම, ඇඹීම්, ගෙතීම් (රෙදි, ලණු, මැක්‍රම්) විවීම් (පොල් අතු, ඉදි කොළ, පන්, රෙදි)

පොල්කටු ආශ්‍රිත විවිධ නිර්මාණ

උදාහරණ : පොල් කටු හැඳි, පොල් කටු මල් පෝච්චි, සත්ව රූප නිර්මාණ කැබලිවලින් මාල සකස් කිරීම .. වැනි)

සිසුන් කැමති නිර්මාණයක් හෝ කිහිපයක් හෝ කිරීමට අවස්ථාව ලබා දීම වැදගත් ය. මේ සඳහා දෙමාපියන් මෙන් ම වෙනත් ප්‍රජා සහාය ලබා ගත හැකි ය.

## ක්‍රියාකාරකම 7

අපේ රට විදේශිකයන්ට යටත් ව තිබු බව හඳුනා ගැනීමට යොමු කරන්න. ඒ සඳහා ශ්‍රී ලංකාවට පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි ජාතින්ගේ පැමිණීම හා බැඳි ඉතිහාසය පිළිබඳ සරල අවබෝධයක් ලබා දීමට කටයුතු කරන්න. පහත සඳහන් ක්‍රියාකාර-කම්හි නිරත වීමට අවස්ථාව සලස්වන්න.

පෘතුගීසි ලන්දේසි හා ඉංග්‍රීසි ජාතිකයන් නියෝජනය කිරීමට පන්තියේ සිසුන් තුන් දෙනකු තෝරා ගන්න. ඒ ඒ ජාතිකයන්ගේ ඇඳුම් පැළඳුම්වලින් සැරසී පැමිණීමට ඒ සිසුන්ට හැකි නම් වඩාත් හොඳය. එසේ නැත්නම් ''පෘතුගීසිහු'' ''ලන්දේසිහු'' හා ''ඉංග්‍රීසිහු'' යන වචන ලියු ශීර්ෂ පාඨ පළඳනා පැළඳ ඔවුන්ගේ අනන්‍යතාව ප්‍රකාශ කිරීමට ප්‍රමාණවත් ලෙස සැරසී පැමිණෙන්නට යොමු කරන්න.

මෙහි ගීත කිහිපයක් ඉදිරිපත් කර ඇත. ඒවා ගායනය හුරු කරවන්න.

මෙහි පසු ලිපිවල කතා පිටපත් තුනක් දක්වා ඇත. එය ශිෂ්‍යයන් තිදෙනකුට දී ඉදිරිපත් කිරීමට හුරුව ලබා දෙන්න. ඉදිරිපත් කිරීමේ දී ඒ ඒ චරිතයට අදාළ ඇඳුම් පැළඳුම්වලින් සැරසී පැමිණිය හැකිනම් වඩාත් හොඳ ය.

## පසුලිපි

1. පෘතුගිසි කාරයා පැමිණි විට කියන කවිය

*යුද්දෙටත් ඇවිත් සිදු පිට නැව් නැගීලා පරංගි*
*උන්නමුත් ඇවිත් කොළඹට ගොඩ බැසලා*
*අන්දමත් සොඳයි කීසි බීසි ගාලා කොළඹ දී*
*කම්පලක් නැතත් සෙනගක් මරාදාලා*

2. ලන්දේසිකාරයා පැමිණි විට කියන කවිය

*නොමදින් විකුම් පාලා*
*සැදෙමින් යුදට ජය ලන්දේසින්*
*සමගින් එජනරාලා*
*සම්දුන් ගෙ භූමිපාලා*
*සියසෙන් අතින් මියැ දී ගියේ*
*යුදයෙන් ඇනුම් කාලා*

3. ඉංග්‍රීසි කාරයා පැමිණි විට කියන කවිය

*පන්නා එලන්දේසී*
*ගෙන්නා ඔවුන් පෙන්නා බලය*
*පන්නා ලිය සිසී*
*ගෙන්නාලා ඉංග්‍රීසි*
*දන්නා ඔවුන් ගෙන්නා බැඳල*
*සෙන්නා අයට දාසී*
*දුරැලා සතුරු වියවුල්*
*කරලා දිගාවු බිමලා වැජඹී*
*නිමලා එකින් එක දල්*
*දැකලා මෙ අප මිහිපල්*
*සකලා සිරිත් එකලා නොකර*
*මැඩලා නිසී වියවුල්*

(පැරණි හටන් කාව්‍යවලින් උපුටා ගැනුණි)

ඉදිරිපත් කිරීම්වලින් පසුව පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ජාතින්ගේ පැමිණීම පිළිබඳ ව කෙටියෙන් පැහැදිලි කරන්න. ඒ යටතේ වර්ෂ 1505 පෘතුගීසින්, වර්ෂ 1658 ලන්දේසීන්, වර්ෂ 1796 ඉංග්‍රීසින් ශ්‍රී ලංකාවට පැමිණි බව ප්‍රකාශ කරන්න.

අපේ රටේ සම්පත් සිය රටවලට යවමින් රටේ ජනතාව පීඩාවට පත් කිරීම නිසා විදේශිකයන්ගෙන් නිදහස් වීමේ අවශ්‍යතාව ජනතාවට දැනෙන්නට වූයෙන් අපේ රට යටත් කර ගත් විදේශිකයන්ට එරෙහිව සටන් කොට රටේ නිදහස වෙනුවෙන් කැප කිරීම් කළ මුතුන් මිත්තන් කිහිප දෙනකු හඳුනා ගැනීමත්, ඔවුනට ගරු කිරීමේ වැදගත්කමත් අවධාරණය කරන්න. සිය ජීවිතය පවා රට වෙනුවෙන් කැප කළ එවන් උතුම් චරිත කිහිපයක් මේ සඳහා අධ්‍යයනය කිරීමට යොමු කරන්න.

උදාහරණ :

මොනරවිල කැප්පෙටිපොල
ගොංගාලේගොඩ බණ්ඩා

මෙම චරිත හඳුන්වා දී තව දුරටත් තොරතුරු රැස් කිරීම සඳහා සිසුන් යොමු කරන්න. උදාහරණ වශයෙන් වැඩිහිටියන්ගෙන් අසා දැන ගැනීම, පොත් පත් මගින් ... වැනි සිසු කණ්ඩායම් රැස් කළ තොරතුරු සුදුසු අයුරින් සකස් කිරීමට අවස්ථාව දෙන්න. ඒවා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න. අවශ්‍ය මග පෙන්වීම් කරන්න.

ගොංගාලේගොඩ බණ්ඩා



නිදහස් සටනේ ප්‍රධානතම සෙන්පතියකු වූ ගොංගාලේගොඩ බණ්ඩාගේ මුල් නාමය වූයේ දාවිත් හෙවත් ඩේවිඩ් ය. අලුදෙණියේ බණ්ඩා, කපුරුබස්ති බණ්ඩලාගේ ඩේවිඩ්, දොන් පුල්ලේ වෙදරාළ ආදී නම්වලින් හැඳින්වූයේ ද මොහු ම ය.

වර්ෂ 1843 පමණ කාලයේ දී මොහු බදුල්ල ප්‍රදේශයේ වාසය කර ඇති අතර එහි දී ජාතිමාමක, ජාත්‍යාභිමානී, නිර්භීත සිංහලයන් සමඟ එකතු වී ඉංග්‍රීසීන්ට විරුද්ධව කටයුතු කර ඇත. එනිසා ම මොහු රාජද්‍රෝහියකු හැටියට ඉංග්‍රීසි ආණ්ඩුව විසින් ප්‍රකාශයට පත් කොට තිබුණි.

තමා රාජසිංහ පවුලට නෑකම් ඇත්තකු බව ප්‍රකාශ කරමින් මහනුවර දළදා මාලිගාවේ වාසය කර ඇත. විදේශීය පාලනයට විරුද්ධව කටයුතු කිරීමේ දී එයට අවශ්‍ය පොදු ජන විශ්වාසය සහ සහයෝගය ලබා ගැනීම වැදගත් බව ඔහු විසින් අවබෝධ කරගෙන තිබුණි.

ඉංග්‍රීසීන් විසින් අය කරන ලද අසාධාරණ බදු අහෝසි කරවා ගැනීමට සිංහල ජනතාවට අවශ්‍ය විය. එසේ ම ඉංග්‍රීසි පාලකයන් ලංකාවෙන් පලවා හැරීමට සිංහලයන් එක් රොක් විය යුතු බව අවබෝධ කරගෙන තිබුණි. මේ අරගලයේ නායකත්වය සඳහා ගොංගාලේගොඩ බණ්ඩා පත්විය. වර්ෂ 1848 ජූලි මස 30 දින විශාල පිරිසකගේ කැමැත්ත සහ විහාරාධිපති ගිරානේගම ඉන්ද්‍රජෝති හිමිපාණන්ගේ අනුග්‍රහය ලැබුණි. ගරුතර මහා සංඝරත්නයේ ආශීර්වාදය ඇතිව ගොංගාලේගොඩ බණ්ඩා ශ්‍රී වික්‍රම සර්ව සිද්ධි නමින් තුන් සිංහලයේ ම රජු වශයෙන් ඔටුණු පළඳවා අභිෂේක කරන ලදී.

මහනුවර පැරැන්දුගල හා මාතලේ නගර ජයගෙන සිටින අවස්ථාවේ සිංහල සටන් නායකයින් අතර ඇති වූ භේද, සිංහලයාගේ යුද්ධායුධ ශක්තිය ප්‍රබල නොවීම ආදී හේතු නිසා සටන අඩපන විය. මෙය අවස්ථාව කරගත් ඉංග්‍රීසීන් සැඟවී සිටි ගොංගාලේගොඩ බණ්ඩා වර්ෂ 1848 නොවැම්බර් 14 දින යුද්ධාධිකරණය ඉදිරියට පමුණුවන ලදී. මෙහි දී ඉදිරිපත් කරන ලද පාපෝච්චාරණය නිසා මරණ දඬුවම ලිහිල් වී කසපහර 100ක් ගසා වර්ෂ 1849 ජනවාරි 01 දින මලක්කාවට පිටුවහල් කරන ලදී. වීර ගොංගාලේගොඩ බණ්ඩා වර්ෂ 1849 දෙසැම්බර් 01 දින මරණයට පත් විය. මහනුවර අභිෂේක ලත් රජු ලෙසත්, වර්ෂ 1848 විමුක්ති සටන සංවිධානය කර එය පොදු ජනතාව මගින් පණ පොවා මෙහෙයවූ වීරයකු ලෙසත් ගොන්ගාලේගොඩ බණ්ඩා යන නාමය ලංකා ඉතිහාසයෙහි නොමැකෙන අයුරින් සටහන් වී ඇත.

මොණරවිල කැප්පෙටිපොල දිසාව



ගොලහෙල කැප්පෙටිපොල සහ දෙල්වල එතනහාමිගේ පුත් කැප්පෙටිපොල දිසාව වූ අතර දුව අහැලේපොල කුමාරිහාමි විය.

කැප්පෙටිපොල සිය පියාගේ ඇවෑමෙන් දළදා මාලිගයේ දියවඩන නිලමේ තනතුර හෙබවී ය. මුල සිට ම ඉංග්‍රීසි ජාතීන් සමග එකට එකතුව කටයුතු කරන ලදී. මේ හේතුවෙන් ඌව වෙල්ලස්ස කැරැල්ල මර්ධනය කිරීම පිණිස ඉංග්‍රීසීන් විසින් යවන ලද්දේ කැප්පෙටිපොල දිසාවේ ය. නමුත් ඔහු ඌවේ ජනතාව සමග එක් වී සිංහල ජාතිය බේරා ගැනීමට ඉංග්‍රීසීන්ට විරුද්ධව සටන් කොට ජය ගත්තේ ය. ඉංග්‍රීසි ජාතිකයන් මොල්ලිගොඩ දිසාවගේ සහයෙන් කැප්පෙටිපොල දිසාව ඇතුලු බොහෝ දෙනෙක් සිරභාරයට ගන්නා ලදී. ඔහු මරණයට මුහුණ දුන්නේ එඩිතරව ය. ඔහුගේ අවසන් ඉල්ලීම වූයේ තම ගෙල එක් කඩුපහරින් ගසා දමන ලෙස ය. මේ තුළින් එතුමාණන් තුළ පැවති වීරත්වය හා නිර්භීත බව පිළිබිඹු වේ.

## ක්‍රියාකාරකම 8

රටේ නිදහස වෙනුවෙන් කටයුතු කළ ජන නායකයින් හා රටේ කීර්ති නාමය නැංවීමට දායක වූ චරිත පිළිබඳ ව තොරතුරු අධ්‍යයනයට සලස්වන්න. පහත සඳහන් තොරතුරු ඒ සඳහා පදනම් කර ගන්න. මෙම ජනනායකයින් බොහෝ උගත් විවිධ ක්ෂේත්‍රවල විශිෂ්ට හැකියාවලින් පිරිපුන් පුද්ගලයින් බව අවධාරණය කරන්න.

රටේ නිදහස වෙනුවෙන් කටයුතු කළ ජන නායකයින් කිහිප දෙනකු පිළිබඳ ව අවධාරණය කරන්න. මෙම චරිත පිළිබඳ මූලික හැඳින්වීමක් කිරීමෙන් පසු ව ඔවුන් පිළිබඳ ව තව දුරටත් තොරතුරු අධ්‍යයනය කිරීමට සිසු කණ්ඩායම්වලට පවරන්න. කණ්ඩායම් වශයෙන් කරුණු සුදුසු පරිදි සකස් කිරීමට හා ඒවා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න. අවශ්‍ය මග පෙන්වීම් කරන්න.

ශ්‍රීමත් ඩී. බී. ජයතිලක



සර් දොන් බාරොන් ජයතිලක කැලණියේ වරාගොඩ ග්‍රාමයේ දී ක්‍රි. ව. 1868 පෙබරවාරි මස 13 දින උපත ලැබීය. බැප්ටිසිම් ශාස්ත්‍රශාලාව, කොළඹ වෙස්ලි විද්‍යාලවලින් මෙතුමා අධ්‍යාපනය ලබා ගත්තේය.

මහනුවර ධර්මරාජ විද්‍යාලයේ ආචාර්යවරයකු වූ මෙතුමා පසු කලෙක වර්ෂ 1900 දස වසරක් කොළඹ ආනන්ද විද්‍යාලයේ විදුහල්පති ධුරය හෙබවීය. කොළඹ තරුණ බෞද්ධ සංගමය හා පරම විඥානාර්ථ බෞද්ධ සංගමයේ සාමාජිකයෙක් වූ මෙතුමා වර්ෂ 1910 දී අමද්‍යප ව්‍යාපාරය ආරම්භ කරන ලදී. සිංහල ශබ්ද කෝෂය සම්පාදනයේ දී ද මෙතුමා මූලික වී ක්‍රියා කළේ ය.

සිංහල, පාලි, සංස්කෘත, ඉංග්‍රීසි, ලතින්, ග්‍රීක් ආදී භාෂාවල හසල දැනුමක් තිබූ මොහුගෙන් සිංහල භාෂාවට සහ සාහිත්‍යයට විශාල සේවයක් සිදුවුණි. පැරණි ශාස්ත්‍රීය ග්‍රන්ථ නැවත ප්‍රකාශ කළ යුතු බව වටහා ගත් මෙතුමා ඒවා නැවත ප්‍රකාශයට පත් කළේ ය. කුඩා කළ එතුමා රචනා කරන ලද උපහාසාත්මක කවි පෙළ ඔහු තුළ පැවති සහජ කවි තැනීමේ හැකියාව පෙන්වීය. මෙතුමා වර්ෂ 1944 මැයි 31 වෙනි දින අවසන් හුස්ම හෙළී ය. වර්ෂ 1927 දී ලංකා විශ්වවිද්‍යාලය පේරාදෙණියේ ආරම්භ කිරීමට කටයුතු කරන ලදී. ලාංකික පාසල්වල ඉගැන්වීම මව් භාෂාවෙන් සිදුවිය යුතු බව ද ඔහු පැවසුවේ ය.

ආචාර්ය ආනන්ද කුමාරස්වාමි



ආචාර්ය ආනන්ද කෙන්ටිශ් කුමාරස්වාමි වර්ෂ 1877 අගෝස්තු 22 වෙනි දින කොළඹ කොල්ලුපිටියේ දී උපත ලැබී ය.

ඔහු විසින් රචිත ශාස්ත්‍රීය ග්‍රන්ථ හා නිබන්ධ ප්‍රමාණාත්මක ව මෙන් ම ගුණාත්මක බවින් ද අති මහත්ය. එම සංඛ්‍යාව 500ට වඩා වැඩිය. මෙතුමා ඉංග්‍රීසි, ප්‍රංශ, ජර්මන්, ලතින්, ග්‍රීක්, සංස්කෘත, පාලි යන භාෂාවල විශිෂ්ටත්වයට පැමිණියෙකි. නීතිවේදියකු හා පරිවර්තකයකු ද විය.

බෞද්ධ ධර්ම ග්‍රන්ථ පාලි බසින් ඉංග්‍රීසියටත්, හින්දු ධර්ම ග්‍රන්ථ දෙමළ බසින් ඉංග්‍රීසියටත් පරිවර්තනය කරන ලදී.

ලන්ඩනයේ වයික් ලිප් විද්‍යාලය ඔහුගේ ගුරු ගෙදර විය. ඔහුගේ ප්‍රථම ශාස්ත්‍රීය ලේඛනය ''ලංකාවේ කඳු හා මිනිරන්'' වාරික සංග්‍රහයයි. වර්ෂ 1905 දී ''ලංකා සමාජ ප්‍රතිසංස්කරණ සංගමය'' ඇරඹූ කුමාරස්වාමි ''සිලෝන් නැෂනල් රිවිව්'' (ceylon ntional nevcew) සඟරාවේ සමාරම්භක සංස්කාරකවරයා විය.

ආනන්ද කුමාරස්වාමි වූ කලී ලංකාවෙන් ලොවට දායාද කළ ප්‍රමුඛ පෙළේ දාර්ශනිකයෙකි. පෙරදිග කලා සම්පත් සංරක්ෂණය කිරීම භාරව සිටි මොහුගේ අත් පිටපත් ලිපි ලේඛන ආදිය බොස්ටන් ලලිත කලා කෞතුකාගාරයෙහි අදත් සංරක්ෂණය කර තිබේ. ''මධ්‍යකාලීන සිංහල කලා, ජාතික අපේක්ෂණ, ඉන්දියානු ඉන්දුනීසියානු කලාවේ ඉතිහාසය'' මොහු විසින් රචිත කෘතීන් ය.

ඔහු වර්ෂ 1947 සැප්තැම්බර් 09 දින ඇමරිකාවේ බොස්ටන් නුවර දී මිය ගියේ ය.

ආචාර්ය ටී. බී. ජයා



වර්ෂ 1890 ජනවාරි 01 වෙනි දා උපත ලැබූ ටී. බී. ජයාගේ ළමා කාලය ගැමි දරුවන් අතර ගෙවුණු සරල දිවි පෙවෙතක් විය. ඔහු කොටහේන සාන්ත පෝල් විදුහලෙන් ද, කොළඹ ශාන්ත තෝමස් විදුහලෙන් ද අධ්‍යාපනය ලැබුවේ ය.

වර්ෂ 1910 ජනවාරි මස මහනුවර ධර්මරාජ විදුහලේ ගුරුවරයෙක් ලෙස වැඩභාරගත් මෙතුමා ලතින්, ග්‍රීක්, ආර්ථික විද්‍යාව, ඉතිහාසය වැනි විෂයයන් මගින් ශිෂ්‍යයන් තුළ දේශාභිමානය, එඩිතර බව හා පෞර්ෂත්වය ගොඩනැගෙන පරිදි ඉගැන්වීම් කටයුතුවල යෙදුනි. වර්ෂ 1917 දී කොළඹ ආනන්ද විද්‍යාලයේ ගුරුවරයෙක් ලෙස වැඩ කරන කාලයේ රට භාර ගැනීමට ඉවහල් වන අන්දමේ පූර්ණ අධ්‍යාපනයක් ශිෂ්‍යයන්ට ලබා දුන්නේ ය. වර්ෂ 1921 දී සහිරා විද්‍යාලයේ විදුහල්පති විය. එකල තිබූ කොළඹ කහිරියා බාලිකා පාසල සහ ඩෙන්හැම් ඉංග්‍රීසි පාසල ආරම්භ කරන ලද්දේ මෙතුමා ය. අලුත්ගම, ගම්පොල, මාතලේ සහ පුත්තලම නගරවල සහිරා විද්‍යාලය ද, අලුත්ගම, අඩ්ඩාලච්චේන නගරවල ගුරු විදුහල් ද ආරම්භ කළේ ය. ජාතික කොඩිය, ජාතික ගීය සම්පාදන කමිටුවේ ක්‍රියාකාරී සාමාජිකයෙක් වූ ආචාර්ය ටී. බී. ජයා වර්ෂ 1960 දී මෙලොවින් සමු ගත්තේ ය.

රටේ කීර්තිනාමය නැංවීමට දායක වූ චරිත කිහිපයක් ද හඳුනා ගැනීමට සලස්වන්න. මෙම චරිත පිළිබඳ ව ද හැඳින්වීමක් කර තව දුරටත් තොරතුරු රැස් කිරීමට අවස්ථාව දෙන්න. රැස් කළ තොරතුරු සුදුසු ආකාරයකට ඉදිරිපත් කිරීමට සිසු කණ්ඩායම්වලට පවරන්න. ඒවා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න. අවශ්‍ය මග පෙන්වීම් කරන්න.

එස්. මහින්ද හිමි



වර්ෂ 1914 දී ටිබෙට් රටේ සීකිම් ප්‍රදේශයෙහි උපත ලද එස්. කේ. තෂිනම්ගල් වයස අවුරුදු 12 දී කොළඹ විද්‍යෝදය පිරිවෙනට ඇතුළත් ව පාලි, සිංහල, සංස්කෘත ඉගෙන ගත්තේ ය. ඉංග්‍රීසි මහාබෝධි විද්‍යාලයෙන් ද පොල්ගස්දූව ආරාමයෙන් ප්‍රාචීන භාෂා ද හැදෑරී ය. රත්ගම සිරිවූලසුමන හිමියන්ගේ ශිෂ්‍යයකු ලෙස දොඩන්දූවේ ශෛල බිම්බාරාමයේ දී සීකිම් මහින්ද නමින් පැවිද්ද ලබා ගත්තේ ය.

ඒ හිමිපාණෝ වර්ෂ 1934-1936 කාලය තුළ කොළඹ ආනන්ද විද්‍යාලයේ සිංහල, පාලි, බුද්ධ ධර්මය ඉගැන්වූහ. පන්සල සහ ගම වෙනුවෙන් විශාල සේවාවක් කළ උන්වහන්සේ ''නව ලංකා දහම් පාසල'' හා ඉංග්‍රීසි පාඨශාලාව ආරම්භ කරන ලදී. එමෙන් ම සතර පේරුවේ ගම්වලින් බෙහෙත් එකතු කොට නොමිලේ බෙහෙත් දෙන පිං බෙහෙත් ශාලාවක් පිහිටුවී ය. ගවමස් කෑමෙන් ගම්මුන් වලකාලීමට තදින් ම ක්‍රියා කළේ ය. මෙතුමා පානදුරේ තොටගමුවේ උපසම්පදා භික්ෂු මණ්ඩලයේ ලේකම් තනතුර දැරී ය.

එස්. මහින්ද හිමි ගද්‍ය, පද්‍ය කෘති 40ක් පමණ රචනා කර ඇත. ලංකා මාතා, නිදහසේ මන්ත්‍රය, නිදහසේ දැහැන, දරු නැලවිල්ල ආදී ග්‍රන්ථ ශ්‍රී ලාංකිකයන්ගේ දේශාභිමානය හැඟීම් ජනිත කරවීමට සමත් විය. කොළඹ යුගයේ ජනප්‍රිය කවියකු වූ මෙතුමාගේ මුල් ම කෘතිය ''ඔවා මුතුදම'' වූ අතර ''ශ්‍රී පාදය'' අවසාන කෘතිය වශයෙන් සැලකේ. දේශාභිමානී හැඟීමෙන් කටයුතු කොට ජාතික මෙහෙවරක යෙදුණු මෙතුමාණෝ වර්ෂ 1951 මාර්තු මස 14 දින අපවත් වූහ.

ආචාර්ය සි. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර




ආචාර්ය ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නන්ගර ශ්‍රේෂ්ඨ අධ්‍යාපනඥයෙක් මෙන් ම ජාතික වීරයෙකි. මෙතුමා වර්ෂ 1894 ඔක්තෝම්බර් මස 18 දින උපත ලැබී ය.

''කන්නන්ගර මැතිතුමා මහා භාරතයේ උපත ලැබී නම් ඔහු එහි දී දෙවියකු වශයෙන් පුද ලබනු ඇත''යි වර්ෂ 1945 ලංකාවේ සිටි ඉන්දියානු නියෝජිත එම්. එස්. අනේ පවසා ඇත. අම්බලන්තොට වෙස්ලියන් විදුහල සහ ගාල්ලේ රිච්මන්ඩ් විදුහල්වල ඉගෙනුම ලැබූ ඔහු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට අයත් රටවල හොඳම ශිෂ්‍යයාට හිමි ත්‍යාගය ද දිනා ගත්තේ ය. රිච්මන්ඩ් විද්‍යාලයේ ගුරුවරයකු ලෙස ගුරු වෘත්තියට පැමිණි ඔහු මොරටුව වේල්ස් කුමාර විද්‍යාලය සහ කොළඹ වෙස්ලි විද්‍යාලයේ ද සේවය කරන ලදී. වර්ෂ 1931 සිට ක්‍රි.ව.1946 කාලයේ ලංකාවේ අධ්‍යාපන ඇමති ව සිට කරන ලද සේවාව අතිමහත් ය.

පළමුවන ශ්‍රේණියේ සිට විශ්වවිද්‍යාලය දක්වා නිදහස් අධ්‍යාපනය නොමිලේ ලබා දීම, මව් භාෂාව අධ්‍යාපන මාධ්‍ය බවට පත් කිරීම, පාසල් රජයට පවරා ගැනීම, මධ්‍ය මහා විද්‍යාල ආරම්භ කිරීම, සෑම ළමයකුට ම තම දෙමව්පියන්ගේ ආගම ඉගැන්වීම, ආදායම් අඩු ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව ලබා දීම, පොදු විෂය නිර්දේශයක් සකස් කිරීම, විෂය බාහිර කටයුතු සංවිධානය, පාසල්වලට ක්‍රීඩා පිට්ටනි ලබා දීම, සංගීතය, නැටුම්, මලල ක්‍රීඩා ඉගෙනීමට අවස්ථාව ලබා දීම දෙවන පන්තියේ සිට ඉංග්‍රීසි විෂයයන් ලෙස ඉගෙනීමට අනිවාර්ය කිරීම වැදගත් විය.

මෙම නවීකරණ ඔස්සේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ නව නැම්මක් ඇති වූ අතර ඒ වකවානුව වන විට අධ්‍යාපනය අතින් ආසියාවේ දියුණුම රට බවට ශ්‍රී ලංකාව පත් විය. පරාදීන යුගයක වුව ද ශ්‍රී ලංකාවේ අධ්‍යාපන රටාව වෙනස් කිරීමේ කාර්යයට උරදීමෙන් ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර නැමති ශ්‍රේෂ්ඨ අධ්‍යාපනඥයා ජාතික වීරයෙක් වශයෙන් මෙන් ම ශ්‍රී ලාංකිකයන්ගේ අධ්‍යාපනයේ පියා යනුවෙන් විරුදාවලිය ලැබී ය.

ආතර් සී. ක්ලාක්



දකුණු එංගලන්තයේ සමර්සෙට් ප්‍රදේශයේ මයින්හෙඩ් යන නගරයේ දී වර්ෂ 1917 දෙසැම්බර් මස 16 වන දා ආතර් සී. ක්ලාක් උපත ලැබී ය. මොහු විද්‍යාඥයකු මෙන් ම ප්‍රසිද්ධ ලේඛකයෙකි. මොහු ප්‍රසිද්ධියට පත් වූයේ වර්ෂ 1945 දී වයර්ලස් වර්ල්ඩ් යන සඟරාවේ පළ කරන ලද ලිපියකිනි. පොළොවේ සිට අහසට චන්ද්‍රිකා යැවිය හැකි ය යනුවෙන් ද එම චන්ද්‍රිකා උපයෝගී කරගෙන පණිවිඩ හුවමාරු ක්‍රමයක් නිර්මාණය කළ හැකි බව ද මොහු ප්‍රකාශ කර ඇත.

මෙතුමා වර්ෂ 1956 දී ශ්‍රී ලංකාවේ පදිංචියට පැමිණියේ ය. මොරටු විශ්වවිද්‍යාලයේ කුලපතිවරයා මෙන් ම එංගලන්තයේ රාජකීය තාරක විද්‍යාඥයන්ගේ සංගමයේ සාමාජිකයකු ලෙස ද කටයුතු කළේ ය. මෙතුමාට උපාධි හා සම්මාන 38ක් පමණ පිරිනමා ඇත. නයිට් පදවියෙන් ද පිදුම් ලැබූ ශ්‍රීමත් ආතර් සී. ක්ලාක් මහතා අනුවියැතිව සිටිය දී වර්ෂ 2008 මාර්තු 19 දා ශ්‍රී ලංකාවේ දී මිය ගියේ ය.

මෙම චරිත ඇසුරෙන් ගොඩ නගා ගත යුතු යැයි සිතන ගුණාංග මොනවා ද යන්න සිසු සමග කතා බහ කරන්න.

තමා සිත්ගත් චරිතයක් පිළිබඳ ව කතා කිරීමට සිසුනට අවස්ථාව දෙන්න. මේ සඳහා තේමාව ක්‍රියාත්මක වන කාලය තුළ දිනපතාම මෙන් ම පාසලේ උදෑසන රැස්වීමේ දී ද කතාවක් ඉදිරිපත් කිරීමට අවස්ථා ලබා දෙන්න.

සිසුන් කණ්ඩායම් වශයෙන් රැස් කළ තොරතුරු අළලා පොත් පිංචක් සකස් කර එය හඳුන්වා දීම සඳහා සුදුසු නමක් යෝජනා කරන්න.

## ක්‍රියාකාරකම 9

අපේ රටේ පිහිටි ස්වභාවික සම්පත් හා සම්බන්ධ පින්තූර ඡායාරූප හා ලිපි රැස් කිරීමට කල්තබා උපදෙස් දෙන්න.

උදාහරණ :

භූමිය, ජලය, සත්ව ශාක, වායු

ස්වභාවික සම්පත් සුරැකීම පිළිබඳ ව සිසුන් තුළ ආකල්පමය වෙනසක් සඳහා පහත සඳහන් ක්‍රියාකාරකමෙහි නිරත වීමට සලස්වන්න. ''අප රටේ ස්වභාවික සම්පත් '' මාතෘකාව පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.

සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදා රැස් කළ තොරතුරු කණ්ඩායම්වලට ලබා දී ඒවා අධ්‍යයනයට සලස්වන්න. එහි සඳහන් සම්පත් මොනවා ද සහ ඒ පිළිබඳ කෙටි විස්තරයක් සටහන් කර ඉදිරිපත් කිරීමට කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.

ඉදිරිපත් කරන අදහස්වලට අනුව ස්වභාවයෙන් ම අපට ලබා දී ඇති සම්පත් ස්වභාවික සම්පත් ලෙසත් ඒවා ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල පිහිටා ඇති බවත් පෙන්වා දෙන්න.

උදාහරණ :

ගංගා, කඳු, දිය ඇලි, මැණික්, මිනිරන් ...

සිසුන් විසින් ගොනු කර ඉදිරිපත් කළ තෙරතුරු බිත්ති පුවත්පතෙහි ප්‍රදර්ශනය කරන්න.

ප්‍රදේශයේ පිහිටි හෝ පහසුවෙන් යා හැකි ස්වභාවික සම්පත් පිහිටි ස්ථානයකට නිරීක්ෂණ චාරිකාවක් සුදානම් කර ගන්න. චාරිකාව යාමට ප්‍රථම එහි අවධාරණය කළ යුතු කරුණු සාකච්ඡා කරන්න. කණ්ඩායමකට එක් කරුණක් බැගින් යොමු කිරීම පහසුවිය හැකි ය.

උදාහරණ :

- ස්වභාවික සම්පත් පිහිටි ස්ථානයේ පවත්නා තත්ත්වය
- ආරක්ෂා සහිත බව, එයට ළඟා වීමට ඇති පහසුකම්
- නරඹන්නන් විසින් එම ස්ථානයට කර ඇති විනාශය
- ස්වභාවික සම්පත් ආරක්ෂාවට ගෙන ඇති පියවර
- නඩත්තු කටයුතු සිදුවන ආකාරය ... වැනි

නිරීක්ෂණයට සිසුන් යොමු කර අවශ්‍ය දෑ සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න. එම ස්ථානයේ බාරව කටයුතු කරන නිලධාරීන් හෝ වෙනත් පුද්ගලයන් සිටී නම් අවශ්‍ය තොරතුරු විමසා ඔවුන්ගෙන් ද දැන ගත හැකි ය.

පන්තියට තොරතුරු රැගෙන ආ පසු තම කණ්ඩායම කරුණු ගොනු කර ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. කරුණු ගොනු කිරීමේ දී ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඇති විය හැකි අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට ගුරුවරයාට සහාය විය හැකි ය.

මෙහි දී ස්වභාවික සම්පත් විනාශ වීමට නොදී ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම මතු කරන්න. මේ සඳහා සිසු අදහස් විමසන්න.

ස්වභාවික සම්පත් පිළිබඳ කියැවෙන කවි, ගී ගායනයට සිසුනට අවස්ථාව ලබා දෙන්න.

උදාහරණ :

*රත්නදීප ජන්ම භූමි ලංකා දීප විජය භූමි*
*මේ අපේ උදාර වූ මාතෘ භූමියයි//*
*ආදී සිංහලේ ඒ වීර දූ පුතුන් ලෙයින්*

ගායනය : පණ්ඩිත් අමරදේව

''අපේ රටේ සම්පත් සුරකිමු'' යන මැයෙන් පෝස්ටර් නිර්මාණයට අවස්ථාව දෙන්න. ඒවා සුදුසු ස්ථානවල ප්‍රදර්ශනයට යොමු කරන්න.

# 12 අපට කළ හැකි වෙනස්කම්

තමාගේ චර්යා පිලිබඳ විමසිලිමත් වෙමින්, ප්‍රතිජනනාත්මක ව චර්යා වෙනස් කර ගත හැකි පුරවැසියන් මහගු මානව සම්පතකි. වඩාත් යහපත් සමාජයක පදනම වන්නේ තමා ද ප්‍රතිජනනාත්මක ව වෙනස් වෙමින්, අන් අය ද වෙනස් කරන්නට දායක වන පුරවැසියන් ය. එවන් පුරවැසියන් බහුතරයකින් යුත් අනාගත සමාජයක පදනම ශක්තිමත් කිරීම සඳහා මෙම තේමාවෙන් අත්දැකීම් ලැබෙතැයි අපේක්ෂිත ය.

## නිපුණතා

- ✶ තම චර්යාවේ ප්‍රතිජනනාත්මක වෙනසක් සඳහා විමසිලිමත් ව කටයුතු කරයි.
- ✶ තමාගේ මෙන් ම සහෝදර සිසුන්ගේ අධ්‍යාපනික ගුණාත්මක බව සහ මනෝ සමාජයීය සත්කාරය සඳහා විමසිලිමත් ව කටයුතු කරයි.
- ✶ අන් අයට උදවු කිරීමට ඇති අවස්ථාවන් පිළිබඳ සොයා බලා ඒ සඳහා කටයුතු කරයි.
- ✶ පාසලේ පරිසරය සෞන්දර්යාත්මක ව පවත්වා ගෙන යාමට දායක වෙයි.
- ✶ කායික හා මානසික සුවතාව සඳහා වන නිර්මාණශීලී ක්‍රීඩාවල නියැලෙයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

ප්‍රතිජනනාත්මක චර්යාවේ වෙනසක් සඳහා සිසුන් පහත සඳහන් ක්‍රියාකාරකමේ නිරත වීමට සලස්වන්න. මේ සඳහා අප දෛනික ව කරන වැඩ ඇසුරෙන් චිත්‍ර කිහිපයක් සකස් කර ගන්න.

උදාහරණ :

- ★ උදෑසන අවදි වූ අවස්ථාවේ ඇඳ හෝ පැඳුර හෝ අපිළිවෙළට තිබීම.
- ★ නිවසේ පොත් තබන ස්ථානය අපිළිවෙළ සහිත වීම.
- ★ තේ බී හෝ කෑම කෑමෙන් පසු හෝ පාවිච්චි කළ භාජන නොසෝදා මේසය මතතබා ඇති අයුරු
- ★ කොළ කැබලි තැන තැන විසිරීමෙන් පන්ති කාමරය අවලස්සන වී තිබෙන ආකාරය

සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදන්න. එක් චිත්‍රයක් බැගින් කණ්ඩායම්වලට ලබා දී එහි දක්නට ලැබෙන දේ එසේ වීමට හේතු සහ එය වළක්වා ගැනීමට කළ යුතු දෑ සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.

එමෙන් ම කණ්ඩායමේ සිසුන්ට සිය දෛනික චර්යා පිළිබඳ ස්වයං තක්සේරුවක යෙදීමට යොමු කරන්න. ඒවා සාකච්ඡා කර අඩුපාඩු සකස් කර ගැනීමට චර්යාවේ ඇති කරගත යුතු වෙනස්කම් ගැන කතා බහ කිරීමට මග පෙන්වන්න. එක් එක් කණ්ඩායමට සටහන් කළ තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න. අවශ්‍ය මග පෙන්වීම් කරන්න.

## ක්‍රියාකාරකම 2

සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කිහිපයක් බෙදා සිද්ධියක් හෝ අවස්ථාවක් හෝ මුල් කර ගනිමින්, චර්යාවල යහපත් වෙනසක් සිදු වූ බව අවධාරණය වන කෙටි නාට්‍ය කිහිපයක් සැලසුම් කිරීමට සිසුන්ට මග පෙන්වන්න. කෙටි නාට්‍ය ආරම්භයේ දී චරිතවල ප්‍රදර්ශනය වූ චර්යා කෙටි නාට්‍ය අවසානයේ දී යහපත් වෙනසකට ලක් වී ඇති බව අවධාරණය විය යුතු බව පෙන්වා දෙන්න. සිසු කණ්ඩායම් සමග සාකච්ඡා කරමින් ඔවුන්ගේ අත්දැකීම් ආශ්‍රිත සිද්ධි හෝ අවස්ථා හෝ මුල් කරගෙන නාට්‍ය සැලසුම් කළ හැකි ය. සැබෑ සිද්ධි/අවස්ථාවල චර්යාවේ යහපත් වෙනස්කම් සිදු වී නැති නම්, කෙසේ යහපත් ලෙස වෙනස් විය හැකි ද යන්න සිසුන් සමග සාකච්ඡා කරමින් කෙටි නාට්‍ය සැලසුම් කිරීමට මැදිහත් වන්න. සැලසුමේ දී කණ්ඩායම්වලට මග පෙන්වමින් එක් චරිතයක් හෝ යහපත් වෙනසක් දැකිය හැකි ලෙස කෙටි නාට්‍ය ඉදිරිපත් කිරීමට හෝ දිරි ගන්වන්න.

කෙටි නාට්‍ය එකක් ප්‍රදර්ශනය වී අවසානයේ දී නාට්‍යයේ චරිතය/චරිතවල සිදු වූ යහපත් වෙනස්කම් ගැන සාකච්ඡා කරමින් අවධාරණය කරවන්න.

අවසානයේ සිසුන්ගේ දෑස් පියා ගන්නට සලසා මෙසේ කියන්න.

> *ඔබේ දිනපතා වැඩ කටයුතු සිහි කරන්න. උදේ අවදි වූ මොහොතේ සිට නින්දට යන මොහොත දක්වා ඔබේ හැසිරීම් මතකයට නගන්න. ඉතා ඉක්මනින්, වැඩි මහන්සියක් නොගෙන ඔබට වෙනස් කර ගත හැසිරීම් හඳුනා ගන්න. එවැනි හැසිරීම්වලින් එකක් තෝරාගන්න. එම හැසිරීමේ ඔබට කළ හැකි යහපත් වෙනස්කම් මොනවා දැයි සිතන්න. එයින් එක් යහපත් වෙනස්කමක් හෙට සිට ආරම්භ කිරීමට අධිෂ්ඨාන කරන්න. ''මම හෙට සිට මගේ හැසිරීමේ ඒ වෙනස කරනවායි'' යනුවෙන් අධිෂ්ඨාන කරන්න.*

## ක්‍රියාකාරකම 3

පන්ති ප්‍රතිපත්ති ලෙස දැනට ක්‍රියාත්මක වන ඕනෑම වැඩ පිළිවෙළක් තෝරා ගන්න.

උදාහරණ :

- උදෑසන ආගමික වතාවත්
- සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකම්
- ශරීර සුවතා ක්‍රියාකාරකම්
- සිසුන්ගේ උපන් දින සැමරුම්
- පන්තියේ කසල බැහැර කිරීම

මෙවැනි එක් වැඩ පිළිවෙළක් එක් කණ්ඩායමකට බැගින් පවරන්න. ඒ ඒ කණ්ඩායමට අදාළ වැඩ පිළිවෙළේ දැනට ඇති අඩුපාඩු ගැන සාකච්ඡා කිරීම අවශ්‍ය ය. එම වැඩ පිළිවෙළ දියුණු කිරීමට අදාළ යෝජනා ද, ඒ සඳහා පන්තියේ සිසුන්ගේ චර්යාවේ ඇති කරගත යුතු වෙනස්කම් ද ගැන සිතා බැලීමට අවස්ථාව සලසන්න. ඊළඟ සතියේ අදාළ වැඩ පිළිවෙළවල මුලින්ම සිදු කළ යුතු වෙනස්කම් ගැන සාකච්ඡා කර ඒ සඳහා යොමු කරන්න.

## ක්‍රියාකාරකම 4

මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු වැනි සුදුසු සම්පත් පුද්ගලයකු පන්තියට කැඳවන්න. පහත සඳහන් මාතෘකාවක් යටතේ සිසුන් දැනුවත් වීමකට අවස්ථාව සලස්වන්න. අමුත්තාගෙන් ඇසිය යුතු ප්‍රශ්න කල් තබා සුදානම් කර ගැනීමට සිසුන් දැනුවත් කරන්න. දේශනයේ දී ප්‍රශ්න ඇසීමට සිසුනට මග පෙන්වන්න.

උදාහරණ :

- පෞද්ගලික පවිත්‍රතාවය සඳහා අවශ්‍යයෙන් ම කළ යුතු දේ
- පෞද්ගලික ව පිරිසිදු ව සිටීමෙන් තමාට ඇති ප්‍රයෝජන

- පෞද්ගලිකව පිරිසිදුව සිටීම තුළින් අන් අයට සිදුවන යහපත
- පෞද්ගලිකව පිරිසිදු ව සිටීම සමාජයට බලපාන ආකාරය

මෙහි දී අමුත්තකු පිළිගැනීම, ආචාරශීලි කතා බහ, ආහාර පාන පිළිගැන්වීම, ස්තුති කිරීම ආදි යහපුරුදු සඳහා අත්දැකීම් ලබා දීම කෙරෙහි අවධානය යොමු කරන්න.

පෞද්ගලික පවිත්‍රතාවයේ වැදගත්කම හා අපිරිසිදු වීමෙන් සෑදෙන ලෙඩ රෝග පිළිබඳ ව කවි, ගී නිර්මාණයට හා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. තමා දැනුවත් වූ කරුණු/පණිවුඩ ඔස්සේ බිත්ති පුවත් පතකට කෙටි ලිපියක් සකස් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

## ක්‍රියාකාරකම 5

තමාගේ මෙන් ම සහෝදර සිසුන්ගේ අධ්‍යාපනික ගුණාත්මක බව හා මනෝ සමාජීය සත්කාරය කෙරෙහි අවධානය යොමු කරන්න. මේ සඳහා ප්‍රවේශයක් වශයෙන් නිවැරදි මග පෙන්වීමවලට යොමු වන ක්‍රීඩාවක් සඳහා අවස්ථාව ලබා දෙන්න.

උදාහරණ :

සිසුන් යුගල වශයෙන් එක් වී එළිමහන් එක් ස්ථානයකට පැමිණ ගමනාන්තයක් තෝරා ගැනීමට යොමු කරන්න. දෙදෙනා විසින් තෝරා ගත් ගමනාන්තයට ආරම්භක ස්ථානයේ සිට යන විට එක් අයෙක් දෑස් පියාගෙන ඇස් නොපෙනෙන කෙනකු ලෙසට ද අනෙක් සිසුවා මග පෙන්වන්නා බවට ද පත් වේ. ගමන් මගෙහි තිබෙන විවිධ බාධක මගහරවමින් අවශ්‍ය ලෙස හරවමින් සිය අන්ධ සගයා ගමනාන්තය කරා මෙහෙයවීම මග පෙන්වන්නාගේ වගකීමයි. ගමනාන්තයට ගිය විට ඇස් නොපෙනෙන සේ ගමන් කළ තැනැත්තා මග පෙන්වන්නා බවට පත් වන අතර මග පෙන් වූ තැනැත්තා ඇස් නොපෙනෙන්නා බවට පත්ව දැස් පියා ගනියි. එසේ යුගලය නැවත ආරම්භක ස්ථානයට පැමිණේ.

ක්‍රියාකාරකමෙන් පසුව සාකච්ඡාවක් මෙහෙයවන්න. කෙනකුගේ ඇස් නොපෙනෙන විට මහත් අසරණ බවට පත් වන්නා සේ අනුන්ගේ උදවු අවශ්‍ය වූ විට පත්වන අසරණභාවය මතු කර දක්වන්න. එසේ ම අපට ද උදවු අවශ්‍ය අවස්ථාවල කවුරු හෝ පිහිටට නොපැමිණියහොත් අප ද මහත් අසරණ බවට පත්වන බව අවධාරණය කරන්න. එහෙත් කෙනකුට උදවු කළ යුත්තේ සමාන තත්ත්වයේ ලා සලකමින්, උදවු ලබා ගන්නාගේ ගරුත්වයට හානියක් නොවන සේ බව පෙන්වා දෙන්න.

තමාට අවශ්‍ය උදවු පිළිබඳ සිතා බැලීමට සියලු ම සිසුන් යොමු කරන්න. මෙම උදවු තමාට අවශ්‍ය ඉගෙනුම් ද්‍රව්‍ය හෝ ද්‍රව්‍ය නොවන වෙනත් උදවු හෝ විය හැකි බව ද අවධාරණය කරන්න.

උදාහරණ :

- පන්තියේ පොත් පත්, පෑන්, පැන්සල් මිල දී ගැනීමට දුෂ්කරතා ඇති ශිෂ්‍යයකුට ඒවා ලබා දීම.
- වත්පොහොසත්කම් අඩු ශිෂ්‍යයකුට සිටුවීම සඳහා අවශ්‍ය මල්, එළවළු වැනි පැළ ලබා දීම.
- අවසානයේ දී අන් අයට උදවු කිරීමේ අවස්ථා සොයා බලා කටයුතු කිරීම ද, උදවු කරන විට උදවු ලබන අයගේ ගරුත්වයට හානි දායක නොවන සේ උදවු කිරීමේ අගය ද අවධාරණය කරන්න.

උදාහරණ :

පැන්සල් පොත්, පෑන්, පැන්සල් දීම, පොත් පත්වලට කවර දැමීම, ඇඳුම් පැළඳුම් ආදී වශයෙන් ලබා දිය හැකි උදවු හා ඉගෙනුම් අවස්ථාවල දී මෙන් ම පාසලට නොපැමිණි දිනවල දී අවශ්‍ය උදවු ලබාදීම කෙරෙහි අවධානය යොමු කරන්න. උදවු කළ හැකි ආකාර පන්ති මට්ටමෙන් හඳුනා ගන්න. උදවු දුන් අයට ස්තුති කිරීම, ප්‍රශංසා කිරීම හා අගය කිරීම් කරන්න.

## ක්‍රියාකාරකම 6

සිය කැපවීම හා දායකත්වය දක්වමින් අන්‍යයන්ට සොයා බලා උදවු කිරීම අවධාරණය වන සේ පහත දැක්වෙන ක්‍රියාකාරකමට සිසුන් යොමු කරන්න.

අන් අයට උදවු කිරීමට ඇති අවස්ථා පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න. සිසු අදහස් අනුව හඳුනා ගත් එවැනි අවස්ථා පෙළගස්වන්න.

උදාහරණ :

- වැඩිහිටි නිවාසයකට උපකාර කිරීම
- ළමා නිවාසයකට උපකාර කිරීම
- රෝහලේ බෙහෙත් නිකුත් කිරීමට අවශ්‍ය කවර පන්තියේ සාදා රෝහලට සැපයීම.

මෙසේ හඳුනා ගත් එක් අවස්ථාවක් සඳහා සිසුන්ට පන්ති මට්ටමෙන් කළ හැකි දෑ පිළිබඳ ව සාකච්ඡා කරන්න.

උදාහරණ :

- සෞන්දර්ය ක්‍රියාකාරකම් තුළින් වැඩිහිටියන්/ළමයින් තෘප්තිමත් කිරීම.
- වැඩිහිටියන්/ළමයින් සමග සුහදව කතා බහ කිරීම හා හැකි මට්ටමින් උපකාර කිරීම. පූර්ව සූදානමක් ඇති ව සිසුන් විසින් පන්තියේ දී මැසූ කොට්ට උර, ලේන්සු, අවාන වැනි දේ වැඩිහිටියන්ට/ළමයින්ට ලබා දීම (මිල දී ගැනීමෙන් තොරව) දම්වැල් මැස්ම, නැටි මැස්ම, කතිර මැස්ම, බිලැන්කට් මැස්ම ආදී විසිතුරු මැහුම් ක්‍රම භාවිත කර මේවා අලංකාර ලෙස නිමැවීමට මග පෙන්වන්න. එමෙන් ම මසා ගන්නා ලද කොට්ට උර/ලේන්සු, රෙදි මුද්‍රණ සායම් (Fabric painting) භාවිත කර අලංකාර කර ගන්න.

ක්‍රියාකාරකම අවසානයේ දී අන්‍යයන්ට උදවු කිරීමේ මහගු ගුණය මතු කර දක්වන්න. එවැනි අය බහුතරයක් ඇති සමාජය වඩාත් යහපත් බව මතු කර දක්වන්න.

## ක්‍රියාකාරකම 7

පාසලේ පරිසරය සුන්දර ව පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව පෙන්වා දෙන්න.

පාසලේ පරිසරය පිළිබඳ අවධානය යොමු වන සේ පාසල් වත්ත නිරීක්ෂණය කිරීමට යොමු කරන්න. නිරීක්ෂණයෙන් පසු ''මා දුටු පාසල'' චිත්‍රයට නැගීමට අවස්ථාව දෙන්න.

තමා ඉගෙනුම ලබන පාසල් පරිසරය සුන්දර ස්ථානයක් වීමේ වැදගත්කම අවධාරණය කරමින් දෙනෙත් පියාගෙන වඩාත් සුන්දර පාසල් වත්තක් පිළිබඳ සිතිවිලි මවා ගැනීමට අවස්ථාව දෙන්න. ඒ සඳහා සිසුන් දිරිගන්වන්න.

සුන්දර පාසල් වත්තක් පිළිබඳ සිතේ මැවුනු දෑ ''මගේ සිහින පාසල'' නමින් චිත්‍රයක් ඇඳීමට යොමු කරන්න.

''මගේ සිහින පාසල'' නම් චිත්‍රය ද රැගෙන සුදුසු පරිදි කණ්ඩායම් වීමට යොමු කරන්න.

ඇඳින ලද චිත්‍ර දෙක සැසඳීමට යොමු කරන්න. කණ්ඩායමේ දී දැන් තිබෙන පාසල් වත්තේ කළ යුතු වෙනස්කම් යෝජනා කරමින් තමාගේ චිත්‍රය විස්තර කිරීමට ඉඩ දෙන්න. කණ්ඩායම එක්ව පස්වන ශ්‍රේණියේ සිසුන් ලෙස පාසලේ සුන්දරත්වය නංවාලීමට අපට කළ හැකි දෑ එක් එක් අයගේ සිහින පාසල ඇසුරෙන් හඳුනා ගන්න.

කුඩා කණ්ඩායමේ සියලු දෙනා එක්ව ''අපේ පාසලට අපෙන්'' යනුවෙන් සාමූහික චිත්‍රයක් නිර්මාණය කිරීමට සලස්වන්න. එහි සැබවින් ම පන්තියේ සිසුන්ට කළ හැකි වෙනස්කම්වලින් සමන්විත විය යුතු බව මතු කර දක්වන්න. තව දුරටත් චිත්‍රය සාමූහිකව, විචාරශීලීව දියුණු කරමින් පාසල් වත්ත සොඳුරු තැනක් වීමට දියුණු කළ යුතු අංග හඳුනා ගන්න.

උදාහරණ :

- පාසලට අලංකාර වැටක්
- බිත්තිවලට පින්තූර
- මිදුලට පොකුණක්
- මග දෙපස විවිධ පැහැති මල්, එළවළු
- පස සෝදායන තැන්වලට අලංකාර වැටියක්
- කියවීමට එළිමහනක්

හඳුනාගත් එක් වෙනස්කමක් කිරීම සඳහා කණ්ඩායමේ වගකීම් බෙදා ගැනීමට යොමු කරන්න. එක් එක් කණ්ඩායම විසින් සැලසුම් කරන ලද වෙනස්කම කිරීම සඳහා වැඩ පිළිවෙළ සකස් කිරීමට මග පෙන්වන්න. වගකීම් බෙදා ගැනීමට සලස්වන්න. වෙනස්කම් ක්‍රියාත්මක කිරීමෙන් පසු මගේ සිහින පාසල චිත්‍රය සමග සිදු වී ඇති වෙනස්කම් සසඳා සතුටු වීමට දිරි ගන්වන්න. ''මගේ සිහින පාසල'' චිත්‍රයට අනුව ඉටු වී නැති වෙනස්කම් අනාගතයේ සිදු කළ යුතු බව අවධාරණය කරන්න.

## ක්‍රියාකාරකම 8

කරන ලද වෙනස්කම් සම්බන්ධව කවි, ගී, ලිපි නිර්මාණ කිරීමට අවස්ථාව දෙන්න. ඒවා පන්තියට ඉදිරිපත් කිරීමට යොමු කරන්න. ඉදිරිපත් කළ නිර්මාණාත්මක කවි, ගී, ලිපි අවසානයේ ප්‍රදර්ශන පුවරුවට යොමු කරන්න.
එමෙන් ම තෝරාගත් සිරිත් මල්දම කවි කිහිපයක් ගායනයට අවස්ථාව දෙන්න. එහි කියවෙන හොඳ පුරුදු කෙරෙහි අවධානය යොමු කර හොඳ අලුත් පුරුද්දක් ඇති ව වෙනස්වීමේ අගය මතු කර දක්වන්න.

## ක්‍රියාකාරකම 9

කායික හා මානසික සුවතාව සඳහා වන නිර්මාණාත්මක ක්‍රීඩා සඳහා සිසුන් යොමු කරන්න. නිවැරදි චර්යා සඳහන් වගන්ති ඇතුළත් පත්‍රිකා කිහිපයක් සකසා ගන්න.

උදාහරණ :

- පොත් මේසය පිළිවෙළට තබමු.
- හොඳ දේ තෝරා ගෙන හොඳ දේ පමණක් කිරීමට කටයුතු කරමු.

මෙහි දී වගන්තියේ ඇතුළත් වචන හැඩතල ලෙස කපා කට්ටල කිහිපයක් සකස් කර ගන්න. ඒවා කලවම් කර කවර කිහිපයකට දමන්න. සිසුන් කණ්ඩායම් කරන්න. කපා ගත් හැඩතල කණ්ඩායමේ සිටින සිසුන් සංඛ්‍යාවට ප්‍රමාණවත් විය යුතු ය.

එළිමහන් ස්ථානයකට සිසුන් රැගෙන යන්න. ස්ථාන කිහිපයක වචන කට්ටල කිහිපය තබා ක්‍රීඩාවේ උපදෙස් සිසුන්ට පැහැදිලි කරන්න. දෙන ලද සංඥාවකට අනුව

- කවරය තුළින් වචන එළියට ගන්න.
- වගන්තියක් සකස් කිරීමට උත්සාහ ගන්න.
- අවශ්‍ය කාඩ්පත් නැත්නම් වෙනත් කණ්ඩායම්වලට යන්න. අවශ්‍ය ඒවා සොයා ගන්න.
- අනවශ්‍ය කාඩ්පත් අන්‍යයන් වෙත දෙන්න.
- වගන්තිය සකස් කළ කණ්ඩායම් ගුරුවරයා විසින් නිශ්චිත කළ ස්ථානයකට වේගයෙන් දුවමින් රැගෙන ආ යුතු ය.
- වගන්තිය නිවැරදි දැ බලා අවශ්‍ය මග පෙන්වීම ගුරුවරයා විසින් කළ යුතු ය.
- ආරම්භක ස්ථානයට දිවීමට උපදෙස් දෙන්න.
- ක්‍රීඩාව නැවත ආරම්භ කරන්න.

# 13 මිනිසා හා තොරතුරු

තොරතුරු තාක්ෂණය මෑත කාලයේ ඉතාම ශීඝ්‍රයෙන් දියුණුවට පත් වූ ක්ෂේත්‍රයකි. රට රටවල් අතර මෙන් ම රටක් තුළ ද තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා පුවත්පත් වැනි මුද්‍රිත මාධ්‍ය මෙන් ම විද්‍යුත් තැපෑල වැනි විද්‍යුත් මාධ්‍ය ද භාවිතයේ පවතී. මේවා පිළිබඳ ව හොඳින් අවබෝධ කරගෙන අර්ථාන්විත ලෙස එදිනෙදා ජීවිතයට සම්බන්ධ කර ගැනීම සාර්ථක පුරවැසියකු වීම සඳහා අත්‍යවශ්‍යය. ඒ සඳහා වැදගත්වන නිපුණතා රාශියක් තිබේ. එදිනෙදා තොරතුරු පිළිබඳ ව විමසිලිමත් ව කටයුතු කිරීම, තොරතුරු අවශ්‍ය පරිදි තෝරා ගැනීම, තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා උචිත ක්‍රම භාවිත කිරීම, මේවා අතර ප්‍රධාන වේ. ඒ සඳහා මූලික පදනමක් සිසුන්ට ලබා දීම මෙම තේමාවෙන් අපේක්ෂා කෙරේ.

## නිපුණතා

- ★ තොරතුරු ලබා ගැනීම සඳහා විවිධ මාධ්‍ය හා ක්‍රමවේද භාවිත කරයි.
- ★ එදිනෙදා කටයුතු සඳහා විද්‍යුත් උපකරණ කිහිපයක් හසුරුවයි.
- ★ විවිධ මාධ්‍ය ඇසුරින් ලැබෙන තොරතුරු විශ්ලේෂණය කර උචිත තොරතුරු තෝරා ගනියි.
- ★ තොරතුරු ඉදිරිපත් කිරීමේ වඩා ඵලදායී ක්‍රමය යොදා ගනියි.
- ★ විවිධ මාධ්‍ය ඔස්සේ ලබා ගන්නා තොරතුරු භාවිත කරමින් විවේකය ඵලදායී ලෙස ගත කරයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

සිසුන් විසින් කියවන, සවන්දෙන සහ නරඹන දෛනික වැඩ සටහනක් පිළිබඳ තොරතුරු රැස් කිරීමට යොමු කරන්න. මේ සඳහා පහත සඳහන් පත්‍රිකාවක් සකස් කර ගැනීමට සලස්වන්න.

අදාළ ස්ථානයේ x ලකුණ යොදන්න.
හිස්තැන්වලට අදාළ පිළිතුරු ලියන්න.

1. මිතුරාගේ/ මිතුරියගේ නම :
2. i. රූපවාහිනිය නරඹන්නේ ද : ඔව් ☐ නැත ☐
   ii. රූපවාහිනිය නරඹන්නේ නම් එම වැඩසටහන් මොනවා ද?: ගත කරන කාලය (දළ වශයෙන්) පැය මිනිත්තු
   ............................................... ............... ...............
   ............................................... ............... ...............
   ............................................... ............... ...............
3. i. ගුවන් විදුලියට සවන්දෙන්නේ ද? : ඔව් ☐ නැත ☐
   ii. ගුවන්විදුලියට සවන් දෙන්නේ නම් එම වැඩසටහන් මොනවා ද? : ගත කරන කාලය (දළ වශයෙන්) පැය මිනිත්තු
   ............................................... ............... ...............
   ............................................... ............... ...............
   ............................................... ............... ...............
4. i. පත්තර කියවන්නේ ද? : ඔව් ☐ නැත ☐
   ii. පත්තර කියවන්නේ නම් ඒවා මොනවා ද? : ........................................
   ........................................
5. i. අතිරේක පොත් කියවන්නේ ද? : ඔව් ☐ නැත ☐
6. i. අන්තර් ජාලය/ විද්‍යුත් තැපැල් භාවිත කරන්නේ ද? : ඔව් ☐ නැත ☐

මෙවැනි පත්‍රිකාවක් සෑම සිසුවකුට ම ලැබිය යුතු ය. මෙම පත්‍රිකාව පන්තියේ මිතුරකු හමුවී පුරවා ගැනීමට සලස්වන්න. ඒ අනුව සෑම සිසුවකු ළඟ තිබෙන පත්‍රිකාව සම්පූර්ණවීම අවශ්‍ය ය. සිසුන් කණ්ඩායම් කරන්න. පුරවන ලද පත්‍රිකාවේ තොරතුරු ගොනු කිරීමට උපදෙස් දෙන්න. පහත වගුව ඒ සඳහා යොදා ගැනීමට උදව් කර ගත හැකි වේ.

| මිතුරාගේ නම | රූපවාහිනියේ නරඹන වැඩසටහන් | ගුවන් විදුලියේ සවන්දෙන වැඩසටහන් | පත්තර | අන්තර්ජාල | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | | | |

කණ්ඩායම විසින් ගොනුකළ තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. සියලු ම කණ්ඩායම් විසින් ඉදිරිපත් කළ තොරතුරු නැවතත් පොදු ගොනුවක් කිරීමට ගුරුවරයා මැදිහත්වන්න. ඒ සඳහා පහත සඳහන් පරිදි වගුවක් භාවිත කළ හැකි ය.

| රූපවාහිනියේ නරඹන වැඩසටහන් | ගුවන් විදුලියේ සවන්දෙන වැඩසටහන් | පත්තර | අන්තර්ජාල | වෙනත් |
|---|---|---|---|---|
| | | | | |

ඉහත වගුව භාවිත කරමින් පහත සඳහන් කරුණු මතු කරන්න.

- එක් එක් මාධ්‍යයක් සඳහා කැමැති සිසුන් සංඛ්‍යාව
- වැඩි වශයෙන් නරඹන වැඩ සටහන්
- වැඩි වශයෙන් සවන්දෙන වැඩ සටහන්
- වැඩි වශයෙන් කියවන පත්තර හා මාතෘකා
- වැඩියෙන් ම භාවිත කරන මාධ්‍ය
- අඩුවෙන් ම භාවිත කරන මාධ්‍ය
- තොරතුරු ලැබෙන වෙනත් මාධ්‍යයන්
- අප විසින් සංවර්ධනය කර ගත යුතු අංග

නරඹන හා සවන්දෙන වැඩසටහන් සහ කියවන පත්තරවල වඩාත් උචිත දේ තෝරා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන්න. වඩා උචිත දේ තෝරා ගැනීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු පිළිබඳ සිසුන්ට මග පෙන්වන්න.

මෙසේ තොරතුරු ලබා ගැනීමෙහිලා එක් ක්‍රමයක් ලෙස පත්‍රිකා මගින් හෝ ප්‍රශ්න විමසමින් හෝ තොරතුරු ලබා ගත හැකි බව පෙන්වා දෙන්න.

ඉහත තොරතුරු ඇසුරු කර ගනිමින් සිසුන් කණ්ඩායම් කරන්න.

උදාහරණ :

ගුවන්විදුලියට සවන්දෙන සිසුන්,
රූපවාහිනිය නරඹන සිසුන්,
පත්තර කියවන සිසුන් ................. වැනි

පසුදින ක්‍රියාකාරකම් සඳහා ඒ ඒ මාධ්‍ය ඔස්සේ ලබා දෙන තොරතුරු කිහිපයක් සටහන් කරගෙන එන ලෙස පවසන්න.

## ක්‍රියාකාරකම 2

කණ්ඩායම් වශයෙන් රැස් කරගෙන ආ තොරතුරුවලින් සිසුනට උචිත තොරතුරු පමණක් තෝරා ගැනීමට උදව් දෙන්න.

තෝරාගන්නා ලද තොරතුරු කිසියම් ආකාරයකට ගොනු කළ හැකි දැයි බැලීමට සලස්වන්න.

උදාහරණ :

ක්‍රීඩා, ළමා වැඩසටහන්, අධ්‍යාපන, සංස්කෘතික ...... වැනි

එම තොරතුරු ඇසුරෙන් පහත සඳහන් ලක්ෂණ හඳුනා ගැනීමට සලස්වන්න.


පත්තරවල අදහස් පැහැදිලි බව
එක් එක් මාතෘකා යටතේ ඉදිරිපත් කර ඇති තොරතුරුවල කෙටි/දිගු බව
කවුරුන් විසින් කා හට ප්‍රකාශ කර තිබේ ද යන්න.
එම අදහස් අසන, නරඹන හා කියවන අයගේ සිත් දිනා ගැනීමට සමත් වේද යන්න
මෙම තොරතුරුවලින් අපට ගත හැකි ආදර්ශ හා ප්‍රයෝජන

මේ අනුව තොරතුරක් ලබාදීමේ දී වඩාත් ම අවධාරණය කළ යුතු දේ කෙරෙහි සැළකිලිමත් වීමට උපදෙස් දෙන්න.

උදාහරණ :

ලබා දෙන අදහස් පැහැදිලි ව හා නිරවුල් ව ලබාදීම ඉදිරිපත් කරන ආකාරය.

## ක්‍රියාකාරකම 3




පාසලේ තිබෙන පහසුකම් අනුව ඉහත දැක්වෙන ජන මාධ්‍යයන් එකක් තෝරා ගෙන ක්‍රියාත්මක කරන ආකාරය සිසුනට අත්දැකීම් ලබා ගැනීමට සලස්වන්න. ප්‍රවෘත්ති නිවේදනයකට සවන් දීමට සලස්වා ඉන් ලබා ගත් තොරතුරු හා ඉන් ඇති ප්‍රයෝජන පිළිබඳ සාකච්ඡා කරන්න.

ප්‍රවෘත්ති නිවේදනවලට සවන් දීම එදිනෙදා ජීවිතය සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රයේජනවත් වන ආකාරය අවබෝධ වන ලෙසට සහ ඒවාට සවන් දීමට ලැදියාවක් ඇති වන ආකාරයට මෙම සාකච්ඡාව ගොඩ නගන්න.

එක් එක් මාධ්‍යයක ඇති වාසි සහ අවාසි පිළිබඳ ව කතාබහ කිරීමට කණ්ඩායම්වලට පවරන්න. ඒවා කඩදාසිවල සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.

උදාහරණ :

රූපවාහිනිය නැරඹීමෙන් ලැබෙන වාසි :

- ලෝකයේ විවිධ තොරතුරු ඇසීමට හා දැකීමට ලැබීම.
- අධ්‍යාපනික වැඩසටහන් විකාශය වීම.
- සමහර වැඩසටහන් සජීවී ව ක්‍රියාත්මක වීම

රූපවාහිනිය නැරඹීමෙන් ලැබිය හැකි අවාසි :

- අනවශ්‍ය ලෙසින් රූපවාහිනී වැඩ-සටහන් සඳහා යොමුවීම හා අනවශ්‍ය ලෙස ඇබ්බැහිවීම
- ඒ අයෝග්‍යතාව
- කාලය අනවශ්‍ය ලෙස වැයවීම
- කියවීමට දක්වන රුචිය අඩුවීම

අනෙක් මාධ්‍යයන් පිළිබඳ ව ද වාසි අවාසි කතා බහ කරන්න.

එක් එක් මාධ්‍යයකින් මතුවන අවාසි පිළිබඳ වැඩි අවධානය යොමු කර එබඳු තත්ත්වයන්ගෙන් මිදී කටයුතු කළ යුතු ආකාරය පැහැදිලි කරන්න.

සිසුන් සටහන් කළ තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න. ගුරුවරයාගේ මැදිහත් වීමෙන් සිසු අදහස් තවදුරටත් සංවර්ධනය කරන්න.

කැසට් රෙකෝඩරයක් සපයා ගනිමින් කවි, ගීත පටිගත කර නැවත සවන්දීමට සලස්වන්න.

වඩාත් නිර්මාණශීලී ව කෙටි වැඩසටහනක් පටිගත කර, පන්තියට ඉදිරිපත් කිරීමට කැමති සිසුන් වෙතොත් එයට අවස්ථාව දෙන්න.

මුද්‍රිත මාධ්‍ය යටතේ විශේෂයෙන් පත්තරවල තොරතුරු ඉදිරිපත් කර ඇති ආකාර සිසුනට අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව ලබා දෙන්න. මේ සඳහා දෛනික පත්තරයක් හෝ පහසුවෙන් සපයා ගත හැකි වෙනත් සිසුනට යෝග්‍ය පත්තරයක් හෝ සපයා ගනිමින් පහත සඳහන් කරුණු ඔස්සේ අධ්‍යයනයට සලස්වන්න.

- ★ පත්තරවල පිටු සකස් කිරීමේ දී එහි සුවිශේෂත්වයක් තිබේ ද? එසේ නම් එයට හේතු?
- ★ පත්තරයෙහි ප්‍රධාන පුවත හා එය සඳහන් ස්ථානය එසේ ඉදිරිපත් කිරීමට හේතු
- ★ එක් එක් පිටුවක සඳහන් ප්‍රධාන පුවත් මොනවා ද?

- ★ සෙසු තොරතුරු ඉදිරිපත් කර ඇති ආකාර?
- ★ වර්ණ යෙදීම හා ඊට හේතු?
- ★ අකුරුවල ප්‍රමාණය, හැඩය හා ඊට හේතු?
- ★ අවධානය ලබා ගැනීමට යොදා ඇති උපක්‍රම උදාහරණ : කාටුන්, චිත්‍ර වැනි

ඉහත යොමු කිරීම් ඔස්සේ සිසු අත්දැකීම් ලබා ගැනීම සඳහා ඔවුන් සමග සාකච්ඡාවක් කරන්න.

විවිධ මාධ්‍ය ඔස්සේ විකාශනය වන වැඩසටහන් කිහිපයක් සකස් කර ඉදිරිපත් කිරීමට සිසු කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.

උදාහරණ :

ප්‍රවෘත්ති විකාශනය, දවසේ වැඩසටහන් විස්තරය ඉදිරිපත් කිරීම,
ආරාධිත අමුත්තෙක් සමග සාකච්ඡාවක් වැනි

## ක්‍රියාකාරකම 4

පුස්තකාලය පරිහරණය කිරීම සඳහා සිසු අත්දැකීම් ලබාදීමට අවස්ථාව ලබා දෙන්න.

මෙහි සජීවි අත්දැකීම් ලබාදීම සඳහා පාසල් පුස්තකාලයට යොමු කිරීම අවශ්‍ය වේ.

පුස්තකාලය නැරඹීමට යාමට ප්‍රථම පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

1. පොත් තබා ඇති ආකාරය
   - අංක අනුව වර්ග කිරීම
   - විෂයයන් අනුව වර්ග කිරීම
   - පොත් තබා ඇති පිළිවෙල (තිරස්/ සිරස්)
2. පොතක් කියවීමට හා රැගෙන යාමට සපයා ඇති ක්‍රියාමාර්ග
3. පුස්තකාල තුළ හැසිරිය යුතු ආකාර
   - නිශ්ශබ්දතාවය
   - රාක්කයකින් පොතක් ගත් පසු නැවත තැබිය යුතු ස්ථානය
   - අන් අයට බාධා නොවන ආකාරයේ හැසිරීම්
   - පොත් ආරක්ෂාකාරීව පරිහරණය

තමාට කියවීම සඳහා සුදුසු පොතක් තෝරා ගැනීම කෙරෙහි අවධානය යොමුකරන්න.

පොතකින් අවශ්‍ය කොටසක් තෝරා ගැනීමේ දී හෝ තමාට උචිත පොතක් ද යන්න තෝරා ගැනීම සඳහා හෝ පොතෙහි පටුන සඳහන් මාතෘකා කෙරෙහි අවධානය යොමු කරවන්න. එමෙන් ම කතුවරයා, වර්ෂය වැනි කරුණු කෙරෙහි ද අවධානය යොමු කිරීම අවශ්‍ය බව පැහැදිලි කරන්න.

පුස්තකාලය නිරීක්ෂණයෙන් ලත් අත්දැකීම් පදනම් කරගනිමින් කණ්ඩායම් පැවරුමක් දෙන්න.

පාසල් පුස්තකාලයට යොමු කර කණ්ඩායම කැමති මෙන්ම යෝග්‍ය පොතක් තෝරා ගැනීමට උපදෙස් දෙන්න.

එම පොත කියවා පහත සඳහන් කරුණු ඕමයි කඩදාසියක හෝ වෙනත් සුදුසු කඩදාසියක හෝ සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.

1. එම පොතෙහි අඩංගු මූලික අදහස (කුමක් ගැන ද යන්න ප්‍රමාණවත් වේ)
2. පොතේ නම හා කතුවරයා
3. මුද්‍රණ වර්ෂය
4. මුද්‍රණය

සම්පූර්ණ කළ ඕමයි කඩදාසි සියල්ල පන්තියේ ප්‍රදර්ශනය කර ඒවා කියවා බැලීමට සිසුනට අවස්ථාව දෙන්න.

විවේකීව ගත කරන අවස්ථාවල දී පුස්තකාලය පරිහරණය කිරීම වඩාත් ඵලදායි වන බව අවධාරණය කරන්න.

## ක්‍රියාකාරකම 5

තොරතුරු ලබාදීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී වඩාත් උචිත ක්‍රම පිළිබඳ ව සිසු අවධානය යොමු කරන්න. මේ සඳහා පෙර දිනයක දී යොමු කෙරෙන පුවත් පතක ඇති වෙළඳ දැන්වීම්, සෞඛ්‍යමය පණිවුඩ, කෙටි දැන්වීම්, රූපික ප්‍රකාශන හැකි තරම් පන්තියට රැගෙන ඒමට උපදෙස් දෙන්න.

සිසුන් කණ්ඩායම් කර රැගෙන ආ තොරතුරු කණ්ඩායම්වලට බෙදා දී ඒවා එකිනෙක හඳුනා ගැනීමට සලස්වන්න. ඒ අනුව එක් එක් වෙළෙඳ

දැන්වීම්වල සෑම විටම අඩංගුවන කරුණු හඳුනා ගැනීමට සලස්වන්න.

උදාහරණ :

රැකියා ඇබෑර්තු, ඉඩකඩම් විකිණීම,
මෝටර් රථ විකිණීම හා මිළදී ගැනීම වැනි

යම් අදහසක් ප්‍රකාශනය සඳහා වෙළෙඳ දැන්වීමක් නිර්මාණය කිරීමට කණ්ඩායම් වශයෙන් යොමු කරන්න. මේ සඳහා සුදුසු මාධ්‍යයක් භාවිත කරන්න. තනිව හෝ කුඩා කණ්ඩායම් ලෙස හෝ පැවරීමක් ලෙස ලබා දී නිර්මාණය කළ දේ ප්‍රකාශ කර එයින් ප්‍රකාශ වන අදහස පිළිබඳ විමසිලිමත් වීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

සරල තේමාවක් ඔස්සේ පෝස්ටර් චිත්‍රයක් නිර්මාණයට යොමු කරන්න. ඒවා උචිත ස්ථානවල ප්‍රදර්ශනයට අවස්ථාව සලස්වන්න.

## ක්‍රියාකාරකම 6

එදිනෙදා ජීවිතයට සමීප විවිධ තොරතුරු දැක්වීමට සංඥා, සංකේත භාවිත කර ඇති ආකාර දක්නට ලැබේ. ඒවා පිළිබඳ සාකච්ඡාවකට ප්‍රවේශයක් ලෙස පහත සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවන්න.

උදාහරණ :

පොලිස් නිලධාරීන් භාවිත කරන සංඥා
මව්බස (සිංහල) කියවීම කොටස 44 සහ 45 පිටු අධ්‍යයනය කරන්න. අප එදිනෙදා භාවිත කරන විවිධ සංඥා

විදුලි පණිවිඩ, ෆැක්ස්, ඊ මේල්, ජාත්‍යන්තර වෙබ් අඩවි වැනි තොරතුරු හුවමාරු ක්‍රම විමසා බැලීමට හා අත්දැකීම් සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දෙන්න.

එදිනෙදා ජීවිතයේ දී අපට ප්‍රයෝජවත් වන සංඥා හා සංකේත මොනවාදැයි විමසීමක් කරන්න.
පොදු ස්ථාන හඳුනා ගැනීම සඳහා ද පාර අයිනේ සංඥා පුවරු සවි කර ඇත.

උදාහරණ :

කෞතුක වටිනාකම් සහිත ස්ථාන, රෝහල්, බොජුන් හල්, උසාවි, පාසල්, බස් නැවතුම්

මේ පිළිබඳ ව තොරතුරු රැස් කිරීමට සිසුනට පවරන්න.
බිත්ති පුවත් පතකට සරිලන සේ මෙම තොරතුරු ගොනු කර ප්‍රදර්ශනය කිරීමට සලස්වන්න.

ආහාර ඇසුරුම්, ඖෂධ ඇසුරුම් හා සම්බන්ධ වෙළෙඳ දැන්වීම්, ගුවන්විදුලි රූපවාහිනි යන්ත්‍ර වැනි ගෙදර දොර පරිහරණය කරන විවිධ උපකරණ මිලට ගැනීමේ දී දෙනු ලබන උපදෙස් පත්‍රිකා හැකි තරම් රැස් කරන්න.
මේ එක් එක් වර්ගයේ විස්තර පත්‍රිකා හෝ ඇසුරුම් පත් හෝ ලේබල් මත මුද්‍රිත විස්තරවල අවධාරණය කර ඇත්තේ කුමන කරුණු දැයි සොයා බැලීමට සිසු කණ්ඩායම්වලට පවරන්න.

උදාහරණ :

ඖෂධ ආරක්ෂා කර ගත යුතු ආකාරය
කුමන රෝග ආබාධ සඳහා ද
ඇති විය හැකි අතුරු ආබාධ
(බොහෝ විට මෙම උපදෙස් ඉංග්‍රීසි බසින් මුද්‍රිත ව ඇත.)

එහෙත් දේශීය වෛද්‍ය ක්‍රමය යටතේ බොහෝ විට සිංහල හා දෙමළ බසින් සඳහන් කර ඇත.

එදිනෙදා පරිහරණය කරන සරල උපකරණ භාවිත කිරීම සඳහා උපදෙස් පත්‍රිකා නිර්මාණය කිරීම කෙරෙහි සිසුන් යොමු කිරීම කළ හැකි ය. මෙවැනි උපදෙස් පත්‍රිකාවල ඇති ප්‍රයෝජනය පිළිබඳ ව සිසු අදහස් විමසා බැලීමට සලස්වන්න.
පාසල/ නිවසේ අනාරක්ෂිත ස්ථාන හඳුනා ගැනීමට කෙටි චාරිකාවක යෙදෙන්න. එබඳු අනතුරු එම ස්ථානයේ දී සිදු වී තිබෙන්නට ද පිළිවන. ඒ පිළිබඳ ව අවට අය දන්නවා විය හැකි ය. ආරක්ෂාව සඳහා ගත යුතු පියවර විස්තර කෙරෙන පත්‍රිකාවක් නිර්මාණය කිරීමට සලස්වන්න. අනතුරුව එය සංකේත හා සංඥා සහිත නිර්මාණයක් බවට පත් කරන්න.

උදාහරණ :

පාරේ කැඩී ගිය තැන්, පාර අයිනේ ඇති වලවල්, වසා නැති පරණ ළිං, ගැඹුරු මඩවලවල්

නාද මගින් ද යම් යම් අවස්ථා සිද්ධි යනාදිය සංකේතවත් වන බව පැහැදිලි කරන්න.

උදාහරණ :

- බයිසිකල් සීනුව, (තැපැල් පියුන් මහතාගේ පැමිණීම සංකේතවත් වේ.)
- ගිලන් රථ නලාව එහි තේරුම (වෙනත් හදිසි අවස්ථා පිළිබඳ සංඥා)

නාදවලින් සංකේතවත් වන සිද්ධි පිළිබඳ ව සිසු අදහස් විමසන්න.

උදාහරණ :

පාරෙන් ඉවත් වනු, පෙරහැරක් එයි, බසය නතර කරනු,ප්‍රවෘත්ති ඇසීමට, වැඩ කරන සමහර ස්ථානවලින් නිකුත් කෙරෙන හඬ, පන්සලේ සංඝාර නාදය, වත්තේ සංගුව (සසිණය)

පන්තියේ විවිධ කාර්ය සඳහා සංඥා නාද කිහිපයක් නිර්මාණය කර ගැනීමට සිසුනට කියන්න.

උදාහරණ :

තුන්වන කණ්ඩායමේ 4 වන සිසුවා මේසය ළඟට එන්න. මේ සඳහා නාද සංඥාවක් නිර්මාණය කරන්න.

- සිසුන් සියල්ල ම නැගිටින්න.
- සිසුන් සියල්ල ම පන්තියෙන් එළියට යන්න.
- පළමුවන හා දෙවන කණ්ඩායම්වල සිසුන් පමණක් පන්තියෙන් ඇතුළට එන්න.

ආදේශ වාද්‍ය භාණ්ඩ උදවු කරගෙන ප්‍රවෘත්ති ආරම්භයට හා අවසානයට වාදනය කළ හැකි වාදන ඛණ්ඩයක් නිර්මාණය කිරීමට යොමු කරන්න. ඉන් පසු එම වාදනය ඉදිරිපත් කර ප්‍රවෘත්ති කීමට අවස්ථාව සලසා දෙන්න.

## ක්‍රියාකාරකම 7

පණිවිඩ ප්‍රචාරය කිරීම සඳහා යොදා ගෙන ඇති විවිධ උපාය මාර්ග පිළිබඳ ව අධ්‍යයනයක් කිරීමට සිසුන් මෙහෙයවන්න.

උදාහරණ ඃ

බැනර්, පෝස්ටර්, දැන්වීම් වැනි දේවල් සපයා ගත නොහැකි නම් එවැනි දේ බහුල ව දැකිය හැකි ස්ථානයකට සිසුන් කැටුව යන්න. පහත ප්‍රශ්න සුදුසු ආකාරයට සකස් කර සිසුන්ගේ අවධානයට යොමු කරන්න.

- ප්‍රචාරණය කරන පණිවුඩ මොනවා ද?
- එම පණිවුඩ සම්බන්ධ කුමන කරුණු-වලට ප්‍රමුඛත්වයක් දී තිබේ ද?
- විස්තරාත්මකව ලියනවා නම් තව කුමන විස්තර ඊට අඩංගු කළ යුතු ද?
- ලොකුම අකුරින් ලියා ඇත්තේ කුමන තොරතුරු ද?
- කුඩාම අකුරින් ලියා ඇත්තේ කුමන තොරතුරු ද?
- පාට කීයක් ඒ සඳහා යොදා ගෙන තිබේ ද?
- වඩාත් ම ඈත සිට බැලූ විට පෙනෙන පාට කුමක් ද?
- ඈතට නොපෙනෙන පාට මොනවා ද?
- ඔබ කැමති පාට මොනවා ද?
- පුවරුවේ පාට අතරින් මිනිසුන් වඩා ප්‍රිය කරන පාට කුමක් ද?
- ඔවුන් යොදා ගන්නා චිත්‍රවල විශේෂ ලක්ෂණ තිබේ ද?

පණිවිඩ ප්‍රචාරය සඳහා දරණ උත්සාහයන් තුළින් පරිසරයට වන හානි හා සම්පත් නාස්තිය සම්බන්ධයෙන් සිසුන්ගේ අවධානය යොමු කරන්න. ඒ ඔස්සේ නිරීක්ෂණය කර ලබා ගන්නා තොරතුරු සුදුසු පරිදි ගොනු කර, ඒවා කතා බහ කිරීමට සලස්වන්න. යම්කිසි නිගමනයන්ට පැමිණිය හැකි දැයි බලන්න.

මිනිසුන් නගන හඬ එසේ වර්ග කළ හැකි දැයි සොයා බැලීමට සිසුනට අවස්ථාව සපයන්න.

හිතට දැනෙන දුක, සතුට ප්‍රකාශ කිරීමට අප පාවිච්චි කරන වචන හඳුනා ගැනීම සඳහා සාකච්ඡාවක් කරන්න. අභ්‍යාසයේ යෙදී වඩා හොඳින් අදහස් ප්‍රකාශ වන පරිදි වචන උච්චාරණය කළ හැකි අය කවුරුන් දැයි හඳුනා ගැනීමට සිසුනට අවස්ථාව සලස්වන්න.

මේ ආශ්‍රිත කෙටි නාට්‍ය ලියා රඟ දැක්වීමට සිසු කණ්ඩායම්වලට අවස්ථා සපයන්න. ඔවුනට එම කාර්යයේ දී උදවු අවශ්‍ය වනු ඇත. නාට්‍යකරණය පිළිබඳ පුරුද්දක් ඇති අය ඇත්නම් ඒ අයගේ සහාය සිසුනට ලබා දෙන්න.

සිසුන්ගේ නිර්මාණ නාට්‍යවල දී ආදේශ භාණ්ඩවලින් හඬ මුසු කිරීම කෙරෙහි සිසුන් යොමු කරන්න.

දුක, සතුට, බිය දනවන ගීත ද අප සාහිත්‍යයේ ඇත. ශෝක ප්‍රකාශ, ස්තෝත්‍ර වැනි ගායනාවලටත් සවන්දීමට අවස්ථා සලසා දිය හැකි නම් වඩා උචිතය.

උදාහරණ :

යශෝදරාවත, ගුත්තිලය වැනි පොත්වලින් උපුටා ගත් කොටස්

පළපුරුදු අයගේ සහාය ලබමින් ගායනා කරවීමට අවස්ථාව ලබා දෙන්න.

# 14 අපේ ආහාර

රටක දියුණුව රඳා පවතින්නේ නිරෝගී, ශක්තිමත් ජාතික මෙහෙවරට එලදායී අයුරින් දායක වන පුරවැසියන් මත ය. ඒ සඳහා ආහාර නිපදවීමට දායක වීම ආහාර පිළිබඳ යහපත් ආකල්ප ඇති වීම, පෝෂණ ගුණයෙන් යුතු සමබල ආහාර නාස්තියෙන් තොරව පරිභෝජනය කිරීම යනාදී ගුණාංගවලින් යුතුවීම අත්‍යවශ්‍ය ය. එවැනි ගුණාංගවලින් හෙබි පුද්ගලයකු සඳහා පදනම් වන නිපුණතා සංවර්ධනය කරනු පිණිස මෙම තේමාව ඉදිරිපත් කෙරේ.

## නිපුණතා

- ✶ තමාගේ දායකත්වය සහිත ව නිපදවන ආහාර ද්‍රව්‍යයක් ආහාර වේලට එකතු කර ගැනීමට ක්‍රියා කරයි.
- ✶ නිරෝගී පැවැත්ම සඳහා සමබල ආහාර වේලක අවශ්‍යතාව වටහාගෙන කටයුතු කරයි.
- ✶ වයසට සුදුසු පරිදි උස හා බර පවත්වා ගනියි.
- ✶ නිවැරදි පිළිවෙත් අනුගමනය කරමින් නිර්මාණශීලී ව ආහාර පිළිගන්වයි.
- ✶ ආහාර නාස්තිය වලක්වා ගැනීම සඳහා සැලකිල්ලෙන් යුතුව කටයුතු කරයි.
- ✶ පෝෂණ ගුණය ආරක්ෂා වන අයුරින් ආහාරයක් පිළියෙල කරයි.
- ✶ කායික හා මානසික සමබරතා සඳහා වන නිර්මාණාත්මක ක්‍රීඩාවන්හි නියැලෙයි.
- ✶ ආහාරවල පෝෂණ ගුණයේ වැදගත්කම මතුවන කවි, ගී ගායන හා රංගවල නිරත වෙයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

ගෙවත්ත තේමාව යටතේ සංවර්ධනය කරන ලද පාසල් ගෙවත්තෙන් ලබා ගන්නා එලදාව සිසුන්ට ලබා දෙන්න. නොඑසේ නම් නිවසේ ගෙවත්තෙන් ලබා ගන්නා එලදාව යොදා ගැනීමට මග පෙන්වන්න. තමාගේ දායකත්වය ඇති ව නිපදවන ලද ආහාර බෝගයක් ගෙන එය දිවා ආහාරය සඳහා පිළියෙල කර ගෙන ඒමට නිශ්චිත දිනයක් යොදා ගන්න. එම දිනයේ දිවා ආහාරයට සැබවින් ම තමාගේ දායකත්ව ඇති ව නිපදවූ ආහාරයක් අඩංගු වීම අත්‍යවශ්‍ය බව අවධාරණය කරන්න. මේ පිළිබඳ ව තේමාවට කලින් පවත්වන දෙමාපිය කවයකදී ද අවධාරණය කරන්න.

ආහාර ගැනීමට පෙර දිවා ආහාරය සඳහා පිළියෙල කර ගෙන ආ තම දායකත්වය ඇති ව නිපද වූ ආහාරය කුමක් දැයි පන්තියට පැවසීමට සෑම සිසුවකුට ම අවස්ථාව දෙන්න.

දිවා ආහාරය ගන්නා මොහොතේ ආහාර බඳුන් විවෘත කර එය හොඳින් නිරීක්ෂණය කිරීමට යොමු කරන්න.

එම ආහාරය දෙස බලා ගුරුවරයා පහත සඳහන් වැකිය කියන විට අසා සිට නැවත කීමට සලස්වන්න.

"මෙම ආහාරයේ මා නිපද වූ දෙයක් තිබීම ගැන මට ආඩම්බරයි. ආහාරයට ගන්නා දෙයක් නිපදවන්නට තරම් හැකියාවක් මට තිබීම සතුටක්" මේ පිළිබඳ ව නැවතත් මෙනෙහි කොට ආහාර ගැනීම ආරම්භ කිරීමට යොමු කරන්න.

දිවා ආහාරයෙන් පසුව සිසුන් කුඩා කණ්ඩායම්වලට යොමු කර තමන්ම නිපද වූ දෙයක් ආහාරට ගැනීමේ වැදගත්කම ගැන කතා බහ කරන්නට අවස්ථාව දෙන්න. කුඩා කණ්ඩායම්වල අදහස් ද උපයෝගී කර ගෙන පොදු සාකච්ඡාවක දී තමන් නිපද වූ දෙයක් ආහාරයට ගැනීමේ වැදගත්කම අවධාරණය කරන්න. තමන් නිපදවන දේ තමාට පමණක් නොව නිවසේ අයට මිතුරු මිතුරියන්ට සහ අසල් වැසියන්ට ද ආහාර සඳහා ලබා දිය හැකි බව අවධාරණය කරන්න.

## ක්‍රියාකරකම 2

මෙම තේමාවට පෙර දෙමාපිය කවයක් පවත්වා සමබල ආහාර වේලක් යනු කුමක් දැයි දෙමාපියන් දැනුවත් කරන්න. ක්‍රියාකාරකම තිබෙන දින දන්වා යැවූ විට විශේෂ අවධානයක් ඇති ව එම දිනවල දී සමබල ආහාර වේලක් දිවා ආහාරය සඳහා එවීම වැදගත්වන බව දෙමාපියන්ට අවධාරණය කරන්න. දෙමාපිය දැනුවත් කිරීම සඳහා පහත සඳහන් තොරතුරු උපයෝගී කර ගන්න.

හොඳ ආහාර වේලක ලක්ෂණ

- ✶ ප්‍රමාණවත් බව
- ✶ පෝෂණ අගය
- ✶ සුරක්ෂිත බව
- ✶ රසවත්ව භුක්ති විඳිය හැකි බව
- ✶ ආහාර වේල කෑම මෙන් ම බීම වර්ගවලින් ද යුක්ත බව
- ✶ පවුලේ සැමට ප්‍රමාණවත් බව

හොඳ ආහාර වේලක් සියලු පෝෂ්‍ය පදාර්ථවලින් යුක්ත විය යුතු අතර එය සමබල ආහාර වේලක් බව තහවුරු කරන්න. ඉහත සඳහන් කළ හොඳ ආහාර වේලක ලක්ෂණ පිළිබඳ ව සිසුන්ට ද මූලික අවබෝධයක් ලබා දීම වැදගත් වේ.

සමබල ආහාර වේලක කාබෝහයිඩ්‍රේට්, ප්‍රෝටීන්, මේද, විටමින්, ලෝහ ලවණ/ ඛනිජ ලවණ, ජලය අඩංගු බව වටහා දෙන්න.

ආහාර මගින් ශක්තිය, වර්ධනය, ශරීරයේ පැවැත්ම, නඩත්තුව සිදුවන බව වර්ගීකරණය තුළින් පැහැදිලි කර දෙන්න. මෙම එක් එක් පෝෂ්‍ය පදාර්ථයක් හා එයින් කෙරෙන කාර්යය ද පැහැදිලි කර දෙන්න. මෙම විවිධ පෝෂ්‍ය පදාර්ථ ලැබෙන මාධ්‍ය පහත දක්වා ඇති දත්ත ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

| පෝෂ්‍ය පදාර්ථ | ලබා ගත හැකි ආහාර |
|---|---|
| කාබෝහයිඩ්‍රේට් | ධාන්‍ය, පිෂ්ඨය සහිත අල වර්ග, කොස්, දෙල් |
| මේදය | තෙල්, මස්, මේදය, මාගරින්, රට කජු වැනි ඇටවර්ග, සමහර මාළු වර්ග |
| ප්‍රෝටීන් | මස්, මාළු, කිරි, බිත්තර, වැනි සත්ව ආහාර හා සෝයා බෝංචි, කඩල, බෝංචි වැනි මාශ බෝග |
| යකඩ | මස්, මාළු, පීකුදු, තද කොළ පැහැති එළවලු, රටකජු වැනි ඇට වර්ග |
| කැල්සියම් | කිරි, කිරි ආශ්‍රිත නිෂ්පාදන, කරවල |
| අයඩින් | මුහුදු මාළු හා ලුණු සහිත පරිසරයක වැඩෙන පැළෑටි, කරවල |
| විටමින් A | පීකුදු, බිත්තර, කිරි නිෂ්පාදන, තද කොළ පැහැති එළවළු හා පලතුරු, කහ පැහැති එළවළු හා පලතුරු |
| විටමින් B | තද කොළ පැහැති එළවළු වර්ග, ධාන්‍ය වර්ග, මස්, මාළු හා බිත්තර |
| විටමින් C | පලතුරු හා එළවළු බොහොමයක විශේෂයෙන් ම ඇඹුල් රසැති පලතුරු |
| විටමින් D | මාළුතෙල්, බිත්තර, කිරි |

ඉහත දක්වන ලද ආහාර අතරින් අඩු වියදමකින් ලබා ගත හැකි වඩාත් පෝෂ්‍ය ගුණයෙන් යුතු ආහාර තෝරා ගෙන දන්වා එවන දිනට දිවා ආහාර සඳහා පිළියෙල කර එවීම අත්‍යවශ්‍ය වන බව දෙමාපිය කවයේ දී දැනුම් දෙන්න.

එසේ ගෙන ආ දිවා ආහාරය ගැනීමෙන් පසු තම ආහාරයේ අඩංගු වූ ආහාර වර්ග ලැයිස්තු ගත කිරීමට අවස්ථාව සලසන්න.

පසුව පොදු සාකච්ඡාවක් තුළින් ශක්තිජනක ආහාර වර්ධක ආහාර හා ආරක්ෂක ආහාර පිළිබඳ ව සිසු අවධානය යොමු කරන්න.

එදිනෙදා කටයුතුවල දී අවශ්‍ය ශක්තිය ශක්තිජනක ආහාරවලින් ද වර්ධනයට අවශ්‍ය ආහාර වර්ධක ආහාරවලින් ද ලෙඩ රෝවලින් වැලකී නිරෝගී ව සිටීමට අවශ්‍ය ආහාර ආරක්ෂක ආහාරවලින් ද ලැබෙන බව අවධාරණය කරන්න.

සුදුසු පරිදි කුඩා කණ්ඩායම්වලට යොමු කර එකිනෙකා ළඟ ඇති දිවා ආහාරයට ගෙන එන ලද ආහාර ලැයිස්තු උපයෝගී කර ගනිමින් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කිරීමට මග පෙන්වන්න.

| ශක්තිජනක ආහාර | වර්ධක ආහාර | ආරක්ෂක ආහාර |
|---|---|---|
| උදාහරණ<br>බත් | උදාහරණ<br>මුං ඇට<br>බිත්තර | උදාහරණ<br>කැරට්<br>නිවිති |

එක් එක් කණ්ඩායමට තමන් සම්පූර්ණ කළ වගුව ද උපයෝගී කරගෙන ආහාර ගැනීමේ දී සමබල ආහාරයක් ගැනීම සිදු වේ දැයි සාකච්ඡා කිරීමට යොමු කරන්න. කැමති අකමැති බව විවිධ දැන්වීම් හා ආහාර පුරුදු ආදිය නිසා බොහෝ ආහාර වේල් ශක්තිජනක, වර්ධක හා ආරක්ෂක ආහාරවලින් සමබල නොවන බව අවධාරණය කරන්න.

එක් එක් පුද්ගලයකුට ලබා ගත යුතු ආහාර අවශ්‍යතා වෙනස්වන ආකාරය පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.

උදාහරණ :

වයස අනුව, රැකියාව අනුව, රෝගී නිරෝගී බව අනුව,

ඒ අනුව ආරක්ෂක ආහාර, වර්ධක ආහාර හා ශක්තිජනක ආහාර ලබාගන්නා ප්‍රමාණ අඩු වැඩි විය හැකි ආකාරය ගැන විමසා බලමින් කතා බහ කරන්න. සමබල ආහාර ගැනීම පිළිබඳ යහ ආකල්ප ඇති වන ලෙස කතාබහක් ගොඩනගා සමබල ආහාර වේලක වැදගත්කම ද අවධාරණය කර ක්‍රියාකාරකම අවසන් කරන්න.

කැමති මාධ්‍යයක් භාවිත කරමින් එළවළු හෝ පලතුරු පෙන්නුම් කෙරෙන චිත්‍රයක් නිර්මාණය කිරීමට සිසු කණ්ඩායම්වලට යොමු කරන්න. නිර්මාණ ප්‍රදර්ශනය කරන්න.

## ක්‍රියාකාරකම 3

සිසුන්ගේ බර කිරීමට සුදුසු තරාදියක් සපයා ගන්න. අවශ්‍ය නම් මේ සඳහා පවුල් සෞඛ්‍ය සේවිකා/ මහජන සෞඛ්‍ය පරීක්ෂක වැනි නිලධාරියකුගේ හෝ දෙමාපිය සහාය හෝ ලබා ගන්න.

සිසුන් එකිනෙකාගේ බර හා උස මනින්න. එම ප්‍රමාණ සටහන් කර ගන්න. සිය බර හා උස සඳහන් කාඩ්පතක් පිළියෙල කිරීමට සහ එම කාඩ්පත පැළඳ ගැනීමට යොමු කරන්න.

පවුල් සෞඛ්‍ය සේවිකා/මහජන සෞඛ්‍ය පරීක්ෂක/ නිලධාරීන්ගෙන් ලබා ගත් උස, බර, වයස පිළිබඳ කාලීන වගුවක් පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

තම උස හා බර සඳහන් කාඩ්පත සමග උස, බර, වයස සසඳමින් තමන්ගේ තත්ත්වය විමසා බැලීමට යොමු කරන්න.

ඒ අනුව බර වැඩි, බර අඩු, සාමාන්‍ය යන කාණ්ඩවලින් තමා අයත් වන්නේ කුමන කාණ්ඩයට දැයි හඳුනා ගැනීමට සලස්වන්න.


කුඩා කණ්ඩායම්වලට යොමු වෙමින් බර වැඩි, බර අඩු සාමාන්‍ය කාණ්ඩවලට අයත් අය නියමිත මට්ටමට පැමිණීමට කළ යුත්තේ කුමක් දැයි සාකච්ඡා කරන්න.

සමබල ආහාර ගැනීම, ව්‍යායාමය හා සිත් පහන් කිරීමට හුරුවීමෙන් නිරෝගී දිවි පැවැත්මක් ගත කිරීමේ හැකියාව ඇති වන බව අවධාරණය කරන්න.

## ක්‍රියාකාරකම 4

කෑම මේසයකට දැමීම සඳහා අලංකාර මේස රෙද්දක් මැසීමට හෝ පැදුරු රටා අනුගමනය කරමින් විවීමට හෝ ගෙතීමට හෝ උපදෙස් දෙන්න. (සෙන්ටිමීටර 60 ක පමණ දිග පළල සිටින සේ කුඩා රෙදි කෑලි භාවිත කරමින් මේස රෙද්ද මසා ගැනීමට හෝ කඩදාසි තීරු පටි, රෙදි පටි, පොල් කොළ, පන් ආදී දේ භාවිත කරමින් වියා ගැනීමට හෝ උදවු කරන්න.)

උදාහරණ :



මසා/වියා නිම වන මේස රෙද්දේ හතර වට අලංකාරව නිම කර ගැනීමට යොමු කරන්න.

උදාහරණ :

ඒ සඳහා පටියක් අල්ලා නවා වාටිය මැසීම හෝ වෙනත් විසිතුරු මැහුම් ක්‍රමයක් හෝ අනුමගමනය කිරීම.

අලංකාරව ගොතන ලද රෙදි පටියක් වටේට ඇල්ලීමෙන් ද අලංකාර කර ගත හැකිය. ආහාර පිළිගැන්වීමේ දී අනුගමනය කළ යුතු සිරිත් විරිත් පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න. එම සාකච්ඡාවේ දී පහත දැක්වෙන කරුණු අවධාරණය කරන්න.

### ආහාර වර්ග පිළිගැන්වීමේ දී

අමුත්තෙකුට ආහාර වර්ග පිළිගැන්වීමේ දී එය සුළු ආහාරයක් නම් බන්දේසියක තබා පිළිගැන්විය හැකි අතර ප්‍රධාන ආහාර වර්ග පිළිගැන්වීමේ දී මේසයක් මත සූදානම් කොට පිළිගැන්වීම කළ හැකි බව පෙන්වා දෙන්න.

ආහාර පිළිගැන්වීම සඳහා එය සකස් කිරීමේ දී සිත් ගන්නා සුළු ආකාරයෙන් නිමාවක් පැවතීම වැදගත් ය.

උදාහරණ :

කෑලි කැපීමේ ක්‍රමවත් බව, දවටන යෙදීම, වර්ණ ගැළපීම, භාවිත උපකරණ, උපකරණවල පවිත්‍රතාවය, ඇසිරීමේ දී ක්‍රමවත් බව, ආහාර වර්ග අනුව සුදුසු භාජන තෝරා ගැනීම වැනි කරුණු කෙරෙහි සැලකිලිමත් විය යුතු බව අවධාරණය කරන්න.

ආහාර වර්ගයක් පිළිගැන්වීමේ දී අත් පිස්නාවක් ද පිළිගැන්වීමේ වැදගත්කම සිසුන්ට වටහා දෙන්න. මේසයක් මත ආහාර පිළිගැන්වීමේ දී පිළිවෙළ හා අලංකාරවත් ලෙස පිළියෙල කිරීම කෙරෙහි අවධාරණය යොමු කිරීම වැදගත් බව පවසන්න. විශේෂයෙන් ආහාර ගැනීමට පෙර හා පසු අත් පිරිසිදු කර ගැනීම සඳහා ජලය තැබීමේ වැදගත්කම ද මතු කරන්න.

## ක්‍රියාකාරකම 5

අව්වේ වේලා පහසුවෙන් කල් තබා ගත හැකි ආහාර ද්‍රව්‍යයක් තම ප්‍රදේශයෙන් සකසා ගන්න. සිසුන්ට පෙන්වමින් මෙවැනි ආකාරයට කල් තබා ගත හැකි වෙනත් වර්ග මොනවා දැයි සාකච්ඡා කරමින් සිසුන් ඉදිරිපත් කරන ආහාර වර්ග කළුලෑල්ලේ සටහන් කරන්න.

උදාහරණ :

කොස්
දෙල්
දෙහි
බිලිං ආදී වශයෙන්

ඉන් පසු ඒ එක් එක් වර්ගය සඳහා අනුගමනය කළ හැකි කල් තබා ගැනීමේ ක්‍රම විමසමින් කළුලෑල්ලේ සටහනේ දකුණු අත පැත්ත සම්පූර්ණ කර ගන්න.

උදාහරණ :

| | |
|---|---|
| කොස් | වේළීමෙන් |
| දෙල් | වේළීමෙන් |
| දෙහි | ලුණු දැමීමෙන් |
| බිලින් | ලුණු දැමීමෙන් |
| පලතුරු | ආරක්ෂණ ද්‍රව්‍ය සමඟ ටින්වල බෝතල්වල ඇසිරීමෙන් |

ආදී වශයෙන්

ප්‍රදේශයේ බහුල ව ඇති ආහාර වර්ගයක් පන්ති කාමරයට ගෙන ඒමට සිසුන් යොමු කරන්න.

ආහාර නාස්තිය වළක්වා ගැනීම සඳහා එවැනි ආහාර වර්ග කල් තබා ගත හැකි ක්‍රමයක් හෝ දෙකක් හෝ අත්හදා බැලීමට කුඩා කණ්ඩායම්වලට යොමු කරන්න.

උදාහරණ :

වර්ගය - කල් තබා ගත හැකි ක්‍රම
දෙහි - ලුණු දෙහි දැමීම

ආහාර කල් තබා ගත හැකි ක්‍රම මගින් ඒවායෙහි බර, පාට හා රස වෙනස් වන ආකාර පිළිබඳ අත්දැකීම් ලබමින් ප්‍රකාශ කිරීමට යොමු කරන්න.

ප්‍රදේශයේ සුලභව ඇති ආහාර නාස්තිය වලක්වා ගැනීම සඳහා ඒවා කල් තබා ගත හැකි ක්‍රම භාවිත කිරීම මගින් තමන්ගේ ආර්ථිකය වර්ධනය කර ගැනීමට අවස්ථා උදා කර ගත හැකි බව ද පැහැදිලි කරන්න.

සිසුන් සමග පොදු සාකච්ඡාවකට පිවිසෙමින් පහත කරුණු අවධාරණය කරන්න.

සුලභව ඇති ආහාර නාස්තිය වලක්වා ගැනීම සඳහා ඒවා කල් තබා ගැනීම වැදගත් ය.

ආහාර හිඟයක් ඉදිරි කාලයේ දී පැමිණිය හැකි නිසා ආහාර නාස්තිය අවම කර ගැනීමට කටයුතු කළ යුතු බවත් සිසුන්ට අවබෝධවීමට ඉඩ සලසන්න.

ආහාර නාස්තිය අවම කර ගැනීමට ආහාර සංරක්ෂණය කිරීමට දායක වීම සැමගේ යුතුකමකි. ආහාර නාස්තිය වලක්වා ගැනීමේ වැදගත්කම පහත දැක්වෙන කරුණු ඔස්සේ මතු කරන්න.

- ✶ අපතේ යාම වළක්වයි.
- ✶ අවාරයේ දී ප්‍රයෝජනයට ගත හැකියි.
- ✶ ප්‍රවාහනයට පහසුයි.
- ✶ සෞඛ්‍යමත් බව වැඩියි.
- ✶ ආහාර හිඟයට පිළියමකි.
- ✶ ආර්ථික වාසි ලබා ගත හැකියි.

නාස්තිය අවම කර ගත හැකි ආකාරයට ආහාර කල් තබා ගැනීම සඳහා අනුමගනය කළ හැකි විවිධ ක්‍රම ඇති බව පෙන්වා දෙන්න.

උදාහරණ :

- ✶ ශීතකරණයේ තැබීම (එළවළු)
- ✶ අධිශීතකරණයේ තැබීම (මාළු)
- ✶ ටින් කිරීම (මාළු, බිස්කට්)
- ✶ සීනි දැමීම (දෙල්, කොස්)
- ✶ ලුණු දැමීම (දෙහි, බිලින්)
- ✶ වේලීම (දෙල්, කොස්)
- ✶ තෙල්වලින් බැදීම
- ✶ වැලි යට තැබීම (දෙහි)
- ✶ දුම් ගැස්සවීම (කරවල)

මෙවැනි ක්‍රම උදාහරණ සහිතව සිසුන්ට පැහැදිලි කරන්න.

ආහාර නාස්තිය වළක්වා ගැනීමේ වැදගත්කම ඉස්මතු වන අයුරින් නිර්මාණි නාටකයක් ඉදිරිපත් කරවන්න. වෙස් මුහුණු, රූකඩ, පන්ති කාමරයෙහි දී සෑදීමට දී ඒවා පැළඳ ඒවා රැගෙන නාටකයේ යෙදීමට යොමු කරන්න. නාටකයට උචිත ගැළපෙන නමක් යෙදීමට ද සිසුන්ට ඉඩ දෙන්න.

ප්‍රදේශයේ බහුලව ඇති ආහාර නාස්ති වීම වළක්වා ගැනීම සඳහා කල් තබා ගත හැකි පරිදි සකස් කර ගත් එක් ආහාර වර්ගයක් සඳහා වෙළෙඳ ප්‍රචාරයක් දීමට ගැළපෙන දැන්වීමක් හෝ පෝස්ටරයක් හෝ ඇඳීමට හා ලේබලයක් සකස් කිරීමට හෝ යොමු කරන්න.

## ක්‍රියාකාරකම 6

පෝෂ්‍ය කොටස් ආරක්ෂා වන ලෙසට ආහාර වර්ගයකින් කෑමක් හෝ බීමක් හෝ පන්තියේ දී සාදා අත්දැකීම් ලබා ගැනීමට සලස්වන්න.

උදාහරණ :

නෙල්ලි, දොඩම්, දෙහි වැනි පාන වර්ගයක්
අමු එළවළු සලාදයක්
අමු පළතුරු සලාදයක්
කොළ කැඳ වර්ගයක්

කොළ කැඳ වර්ගයක් පාසලේ දී සෑදීමට කටයුතු සැළසුම් කර ගන්නේ නම්

මෙහිදී,

- ✶ කොළ හොඳින් පිරිසිදු කර ගැනීම.
- ✶ පෝෂණ ගුණයෙන් වැඩි සහල් වර්ගයක් තෝරා ගැනීම.
- ✶ සෝදාගත් කොළ සිහින්ව කොටා ගැනීම.
- ✶ කැඳ වැඩි වේලාවක් තැම්බෙන්නට නොදී කොළ පාට රැඳෙන ආකාරයට පිස ගැනීම ... වැනි කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

පෝෂ්‍ය කොටස් ආරක්ෂා වන ලෙස ආහාර ගැනීමේ වැදගත්කම පිළිබඳ සාකච්ඡා කරන්න. මෙම සාකච්ඡාවේ දී ආහාර විස වීම සිදුවන ආකාර සහ එවැනි ආහාර ගැනීමෙන් වැළකීම.

තැන් තැන්වල අක්‍රමවත් ලෙස තබා ඇති ආහාර දූෂණය වන ආකාර හා එවැනි ආහාර ගැනීමෙන් වැළකීම.

විවිධ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යවලින් ප්‍රචාරය වන දැන්වීම් නිසා පෝෂණ ගුණයක් නැති ආහාරවලට නොරැවටීම. වැනි කරුණු මතු කර පෝෂ්‍ය කොටස් ආරක්ෂා වූ ආහාර ගැනීමේ වැදගත්කම අවධාරණය කරන්න.

## ක්‍රියාකාරකම 7

පෝෂ්‍ය ගුණයට හානි නොවන පරිදි ආහාර පිසින ක්‍රම පිළිබඳ තොරතුරු වැඩිහිටියන්ගෙන් අසා දැන ගෙන ඒමට යොමු කරන්න.

පන්තියට පැමිණි පසු ඒ පිළිබඳ රැස් කර ගත් තොරතුරු ඇසුරෙන් සාකච්ඡාවක් කරන්න. පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

### පෝෂණ ගුණය ආරක්ෂා වන පරිදි ආහාර පිසීමේ දී අනුගමනය කළ යුතු දෑ

අමුවෙන් ගත හැකි ආහාර එළවළු පළතුරු හා පාන වර්ග, පලා වර්ග තැම්බීමේ දී හා කපා සේදීමේ දී පෝෂ්‍ය ගුණයට සිදුවන දේ
අමුවෙන් ආහාරයට ගන්නා සියල්ල හොඳින් සෝදා ගත යුතු බව
ආහාර පාන වර්ග අමුවෙන් ගන්නා විට ලැබෙන වාසි
ආහාර පිළිගැනීමට කැමැත්තක් ඇති බව
සාකච්ඡා කරන කරුණු ඔස්සේ පහත සඳහන් ආකාරයට වගුවක් කළුලෑල්ලේ ගොඩ නගන්න.

උදාහරණ :

| ආහාර වර්ගය | සාදන ක්‍රමය හෝ පාවිච්චි කරන ආකාරය | ලැබෙන වාසි |
|---|---|---|
| 1. එළවළු වර්ග<br>2. බීම වර්ග<br>3. පළතුරු වර්ග | | |

පෝෂ්‍යදායි ආහාර වේලක් කුසගිනි නිවා ගැනීමට පමණක් නොව ශරීරයේ වැඩීමට හා ශක්තිය ලැබීමට ද අවශ්‍ය වන බවත් පැහැදිලි කර දෙන්න.

තැම්බීමේ දී හා කපා සේදීමේ දී පෝෂ්‍ය ගුණයට සිදුවන දේ සොයා බැලීමට පන්තියේ දී පහත සඳහන් ක්‍රියාකාරකම්වල යොදවන්න.

බීට් අලයක් කපා තැම්බීම හා නොකපා තැම්බීම
පලා වර්ගයක් කපා සේදීම හා නොකපා සේදීම
බණ්ඩක්කා කරලක් කපා තැම්බීම හා නොකපා තැම්බීම

කුඩා කණ්ඩායම්වලට සරල අත්හදා බැලීම්වලට යොමු කොට සොයා ගත් තොරතුරු වාර්තා කිරීමට අවස්ථාව දෙන්න.

ආහාර වැඩිපුර සේදීමේ දී පෝෂ්‍ය පදාර්ථ සේදී යන බවත්. ඇතැම් ආහාර තැම්බීමෙන් පෝෂ්‍ය පදාර්ථ විනාශ වී යන බවත් පැහැදිලි කර දෙන්න.

ප්‍රවීණ අයෙකු පන්තියට කැඳවා ඉහත කරුණුවලට

අදාළ ව තොරතුරු ලබා ගැනීමට අවස්ථාව සලස්වන්න.
පෝෂ්‍ය ගුණය ආරක්ෂා වන ලෙස ආහාර පිළියෙල කිරීමේ වැදගත්කම අවධාරණය කරන්න.

## ක්‍රියාකාරකම 8

ආහාර පාන පිළිබඳ ව කියවෙන රබන් පද අත්තාල තබමින් කීමට හා වාදනයට සිසුන් යොමු කරන්න.

උදාහරණ

1. *උඩ පල ගත්තත් වට්ටක්කා*
   *බිම පල ගත්තත් වට්ටක්කා*
   *උඩ පල ගත්තත් බිම පල ගත්තත්*
   *පුංචි පුංචි ගෙඩි වට්ටක්කා*
2. *තුං තුඹ ගෙඩි තුනයි තුනයි*
   *තිත්ත කැකිරි දෙකයි දෙකයි*
   *තුං තුඹ ගෙඩි තුනට කපන්*
   *තිත්ත කැකිරි දෙකට කපන්*
3. *ඉහළ ගහෙන් ඉදුනු ජම්බු*
   *පහළ ගහෙන් ඉදුනු ජම්බු*
   *ඉහළ ගහෙන් පහළ ගහෙන්*
   *පොකුරු පොකුරු ඉදුණු ජම්බු*

සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න.
එයින් කණ්ඩායම් දෙකකට මේසය මතට අතින් ගසමින් රබන් පද කියන අතරතුර අනෙක් කණ්ඩායම් දෙකේ සිසුන්ට ඊට අනුකූල රංගනයක් ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න.
මේ ආකාරයට රංගනය ඉදිරිපත් කළ කණ්ඩායමට ගායනා කිරීමට ද ගායනා ඉදිරිපත් කළ කණ්ඩායමට රංගනය ඉදිරිපත් කිරීමට ද අවස්ථාව ලබා දෙන්න.
ආහාරවල පෝෂණ ගුණයෙහි වැදගත්කම මතුකර දැක්වෙන ගායනා රැස් කිරීමට හා නිර්මාණයට සිසුන් යොමු කරන්න.
ඒවා එකතු කර පොත් පිංචක් සෑදීමට උපදෙස් දෙන්න.

## ක්‍රියාකාරකම 9

සිසුන් පිට්ටනියට හෝ නිදහස් ස්ථානයකට හෝ රැගෙන යන්න. පන්තිය සමාන සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න.
කණ්ඩායම් හතරේ සිසුන්ට පහත දැක්වෙන ආකාරයට සිට ගැනීමට උපදෙස් දෙන්න.

| | | |
|---|---|---|
| x x x x x | | |
| x x x x x | | x ගුරුතුමිය |
| x x x x x | මීටර 10ක් පමණ | |
| x x x x x | පතරයක් | |

එක් එක් පේළියක සිසුන්ට 1 සිට ගණන් කිරීමට පවසන්න. තමා කියූ ඉලක්කම මතක තබා ගන්නා ලෙස උපදෙස් දෙන්න.
ගුරුවරිය විසින් අංකයක් ප්‍රකාශ කළ විට එම අංකය හිමි සිසුවා තම කණ්ඩායමේ ඉදිරියට පැමිණිය යුතුයි.
ගුරුවරයා පවසන ඉරියව්ව අනුගමනය කරමින් ඉදිරියට පැමිණි එක් එක් පේළියේ සිසුවා ගුරුතුමිය අසල සලකුණු කර ඇති අවසන් සීමාවට පැමිණිය යුතුයි.
පළමුව පැමිණි සිසුවාට ලකුණක් හිමිවේ.
කායික හා මානසික සමබරතාව ඇති වන මෙවැනි තවත් ක්‍රීඩා නිර්මාණය කර සිසුන්ට ඉදිරිපත් කරන්න.

# 15 ගමනාගමනය

ගමනාගමනය පුද්ගලයකුගේ එදිනෙදා ජීවිතය සමග සෘජු ලෙස සම්බන්ධ වන වැදගත් සාධකයකි. සාර්ථක ජීවිතයක් පවත්වා ගෙන යාම සඳහා පුද්ගලයකුට ගමනාගමනය හා සම්බන්ධ කුසලතා රාශියක් සංවර්ධනය කර ගත යුතුය. රටේත් තම ප්‍රදේශයේත් පවතින ප්‍රවාහන ක්‍රම, මාර්ග රටාව, පිළිබඳ අවබෝධයක් ඔහුට තිබිය යුතුය. එම නිසා සිසුන් තුළ ඉහත සඳහන් කරුණුවලට අදාළ ව නිපුණතා සංවර්ධනය මෙම තේමාවෙන් අපේක්ෂා කෙරේ.

## නිපුණතා

- ✶ ගමනාගමන විකාශයෙහි අතීතය හා වර්තමානය සසඳමින් අනාගතය පිළිබඳ පුරෝකථනය කරයි.
- ✶ මාර්ගවල ව්‍යාප්තිය සැලසුම් සහගත ව කටයුතු කරයි.
- ✶ ගමන් බිමන්වල දී සැලසුම් සහගත ව කටයුතු කරයි.
- ✶ ගමනාගමන අවශ්‍යතා පහසු කර ගැනීම සඳහා යාන්ත්‍රික ශක්තිය උපයෝගී කර ගත හැකි අයුරු පිළිබඳ ව ගවේෂණශීලි ව කටයුතු කරයි.
- ✶ මාර්ග භාවිත කරන්නන් විසින් පිළිපැදිය යුතු නීතිරීති, ආචාරධර්ම, මහ මගදී ප්‍රවේසම පිළිබඳ සැලකිලිමත් වෙමින් ඒ අනුව ක්‍රියා කරයි.
- ✶ ගමනාගමනය ආශ්‍රිත ගායන, රංගන, නිර්මාණ සහ ක්‍රීඩාවල නිරත වෙයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

තුන්වන හා හතරවන ශ්‍රේණිවල දී ද ගමනාගමනය තේමාව යටතේ සිසුන් ගමනාගමනය පිළිබඳ විවිධ අත්දැකීම් ලබා ඇත. තුන්වන හා හතරවන ශ්‍රේණිවල සඳහන් තොරතුරු මොනවා ද යන්න අධ්‍යයන කර සිසුන්ගෙන් ඒ පිළිබඳ විමසීමක් කරන්න.

### ක්‍රියාකාරකම 2

අතීතයේ ශ්‍රී ලංකාවේ පැවැති ගමනාගමන ක්‍රම පිළිබඳ තොරතුරු ගවේෂණය කිරීමට සිසුන් යොමු කරන්න.

මේ සඳහා පෙර රජවරු විවිධ කටයුතු සඳහා විදේශ රටවලට යැම තම නිලධාරීන්, සේනා යැවීම.

උදාහරණ :

- ★ රාවණා රජු දඬු මොණරයක් උපයෝගී කොට ගෙන ගමන් බිමන් යාම.
- ★ වලගම්බා රජු යුද්ධයෙන් පැරදී අශ්ව කරත්තයෙන් පළායාමේ කතා පුවත.
- ★ මහා පරාක්‍රමබාහු රජු විදේශ රටවලට යුද්ධ සේනාව යැවීම.

වැනි ඓතිහාසික සිද්ධි කිහිපයක් ඉදිරිපත් කරමින් ඒ ආශ්‍රයෙන් අතීතයේ දී ගමනාගමන කටයුතු සඳහා වාහන යොදා ගැනීම සතුන් පිට යාම, පයින් ගමන් කිරීම මුහුදු යාත්‍රා භාවිත කිරීම, දෝලාවල් යොදා ගැනීම වැනි ක්‍රම උපයෝගී කරගෙන ඇති බව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

මේවාට අදාළ පින්තූර එකතු කිරීමට යොමු කරන්න. අතීතයේ භාවිත කළ ගමනාගමන ක්‍රමවල පැවැති ප්‍රයෝජන හා ගැටලු ලක්ෂණ පිළිබඳ ව සාකච්ඡා කොට පහත සඳහන් වගුවට ඇතුළත් කරන්න.

| ප්‍රයෝජන | ගැටලු |
|---|---|
| උදා: පරිසරයට හිතකාමී වීම<br>ශරීර සෞඛ්‍ය යහපත්ව පවත්වා ගැනීමට දායකවීම | වැඩි කාලයක් ගත වීම |

අතීතයේ අපේ රටේ පැවැති ප්‍රධාන මාර්ග දැක්වෙන සිතියමක් භාවිත කරමින් එදා පැවති ප්‍රධාන මාර්ග හා ප්‍රධාන නගර කිහිපයක් හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න. මේ සඳහා පුරාණ නගර හා සම්බන්ධ කරමින් දැක්වෙන මාර්ග සිතියම භාවිත කරන්න. මෙම නගර හා සම්බන්ධ වන ප්‍රධාන මාර්ග නිරීක්ෂණය කිරීම ප්‍රමාණවත් වේ.

අනුරාධපුරයේ ඇති නටබුන් වූ ගල්පාලම වැනි ඓතිහාසික තොරතුරුවලින් එදා පැවැති දියුණු මාර්ග පද්ධතිය පිළිබඳ අවබෝධයක් ලබා දීමට කටයුතු කරන්න.

## ක්‍රියාකාරකම 3

නවීන වාහන සහ ඒ ආශ්‍රිත මාර්ග පද්ධතිය අපේ රටේ ගමනාගමනය හා සම්බන්ධ විශාල පරිවර්තනයක් ඇරඹීම සම්බන්ධව සාකච්ඡා කරන්න.

ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්තය ආරම්භ වීමත් සමඟ ම දුම්රිය, මෝටර් රථ වැනි ගමනාගමන ක්‍රම අපේ රටේ ආරම්භවීම පිළිබඳ සාකච්ඡාවක් කරන්න.

ඉන්පසුව ක්‍රමක්‍රමයෙන් ගමනාගමන ක්‍රම සංවර්ධනය වූ ආකාරය සිසුන්ට හඳුන්වා දෙන්න.

## ක්‍රියාකාරකම් 4

අද අපේ රටේ භාවිත කරන දියුණු පරිවහන ක්‍රම ගොඩබිම, ජලය හා ගුවන් යාන ක්‍රම යටතේ සාකච්ඡා කරන්න.

| මාධ්‍ය | වාහන | භාවිත කරන ශක්ති ප්‍රභවය |
|---|---|---|
| ගොඩබිම<br>ජලය<br>ගුවන් | කරත්ත, පා පැදි දුම්රිය, බස්, කාර්<br>ඔරු පාරු, බෝට්ටු, නැව්<br>හෙලිකොප්ටර්, ගුවන් යානා | ශ්‍රමය |

අතීතයේ පැවති වර්තමානයේ පවතින අනාගතයේ ඇති විය හැකි වාහන පිළිබඳ නිර්මාණ කිරීමට සිසුන් යොමු කරන්න.

සිසුන් නිර්මාණය කරන ලද වාහන ආකෘති සහ පින්තූර ගෙන්වා ගන්න. ඒ ආශ්‍රිත ප්‍රදර්ශනයක් පැවැත්වීමට කටයුතු සංවිධානය කරන්න.

## ක්‍රියාකාරකම 5

පින්තූර හා ආකෘති උපයෝගී කරගෙන ලෝකයේ භාවිත කරන නවීන ගමනාගමන ක්‍රමෝපායන් හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න.

| | |
|---|---|
| ගුවන් | නවීන ගුවන් යානා පිළිබඳ තොරතුරු |
| ජල | නවීන නැව් හා බෝට්ටු පිළිබඳ තොරතුරු |
| ගොඩබිම | නවීන මෝටර් රථ, අධිවේගී දුම්රිය |

## ක්‍රියාකාරකම 6

ශ්‍රී ලංකාවේ මාර්ග සිතියමක් අධ්‍යයනය කර ප්‍රධාන මාර්ග සහ අතුරු මාර්ග පිළිබඳ අවබෝධ කර ගැනීමට ඉඩ සලසා දෙන්න.

පහත සඳහන් ආකාරයේ ක්‍රියාකාරකම්වල සිසුන් යොමු කරන්න.

නගර දෙකක් හඳුනාගෙන එක් නගරයක සිට අනිත් නගරයට යාමට ඇති මාර්ග මොනවා දැයි හඳුනා ගැනීමට සලස්වන්න.

විශේෂයෙන් තම පාසල පිහිටි ප්‍රධාන නගරයේ සිට තමත් නගරයකට යා හැකි මාර්ග සෙවීම. එමෙන් ම කොළඹ සිට ත්‍රිකුණාමලයට දුම්රියෙන් බස් රථයෙන් හෝ නැවෙන් හෝ යා හැකි ය. විකල්ප ක්‍රම තිබිය හැකි දැයි සිතීමට සිසුන් යොමු කරන්න.

නගර දෙකක් අතර ඇති කෙටිම දුරක් ඇති මාර්ගය සෙවීමට සලස්වන්න.

එම මාර්ගයේ ගමන් කිරීමේ දී අපහසුතාවයක් ඇති වුවහොත් ඒ සඳහා යොදා ගැනීමට හැකි විකල්ප මාර්ගයක් හඳුනා ගැනීමට සලස්වන්න.

## ක්‍රියාකාරකම 7

වාහන ගමන් කිරීම ආශ්‍රිත ක්‍රීඩාවේ සිසුන් යොමු කරන්න.

ක්‍රීඩාව : කෝච්චිය හදමු

- ★ ක්‍රීඩාව සඳහා මීටර. 10 x මීටර 10 පමණ කොටුවක් සලකුණු කරගන්න.
- ★ එක් සිසුවකු කෝච්චියේ පෙට්ටිය ලෙස තෝරා ගන්න.
- ★ අනෙක් සිසුන් නිදහසේ ලකුණු කරන ලද සීමාවේ සිටීමට උපදෙස් දෙන්න.
- ★ ගුරුවරයාගේ විධානයට එන්ජිම දුවගොස් සීමාවේ සිටින සිසුවකුට තට්ටු කළ යුතුය.
- ★ එසේ තට්ටු කළ සිසුවා කෝච්චියේ පෙට්ටියක් සේ එන්ජිමට උරහිසින් අල්ලා එකතු විය යුතුය.
- ★ ඉන්පසු එන්ජිම සහ පෙට්ටිය දුවගොස් පෙට්ටි ගණන වැඩි කර ගත යුතුය.
- ★ අනෙක් සිසුන් සීමාවේ සිටිමින් කෝච්චියට අසු නොවී සිටීමට උත්සාහ ගත යුතුය.
- ★ කෝච්චියට අසු නොවී ඉතිරිව සිටින සිසුවා ජයග්‍රාහකයා වේ.

තවත් මෙවැනි ක්‍රීඩා සැලසුම් කර ඒවායේ නිරත වීමට අවශ්‍ය මග පෙන්වීම් කරන්න.

## ක්‍රියාකාරකම 8

නවීන ගමනාගමන ක්‍රමවල ඇති ප්‍රයෝජන හා ගැටලු හඳුනා ගැනීමට සලස්වන්න.

සිසුන් සමඟ සාකච්ඡා කරමින් අද පවතින නවීන වාහන ගමනාගමන ක්‍රම සහ ඒවායේ ප්‍රයෝජන හා දුර්වලතා පහත සඳහන් ආකාරයේ වගුවක් යටතේ ගොනු කිරීමට සිසුන් යොමු කරන්න.

| ප්‍රබලතා | දුබලතා |
|---|---|
| | |

- ★ දුම්රිය කාල සටහනක් හෝ බස් නැමතුම් පොළක කාල සටහනක් හෝ සපයා ගෙන එවැනි කාල සටහනකට අනුව වැඩ කිරීමේ ප්‍රයෝජන සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ★ එසේ නොකළහොත් ඇති වන ගැටලු පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ★ ගමන් බිමන් යාමේ දී කාල සටහනකට අනුව ක්‍රියා කිරීමේ දී ඇති ප්‍රයෝජන ගවේෂණාත්මක අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න.

## ක්‍රියාකාරකම 9

මහා මාර්ග භාවිත කිරීමේ දී රියදුරන් සහ පදිකයන් යන දෙපිරිසම නීති රීතිවලට අනුකූලව කටයුතු කිරීමේ ඇති වැදගත්කම සාකච්ඡාවක් තුළින් මතු කර ගන්න.

මහා මාර්ග භාවිතයේ දී පදිකයන් හා රියදුරන් වශයෙන් අප අනුගමනය කළ යුතු නීති රීති සහ සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ ව සිසුන් දැනුවත් කිරීම පිණිස පහත සඳහන් ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.

- ★ මහා මාර්ග භාවිතයේ දී පිළිපැදිය යුතු නීති රීති පිළිබඳ ව ප්‍රජාව දැනුවත් කිරීම පිණිස පොලීසිය හා වෙනත් රාජ්‍ය ආයතන මගින් පිළියෙල කර ඇති උපදෙස් පත්‍රිකා පෝස්ටර් වැනි දේවල් රැස් කර ගන්න.
- ★ පාඩම ආරම්භයේ ඒවා සිසුන්ට ප්‍රදර්ශනය කර ඔවුන්ට ඒ පිළිබඳ ව අවධානය යොමු කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ★ ඒවායින් කියවෙන දේවල් පිළිබඳ ව පහත සඳහන් කරුණු මතු වන ආකාරයෙන් සාකච්ඡාවක් ගොඩ නගන්න.

පදිකයින්

පාරේ පයින් ගමන් කිරීමේ දී නිතරම තමාගේ දකුණු අත පැත්තෙන් ගමන් කිරීම.

පාරේ එක් පසක සිට අනෙක් පසට මාරු වීමේ දී පාර මාරුවීමට යොදා ඇති ස්ථාන හරහා පාර මාරුවීම.

එවැනි ස්ථාන නොමැති අවස්ථාවල පාර දෙපස හොඳින් බලා වාහන නොමැති අවස්ථාවල පමණක් පාර මාරුවීම.

රියදුරන්

රියදුරන් සඳහා නීති රීති බොහොමයක් ඇත. නමුත් සිසුන් ඒ පිළිබඳ සංවේදී වීම සඳහා පහත සඳහන් ආකාරයේ නීති රීති කීපයක් පිළිබඳ ව සිසුන්ගේ අවධානය යොමු කරන්න.

අපේ රටේ වාහන පදවන්නේ පාරේ වම් අත පැත්තෙන් බව

වට රවුමක දී නිතරම තමාගේ දකුණු පසින් පැමිණෙන වාහනවලට ඉඩ දී ධාවනය කරනබව

වාහනයක් තවත් වාහනයකට ඉස්සර කිරීමේ දී අනුගමනය කළ යුතු නීති රීති තිබෙන බව

පාරේ ඇති විවිධ සලකුණු කඩඉර, තනි සුදු ඉර, සුදු ඉරි දෙක මේවායින් ප්‍රකාශ වන අදහස් සිසුන් තුළ ඇති කළ යුතු වේ.

විදුලි සංඥා පුවරු ඇති තැන්වල කටයුතු කළ යුතු ආකාරය

පාරේ යන මගින්ගේ ආරක්ෂාව හා පරිස්සම පිළිබඳ ව අවබෝධයක් ඇති ව වාහන ධාවනය කළ යුතු බව

මේවා තුළින් පාරේ වාහන පැදවීම නීති රීති සමුදායක් අනුව කළ යුත්තන් බවත් ඒ තුළින් අනතුරුවලින් තොරව වාහන ධාවනය කළ හැකි බවත් මහා මාර්ගයේ නීති රීතිවලට එකඟව ක්‍රියා කිරීමේ ඇති මහගු ප්‍රයෝජන මතුවන ආකාරයේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

අවස්ථාවන් ලබා ගත හැකි නම් පොලිස් නිලධරයෙක් හෝ වෙනත් එවැනි සම්පත් පුද්ගලයෙක් හෝ පන්තියට ගෙන්වා මාර්ග නීති රීති පිළිබඳ ව සාකච්ඡාවක් කරන්න.

සිසුන්ට මතුවී තිබෙන ගැටලු ඉදිරිපත් කර ඒවා විසඳා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

පහත සඳහන් ආකාරයේ සටහන් මිදුලේ හෝ ඉඩ ඇති ස්ථානයක හෝ සකස් කොට සිසුන් වාහන ලෙසට ක්‍රියාකරන ආකාරයෙන් මාර්ග නීති රීති පිළිබඳ ව අවබෝධයක් ලබා දීමට කටයුතු කරන්න.

පළමුව සිසුන් කිහිපදෙනෙක් ලවා ආදර්ශ කර පසුව සෑම දෙනාට ම අවස්ථාව ලබා දෙන්න.

මාර්ග අනතුරු පිළිබඳ ඇති පුවත්පත් වාර්තා රැස් කොට ඒවා විශ්ලේෂණය කර බොහෝ දෙනා බෙහෙවින් කරන වැරදි හඳුනාගෙන ඒවා නැති කළ යුතු බව අවබෝධ කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

## ක්‍රියාකාරකම් 10

ගමනාගමනය පිළිබඳ ඇති ජනකවි හා ගීත ගායනා කර වින්දනයක් ලබා දීමට අවස්ථාව ලබා දෙන්න.

1. කරත්ත කවි
2. පාරු කවි

දුම්රිය පිළිබඳ ව, බයිසිකල් පිළිබඳ ව ඇති ගීත නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

මෙම ගීතය ගායනයට හා රංගනයට අවස්ථාව දෙන්න. තවත් මෙවැනි ගීත සොයා ගායනයට අවස්ථාව දෙන්න.

*පාන්දරින් ඉස්කෝලෙට ටැන්ටු කරත්තෙන්*
*තොප්පිගොනා ඉස්සරහෙං මං පිටිපන්සෙන්*
*හනිහනිකට උඹ යනකොට//*
*පාර කියන්නෑ තෝනෙන්*
*පාර තියන්නෑ කෙවිටෙන්*
*පුංචිකාලේ නුඹට බොන්න*
*එරිච්ච කිරි බිව්වලු මං*
*වත්ත පහළ උඹේ පිනුම්*
*දැක්කම හිනා හුනාලු මං*
*ලාඩන් නැති උඹෙ පාකුර*
*ගල් කන්දෙදි රිදෙන තරම්*
*උඹේ කඳුළු මං කියද්දි*
*උඹට හොරෙන් අඬනවා මං*
*පාර කියන්නෑ තෝනෙන්*
*පාර තියන්නෑ කෙවිටෙන්*
*ඉස්කොලෙන් ශිල්ප අරං*
*මං ලොකු මිනිහෙක් වෙන්නම්*
*බිව්ව කිරට ඇද්ද බරට*
*කළගුණ මං සලකන්නම්*
*බැරිබර දෙන මේ වියකර*
*නුඹේ කරෙන් ගලවන්නම්*
*උජාරුවට දුව පනින්න*
*ගෙප්පිවැලක් පළඳන්නම්*
*පාර කියන්නෑ තෝනෙන්*
*පාර තියන්නෑ කෙවිටෙන්*
*පාන්දරින් ඉස්කෝලෙට ටැන්ටු කරත්තෙන් ...*

ගායනය - හර්ෂණ දිසානායක
පද රචනය - සෝමරත්න දිසානායක
සංගීතය - සුනිල් දයානන්ද කෝනාර

කණ්ඩායම් වශයෙන් මාර්ග අනතුරු පිළිබඳ ව ප්‍රජාව දැනුවත් කිරීමේ පෝස්ටර් හා අත් පත්‍රිකා නිර්මාණය කිරීමට යොමු කරන්න.

## ක්‍රියාකාරකම 11

පොදු ප්‍රවාහන සේවා භාවිතයේ සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ පන්ති සාකච්ඡාවක් පවත්වා සිසුන් දැනුවත් කිරීමට කටයුතු කරන්න.

උදාහරණ :

තමාගේ වාරය එන තෙක් සිටීම
පොදු වාහන භාවිතයේ දී සැලකිලිමත් ව කටයුතු කිරීම
පොදු වාහනයක ගමන් කිරීමේ දී තිබිය යුතු සංයමය
පොදු වාහනයක ගමන් කිරීමේ දී අන් අයගේ පහසුව පිළිබඳ සැලකිලිමත් වීම
ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් වීම
අවශ්‍ය අවස්ථාවල දී අන් අයට උදවු දීම

# 16 මිනිස් හැසිරීම්

සමාජයක සාමාජිකයන් අතර යහපත් අන්තර් සබඳතා පැවතීමට නම් එකිනෙක කෙරෙහි අනුකම්පා සහගතව කටයුතු කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. අන් අය සේ සිතා සහානුභූතික ව කටයුතු කිරීමට හුරුකම් ඇති, ගැටලුවලට විකල්ප විසඳුම් සෙවීමට උත්සුක වන පුද්ගලයන් සිටින සමාජයක සාමාජිකයන් අතර ප්‍රියමනාප බව හා සමගිය වර්ධනය වීමෙන් යහපත් අන්තර් සබඳතා ඇති වේ. එවන් ශ්‍රී ලාංකික සමාජයක් සඳහා අනාගත පරපුරට අදාළ ඉගෙනුම් අත්දැකීම් ලබා ගනු පිණිස මෙම තේමාව සකස් කර ඇත.

## නිපුණතා

- ★ අවබෝධයෙන් කටයුතු කරමින් අන් අයට සහානුභූතික වෙයි.
- ★ මානව ගරුත්වය සුරැකෙන ලෙසින් සහනශීලී ලෙස ක්‍රියා කරයි.
- ★ සැමවිට ම අන්‍යයන්ට උපකාර කිරීමට ද අවශ්‍ය විටක උපකාර ලබා ගැනීමට ද පෙළඹෙයි.
- ★ වයසින් අඩු සහ වයසින් වැඩි අයගේ චර්යා රටා අවබෝධ කරගෙන ඒ අනුව හැසිරෙයි.
- ★ විකල්ප ජනනය පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.
- ★ ප්‍රියමනාප ලෙස සමගියෙන් ජීවත් වීමේ අගය අවධාරණය වන කවි, ගී, ගායන හා රංගනවල නිරත වෙයි.
- ★ යහපත් මිනිස් චර්යා පිළිබිඹු වන නිර්මාණ කරයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

අන් අයට සහනුභූතික වීම පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමට දී ඉරියව්වල වැදගත්කම අවධාරණය වීමේ ක්‍රියාකාරකම්වල යෙදීමට අවස්ථා සලසන්න.

ක්‍රීඩාව ආරම්භයට පෙර ක්‍රීඩාව සිදුකරන ආකාරය පිළිබඳ ව පැහැදිලි කරයි. ඒ අනුව කණ්ඩායමට නායකයෙක් තෝරා ගන්නා බව පවසයි. නායකයා හඳුනා ගැනීමේ අභියෝගය බාර ගැනීමට කැමති සිසුවෙක් හඳුනා ගනියි. එම සිසුවාට කණ්ඩායම නොපෙනෙන ස්ථානයකට යවයි. කණ්ඩායමේ නායකයා කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ ව ගුරුවරයා උපදෙස් දෙයි.

උදාහරණ :

නායකයා සෙවීම

ගුරුවරයා ද සිසුන් ද කවයක සිටිති. අන් අයට නොදන්වා ගුරුවරයා විසින් නායකයෙක් තෝරා ගැනේ. ගුරුවරයා ක්‍රියාවක් අරඹයි. සියල්ලෝ ම එය අනුගමනය කරති. කලින් ලැබුණ උපදෙස් පරිදි නායකයා ඉරියව්ව වෙනස් කරන්නේ අන් අයට නොදැනෙන පරිද්ය. ගුරුවරයා ද නායකයා අනුව ක්‍රියාව වෙනස් කරයි. මෙසේ නායකයා වරින් වර ඉරියව් වෙනස් කරමින් කරන ක්‍රියා ගුරුවරයා ද අනුගමනය කරයි. ඒ අනුව අන් අය ද වෙනස්

වෙති. වෙනස් වන ඉරියවුව හා ක්‍රියා පිළිබඳ අවධානයෙන් සිට සැඟවුණු නායකයා සෙවිය යුතුය. අන් අයට නොදැනෙන සේ දිගු වේලාවක් ක්‍රීඩාව කරගෙන යාම නායකයාගේ අභියෝගයයි. ඉක්මනින් නායකයා සොයා ගැනීම අන් අයගේ අභියෝගයයි.

වෙනස් වන ඉරියව් පිළිබඳ අවධානය යොමු කෙරෙන ක්‍රීඩා නිර්මාණය කර ඉදිරිපත් කරන්න.

## ක්‍රියාකාරකම 2

අන් අයට සහානුභූතික වීම සඳහා පවත්වා ගත යුතු ඉරියවු පිළිබඳ අවධාරණය සඳහා නිසල එළිමහන් පරිසරයක දී යුගල වශයෙන් පහත දැක්වෙන ආකාරයේ ක්‍රියාකාරකම්වලට සිසුන් යොමු කරන්න.

උදාහරණ :

තමන් වඩාත් සතුටට පත් වූ සිද්ධියක් මෙනෙහි කිරීමට සලස්වන්න.

### පියවර 1

සිසුන් යුගල වශයෙන් මුහුණු නොපෙනෙන පරිදි එකිනෙකාට පිටුපා වාඩි කර තබන්න. එක් සිසුවකුගේ මතකයට ආ සිද්ධිය අනෙක් සිසුවාට කීමට යොමු කරන්න. යුගල එකිනෙක ඈත් කර තබා එක් එක් යුගලයට නිදහසේ කටයුතු කිරීමට අවශ්‍ය පරිසරයක් ඇති කරන්න.

### පියවර 2

යුගලයේ සිසුන්ට මුහුණට මුහුණ ලා වාඩි වීමට සලස්වන්න. පියවර 1 දී ඇහුම්කන්දුන් සිසුවාට මතකයට නැගුණු සිද්ධිය කීමටත්, පියවර 1 දී කතා කළ සිසුවාට ඇහුම්කන් දීමටත්, අවස්ථාව දෙන්න.

### පියවර 3

යුගලයෙන් එක් අයෙක් නැගිට සිටීමට උපදෙස් දෙන්න. එක් අයෙක් නැගිටගත් විට පුද්ගලභාවය මාරු වන බව කියන්න. දැන් වාඩි වී සිටින අය එසේම සිටිය දී නැගී සිටින අය වෙනත් තැනකට තැන් මාරු කිරීමට උපදෙස් දෙන්න.

පියවර 1 හා පියවර 2 දී අදහස් ප්‍රකාශ කිරීමේ දී හා ඇහුම්කන් දීමේ දී අත්දුටු පහසු අපහසු බව ගැන සිසු අදහස් සමඟ සාකච්ඡා කරන්න. ප්‍රශ්න හා පිළිතුරු ක්‍රමය භාවිතයෙන් පහත සඳහන් කරුණු අවධානය වන පරිදි සාකච්ඡාව මෙහෙයවන්න. සිසු අදහස් තුළින් කරුණු අවධාරණය කරන්න.

- විටින් විට පවත්වන ඇසට ඇස සම්බන්ධතාවයේ වැදගත්කම
- ප්‍රියජනක පිළිගන්නා සුළු මුහුණේ ඉරියව් පවත්වා ගැනීම
- අදහස්වලට ආරාධනා කරන සුළු අත්පා හැසිරවීම
- වචන හා ඉරියව් යෝග්‍ය ලෙස හසුරුවමින් අදහස් ප්‍රකාශ කිරීම
- යෝග්‍ය ලෙස වචන ඉරියව් සහ හැඟීම් හුවමාරු වන ආකාරයට මොහොතකට වෙනත් අයකු බවට පත්වීමේ වැදගත්කම

ඉහත ඉගෙනුම් අත්දැකීම් මත පෝස්ටර් චිත්‍ර නිර්මාණය කිරීමට කණ්ඩායම් වශයෙන් අවස්ථා සලසන්න.

සැ.යු. සර්ව සම්පූර්ණ පෝස්ටර් චිත්‍ර නිර්මාණයක් මෙහි දී අපේක්ෂා නොකෙරේ. ලැබූ ඉගෙනුම් අත්දැකීම් මත නිර්මාණාත්මක චින්තනයට යොමු කිරීමත්, රූප මාධ්‍යයෙන් අදහස් ප්‍රකාශනයට ඉඩ සැලසීමත්, තේමාව තුළ සිසුන්ගේ නිර්මාණ එළිදැක්වීමත් අපේක්ෂිතය.

## ක්‍රියාකාරකම 3

අන් අයට සහානුභූති වීමේ දී වචනවලින් අදහස් නිසි පරිදි හුවමාරු වීමේ වැදගත්කම අවධාරණය වීම සඳහා වන ක්‍රියාකාරකම්වලට සිසුන් යොමු කරන්න.

උදාහරණ :

''දොම්පෙට යන පාර කොයිබදෝ'' යන කවි පන්තිය කීමට හා රංගනයට සිසුන් යොමු කරන්න.

| | |
|---|---|
| ආගන්තුකයා | දොම්පෙට යන පාර කොයිබදෝ<br>ගමයෝ මට කියා දෙන්නකෝ |
| ගම මහතා | බතල හොඳට බැසී තියනවා<br>හාරන තුරු ටිකක් ඉන්නවා |

| | |
|---|---|
| ආගන්තුකයා | උඹේ ඉලවු බතල මට එපා<br>දොම්පෙට යන පාර කියනවා<br>දොම්පෙට යන පාර කොයිබදෝ<br>අම්මේ මට කියා දෙන්න කෝ |
| ගම මහගේ | පැදුර හොඳට වියා තියනවා<br>සායම් ටික දමා ඉවර නෑ |
| ආගන්තුකයා | උඹේ ඉලවු පැදුර මට එපා<br>දොම්පෙට යන පාර කියනවා |
| ගම මහගේ | අනේ දුවේ මෙන්න මෙහෙ වරෙන්<br>මේ මිනිහට පැදුර ගැන කියන් |
| ආගන්තුකයා | නුඹවත් දැන් ඉතින් නංගියෝ<br>දොම්පෙට යන පාර කියාපන් |
| ගම දුව | තරුණෙක් අද එනව යයි කියා<br>කපුට කීවෙ ඒ ඔයා තමයි<br>අම්ම අප්ප දෙන්න කැමති නං<br>කසාදයට බොහොම කැමති මං |

මෙම ගායනය හා රංගනවලින් පහසුව එය බිහිරි අය අතර වූ සංවාදයක් ලෙස අවධාරණය කරන්න. බිහිරි බැවින් එකිනෙකාට සවන් දීමට නොහැකි නිසා ඔවුන් අතර මෙවැනි සංවාදයක් වූ බව මතු කරන්න.

| | |
|---|---|
| පළමුවන සිසුවා/ සිසුවිය | ඔයා හමුවෙන තුරු හිටියේ.<br>මේ දවස්වල මම හරි දුකෙන් ඉන්නේ. මගේ අම්මා අසනීපයෙන් රෝහලේ |
| දෙවන සිසුවා/ සිසුවිය | අපේ තාත්තාත් පසුගිය දිනවල රෝහලේ හිටියා. මම හැමදාම අම්මාත් එක්ක බලන්න ගියා |
| පළමුවන සිසුවා/ සිසුවිය | අම්මා රෝහලේ නිසා ගෙදර හරිම පාළුයි. අම්මා ගෙදර නැති නිසා මට හරිම දුකයි |
| දෙවන සිසුවා/ සිසුවිය | තාත්තා රෝහලේ හිටිය දවස්වල තවත් ලෙඩෙක් හිටියා ළඟම ඇඳේ. එයා හැමදාම රෑට නිදියන්නේ නැතිව කෑ ගසනවාලු |

මෙසේ එක් අයෙක් කියන දෙයට සංවේදීව සවන් නොදී, තමන්ගේ අත්දැකීම් කතා කරන අවස්ථා සහිත භූමිකා රංගන ඉදිරිපත් කිරීමට මග පෙන්වන්න.

එවැනි භූමිකා රංගන අවසානයේ සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවන්න. බිහිරි නොවුවත්, බොහෝ විට මෙවැනි අවස්ථාවලදී අනුන්ට සවන් නොදීමෙන් මෙසේ ක්‍රියා කිරීම බිහිරි බව පෙන් වන බව අවධාරණය කරන්න.

උචිත ඉරියව් ඇතිව සංවේදී ව සවන් දීමෙන් අපට අන් අය අවබෝධ කර ගැනීමට අන් අය මෙන් සිතීමට හැකිවන බව මතු කරන්න. එකිනෙකා අතර සංවේදී බවත් ඇති වීම අන් අයට මෙන් සිතීමටත් අන් අය තේරුම් ගැනීමටත් පහසු වන බව අවධාරණය කරන්න.

## ක්‍රියාකාරකම 4

පන්තිය තුළත්, නිවසේ දීත්, මොහොතකට හෝ වෙනත් අයකු වීමේ අගය පිළිබඳ සිත් පහන් කිරීමට අවස්ථා සලසන්න. මේ සඳහා සිසුන්ට වෙහෙස නැති ප්‍රබෝධජනක වේලාවක් තෝරා ගන්න. ළයාන්විත මෘදු හඬකින් පහත දැක්වෙන ලෙස සිසුන් අමතන්න.

උදාහරණ :

"දැන් ඔබ මේ අසුනේ පහසු ලෙස වාඩි වී සිටිනවා. පාද පහසු ලෙස තබා ගන්න. කඳ කෙළින් තබා හිස මදක් ඔසවා සිටින්න. ඔබ සිටින්නේ ඔබට පහසු ඉරියව්වක ගැඹුරු හුස්මක් ඉහළට ගන්න. පහළට හෙළන්න. (කිහිපවරක්) ඔබේ ඇස් සෙමෙන් වැසී යන්නට සලස්වන්න. දැන් මගේ වචනවලට හොඳින් ඇහුම්කන් දෙන්න. මා සමඟ මේ වචන පෙළ සිතින් කියවන්න. මම ඔබ කියන දේ අසන විට ඔබේ වචනවලට හොඳින් කන්දෙමි. ඔබේ මුහුණ, ඔබේ ඇස්, ඔබේ අත්, ඔබ එය කියන හැටි ගැන විමසිල්ලෙන් බලා සිටිමි. ඔබ කියන දේ හොඳින් තේරුම් ගන්නට උත්සාහ කරමි. ඔබ සිතන දේ ඔබ සිතන හැටි තේරුම් ගනිමි. මොහොතකට ඔබ බවට පත්වන්නට උත්සාහ කරමි.

පන්තියේ ක්‍රියාත්මක වන සිත් පහන් කිරීමේවලට මොහොතක් හෝ අනුන් බවට පත් වීම ඇතුළත් කරන්න. අනුන්ගේ අත්දැකීම්, හැඟීම් තමාගේ කර ගැනීමට උත්සාහ කිරීමේ වැදගත්කම පෙන්වා දෙන්න. එමගින් එක් එක් සිසුන්ගේ හැඟීම් තේරුම් ගැනීමේ වැදගත්කම  අවධාරණය කරන්න.

දෙමාපිය හමුවක දී සිසු පෝස්ටර් නිර්මාණ ප්‍රදර්ශනය කරන්න. පන්ති පරිසරයේ අවධාරණය කරන සවන් දීම හා අදහස් ප්‍රකාශ කිරීම පිළිබඳ කරුණු තහවුරු වන ගෙදර දොර පරිසරයක් සඳහා දෙමාපියන් යොමු කරන්න.

## ක්‍රියාකාරකම 5

පන්තියේ සිසුන්ගේ වයසට ආසන්න වයස්වල සිටින දරුවන් අතරෙන් පහත දැක්වෙන අවස්ථාවලට එලැඹි දරුවන් පිළිබඳ අවධානය යොමු කරන්න. පහත සඳහන් අවස්ථාවලට හෝ එවැනි වෙනත් අවස්ථාවලට හෝ එලැඹි දරුවන් පිළිබඳ සිද්ධි ලියා කාඩ්පත් සකස් කර ගන්න.

උදාහරණ :

- ★ ගංවතුර නිසා නිවස කැඩී ගොස් පාසල් හෝ එවැනි පොදු ගොඩනැගිලිවල හෝ තාවකාලික ව නැවතී සිටින දරුවකුගේ කතාව
- ★ පාසල් යා යුතු වයසේ සිටින එහෙත් ගෙදරට ආදායමක් ලබා දීම සඳහා විවිධ රැකියාවල නියුතු දරුවන්ගෙන් කෙනකුගේ කතාව
- ★ නියඟය නිසා වගා පාළු වී ඇති පවුලකින් එන ආහාර හිඟයෙන් පෙළෙන දරුවකුගේ කතාව
- ★ ආදරයෙන් ඇති දැඩි කළ තම සුරතල් සතා මිය යාම නිසා දුක් වන දරුවකුගේ කතාව
- ★ යුද්ධයෙන් පීඩාවට පත් වීම නිසා ගම හැර දා විත් සරණාගත කඳවුරක සිටින පවුලකින් පාසල් එන දරුවකුගේ කතාව
- ★ මව හෝ පියා රෝහල් ගත වී සිටින ඒ පිළිබඳ සිතිවිලි නිසා ඉගෙනීමේ කටයුතුවල යෙදීමට දුෂ්කරතා ඇති දරුවකුගේ කතාව

සැ.යු. පන්තියේ මෙවැනි අවස්ථාවලට එලැඹුණු දරු දැරියන් සිටිය හැකි ය. ඉහත දැක් වූ කාඩ්පත් පිළියෙල කිරීමට පෙර පන්තියේ දරුවන්ගේ පසුබිම පිළිබඳ සොයා බැලීම වැදගත් ය. එවැනි දරුවන් මානසික පීඩාවක් ගෙන දෙන අන්දමේ කාඩ්පත් පන්තියට ඉදිරිපත් කිරීමෙන් වැලකිය යුතුය. පන්තියේ දරුවන්ට පීඩාවක් ඇති නොවන වෙනත් අවස්ථා පිළිබඳ කතා පුවත් ඉදිරිපත් කිරීමෙන් එවැනි තත්ත්ව වළක්වා ගත හැකි ය. එමෙන් ම දරුවන්ගේ වයසට නොසරිලන කරුණු දැක්වෙන සිද්ධි ඇතුළත් කාඩ්පත් ද ඉදිරිපත් කළ යුතු නොවේ.

පිළියෙල කළ කාඩ්පත් සිසුන් හතර දෙනාගේ කණ්ඩායම්වලට එක බැගින් ඉදිරිපත් කරන්න. එක ම කතාව වෙනස් කණ්ඩායම් දෙකකට වුව ද ඉදිරිපත් කළ හැකිය. කාඩ්පත් කියවා සාකච්ඡා කිරීමට මග පෙන්වන්න. ඔබ ඒ දරුවා නම් ඔබ එය අන් අයට කියන්නේ කෙසේද?

එකිනෙකා කාඩ්පතේ දැක්වෙන දරුවා සේ අදහස් දැක්වීමට අවස්ථා සලසන්න. අදහස් දක්වමින් කළ හැකි උදවු කිහිපයක් පිළිබඳ ව එකඟ වීමට යොමු කරන්න.

මෙසේ සහානුභූතික විය යුතු දරුවන්ට උදවු වීමට පන්තියේ සිසුන්ට කළ හැකි දෑ විමසා කළුලෑල්ලේ පෙළ ගස්වන්න.

උදාහරණ :

- ★ එවැනි දරුවන්ගේ එදිනෙදා තොරතුරු ගැටලු විමසීම.
- ★ දිවා ආහාරය ගෙන යාම.
- ★ විදේශ ගත වූ මවුපියන් එවූ ලිපිවල තොරතුරු විමසීම.
- ★ මිය ගිය සිය සුරතලා ගැන කියූ දේ ඇතුළත් කර සෑදූ කවි සහිත සැමරුම් පතක් නිර්මාණය කරදීම.
- ★ කියන ලද අවංක තොරතුරු පිළිබඳ ස්තුති කිරීම.
- ★ ඇඳුම් පැළඳුම් සැපයීම.
- ★ පාසල් ද්‍රව්‍ය සැපයීම

සිසුන්ගෙන් ප්‍රශ්න අසා සිසුන් දෙන පිළිතුරු ඇසුරු කරගෙන අදාළ අදහස් මතු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

අප හැමට ම උදවු කළ යුත්තේ සමාන අයකු ලෙසය. ඔබ සිතන්නේ කොහොමද? චින්තනයට ඉඩ සලසන්න.

සැමට සමාන ලෙස සැලකීම. සැමගේ ම අයිතීන් ආරක්ෂා වන ලෙස අපේ යුතුකම් ඉටු කිරීම ප්‍රජාතන්ත්‍රීය ගුණාංගයන් බව සරල ව පැහැදිලි කරන්න.

සහානුභූතික ව අනුන් මෙන් සිතන විට සමාන ලෙස සලකා කටයුතු කිරීමට පහසු වන බව අවධාරණය කරන්න.

තමන්ගේ ගැටලු අඩු පාඩුකම් දස්කම් අවංකව හෙළි කළ හැකි මිතුරු මිතුරියන් සිටින වාතාවරණයක අන් අය මෙන් සිතා කටයුතු කළ හැකි බව

එමගින් තමාගේ ම සුරක්ෂිතභාවය තහවුරු වන බව

ඒ නිසා ම ප්‍රීතිමත් පරිසරයක් ඇති වන බව

''අපට ඇති ගැටලු සිත්වේදනා විශ්වාසදායක අයකුට කිව යුතුමයි'' යන්න පිළිබඳ චින්තනයට ඉඩ දෙන්න. සාකච්ඡා කරන්න.

තමන් විනිවිද දැකීමට අනුන්ට ඉඩ සැලසීම මගින් ප්‍රියජනක වාතාවරණයක් ඇති වන බවත්, එකිනෙකාට උදවු වන පරිසරයක් සඳහා එය පහසුවක් වන බවත් අවධාරණය කරන්න.

## ක්‍රියාකාරකම 6

මෙම ක්‍රියාකාරකමට පෙර හතරවන ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ මිනිස් හැසිරීම් තේමාව අධ්‍යයනය කරන්න. එහි සහනශීලි චර්යාව සහිත කොටස් පිළිබඳ විශේෂ අවධානය යොමු කරන්න. ආක්‍රමණශීලි සහ යටහත් චර්යා යන අන්තවලින් බැහැර ව සහනශීලී චර්යාවට හුරුවීමේ වැදගත්කම පිළිබඳ යහපත් ආකල්ප ඇතිව මෙම ක්‍රියාකාරකම මෙහෙයවන්න.

සහනශීලී චර්යා තහවුරු කිරීම සඳහා පහත දැක්වෙන ආකාරයේ ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න. පන්තියේ හය දෙනා බැගින් සිසුන් අහඹු ලෙස තෝරා ගෙන පිළිතුරු අනුව ලකුණු දෙන්න. අනෙක් සිසුන්ට බලා සිටිමට ඉඩ දෙන්න. දෙපිලටම නොහැකි වූ ප්‍රශ්න අසා සිටින සිසුන්ට යොමු කළ හැකිය. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන අවසානයේ ලකුණු දුන් ආකාරය පෙන්වා දෙමින් සහනශීලි චර්යාව අගය කරන්න.

උදාහරණ :

(1) පාසල ඇරී ගෙදර යන අතර වැඩිහිටි-යන්ට නොදන්වා ජලාශයකට ගොස් පිහිනා නෑමට ඔබේ හොඳම මිතුරා ඔබට යෝජනා කරයි. ඔබ කරන්නේ කුමක් ද?

1. ගෙදරට නොදන්වා අයුතු දෙයක් යෝජනා කිරීම ගැන මිතුරාට බැන වැදී ප්‍රතික්ෂේප කිරීම.
2. මිතුරාට එකඟ වී ජලාශයට යාම සහ විනෝදයෙන් පිහිනමින් දිය නෑම.
3. මිතුරා අමතා ''ඔබ සමඟ මම යන්නේ කොහොමද? මොකද, මම ගෙදරට නොදන්වා යන්නේ නැහැ. මම කැමතියි, ඔබත් ගෙදර යනවා නම් කියා ප්‍රතික්ෂේප කිරීම.

(2) ඔබ කඩේට ගොස් ඔබේ වාරය එනතුරු බඩු ගැනීමට බලා සිටියි. මුදලාලි ඔබට කලින් පැමිණි කෙනකුට දැන් බඩු නිකුත් කරයි. ඔබට පසු පසින් පැමිණි ළමයෙක් ඔබ ඉදිරියට විත් ඔබට කලින් බඩු ගැනීමට තැත් කරයි.

1. බොහෝ වේලාවක් බලා සිටි, ඔබට කලින්, පසුව පැමිණි අය බඩු ලබා ගැනීමට උත්සාහ කිරීම ගැන කෝප වී බැන වැදීම.
2. එම ළමයාට බඩු ගැනීමට දී පසු පසට වීම.
3. ''ඔබ මට කලින් පෝලිමේ සිට ගැනීම ගැන කණගාටුයි. මම දැන් මෙතනට වෙලා හුඟක් වෙලා. මම කැමතියි ඔබ පෝලිමේ හරි තැනට යනවා නම්'' කියා කීම.

පාසල් ගෙවත්ත සකස් කරන ස්ථානයේ තෝරා ගැනීම සඳහා ගුරුතුමිය කතා බහක යෙදෙයි. පන්තියේ සිසුන් බොහෝ දෙනෙක් එක් ස්ථානයකට කැමතිය. එහෙත් එතන නුසුදුසු බවත් පාසල් නොපැවැත්වෙන දිනවල එතැන පවත්වාගෙන යාම ගෙවත්තට හානි වීමට වැඩි ඉඩකඩක් ඇති බවත් ඔබේ මතයයි. ඔබ කරන්නේ කුමක් ද?

1. නිවාඩු දිනවල දී සිදුවිය හැකි හානි දක්වමින් වැඩි දෙනාගේ තීරණය තදින් විවේචනය කිරීම. එතැන ගෙවත්ත හදන්නේ නම් ඔබ කිසි විටෙක ඒ වැඩවලට සහාය නොදෙන බව තදින් කීම.
2. වැඩි දෙනකු කැමති නිසා ඔබේ අදහස යටපත් කරගෙන වැඩිදෙනාගේ කැමැත්තට එකඟ වීම.
3. ''ඔබ වැඩි දෙනාගේ තීරණයට මට එකඟ වන්නට අපහසුයි. මොකද කිව්වොත් එතැන ගෙවත්තට නිවාඩු වෙලාවට සත්තු එන්න තිබෙන ඉඩකඩ වැඩියි. මම නම් කියන්නේ ගෙවත්ත හදන්න හොඳම තැන අර අඹ ගහට එහා පැත්තයි.

මේ අන්දමට අංක 1 සඳහන් ආක්‍රමණශීලී ප්‍රතිචාරවලට ලකුණු 0ක් ද, අංක 2 යටහත් වන ප්‍රතිචාරවලට ලකුණු 0ක් ද, අංක 3 සහනශීලී ප්‍රතිචාරවලට ලකුණු 1ක් ද දෙන්න.
මේ අන්දමට සහනශීලී අදහස් දැක්වීම අගය කරමින් සහනශීලී චර්යාව උත්සාහයේ පුරුදු පුහුණු වීම සඳහා පහත දැක්වෙන පිළිවෙළ අවධාරණය කරන්න.

| | |
|---|---|
| ඔබේ අදහස් කිසිවකුගේ සිත් නොරිදෙන ලෙස කියන්න. | මට නම් ගෙදරට නොකියා ජලාශයට යන්න එන්න නම් බැහැ |
| හේතුව කියන්න. එය ඔබට බලපාන ආකාරය කියන්න. | මම ගෙදරට නොකියා කොහේවත් යන්නේ නැහැ. |
| අවශ්‍ය නම් අවධාරණය කරන්න. | ගෙදර අය මට කොයිතරම් ආදරේද |
| ඔබේ යෝජනාව ඉදිරිපත් කරන්න. | මම නම් කැමතියි ඔයත් ඔය අනතුරුදායක දේ නොකර ඉන්නවා නම් |

මෙසේ දරුවන්ගේ බසින් සහනශීලී ප්‍රකාශන අවධාරණය කරන්න.
තම අදහස නොකියා නොසිට කියන්නට, අනතුරුදායක, අයුතු යෝජනා ප්‍රතික්ෂේප කරන්නට, එකඟ නොවන අවස්ථාවල තමන්ගේ මතය දක්වන්නට සහනශීලී ප්‍රකාශන අවශ්‍ය බවත් කියන්න. එයත් ආවේගශීලී ව අනුන් තලා පෙලා හැසිරීමත් හා තමාගේ හිතට එකඟ නොවී අනුන්ට උවමනා ලෙස හැසිරීමත් මේ නිසා වළකින බවත් අවධාරණය කරන්න.

## ක්‍රියාකාරකම 7

සහනශීලී චර්යාව අවධාරණය වන සිසුන්ගේ එදිනෙදා ජීවිතයට සම්බන්ධ අවස්ථා උපයෝගී කරගෙන භූමිකා රංගන කිහිපයක් සැලසුම් කර දරුවන් ඒ රංගනවල යොදවන්න.

## ක්‍රියාකාරකම 8

සිසු සිසුවියන්ට තීරණ ගැනීම සඳහා මග පෙන්විය හැකි පන්තියේ කටයුතු පිළිබඳ ව අවධානය යොමු කරන්න. මෙතෙක් සාම්ප්‍රදායිකව සිදු වූ එවැනි කටයුතු සිසු තීරණවලට මග පෙන්වීම සඳහා චින්තනයට යොමු කෙරෙන ගැටලු ලෙස ඔබේ සිතේ පෙළ ගස්වන්න.

උදාහරණ :

පන්තිය පිරිසිදු කර ගැනීම සඳහා සකස් කර ගත හැකි හොඳම වැඩ පිළිවෙළ කුමක් ද?
පන්ති නායකත්ව සඳහා සිසුන් තෝරා ගැනීමටත්, ඒ සඳහා අවස්ථා ලබා දීමටත්, වඩා ම සුදුසු පිළිවෙළ කුමක් ද?
පන්තියේ දරුවන් විසින් පාසල් වත්තේ ගොඩ නගන ලද විවිධ නිර්මාණ, මල් පාත්ති, එළවලු පාත්ති රැක ගැනීමට නිවාඩු කාලයේ සකස් කර ගත යුතු වැඩ පිළිවෙළ කුමන ආකාරයක විය යුතු ද?
පාසලේ ගෙවත්ත පිළියෙල කර නඩත්තු කරගෙන යාම සඳහා සුදුසු ම වැඩ පිළිවෙළ කුමක් ද?
ගෙදර දොරේ විවිධ ප්‍රශ්න නිසා පීඩනයට පත් පන්තියේ දරුවන්ට සහනදායක වාතාවරණයක් සඳහා අනෙක් දරුවන්ට දායක විය හැක්කේ කෙලෙස ද?

ඔබේ දරුවන් භාවිත කරන භාෂාව මනා ලෙස අවබෝධ කර ගන්න. ඔබේ සිතේ පෙළ ගැස් වූ සිසුන් චින්තනයට යොමු කෙරෙන ගැටලු සිසුන්ට උචිත බසින් ඉදිරිපත් කරන්න. ඔබේ බස් වහර ඔවුන්ගේ චින්තනයට බාධා නොවන ලෙස හැසිරවීම කෙරෙහි සැලකිලිමත් වන්න.

එවැනි ගැටලුවක් සඳහා සිසුන්ගේ විකල්ප විසඳුම් පෙළගස්වන්න. එක් එක් විකල්ප යෝජනා කිරීමට හේතු වූ කරුණු ප්‍රකාශ කිරීමටත් ඒවාට සංයමයෙන් සවන් දීමටත් හුරු කරන්න.

උදාහරණ :

පන්තිය පිරිසිදු කර ගැනීම සඳහා වූ වැඩ සටහන

විකල්ප 1.
2.
3.
4.
5.

එවැනි එක් එක් විකල්පය තමන්ගේ යහපත හා අයහපතට, අනුන්ගේ යහපත හා අයහපතට හේතු වන ආකාරය පිළිබඳ සාකච්ඡාවට සිසුන් යොමු කරන්න. ඒ අනුව තමන්ටත්, අනුන්ටත් යහපතක් ම සිදු වන වඩාත් ම ඵලදායී තීරණ ගැනීමට මග පෙන්වන්න. (එහෙත් ගුරුවරයාගේ තීරණයට දරුවන් යොමු කිරීම අපේක්ෂා නොකෙරේ. දරුවන්ට ඵලදායී තීරණයකට මග පෙන්වීම පමණක් අපේක්ෂා කෙරේ.)

මෙම ක්‍රියාකාරකමෙන් පසු පහත සඳහන් ගුණාංග අවධාරණය වන පරිදි සාකච්ඡාවකට යොමු කරන්න. මෙම අදහස් අවධාරණය කෙරෙන සාකච්ඡාව ද සිසුන්ට හුරු පුරුදු වාග්මාලාවෙන් යුතුව මෙහෙය විය යුතුය. එසේ නොමැතිව පහත දැක්වෙන දේ වරක් කියවීම හෝ ලියා ගැනීම අපේක්ෂා නොකෙරේ. තේමාවෙන් පසු යහපත් ආකල්පවලට නිරතුරුව මුසු වීමට යොමු කෙරෙන සාකච්ඡාවක් අපේක්ෂිතය.

- ★ ගැටලු පිළිබඳ සංවාදයක තම අදහස් ප්‍රියමනාප ලෙස ඉදිරිපත් කිරීමට යොමු වීම.
  - ගැටලුව සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන විවිධ අදහස්වලට සංයමයෙන් යුතුව සවන් දීමට හුරු වීම.
  - ගැටලුව පිළිබඳ තම අදහස් සංවාදයට සහභාගි වන අන්‍යයන්ට ප්‍රියමනාප ලෙස ඉදිරිපත් කිරීම.
- ★ ගැටලුවකට විසඳුම් ලෙස විකල්ප රැසක් සෙවීමට යොමු වීම.
  - ඉදිරිපත් කරනු ලබන ගැටලුවක විවිධ පැතිකඩ සොයා බැලීම.
  - ගැටලුවක් විසඳීමෙහි ලා යොමු වන විකල්ප කිහිපයක් පිළිබඳ ව විමසිලිමත් වීම.
- ★ අවධාරණය විය යුතු කරුණු
  - තීරණ ගැනීමට පෙර ගැටලුව ගැන ගැඹුරින් සිතා බැලිය යුතුය.
  - එක් ගැටලුවක් සඳහා විකල්ප විසඳුම් කිහිපයක් තිබිය හැක.
  - වැඩි විකල්ප ගණනක් පිළිබඳ ව සිතා බැලිය හැක්කේ ගැටලුවේ සෑම පැත්තකම විමසා බැලීමෙනි.
- ★ එක් එක් විකල්ප තමන්ට යහපත් හා අයහපත් වන සැටි ද අනුන්ට යහපත් හා අයහපත් වන සැටි ද විමසා බැලීම මැදිහත් ව තීරණ ගැනීමට උපකාරී වේ.
- ★ තෝරා ගනු ලබන තීරණය එම ගැටලුව සම්බන්ධයෙන් ගත හැකි හොඳම තීරණය විය යුතුය.

## ක්‍රියාකාරකම 9

පහත සඳහන් අදහස් අවධාරණය වන කවි, ගීවලට සවන් දී ගායනයට හා රංගනයට අවස්ථා සලසන්න.

- අන් අයට සහානුභූතික වීම.
- ප්‍රියමනාප ලෙස හැසිරීම.
- ආවේගශීලී නොවී තම අදහස් ඉදිරිපත් කිරීම.
- සමගියෙන් ජීවත් වීම අවශ්‍යය

උදාහරණ :

*පුංචි සිතේ පුංචි සිනා*
*වෙල් ඉපනැල්ලේ*
*රංචු ගැසී හාද වෙලා*
*මල් හසරැල්ලේ*
*පුංචි දෙයට කතාවෙලා*
*රණ්ඩු වෙලා වෛරබැඳන්*
*කතා නොමැති ගෙවල් තුනක*
*දූල පුතාලා*

*අම්මලාට හොරෙන් ඇවිත්*
*සෙනේ සිතින් යාළු වෙලා*
*පුංචි පැටව් එක පවුලකි*
*වෙල් ඉපනැල්ලේ*
*දෙමාපියන් කතා නැතිව*
*වෛරවුනත් ඒ වාගේ*
*පුංචි සිතේ වස විස නෑ*
*ලොකු සිත් වාගේ*
*මල් වාගේ දුවේ පුතේ*
*ලොකු අයටත් හඬගාලා*
*ජීවිතයේ කතන්දරේ කියා දියන්නේ*
රචනය - කුලරත්න සී. ආරියවංශ

රංගන සඳහා ඉහත දැක් වූ අදහස් අවධාරණය වන වින්දනාත්මක රංගන ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න. ගායන හා රංගනවලින් පසු ව ඉහත දැක් වූ අදහස් අවධාරණය කරමින් ප්‍රියමනාප ලෙස සමගියෙන් කටයුතු කිරීමේ අගය අවධාරණය කරන්න.

## ක්‍රියාකාරකම 10

පන්තියේ සිසුන් සමඟ ඔවුන් එකිනෙකාගේ හැකියා ගැන කතා කරන්න. සෑම අයකුටම කුමක් හෝ හැකියාවක් ඇති බව අවධාරණය කරන්න.
සිසුන් යුගලය බැගින් වාඩි වීමට සලස්වන්න. එක් එක් සිසුවා තමන්ගේ හැකියා හා දක්ෂතා ගැන යුගලයේ අනෙක් සිසුන්ට කියන්නට සලස්වන්න. මෙසේ කියන විට අසා සිටින සිසුවාට ද අනෙක් සිසුවාගේ දස්කම් හැකියා යහගුණ ඉදිරිපත් කළ හැකිය.

උදාහරණ :

පළමු සිසුවා   මට චිත්‍ර අඳින්නට පුළුවන් සතුන්ට මම ආදරෙයි

දෙවන සිසුවා   ඇයි ඔයා හැමෝටම උදවු කරන කෙනෙක්

යුගල හතරක් බැගින් එකතු වී කණ්ඩායම් වීමට යොමු කරන්න. තමා සමඟ යුගලයේ සිටි සිසුවාගේ හැකියා කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සිසුන්ට මග පෙන්වන්න. මෙසේ සෑම සිසුවෙක් ම අනෙක් සිසුන්ගේ යහගුණ, හැකියා දක්ෂතා කණ්ඩායමට ඉදිරිපත් කළ යුතුයි.
කණ්ඩායමේ සිටින සිසුන්ගේ යහගුණ, දක්ෂතා, හැකියා ලැයිස්තුවක් සකස් කිරීමට කණ්ඩායම්වලට මග පෙන්වන්න. එම ලැයිස්තුවෙන් වැදගත්ම හැකියා, යහගුණ, දස්කම් ලැයිස්තුවක් තෝරාගෙන ''අපෙන් ඔබට'' යනුවෙන් නම් වූ පෝස්ටරයක් නිර්මාණය කිරීමට යොමු කරන්න.

## පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් තොරතුරු වාර්තා කිරීමේ පත්‍රිකාව - පස්වන ශ්‍රේණිය

තක්සේරු කිරීමේ පරිමාණය

සාර්ථක ව කරයි ✓

දුෂ්කරතා පෙන්නුම් කරයි/ තව දුරටත් උදවු අවශ්‍යයි •

| නිපුණතා මට්ටම් | මාතෘකාව |
|---|---|
| සිසුන්ගේ නම් | |
| 1 . සමාජයේ යහපැවැත්මට තුඩු දෙන යුතුකම්, අයිතිවාසිකම් හා වගකීම් කෙරෙහි සංවේදී ව ප්‍රතිචාර දක්වයි.<br>2 . නීති ගරුකව හැසිරෙයි. | අපේ යහපැවැත්ම |
| 3 . සතුන් කිහිප දෙනකුගේ සුවිශේෂ හැකියා ප්‍රකාශ කරයි.<br>4 . සතුන්ගේ පැවැත්ම ගැන තමාට කළ හැකි දේ විස්තර කරයි.<br>5 . සතුන්ගෙන් මිනිසා ලබන ප්‍රයෝජන පැහැදිලි කරයි.<br>6 . සත්ත්ව හඬෙහි විවිධත්වයෙහි විචිත්‍රත්වය අගය කරයි. | අප අවට සතුන් |
| 7 . ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම ප්‍රකාශ කරයි.<br>8 . භූමිය සුන්දරත්වය රැක ගැනීමට දායක වෙයි.<br>9 . අහස නිරීක්ෂණය තුළින් හඳුනා ගන්නා ලක්ෂණ කිහිපයක් ප්‍රකාශ කරයි.<br>10.පසෙහි විවිධත්වය පරීක්ෂණාත්මක ව ඉදිරිපත් කරයි. | පොළොව හා අහස |
| 11.සුළඟේ ක්‍රියාකාරිත්ව පිළිබඳ ව තම අත්දැකීම් කිහිපයක් ප්‍රකාශ කරයි.<br>12.එදිනෙදා කටයුතුවල දී භාණ්ඩ හා සේවා කාර්යක්ෂම හා ඵලදායීව පරිභණය කරයි.<br>13.භාණ්ඩ මිල දී ගැනීමේ දී මෙන් ම භාණ්ඩ පරිහරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා දැයි ප්‍රකාශ කරයි. | අප හා වෙළෙඳ පොළ |
| 14.ගස්වැල්වලින් මිනිසා ලබන ප්‍රයෝජන විස්තර කරයි.<br>15.ගස්වැල්වල පැවැත්ම සඳහා තම දායකත්වය කෙබඳු දැයි විස්තර කරයි.<br>16.අවට පරිසරයේ පැළෑටි හා ගස්වැල්වල විවිධත්වය අගය කරමින් ඒවා පවත්ව ගැනීමට දායක වෙයි. | පැළෑටි හා ගස්වැල් |
| 17.ජලය අරපිරිමැස්මෙන් යුතු ව භාවිත කරයි.<br>18.ප්‍රමාණවත් ලෙස ජලය පරිභෝජනය කරයි.<br>19.ජල දූෂණය වලක්වා ගත හැකි අයුරු විස්තර කරයි.<br>20.ජලයෙන් ක්‍රියාත්මක කළ හැකි උපකරණ ආකෘති සකස් කරයි. | ජලය |
| 21.බෝග වගා කිරීමෙන් තමන් ලද අත්දැකීමක් ප්‍රකාශ කරයි.<br>22.බෝග වගා කිරීමේ විකල්ප ක්‍රම කිහිපයක් විස්තර කරයි. | ගෙවත්ත |
| 23.ස්වභාවික මෙන් ම සිදුවන හදිසි අනතුරු මොනවා දැයි ප්‍රකාශ කරයි.<br>24.හදිසි අනතුරක දී කටයුතු කළ යුතු ආකාරය පැහැදිලි කරයි. | ආරක්ෂාව හා පරිස්සම |
| 25.රටේ දියුණුවට සේවයක් කළ රජවරු කිහිප දෙනකු හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>26.ඓතිහාසික වටිනාකමකින් යුතු ස්ථානයක් පිළිබඳ තොරතුරු වාර්තා කරයි.<br>27.ඓතිහාසික වටිනාකමකින් යුතු ස්ථාන සංරක්ෂණයට දායක විය හැකි ආකාරය විස්තර කරයි. | අපේ අතීත විත්ති |
| 28.සාමූහික ව කළ යුතු කාර්යයන් සැලසුම් කිරීමේ සිට සාර්ථක ව නිමවන තෙක් දායක වෙයි.<br>29.වැඩ පහසු කර ගැනීම සඳහා එදිනෙදා වැඩ කටයුතුවල දී උචිත ක්‍රම භාවිත කරයි.<br>30.වැඩ පහසු කර ගැනීම සඳහා යොදා ගත හැකි සරල උපකරණයක් සකස් කරයි. | වැඩ පහසු කිරීමේ මං |
| 31.සියලු ම ජන කොටස්වල අනන්‍යතාවට ගරු කරමින් සහයෝගී ව කටයුතු කරයි.<br>32.රටේ නිදහස වෙනුවෙන් සහ රටේ කීර්තිනාමය නැංවීමට ක්‍රියාකළ චරිතවල කැපීපෙනෙන ලක්ෂණ කිහිපයක් ප්‍රකාශ කරයි. | අපි ලක්වැසියෝ |
| 33.චර්යාවේ ප්‍රතිජනනාත්මක වෙනසක් සඳහා තම චර්යා නිසි අයුරින් පවත්වා ගනියි.<br>34.තමාගේ මෙන් ම අන් අයගේ අධ්‍යාපනික කටයුතුවලට මෙන් ම වෙනත් උදවු අවශ්‍ය අවස්ථාවල දී උදවු කිරීමට ඉදිරිපත් වෙයි.<br>35.පාසලේ පරිසරයේ සෞන්දර්යාත්මක ව පවත්වාගෙන යාමට දායක වෙයි. | අපට කළ හැකි වෙනස්කම් |
| 36.තොරතුරු ලබා ගැනීමේ හා ඉදිරිපත් කිරීමේ ක්‍රම උචිත අයුරින් භාවිත කරයි.<br>37.ලැබෙන තොරතුරු විශ්ලේෂණය කර උචිත තොරතුරු තෝරා ගනියි. | මිනිසා හා තොරතුරු |
| 38.තමාගේ දායකත්වයෙන් නිපදවන ආහාර බෝග තම ආහාර වේලකට එකතු කර ගනියි.<br>39.වයසට සරිලන උස හා බර පවත්වා ගනියි.<br>40.ආහාර පිළිගැන්වීමේ සහ ආහාර ගැනීමේ නිවැරදි පිළිවෙත් අනුගමනය කරයි. | අපේ ආහාර |
| 41. අතීත හා වර්තමාන ගමනාගමන ක්‍රමවල දක්නට ලැබෙන සුවිශේෂතා විස්තර කරයි.<br>42. එදිනෙදා කටයුතුවල දී යාන්ත්‍රික ශක්තිය උපයෝගී කර ගන්නා අවස්ථාවන් විස්තර කරයි.<br>43. මාර්ග භාවිතයේ දී පිළිපැදිය යුතු නීති රීති ආචාර ධර්ම පිළිබඳ ව සැලකිලිමත් ව කටයුතු කරයි. | ගමනාගමනය |
| 44. අන් අයගේ ගරුත්වය සුරැකෙන අයුරින් සහනශීලී ලෙස ක්‍රියා කරයි.<br>45. විකල්ප විසඳුම් ජනනය පිළිබඳ ව සැලකිලිමත් ව කටයුතු කරයි. | මිනිස් හැසිරීම් |

# ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි

## හැඳින්වීම

පළමුවන සහ දෙවන ප්‍රධාන අවධියේ දී ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි භාවිත කිරීම පිළිබඳ ව සරල අත්දැකීම් ලබා ඇති සිසුන් තව දුරටත් ඒ ඔස්සේ යොමු කරමින් සන්නිවේදනය සඳහා ඉංග්‍රීසි භාෂාව යොදා ගන්නා ආකාරය පිළිබඳ අත්දැකීම් ලබා දීම තුන්වන ප්‍රධාන අවධියෙහි දී ද අපේක්ෂා කෙරේ. පළමුවන හා දෙවන ශ්‍රේණිවල දී තනි වචන, වචන යුගල, විධාන, ආශීර්වාද, වාක්‍යාංශ හා ඉතා කෙටි වාක්‍ය භාවිතයට හුරු වූ ඔවුහු තුන්වන, හතරවන සහ පස්වන ශ්‍රේණිවල දී ඉංග්‍රීසි වාක්‍ය භාවිත කරන හා තේරුම් ගන්නා ආකාරය පිළිබඳ ව වැඩිදුරටත් හුරුවක් ලබති.

මෙම කාර්යය පළමුවන හා දෙවන ශ්‍රේණිවල දී කරන ලද ක්‍රියාකාරකම්වලට වඩා තරමක් සංකීර්ණ ක්‍රියාවලියක් බව පෙනී යයි. මේ අවධිය වන විට තුන්වන ශ්‍රේණියේ සිට ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයකු පැමිණ ක්‍රමවත් ව ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමට පටන් ගෙන ඇත.

තුන්වන ශ්‍රේණියේ පටන්, ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි වැඩසටහන ක්‍රියාත්මක වන්නේ, ඉංග්‍රීසි භාෂාව විෂය නිර්දේශයකට අනුව ඉගැන්වීමට සමගාමීවය. මේ නිසා ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි වැඩසටහන සඳහා ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයාගේ සහාය වඩාත් පුළුල් ව ලබා ගැනීමේ අවශ්‍යතාවක් පන්තිය භාර ගුරුවරයාට ඇති වනු ඇත. එනිසා ගුරුවරුන් දෙදෙනා අතර ඇති වන අන්‍යෝන්‍ය අවබෝධය සහ සහයෝගය මත මෙම වැඩසටහනෙහි සාර්ථකත්වය රඳා පවතී.

තනි සරල වාක්‍ය වශයෙන් අසන්නට ලැබෙන ඉංග්‍රීසි තේරුම් ගැනීමටත්, ඒ ආකාරයට ම තම අදහස් සරල ඉංග්‍රීසි වාක්‍යවලින් ප්‍රකාශ කිරීමටත් හැකියාව සිසුන්ට ලබා දීම මෙම අවධියේ දී අපේක්ෂා කෙරේ.

මේ සඳහා අවස්ථා තුනක දී සිදු කරනු ලබන ක්‍රියාකාරකම් යොදා ගත යුතු වේ.

1. පන්තියට පැමිණෙන ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයා විසින් ඉංග්‍රීසි භාෂාව සඳහා වෙන් කොට ඇති කාල පරිච්ඡේදවල දී විෂය නිර්දේශයට අනුව ඉංග්‍රීසි භාෂාව උගන්වනු ලැබේ.
2. පළමුවන හා දෙවන ප්‍රධාන අවධියේ දී මෙන් ම පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් හා ගණිත විෂයට අදාළ කාලය හා විවේක කාලය ප්‍රයෝජනයට ගනිමින් පන්තිය භාර ගුරුවරයා විසින් සිසුන්ට ඉංග්‍රීසි කතා කරන්නටත්, අසන්නටත් අවස්ථාව ලබා දෙයි.
3. මේ සියල්ලට ම අමතර ව සිසුන්, පන්තිය භාර ගුරුවරයා සහ ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයා සහභාගී වෙමින් සතියකට වරක් පවත්වනු ලබන සංවාද වැඩසටහන තුන්වන ශ්‍රේණියේ සිට හඳුන්වා දෙනු ලැබූ අලුත් අංගයකි.

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් පාඩම ආශ්‍රයෙන් ගොඩනගා ගනු ලබන ක්‍රියාකාරකමක් මත සංවාදය පැවැත්වේ. සම්පූර්ණයෙන් ඉංග්‍රීසි භාෂාව භාවිත කරමින් ද, ක්‍රියාකාරකම් හා විනෝදජනක ක්‍රීඩා යොදා ගනිමින් ද මෙම අංගය ගොඩ නැගිය යුතුවේ. මේ සඳහා සතියකට වරක් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයට අයත් කාල පරිච්ඡේදවලින් එකක් වෙන් කර ගත යුතුවේ.


ඉහත සඳහන් සංවාද වැඩසටහන සඳහා තෝරා ගන්නා කාල පරිච්ඡේදය පන්තිය භාර ගුරුවරයාටත් ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයාටත් එක විට සහභාගී විය හැකි එකක් විය යුතු ය. කාල සටහන් පිළියෙල කිරීමේ දී විදුහල්පතිවරයාගේ විශේෂ අවධානය මේ සඳහා යොමු විය යුතුය.

මෙම වැඩසටහනේ දී ලිවීම, කියවීම, පාඩම් කරවීම ආදිය නොකළ යුතුය. ඒ වෙනුවට කිසියම් ක්‍රියාකාරකමක් ආශ්‍රයෙන් ශිෂ්‍යයන් හා ගුරුවරුන් දෙදෙනා අතර සරල සංවාද ගොඩ නැගිය යුතුය. එක වාක්‍යයක් කිහිපවරක් පුනරුච්චාරණය කරවීම මගින් සිසුන්ගේ හැකියා තහවුරු කරවන පරිදි සංවාද සැලසුම් කිරීම ඉතා වැදගත්ය. මෙහි අන්තර්ගත වන වචන සහ වාක්‍ය ඛණ්ඩ සියල්ලක් ම භාවිත කිරීම අවශ්‍ය නොවේ. සුදුසු අවස්ථාවන්හි දී අදාළ වචන හා වාක්‍ය කාණ්ඩ යොදා ගැනීමට නිදහස ඇත.

මෙහි දී යොදා ගන්නා වාංමාලාව, පස්වන ශ්‍රේණියේ සිසුන්ට තේරුම් ගත හැකි පරිදි හා කතා බහ කළ හැකි පරිදි සරල වචන තෝරාගෙන සකස් කර ගත යුතුවේ. පළමුවන, දෙවන, තුන්වන හා හතරවන ශ්‍රේණි ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල අඩංගු ඉංග්‍රීසි වාක්‍යාංශ, වාක්‍ය, විධාන, ඉල්ලීම් හා සුබ පැතුම් ආදිය ද මෙහි දී යොදා ගත හැකිය. හඳුනාගත් ඉංග්‍රීසි වාක්‍ය රටාවක් පන්තියේ දී හා පන්තියෙන් පිටත දී නැවත නැවත භාවිත කිරීම සඳහා දිරි ගැන්වීම ගුරුවරුන් විසින් කළ යුතුය.

මෙබඳු ක්‍රියාකාරකමකට සහභාගී වීමට පෙර ඒ සඳහා හොඳින් සූදානම් වී සිටීම අවශ්‍ය වේ. විදුහල්පතිවරයාගෙන් ලැබෙන උපදෙස් අනුව, පස්වන ශ්‍රේණියේ පන්තිය භාර ගුරුවරයාත්, ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයාත් එක් ව පෙර සූදානමෙහි නිරත විය යුතු බවට නිර්දේශ කෙරේ.

## ඉංග්‍රීසි වැඩසටහන්




### නිපුණතා

තුන්වන ප්‍රධාන අවධියට පැමිණෙන ශිෂ්‍යයකු සඳහා ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී පහත දැක්වෙන නිපුණතා සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

★ ඉංග්‍රීසි සරල වචන, ඉංග්‍රීසි වගන්ති භාවිත කරමින් එදිනෙදා ජීවිතයේ සන්නිවේදන කටයුතුවල නියැලෙයි.

★ එදිනෙදා සන්නිවේදන කටයුතුවල දී සරල ඉංග්‍රීසි වචන හා වගන්ති භාවිත කිරීමට කැමැත්තක් දක්වති.

# ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි
# ආදර්ශ වාංමාලාව

## ACTIVITY BASED ORAL ENGLISH
## AN EXAMPLE OF A VOCABULARY

### Objects in the classroom

chair, cupboard, desk, blackboard, chalk, bags, books, bottles, register, record book, table, table cloth, duster, posters, eraser, pen, pencil, gum, glue, clay, pictures, calendar, ruler, lunch box

### Persons in the school

principal, teacher, monitor, captain, security guard, peon, vice principal, group leader, watcher prefect

### Common places inside the school

art-room, classroom, canteen, dental clinic, corridor, garden, well, gate, fence, tap, dancing-room, shrine room, library, office, toilet, playground, room, music-room, sickroom, staffroom

### Common places outside the school

home, house, market, dispensary, hospital, airport, post office, bus stop, shop, fair, bakery mosque, pharmacy, police station, railway station, temple, church, kovil, boutique

### Persons outside the school

brother, sister, father, aunt, doctor, driver, policeman, postman, priest, mother, grandfather, nurse, uncle, grandmother, Buddhist monk

### Names of toys

ball, bat, doll, building block, balloon, kite, whistle, toy car, toy aeroplane, badminton rackets shuttlecock

### Common food items and drinks

bread, buns, cakes, beans, butter, cheese, ice cream, chocolate, dhal, hoppers, rice and curry beetroot, brinjal, potatoes, toffees, biscuits, cabbage, carrot, milk, tea, curd and treacle, string hoppers, fish, meat, coffee, orange juice, water

### Parts of body

eyes, ears, face, nose, arms, hands, legs, fingers, feet, toes, thumb, mouth, chin, cheeks, chest, stomach, nails, hair

### Fruits

mango, pineapple, plantain, papaw, wood apple, lemon, orange, grapes, apple, sweet melon

## Vehicles

bus, bicycle, car, lorry, train, tractor, aeroplane, helicopter, ship, boat, motor cycle, van, cart, jet plane, foot cycle

## Common animals and birds

dog, cat, cow, hen, elephant, horse, parrot, peacock, ant, spider, bee, goat, crow, pigeon, butterfly, mosquito, rabbit , cockroach, gecko, buffalo

## Common flowers

rose, sunflower, shoe-flower, carnation, temple flower, jasmine, lotus, blue water lily

## Colours

red, blue, white, green, yellow, pink, black, brown, orange, maroon, violet, purple, gold, silver, grey, light blue/green, dark blue/ green

## Numbers

one, two, three, four, five, six, seven, eight, nine, ten, eleven, twelve, thirteen, fourteen, fifteen, sixteen, seventeen, eighteen, nineteen, twenty, thirty, forty, fifty, sixty, seventy, eighty, ninety, one hundred , one thousand, first, second, third, fourth, fifth, sixth, seventh, eighth, ninth, tenth

## Natural environment

sky, sun, moon, stars, clouds, rainbow, wind, rain, thunder, lightening, mist, waterfalls, river, sea, beach, lake, tanks, trees, flowers, animals

## Activity Based Oral English

| Theme No | Theme | Suggested Vocabulary |
|---|---|---|
| 01 | Our Well - being | wish, worship, beautiful, like, mind, relax, unity, group, leader, win, lose, listen, peaceful |
| 02 | Animals around us | animals, legs, spiders, smell, message, malaria, fly, blood, rat, sick, parrot, snake, deer, rabbit, tortoise, hawk, shell, jungle fowl, kangaroo, crow, bee, owl, earthworm, chameleon |
| 03 | Earth and Sky | map, beach, rivers, weeds, nature, cloud, birds, fly, cover, district, village, tracing paper, direction |
| 04 | Marketplace | buying, selling, goods, weighing, measuring, fresh, trader, seller, buyer, labels/wrappings, expiry (EX.), price, weight, manufactured date (MFD) |
| 05 | Plants Trees and Creepers | herbs, honey, coconut-oil, spices, decorate, pod, nest, caterpillar, shade, drink, ants, red ants, winged beans, country beans, bitter gourd, maize, pumpkin, paddy, green gram, cucumber, snake gourd, flour, colour, shape, size, raw food, cooked food, medicine, timber, fuel, use |
| 06 | Water | ice, hot water, warm water, cool water, temperature, salt, sugar, spoon, tea, stream, sea, river, well, tank, rain water |
| 07 | Home Garden | agriculture, vegetable bed (flower bed), insects, soil, sunny, grow, compost, fence, rain, sun, protect, okra, green leaves, brinjal, frogs, potatoes |
| 08 | Safety and Protection | safe, dangerous, floods, thorns, earth slip, stale food serpent (reptile), poison, vomit, swell, rash, first aid box |
| 09 | Our heritage | history, fort, coins, king, queen, game, temple, church, proud, important place, wooden carvings, historical places, tanks, buildings |

| | | |
|---|---|---|
| 10 | Ways of making work easy | work, heavy, lift, bottle opener, stick, move, wheel, wheelbarrow, machine, magnet, pin, torch, batteries, push, pull, knife, scissors, a piece of string/rope |
| 11 | We are Sri Lankan | shape (of Sri Lanka), globe, place, North, South, East, West, Island, India, Maldives, Pakistan, Bhutan, Nepal, resources, coconut shell |
| 12 | Changes we can make | plan, cobweb, clean, tidy, decide, leader, save, time, song, discussion, plates, good habits |
| 13 | Man and Information | world, computer, post office, stamp, post box, envelope, post master, stage, post card, news, message, leaflet, newspapers, magazines, advertisements |
| 14 | Our Food | balanced diet, fresh, clean, apron, kitchen, sweets, wash, hands, daily, plate, cook, eggs, hungry, thirsty, boiled water, salt, tea strainer, nutrients, fat, iron, milk food, king coconut, young coconut |
| 15 | Transport | bridge, bus stand, yellow line, crossing, by road(s), railway line, hospital, school, temple, police, pavement, flyover |
| 16 | Human Behavior | borrow, sweep, promise, queue, forget, problem, friend, friendly, draw, smile, help, game, unity |

## CLASSROOM LANGUAGE

### Greetings and wishes

Good morning
Good afternoon
Good evening
Good night
Good bye
Good luck
All the best
Happy birthday
Happy New year
Merry Christmas

### Simple commands

Hands up/down,
Run, jump, start, stop,
clap your hands — get back
throw, catch, pass — come forward
look at me — open your books
form a line/circle — sweep
don’t go out — cut, past
Get ready — draw, colour
Come here — write, read
Go there (out) — sing, dance, play
Bring (your book) — give me the book
show

## Requests
May I come in/go out/go home?
May I go to the toilet/office/canteen?
Silence please
Listen to me please
Hurry up please
Be quiet
Be careful
Please do your home work
Please come to school every day
Tell your parents…
Go home straight
Don't shout please
Please try to be clean/be good
Please think about others
Please give me a pencil/book/ruler
Please give me a piece of paper
Please give me a piece of chalk
Please clean the blackboard
Please sit down/stand up
Please be silent
Please open your book
Please look at the picture
Please wipe your feet/nose
Please stop there
Please go out
Do me a favour please

## Polite forms
Thank you
Please excuse me
I am sorry
Can I help you
Could you pleasebring me the duster/ Some chalk
Please take this to the office/ to your parents
Bring me the register please
How are you?
Take care
Look after yourself
Be careful
Can I see…?
Do you like..?
Please bring me…

## Praising
good
very good
well done
That's right
I like it
Good work
Excellent
Keep it up
Very well
You have done well
That's good work
Wonderful

## Simple question forms
Who is shouting?
What's this?
What's that?
What's it?
Are you ready?
Is this yours?
Is this your......?
Is it a ………..?
What do you like?
Where are you going?
Where is the…?
What can you see in the…?
How many?
What are they?
What colour is the......?
What are the colours of .......?
What is it?
What is this?
Where do you live?

## Simple answer forms

This is my…..
I have got a …/ I've got a …
It's….
I am going to the….
Here it is.

I am hungry/thirsty.
I am reading a book.
I am drinking water.
I am coming to the class.
I am going out.
I am watering the plants.
I am closing my bag.
I want to watch a match.
I want to pluck flowers.
I want to sing/dance/play.

I will come tomorrow.
I will bring flowers.
I will sweep the classroom.
I will clean the blackboard.
I will walk slowly.
I can hear you.
I can come now.
I can't hear you.

## Simple suggestions

Let's go home.
Let's go out.
Let's sing a song.
Let's go to the playground

Shall we get ready?
Shall we go to the playground?
Shall we start the game?
Shall we wash our hands?
Shall we sing a song?
Shall we pluck flowers?
Shall we stop now?

## ගණිත විෂය සඳහා හඳුන්වා දෙන වචන මාලාව

number
order
ordering
number pattern
add
digit
two digit numbers
subtract
multiply
divide
balance
time
hour
minutes
clock
date
day
month
year
ruler
length
meter
weight
weigh
kilogram
gram
volume
liter
milliliter
space
decimal
model
week
second
less than
greater than

hundred
thousand
whole
half
fraction
bill
angle
direction
solid
plane
spatial Patterns
money
data
front view
side view
plan
problem solving
square
triangle
rectangle
straight line
cube
cuboids
sphere
area
graph
picture graph
table
transaction
symmetry
axis
measure
measurement
terms
times
symbols

# ඉංග්‍රීසි සංවාද වැඩසටහන

## හැඳින්වීම

පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා අවස්ථා තුනක දී ඉංග්‍රීසි භාෂාව ඉදිරිපත් කෙරේ.

1. පන්ති භාර ගුරුවරයා විසින් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ දී සහ ගණිත විෂයයේ දී වාචික ඉංග්‍රීසි භාවිත කිරීම.
2. ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයකු විසින් ඉංග්‍රීසි විධිමත් ව ඉගැන්වීම.
3. පන්තිය භාර ගුරුවරයා, ඉංග්‍රීසි විෂය උගන්වනු ලබන ගුරුවරයා සහ සිසුන්ගේ සහභාගිත්වයෙන් කෙරෙන සංවාදාත්මක ඉංග්‍රීසි වැඩසටහන යනුවෙනි.

සතියකට වරක් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය සඳහා වෙන් වූ වේලාවෙන් තෝරා ගත් කාල පරිච්ඡේදයක් සංවාදාත්මක වැඩ සටහන සඳහා යොදවා ගැනීමට යෝජනා කර තිබේ. මේ සඳහා විදුහල්පතිවරයාගේ සහයෝගය ද ලබා ගෙන ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයාට මේ වැඩසටහන සඳහා සතියකට වරක් පන්තියට පැමිණීමට හැකි වන පරිදි කාල සටහන සකස් කර ගැනීම අපේක්ෂිතය. සිසුන් සමඟ මිත්‍රශීලී ව කටයුතු කරමින් මේ කාලය තුළ ඔවුන්ගේ ඉංග්‍රීසි භාවිතය පිළිබඳ නිපුණතාව වැඩි දියුණු කිරීමට ගුරුවරුන් දෙදෙනා කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වේ.

- ★ සිසුන් ඉංග්‍රීසි භාෂාව වාචික ව භාවිත කරන විට ඊට සවන් දීමටත්, තමන් ද එම භාෂාව යොදා ගෙන කතා කිරීමටත් යොමු වීම මෙම වැඩ සටහනේ අරමුණයි.
- ★ අදාළ සතියේ හෝ ඊට පෙර සතියේ හෝ උගන්වන ලද පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් තේමා අනුසාරයෙන් මෙම සංවාදය ගොඩ නගා ගැනීම අපේක්ෂා කෙරේ.
- ★ අදාළ සතියේ තමන් විසින් උගන්වන ලද තේමාව පිළිබඳ ව පන්තිය භාර ගුරුවරයා තුළ ඇති අවබෝධය පදනම් කරගෙන ඉංග්‍රීසි විෂය උගන්වන ගුරුවරයා සමඟ එකතුව සංවාද වැඩ සටහන සැලසුම් කළ යුතු ය.
- ★ ගුරුවරුන් දෙදෙනාගේ ම දෛනික පාඩම් සැලසුමට එය ඇතුළත් වී තිබීම මෙම වැඩ සටහන් සාර්ථක කර ගැනීමට හේතු වේ.
- ★ වැඩ සටහන මෙහෙය වන කාලය තුළ පන්තිය භාර ගුරුවරයා ද ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයා ද සිසුන් ද යන පාර්ශව තුන ම සංවාදයට සහභාගී වීම අවශ්‍ය වේ.

තේමා කිහිපයකට අදාළ ආදර්ශ ඉංග්‍රීසි සංවාද වැඩ සටහන් කිහිපයක් ඉදිරි පිටුවලින් ඉදිරිපත් කර ඇත. මෙම වැඩසටහන් ආශ්‍රය කර ගෙන තවත් එබඳු වැඩසටහන් නිර්මාණය කර ගැනීමට උනන්දු වන්න. කෙසේ වෙතත් සෑම සතියකම මෙබඳු වැඩ සටහනක් පැවැත්වීම මගින් සිසුන්ගේ ඉංග්‍රීසි භාවිතය පිළිබඳ නිපුණතාව වර්ධනය කිරීම අත්‍යවශ්‍ය බව සැලකිය යුතු ය.

# තේමාව 2

## අප අවට සතුන්

හඳුන්වා දෙන වාක්‍ය හා වාක්‍යාංශ

I can see a .................
What can you see ................
near the ................
under the ...............
in the ................
on the ................
around the ............
I have ...........
It's a .....................

**පෙර සුදානම :**

මෙම ක්‍රියාකාරකම කිරීම සඳහා පාසල් වත්තේ සුදුසු ස්ථානයක් ගුරුවරයා විසින් තෝරා ගැනීම කළ යුතුයි. මෙහි දී සිසුන් විසින් සංවාදයට ගැළපෙන ආකාරයට ස්ථාන ද්‍රව්‍ය හා සතුන් හඳුනා ගැනීම අවශ්‍යයි.

## ක්‍රියාකාරකම 1

පන්ති භාර ගුරුවරයා හා ඉංග්‍රීසි ගුරුවරයා පහත දැක්වෙන ආකාරයට ක්‍රියාකාරකම ඉදිරිපත් කරන්න.

ඉංග්‍රීසි ගුරුවරයා
I can see a blue bird near the pond
What can you see?

පන්ති භාර ගුරුවරයා
I can see a beautiful fish in the pond
What can you see?

ඉංග්‍රීසි ගුරුවරයා
I can see a fat cat under the tree
What can you see?

පන්ති භාර ගුරුවරයා
I can see a fence around the garden
What can you see?

මෙලෙසින් ම සංවාදයක් ගොඩ නගා සිසුන් පුහුණුවට යොමු කරන්න. (කණ්ඩායම්වලට බෙදා හෝ සමූහ වශයෙන්)

## ක්‍රියාකාරකම 2

සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා එක් එක් කණ්ඩායම්වලින් මේ ආකාරයේ තේරවිල්ලක් බැගින් නිර්මාණය කර අනිත් කණ්ඩායමට ඉදිරිපත් කිරීමට උනන්දු කරවන්න.

| A | B |
|---|---|
| කණ්ඩායම තේරවිල්ල | කණ්ඩායම පිළිතුර |
| A | B |
| කණ්ඩායම පිළිතුර | කණ්ඩායම තේරවිල්ල |

අවශ්‍ය නම් පින්තූර පදනම් කර ගෙන එක් එක් සිසුවාට තේරවිල්ලක් බැගින් නිර්මාණය කිරීමට උනන්දු කරවන්න.
(මෙහි දී අවශ්‍ය නම් ගුරුවරුන්ගේ සහාය සිසුන්ට ලබා ගන්න)

සිසුන්ගේ තේරවිලි නිර්මාණයෙන් පසුව ඒවා යහළුවන් කිහිපදෙනකුට ඉදිරිපත් කර පිළිතුරු ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන්න.
සිංහල පාඩමේ කෙරෙන තේරවිලි පිළිබඳ ව මතක් කිරීමක් කොට, ඒ ආකාරයෙන් ම ඉංග්‍රීසි භාෂාවෙන් තේරවිලි ඇසීමට හා නිර්මාණයට පිවිසෙන බව පවසා ක්‍රියාකාරකමට පිවිසෙන්න.

ඉංග්‍රීසි ගුරුවරයා
I can see at night
I have big eyes
What am I?

| | |
|---|---|
| පන්ති භාර ගුරුවරයා | It's a bat |
| ඉංග්‍රීසි ගුරුවරයා | No, I lay eggs |
| පන්ති භාර ගුරුවරයා | It's an owl |
| ඉංග්‍රීසි ගුරුවරයා | Yes, you're correct |
| ඒ ආකාරයෙන් ම | |
| පන්ති භාර ගුරුවරයා | I can fly<br>I have green feathers<br>What am I? |
| ඉංග්‍රීසි ගුරුවරයා | It's a parrot |
| පන්ති භාර ගුරුවරයා | Yes, you're right |

# තේමාව 3

## පොළොව හා අහස

හඳුන්වා දෙන වාක්‍ය හා වාක්‍යාංශ

Where does the wind blow, now?

The wind blows to the south now
to the west
to the east
to the north

## ක්‍රියාකාරකම 1

සුළං හමන දිශාව පෙන්නුම් කරන ''සුළං මාපකයක්'' පාවිච්චි කරමින් පන්ති භාර ගුරුවරයා හා ඉංග්‍රීසි ගුරුවරයා අතර පහත දැක්වෙන අයුරින් දෙබසක් දක්වන්න.

ඉංග්‍රීසි ගුරුවරයා
Where does the wind blow now?

පන්ති භාර ගුරුවරයා
The wind blows to the south now

පිඹීමෙන් මාපකයේ දිශාව වෙනස් කර

පන්ති භාර ගුරුවරයා
Where does the wind blow now?

ඉංග්‍රීසි ගුරුවරයා
The wind blows to the east

මේ ආකාරයට සුළං මාපකය ආධාර කර ගනිමින් සිසුන් ද මෙම දෙබස භාවිතයේ යෙදා ගැනීම සඳහා යොමු කරන්න.

## ක්‍රියාකාරකම 2

සුළඟේ වාසි සහ අවාසි කියාපාන පින්තූරයක් හෝ දෙයක් ගෙන පන්ති භාර ගුරුවරයා හා ඉංග්‍රීසි ගුරුවරයා පහත දැක්වෙන සංවාදයේ නියැළෙයි. සිසුනට හොඳින් සවන් දෙන ලෙස උපදෙස් දෙන්න.

ඉංග්‍රීසි ගුරුවරයා
What happens here?

පන්ති භාර ගුරුවරයා
The wind breaks trees

ඉංග්‍රීසි ගුරුවරයා
Right, What happens here

පන්ති භාර ගුරුවරයා
The wind drops fruits

ඉංග්‍රීසි ගුරුවරයා
Right, What happens here

ඉහත දෙබස කිහිප විටක් සිසුනට ඇසීමට සලස්වා සිසුන් පස් දෙනාගේ පමණ කණ්ඩායම් සකස් කර සුළඟේ විවිධ වාසි අවාසි කියාපාන පින්තූර දී ඉහත ආකාරයේ සංවාදයකට යොමු කරන්න.

## ක්‍රියාකාරකම 2

මෙම කවිය ගායනයට සිසුන් යොමු කරන්න.

The moon shines clear as silver
The sun shines bright like gold
And both are very lovely
And very very old

by C. D. Cole

# තේමාව 6

## ජලය

හඳුන්වා දෙන වාක්‍ය හා වාක්‍යාංශ

What are you doing?
I'am .................

1. bathing
2. washing the clothes
3. drinking some water
4. watering the plants









## පෙර සූදානම

ඉහත පරිදි එක කාඩ් වර්ගයකින් 10 බැගින් කාඩ් 40ක් සාදා ගන්න. ලොකු ප්‍රමාණයේ කාඩ් හතරක් සාදා පැහැදිලි පින්තූර ඇඳ ගන්න. එම හතර ගුරුවරුන්ට ප්‍රදර්ශනය සඳහා වේ.

## ක්‍රියාකාරකම 1

සිසුන් රවුමට සිට ගැනීමට සලස්වන්න. පහත අයුරින් ක්‍රියාකාරකමේ යෙදෙන්න.

එක ගුරුවරියක් මැදට පැමිණෙන්න. ඇය මැද සිට පැළවලට වතුර දමන ආකාරයට රඟපායි. වටේ සිටින ගුරුවරිය හා සිසුන් What are you doing?

යනුවෙන් අසයි. මැද සිටින ගුරුවරිය තම අතේ ඇති තෝරා ගත් කාඩ්පතේ සඳහන් පරිදි I'am watering the plant යනුවෙන් කියයි. එවිට watering the plant කාඩ්පත් අතේ ඇති රවුමේ සිටින සිසුන් ගස් මාරු කරන මෙන් තම ස්ථානය වෙනස් කරයි. මැද සිටින ගුරුවරිය පැමිණ රවුමේ ස්ථානයක් ලබා ගනියි. එවිට සිසුවකුට මැදට පැමිණීමට අවස්ථාව ලැබේ.

ගුරුවරුන් දෙදෙනා මෙම ක්‍රීඩාව සිසුන්ට පැහැදිලි වීම සඳහා ඔවුන්ට පෙනෙන පරිදි කිහිප වාරයක් කර පෙන්වන්න.

## ක්‍රියාකාරකම 2

ගීත ගායනය කිරීම

1. I wash my face in the morning
   I wash my face in the morning
   I wash my face in the morning
   And hope to be happy and gay

2. I drink some water in the morning
   I drink some water in the morning
   I drink some water in the morning
   And hope to be happy and gay

3. I bathe myself in the morning
   I bathe myself in the morning
   I bathe myself in the morning
   and hope to be happy and gay

# තේමාව 14

## අපේ ආහාර

හඳුන්වා දෙන වාක්‍ය හා වාක්‍යාංශ

1. What do you like for lunch?
   What do you like for breakfast?
   What do you like for dinner?
   What do you like for tea?

2. I like ............. (string hoppers, noodles, rice & curry, hoppers, milk rice, bread etc)

**පෙර සූදානම :**

පන්ති කාමරය තුළ හෝ එළිමහන් ස්ථානයක හෝ මේ ක්‍රියාකාරකම කළ හැකිය. මේ සඳහා බෝලයක් ගන්න. තරමක විශාල රවුමක් අඳින්න. සිසුන් සහ පන්ති භාර ගුරුවරයාත්, ඉංග්‍රීසි ගුරුවරයාත් රවුමේ සිටගන්න. සිසුන් හතර දෙනකුට ආහාර වේල් හතරක නම් ලියූ පුවරු හතරක් දෙන්න.

## ක්‍රියාකාරකම

පන්ති භාර ගුරුවරයා රවුම මැදට ගොස් ඉංග්‍රීසි ගුරුවරයාට බෝලය යවයි. ඉංග්‍රීසි ගුරුවරයා රවුම මැදට ගිය විට ආහාර වේල්වල පුවරු අතැති එක් සිසුවෙක් එය ඉංග්‍රීසි ගුරුවරයාට පෙන්වයි. එම පුවරුවෙහි සඳහන් පරිදි ඉංග්‍රීසි ගුරුවරයා

What do you like for lunch?

කියා පන්ති භාර ගුරුවරයාගෙන් අසයි.
එවිට පන්ති භාර ගුරුවරයා

I like ............. (rice and curry, noodles)

යනුවෙන් පිළිතුරු දෙයි.

පසුව ඉංග්‍රීසි ගුරුවරයා පන්ති භාර ගුරුවරයාට බෝලය යවයි. පන්ති භාර ගුරුවරයා රවුම මැදට පැමිණෙයි. සිසුවකු පුවරුවක් පෙන්වයි. එහි සඳහන් පරිදි පන්ති භාර ගුරුවරයා ඉංග්‍රීසි ගුරුවරයාගෙන්

What do you like for dinner? යනුවෙන් අසයි

එවිට ඉංග්‍රීසි ගුරුවරයා
I like ........... (bread, string hoppers) යනුවෙන් පිළිතුරු දෙයි.

ඉන් පසු ගුරුවරුන් දෙදෙනා පසෙකට වී මෙම ක්‍රියාකාරකම කරගෙන යාමට සිසුන්ට අවස්ථාව දෙන්න. මෙහි දී පෙර හඳුන්වා දෙන ලද වාක්‍ය හා වාක්‍යාංශ භාවිත කිරීමට උපදෙස් දෙන්න.

# දෙවන ජාතික භාෂාව දෙමළ

## හැඳින්වීම

ශ්‍රී ලාංකිකයකු වශයෙන් තමා සමග ජීවත් වන සහෝදර ජනතාව සන්නිවේදනය සඳහා භාවිත කරන භාෂාව ඉගෙනීමෙන් එකිනෙකා කෙරෙහි අවබෝධයෙන් ක්‍රියා කිරීමේ හැකියා සිසුන් තුළ වර්ධනය කිරීම මෙහි අපේක්ෂාවයි.

මෙම අරමුණ ඇති ව දෙවන ජාතික භාෂාවක් ඉගෙනීමෙන් භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් බලාපොරොත්තු නොවූ ව ද යම් ප්‍රමාණයක සන්නිවේදන හැකියා වර්ධනය කර ගැනීමත් එකිනෙකා කෙරෙහි සංවේදී බවක් ඇති කර ගැනීමත් අපේක්ෂා කෙරේ. මෙම අවධිය සඳහා හඳුන්වා දී ඇති බොහෝ වචන සහ වාක්‍ය පහළ ශ්‍රේණිවල දී ඉගෙන ගත් ඒවාය. එමෙන් ම මෙම විෂයය තුළින් හයවන ශ්‍රේණියේ දී දෙවන ජාතික භාෂාව ඉගෙනීම සඳහා මනා අඩිතාලමක් ද සපයනු ඇත.

ක්‍රියාශීලී ජාතික ඒකාබද්ධතාවක් ඇති කර ගැනීමටත් ජාතික සමගිය ඇති කිරීමේ මූලික අඩිතාලමක් සකස් කිරීමටත් දෙවන ජාතික භාෂාවක් ඉගෙනීම රුකුලක් වෙතැයි ද අපේක්ෂා කෙරේ.

### ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා

- ★ එදිනෙදා අවශ්‍යතා සපුරා ගැනීමේ දී අදාළ වචන හා වගන්ති යොදා කතා කරයි.
- ★ භාෂාවකට සවන් දී අර්ථාන්විත ව ප්‍රතිචාර දක්වයි.
- ★ භාෂාවක් හැසිරවීමේ යහපුරුදු ප්‍රදර්ශනය කරයි.
- ★ අන් අය ඉදිරියේ තම අදහස් ප්‍රකාශ කිරීමට ඉදිරිපත් වෙයි.
- ★ කියවීමේ හැකියා ප්‍රදර්ශනය කරයි. එය අර්ථාන්විත ව භාවිත කරයි.
- ★ කවි, ගී අසමින්, ගයමින් රස විඳියි.
- ★ දෙමළ භාෂාව හැසිරවීමෙන් වින්දනයක් ලබයි.
- ★ දෙමළ භාෂාව හැසිරවීමට ඇති හැකියාව පිළිබඳ ස්වයං තෘප්තියක් ලබයි.
- ★ සරල වචන සහ වගන්ති ලියා දක්වයි.
- ★ දෙමළ භාෂාව හසුරුවමින් සරල භූමිකා රංගනවල නිරත වෙයි.

### තුන්වන ප්‍රධාන අවධියේ අපේක්ෂිත නිපුණතා

- ★ එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවන් කෙරෙහි අවධානයෙන් විධාන හා ඉල්ලීම්වලට සවන් දී අවස්ථාවෝචිත ව ප්‍රතිචාර දක්වයි.
- ★ දෛනික අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා අන් අය සමඟ කතා බහේ යෙදෙයි.
- ★ සමීප පරිසරයේ සතුන්, පලතුරු සහ එළවළු කිහිපයක් හඳුනාගෙන ඒවායේ නම් ප්‍රකාශ කරයි.
- ★ සරල කවි, ගී අභිනය සහිත ව ගායනා කරයි.
- ★ නිවැරදි උච්චාරණය සහිත ව සංඛ්‍යා කියයි.
- ★ සතියේ දවස් හත අනුපිළිවෙළින් හඳුනාගෙන ඒ අනුව කටයුතු කරයි.
- ★ අන්‍යොන්‍ය සුහදතාව ගොඩනැගීම සඳහා ජීවිතයට සමීප චරිත නිරූපණය වන අයුරින් භූමිකා රංගනවල යෙදෙයි.
- ★ පාසලේ ද්‍රව්‍ය, ස්ථාන සහ පුද්ගලයන් හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- ★ පින්තූරයක දැක්වෙන සිද්ධියකින් හෝ අව-ස්ථාවකින් හෝ නිරූපණය වන දේ හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- ★ දෙමළ අක්ෂර මාලාව හඳුනා ගනිමින් ඒවායේ සම්මත රටා නිවැරදි ව භාවිත කරයි.
- ★ දෙමළ භාෂාවේ සමහර අක්ෂරවලින් විවිධ ශබ්ද උත්පාදනය වන බව අවබෝධ කරගෙන අදාළ අවස්ථාවල දී එම අක්ෂර නිවැරදි ව භාවිත කරයි.
- ★ පිල්ලම් සහිත සරල වචන ලියයි.
- ★ එදිනෙදා ව්‍යවහාර වන සරල වාක්‍ය ගොඩනගා ප්‍රකාශ කරයි.
- ★ සරල වචන භාවිත කරමින් වාක්‍ය ගොඩනගා ලිඛිත ව ප්‍රකාශ කරයි.

# දෙවන ජාතික භාෂාව (දෙමළ) - විෂය නිර්දේශය

## නිපුණතාව

★ එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවන් කෙරෙහි අවධානයෙන් විධාන හා ඉල්ලීම්වලට සවන් දී අවස්ථාවෝචිත ව ප්‍රතිචාර දක්වයි.

தண்ணீர் தாருங்கள் - තණ්ණීර් තාරුංගළ්
புத்தகத்தைத் தாருங்கள் - පුත්තහත්තෛත් තාරුංගළ්
சோறு தாருங்கள் - සෝරු තාරුංගළ්
பாடம் சொல்லித் தாருங்கள் - පාඩම් සොල්ලිත් තාරුංගළ්

போங்கள் - පෝංගළ්
எடுங்கள் - එඩුංගළ්
கேளுங்கள் - කේළුංගළ්
சொல்லுங்கள் - සොල්ලුංගළ්
வாசியுங்கள் - වාසියුංගළ්
எழுதுங்கள் - එළුදුංගළ්
சாப்பிடுங்கள் - සාප්පිඩුංගළ්
குடியுங்கள் - කුඩියුංගළ්

## නිපුණතාව

★ දෛනික අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා අන් අය සමඟ කතා බහේ යෙදෙයි.

### පාසලේ දී :

ஆசிரியர் வருவாரா? - ආසිරියර් වරුවාරා?
மலசலகூடம் எங்கே உள்ளது? - මැලසැලකූඩම් එංගේ උළ්ළදු?
சிற்றுண்டிச்சாலை எங்கே உள்ளது? - සිට්රුණ්ඩිච්චාලෛ එංගේ උළ්ළදු?
அதிபர் அறை எங்கே உள்ளது? - අදිපර් අරෛ එංගේ උළ්ළදු?

### නිවසේ දී :

அப்பா வந்தாரா? - අප්පා වන්දාරා?
விளையாடப் போவோமா? - විළෛයාඩප් පෝවෝමා?
நான் குளிக்கட்டுமா? - නාන් කුළික්කට්ටුමා?
உங்களுக்குப் பசிக்கிறதா? - උංගළුක්කුප් පසික්කිරදා?
அம்மா சோறு சமைத்தாரா? - අම්මා සෝරු සමෛත්තාරා?

### කඩයේ දී :

ஒரு கிலோ அரிசி என்ன விலை? - ඔරු කිලෝ ඇරිසි එන්න විලෛ?
தேங்காய் என்ன விலை? - තේංගායි එන්න විලෛ?
பிஸ்கட் ஷபக்கெட்' என்ன விலை? - බිස්කට් පැකට් එන්න විලෛ?
விலையைக் குறைக்க முடியாதா? - විලෛයෛක් කුරෛක්ක මුඩියාදා?
முட்டை என்ன விலை? - මුට්ටෛ එන්න විලෛයි?

## නිපුණතාව

★ සමීප පරිසරයේ සතුන්, පලතුරු සහ එළවළු කීපයක් හඳුනාගෙන ඒවායේ නම් ප්‍රකාශ කරයි.

### සතුන්

| | |
|---|---|
| பல்லி | - පැල්ලි |
| ஈ | - ඊ |
| பசு | - පසු |
| பாம்பு | - පාම්බු |
| சேவல் | - සේවල් |
| எறும்பு | - එරුම්බු |
| கொக்கு | - කොක්කු |

நுளம்பு - නුළම්බු
குரங்கு - කුරංගු
வண்ணத்துப்பூச்சி - වණ්ණත්තුප්පූච්චි

පලතුරු

மாம்பழம் - මාම්බළම්
பலாப்பழம் - පැලාප්පළම්
தோடம்பழம் - තෝඩම්බළම්
விளாம்பழம் - විළාම්බළම්
வாழைப்பழம் - වාළෛප්පළම්
அன்னாசிப்பழம் - ඇන්නාසිප්පළම්
கொய்யாப்பழம் - කොයියාප්පළම්
திராட்சை - තිරාට්චෛ
றம்புட்டான் - රම්බුට්ටාන්

එළවළු

கத்தரிக்காய் - කත්තරික්කායි
வாழைக்காய் - වාළෛක්කායි
வெண்டிக்காய் - වෙණ්ඩික්කායි
பூசனிக்காய் - පූසනික්කායි
புடலங்காய் - පුඩලංගායි
பீர்க்கங்காய் - පීර්ක්කංගායි
பாகற்காய் - පාකට්කායි
கோவா - ගෝවා
லீக்ஸ் - ලීක්ස්
கரட் - කැරට්
பீட்றூட் - බීට්රූට්
முருங்கை - මුරුංගෛ

## නිපුණතාව

★ සරල කවි, ගී අංගචලනය සහිත ව ගායනා කරයි.

- එළවළු හා සම්බන්ධ ගීතයක්
- පලතුරු හා සම්බන්ධ ගීතයක්
- සතුන් හා සම්බන්ධ ගීතයක්

## නිපුණතාව

★ නිවැරදි උච්චාරණය සහිත ව සංඛ්‍යා කියයි.

නිවැරදි උච්චාරණය සහිත ව 21 සිට 30 දක්වා පිළිවෙළින් සංඛ්‍යාව කියවයි.

இருபத்து ஒன்று ඉරුපත්තු ඔන්රු
இருபத்து இரண்டு ඉරුපත්තු ඉරණ්ඩු
இருபத்து மூன்று ඉරුපත්තු මූන්රු
இருபத்து நான்கு ඉරුපත්තු නාන්ගු
இருபத்து ஐந்து ඉරුපත්තු ඓන්දු
இருபத்து ஆறு ඉරුපත්තු ආරු
இருபத்து ஏழு ඉරුපත්තු ඒළු
இருபத்து எட்டு ඉරුපත්තු එට්ටු
இருபத்து ஒன்பது ඉරුපත්තු ඔන්බදු
முப்பது මුප්පදු

නිවැරදි උච්චාරණය සහිත ව 5 සිට 50 දක්වා පහේ ගුණාකාරවල සංඛ්‍යා නාම අනුපිළිවෙළින් කියයි.

ஐந்து ඓන්දු
பத்து පත්තු
பதினைந்து පදිනෛන්දු
இருபது ඉරුපදු
இருபத்தைந்து ඉරුපත්තෛන්දු
முப்பது මුප්පදු
முப்பத்தைந்து මුප්පත්තෛන්දු
நாற்பது නාට්පදු
நாற்பத்தைந்து නාට්පත්තෛන්දු
ஐம்பது ඓම්බදු

## නිපුණතාව

★ සතියේ දවස් හත අනුපිළිවෙළින් හඳුනාගෙන ඒ අනුව කටයුතු කරයි.

திங்கள் - තිංගළ්
செவ்வாய் - සෙව්වායි

புதன் - පුදන්
வியாழன் - වියාළන්
வெள்ளி - වෙළ්ළි
சனி - සනි
ஞாயிறு - ඥායිරු

**නිපුණතාව**

★ අන්‍යෝන්‍ය සුහදතාව ගොඩ නැගීම සඳහා ජීවිතයට සමීප චරිත නිරූපණය වන අයුරින් සරල භූමිකා රංගනවල යෙදෙයි.

නිවසේ, පාසලේ හා සමාජයේ හමුවන චරිත හා සම්බන්ධ භූමිකා රංගනවල යෙදෙයි.

**නිපුණතාව**

★ පාසලේ ද්‍රව්‍ය, ස්ථාන සහ පුද්ගලයන් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.

## පාසලේ සිටින පුද්ගලයන්

அதிபர் - අදිපර්
ஆசிரியர் - ආසිරියර්
மாணவன் - මාණවන්
மாணவி - මාණවි
வகுப்பாசிரியர் - වහුප්පාසිරියර්

## පාසලේ ඇති ද්‍රව්‍ය

கதிரை - කදිරෛ
மேசை - මේසෛ
புத்தகம் - පුත්තහම්
பேனை - පේනෛ
பென்சில் - පෙන්සිල්
கரும்பலகை - කරුම්බලහෛ
வெண்கட்டி - වෙණ්කට්ටි

## පාසලේ ඇති විවිධ ස්ථාන

காரியாலயம் - කාරියාලයම්
நூலகம் - නූලහම්
கணினிக்கூடம் - කණිනික්කූඩම්
விஞ்ஞானகூடம் - විඥ්ඥානකූඩම්
மலசலகூடம் - මැලසැලකූඩම්
விளையாட்டு மைதானம் - විළෛයාට්ටු මෛදානම්

**නිපුණතාව**

★ පින්තූරයක දැක්වෙන සිද්ධියකින් හෝ අවස්ථාවකින් හෝ නිරූපණය වන දේ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.

ස්වභාවික පරිසරය හා සම්බන්ධ චිත්‍රයක්, පොළක් පවතින අවස්ථාවක් දැක්වෙන චිත්‍රයක්, පාසලේ දර්ශනයක්.

**නිපුණතාව**

★ දෙමළ අක්ෂර මාලාව හඳුනා ගනිමින් ඒවායේ සම්මත රටා නිවැරදි ව භාවිත කරයි.

ස්වර අකුරු හඳුනා ගනියි.

## ස්වර අකුරු

| | | | | | |
|---|---|---|---|---|---|
| அ | ஆ | இ | ஈ | உ | ஊ |
| අ | ආ | ඉ | ඊ | උ | ඌ |
| எ | ஏ | ஐ | ஒ | ஓ | ஔ |
| එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |

ව්‍යඤ්ජන අකුරු හඳුනා ගනියි.

## ව්‍යඤ්ජන අකුරු

| | | | | | |
|---|---|---|---|---|---|
| க | ங | ச | ஞ | ட | ண |
| ක | ඞ | ස | ඤ | ඩ | ණ |
| த | ந | ப | ம | ய | ர |
| ත | න | ප | ම | ය | ර |
| ல | வ | ள | ழ | ற | ன |
| ල | ව | ළ | ළ | ර | න |

**නිපුණතාව**

★ දෙමළ භාෂාවේ සමහර අක්ෂරවලින් විවිධ ශබ්ද උත්පාදනය වන බව අවබෝධ කරගෙන අදාළ අවස්ථාවල දී එම අක්ෂර නිවැරදි ව භාවිත කරයි.

ක, ග, හ } க

ප, බ, ෆ } ப

ස, ච } ச

ට, ඩ } ட

ත, ද } த

**නිපුණතාව**

★ පිල්ලම් සහිත සරල වචන ලියයි

அரிசி - ඇරිසි
மா - මා
சீனி - සීනි
உப்பு - උප්පු
அம்மி - අම්මි
சட்டி - සට්ටි
கத்தி - කත්ති
வட்டம் - වට්ටම්
சட்டை - සට්ටෛ
புத்தகம் - පුත්තහම්

**නිපුණතාව**

★ එදිනෙදා ව්‍යවහාර වන සරල වාක්‍ය ගොඩ-නගා ප්‍රකාශ කරයි.

நாங்கள் பாடசாலைக்குப் போவோம்.
නාංගළ් පාඩසාලෛක්කුප් පෝවෝම්.

நாங்கள் விளையாடுவோம்.
නාංගළ් විළෛයාඩුවෝම්.

மணி அடிக்கிறார்கள்.
මණි අඩික්කිරාර්හළ්.

அதோ ஆசிரியர் வருகிறார்.
අදෝ ආසිරියර් වරුහිරාර්.

நான் படிக்கின்றேன்.
නාන් පඩික්කින්රේන්.

பஸ் வந்துள்ளது.
බස් වන්දුළ්ළදු.

அண்ணா கடைக்குப் போனார்.
අණ්ණා කඩෛක්කුප් පෝනාර්.

நாங்கள் சோறு சாப்பிடுவோம்.
නාංගළ් සෝරු සාප්පිඩුවෝම්.

அம்மா தண்ணீர் கொண்டுவந்தார்.
අම්මා තණ්ණීර් කොණ්ඩුවන්දාර්.

நாங்கள் தண்ணீர் குடிப்போம்.
නාංගළ් තණ්ණීර් කුඩිප්පෝම්.

**නිපුණතාව**

★ සරල වචන භාවිත කරමින් වාක්‍ය ගොඩනගා ලිඛිතව ප්‍රකාශ කරයි.

මේ සඳහා භාවිත කරන වචන

நிறம் - නිරම්
சோறு - සෝරු
இது - ඉදු

கிளி - කිළි
எனது - එනදු
பச்சை - පච්චෛ
குடியுங்கள் - කුඩියුංගළ්
பாடசாலை - පාඩසාලෛ
பால் - පාල්
அம்மா - අම්මා
மேசை - මේසෛ
பாடம் - පාඩම්
வாருங்கள் - වාරුංගළ්
சாப்பிடுங்கள் - සාප්පිඩුංගළ්
சொல்லுங்கள் - සොල්ලුංගළ්

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පළමුවන ප්‍රධාන අවධියේ සිට දෙවන ජාතික භාෂාවක් හැදෑරීමට සිසුනට අවස්ථා සැලසී ඇත. සැලසුම්ගත සෙල්ලම්, විනෝදජනක වැඩ, ක්‍රියාකාරකම් සහ අසුන්ගත වැඩ ප්‍රධාන කොට ගනිමින් පෙළ ගස්වා ඇති මෙම විෂයයේ අපේක්ෂිත ඉගෙනුම් නිපුණතා සාක්ෂාත් කර ගත හැකි පරිද්දෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ඇත.

සවන්දීම, කතා කිරීම, කියවීම සහ ලිවීම යන භාෂා ක්ෂේත්‍ර යටතේ මූලික දක්ෂතා ලබා දෙමින් සන්නිවේදන හැකියා වැඩි දියුණු කර ගැනීමට අවස්ථා ලබා දීම මෙමගින් අපේක්ෂා කෙරේ. ඒ සඳහා සිසුනට අවශ්‍ය ඉගෙනුම් උදවු ලබා දීම මෙහි දී ගුරුවරයාගේ මූලික වගකීම වේ.

දෙවන ජාතික භාෂාවක් හැදෑරීමෙන් අපේක්ෂිත නිපුණතා සාක්ෂාත් වන අයුරින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු වේ. තව ද යෝජිත ක්‍රියාකාරකම් වෙනුවට සුදුසු නව ක්‍රියා-කාරකම් යොදා ගැනීමට ද ගුරුවරයාට නිදහස ඇත.

## පාසල් ප්‍රතිපත්තිය හා වැඩසටහන්

දෙවන ජාතික භාෂාව භාවිත කරන අවස්ථා පාසල් ප්‍රතිපත්තිය තුළ ඇති කිරීමට විදුහල්පතිවරුන්ගේ අවධානය යොමු විය යුතු ය. මෙයට අමතර ව පස්වන ශ්‍රේණියේ පන්තිය තුළ දෙවන ජාතික භාෂාව භාවිත වන පන්ති ප්‍රතිපත්ති ඇති කිරීමට පන්ති භාර ගුරු මහත්ම මහත්මීන්ගේ අවධානය යොමු විය යුතු ය. ඇතැම් අවස්ථාවල දෙවන ජාතික භාෂාවෙන් සුබ පැතීම්, ස්තුති කිරීම් වැනි භාෂා ප්‍රතිපත්ති ඇති කර ගත හැකි ය. මෙයට අමතරව දෙවන ජාතික භාෂාව සඳහා විශේෂ දිනයන් වෙන් කර පන්ති මට්ටමෙන් වැඩසටහන් ද සංවිධානය කළ හැකි ය.

## සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

අවස්ථානුකූල ව දෙමළ භාෂාව භාවිත කරන ආකාරය පිළිබඳ ව නිරන්තර ව තොරතුරු රැස් කිරීම අවශ්‍ය ය. එම තොරතුරු සිසුන්ගේ ප්‍රබලතා හඳුනා ගැනීමටත් දුෂ්කරතා අවම කර ගැනීම සඳහාත් අත්‍යවශ්‍ය වේ. පොදු තක්සේරු පත්‍රිකාවේ දෙවන ජාතික භාෂාව තක්සේරු කිරීම සඳහා අදාළ නිර්ණායක ඇතුළත් කර ඇත.

නිපුණතාව

★ එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවන් කෙරෙහි අවධානයෙන් විධාන, ඉල්ලීම්වලට සවන් දී අවස්ථාවෝචිත ව ප්‍රතිචාර දක්වයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

- පහත දැක්වෙන ඉල්ලීම් සිසුන්ට හඳුන්වා දීම සඳහා එක් එක් ඉල්ලීමට එක් එක් කාඩ්පත බැගින්, උච්චාරණය වන ආකාරය සහිත ව සකස් කර ගන්න.

தண்ணீர் தாருங்கள் - තණ්ණීර් තාරුංගළ්
புத்தகத்தைத் தாருங்கள் - පුත්තහත්තෛත් තාරුංගළ්
சோறு தாருங்கள் - සෝරු තාරුංගළ්
பாடம் சொல்லித் தாருங்கள் - පාඩම් සොල්ලිත් තාරුංගළ්

- මෙම ඉල්ලීම් එකින් එක මුළු පන්තියට ම හඳුන්වා දෙන්න.
- ඒවා සියලු ම සිසුන්ට පෙනෙන පරිදි කළුලෑල්ලේ ප්‍රදර්ශනය කරන්න.
- සිසුන්ට අවබෝධ වන තෙක් ඒවා නැවත නැවත උච්චාරණය කරන්න.

### ක්‍රියාකාරකම 2

- මෙම ක්‍රියාකාරකම තරගයක් ආකාරයට සංවිධානය කර ගන්න. ඒ සඳහා සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා මුහුණට මුහුණලා සිටින ආකාරයට පේළි දෙකකට සිටුවන්න. කණ්ඩායම් දෙක A, B වශයෙන් නම් කරන්න.
  A, B කණ්ඩායම් දෙක මැදින් මේසයක් තබන්න.
- ක්‍රියාකාරකම 1 සඳහා සකස් කර ගත් ඉල්ලීම් දැක්වෙන කාඩ්පත් මේසය මත මුණින් අතට හරවා තබන්න. ක්‍රියාකාරකම සඳහා අවශ්‍ය වන අදාළ ද්‍රව්‍ය ද තබන්න.
- තරගය ආරම්භ කිරීම සඳහා ගුරුවරයා මැදිහත් වන්න.
  පළමුව A කණ්ඩායමේ සිටින පළමු සිසුවා කැඳවා මේසය මත ඇති කාඩ්පත්වලින් එකක් ගන්නා ලෙස උපදෙස් දෙන්න. එහි සඳහන් වන ඉල්ලීම එම සිසුවා ඉදිරිපත් කිරීමේ දී B කණ්ඩායමේ සිටින සියලු ම සිසුන් හොඳින් අසා සිටිය යුතු බව පවසන්න. එම ඉල්ලීමට අදාළ ප්‍රතිචාරය B කණ්ඩායමේ සිටින පළමු සිසුවා ලබා දිය යුතුය. ප්‍රතිචාරය නිවැරදි නම් B කණ්ඩායමට ලකුණක් හිමි වේ. එම සිසුවා ඉල්ලීමට අදාළ නිවැරදි ප්‍රතිචාරය දැක්වීමට අපොහොසත් වුවහොත් එම අවස්ථාව B කණ්ඩායමේ දෙවන සිසුවා ලබා ගත යුතු බව පවසන්න.
- එම ඉල්ලීම සහිත කාඩ්පත මේසය මත ඇති අනෙක් කාඩ්පත් සමග මිශ්‍ර කර මුණින් අතට හරවා තබන්න.
- නැවත B කණ්ඩායමේ සිටින දෙවන සිසුවා ඉදිරියට කැඳවා මේසය මතින් කාඩ්පතක් ලබා ගැනීමට උපදෙස් දෙන්න. එම කාඩ්පතෙහි සඳහන් ඉල්ලීම A කණ්ඩායමේ සිටින දෙවන සිසුවා වෙත යොමු කරන ලෙස පවසන්න. පෙර පරිදි ම A කණ්ඩායමේ දෙවන සිසුවා ඊට ප්‍රතිචාරය දැක්විය යුතුයි.
- මේ ආකාරයට කණ්ඩායමේ සියලු ම සිසුනට තරගය සඳහා සහභාගී වීමට අවස්ථාව සලසන්න.
- වැඩි ලකුණු ලබා ගත් කණ්ඩායමට ජයග්‍රහණය හිමිවේ.
- සහභාගී වූ සියලු ම සිසුන් අගය කරන්න.

### ක්‍රියාකාරකම 3

- පහත සඳහන් විධාන දැක්වෙන වචන ද සියලු ම සිසුන්ට හඳුන්වා දෙන්න.

போங்கள் - පෝංගළ්
எடுங்கள் - එඩුංගළ්
கேளுங்கள் - කේළුංගළ්
சொல்லுங்கள் - සොල්ලුංගළ්
வாசியுங்கள் - වාසියුංගළ්
எழுதுங்கள் - එළුදුංගළ්
சாப்பிடுங்கள் - සාප්පිඩුංගළ්
குடியுங்கள் - කුඩියුංගළ්

- මෙම විධානවලට සවන් දී ප්‍රතිචාර දැක්වීම සඳහා සියලු ළමුන්ට සහභාගී විය හැකි වන පරිදි සුදුසු ක්‍රීඩාවක් හෝ ක්‍රියාකාරකමක් සැලසුම් කරන්න.
- සිසුන්ට නිරන්තරයෙන් දර්ශනය වන සේ පන්ති කාමරයේ මෙම විධාන සහිත කාඩ්පත් ප්‍රදර්ශනය කරන්න.

**අර්ථය**

தண்ணீர் தாருங்கள் - වතුර දෙන්න
புத்தகத்தைத் தாருங்கள் - පොත දෙන්න
சோறு தாருங்கள் - බත් දෙන්න
பாடம் சொல்லித் தாருங்கள் - පාඩම කියලා දෙන්න

போங்கள் - යන්න
எடுங்கள் - ගන්න
கேளுங்கள் - අහන්න
சொல்லுங்கள - කියන්න
வாசியுங்கள் - කියවන්න
எழுதுங்கள் - ලියන්න
சாப்பிடுங்கள் - කන්න
குடியுங்கள் - බොන්න

**නිපුණතාව**

★ දෛනික අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා අන් අය සමග කතා බහේ යෙදෙයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

- පහත දැක්වෙන ප්‍රශ්න සිසුන්ට අවබෝධ කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

පාසලේ දී :

ஆசிரியர் வருவாரா? - ආසිරියර් වරුවාරා?
மலசலகூடம் எங்கே உள்ளது? - මැලසැලකූඩම් එංගේ උළ්ළදු?
சிற்றுண்டிச்சாலை எங்கே உள்ளது? - සිට්රුණ්ඩිච්චාලෙ එංගේ උළ්ළදු?
அதிபர் அறை எங்கே உள்ளது? - අදිපර් අරෛ එංගේ උළ්ළදු?

- උච්චාරණය හා අදහස අවබෝධ කර ගෙන අන් අය සමග සංවාදයේ යෙදීමට සිසුන්ට මග පෙන්වන්න.
- ඒ සඳහා සිසුන් යුගල වශයෙන් කණ්ඩායම් කරන්න.
- දෙදෙනාගෙන් එක් අයකු ප්‍රශ්න ඇසිය යුතු බවත් අනෙක් සිසුවා පිළිතුරු දිය යුතු බවත් පවසන්න.
- පිළිතුරු සැපයීමේ දී කලින් ශ්‍රේණිවල ඉගෙන ගත් වචන ද භාවිත කරමින් තම හැකියාව අනුව පිළිතුරු දීමට සිසුන් යොමු කරන්න.

උදාහරණ :

කමල් : ஆசிரியர் வருவாரா? ආසිරියර් වරුවාරා? (ගුරුතුමා එයි ද?)
ශාන්ත : வருவார். වරුවාර්. (එයි)
ஆம், வருவார். ආම්, වරුවාර්. (ඔව්, එයි.)
சில சமயம் வருவார் සිල සමයම් වරුවාර්. (සමහර විට එයි.)
இன்று வர மாட்டார் ඉන්රු වර මාට්ටාර්. (අද එන්නේ නෑ.)

- ඉහත අසන ලද ප්‍රශ්නයට ක්‍රම හතරකින් පිළිතුරු සපයා ඇත. මෙවැනි වෙනත් පිළිතුරු වුව ද අදහස් මතුවන ආකාරයෙන් ලබා දිය හැකිය.

மலசல கூடம் எங்கே உள்ளது?මැලසැල කූඩම් එංගේ උළ්ළදු? (වැසිකිළිය කොහේ ද?)
කමල් : அங்கேඅංගේ (අරෙහෙ)
ශාන්ත : இங்கே ඉංගේ (මෙහෙ)
அந்தப் பக்கத்தில் අන්දප් පක්කත්තිල් (එහා පැත්තේ)
அந்த மரத்துக்கு அருகில் අන්ද මරත්තුක්කු අරුගිල් (අර ගහ ළඟ)

- මෙම ප්‍රශ්නයට ද ඉහත දක්වා ඇති පිළිතුරු ගැළපෙන ආකාරයට යොදා ගත හැකි බව පෙන්වා දෙන්න.
- එම ආකාරයට පහත සඳහන් ප්‍රශ්න ද ඇසීමට සිසුන් යොමු කරන්න.

சிற்றுண்டிச்சாலை எங்கே உள்ளது?
සිට්රුණ්ඩිච්චාලෛ එංගේ උළ්ළදු ?
அதிபர் அறை எங்கே உள்ளது?
අදිපර් අරෛ එංගේ උළ්ළදු?

- මෙම ප්‍රශ්න සඳහා ද කලින් පිළිතුරු වශයෙන් දී ඇති පිළිතුරු ම අදාළ පරිදි යොදා ගත හැකිය.

## ක්‍රියාකාරකම 2

- අදහස අවබෝධ වන සේ පහත සඳහන් ප්‍රශ්න සිසුන්ට හඳුන්වා දෙන්න. මේවා කළුලෑල්ල මත හෝ ඩිමයි කඩදාසිවල හෝ වෙනත් බෝඩ් කැබලි මත ලියා හඳුන්වා දිය හැකිය.

නිවසේ දී :

1. அப்பா வந்தாரா? - අප්පා වන්දාරා?
2. விளையாடப் போவோமா? - විළෛයාඩප් පෝවෝමා?
3. நான் குளிக்கட்டுமா? - නාන් කුළික්කට්ටුමා?
4. உங்களுக்கு பசிக்கிறதா? - උංගළුක්කුප් පසික්කිරදා?
5. அம்மா சோறு சமைத்தாரா? - අම්මා සෝරු සමෛත්තාරා?

- මෙම ප්‍රශ්න යොදා ගනිමින් සංවාදයේ යෙදීමට සිසුන්ට අවස්ථා සලසන්න.
- ඒ සඳහා සිසුන් යුගල වශයෙන් කණ්ඩායම් කරන්න.
- සිසුන් යුගලයේ එක් සිසුවකු ප්‍රශ්නය ඇසීමටත් අනෙක් සිසුවා පිළිතුරු දීමටත් යොමු කරන්න.
- නැවත කලින්, පිළිතුර දුන් ශිෂ්‍යයා ප්‍රශ්නය ඇසීමටත් ප්‍රශ්නය ඇසූ ශිෂ්‍යයා පිළිතුර දීමටත් යොමු කරන්න.
- අසන ලද ප්‍රශ්නවලට සිසු හැකියාව අනුව පිළිතුරු දීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත දක්වා ඇති පිළිතුරු ද ඇතුළත් වන සේ දෙබස් සැලසුම් කර ගන්න.
  ඉහත ප්‍රශ්න අනුපිළිවෙළ අනුව පහත පිළිතුරු සපයා ඇත. මෙම පිළිතුරු හැර යෙදිය හැකි වෙනත් පිළිතුරු ද අදාළ පරිදි යොදා ගත හැකි ය.

1. இல்லை. ඉල්ලෛ. (නැහැ.)
   இன்னும் வரவில்லை.ඉන්නුම් වරවිල්ලෛ. (තවම ආවේ නෑ.)
   ஆம் வந்தார். ආම් වන්දාර්. (ඔව් ආවා.)
   இன்னும் சற்று நேரத்தில் வருவார். ඉන්නුම් සට්රු නේරත්තිල් වරුවාර්. (තව ටිකකින් ඒවි.)
2. இன்று முடியாது. ඉන්රු මුඩියාදු. (අද බැහැ.)
   ஆ போவோம்? ආ පෝවෝම්. (හා යමු.)
   இன்னும் சற்று நேரத்தில் போவோம். ඉන්නුම් සට්රු නේරත්තිල් පෝවෝම්. (තව ටිකකින් යමු.)
   தம்பியுடன் போவோம். තම්බියුඩන් පෝවෝම්. (මල්ලිත් එක්ක යමු.)
3. ஆ சரி. ආ සරි. (හා හරි.)
   இன்று வேண்டாம்.ඉන්රු වේණ්ඩාම්. (අද එපා.)
   வேண்டாம். වේණ්ඩාම්. (එපා.)
   நாளை குளிக்கவும். නාළෛ කුලික්කවුම්.(හෙට නාන්න.)
4. ஆம். ආම්. (ඔව්.)
   இல்லை. ඉල්ලෛ. (නෑ.)
   கொஞ்சம் பசிக்கிறது. කොඤ්ජම් පසික්කිරදු. (ටිකක් බඩගිනියි.)
5. ஆம். ආම්. (ඔව්.)
   இன்னும் இல்லை. ඉන්නුම් ඉල්ලෛ. (තවම නෑ.)
   இன்னும் கொஞ்சம் நேரமாகலாம். ඉන්නුම් කොඤ්ජම් නේරමාහලාම්.
   (තව ටිකක් වෙලායාවි.)

## ක්‍රියාකාරකම 3

- පහත දැක්වෙන ප්‍රශ්න ද ඉහත ක්‍රියාකාරකම 1 හා 2 හි සිදු කළ ආකාරයට ම සිසුන්ට හඳුන්වා දෙන්න.

කඩයේ දී :

ஒரு கிலோ அரிசி என்ன விலை?
ඔරු කිලෝ ඇරිසි එන්න විලෛ?
தேங்காய் என்ன விலை?තේංගායි එන්න විලෛ?

பிஸ்கட் ஷபக்கெட்’ என்ன விலை?
බිස්කට් පැකට් එන්න විලෛ?
விலையை குறைக்க முடியாதா?
විලෛයෛ කුරෛක්ක මුඩියාදා?
முட்டை என்ன விலை? මුට්ටෛ එන්න විලෛයි?

- මෙම ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු යොදා ගනිමින් දෙබස් ගොඩනැඟීමට සිසුන් යොමු කරන්න.

පිළිතුරු

எழுபது ரூபாய் එළුපදු රූපාය් - රුපියල් හැත්තෑවයි
எண்பது ரூபாய் එණ්බදු රූපාය් - රුපියල් අසූවයි
இருபத்தெட்டு ரூபாய் ඉරුපත්තෙට්ටු රූපාය් - රුපියල් විසි අටයි
முப்பத்தைந்து ரூபாய் මුප්පත්තෛන්දු රූපාය්- රුපියල් තිස්පහයි
முப்பது ரூபாய் මුප්පදු රූපාය් - රුපියල් තිහයි
நாற்பது ரூபாய் නාට්පදු රූපාය් - රුපියල් හතලිහයි
ஒன்பது ரூபாய் ඔන්බදු රූපාය් - රුපියල් නවයයි
பத்து ரூபாய் පත්තු රූපාය් - රුපියල් දහයයි
முடியாது මුඩියාදු - බැහැ
எடுங்கள் குறைக்கிறேன் එඩුංගල් කුරෛක්-කිරේන් - ගන්න අඩුකරන්නම්
எவ்வளவு? එව්වලවු? - කීයක් ද?

සෑම සිසුවකුට ම ප්‍රශ්න ඇසීමට හා පිළිතුරු දීමට අවස්ථාව ලබා දෙන්න.

අර්ථය

ஆசிரியர் வருவாரா? ගුරුතුමා එයි ද?
மலசலகூடம் எங்கே உள்ளது?
වැසිකිලිය කොහෙද තියෙන්නේ?
சிற்றுண்டிச்சாலை எங்கே உள்ளது?
ආපනශාලාව කොහෙ ද තියෙන්නේ?
அதிபர் அறை எங்கே உள்ளது?
විදුහල්පතිතුමාගේ කාර්යාලය කොහේ ද?
அப்பா வந்தாரா? තාත්තා ආවා ද?
விளையாடப் போவோமா? සෙල්ලම් කරන්න යමු ද?

நான் குளிக்கட்டுமா? මම නාන්න ද?
உங்களுக்குப் பசிக்கிறதா? ඔබට බඩගිනි ද?
அம்மா சோறு சமைத்தாரா? අම්මා බත් ඉව්වා ද?
ஒரு கிலோ அரிசி என்ன விலை?
හාල් කිලෝවක් කීය ද?
தேங்காய் என்ன விலை? පොල් ගෙඩියක් කීය ද?
பிஸ்கட் ஷபக்கெட்’ என்ன விலை?
බිස්කට් පැකට් එකක් කීය ද?
விலையைக் குறைக்க முடியாதா?
මිල අඩුකරන්න බැරි ද?
முட்டை என்ன விலை? බිත්තරයක මිල කීය ද?

## නිපුණතාව

★ සමීප පරිසරයේ සතුන්, පලතුරු සහ එළවළු කීපයක් හඳුනාගෙන ඒවායේ නම් ප්‍රකාශ කරයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

- පහත දැක්වෙන සතුන්ගේ නම් ප්‍රදර්ශනය කළ හැකි ආකාරයට සකස් කර ගන්න. එය සිසුන්ට පහසුවෙන් දර්ශනය වන අයුරින් ප්‍රදර්ශනය කරන්න.

සතුන්

பல்லி - පැල්ලි
ஈ - ඊ
பசு - පසු
பாம்பு - පාම්බු
சேவல் - සේවල්
எறும்பு - එරුම්බු
கொக்கு - කොක්කු
நுளம்பு - නුළම්බු
குரங்கு - කුරංගු
வண்ணத்துப்பூச்சி - වණ්ණත්තුප්පූච්චි

- මෙම සතුන්ගේ රූප රැස් කරන්න. ඒවා වෙන් වෙන් ව කාඩ්බෝඩ් කැබලිවල අලවා පින්තූර කාඩ්පත් කට්ටලයක් සකස් කර ගන්න.
- එසේ ම එම සතුන්ගේ නම් දෙමළෙන් වෙන් වෙන් වශයෙන් ලියන ලද කාඩ් කට්ටලයක් ද සකස් කර ගන්න.
- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- කණ්ඩායම් සංඛ්‍යාවට ගැළපෙන පරිදි සත්ත්ව රූප කාඩ්පත් හා නම් ලියන ලද කාඩ්පත් කට්ටල සකස් කර ගන්න.
- එක් එක් කණ්ඩායමට නම් කාඩ්පත් කට්ටලයක් ද රූප කාඩ්පත් කට්ටලයක් ද බැගින් ලබා දෙන්න.
- තමන්ට ලැබුණු මෙම කාඩ්පත් කට්ටල දෙක මුණින් අතට හරවා කණ්ඩායම මැදින් තැබීමට උපදෙස් දෙන්න.

  වරකට කණ්ඩායමෙන් එක් අයෙක් රූප කාඩ් කට්ටලයෙන් එක් කාඩ්පතක් ගෙන එය තම කණ්ඩායමට පෙන්වා කණ්ඩායමෙන් ම වෙනත් සිසුවෙක් නම් කර මෙම රූපයට අදාළ නම, නම් සඳහන් කාඩ්පත් කට්ටලයෙන් තෝරා දෙන ලෙස පවසන්න. කාඩ්පත තෝරා ගැනීමේ දී තමා තෝරා ගන්නා කාඩ්පත කණ්ඩායමේ අනෙක් සිසුන්ට නොපෙන්විය යුතුය. කාඩ්පතට අදාළ නිවැරදි නම තෝරා ගැනීමෙන් පසු එය අන් සිසුන්ට ද ඇසෙන සේ උච්චාරණය කළ යුතුය. කියවූ කාඩ්පත් වෙන ම තැබීමට සිසුන්ට උපදෙස් ලබා දෙන්න. මෙසේ පන්තියේ අන් අයට ද නම් කාඩ්පත් ද රූප කාඩ්පත් ද තේරීමට කියවීමට අවස්ථාව ලබා දෙන්න.

## ක්‍රියාකාරකම 2

- සිසුන් සමඟ ඔවුන් කන්නට කැමති පලතුරු ගැන සාකච්ඡා කරන්න. ඒවායේ නම් දෙමළ භාෂාවෙන් කීමට මඟ පෙන්වන්න.
- ඒ සඳහා පහත දැක්වෙන පලතුරුවල නම් සඳහන් වචන කළුලෑල්ල මත ලියා ඒවායේ අර්ථය පැහැදිලි කර දී උච්චාරණය කර පෙන්වන්න. සිසුන්ට උච්චාරණයට අවස්ථාවට ලබා දෙන්න.

පලතුරු

| | | |
|---|---|---|
| பலாப்பழம் | - | පැලාප්පළම් |
| தோடம்பழம் | - | තෝඩම්බළම් |
| விளாம்பழம் | - | විළාම්බළම් |
| வாழைப்பழம் | - | වාළෛප්පළම් |
| மாங்காய் | - | මාංගායි |
| அன்னாசிப்பழம் | - | ඇන්නාසිප්පළම් |
| கொய்யாப்பழம் | - | කොයියාප්පළම් |
| திராட்சை | - | තිරාට්චෛ |
| றம்புட்டான் | - | රම්බුට්ටාන් |

- ඉහත පලතුරුවල රූප හා නම් ඇතුළත් කාඩ්පත් වෙන් වෙන් වශයෙන් සකස් කර ගන්න.
- සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න. ඒවා A, B වශයෙන් නම් කරන්න.
- සකස් කරන ලද කාඩ්පත් පෙට්ටියකට දමන්න.
- කණ්ඩායම් දෙක මැදින් එම පෙට්ටිය තබන්න.
- කණ්ඩායමකට නායකයෙක් බැගින් තෝරා ගන්න.
- පළමුව එක් කණ්ඩායමක නායකයෙක් ඉදිරියට විත් රූප කාඩ්පතක් ගැනීමට අවස්ථාව දෙන්න.
- එම කාඩ්පත ගෙන එහි ඇති පලතුරේ නම කියවීමට යොමු කරන්න. නිවැරදි ව කියවූ විට ඔහුට/ඇයට ලකුණක් හිමි වේ. එම කාඩ්පතෙහි සඳහන් පලතුරේ නම ඔහු/ඇය කියවීමට අපොහොසත් වුවහොත් අනෙක් කණ්ඩායමේ නායකයාට එම අවස්ථාව හිමි වේ.
- මෙසේ සියලු ම සිසුන්ට ක්‍රීඩාවේ නියැලීමට අවස්ථාව ලබා දෙන්න.
- කියවන ලද කාඩ්පත් වෙනම තබන්න.
- පෙට්ටියේ ඇති කාඩ්පත් සියල්ලම කියවූ පසු ඒවා නැවත පෙට්ටි තුළට දැමිය යුතුය. තරගය දිගටම පවත්වන්න.

## ක්‍රියාකාරකම 3

- පහත වචන සිසුන්ට පහසුවෙන් දර්ශනය වන සේ කළුලෑල්ල මත හෝ ඩිමයි කඩදාසියක ලියා දක්වන්න.

එළවළු

| | | |
|---|---|---|
| கத்தரிக்காய் | - | කත්තරික්කායි |
| வாழைக்காய் | - | වාළෛක්කායි |

| | | |
|---|---|---|
| வெண்டிக்காய் | - | වෙණ්ඩික්කායි |
| பூசனிக்காய் | - | පූසනික්කායි |
| புடலங்காய் | - | පුඩලංගායි |
| பீர்க்கங்காய் | - | පීර්ක්කංගායි |
| பாகற்காய் | - | පාකට්කායි |
| கோவா | - | ගෝවා |
| லீக்ஸ் | - | ලීක්ස් |
| கரட் | - | කැරට් |
| பீட்ரூட் | - | බීට්රූට් |

- ක්‍රියාකාරකම 1, 2 හි හඳුන්වා දී ඇති ක්‍රමවේද අනුව ඉහත සඳහන් වචන ද සිසුන්ට හඳුන්වා දීමට උචිත ලෙස ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.

අර්ථය

| | | |
|---|---|---|
| கத்தரிக்காய் | - | වම්බටු |
| வாழைக்காய் | - | අළුකෙසෙල් |
| வெண்டிக்காய் | - | බණ්ඩක්කා |
| பூசனிக்காய் | - | වට්ටක්කා |
| புடலங்காய் | - | පතෝල |
| பீர்க்கங்காய் | - | වැටකොළු |
| பாகற்காய் | - | කරවිල |
| கோவா | - | ගෝවා |
| லீக்ஸ் | - | ලීක්ස් |
| கரட் | - | කැරට් |
| பீட்ரூட் | - | බීට්රූට් |

**නිපුණතාව**

★ සරල කවි, ගී අංග චලනය සහිත ව ගායනා කරයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

- දී ඇති ගීත සිසුන් ඉදිරියේ ගායනා කර පෙන්වන්න.
- ප්‍රථමයෙන් ගීතයට සවන් දීමටත් පසුව ගුරුවරයා සමඟ එකතුව ගායනය කිරීමටත් සිසුන් යොමු කරන්න.
- කුඩා කණ්ඩායම් වශයෙන් ද, දෙදෙනා බැගින් ද තනිව ද නිවැරදි උච්චාරණය සහිත ව ගායනා කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අවශ්‍ය අවස්ථාවල දී ආදේශ සංගීත භාණ්ඩ භාවිත කිරීමටත් අභිනය පෙන්වමින් රංගපෑමටත් පොළඹවන්න.
- සිසුන්ට පහසුවෙන් කියවිය හැකි සේ දෙමළ බසින් ද සිංහල බසින් ද ගීත ලියා ප්‍රදර්ශනය කරන්න.

**தங்க நிற மாம்பழம்**

*தாத்தா வைத்த மரத்திலே*
*தங்க நிற மாம்பழம்!*
*பாட்டி வைத்த மரத்திலே*
*பந்துபோல் விளாம்பழம்*
*மாமா வைத்த மரத்திலே*
*முத்து முத்தாய் மாதுளை!*
*மாமி வைத்த மரத்திலே*
*மஞ்சள் நிற ஆரஞ்சு!*
*அப்பா வைத்த மரத்திலே*
*ஆளுயர முருங்கைக்காய்!*
*அம்மா வைத்த மரத்திலே*
*அடுக்கடுக்காய் வாழைக்காய்!*
*தொட்டிக்குள்ளே நட்டு வைத்தேன்*
*நானும் ஒரு சுண்டைக்காய்!*
*தண்ணீர் விட்டேன் முளைத்திருக்கு*
*காகம் போட்ட வெண்டைக்காய்!*

- குழ கதிரேசன் -

තංග නිර මාම්බළම්

තාත්ත වෛත්ත මරත්තිලේ
තංග නිර මාම්බළම්
පාට්ටි වෛත්ත මරත්තිලේ
පන්දු පෝල විළාම්පළම්
මාමා වෛත්ත මරත්තිලේ
මුත්තු මුත්තායි මාදුළයි
මාමි වෛත්ත මරත්තිලේ
මංජල් නිර ආරංජු
අප්පා වෛත්ත මරත්තිලේ
ආළුයර මුරුංගෛක්කායි
අම්මා වෛත්ත මරත්තිලේ
අඩුක්කඩුක්කායි වාලෛක්කායි

තොට්ටික්කුළ්ළේ නට්ටු වෛත්තේන්
නානුම් ඔරු සුන්ඩෛක්කායි
තණ්ණීර් විට්ටේන් මුළෛත්තිරුක්කු
කාහම් පෝට්ට වෙන්ඩෛක්කායි

(සිංහල අදහස)    රන්වන් අඹ

*සීයා සිටවූ අඹ ගහේ රන් පාට අඹ*
*ආච්චි සිටවූ දිවුල් ගහේ බෝල මෙන් දිවුල්*
*මාමා සිටවූ දෙළුම් ගහේ මුතුමෙන් දෙළුම්*
*නැන්දා සිටවූ දොඩං ගහේ කහපාටට දොඩං*
*තාත්තා සිට වූ මුරුංග ගහේ*
*මිනිසකු උසට මුරුංග කරල්*
*අම්මා සිට වූ කෙසෙල් ගහේ*
*ඇවරි පිරුණු කෙසෙල් කැන්*
*මම සිටෙව්වෙමි තිබ්බටු භාජනයක් තුළ*
*කපුටා දැමූ බණ්ඩක්කා*
*වතුර දැමූ නිසා පැළ වුනා*

**ஆட்டுக் குட்டி**

*குட்டி ஆடே குட்டி ஆடே*
*இங்கே ஓடிவா - உந்தன்*
*குரலைக் கேட்டு ஓடி வாறன்*
*இங்கே ஓடிவா*
*கட்டி அம்மா போடும் முன்னே*
*இங்கே ஓடிவா - நல்ல*
*கதைகள் எல்லாம் சொல்லித்தாறன்*
*இங்கே ஓடிவா*
*துள்ளித்துள்ளிக் கரணம் போட்டு*
*இங்கே ஓடிவா - உன்னைத்*
*தூக்கி தூக்கி முத்தம் தாறேன்*
*இங்கே ஓடிவா*

- வித்துவான் சி.குமாரசாமி -

ආට්ටුක් කුට්ටි

කුට්ටා ආඩේ කුට්ටා ආඩේ
ඉංගේ ඕඩිවා - උන්දන්
කුරලෛක් කේට්ටු ඕඩිවාරන්
ඉංගේ ඕඩිවා
කට්ටි අම්මා පෝඩුම් මුන්නේ
ඉංගේ ඕඩිවා - නල්ල
කදෛගල්එල්ලාම් සොල්ලිත්තාරන්
ඉංගේ ඕඩිවා
තුල්ලිත් තුල්ලික් කරණම් පෝට්ටු
ඉංගේ ඕඩිවා - උන්නෛත්
තූක්කි තූක්කි මුත්තම් තාරේන්
ඉංගේ ඕඩිවා

(සිංහල අදහස)    එළු පැටවා

*එළු පැටවෝ එළුපැටවෝ දුවලා එන්න*
*නුඹෙ කට හඬ අසා දුවගෙන ආවා*
*අම්මා ගැටගහන්න කලින් දුවලා එන්න*
*හොඳ හොඳ කතන්දර කියා දෙන්නම් දුවලා එන්න*
*පැන පැන කරණම් ගහගෙන දුවලා එන්න*
*නුඹව වඩාගෙන සිපගන්නම් දුවලා එන්න*

**தோட்டம்**

*எங்கள் வீட்டு பின்புறத்தில்*
*எழிலாய் விளங்குது ஒரு தோட்டம்*
*நல்ல நல்ல காய்கறிகள்*
*நாளும் தந்திடும் இத்தோட்டம்*
*கத்தரி வெண்டி தக்காளி*
*கனத்த பெரிய பூசனியும்*
*மெத்த உண்டெம் தோட்டத்திலே*
*மெல்ல வந்து பாருங்கள்*
*பாம்பு போலப் புடோலங்காய்*
*பந்தரிற் தொங்குது பாகற்காய்*
*பாத்தி வரிசையில் கீரை வகை*
*பரந்து வளருது பாருங்கள்*
*உங்கள் வீட்டிலும் இது போல*
*உண்டு பண்ணுங்கள் ஒரு தோட்டம்*
*வீட்டுத் தோட்டம் செய்திட்டால்*
*விரும்பும் பயனைப் பெற்றிடலாம்*

- கவிஞர் த. துரைசிங்கம் -

තෝට්ටම්

එංගල් වීට්ටු පින්පුරත්තිල්
එළිලායි විලංගුදු ඔරු තෝට්ටම්
නල්ල නල්ල තායිකරිහල්
නාලුම් තන්දිඩුම් ඉත්තෝට්ටම්

කත්තරි වෙණ්ඩි තක්කාලි
කනත්ත පෙරිය පූසනියුම්
මෙත්ත උන්ඩෙම් තෝට්ටත්තිලේ
මෙල්ල වන්දු පාරුංගල්
පාම්බු පොලප් පුඩෝලංගායි
පන්දරිට් තොංගුදු පාහට්කායි
පාත්ති වරිසෙයිල් කීරෛ වගෛ
පැරන්දු වළරුදු පාරුංගළ්
උංගල් වීට්ටිලුම් ඉදු පෝල
උණ්ඩු පන්ණුංගල් ඔරු තෝට්ටම්
වීට්ටුත් තෝට්ටම් සෙයිදිට්ටාල්
විරුම්බුම් පයනෛප් පෙට්රිඩලාම්

(සිංහල අදහස)     වත්ත

*අපේ ලස්සන ගෙවත්තේ හැමදාට ම*
*ගන්න පුළුවන් එළවලු තියෙනවා*
*වම්බටු, බණ්ඩක්කා, තක්කාලි, වට්ටක්කා*
*හැමදේම තියනවා ඇවිත් බලන්න*
*පතෝල, කරවිල, කොළජාතිත් තියනවා*
*ඔයාගේ ගෙදරත් මේවාගේ ගෙවත්තක් හදන්න*
*ඒකෙන් අපට අවශ්‍ය ප්‍රයෝජන*
*ගන්න පුළුවන් වෙනවා*

**නිපුණතාව**

★ නිවැරදි උච්චාරණය සහිත ව සංඛ්‍යා කියයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

21 සිට 30 දක්වා සංඛ්‍යාවල නම් නිවැරදි උච්චාරණයෙන් හා පිළිවෙළින් කියයි.

පහත සඳහන් සංඛ්‍යාවල නම් ඇතුළත් වගුවක් සකස් කර ප්‍රදර්ශනය කරන්න.

| | |
|---|---|
| இருபத்து ஒன்று | ඉරුපත්තු ඔන්රු |
| இருபத்து இரண்டு | ඉරුපත්තු ඉරණ්ඩු |
| இருபத்து மூன்று | ඉරුපත්තු මූන්රු |
| இருபத்து நான்கு | ඉරුපත්තු නාන්ගු |
| இருபத்து ஐந்து | ඉරුපත්තු ඓන්දු |
| இருபத்து ஆறு | ඉරුපත්තු ආරු |
| இருபத்து ஏழு | ඉරුපත්තු ඒළු |
| இருபத்து எட்டு | ඉරුපත්තු එට්ටු |
| இருபத்து ஒன்பது | ඉරුපත්තු ඔන්බදු |
| முப்பது | මුප්පදු |

21 සිට 30 දක්වා සංඛ්‍යා නාම පහත දැක්වෙන ආකාරයට සකස් කර ගන්න.

| | | | |
|---|---|---|---|
| இருபத்து ஒன்று<br>21 | இருபத்து இரண்டு<br>22 | இருபத்து மூன்று<br>23 | இருபத்து நான்கு<br>24 |
| இருபத்து ஐந்து<br>25 | இருபத்து ஆறு<br>26 | இருபத்து ஏழு<br>27 | இருபத்து எட்டு<br>28 |
| இருபத்து ஒன்பது<br>29 | முப்பது<br>30 | | |

- එක් වතාවක දී එක් කාඩ්පත බැගින් රැගෙන සිසුන්ට උච්චාරණය කර පෙන්වන්න. පසුව සිසුන්ට ද උච්චාරණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- 21 සිට 29 දක්වා සංඛ්‍යා இருபத்து ඉරුපත්තු ලෙස පටන් ගෙන පිළිවෙළින් ஒன்று, இரண்டு ආදී වශයෙන් සම්බන්ධ කිරීමෙන් இருபத்து ஒன்று, இருபத்து இரண்டு ලෙස සංඛ්‍යා නාම ගොඩනැගිය හැකි බව සිසුන්ට අවබෝධ වීමට සළස්වන්න.
- 30 යන සංඛ්‍යා නාමය පමණක් முப்பது ලෙස වෙනස් වන බව පෙන්වා දෙන්න.
- ක්‍රියාකාරකම 1 හා 2හි හඳුන්වා දී ඇති 15, 25, 35, 45 යන සංඛ්‍යා නාම සිසුන්ගේ උච්චාරණ පහසුව තකා பதின் ஐந்து, இருபத்து ஐந்து, முப்பத்து ஐந்து, நாற்பத்து ஐந்து ලෙස හඳුන්වා දී ඇත. එහෙත් ක්‍රියාකාරකම් 3හි එම සංඛ්‍යා නාම හඳුන්වන වචන දෙක එකතු කරමින් பதினைந்து, இருபத்தைந்து, முப்பத்தைந்து, நாற்பத்தைந்து ලෙස හඳුන්වා දී ඇත. මේ ආකාර දෙක ම නිවැරදි ය.

## ක්‍රියාකාරකම 2

- දෙමළ භාෂාවෙන් පමණක් 21 සිට 30 දක්වා සංඛ්‍යා නාම ලියා ඇති කාඩ්පත් කට්ටලයක් බැගින් සෑම කණ්ඩායමකට ම බෙදා දිය හැකි ප්‍රමාණයට සකස් කර ගන්න.
- සිසුන් හතර දෙනා බැගින් කණ්ඩායම් කරන්න.
- සිසුන් එළිමහන් ස්ථානයක කැඳවාගෙන යන්න. එක් එක් කණ්ඩායමට එක් එක් ස්ථානයක් වෙන් කර දෙන්න.
- කණ්ඩායම්වලට වෙන් කර දුන් ස්ථානයේ අඹ ඇට පැනීමේ ක්‍රීඩාව සඳහා කොටුවක් ඇඳ ගන්න.

| | |
|---|---|
| இருபத்து ஐந்து | இருபத்து ஆறு |
| இருபத்து நான்கு | இருபத்து ஏழு |
| இருபத்து மூன்று | இருபத்து எட்டு |
| இருபத்து இரண்டு | இருபத்து ஒன்பது |
| இருபத்து ஒன்று | முப்பது |

- කලින් ම සූදානම් කර ගත් සංඛ්‍යා නාම දැක්වෙන කාඩ්පත් එක් එක් කොටුවේ පිළිවෙළින් තබන්න. සිසුන් අඹ ඇට පැනීමේ ක්‍රීඩාවේ යොදවන්න. අඹ ඇටය කකුලෙන් තල්ලු කර නවතින කොටුවේ අංක දෙස බලා කියවමින් එම ක්‍රීඩාවේ යෙදීමට සිසුන් යොමු කරන්න. ක්‍රීඩාවේ නියැලීමට සියලු සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

★ නිවැරදි උච්චාරණයෙන් යුක්තව 5 සිට 30 දක්වා පහේ ගුණාකාර සංඛ්‍යා අනුපිළිවෙළින් කියවයි.

## ක්‍රියාකාරකම 3

- පහත සඳහන් සංඛ්‍යා නාම ඇතුළත් සටහනක් සකස් කර ප්‍රදර්ශනය කරන්න.

| | |
|---|---|
| ஐந்து | ඓන්දු |
| பத்து | පත්තු |
| பதினைந்து | පදිනෛන්දු |
| இருபது | ඉරුපදු |
| இருபத்தைந்து | ඉරුපත්තෛන්දු |
| முப்பது | මුප්පදු |
| முப்பத்தைந்து | මුප්පත්තෛන්දු |
| நாற்பது | නාට්පදු |
| நாற்பத்தைந்து | නාට්පත්තෛන්දු |
| ஐம்பது | ඓම්බදු |

ක්‍රියාකාරකම් 1 හා 2 හි සඳහන් ආකාරයට මෙම සංඛ්‍යා නාම හඳුන්වා දිය හැකිය. එසේ නැතහොත් 5 සිට 30 දක්වා සංඛ්‍යා හඳුන්වා දීමට වඩාත් උචිත ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.

**අර්ථය**

| | |
|---|---|
| இருபத்து ஒன்று | විසි එක |
| இருபத்து இரண்டு | විසි දෙක |
| இருபத்து மூன்று | විසි තුන |
| இருபத்து நான்கு | විසි හතර |
| இருபத்து ஐந்து | විසි පහ |
| இருபத்து ஆறு | විසි හය |
| இருபத்து ஏழு | විසි හත |
| இருபத்து எட்டு | විසි අට |
| இருபத்து ஒன்பது | විසි නවය |
| முப்பது | තිහ |

**නිපුණතාව**

★ සතියේ දවස් හත අනුපිළිවෙළින් හඳුනාගෙන ඒ අනුව කටයුතු කරයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

## ක්‍රියාකාරකම 1

- සතියේ දින හතේ නම් දෙමළ බසින් හා ඒවායෙහි උච්චාරණය සිංහල බසින් ඩිමයි කඩදාසියක ලියා සකස් කර ගන්න.

திங்கள் - තිංගළ්
செவ்வாய் - සෙව්වායි
புதன் - පුදන්
வியாழன் - වියාළන්

| | | |
|---|---|---|
| வெள்ளி | - | වෙල්ළි |
| சனி | - | සනි |
| ஞாயிறு | - | ඥායිරු |

- සතියේ දවස් හත අනුපිළිවෙළින් සිංහල බසින් කීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සතියේ දින හතේ නම් දෙමළ බසින් කිව හැකි දැයි සිසුන්ගෙන් විමසන්න.
- ඩිමයි කඩදාසියේ ලියා සකස් කරගත් වචන සිසුන්ට පහසුවෙන් දර්ශනය වන සේ සවි කරන්න.
- එහි සඳහන් වචනවල අර්ථය අවබෝධ කර දී නිවැරදි ව උච්චාරණය කර පෙන්වන්න. සිසුන්ට ද උච්චාරණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

## ක්‍රියාකාරකම 2

- නිදහසේ දිවීමට හැකි එළිමහන් ස්ථානයකට සිසුන්ව කැඳවාගෙන යන්න.
- දෙමළ බසින් හා සිංහල බසින් සතියේ දිනවල නම් ලියු කාඩ්පත් කට්ටල දෙකක් සකස් කර ගන්න.
- එම කාඩ්පත් කට්ටල දෙකෙන් සිංහල භාෂාවෙන් නම් ලියු කාඩ්පත් එළිමහනේ සුදුසු ස්ථානවල ප්‍රදර්ශනය කරන්න.
- ගුරුවරයා සහ සිසුන් සියලු දෙනා ම එක ස්ථානයක සිටිය යුතුයි.
- ගුරුතුමිය එක්වතාවක දී සතියේ දිනයක නමක් (උදාහරණ : සඳුදා) කී විට සිසුන් එම නම සහිත කාඩ්පත රඳවා ඇති ස්ථානයට දිව යා යුතුයි.
- ඒ ආකාරයට දින කිපයක නම් කියමින් සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- පසුව සිංහල භාෂාවෙන් ලියා ඇති නම් සහිත කාඩ්පත් වෙනුවට දෙමළ භාෂාවෙන් ලියන ලද සතියේ දිනවල නම් සහිත කාඩ්පත් එම ස්ථානවල රඳවන්න.
- ඉහත ආකාරයට දිනයක නමක් කියු විට එම ස්ථානයට දිව යන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.
- මේ ආකාරයට දිගට ම ක්‍රීඩාව සිදු කරන්න.
- සිසුන් කුඩා කණ්ඩායම් වශයෙන් සකස් කර මෙම ක්‍රීඩාවේ නියැලීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

## ක්‍රියාකාකරම 3

- කණ්ඩායම්වලට ප්‍රමාණවත් පරිදි සිංහල භාෂාවෙන් හා දෙමළ භාෂාවෙන් සතියේ දිනවල නම් ලියු කාඩ්පත් කට්ටල වෙන් වෙන් ව සකස් කර ගන්න.
- සිසුන් කුඩා කණ්ඩායම් කීපයකට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම සිංහල භාෂාවෙන් හා දෙමළ භාෂාවෙන් සකස් කර ගත් කාඩ්පත් කට්ටල එක බැගින් ලබා දෙන්න.
- එක් එක් කාඩ්පත් වෙන් වෙන් වශයෙන් කණ්ඩායමට මැදින් තැබීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- කණ්ඩායමේ එක් සිසුවකු සිංහල භාෂාවෙන් ලියා ඇති කාඩ්පතක් ගෙන තම කණ්ඩායමේ ම තවත් සිසුවකුට ඊට අදාළ දෙමළ වචනය කාඩ්පත් අතරින් තෝරන ලෙස කිව යුතුයි. පිළිතුරු ලබා දෙන සිසුන් අගය කරන්න.
- සෑම සිසුවකුට ම සතියේ දින හතේ නම් නිවැරදි ව උච්චාරණය කිරීමට හා නිවැරදි ව හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- සතියේ දින හතේ නම් ඉහත දක්වා ඇති ආකාරයට හඳුන්වා දිය හැකිය. එම දිනයන් සඳහා අගට கிழமை "කිළමෙ" ලෙස ද යොදා භාවිත කළ හැකි ය.

## ක්‍රියාකාරකම 4

- පහත දැක්වෙන ගීතය කළුලෑල්ලේ ලියා දක්වන්න.
- එය ගායනා කර පෙන්වන්න. පසුව සිසුන් සමඟ ද ගායනා කරන්න.

**ஏழு நாளும் காய்கறி**

*திங்கள் கிழமை தக்காளி*
*செவ்வாய்க் கிழமை சிறுகீரை*
*புதன் கிழமை புடலங்காய்*
*வியாழக் கிழமை வாழைக்காய்*
*வெள்ளிக் கிழமை வெண்டைக்காய்*
*சனிக் கிழமை சுண்டைக்காய்*
*ஞாயிறு காரட், பீட்ரூட்டு*
*வார நாள்கள் ஏழாகும்.*

*உணவில் காய்கறி நலமாகும்!*
*ஊட்ட மான காய்கறிதான்*
*உயிரைக் காக்கும் மருந்தாகும்!*
- குழ கதிரேசன் -

එලු නාලුම් කායිහරි

තිංගල් කිළමයි තක්කාළි
සෙව්වායි කිළමයි සිරු කීරයි
පුදන් කිළමයි පුඩලංගායි
වියාළක් කිළමයි වාළෛක්කායි
වෙල්ළික් කිළමයි වෙණ්ඩක්කායි
සනික් කිළමයි සුණ්ඩෛක්කායි
ඥායිරු කැරට් බීට්රූට්ටු
වාර නාල්හළ් ඒළාහුම්
උණවිල් කායි හරි නලමාහුම්
ඌට්ටමාන කායිහරිතාන්
උයිරෛක් කාක්කුම් මැරුන්දාහම්
- කුල කදිරේසන් -

සිංහල අදහස

*සඳුදාට තක්කාලි - අඟහරුවාදාට තම්පලා*
*බදාදාට පතෝල - බ්‍රහස්පතින්දාට අළු කෙසෙල්*
*සිකුරාදාට බණ්ඩක්කා - සෙනසුරාදාට තිබ්බටු*
*ඉරිදාට කැරට් බීට්රූට්*
*පෝෂණය සහිත ආහාර*
*නිරෝගී කම රැකදෙනවා*

මෙම ගීතය ආශ්‍රයෙන් සිසුන් තුළ සතියේ දින පිළිබඳ අවබෝධය තව දුරටත් තහවුරු කරන්න.

අර්ථය

| | | |
|---|---|---|
| திங்கள் | - | සඳුදා |
| செவ்வாய் | - | අඟහරුවාදා |
| புதன் | - | බදාදා |
| வியாழன் | - | බ්‍රහස්පතින්දා |
| வெள்ளி | - | සිකුරාදා |
| சனி | - | සෙනසුරාදා |
| ஞாயிறு | - | ඉරිදා |

නිපුණතාව

★ අන්‍යෝන්‍ය සුහදතාව ගොඩ නැගීම සඳහා ජීවිතයට සමීප චරිත නිරූපණය වන අයුරින් සරල භූමිකා රංගනවල යෙදෙයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය


## ක්‍රියාකාරකම 1

- නිවස, පාසල හා සමාජ පරිසරයේ දැකිය හැකි භූමිකා කිහිපයක් තෝරා ගන්න.
- එම භූමිකා ආශ්‍රයෙන් සිසුන් තමන් දන්නා ආකාරයට දෙමළ බසින් කුඩා දෙබස්වලට සහභාගි වීමට උනන්දු කරවන්න.
- භූමිකා රංගන සඳහා සිසුන් කණ්ඩායම් කරන්න.
- කණ්ඩායමක් රංගනයේ යෙදෙන විට, අන් සිසුන් හොඳින් සවන් දීමට යොමු කරන්න.
- ඉන් පසු අනෙක් කණ්ඩායම්වලට ද රඟ දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් ඉදිරිපත් කරන භූමිකා රංගන ඉදිරිපත් කිරීමට පෙර, පුහුණුව ලැබීමට අවශ්‍ය තරම් කාලය ලබා දෙන්න.
- පහත දී ඇති දෙබස් ආදර්ශ ලෙස සලකන්න.
- මෙවැනි දෙබස්/කතාබහවල යෙදීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් දැනට ඉගෙන ගෙන ඇති වචන හෝ දන්නා වචන හෝ භාවිත කිරීමට උනන්දු කරන්න.

උදාහරණ වශයෙන් දෙබස් කිහිපයක් පහත දැක්වේ.

சந்தையில் நடைபெறும் உரையாடல்
සන්දෛයිල් නඩෛපෙරුම් උරෛයාඩල්
වෙළෙඳ පොළක සිදුවන දෙබසක්

**தேங்காய் வியாபாரியும் சிறுவனும்**
තේංගායි වියාපාරියුම් සිරුවනුම්
පොල් වෙළෙන්දා සහ ළමයා



சிறுவன் : தேங்காய் என்ன விலை?
තේංගායි එන්න විලෛ?
ළමයා : පොල් මිල කීය ද?
வியாபாரி : முப்பது ரூபாய்.
මුප්පතු රූපායි.
වෙළෙන්දා : රුපියල් තිහයි.
சிறுவன் : விலையை குறைக்க முடியாதா?
විලෛයෛ කුරෛක්ක මුඩියාදා?
ළමයා : මිල අඩු කරන්න බැරි ද?
வியாபாரி : ஐந்து தேங்காய் வாங்கினால் விலை குறைப்பேன்.
අයින්දු තේංගායි වාංගිනාල් විලයි කුරෛප්පේන්.
වෙළෙන්දා : ගෙඩි පහක් ගත්තොත් මිල අඩු කරනවා
சிறுவன் : எத்தனை ரூபாய் குறைப்பீர்கள்?
එත්තනෛ රූපායි කුරෛප්පීර්හළ්?
ළමයා : රුපියල් කීයක් අඩු කරනවා ද?
வியாபாரி : ஒரு தேங்காய்க்கு இரண்டு ரூபாய்.
ඔරු තේංගායික්කු ඉරණ්ඩු රූපායි.
වෙළෙන්දා : එක පොල් ගෙඩියකට රුපියල් දෙකක්.
சிறுவன் : அதற்கு மேல் குறைக்க முடியாதா?
අදට්කු මේල් කුරෛක්ක මුඩියාදා?
ළමයා : ඊට වඩා අඩු කරන්න බැරි ද?
வியாபாரி : இதற்கு மேல் முடியாது தம்பி, எனக்கு நட்டம் ஏற்படும்
ඉදට්කු මේල් මුඩියාදු තම්බි, එනක්කු නට්ටම් එට්පඩුම්
වෙළෙන්දා : මීට වඩා බෑ මල්ලි, මට පාඩුවෙයි

சிறுவன் : சரி, நல்லதாக பெரியதாக ஐந்து தேங்காய் தாருங்கள்.
සරි, නල්ලදාහ පෙරියදාහ ඓන්දු තේංගායි තාරුංගළ්
ළමයා : හරි, හොඳවායින් ලොකු පොල් ගෙඩි පහක් දෙන්න.

**தாயும் மகளும்**
තායුම් මහළුම්
මව හා දුව



மகள் : அம்மா நாளை பாடசாலை விடுமுறை
මහල් : අම්මා නාළෛ පාඩසාලෛ විඩුමුරෛ
දුව : අම්මා හෙට පාසල් නිවාඩුයි
அம்மா : அதற்கு என்ன? அதனால் என்ன?
අදට්කු එන්න? අදනාල් එන්න?
අම්මා : ඉතින් මොක ද?
மகள் : மிருகக்காட்சி சாலைக்குப் போவோமா?
මහල් : මිරුහක්කාට්චි සාලෛක්කුප් පෝවෝමා
දුව : සත්ත්ව උද්‍යානයට යමුද?
அம்மா : அப்பா வேலை முடிந்து வந்ததும் கேள்!
අම්මා : අප්පා වේලයි මුඩින්දු වන්දදුම් කේළ්
අම්මා : තාත්තා වැඩ ඇරිලා ආවාම අහන්න
மகள் : அம்மா போக வருவீர்களா?
මහල් : අම්මා පෝහ වරුවීර්හළා?
දුව : අම්මා එනවා ද යන්න?
அம்மா : ஆம் நான் வருகிறேன்.
ආම් නාන් වරුහිරේන්.
අම්මා : ඔව් මම එන්නම්.
மகள் : அம்மா என்றால் அம்மா தான்.
මහල් : අම්මා එන්රාල් අම්මා තාන්.

| | | |
|---|---|---|
| දුව | : | අම්මා නම් හොඳ අම්මා. |
| அம்மா | : | நான் அப்பா வந்ததும் கேட்கிறேன். நාන් අප්පා වන්දදුම් කේට්කිරේන්. |
| අම්මා | : | මම තාත්තා ආවාම අහන්නම්. |

**ஆசிரியையும் மாணவியும்**
**ආසිරියෙයුම් මාණවියුම්**
**ගුරුතුමිය හා ශිෂ්‍යාව**



| | | |
|---|---|---|
| ஆசிரியை | : | கீதா ஏன் மூன்று நாட்களாக பாடசாலைக்கு வரவில்லை? |
| ආසිරියෙ | : | ගීතා ඒන් මූන්රු නාට්කළාහ පාඩසාලෙයික්කු වැරවිල්ලෙ? |
| ගුරුතුමිය | : | ගීතා ඇයි දින තුනක් පාසලට නොආවේ? |
| கீதா | : | காய்ச்சல் டீச்சர் කාය්ච්චල් ටීච්චර් |
| ගීතා | : | උණ හැදුනා ටීචර් |
| ஆசிரியை | : | வராததற்கு கடிதம் கொண்டு வந்தீர்களா? |
| ආසිරියෙ | : | වරාදදට්කු කඩිදම් කොණ්ඩු වන්දීර්හළා? |
| ගුරුතුමා | : | නොපැමිණීමට ලියුම් ගෙනාවාද? |
| கீதா | : | ஆம் டீச்சர் ආම් ටීච්චර් |
| ගීතා | : | ඔව් ටීචර් |
| ஆசிரியை | : | கொண்டு வந்து மேசையில் வையுங்கள். |
| ආසිරියෙ | : | කොණ්ඩු වන්දු මේසෙයිල් වෛයුංගළ් |
| ගුරුතුමිය | : | ගෙනැල්ලා මේසය උඩ තියන්න |

| | | |
|---|---|---|
| கீதா | : | சரி டீச்சர் සරි ටීච්චර් |
| ගීතා | : | හරි ටීචර් |

**නිපුණතාව**

★ පාසලේ ද්‍රව්‍ය, ස්ථාන සහ පුද්ගලයන් හඳුනාගෙන ප්‍රකාශ කරයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

- පාසලේ සිටින පුද්ගලයන් පිළිබඳ ව සිංහල බසින් සාකච්ඡා කරන්න. එම පුද්ගලයන් ගේ නම් හැඳින්වීමට යොමු කරන්න.
- එම නම් දෙමළ බසින් කීමට හැකි දැයි සිසුන්ගෙන් විමසන්න.
- පහත දැක්වෙන වචන දෙමළ බසින් බ්‍රිස්ටල් බෝඩ් පතක හෝ කළුලෑල්ලේ ලියා හෝ ප්‍රදර්ශනය කරන්න.

| | | |
|---|---|---|
| அதிபர் | - | අදිෆර් |
| ஆசிரியர் | - | ආසිරියර් |
| மாணவன் | - | මාණවන් |
| மாணவி | - | මාණවි |
| வகுப்பாசிரியர் | - | වහුප්පාසිරියර් |

- මෙම වචනවල අදහස එකිනෙක අවබෝධ කර දෙමින් ඒවා නිවැරදි ව උච්චාරණය කිරීමට සිසුන්ට මග පෙන්වන්න.

### ක්‍රියාකාරකම 2

- ක්‍රියාකාරකම 1 හි වචන පහ වෙන් වෙන් ව දෙමළ භාෂාවෙන් කාඩ්පත්වල ලියා ගන්න. මෙවැනි කාඩ්පත් සෑම සිසුවකුට ම එකක් බැගින් ලැබෙන සේ ප්‍රමාණවත් ව සකස් කරගන්න.
- සිසුන් සියලු දෙනා ම එක ම රවුමක සිට ගැනීමට සලස්වන්න. සෑම ශිෂ්‍යයකුට ම වචන කාඩ්පතක් බැගින් ලබා දෙන්න.
- ගුරුවරයා රවුමේ මැදට පැමිණ වචනයක් කී විට එම වචනය ලියන ලද කාඩ්පත් අත ඇති සියලු ම

සිසුන් රවුමේ මැද සිටින ගුරුවරයා වට කර ගත යුතු බවට උපදෙස් ලබා දෙන්න. පසුව ඔවුන් රැගෙන ආ කාඩ්පත කියවීමට මග පෙන්වන්න.

- මෙසේ සියලු ම වචන හුරු වන තුරු සිසුන් අතර කඩ්පත් හුවමාරු කරමින් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

## ක්‍රියාකාරකම 3

- පාසලේ ඇති ද්‍රව්‍ය පිළිබඳ ව සිංහල බසින් සාකච්ඡා කරන්න.
- එම ද්‍රව්‍ය සිංහල බසින් නම් කිරීමට යොමු කරන්න. ඒවා දෙමළ භාෂාවෙන් කිව හැකි දැයි සිසුන්ගෙන් විමසන්න. එම නම් කළුලෑල්ල මත ලියා දක්වන්න.

| | | |
|---|---|---|
| கதிரை | - | කදිරෛ |
| மேசை | - | මේසෛ |
| புத்தகம் | - | පුත්තහම් |
| பேனை | - | පේනෛ |
| பென்சில் | - | පෙන්සිල් |
| கரும்பலகை | - | කරුම්බලහෛ |
| வெண்கட்டி | - | වෙණ්කට්ටි |

- එම වචනවල අර්ථය අවබෝධ කර දී එකින් එක උච්චාරණය කර පෙන්වන්න. සිසුන්ට ද උච්චාරණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකම 2 හි හඳුන්වා දී ඇති ක්‍රීඩාව ආකාරයට ද මෙහි වචන හඳුන්වා දිය හැකි ය.

## ක්‍රියාකාරකම 4

- ක්‍රියාකාරකම 1, 2, 3 හි හඳුන්වා දෙන ලද වචනවලට අදාළ පින්තූර රැස් කරන්න. ඒවා වෙන වෙන ම කුඩා කාඩ්පත්වල අලවාගන්න.
- මෙසේ සකස් කළ කාඩ්පත් කුඩා පෙට්ටියකට දමන්න.
- සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න. කණ්ඩායම් දෙක A, B ලෙස නම් කරන්න. මෙම ක්‍රියාකාරකම තරගයක් ලෙස සංවිධානය කර ගන්න.
- A කණ්ඩායමේ සිසුවෙක් කාඩ්පතක් ගෙන B කණ්ඩායමේ කිසියම් සිසුවකුට පෙන්වමින් කාඩ්පතේ ඇති රූපයට අදාළ නම දෙමළ බසින් ඇසිය යුතුය. එවිට B කණ්ඩායමේ සිසුවා නිවැරදි පිළිතුර දෙමළ බසින් දිය යුතුය. එසේ නිවැරදි ව කී විට ඔහුට ලකුණක් හිමි වේ.
- මෙසේ වරකට එක් අයකුගෙන් එක් ප්‍රශ්නයක්වත් ඇසිය යුතුය. ඉන් පසුව එම කාඩ්පත නැවත පෙට්ටියට දමා මිශ්‍ර කර වෙනත් කාඩ්පතක් ගෙන වෙනත් සිසුවකුගෙන් විමසිය යුතුය.
- ඊළඟ වාරයේ දී පළමුව ප්‍රශ්න ඇසූ කණ්ඩායම පිළිතුරු සපයන කණ්ඩායම ලෙස ක්‍රියා කළ යුතුයි. සෑම සිසුවෙක් ම එක් අවස්ථාවක හෝ ප්‍රශ්න අසන්නා හා පිළිතුරු සපයන්නා බවට පත්විය යුතුයි. මේ ආකාරයට ක්‍රියාකාරකම දිගට ම පැවැත්විය හැකිය.
- වැඩි ලකුණු ගත් කණ්ඩායම ජයග්‍රාහී කණ්ඩායම වේ.
- සහභාගි වූ සියලු ම සිසුන් අගයන්න.

## ක්‍රියාකාරකම 5

- පාසලේ ඇති ස්ථාන හඳුන්වා දීම සඳහා එම ස්ථාන පෙන්වන පින්තූර රැස් කරන්න. ඒවා වෙන් වෙන් ව කුඩා කාඩ්පත්වල අලවා ගන්න. එම රූපවලට අදාළ වචන කළුලෑල්ල මත ලියා දක්වන්න. ඒවායේ අර්ථය සිසුන්ට පැහැදිලි කරන්න.
- වරකට පින්තූරයක් බැගින් පෙන්වමින් එහි නම සිංහල බසින් අසා, එය දෙමළ බසින් කීමට සිසුන්ට මග පෙන්වන්න.

| | | |
|---|---|---|
| காரியாலயம் | - | කාරියාලයම් |
| நூலகம் | - | නූලහම් |
| கணினிக்கூடம் | - | කණිනික්කූඩම් |
| விஞ்ஞானகூடம் | - | විඤ්ඤානකූඩම් |
| மலசலகூடம் | - | මැලසැලකූඩම් |
| விளையாட்டு மைதானம் | - | විළෛයාට්ටු මෛදානම් |

නිවැරදි වචන උච්චාරණය සඳහා සිසුන්ට මග පෙන්වන්න.

## ක්‍රියාකාරකම 6

- සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න.
- හඳුන්වා දිය යුතු ස්ථාන දක්වන වචන දෙමළ බසින් ලියා කාඩ්පත් කිහිපයක් සුදානම් කර ගන්න.
- වචන කාඩ්පත්, පෙට්ටියක දමා ගන්න. සිසුන් කණ්ඩායම් දෙකකට බෙදී දෙපැත්තේ සිටීමට සලස්වන්න. වරකට එක් සිසුවෙක් එක් කණ්ඩායමකින් පැමිණ කාඩ්පතක් ගෙන කියවා එහි තේරුම සිංහල බසින් කීමට යොමු කරන්න. කියවූ කාඩ්පත පසෙකින් තබන්න. කාඩ්පත් සියල්ල භාවිත කර අවසන් වූ පසු ඒවා නැවත පෙට්ටියට දමන්න. කිසියම් කණ්ඩායමකින් පැමිණි අයෙක් නිවැරදි ව පිළිතුරු දුන්නේ නම් ඔහුට ලකුණක් හිමි වේ. කියවීමට නොහැකි වුවා නම් ඒ කණ්ඩායමේ ඊළඟ සාමාජිකයාට අවස්ථාව ලබා දෙන්න.
- මෙසේ කණ්ඩායමේ සිටින සියල්ලන්ට ම අවස්ථාව ලබා දිය යුතුය.
- වැඩි ලකුණු හිමි කර ගන්නා කණ්ඩායම ජයග්‍රාහී කණ්ඩායමයි.
- සහභාගි වන සියලු ම සිසුන් අගයන්න.

අර්ථය

| | | |
|---|---|---|
| அதிபர் | - | විදුහල්පති |
| ஆசிரியர் | - | ගුරුවරයා |
| மாணவன் | - | ශිෂ්‍යයා |
| மாணவி | - | ශිෂ්‍යාව |
| வகுப்பாசிரியை | - | පන්ති භාර ගුරුතුමී |
| காரியாலயம் | - | කාර්යාලය |
| நூலகம் | - | පුස්තකලය |
| கணினிக்கூடம் | - | පරිගණකාගාරය |


### නිපුණතාව

★ පින්තූරයක දැක්වෙන සිද්ධියකින් හෝ අවස්ථාවකින් හෝ නිරූපණය වන දේ හඳුනාගෙන ප්‍රකාශ කරයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

## ක්‍රියාකාරකම 1

- කණ්ඩායම්වලට බෙදා දීමට සෑහෙන ප්‍රමාණයෙන් පහත රූපය පිටපත් කර ගන්න.



- පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදා ගන්න.
- සෑම කණ්ඩායමට ම රූපයේ පිටපත බැගින් ලබා දෙන්න.
- කණ්ඩායම මැදින් රූපය තබා නිරීක්ෂණය කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- සෑම කණ්ඩායමක් ම ඉදිරියට පැමිණ තමා රූපයේ හඳුනා ගත් ඒවායේ නම් දෙමළෙන් කීමට යොමු කරන්න.

උදාහරණ :

| | |
|---|---|
| மாங்காய் | මාංගායි |
| மரம் | මරම් |
| நாய் | නායි |
| தென்னை மரம் | තෙන්නෛ මරම් |
| வீடு | වීඩු |
| பஸ் | බස් |
| அணில் | අණිල් |
| குருவி | කුරුවි |

- මෙවැනි වචන හෝ පින්තූරයේ ඇති වෙනත් වචන ළමයා කියයි නම් එය අගය කරන්න.

## ක්‍රියාකාරකම 2

- ඉහත ඇති වචනවලට අදාළ වචන ලියු කාඩ්පත් සූදානම් කරන්න. වචන කාඩ්පත් ගොනුව කුඩා පෙට්ටියක දමන්න. සෑම කණ්ඩායමකට ම පෙට්ටියක් බැගින් ලබා දෙන්න.
  අහඹු ලෙස වචනය බැගින් ගෙන කණ්ඩායම් ඉදිරියේ කියවීමට අවස්ථාව ලබා දෙන්න. සෑම ශිෂ්‍යයකුට ම සෑම වචනය ම කියවීමට අවස්ථාව ලබා දෙන්න.



## ක්‍රියාකාරකම 3

- සිසුන් තෝරාගත් වචනයක් යොදා වාක්‍ය තනා දෙමළ භාෂාවෙන් කීමට සිසුන් යොමු කරන්න.
  උදාහරණ :
  மாங்காய் சுவையானது.මාංගායි සුවෛයානදු.
  பஸ் போகிறது.බස් පෝහිරදු.
  பிள்ளைகள் விளையாடுகின்றார்கள்
  පිළ්ළෛගළ් විළෛයාඩුහින්රාර්හළ්.
  சூரியன் உதிக்கிறது. සූරියන් උදික්කිරදු.
  அப்பா வேலைக்கு போகிறார்.
  අප්පා වේලෛක්කු පෝගිරාර්.
  அம்மா வீட்டுக்கு வருகிறார்.
  අම්මා වීට්ටුක්කු වරුහිරාර්.
  මෙවැනි වාක්‍ය කීමට සිසුන් යොමු කරන්න.

## ක්‍රියාකාරකම 4

- සිසුන් අඩ කවයක් ආකාරයට සිටීමට සලස්වන්න.
- පොළක් පැවැත්වෙන අවස්ථාවක දී දැක ඇති දේ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- පහත දැක්වෙන ආකාරයේ පොළක රූප සටහනක් විශාල ප්‍රමාණයෙන් සකස් කර පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

- රූපයේ දක්නට ලැබෙන දේවල් සහ ක්‍රියාකාරකම් ආදිය හඳුනා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- තමන් හඳුනා ගත් දේවල් දෙමළ භාෂාවෙන් ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.
  උදාහරණ :
  தேங்காய் තේංගායි
  அன்னாசி අන්නාසි
  வாழைப்பழம் වාළෛප්පලම්
  சைக்கிள் සෛක්කිළ්
  பொருட்கள் நிறுக்கிறார்
  පොරුට්කළ් නිරුක්කිරාර්
  பொருட்கள் வாங்குகிறார்
  පොරුට්කළ් වාංගුහිරාර්
  மனிதர்கள் சந்தைக்கு வருகிறார்
  මනිදර්හළ් සන්දෛක්කු වරුහිරාර්හළ්

## ක්‍රියාකාරකම 5


- රූපයේ පෙනෙන ද්‍රව්‍යවල නම් ඇතුළත් කාඩ්පත් කිහිපයක් සූදානම් කර ගන්න. සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න. A, B ලෙස නම් කරන්න.
- කාඩ්පත් කණ්ඩායම් දෙක මැද අකුරු නොපෙනෙ සේ මුනින් අතට හරවා තබන්න. A කණ්ඩායමේ ශිෂ්‍යයෙක් කාඩ්පතක් ඇරගෙන වචනයක් කී විට B කණ්ඩායමේ ශිෂ්‍යයෙක් එම වචනයට ගැළපෙන වාක්‍යය දෙමළ භාෂාවෙන් සකසා ඉදිරිපත් කළ යුතු බව පවසන්න. එම ශිෂ්‍යයාට පිළිතුරු දීමට නොහැකි වුවහොත් වෙනත් ශිෂ්‍යයකුට අවස්ථාව ලබා දෙන්න.

ඉන්පසු B කණ්ඩායමේ ශිෂ්‍යයෙක් ද කාඩ්පතක් රැගෙන A කණ්ඩායමේ ශිෂ්‍යයෙකුට එය පෙන් වූ විට ඔහු/ඇය ද වාක්‍යයක් ගොඩනගා කිව යුතුයි. මෙසේ කාඩ්පත් ගොඩෙන් ගන්නා ලද වචන වෙන් කර තැබිය යුතුය.

- මේ ආකාරයට සෑම ශිෂ්‍යයකු ම අවම වශයෙන් එක් වාක්‍යයක්වත් සකස් කිරීමට යොමු කරන්න.

## ක්‍රියාකාරකම 6

- සිසුන් අඩ කවයක් ආකාරයට වාඩිවීමට සලස්වන්න.
- පාසලේ දක්නට ඇති ස්ථාන ගැන සාකච්ඡා කරන්න.
- පාසලේ සිටින අය ගැන සාකච්ඡා කරන්න.
- දී ඇති රූපයේ විශාල කරන ලද පිටපතක් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.



- රූපයේ දක්නට ලැබෙන ස්ථාන/පුද්ගලයන් වැනි අය හඳුනාගෙන දෙමළ භාෂාවෙන් කීමට යොමු කරන්න.

උදාහරණ :

காரியாலயம் කාරියාලයම්
வகுப்பறை වකුප්පරෛ
அதிபர் අදිෆර්
ஆசிரியர் ආසිරියර්
மாணவன் මාණවන්
மாணவி මාණවි
ஆய்வுகூடம் ආය්වුකූඩම්
நூலகம் නූලහම්
சிற்றுண்டிச்சாலை සිට්රුණ්ඩිච්චාලෛ
விளையாட்டு மைதானம் විළෛයාට්ටු මෛදානම්

## ක්‍රියාකාරකම 7

- ඉහත රූපයේ පෙන්වා ඇති ස්ථානවල නම් ලියන ලද කාඩ්පත් සකස් කරන්න.
- එම කාඩ්පත් පෙට්ටියක දමා සිසුන්ට ලබා දෙන්න. සෑම ශිෂ්‍යයකුට ම තමාට ලැබුණු වචනය යොදා ගනිමින් වාක්‍යයක් දෙමළ භාෂාවෙන් සකසා නිවැරදි ව කීමට යොමු කරන්න.
- සෑම ශිෂ්‍යයකුට ම මෙම ක්‍රියාකාරකමේ යෙදීමට අවස්ථාව ලබා දෙන්න.

අර්ථය

மாங்காய் අඹ
மரம் ගස
நாய் බල්ලා
தென்னை மரம் පොල් ගස
மாங்காய் சுவையானது අඹ රසයි
பஸ் போகிறது බස් යනවා
பிள்ளைகள் விளையாடுகின்றார்கள் ළමයි සෙල්ලම් කරනවා
சூரியன் உதிக்கிறது ඉර පායනවා
அப்பா வேலைக்கு போகிறார் තාත්තා වැඩට යනවා
அம்மா வீட்டுக்கு வருகிறார் අම්මා ගෙදර එනවා
தேங்காய் පොල්
அன்னாசி අන්නාසි
பொருட்கள் நிறுக்கிறார் බඩු කිරනවා
பொருட்கள் வாங்குகிறார் බඩු මිලදී ගන්නවා
மனிதர்கள் சந்தைக்கு வருகிறார்கள் මිනිස්සු පොළට එනවා
சிற்றுண்டிச்சாலை ආපනශාලාව
விளையாட்டு மைதானம் ක්‍රීඩාපිටිය

### නිපුණතාව

★ දෙමළ අක්ෂරමාලාව හඳුනා ගනිමින් ඒවායේ සම්මත රටා නිවැරදිව භාවිත කරයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

- ප්‍රථමයෙන් ස්වර අකුරු පන්තියට හඳුන්වා දෙන්න.
- ඒ සඳහා පහත සඳහන් අකුරු භාෂා දෙකෙන් ම තරමක් ලොකුවට කඩදාසියක හෝ කාඩ්බෝඩ් පතක ලියා සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

ස්වර අකුරු

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| அ | ஆ | | | இ | ஈ | உ |
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ | උ |
| ඌ | எ | ஏ | ஐ | ஒ | ஓ | ஔ |
| ஊ | එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |

- මේවායේ උච්චාරණය සියලු ම සිසුන්ට අවබෝධ වන සේ ඉදිරිපත් කරන්න. සිසුන්ට ද උච්චාරණයට අවස්ථා ලබා දෙන්න. ප්‍රදර්ශනය කළ කාඩ්පත දෙස බලා කුඩා කණ්ඩායම් ලෙස හෝ දෙදෙනා බැගින් හෝ වෙන වෙන ම අකුරු උච්චාරණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිංහල බසින් ඇති සමහර අකුරු දෙමළ බසෙහි නැති බව වටහා දෙන්න.

### ක්‍රියාකාරකම 2

- සිසුන් කණ්ඩායම් කරන්න.
- කලින් හඳුන්වා දුන් දෙමළ ස්වර අක්ෂර පහත දැක්වෙන ආකාරයට වෙන් වෙන් වශයෙන් කාඩ්පත්වල ලියා එක් එක් කණ්ඩායමට එක් එක් ගොනුවක් ලබා දීමට හැකි අයුරින් සකස් කරගන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| அ | ஆ | இ | ஈ | உ | ஊ |
| எ | ஏ | ஐ | ஒ | ஓ | ஔ |

- සෑම කණ්ඩායමක් සතුව ම ස්වර අකුරු සියල්ල ම සහිත එක් කාඩ්පතක් හා වෙන වෙන ම අකුරු ලියන ලද කාඩ්පත් ගොනුවක් ද තිබිය යුතුය.
- අකුරු සියල්ල සහිත කාඩ්පත කණ්ඩායම් මැදින් තැබීමට ද තනි අකුරු වෙන ම තැබීමට ද උපදෙස් දෙන්න.
- ගුරුවරයා අකුරක් අහඹු ලෙස කී විට සිසුන් අකුරු සහිත කාඩ්පත් කට්ටලයෙන් එම අකුර තෝරා අකුරු සියල්ල සහිත කාඩ්පතේ අදාළ අකුරට උඩින් තැබිය යුතු බව පවසන්න.
- මෙසේ කිහිප වාරයක් ක්‍රියාකාරකම සිදු කර අකුරු හඳුනා ගැනීමට සිසුන්ට මග පෙන්වන්න.

### ක්‍රියාකාරකම 3

- ස්වර අකුරු ලියන ආකාරය මුළු පන්තියට ම හඳුන්වා දෙන්න.
- පහත ක්‍රමය නිරීක්ෂණය කර අකුරු ලිවීමට මග පෙන්වන්න.

උදාහරණ :



- පසුව තම කණ්ඩායමට ලබා දුන් කාඩ්පත් දෙස බලා ප්‍රාණ අක්ෂර ලිවීමට මග පෙන්වන්න.

## ක්‍රියාකාරකම 4

- ව්‍යඤ්ජන අකුරු මුළු පන්තියට ම හඳුන්වා දීම සඳහා භාෂා දෙකින් ම තරමක් ලොකු අකුරින් සියලු ම ව්‍යඤ්ජන අකුරු අඩංගු වන සේ කාඩ්පතක් සකස් කර ගන්න.

ව්‍යඤ්ජන අකුරු

| | | | | | |
|---|---|---|---|---|---|
| க | ங | ச | ஞ | ட | ண |
| ක | ඞ | ස | ඤ | ඩ | ණ |
| த | ந | ப | ம | ய | ர |
| ත | න | ප | ම | ය | ර |
| ல | வ | ள | ழ | ற | ன |
| ල | ව | ළ | ළ | ර | න |

- මෙහි නිතර භාවිත කරන අක්ෂර පමණක් ප්‍රථමයෙන් හඳුන්වන්න.
  උදාහරණ :
  க ச ட ண த ப ம ய ர

- මෙම අකුරුවල උච්චාරණය සියල්ලන්ට ම වැටහෙන සේ කියා පෙන්වන්න. සිසුන්ට ද කීමට සලස්වන්න.

## ක්‍රියාකාරකම 5

- ව්‍යඤ්ජන අකුරු හඳුන්වා දීම සඳහා කාඩ්පත් සකස් කර ගන්න.
- මෙහි දී හඳුන්වා දෙන අකුරු වෙන වෙන ම කුඩා කාඩ්පත්වල ලියා ගන්න. එක් අකුරකින් කාඩ්පත් 12, 15ක් පමණ සාදා ගත යුතුයි.
- සිසුන් රවුමක ආකාරයට සිට ගැනීමට සලස්වන්න.
- අකුරු ලියන ලද කාඩ්පත් මිශ්‍ර කර සෑම සිසුවකුට ම අකුරු කාඩ්පත් කීපයක් බැගින් ලැබෙන සේ බෙදා දෙන්න.
- ගුරුවරයා රවුමේ මැද සිට අකුරක් උච්චාරණය කළ විට එම අකුර සහිත කාඩ්පත ඇති සිසුන් ගුරුවරයා දෙසට දිව ආ යුතුයි.
- සිසුන් ගෙන ආ අකුරු නිරීක්ෂණය කර නිවැරදි කිරීමට අවශ්‍ය අවස්ථාවක් වෙතොත් එසේ කරන්න.
- මේ ආකාරයට සියලු අකුරු හඳුන්වා දෙන්න.
- සෑම අකුරකින් ම එක කාඩ්පත බැගින් වන සේ කාඩ්පත් කට්ටලයක් සෑම කණ්ඩායමකට ම ලබා දෙන්න.
- ඒවා බලා තම අභ්‍යාස පොතේ ලිවීමට සිසුන්ට මග පෙන්වන්න.

## ක්‍රියාකාරකම 6

- ක්‍රියාකාරකම් 5 හි අකුරු හඳුන්වා දුන් අයුරින් ඉතිරි අකුරු ද හඳුන්වා දෙන්න.
  ඒවා ලිවීමට මග පෙන්වන්න.

**නිපුණතාව**

★ දෙමළ භාෂාවේ සමහර අක්ෂරවලින් විවිධ ශබ්ද උත්පාදනය වන බව අවබෝධ කරගෙන අදාළ අවස්ථාවල දී එම අක්ෂර නිවැරදි ව භාවිත කරයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

## ක්‍රියාකාරකම 1

- පහත සඳහන් දෙමළ අකුරු පමණක් කඩදාසියක හෝ කළුලෑල්ලේ ලියා ප්‍රදර්ශනය කරන්න.

க ச ப ட த

- ඒවා එකින් එක උච්චාරණය කර පෙන්වන්න.
- ඉහත සඳහන් අකුරුවල ශබ්දය ලබා දෙන වචන ඇතුළත් වගුවක් සකස් කර ප්‍රදර්ශනය කරන්න.

| | | |
|---|---|---|
| கத்தி | කත්ති | පිහිය |
| கப்பல் | කප්පල් | නැව |
| கடவுள் | කඩවුළ් | දෙවියා |
| கல்வி | කල්වි | අධ්‍යාපනය |
| கடலை | කඩලෛ | කඩල |

| | | |
|---|---|---|
| படம் | පඩම් | පින්තූරය |
| பட்டம் | පට්ටම් | සරුංගලය |
| பதம் | පදම් | වචනය |
| பங்கு | පංගු | කොටස් |
| பசி | පසි | බඩගිනි |

| | | |
|---|---|---|
| சங்கு | සංගු | හක්ගෙඩිය |
| சட்டை | සට්ටෛ | හැට්ටය |
| சல்லி | සල්ලි | කාසි |
| சண்டை | සණ්ඩෛ | රණ්ඩුව |
| சட்டி | සට්ටි | හට්ටිය |

| | | |
|---|---|---|
| பட்டம் | පට්ටම් | සරුංගලය |
| சட்டம் | සට්ටම් | නීතිය |
| கட்டம் | කට්ටම් | කොටුව |
| மட்டம் | මට්ටම් | මට්ටම |
| திட்டம் | තිට්ටම් | සැලසුම |

| | | |
|---|---|---|
| தம்பி | තම්බි | මල්ලි |
| தங்கை | තංගයි | නංගි |
| தந்தை | තන්දෛ | තාත්තා |
| தாய் | තායි | අම්මා |
| தகப்பன் | තහප්පන් | තාත්තා |

- ඉහත සඳහන් වචන නිවැරදි ව උච්චාරණය කර පෙන්වන්න.
- ඉහත එක් එක් වචන ගොනුවලින් க, ச, ப, ட, த යන අකුරු සෘජුවම උච්චාරණය වන බව හඳුන්වා දෙන්න.
- පසුව පහත සඳහන් වගුව ද සකස් කර ළමයින්ට ඉදිරිපත් කරන්න.

| | | | |
|---|---|---|---|
| கத்தி | කත්ති | ක | පිහිය |
| தங்கம் | තංගම් | ග | රත්තරං |
| காகம் | කාහම් | හ | කපුටා |

- දෙමළ භාෂාවේ එක ම අකුර විවිධ අවස්ථාවල භාවිත වන නමුත් එය අවස්ථාව අනුව විවිධ ශබ්ද ලබා දෙන බව ඉහත වගුව ඇසුරෙන් පෙන්වා දෙන්න.
- පහත සඳහන් උදාහරණ ඇසුරින් එය තව දුරටත් තහවුරු කරන්න.

| | | | |
|---|---|---|---|
| பந்து | පන්දු | ප | බෝලය |
| குடும்பம் | කුඩුම්බම් | බ | පවුල |
| அனுபவம் | අනුභවම් | භ | අත්දැකීම |

| | | | |
|---|---|---|---|
| சங்கு | සංගු | ස | හක්ගෙඩිය |
| பச்சை | පච්චෛයි | ච | කොළ පාට |

| | | | |
|---|---|---|---|
| பட்டம் | පට්ටම් | ට | සරුංගලය |
| படம் | පඩම් | ඩ | පින්තූරය |

| | | | |
|---|---|---|---|
| தம்பி | තම්බි | ත | මල්ලී |
| கதவு | කදවු | ද | දොර |

- ඉහත වචන තුළින් අදාළ අකුරු හඳුන්වා දීම සඳහා සුදුසු ක්‍රීඩාවක් හෝ සුදුසු ක්‍රියාකාරකමක් සකස් කළ හැකිය.

  උදාහරණ :

  සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.

  හඳුන්වා දෙන ලද අකුරු සහිත වචන කාඩ්පත් කට්ටල සකස් කරගන්න.

  එක් එක් කණ්ඩායමට වචන කට්ටලය බැගින් දෙන්න.
- ඉන් පසු ගුරුවරයා ක, ග, හ, ප, බ, භ, ස, ච, ට, ඩ, ත, ද එම අකුරු ශබ්දයෙන් නැගෙන දෙමළ වචන උච්චාරණය කරන්න. එවිට කණ්ඩායම් විසින් නිවැරදි වචනය පෙන්විය යුතුයි.

- හරි වචනය පෙන්වන කණ්ඩායමට එක වචනයට එක ලකුණ බැගින් ලබා දෙන්න. වැඩි ලකුණු ලබා ගත් කණ්ඩායම ජයග්‍රාහී කණ්ඩායම වේ.
- සහභාගි වූ සියලු සිසුන් අගය කරන්න.
- ඉහත සඳහන් වචන සියල්ල ක්‍රියාකාරකම් තුනකට හෝ හතරකට හෝ අදාළ පරිදි වෙන් කර ගෙන හඳුන්වා දෙන්න.

**නිපුණතාව**

★ පිල්ලම් සහිත සරල වචන ලියයි

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

- දී ඇති වචන ඕමයි කඩදාසියක/කළුලෑල්ලේ, කාඩ්බෝඩ් එකක ලියා සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

அரிசி - ඇරිසි
மா - මා
சீனி - සීනි
உப்பு - උප්පු
அம்மி - අම්මි
சட்டி - සට්ටි
கத்தி - කත්ති
வட்டம் - වට්ටම්
சட்டை - සට්ටෛ
புத்தகம் - පුත්තහම්

- මෙම වචන උච්චාරණය කර පෙන්වන්න. සිසුන් ලවා උච්චාරණය කර කියවීමට සලස්වන්න. ඉන්පසු සිසුන් රවුමක සිට ගැනීමට සලස්වන්න. අහඹු ලෙස සිසුවකු තෝරා අදාළ අකුර හෝ වචනය කියවා කළුලෑල්ලේ ලිවීමට සලස්වන්න.
- පසුව ප්‍රදර්ශනය කළ වචන තම අභ්‍යාස පොත්වල ලියා ගැනීමට සිසුන් යොමු කරන්න. හැකි පමණින් අක්ෂර වින්‍යාසය අනුගමනය කිරීමට මග පෙන්වන්න.

**අර්ථය**

அரிசி - හාල්
மா - පිටි
சீனி - සීනි
உப்பு - ලුණු
அம்மி - මිරිස් ගල
சட்டி - හට්ටිය
கத்தி - පිහිය
வட்டம் - රවුම
சட்டை - කමිසය
புத்தகம் - පොත

**නිපුණතාව**

★ එදිනෙදා ව්‍යවහාර වන සරල වාක්‍ය ගොඩනගා ප්‍රකාශ කරයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

- එදිනෙදා තොරතුරු හුවමාරුව සඳහා භාවිත කරන සරල වාක්‍ය කිහිපයක් සිසුන්ට හඳුන්වා දෙන්න.

நாங்கள் பாடசாலைக்கு போவோம்.
නාංගළ් පාඩසාලෛක්කුප් පෝවෝම්.
நாங்கள் விளையாடுவோம்.
නාංගළ් විළෛයාඩුවෝම්.
மணி அடிக்கிறார்கள்.
මණි අඩික්කිරාර්හළ්.
அதோ ஆசிரியர் வருகிறார்.
අදෝ ආසිරියර් වරුහිරාර්.
நான் படிக்கின்றேன்.
නාන් පඩික්කින්රේන්.
பஸ் வந்துள்ளது.
බස් වන්දුළ්ළදු.
அண்ணா கடைக்குப் போனார்.
අණ්ණා කඩෛක්කුප් පෝනාර්

நாங்கள் சோறு சாப்பிடுவோம்.
නාංගළ් සෝරු සාප්පිඩුවෝම්.
அம்மா தண்ணீர் கொண்டுவந்தார்.
අම්මා තණ්ණීර් කොණ්ඩුවන්දාර්.
நாங்கள் தண்ணீர் குடிப்போம்.
නාංගළ් තණ්ණීර් කුඩිප්පෝම්.

- ඉහත සඳහන් වාක්‍ය කළුලෑල්ලේ හෝ ඩිමයි කඩදාසියක හෝ ලියා ප්‍රදර්ශනය කරන්න. ඒවායේ අර්ථය පහදා දී නිවැරදි ව උච්චාරණය කර පෙන්වන්න. සිසුන්ට ද ඒ සඳහා අවස්ථා ලබා දෙන්න.

## ක්‍රියාකාරකම 2

- ඉහත සඳහන් වාක්‍ය එක් කාඩ්පතක එක බැගින් දෙමළ භාෂාවෙන් ලියා සකස් කරගන්න. එම වාක්‍යවල උච්චාරණය සිංහල භාෂාවෙන් ද වෙනත් කාඩ්පත්වල වෙන වෙන ම ලියා සකස් කරගන්න. එහි අදහස එම කාඩ්පතේ පිටුපස සටහන් කරන්න.
- සිංහලෙන් හා දෙමළෙන් සකස් කර ගන්නා කාඩ්පත් කණ්ඩායම්වලට ප්‍රමාණවත් ආකාරයෙන් සකස් කර ගන්න.
- සිසුන් කණ්ඩායම් 3/4 බෙදන්න. සිසුන්ට රවුමක් ආකාරයට සිටීමට සලස්වා සෑම කණ්ඩායමකින් ම එක් සිසුවෙක් තම රවුමේ මැදට කැඳවන්න.
- රවුම මැද මේසයක් තබා සිංහලෙන් ලියන ලද කාඩ්පත් මුණින් අතට හරවා තබන්න.
- දෙමළ භාෂාවෙන් ලියන ලද කාඩ්පත් කණ්ඩායමේ සෑම සිසුවකුට ම ලැබෙන සේ බෙදා දෙන්න. කණ්ඩායමේ මැද සිටින සිසුවා මේසය මත ඇති කාඩ්පත් අතුරින් එකක් රැගෙන ශබ්ද නගා කියවිය යුතුය.
- අන් අයට එයට සවන් දී අවබෝධ කරගෙන එම අදහස දෙමළ බසින් ලියන ලද කාඩ්පත සහිත සිසුවා ඉදිරියට පැමිණ අනෙක් සිසුන්ට ද ඇසෙන සේ ශබ්ද නගා කියවිය යුතු බවට උපදෙස් ලබා දෙන්න.
- කාඩ්පත කියවා අවසානයේ එම කාඩ්පත කණ්ඩායමේ මැද සිටින සිසුවාට ලබා දී නැවත රවුමට යා යුතුයි.
- කියවන ලද කාඩ්පත් එක් පැත්තකින් තබා ගන්නා ලෙස රවුම මැද සිටින සිසුවාට උපදෙස් ලබා දෙන්න.
- නැවත රවුම මැද සිටින සිසුවා තවත් කාඩ්පතක් රැගෙන කියවූ විට කණ්ඩායමේ සිසුන් කලින් ආකාරයට ම ක්‍රියා කළ යුතුයි.
- අවසානයේ දී රවුමේ මැද සිටින සිසුවා රවුමට එක් වී වෙනත් සිසුවෙක් රවුම මැදට පැමිණිය හැකිය.
- මේ ආකාරයට සියලු ම සිසුන්ට ක්‍රියාකාරකමේ යෙදීමට අවස්ථාව ලබා දෙන්න.

අර්ථය

நாங்கள் பாடசாலைக்குப் போவோம்.
අපි පාසලට යමු
நாங்கள் விளையாடுவோம்.
අපි සෙල්ලම් කරමු
மணி அடிக்கிறார்கள்.
සීනුව ගහනවා
அதோ ஆசிரியர் வருகிறார்.
අන්න ගුරුතුමා එනවා
நான் படிக்கின்றேன்.
මම පාඩම් කරනවා
பஸ் வந்துள்ளது.
බස් එක ඇවිල්ලා
அண்ணா கடைக்குப் போனார்.
අයියා කඩයට ගියා
நாங்கள் சோறு சாப்பிடுவோம்.
අපි බත් කමු
அம்மா தண்ணீர் கொண்டுவந்தார்
අම්මා වතුර ගෙනාවා
நாங்கள் தண்ணீர் குடிப்போம்.
අපි වතුර බොමු

නිපුණතාව

★ සරල වචන භාවිත කරමින් වාක්‍ය ගොඩනගා ලිඛිත ව ප්‍රකාශ කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

## ක්‍රියාකාරකම 1

- එක් කණ්ඩායමකට සිසුන් පස්දෙනකු හෝ හය දෙනකු බැගින් වන සේ පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදා ගන්න.
- පහත දැක්වෙන එක් එක් වචනයක් සඳහා කාඩ්පත බැගින් කාඩ්පත් කට්ටල කිහිපයක් දෙමළ භාෂාවෙන් සකස් කර ගන්න.

| | | |
|---|---|---|
| நிறம் | - | නිරම් |
| சோறு | - | සෝරු |
| இது | - | ඉදු |
| கிளி | - | කිළි |
| எனது | - | එනදු |
| பச்சை | - | පච්චෛ |
| குடியுங்கள் | - | කුඩියුංගළ් |
| பாடசாலை | - | පාඩසාලෛ |
| பால் | - | පාල් |
| அம்மா | - | අම්මා |
| மேசை | - | මේසෛ |
| பாடம் | - | පාඩම් |
| வாருங்கள் | - | වාරුංගළ් |
| சாப்பிடுங்கள் | - | සාප්පිඩුංගළ් |
| சொல்லுங்கள் | - | සොල්ලුංගළ් |

- සෑම කණ්ඩායමකට ම කාඩ්පත් කට්ටලය බැගින් ලබා දෙන්න.
- දෙන ලද කාඩ්පත්වල සඳහන් වචන කියවා අවබෝධ කර ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- දෙන ලද කාඩ්පත්වල සඳහන් වචන දෙකක් හෝ තුනක් හෝ යොදා සරල වාක්‍යයක් තැනීමට සිසුන් කණ්ඩායම් වශයෙන් යොමු කරන්න.

උදාහරණ :

| | | |
|---|---|---|
| இது | எனது | பாடசாலை |
| கிளி | பச்சை | நிறம் |
| பால் | குடியுங்கள் | |

- වචන කට්ටලය භාවිත කරමින් කණ්ඩායම් වශයෙන්, දෙදෙනා බැගින් හා තනිව මෙවැනි වාක්‍ය ගොඩ නැගීමට අවස්ථාව ලබා දෙන්න.
- ගොඩ නගන ලද වාක්‍ය අනෙක් සිසුන්ට ද ඇසෙන සේ ශබ්ද නගා කියවීමට යොමු කරන්න.
- නිවැරදි ව වාක්‍ය ගොඩනගා කියවූ සියලු ම සිසුන් අගය කරන්න.

## ක්‍රියාකාරකම 2

- එක් එක් කණ්ඩායම විසින් ගොඩ නගන ලද වාක්‍ය අභ්‍යාස පොත්වල සටහන් කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

අර්ථය

| | | |
|---|---|---|
| நிறம் | - | පාට |
| சோறு | - | බත් |
| இது | - | මෙය |
| கிளி | - | ගිරවා |
| எனது | - | මගේ |
| பச்சை | - | කොළ පාට |
| குடியுங்கள் | - | බොන්න |
| பாடசாலை | - | පාසල |
| பால் | - | කිරි |
| அம்மா | - | අම්මා |
| மேசை | - | මේසය |
| பாடம் | - | පාඩම |
| வாருங்கள் | - | එන්න |
| சாப்பிடுங்கள் | - | කන්න |
| சொல்லுங்கள் | - | කියන්න |

| | அ | ஆ | இ | ஈ | உ | ஊ | எ | ஏ | ஐ | ஒ | ஓ | ஔ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| க் | க | கா | கி | கீ | கு | கூ | கெ | கே | கை | கொ | கோ | கௌ |
| ங் | ங | ஙா | ஙி | ஙீ | ஙு | ஙூ | ஙெ | ஙே | ஙை | ஙொ | ஙோ | ஙௌ |
| ச் | ச | சா | சி | சீ | சு | சூ | செ | சே | சை | சொ | சோ | சௌ |
| ஞ் | ஞ | ஞா | ஞி | ஞீ | ஞு | ஞூ | ஞெ | ஞே | ஞை | ஞொ | ஞோ | ஞௌ |
| ட் | ட | டா | டி | டீ | டு | டூ | டெ | டே | டை | டொ | டோ | டௌ |
| ண் | ண | ணா | ணி | ணீ | ணு | ணூ | ணெ | ணே | ணை | ணொ | ணோ | ணை |
| த் | த | தா | தி | தீ | து | தூ | தெ | தே | தை | தொ | தோ | தௌ |
| ந் | ந | நா | நி | நீ | நு | நூ | நெ | நே | நை | நொ | நோ | நௌ |
| ப் | ப | பா | பி | பீ | பு | பூ | பெ | பே | பை | பொ | போ | பௌ |
| ம் | ம | மா | மி | மீ | மு | மூ | மெ | மே | மை | மொ | மோ | மௌ |
| ய் | ய | யா | யி | யீ | யு | யூ | யெ | யே | யை | யொ | யோ | யௌ |
| ர் | ர | ரா | ரி | ரீ | ரு | ரூ | ரெ | ரே | ரை | ரொ | ரோ | ரௌ |
| ல் | ல | லா | லி | லீ | லு | லூ | லெ | லே | லை | லொ | லோ | லௌ |
| வ் | வ | வா | வி | வீ | வு | வூ | வெ | வே | வை | வொ | வோ | வௌ |
| ழ் | ழ | ழா | ழி | ழீ | ழு | ழூ | ழெ | ழே | ழை | ழொ | ழோ | ழௌ |
| ள் | ள | ளா | ளி | ளீ | ளு | ளூ | ளெ | ளே | ளை | ளொ | ளோ | ளௌ |
| ற் | ற | றா | றி | றீ | று | றூ | றெ | றே | றை | றொ | றோ | றௌ |
| ன் | ன | னா | னி | னீ | னு | னூ | னெ | னே | னை | னொ | னோ | னௌ |

## විශේෂ අධ්‍යාපන අවශ්‍යතා

ඔබ පන්තියේ සිටින ඇතැම් දරුවන් තුළ සුළු වශයෙන් කායික, මානසික, චිත්තවේගීය, දුබලතා පැවැතිය හැකි ය. මේ හැර ඇතැම් දරුවන් තුළ ඉගෙනීමේ ගැටලු ද තිබිය හැකි ය. ඉහත කී වෙනස්කම් නොසලකා පන්ති කාමරයේ සිටින සෑම දරුවකුට ම අධ්‍යාපනය ලැබීමේ අයිතියක් ඇත. තමාගේ පන්ති කාමරයේ සිටින සෑම දරුවකුට ම යෝග්‍ය අධ්‍යාපනයක් ලබා දීමේ වගකීම ගුරුවරයා වෙත පැවරී ඇත. එබැවින් පන්ති කාමරයේ සිටින දරුවන්ගේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා හඳුනාගෙන ඔවුනට යෝග්‍ය අධ්‍යාපනයක් ලබා දීම සඳහා සහාය වීම පන්ති කාමර ගුරුවරයාගේ කාර්ය භාරය වේ. ඒ සඳහා අවශ්‍ය මග පෙන්වීමක් ලබා දීම මෙම පරිච්ඡේදයේ අරමුණ වේ. ඒ අනුව කටයුතු කිරීමෙන් පස්වන ශ්‍රේණියේ සෑම දරුවකුට ම ඵලදායී අධ්‍යාපනයක් ලබා දීමට හැකි වන බව අපගේ විශ්වාසයයි.

දරුවන් තුළ පැවතිය හැකි විශේෂ අවශ්‍යතා පහත දැක්වේ

- ★ සුහග හා සුවිශේෂී දක්ෂතා
- ★ ඉගෙනුම් දුෂ්කරතා
- ★ සන්නිවේදන දුබලතා
- ★ චිත්තවේගීය ගැටලු
- ★ දෘෂ්ටි ඌනතා
- ★ ශ්‍රවණ ඌනතා
- ★ කායික දුබලතා
- ★ දිගුකාලීන රෝගී තත්ත්ව

1. සුහග හා සුවිශේෂී දක්ෂතා

පන්ති කාමරයේ ඇතැම් දරුවෝ සුහග හා සුවිශේෂ දක්ෂතා පෙන්නුම් කරති. දරුවන් තුළ පවතින එවැනි දක්ෂතා පහත සඳහන් ලක්ෂණ ඇසුරෙන් හඳුනා ගත හැකි ය.

- ★ සුවිශේෂී මතක ශක්තිය
- ★ නිර්මාණශීලී බව
- ★ ගැටලු විසඳීමේ හැකියාව
- ★ අධික කුතුහලය
- ★ පොහොසත් වාග්මාලාව
- ★ ඉහළ සාධන මට්ටමක් තිබීම
- ★ තර්කන හැකියාව
- ★ නියමිත කාර්යයන් ඉතා ඉක්මනින් අවසන් කර වෙනත් කාර්යයන්හි නියුක්තවීම
- ★ අසාමාන්‍ය සංවේදිතාව
- ★ වයසට වඩා පැසුණු බව

සහාය විය හැකි අයුරු

පන්ති කාමරයේ නියමිත ක්‍රියාකාරකම්වලට අමතර ව පහත දැක්වෙන අයුරින් ක්‍රියාකාරකම් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීමෙන් ඔවුන්ගේ සංවර්ධනය සඳහා සහාය විය හැකි ය.

★ නිර්මාණශීලී ව ලිවීම
  උදාහරණ : ජනේලයකින් බලා පෙනෙන දේ ලිවීම
  කොළයක සිදුරක් තුළින් බලා පෙනෙන දේ ලිවීම
★ ගවේෂණාත්මක ක්‍රියාකාරකම්
  උදාහරණ : සඟරාවක ඇති අලුත් වචන සොයා ලිවීම
  සපයන ලද හෝඩුවාවක් ඇසුරෙන් ප්‍රබන්ධකරණයේ යෙදවීම
★ ප්‍රහේළිකා විසඳීම
★ ගණිත ගැටලු විසඳීම

2. ඉගෙනුම් දුෂ්කරතා

කායික, මානසික හෝ වෙනත් දුබලතා නොමැති වුවත් ඇතැම් දරුවෝ ලිවීම, කියවීම සහ ගණිතය වැනි කාර්යයන්හි දී කැපී පෙනෙන දුර්වලතා පෙන්නුම් කරති.

දරුවන් තුළ පවතින ඉගෙනුම් දුෂ්කරතා, පහත සඳහන් ලක්ෂණ ඇසුරින් හඳුනා ගත හැකිය.

★ අපේක්ෂිත හැකියා හා සැබෑ හැකියා අතර වෙනස්කම
★ මතක තබා ගැනීමේ ශක්තිය අඩුකම
★ දෘෂ්ටි විභේදන හැකියාව හා ශ්‍රවණ විභේදන හැකියාවේ දුර්වල බව
★ අවධානය රඳවා ගැනීමට අපහසු බව
★ අධි ක්‍රියාකාරී බව
★ වයසට ගැළපෙන වාංමාලාව නොතිබීම
★ සරල අදහසක් නිවැරදි ව ප්‍රකාශ කිරීමට නොහැකි වීම
★ අවබෝධයකින් යුතුව දෙයක් කියවා තේරුම් ගැනීමේ අපහසුකම

සහාය විය හැකි අයුරු

දරුවන් තුළ ඇති ඉගෙනුම් දුෂ්කරතා මග හැරීම සඳහා ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ. ඉගෙනීමට අදාළ පහත දැක්වෙන කාර්යයන් සඳහා අවශ්‍ය මූලික කුසලතා සංවර්ධනය කළ යුතු වේ.

★ සවන් දීම
★ සිතීම
★ කියවීම
★ ලිවීම
★ අක්ෂර වින්‍යාසය
★ ගණිතය

මූලික කුසලතා ලබා දීමේ දී පහත දැක්වෙන උපාය මාර්ග යොදා ගැනීම වැදගත් වේ.

- ★ දරුවාගේ වේගය අනුව ක්‍රියාකාරකම්වලට නිරත කරවීම
- ★ පුහුණු වීම සඳහා වැඩි වාර ගණනක් ලබා දීම
- ★ අවශ්‍ය තැන්වල දී යෝග්‍ය උපකරණ භාවිතය
- ★ ස්වයං ඉගෙනීම සහ ස්වයං ඇගයීමේ කුසලතා ලබා දීම
- ★ බහු ඉන්ද්‍රිය ප්‍රවේශය
- ★ සුළු ජයග්‍රහණයක් පවා ඉහළින් අගය කිරීම
- ★ අනවශ්‍ය චර්යා පාලනය කිරීම

3. සන්නිවේදන දුබලතා

දරුවන් තුළ භාෂණයේ දී දැකිය හැකි දෝෂ සන්නිවේදන දුබලතා ලෙස හැඳින්වේ.

- ★ හඬ පාලනය අපහසු වීම
- ★ උගුරෙන් කතා කිරීම
- ★ උස් හඬින් කතා කිරීම
- ★ සෙමින් කතා කිරීම
- ★ කතාවේ දී වචන ලිවීම
- ★ ගොත ගැසීම
- ★ කතාවේ ලාලිත්‍යක් නොමැති බව
- ★ ශබ්ද වෙනුවට වෙනත් ශබ්ද ආදේශ කොට කතා කිරීම

දරුවාට සහාය විය හැකි අයුරු

- ★ දරුවාගේ භාෂණ දෝෂ පිළිබඳ ව අවධානය යොමු කරන බව නො අඟවා කටයුතු කිරීම
- ★ පන්තියේ අනෙක් දරුවන් ද එසේ කටයුතු කිරීම සඳහා දැනුවත් කිරීම
- ★ දරුවාගේ භාෂණ දෝෂ සමච්චලයට භාජන නොකිරීම
- ★ ගුරුවරයා පැහැදිලි ව සහ නිවැරදි ව වචන භාවිත කිරීමෙන් ආදර්ශන සැපයීම
- ★ දරුවාට හැකි පමණ කතා කිරීමට අවස්ථා ඇති කිරීම
- ★ දරුවාගේ වැරදි නිතර නිතර නිවැරදි කිරීමට උත්සාහ නොදැරීම
- ★ කතාවේ දී දරුවාට ක්ෂණික ව කතා කිරීමට යොමු නොකිරීම. කතාව සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දීම
- ★ භාෂණ චිකිත්සක සහාය ලබා දීම

4. චිත්තවේගීය ගැටලු

පන්ති කාමරයේ ඉගෙනීමේ ක්‍රියාවලියට සහභාගි නොවී තමා විසින් ම ගොඩ නගා ගන්නා ලද ලෝකයක හුදකලාව හෝ ආක්‍රමණශීලී ව හෝ සිටින දරුවෝ වෙති. මේ ලක්ෂණ පෙන්නුම් කරන්නේ චිත්තවේගී ගැටලු නිසා විය හැකි ය. පන්ති කාමරයේ සිටින එවැනි දරුවන් හඳුනා ගත හැකි විශේෂ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- ★ තමා ගැන නොසැලකිලිමත් වීම
- ★ එදිනෙදා කටයුතු ගැන නොසැලකිලිමත් වීම
- ★ අන් අයට අඩුවෙන් ප්‍රතිචාර දැක්වීම
- ★ හුදකලාව සිටීමට කැමැත්තක් දැක්වීම
- ★ ඉක්මනින් කෝප වීම
- ★ දවල් සිහින දැකීම
- ★ බලා ගත් අත බලා සිටීම
- ★ සොරකම් කිරීම
- ★ අලස බව
- ★ උදාසීන බව
- ★ සුළු දෙයකින් පවා නොසන්සුන් වීම
- ★ නිතර හැඬීම
- ★ නිතර නිතර විරුද්ධ ව පැමිණිලි කිරීම
- ★ පොත් පත් ඇඳුම් පැළඳුම් අපිළිවෙළට තබා ගැනීම

දරුවාට සහාය විය හැකි අයුරු

- ★ දරුවා තමාගේ ආසන්නයේ තබා ගැනීම
- ★ නිතර සහභාගිත්වය ඇති වන පරිදි දරුවා කණ්ඩායම් ක්‍රියාකාරකම්, භූමිකා රංගන වැනි දේවල යෙදවීම
- ★ කතා බහේ දී මෘදු වචන භාවිතය
- ★ දරුවාට ජයග්‍රහණය අත්විඳිය හැකි කටයුතු පැවරීම
- ★ සතුටෙන් පිරි පන්ති කාමර වාතාවරණයක් ගොඩ නැංවෙන පරිදි කටයුතු කිරීම
- ★ දරුවාගේ නොගැළපෙන හැසිරීම් පාලනය කිරීමට කටයුතු කිරීම
- ★ යහපත් හැසිරීම් දිරිමත් කිරීම සඳහා උපක්‍රම යෙදීම

5. දෘෂ්ටි ඌනතා

පෙනීම අඩු, පූර්ණත්ව වශයෙන් නොපෙනෙන දරුවන් ඇතැම් විට ඔබේ පන්ති කාමරයේ සිටිය හැකි ය. පූර්ණ අන්ධ දරුවන් පහසුවෙන් හඳුනා ගත හැකි නමුත් පෙනීම අඩු දරුවන් හඳුනා ගැනීම ගැටලු සහිත වේ. එවැනි දරුවන් හඳුනා ගත හැකි හෝඩුවා කිහිපයක් පහත සඳහන් වේ.

- ★ නිතර ඇස්වලින් කබ කඳුළු ගැලීම
- ★ නිතර ඇස් රතු පැහැ ගැන්වී තිබීම
- ★ නිතර ඇස් නැටීම
- ★ නිතර ඇස් පිය ගැසීම
- ★ කියවන විට වචන අකුරු අතහැර කියවීම ලිවීම
- ★ පොත ඇසට ලං කර බැලීම
- ★ හිස ඈත් මෑත් කර ද්‍රව්‍ය දෙස බැලීම
- ★ නිතර ඇසේ, කනේ, හිසේ වේදනා ගැන පැමිණිලි කිරීම
- ★ නිතර කළුලෑල්ල ළඟට ගොස් බැලීම
- ★ නිතර ළඟ සිටින දරුවන්ගේ පොත්වලට එබී බැලීම

දරුවාට සහාය විය හැකි අයුරු

- ★ පූර්ණ අන්ධ දරුවකු නම් විශේෂ අධ්‍යාපන ගුරුවරයා සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම
- ★ දරුවාට කළුලෑල්ල හොඳින් පෙනෙන පරිදි මනා ආලෝකය ඇති තැනෙක ඉදිරිපසින් තැබීම
- ★ කළුලෑල්ලේ ලියන විට ලොකු හා පැහැදිලි අකුරු ලිවීම හා ලියන දෙය පැහැදිලි ව කියමින් ලිවීම
- ★ ලිවීම හා කියවීම සඳහා දරුවාට ප්‍රමාණවත් කාලයක් ලබා දීම
- ★ ලිඛිත උපදෙස් සමඟ වාචික ව උපදෙස් දීම
- ★ දීර්ඝ වාචික පැවරුම් පටිගත කර ගැනීමට ඉඩ සැලැස්වීම
- ★ පන්ති කාමරය තුළ අනවශ්‍ය ඝෝෂාකාරී බව අඩු කිරීම
- ★ දරුවා භාවිත කරන ඇස් කණ්ණාඩිය යෝග්‍ය තත්ත්වයක පවතී දැයි සොයා බැලීම
- ★ ඉගෙනුම් ආධාරක පැහැදිලි ව හා තද පැහැයෙන් සකස් කිරීම
- ★ පන්ති කාමරයේ උපකරණ දරුවාට පහසුවෙන් ළඟා විය හැකි ආකාරයට සකස් කිරීම
- ★ දරුවා සහ ගුරුවරයා අතර පරතරය හැකි පමණ අවම වන සේ වාඩි කරවීම.

6. ශ්‍රවණ ඌනතා

පූර්ණව හෝ මද වශයෙන් හෝ ශ්‍රවණය සහිත දරුවන් පන්ති කාමරයක සිටිය හැකි ය. ඔවුන් හඳුනා ගත හැකි ලක්ෂණ කිහිපයක් පහත සඳහන් වේ.

- ★ වාචික උපදෙස් අවබෝධ කර ගැනීම අපහසු වීම
- ★ කතා කරන පුද්ගලයාගේ මුහුණ හෝ තොල් දෙස බලා සිටීම
- ★ ශබ්දය ඇසෙන පැත්තට කන හරවා බැලීම
- ★ වාංමාලාව ඉතා සීමිත වීම
- ★ කනට අත තබා සවන් දීම
- ★ කනේ වේදනාව ගැන පැමිණිලි කිරීම
- ★ උස් හඬින් කතා කිරීම
- ★ පහත් හඬින් කතා කිරීම
- ★ එකම ලයකින් කතා කිරීම
- ★ පිටුපසින් එන ශබ්දවලට අඩු ප්‍රතිචාර දැක්වීම
- ★ වාචික උපදෙස්වල දී අඩු අවධානයක් යොමු කිරීම

දරුවාට සහාය විය හැකි අයුරු

- ★ පන්ති කාමරයේ අනවශ්‍ය ශබ්ද හැකි පමණ අවම කිරීම
- ★ ගුරුවරයා හා දරුවා අතර දුර ප්‍රමාණය හැකි පමණ අඩු කිරීම
- ★ ගුරුවරයාගේ මුහුණ පැහැදිලි ව දැකිය හැකි තැනක අසුන් ගැන්වීම
- ★ වාචික උපදෙස් දීමේ දී සම්පූර්ණ වාක්‍ය භාවිත කිරීම
- ★ බහු ඉන්ද්‍රිය ප්‍රවේශය ඉගෙනුම් ක්‍රියාකාරකම් සඳහා යෙදවීම
- ★ වැඩි වශයෙන් දෘෂ්ටි මාධ්‍ය උපයෝගී කර ගැනීම ඉඩ සැලසීම
- ★ සටහන් ලියා ගැනීමට පන්ති කාමර වේලාවෙන් බාහිර ව ද අවකාශ ලබා දීම
- ★ ශ්‍රවණාධාරකයක් භාවිත කරන්නේ නම් එහි යෝග්‍යතාව සොයා බැලීම
- ★ ශ්‍රවණාධාරකයක් භාවිත නොකරන්නේ නම් ඒ සඳහා යොමු කිරීම

7. කායික දුබලතා

අත පය ඇඟිලි ක්‍රමවත් ව පිහිටා නැති හෝ ඒවායේ මනා ක්‍රියාකාරිත්වයක් නොමැති හෝ දරුවන් පන්ති කාමරයේ සිටිය හැකි ය. මේ දරුවන්ට අත් පා ඇඟිලි මෙහෙයවා කටයුතු කිරීමේ හසුරු කුසලතා පිළිබඳ ගැටලු ඇති විය හැකි ය.

- ★ අත් පා ඇඟිලිවල මුළුමනින් ම හෝ කොටසක් අක්‍රිය වීම
- ★ අත් පා ඇඟිලි පාලනය කර ගැනීමට අපහසු වීම
- ★ ලිවීම කැපීම ඇල්ලීම වැනි සියුම් චාලක කුසලතා අපහසු වීම
- ★ දිවීම පැනීම ඇඳීම පෙරලීම වැනි ක්‍රියාකාරකම්වල යෙදීම අපහසු වීම

දරුවාට සහාය විය හැකි අයුරු

- ★ දරුවා සමච්චලයට භාජනය කිරීමෙන් වැළැක්වීම
- ★ පන්තියේ අනෙක් දරුවන් අතර පිළිගැනීමට ලක් කිරීම
- ★ එළිමහන් ක්‍රියාකාරකම්වලට සහභාගි කර ගැනීමේ දී විකල්ප ක්‍රියාමාර්ග යොදා ගැනීම
- ★ අනෙක් දරුවන්ගේ උපකාර ලබා ගැනීම සඳහා කටයුතු කිරීම
- ★ භෞතික චිකිත්සක සහාය ලබා ගැනීමට යොමු කිරීම

8. දිගුකාලීන රෝගී තත්ත්ව

ඔබ පන්ති කාමරයේ ඇදුම, අපස්මාරය වැනි දිගුකාලීන රෝගවලින් පෙළෙන දරුවන් ද සිටිය හැකි ය.

දරුවාට සහාය විය හැකි අයුරු

- ★ දරුවාගේ රෝගී තත්ත්වය පිළිබඳ ව දෙමව්පියන්ගෙන් නිවැරදි තොරතුරු දැන ගැනීම
- ★ පාසල් වේලාව තුළ ඖෂධ ගැනීමට ඇත්නම් ඒ සඳහා යෝග්‍ය වැඩ පිළිවෙළක් සකස් කර ගැනීම
- ★ වෛද්‍ය නිර්දේශවලට අනුව යෝග්‍ය ක්‍රියාකාරකම්වල යෙදවීමට උනන්දු වීම
- ★ දරුවාට නිතර ප්‍රීතියෙන් සහ සතුටෙන් සිටීමට උපකාර කිරීම
- ★ පාසලට නොපැමිණි දිනයන්හි අතපසු වූ ඉගෙනුම් වැඩ සඳහා විකල්ප වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම
- ★ දරුවා රෝගියකු ලෙස හඳුන්වා දීමෙන් වළක්වාලන ආකාරයට කටයුතු කිරීම

## සිසුන්ට ඔවුන්ගේ ලැදියා සහ රුචිකත්වයන්ට අනුව වෛකල්පික විෂයයන් හැදෑරීමට අවස්ථා සම්පාදනය

ප්‍රාථමික ශ්‍රේණිවල ඉගෙන ගන්නා ළමුන් ඔවුන්ගේ ලැදියාවන්, රුචිකත්වයන්, අභියෝගතාවයන් අතින් එකිනෙකාගෙන් බෙහෙවින් වෙනස් වේ. පන්ති කාමරයේ දී කරන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මේ වෙනස්කම් සැලකිල්ලට ගෙන කටයුතු කිරීම ඔවුන්ගේ සංවර්ධනයට අත්‍යවශ්‍යය. එම නිසා පන්ති කාමරයේ සිටින එක් එක් ශිෂ්‍යයාගේ රුචිකත්වය සහ ලැදියාවන් සුවිශේෂීව හඳුනාගත යුතුය. සමහර සිසුන් ගායනයට, රංගනයට, වාදනයට, ඇඳීමට, නෙළීමට, ඇඹීමට, ක්‍රීඩා සහ තාක්ෂණ කුසලතා වැනි ක්‍රියාකාරකම්වලට වැඩි ලැදියායක් දක්වයි. ඒවාට ගැළපෙන ලෙස සිය කුසලතා වර්ධනය කර ගැනීමට පාසලේ දී උපරිම ලෙස අවස්ථාව ලබා දීමට මේ වැඩ සටහනෙන් අපේක්ෂා කෙරේ. මේ සඳහා සතියකට මිනිත්තු 30ක කාලයක් වෙන් කර ඇත.

අරමුණු

- ★ සිසු ළැදියා සහ රුචිකත්ව හඳුනා ගනිමින් ඒවා වර්ධනයට අවස්ථාව සැලසීම.
- ★ ඉගෙනුමට ඉගෙනුම යන නිපුණතාවය සාක්ෂාත් කර ගැනීමට දිරි ගැන්වීම.
- ★ නිදහස්ව කටයුතු කිරීමට ඉඩ සැලසීම.
- ★ සහජ හැකියා තමාටම අවබෝධ කර ගැනීමට අවස්ථාව ලබා දීම.
- ★ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් පරිසරය පෝෂණය කිරීම.
- ★ වින්දනාත්මක ව ඉගෙනීම් කටයුතු කරගෙන යාමට අවස්ථාව ලබා දීම.
- ★ කුඩා කාලයේ සිටම ජීවන නිපුණතා ඇති කර ගැනීමට මග පෙන්වීම.
- ★ විවේකය ඵලදායීව ගත කිරීමට හුරුවීම.
- ★ ස්වාධීනව වැඩ කිරීමට ආත්ම ශක්තිය ඇති වීම.

දරුවන්ගේ විශේෂ හැකියා සහ රුචිකත්වයන් හඳුනා ගැනීම

මේ සඳහා ක්‍රම කීපයක් භාවිත කළ හැකි ය.

- ★ තුන්වන ප්‍රධාන අවධියට ප්‍රීතිමත් ආරම්භයක්
- ★ දෙවන ප්‍රධාන අවධියේ ගුරුවරුන් සමඟ සාකච්ඡා කිරීම
- ★ තක්සේරු පත්‍රිකා පරිශීලනය
- ★ කාර්ය සාධන ගොනුව පිරික්සීම
- ★ දෙමව්පියන්/භාරකරුවන්ගෙන් ලබා ගන්නා තොරතුරු

සිසුන්ගේ රුචිකත්වයට සහ ළැදියාවන්ට අනුව කළ හැකි ක්‍රියාකාරකම්

- ★ නිර්මාණාත්මක ලිවීම (ගද්‍ය - පද්‍ය)
- ★ කථිකත්වය
- ★ ගායනය ★ වාදනය ★ රංගනය ★ අභිරූපනය
- ★ කැටයම් ★ ඇඹීම් ★ නෙළීම් ★ ඉදිකිරීම් ★ විවීම්
- ★ කෘෂිකාර්මික වැඩසටහන්
- ★ තාක්ෂණික ක්‍රියාකාරකම්

වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙහි දී පහත කරුණු විශේෂ අවධානයට යොමු විය යුතු ය.

- ★ සිසු ළැදියා හා රුචිකත්ව අනුව සකස් කර ගත් වැඩසටහන් පන්ති තුළ ප්‍රසිද්ධ කිරීම (දැන්වීම් පුවරුවට යොදා)
- ★ ඒ ඒ වැඩසටහන් සමග එයට අයත් වන සිසුන්ගේ නම් යෙදීම
- ★ එක් එක් වැඩසටහන් පැවැත්වෙන ස්ථාන
- ★ ඒ ඒ වැඩසටහන් සඳහා පැමිණෙන සම්පත් පුද්ගලයන්

**ප්‍රාථමික පාසලේ කාල සටහන නම්‍යශීලී වුව ද මෙම කාලච්ඡේදය සඳහා නිශ්චිත වේලාවක් වෙන් කිරීම කෙරෙහි විශේෂයෙන් සැලකිලිමත් වන්න.**

මේ සඳහා ලබා ගත හැකි සම්පත්

- ★ විවිධ දක්ෂතා දැක් වූ ආදී සිසු සිසුවියන්
- ★ ස්වකැමැත්තෙන් ඉදිරිපත් වන විශ්‍රාමික ගුරුභවතුන්
- ★ පාසලේ ගුරුභවතුන්
- ★ දෙමාපියන් සහ අවට ප්‍රජාව

තක්සේරුව සහ ඇගයීම

- ★ තමන්ගේ ළැදියා හා රුචිකත්ව සඳහා අවස්ථාවක් උදාවීම නිසා ස්වයං වින්දනයක් හා ස්වයං ඇගයීමක් සඳහා සිසුන් යොමු කිරීම.
- ★ තම ප්‍රගතිය පිළිබඳ ව ස්වයං ඇගයීමකින් යුතුව කටයුතු කිරීම.
- ★ සිසුන් කෙරෙහි නිරන්තර අවධානයෙන් සිට විටින් විට කරනු ලබන වාර්තා කාර්ය සාධන ගොනුවට ඇතුළත් කිරීම.
- ★ සිසුන්ගේ ප්‍රගතිය ගැන ගුරුවරයා ද වාර්තාවක් තබා ගැනීම.
- ★ සිසු ප්‍රගතිය දෙමව්පියන්ට දැකීමට අවස්ථාව සැලසීම.

උදාහරණ : ★ නිර්මාණ ප්‍රදර්ශන
- ● ප්‍රදර්ශනාත්මක තරග
- ● සුවිශේෂී හැකියා ප්‍රදර්ශන
- ● විශිෂ්ට ජයග්‍රහණ දැක්වෙන සහතික
- ● කාර්ය සාධන ගොනුව

# සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

## 1.0 හැඳින්වීම

ප්‍රාථමික පන්තිවල සිටින සිසුන් සඳහා ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ දී ගුරුවරයකුට සිසුන්ගේ හැකියාවන් නොහැකියාවන් මෙන් ම ඔවුන් ඉගෙනීම සම්බන්ධයෙන් පෙන්නුම් කරන දුෂ්කරතා සහ ප්‍රබලතා පිළිබඳ තොරතුරු ඉතා වැදගත් වේ. මෙම අරමුණ සහිත ව සිසුන්ගේ ප්‍රගතිය පිළිබඳ ව නිරන්තරයෙන් සොයා බලා තොරතුරු රැස් කිරීමේ ක්‍රියාවලිය තක්සේරු කිරීම යන්නෙන් අදහස් කරනු ලැබේ. සිසුන්ට ගැළපෙන ආකාරයට ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කරමින්, අපේක්ෂිත ඉගෙනුම් ඵල කරා ඔවුන් නියාමනය කිරීම සඳහා සිසුන් සම්බන්ධයෙන් කරනු ලබන නිරන්තර තක්සේරු කිරීමක් අත්‍යවශ්‍යය. එය සිසුන්ගේ ඉගෙනීම වැඩි දියුණු කිරීමට ආධාර වන්නක් විය යුතුය. තක්සේරු කිරීම කළ යුත්තේ බාහිර පුද්ගලයකු විසින් නොව උගන්වන ගුරුවරයා විසින්මය. එහි දී ප්‍රධාන විය යුත්තේ අනාවරණය හා උපදේශනයයි. එමගින් එක් එක් සිසුවාගේ ප්‍රගතිය, ඔහු මුහුණපාන ගැටලු සුවිශේෂී ලෙස හඳුනා ගත හැකිය. ප්‍රාථමික පන්ති කාමරය තුළ ක්‍රියාත්මක වන තක්සේරු කිරීම පන්ති කාමරයේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය හා කෙළින් ම සම්බන්ධ විය යුතුය. එසේ ම එය ශිෂ්‍යයාගේ ප්‍රගතිය ඉහළ නැංවීමට ආධාර කරන්නක් ද විය යුතුය.

## 2.0 සිසු ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රමවේද

සිසුන් විෂයමාලාවෙන් අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වී තිබේ ද යන්න තක්සේරු කිරීම අවිධිමත් ලෙස මෙන් ම විධිමත් ලෙස ද කළ හැකිය.

- ★ අවිධිමත් තක්සේරු කිරීම සිසුන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදී සිටින අවස්ථාවන්හි දී ඊට බාධා නොවන අයුරින් තොරතුරු රැස් කිරීම.
- ★ විධිමත් තක්සේරු කිරීම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තාවකාලික ව නතර කොට, මුළු අවධානය පූර්ව සූදානමකින් හා සැලැස්මකින් යුතුව ඒ කෙරෙහි යොමු කොට තොරතුරු රැස් කිරීම.

එමෙන් ම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී තක්සේරු කිරීම විවිධ අවස්ථාවල දී සිදු කළ හැකිය. ඒ අනුව එය සම්භවන ලෙස හෝ සම්පිණ්ඩිත ලෙස සිදුකළ හැකිය.

- ★ සම්භවන තක්සේරු කිරීම - යම් ඉගෙනුම් අදියරක් අතරතුරෙහි නිතර නිතර සිසු ඉගෙනුම් ප්‍රගතිය හා ඉගෙනුම් දුෂ්කරතා සොයා බැලීමට පන්ති කාමරයේ උගන්වන අතර තුරම සිසුන්ගේ ප්‍රගතිය සොයා බැලීම මෙයට උදාහරණයි.
- ★ සම්පිණ්ඩිත තක්සේරු කිරීම - යම් ඉගෙනුම් අදියරක් අවසානයේ දී සිසුන් මේ ඉගෙනුම් කොටසක් කෙතෙක් දුරට සාර්ථක ව ඉගෙන ගෙන අත්දැයි සොයා බැලීමට වාරයක් අවසානයේ ඒකකයක් අවසානයේ කරන පරීක්ෂණ මෙයට උදාහරණයි.

## 2.1 අවිධිමත් - සම්භවන ආකාරයට තොරතුරු රැස් කිරීම

''අවිධිමත් - සම්භවන ආකාරයට සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම'' සඳහා යොදා ගත හැකි ක්‍රම රාශියකි. ඒවා අතුරෙන් තුන්වන ප්‍රධාන අවධිය සඳහා යොදා ගත හැකි ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

1. සිසුන් නිරීක්ෂණය
   - ★ කණ්ඩායම් වශයෙන් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත ව සිටින විට, සැලසුම්ගත සෙල්ලම්/ විනෝදජනක වැඩවල යෙදී සිටින විට ස්වාධීන ව අසුන්ගත වැඩවල යෙදී සිටින විට

මෙහි දී එක් අවස්ථාවක දී ගුරුවරයාගේ අවධානය තනි සිසුවකුට මෙන් ම තනි ක්‍රියාවලියකට යොමු වීම වැදගත්ය. ඒ අනුව පහත සඳහන් ක්‍රම භාවිත කළ හැකිය.

- පැවරුම්, ගෙදර වැඩ, අභ්‍යාස යනාදිය ලකුණු කිරීම. මෙහි දී සිසුන් විසින් කරුනු ලබන වැරදි හා සංකල්ප පිළිබඳ අනවබෝධය සම්බන්ධයෙන් ගුරුවරයාගේ විශේෂ අවධානය යොමු විය යුතුය.
- සිසුන් සමග තනි තනි ව හා කණ්ඩායම් වශයෙන් කතා බහ කිරීම.
- සිසුන් පන්තිය ඉදිරියේ කරනු ලබන ඉදිරිපත් කිරීම්, ආදර්ශන යනාදිය නිරීක්ෂණය හා ඒවාට සවන් දීම.
- සිසුන් නිර්මාණය කරනු ලබන ආකෘති යනාදිය පරීක්ෂා කිරීම හා ඒවායේ නියැදියක් එක් රැස් කර තැබීම.
- සිසු පැවරුම් හ වෙනත් නිර්මාණ සම්බන්ධ විශේෂ ලිඛිත වැඩ පත්‍රිකා ගොනු කර තැබීම.

## 2.2 සිසුන්ගෙන් ප්‍රශ්න ඇසීම

ප්‍රශ්න කරණය සිසුන්ගේ ප්‍රගතිය පිළිබඳ හොඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා ගුරුවරයකුට භාවිත කළ හැකි ක්‍රමවේදයකි. ගුරුවරු සිසුන්ගෙන් ප්‍රශ්න ඇසීම පන්ති කාමරය තුළ ඉතා බහුලව භාවිත කරනු ලබයි. නමුත් සිසුන් පාඩමට යොමු කරන සිසුන්ගේ හැකියාවන් හොඳින් හඳුනා ගැනීම සඳහා ප්‍රශ්න ඇසීම ගුරුවරයකු සතු විය යුතු හොඳ ලක්ෂණයකි. පන්තියේ උගන්වන අතරතුරම නොයෙකුත් ආකාරයේ ප්‍රශ්න අසමින් තක්සේරු වාර්තාවල සඳහන් කොට ඇති නිර්ණායකවලට සිසුන් පැමිණ තිබේ ද යන්න පරීක්ෂා කළ හැකිය.

2.3 සිසුන්ගේ ප්‍රගතිය පිළිබඳ ව මේ ලෙස අවිධිමත් ව තොරතුරු රැස් කිරීම ඉතා වලංගු ක්‍රමයන් වශයෙන් සැලකේ. ගුරුවරුන් ඔවුන්ගේ අවබෝධය මත ගන්නා නිගමන සම්මත පරීක්ෂණවලට වඩා වලංගු ඒවා බව බොහෝ පර්යේෂණවලින් පෙන්වා දී තිබේ.

## 3.0 සිසු ප්‍රගතිය විධිමත් ලෙසට තක්සේරු කිරීම

තුන්වන ප්‍රධාන අවධියේ දී සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා අවිධිමත් තක්සේරු කිරීම මෙන් ම විධිමත් තක්සේරු කිරීමේ ක්‍රම ද බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. විශේෂයෙන් පස්වන ශ්‍රේණිය වන විට සිසුන් විධිමත් ඉගෙනුම් රටාවකට හුරුවන නිසාත් ඉගෙන ගන්නා කරුණුවල ස්වභාවයන් අනුව පරීක්ෂණ වැනි විධිමත් තක්සේරු කිරීමේ ක්‍රම යොදා ගැනීමට සිදුවේ. ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රාථමික අධ්‍යාපන අංශය විසින් පිළියෙල කර ඇති විධිමත් තක්සේරු කිරීම පිළිබඳ අත්පොතෙහි මේ සම්බන්ධ වැඩි විස්තර ඉදිරිපත් කර ඇත.

3.1 විධිමත් සම්පිණ්ඩිත තක්සේරු කිරීම

යම්කිසි ඒකකයක් අවසානයේ, වාරයක් අවසනයේ වැනි යම්කිසි කාල පරිච්ඡේදයක් අවසානයේ පවත්වනු ලබන විධිමත් පරීක්ෂණ මෙයට උදාහරණ වශයෙන් ගත හැකිය. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල යම් තේමාවක් උගන්වා එය අවසානයේ දී එම තේමාවෙන් ඉගැන්වීමට අපේක්ෂා කළ දේවල් සිසුන් ඉගෙන ගෙන තිබේ ද යන්න පරීක්ෂා කිරීමට දෙනු ලබන විධිමත් පරීක්ෂණයක් මෙයට උදාහරණයකි. අවුරුද්දක් අවසානයේ පවත්වනු ලබන පරීක්ෂණ ද අයත් වන්නේ මේ වර්ගයටම ය.

ප්‍රශ්න පත්‍ර යනු ඉතා වැදගත් තක්සේරු කිරීමේ උපකරණයකි. සිසුන් පිළිබඳ ඉතා නිවැරදි තක්සේරුවක් කළ හැකි වන්නේ ඒවා වලංගු හා විශ්වාස්‍යතාවයකින් යුතු වන ආකාරයට සකස් කළ හොත් පමණි. මේ නිසා වඩාත් හොඳ පරීක්ෂණ සකස් කිරීමට ගුරු මහත්ම මහත්මීන් උනන්දු විය යුතුය. එය ගුරුවරයකු සතු විය යුතු ඉතා වැදගත් නිපුණතාවයකි.

3.2 ගුරුවරුන් විසින් සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍ර

පළමුවන ප්‍රධාන අවධියේ දී සහ තුන්වන ශ්‍රේණියේ දී සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා අවිධිමත් ක්‍රම බොහෝ ප්‍රයෝජනවත් විය. නමුත් හතරවන ශ්‍රේණියේ සිට ඒ සඳහා විධිමත් පරීක්ෂණ ද උපයෝගී කර ගත හැකිය.

පන්ති කාමරයේ සිටින සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීමට යොදා ගත හැකි හොඳම පරීක්ෂණ සකස් කළ හැක්කේ එම පන්තියේ ඉගැන්වීම කළ ගුරුවරුන්ට මය. ඒ නිසා තක්සේරු කිරීම සඳහා වෙනත් පසල් හෝ ආයතන මගින් සකස් කළ ප්‍රශ්න පත්‍ර භාවිත කිරීම යෝග්‍ය නොවේ.

මේ සඳහා භාවිත කළ හැකි ප්‍රශ්න වර්ග රාශියකි. බහුවරණ ප්‍රශ්න, ගැළපීම් වර්ගයේ ප්‍රශ්න, හිස්තැන් පිරවීමේ ප්‍රශ්න, නිවැරදි පිළිතුරු යා කිරීම් ප්‍රශ්න, ඔව්/නැහැ වර්ගයේ ප්‍රශ්න, ඡේදයක් ආශ්‍රයෙන් අසන ප්‍රශ්න මේ සඳහා භාවිත කළ හැකි ප්‍රශ්න වර්ග කිහිපයකි.

පරීක්ෂණ වගුවක් සකස් කිරීම ඉතා පහසු කාර්යයක් වශයෙන් බැලූ බැල්මට පෙනුනත්, මැනීමට අපේක්ෂා කළ දෙය ම මැනෙන ආකාරයේ වලංගුතාවකින් යුතු ප්‍රශ්න සකස් කිරීම සැලකිල්ලෙන් කළ යුතු දෙයකි. මෙහි දී අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයක් ඇත.

සකස් කරනු ලබන සෑම ප්‍රශ්නයක් ම ඒ සඳහා ම සුවිශේෂී වූ අරමුණක් මුල් කරගෙන සකස් කිරීම අත්‍යවශ්‍යය.

ප්‍රශ්න සකස් කිරීමේ දී දැනුම වැනි සරල හැකියා මෙන් ම සංකීර්ණ හැකියා මැනීමට හැකි වන ආකාරයට ප්‍රශ්න සකස් කිරීමට අවධානය යොමු කළ යුතුයි. අවබෝධ කර ගැනීමේ හැකියාව, සංශෝධන හා විශ්ලේෂණ හැකියාව, ගැටලු විසඳීමේ හැකියාව, ගැටලුවකට අදාළ ක්‍රමවේද හඳුනා ගැනීමේ හැකියාව, වැනි සංකීර්ණ හැකියා හඳුනා ගැනීමට ප්‍රශ්න සකස් කළ යුතුයි.

## 4.0 කෙටි සටහන් ලිවීමෙන් වාර්තා තැබීම

එක් එක් සිසුවා සම්බන්ධයෙන් කැපී පෙනෙන යම් තොරතුරු වෙතොත් ඒවා පිළිබඳ ව කෙටි සටහන් ලිවීම කළ හැකිය. යම් සිසුවකු ප්‍රදර්ශනය කරනු ලබන විශේෂ දක්ෂතා හෝ දුර්වලතා හෝ හැසිරීම් හෝ වෙතොත් ඒවා මෙම ගණයට ඇතුළත් වේ. එක් එක් සිසුවා වෙනුවෙන් පිටුවක් හෝ දෙකක් බැගින් වෙන් කර ඇති පොතක හෝ ලිපි ගොනුවක හෝ මෙම සටහන් ඇතුළත් කළ හැකිය. එසේ කිරීමේ දී දිනය සහ විශේෂ නිරීක්ෂණය පිළිබඳ කෙටි විස්තරයක් ක්‍රමානුකූල ව සටහන් කිරීම වැදගත් ය.

## 5.0 කාර්ය සාධන ලිපි ගොනුව

සිසුන් එදිනෙදා කරනු ලබන ඉගෙනුම් ක්‍රියාකාරකම්වල තොරතුරු රැස් කර සකස් කර ගන්නා ගොනුවක් කාර්ය සාධන ගොනුව යනුවෙන් දළ වශයෙන් හැඳින්විය හැකිය. මෙහි දී සිසුන්ගේ හැකියා මෙන් ම නොහැකියා පිළිබඳ ව පැහැදිලි චිත්‍රයක් පෙන්නුම් කරන ආකාරයට කාර්ය සාධන ගොනුවක් සකස් කිරීම ගුරුවරයාගේ කාර්ය භාරයකි.

මේ තොරතුරුවලින් ලබා ගන්නා තීරණ තක්සේරු කිරීමේ පත්‍රිකා ලකුණු කිරීම ප්‍රයෝජනවත්ය. මේ පිළිබඳ වැඩි විස්තර සඳහා පිටු සඳහන් ව ඇත.

## 6.0 තොරතුරු වාර්තා කිරීමේ පත්‍රිකාව හා එය ප්‍රයෝජනයට ගැනීම

රැස් කරනු ලබන තොරතුරු සටහන් කර වාර්තා කිරීම සඳහා යොදා ගත හැකි පත්‍රිකාවල ආකෘති තුනක් මව්බස, ගණිතය සහ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් යන විෂයයන් යටතේ සකස් කර ඉදිරිපත් කර ඇත.

ඒවායේ එක් එක් සිසුවාගේ නම ඉදිරියෙන් එක් එක් ඉගෙනුම් ඵලය සඳහා එක් කොටුව බැගින් වෙන් කර ඇත. සිසුන් ඒ ඒ ඉගෙනුම් ඵලය කරා ළඟා වී තිබේ ද නැති ද යන්න, පරීක්ෂා කිරීමෙන් අනතුරු ව අපේක්ෂිත මට්ටමට පැමිණ ඇත්නම් ✓ දුෂ්කරතාවන් පෙන්නුම් කරයි නම් • ලකුණත් යොදා සටහන් කරන්න. සටහන් කළ යුතුය. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ දී තක්සේරුවට භාජනය කළ යුතු බොහෝ ''ඉගෙනුම් ඵල'' අවුරුද්ද පුරා විහි දී ඇත.

| තීරණය | සංකේතය |
|---|---|
| සාර්ථක ව කරයි | ✓ |
| දුෂ්කරතා පෙන්නුම් කරයි/තව දුරටත් උදවු අවශ්‍යයි | • |

යම් ඉගෙනුම් ඵලයක් සම්බන්ධයෙන් ශිෂ්‍යයෙක් සාර්ථකත්වය පෙන්නුම් කරන්නේ ද යන්න ගුරුවරයකු විසින් තීරණය කරනු ලැබීම සඳහා අදාළ ඉගෙනුම් ඵලයට ගැළපෙන පරිදි තමා ම සකස් කර ගත් නිර්ණායක උපයෝගී කර ගැනීමට හැකිය.

පන්තියේ සියලු ම සිසුන්ගේ සාධන මට්ටම පිළිබඳ තීරණ එක ම නිර්ණායක කට්ටලයක් මත පදනම් කර ගනු ලැබූ විට ඒවායේ ඒකාකාර බව ද වැඩි වනු ඇත.

## 7.0 අනාවරණය හා ප්‍රතිකාර්ය

ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීමේ ප්‍රධාන අරමුණක් වන්නේ සිසුන්ගේ හැකියා සහ නොහැකි පිළිබඳ අනාවරණය කර ගැනීමයි.

යම් සිසුවකු සඳහා තක්සේරු පත්‍රයේ ''●'' සලකුණ යොදා ඇති සෑම අවස්ථාවක් කෙරෙහි ම ගුරුවරයාගේ විශේෂ අවධානය යොමු විය යුතුය. සිසුවා මුහුණපාන දුෂ්කරතාව හඳුනාගෙන එයට පිළියම් යොදා එම සිසුවා නැවත තක්සේරුවට භාජන කළ යුතුය. එම ''●'' සංකේතය, අනතුරු ව ''✓'' සංකේතයක් බවට වෙනස් කිරීමට හැකි වන තෙක් මෙම ක්‍රියාවලිය දිගට ම සිදු කිරීම ගුරුවරුන්ගේ වගකීමයි.
හඳුනාගනු ලබන ඉගෙනුම් දුෂ්කරතා මගහැර වීම පිණිස එක් එක් අවස්ථාවට ගැළපෙන පරිදි සුවිශේෂ ප්‍රතිකාර්ය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සම්පාදනය කිරීම වැදගත්ය. මේවා එක් එක් සිසුවා පෙන්නුම් කරන ඉගෙනුම් දුෂ්කරතා අනුව තීරණය කළ හැකිය.

එමෙන් ම යම් ඉගෙනුම් අභිමතාර්ථයක් කෙරෙහි පන්තියේ සිසුන් වැඩි දෙනකු ''●'' සංකේත ලබා ඇත්නම් එසේ වීමට බලපෑ හේතු රාශියක් තිබිය හැකිය. ඒවා හඳුනාගෙන සුදුසු ක්‍රියා මාර්ග ගෙන සිසුන් අවශ්‍ය ඉගෙනුම් ඵල කරා ගෙන ඒම ගුරුවරයාගේ වගකීමකි.

## 8.0 අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා

තුන්වන ප්‍රධාන අවධිය අවසානයේ සෑම ශිෂ්‍යයකු ම ප්‍රවීණත්වය ලබා ඇතැයි තහවුරු කර ගත යුතු නිපුණතා කට්ටලයක් හඳුනාගෙන ප්‍රකාශයට පත් කර ඇත.

සෑම ශිෂ්‍යයකු ම එම නිපුණතාවල ප්‍රවීණයන් බවට පත් කිරීමට කටයුතු කිරීම ගුරුවරයා වෙත පැවරෙන වගකීමකි. එම නිපුණතා පිළිබඳ ව විශේෂ අවධානය යොමු කර ඉගැන්වීම් කටයුතු කිරීමටත් සෑම ශිෂ්‍යයකු ම තක්සේරුවට ලක් කර එම නිපුණතා පිළිබඳ ව ප්‍රවීණත්වය ලබා ඇති බව තහවුරු කිරීමත් අවශ්‍යය.

මෙම තහවුරු කිරීම සඳහා අඛණ්ඩ අවිධිමත් තක්සේරු කිරීම්, නිරීක්ෂණ වාර්තා, සම්පිණ්ඩිත පරීක්ෂණ ආදිය මගින් නිගමන ගැනීමට ගුරුවරයාට සිදුවේ. මේ අවස්ථාවේ දී ප්‍රවීණත්වයට පත් නොවන සිසුන්ට නැවත වරක් සුවිශේෂී ඉගැන්වීම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමෙන් අදාළ නිපුණතා පිළිබඳ ප්‍රවීණයන් කිරීමට උත්සාහ දැරිය යුතුය. එයින් අනතුරු ව නැවත වරක් ඔවුන් ව තක්සේරු කර ප්‍රවීණතාව පිළිබඳ නිගමනය කිරීමට සිදුවේ.

දෙවැනි වර තක්සේරු කිරීමෙන් ද සමහර නිපුණතා පිළිබඳ ප්‍රවීණත්වයට පත් නොවූ සිසුන් වෙතොත් එම සිසුන් හා අදාළ නිපුණතා පිළිබඳ ව විශේෂ වාර්තාවක් පිළියෙල කිරීමක් අවශ්‍යය. එසේ කළ යුතු වන්නේ එබඳු සිසුන් වෙත හයවන ශ්‍රේණිය භාර ගුරුවරයාගේ ද සුවිශේෂ අවධානය යොමු වීම අත්‍යවශ්‍ය නිසාය.

ඉහත කරුණු නිසා අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවල ප්‍රවීණත්වය තහවුරු කිරීම ද පස්වන ශ්‍රේණිය භාර ගුරුවරයාගෙන් අපේක්ෂිත වැදගත් කාර්ය භාරයක් බව වටහා ගත යුතුය. මේ පිළිබඳ විශේෂ ගුරු අත්පොතක් හා විශේෂ ගුරු පුහුණු කටයුතු ද සංවිධානය කර ඇත.

## 9.0 තක්සේරු කිරීමේ දී සැලකිය යුතු වෙනත් කරුණු

★ එක් සිසුවකුගේ ඉගෙනුම් ප්‍රගතිය තවත් සිසුවකුගේ ඉගෙනුම් ප්‍රගතිය සමඟ සැසඳීමෙන් අධ්‍යාපනික වශයෙන් වැදගත් වූ තීරණ ලබා ගැනීම අසීරුය. එම නිසා සිසු-සිසු සාධන සැසඳීමෙන් වලකින්න.

★ එක් සිසුවකුගේ වර්තමාන සාධන මට්ටම එම සිසුවාගේ ම පූර්ව සාධන මට්ටම් සමඟ සැසඳීමෙන් සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි හෙයින් ඒ පිළිබඳ ව අවධානය යොමු කළ යුතුය. එසේ ම විෂයමාලාවේ අපේක්ෂණ කරා කොරතම් ළඟා වී ඇත්දැයි සොයා බැලිය යුතුය.

★ ලිඛිත ප්‍රශ්න පත්‍ර නිර්මාණය කිරීමේ දී අදාළ මට්ටමට ගැළපෙන පරිදි සුදුසු ප්‍රශ්න වර්ග තෝරා ගන්න.

★ තමාගේ පන්තියේ සිටින සිසුන්ට ගැළපෙන ආකාරයට ප්‍රශ්න සකස් කිරීමට පන්තිය භාර ගුරුවරයා ම සමත් විය යුතුය.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සන්තතිකව තක්සේරු කිරීම සඳහා කාර්ය සාධන ගොනු භාවිතය

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ක්‍රමිකව සිදු කරනු ලබන ගුණාත්මක සංවර්ධනයක් සමගින් තක්සේරුකරණ ක්‍රියාවලිය ද වඩාත් උචිත ලෙස සංවිධානය කර ගැනීම අවශ්‍ය වේ. විශේෂයෙන් ම ප්‍රාථමික අධ්‍යාපන අවධියෙහි දරුවන් සඳහා ඉගෙනුම් අවස්ථා සංවිධානය කළ යුත්තේ ප්‍රායෝගික අවස්ථා මුල් කරගෙන හෙයින් තක්සේරුකරණ ක්‍රියාවලිය ද ප්‍රායෝගික මෙන්ම ඵලදායී, ඉගෙනුම් ක්‍රියාවලියෙහි අත්‍යවශ්‍ය අංගයක් ලෙස පවත්වා ගැනීමට කාර්ය සාධන ගොනු වැනි ක්‍රමවේද භාවිත කළ හැකි ය.

කාර්ය සාධන ගොනුවක් යනු සිසුන්ගේ අර්ථාන්විත වැඩ එකතුවක් ලෙස සැලකිය හැකි ය. එය අර්ථාන්විත කර ගැනීම සඳහා ගුරුවරයා වඩා සැලකිලිමත් ව උපක්‍රමශීලීව කටයුතු කිරීම අවශ්‍ය වේ. සිසුන්ගේ හඳුනා ගත් ගැටලුවක් විසඳීමට, ඔවුන් තුළ ඇති සුවිශේෂී හැකියාවන් වර්ධනය කිරීමට, ඔවුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය පිළිබඳ ව දෙමාපිය භාරකරුවන් සමග සහයෝගී සංවාදයක් පවත්වා ගැනීමට කාර්ය සාධන ගොනු භාවිත කළ හැකි ය.

සිසුන්ගේ හඳුනාගත් ගැටලුවක් විසඳීමට කටයුතු කිරීමේ දී එම ගැටලුවේ ස්වභාවය, එය හඳුනා ගත් ආකාරය, ගැටලුව විසඳීමට ගත් ක්‍රියා මාර්ග වැනි කරුණු කාර්ය සාධන ගොනුවෙහි ඇතුළත් කිරීම මගින් ගුරුවරයාගේ මැදිහත්වීම කෙසේ විය යුතු ද යන්න පිළිබඳ ව ගුරුවරයාට, සිසුන්ට මෙන්ම දෙමව්පියන්ට ද අදහසක් ඇති කර ගත හැකි ය.

කාර්ය සාධන ගොනු විධිමත් සහ අවිධිමත් තක්සේරුකරණ ක්‍රියාවලීන්හි සංකලනයක් ලෙස පවත්වා ගත හැකිය. එදිනෙදා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ගුරුවරයා සහ සිසුවා අතර සිදුවන අන්තර් ක්‍රියාවලිය සමස්තයක් ලෙස දැක්වෙන අයුරින් ඉගෙනුම් ක්‍රියාවලිය තුළ සිදු කෙරෙන විවිධ විධිමත් තක්සේරු කිරීම් ද ඒ හා සම්බන්ධව නිරීක්ෂණ, සාකච්ඡා, සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නකරණය, පිරික්සුම් ලැයිස්තු යනාදියෙන් රැස් කර ගත් තොරතුරු ද කාර්ය සාධන ගොනුව තුළ සමෝධානය කර ඉදිරිපත් කළ හැකි ය.

සිසුන්ගේ කාර්ය සාධන ගොනු පිළිබඳ ව සකස් කරනු ලබන වාර්තාවක් දෙමව්පියන්ට මෙන්ම ඊළඟ ශ්‍රේණිය භාර අදාළ ගුරුවරුන්ට ද ලබා දිය හැකිය. කෙසේ වුව ද සිසුන්ගේ සුවිශේෂී හැකියා වර්ධනය සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග ඇතුළත් කාර්ය සාධන ගොනු හෝ වෙනත් එවැනි සැලකිය යුතු තත්ත්වයන් සම්බන්ධ කාර්ය සාධන ගොනු ඊළඟ ශ්‍රේණිය භාර අදාළ ගුරුවරුන්ට ඉදිරිපත් කිරීම වඩාත් ප්‍රයෝජනවත් වේ.

පොදු තක්සේරු පත්‍රිකාව -තක්සේරු වාර්තා කිරීමේ පත්‍රිකාව - පස්වන ශ්‍රේණිය

තක්සේරු කිරීමේ පරිමාණය
සාර්ථකව කරයි ✓
දුෂ්කරතා පෙන්නුම් කරයි /
තව දුරටත් උදවු අවශ්‍යයි •

| සිසුන්ගේ නම් | | | | |
|---|---|---|---|---|
| 1. පැහැදිලි නිමාවක් සහිත ව කාර්යයක් අවසාන කරයි. | | | | |
| 2. උදවු අවශ්‍ය අවස්ථාවල නොපැකිල ව ඉදිරිපත් වෙයි. | | | | |
| 3. පොදු වස්තූන් ආරක්ෂා කරමින් අන්‍යයන් ද ඒ සඳහා උනන්දු කරයි. | | | | |
| 4. කවි ගී රසවිඳිමින් තාලානුකූල ව ගායනා කරයි. | | | | |
| 5. නිසි ඉරියව් සහ අභිනයෙන් යුතු ව චරිත නිරූපණය කරයි. | | | | |
| 6. නිර්මාණශීලී ව කාර්යයක නියැලෙයි. | | | | |
| 7. පොදු කටයුතු සඳහා කැමැත්තෙන් ඉදිරිපත් වෙයි. | | | | |
| 8. පොදු කටයුතුවලදී අන්‍යයන් සමග සහයෝගයෙන් කටයුතු කරයි. | | | | |
| 9. ගුරුවරුන්ට ගෞරව කරයි. ආචාරශීලී ව කතා කරයි. | | | | |
| 10. භාවිතයට ගන්නා උපකරණ ආරක්ෂාකාරී ව පරිහරණය කරමින් නිසි තැන තබයි. | | | | |
| 11. සරල පරීක්ෂණවල යෙදෙමින් තොරතුරු වාර්තා කරයි. | | | | |
| 12. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යවලින් ලබා ගන්නා ආරංචි පිළිබඳ තම මතය ප්‍රකාශ කරයි. | | | | |
| 13. නායකත්වයට ගරු කරමින් කටයුතු කරයි. | | | | |
| 14. අන්‍යයන්ගේ හැකියා සහ යහගුණ අගය කරයි. | | | | |
| 15. ස්වයං ඉගෙනුමෙහි යෙදෙමින් අන්‍යයන් දැනුවත් කරයි. | | | | |
| 16. තම අදහස් හා හැඟීම් චිත්‍ර මගින් ප්‍රකාශ කරයි. | | | | |
| 17. පරිසර සම්පත් නිර්මාණශීලී ව යොදා ගනිමින් ආකර්ශණීය නිර්මාණවල නියැලෙයි. | | | | |
| 18. නිසි රිද්මයට අනුව සංචලන ක්‍රියාකාරකම්වල නියැලෙයි. | | | | |
| 19. ආදේශ භාණ්ඩ යොදා ගනිමින් සමූහ වාදනයෙහි යෙදෙයි. | | | | |
| 20. සරල නීති රීති අනුගමනය කරමින් ක්‍රීඩාවල යෙදෙයි. | | | | |
| 21. අන්‍යයන් කෙරෙහි සහානුභූතික ව කටයුතු කරයි. | | | | |
| 22. සිය අදහස් සහනශීලී ව ප්‍රකාශ කරයි. | | | | |
| 23. යොමු කරන දළ සැලැසුමක් යටතේ දළ ආකෘති ගොඩනගයි. | | | | |
| 24. මැහුම් ගෙතුම් ඇසුරෙන් නිර්මාණය කරයි. | | | | |
| 25. අවස්ථානුකූල ව දෙමළ බසින් සුබ පතයි. | | | | |
| 26. අන් අය සමග දෙමළ බසින් සුහද ව තමා පිළිබඳ සරල තොරතුරු බෙදා ගනියි. | | | | |
| 27. දෙමළ බසින් සරල අකුරු ලියයි. | | | | |
| 28. දෙන ලද පින්තූරයට අදාළ වචන දෙමළ බසින් කියයි. | | | | |
| 29. දෙමළ බසින් සරල කවියක්/ගීයක් ගායනා කරයි. | | | | |